Therefore, in conclusion, I appeal to the hon. Parliamentary Secretary to see that there are Unani dispensaries also, that they are kept functioning and that they are not looked down upon. He should examine seriously this hush-hush talk that is going on to get the Unani section closed down. The Unani system has been in vogue for hundreds of years in this country and it has been encouraged by the Sinhalese kings. I would like to ask who this pundit is who conceived the idea of closing the Unani section here and sending the students to India. This is a very serious matter. You cannot get away with it and I am sure the Government is not going to dance to the tune of every high official in the Unani section. This is a gross injustice. The Unani section has been treated in the most shabby manner.

I would ask the hon. Parliamentary Secretary to kindly let us know how many Unani dispensaries there are today and how many Unani qualified graduates have been recruited to work in these various municipal, urban council and village council dispensaries.

විලියම් ප්‍රනාන්දු මයා.
*(திரு. வில்லியம் பெர்ணண்டோ)*
(Mr. William Fernando)

ගරු කථානායකතුමනි, නුවරඑළියේ තිබෙන ඖෂධ වර්ගයක් ගැන විස්තරයක් කරන්න මට විනාඩියක් අවසර ඕනෑ. මා කීවේ ඇත්ත වශයෙන්ම සිද්ධායුර්වේද —[බාධා කිරීම්]

ගරු මන්ත්‍රීවරයෙක්
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)

දෙවැනි වතාවට කථා කරන්නේ. කලින් කථා කළා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**විලියම් ප්‍රනාන්දු මයා.**
*(திரு. வில்லியம் பெர்னாண்டோ)*
(Mr. William Fernando)

මට මේ බෙහෙත් වගී ලැයිස්තුවක් ඉදිරිපත් කරන්න තිබෙනවා. කරුණා කර ඒකට අවසර දෙන්න. අසෝක ගස්, ලොත් සුබුල්, ගම්මාලු, වදුලැස්ස, වදකහ, නගාමැරුඅල, අරුද—[බාධා කිරීම්]

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)

කරුණා කර නිශ්ශබ්ද වෙන්න.

**විලියම් ප්‍රනාන්දු මයා.**
*(திரு. வில்லியம் பெர்னாண்டோ)*
(Mr. William Fernando)

තමුන්නාන්සෙගෙ අණට කීකරු වීයි මා ඉඳගත්තේ. අනික් මන්ත්‍රීවරුන්ට වෙනත් දේවල් ගැන කථා කරන්න ඉඩ දුන්නා. [බාධා කිරීම්] අක්කර කීපයක් වත් අරගෙන ඒ බෙහෙත් ඖෂධ වර්ග වවන්නය කියා ඉල්ලනවා. මම ඒ ලැයිස්තුව තමුන්නාන්සේට ඉදිරිපත් කරනවා. [බාධා කිරීම්] නුවරඑළියේ දේශගුණයට සුදුසු මේ ඖෂධ ටික රැක ගන්නය කියා ඉල්ලනවා.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

I rise to a point of Order, Sir.

**හමීඩ් මයා.**
*(ஜனாப் ஹமீத்)*
(Mr. Hameed)

What is the meaning of this, Sir? When we want to speak you have all kinds of regulations——

**පී. සී. ඉඹුලාන මයා.** (රුවන්වැල්ල)
*(திரு. பீ. ஸீ. இம்புலான—ருவான்வல்ல)*
(Mr. P. C. Imbulana—Ruwanwella)

The rules and regulations are only for the Opposition.

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)

ගරු දෙණියායේ මන්ත්‍රීතුමා කථා කරන්න.

පරිපූරක මුදල්

**සුමනපාල දහනායක මයා.**
*(திரு. ஸுமனபால தகனாயக்க)*
(Mr. Sumanapala Dahanayake)

ගරු කථානායකතුමනි, ඊයේ උදේ වරුවේ සෞඛ්‍ය අමාත්‍යාංශය ගැන සාකච්ඡා කළ අවස්ථාවේදී කථා කරන්නට බැරි වීම ගැන මම කනගාටු වෙනවා. මේ ආයුර්වේද ක්‍රමය, දේශීය වෛද්‍ය ක්‍රමය, ගැන කොපමණ පොරොන්දු දී තිබුණත් ඒවා ඉටු වන්නේ නැහැ. සාමාන්‍ය තත්ත්වයක් දේශීය වෛද්‍ය ක්‍රමයටත් දෙනවාය කියා කොපමණ පොරොන්දු දී තිබුණත් එය දෙන බවක් පෙනෙන්නට නැහැ. රජයේ වුවමනාවකුත් නැහැ; දෙපාර්තමේන්තුවට වුවමනාවකුත් නැහැ. අද පළාත් පාලන ආයතනවලට දෙන මුදල සෑහෙන්නේ නැත කියා ප්‍රථමයෙන්ම මතක් කරන්න කැමතියි. ඒවා නඩත්තු කිරීමට, බෙහෙත් ශාලා ඇති කිරීමට, ඒ මුදල සෑහෙන්නේ නැහැ. පළාත් පාලන ආයතන මගින් මහ ජනතාවට ඒ සේවය ලබා දීමට ආණ්ඩුව උනන්දු වෙනවා නම්, ඒ සඳහා අවශ්‍ය කරන මුළු මුදලම දෙපාර්තමේන්තුවෙන් දෙන්නට බැරි ඇයි කියා අහන්න කැමතියි.

අපේ පළාත්වල මහජනයා ආයුර්වේද ක්‍රමය යටතේ ප්‍රතිකාර ලබාගැනීමට බොහොම ආශාවෙන් සිටිනවා. පොඩි අසනීපයක් හැදුණත් පුද්ගලික වෛද මහත්වරුන් ළඟටම මහජනයා නිතරම යැමෙන් ඒක අපට පැහැදිලි වෙනවා. බටහිර වෛද්‍ය ක්‍රමය අනුව දෙපාර්තමේන්තුවෙන් ඇති කරන ඉස්පිරිතාල ගැන රජයේ කිසිම සැලකිල්ලක් නැහැ. ඒ නිසා තමයි, විශේෂයෙන් ආයුර්වේද ක්‍රමය අනුව ප්‍රතිකාර ලබා ගැනීමට මහජනයා බලාපොරොත්තුවෙන් ඉන්නේ. බටහිර වෛද්‍ය ක්‍රමය සම්බන්ධයෙන් අපේ පළාත්වලට දෙපාර්තමේන්තුවෙන් කිසිම සැලකිල්ලක් ලැබෙන්නේ නැති බව මා කලින් කීවා.

1955 සිට දෙණියාය ආසනයේ පල්ලෙගම කියන ගමේ මාතෘ නිවාසයක් තිබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org
3050

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)
කරුණා කර මා කියන එකට සවන් දෙන්න. දැන් අප ඉදිරිපිට තිබෙන්නේ නගර සභා, පළාත් පාලන සභා හා සුළු නගර සභා මගින් ආයුර්වේදයට ආධාර දීමයි. ඒ ගැන සාකච්ඡා කරන්න. බටහිර වෛද්‍ය ක්‍රමය ගැන ඕනෑ නැහැ.

**සුමනපාල දහනායක මයා.**
*(திரு. ஸுமனபால தகநாயக்க)*
(Mr. Sumanapala Dahanayake)
බටහිර වෛද්‍ය ක්‍රමය නැහැ. මහජනයා ආයුර්වේදයට කැමතියි. ඒකයි පෙන්වන්න හදන්නේ. බටහිර වෛද්‍ය ක්‍රමය නැති නිසා මහජනයා ආයුර්වේදයට කැමතියි.

**ඩබ්ලිව්. දහනායක මයා.**
*(திரு. டப்ளியு. தகநாயக்க)*
(Mr. W. Dahanayake)
තර්කයක් ඉදිරිපත් කරන්නට ඕනෑ නැද්ද? [බාධා කිරීමක්.]

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)
එහෙම නම් අධ්‍යාපනය ගැනත් යන්න පුළුවන්; අයන්නේ සිට යන්න පුළුවන්. කරුණා කර කෙටි කර කථා කරන්න.

**සුමනපාල දහනායක මයා.**
*(திரு. ஸுமனபால தகநாயக்க)*
(Mr. Sumanapala Dahanayake)
දෙණියාය ආසනයේ තිබෙන ගම්කාර්ය සභා එකකවත් ආයුර්වේද බෙහෙත් ශාලාවක් නැහැ. පළාත් පාලන ආයතනයක් මගින් ගෙන යන එක දිස්පැන්සරියක්වත් නැහැ. මා කියන්නේ අඩු වශයෙන් දෙකෙන් එකක්වත් තිබෙන්න ඕනෑ. ඒ පළාත්වල මහජනතාව කොතරම් අවාසනාවන්තයන්ද කියතොත්, බටහිර වෛද්‍ය ක්‍රමයත් නැහැ; ආයුර්වේද වෛද්‍ය ක්‍රමයත් නැහැ. ඒ නිසා මා දෙපාර්තමේන්තුවෙන් අහන්නේ, මහජනයා ආශා කරනවා නම්, මහජනයා උනන්දු වෙනවා නම්, නොදෙන්නේ ඇයි? ගම්කාර්ය සභාවලට දෙන මුදල මදි නිසා හෝ වෙන යම් දේවල් නිසා හෝ මේ ආයුර්වේද බෙහෙත් ශාලා ඇති කරන්නේ නැහැ. මේ සම්පූර්ණ වියදම දරන්නට රජයට බැරි ඇයි? හැම ගම්කාර්ය සභා සීමාවක් තුළම එක බෙහෙත් ශාලාවක්වත් ඇති කරන්නට ඕනෑ කියා නීතියක්වත් හදන්නට බැරි ඇයි කියා ආණ්ඩුවෙන් අහන්නට කැමතියි. මේ ආයුර්වේදය ගැන දැන් මහජනතාව උනන්දුවක් දක්වනවා; නමුත් දෙපාතීමේන්තුව මහජනතාවට ආයුර්වේද පහසුකම් සැලසීමට ක්‍රියා කරන්නෙ නැහැ. මගේ කොට්ඨාශයේ මහජනතාව එක් වී ආයුර්වේද ආරෝග්‍ය ශාලාවක් ඇති කිරීමට විශාල මුදලක් එකතු කළා. නමුත් මේ කටයුත්තට සෞඛ්‍ය දෙපාතීමේන්තුව කිසිම සහයෝගයක් නොදුන් බව මම කනගාටුවෙන් කියනවා.

ගරු කථානායකතුමනි, තවත් කාරණයක් මතක් කරන්ට කැමතියි. අවුරුදු 14 කට පෙර මගේ කොට්ඨාශයේ කොටපොල කියන ගමේ මහජනයාගේ මුදල්වලින්—සෞඛ්‍ය දෙපාතීමේන්තුවේ මුදල්වලින් නොවෙයි, මහජනයාගේ මුදල්වලින්—මාතෘ නිවාසයක් සඳහා ගොඩනැගිල්ලක් සෑදුවා. ඒ අවස්ථාවේදී සෞඛ්‍ය දෙපාතීමේන්තුව මේ ගොඩනැගිල්ල මාතෘ නිවාසයකට නුසුදුසුය කියා කල්පනා කර, ඒ කටයුත්ත සඳහා මේ ගොඩනැගිල්ල පාවිච්චියට ගත්තේ නැහැ. මෑතක් වන තුරුම, අවුරුදු 13ක කාලයක් තුළම, මේ ගොඩනැගිල්ල ප්‍රයෝජනයට ගත්තේ නැහැ. එමෙන්ම ඒ කාලය ඇතුළත කිසිවකු එම ගොඩනැගිල්ලේ පදිංචියට ගියේත් නැහැ. මේ අතරතුර නැවතීමට ස්ථානයක් සොයා ගත නොහැකි වූ ඇතැම් නිලධාරීන් මේ ගොඩනැගිල්ලේ වරින් වර පදිංචි වුණා. පසුව මොරවක්කෝරළේ ග්‍රාම සංවර්ධන සමිතිය මගින්, ආයුර්වේද ආරෝග්‍ය ශාලාවක් ඇති කිරීමට බලාපොරොත්තු වුණා. එම ආරෝග්‍ය ශාලාව සඳහා මේ ගොඩනැගිල්ල සුදුසුය කියා මාතර දිස්ත්‍රික්කයේ සම්බන්ධතා කාරක සභාව ඒකඡන්දයෙන් තීරණය කළා. එසේ තීරණය කර එම ආයුර්වේද ආරෝග්‍යශාලාව සඳහා මේ ගොඩනැගිල්ල ලබා දෙන ලෙස සෞඛ්‍ය දෙපාතීමේන්තුවෙන් ඉල්ලා සිටියා. එහෙත් අවුරුදු දෙකක් තිස්සේ මවිසින් පුද්ගලිකව සෞඛ්‍ය දෙපාතීමේන්තුවට කරුණු කියා සිටියත්, තවමත් මේ ගොඩනැගිල්ල එම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආයුර්වේද ආරෝග්‍යශාලාව සඳහා ලබා ගැනීමට පුළුවන් වූයේ නැහැ. මාතර සෞඛ්‍ය අධිකාරී තුමා නම් එම කටයුත්ත සඳහා මේ ගොඩනැගිල්ල පාවිච්චි කළාට කිසිම බාධාවක් නැත කියා අදහස් කළ බව මම ඉතා සන්තෝෂයෙන් කියන්ට කැමතියි. නමුත් තවමත් සෞඛ්‍ය දෙපාර්මේන්තුව මේ ගොඩනැගිල්ල පිළිබඳව පුද්ගලිකව මටවත්, මේ සඳහා කරුණු ඉදිරිපත් කළ වෙනත් සමිති සමාගම්වලටවත්, මාතර දිස්ත්‍රික්කයේ සම්බන්ධතා කාරක සභාවටවත්, පිළිතුරක් සපයා නැහැ. මේ ආරෝග්‍යශාලාව සඳහා එම ගොඩනැගිල්ල කොයිම විධියකින්වත් නොදීමට සෞඛ්‍ය දෙපාර්මේන්තුව ලැහැස්ති වී සිටින බව අපට ආරංචියි. මේ ගොඩනැගිල්ල දැනට කොටපොල සිටින සෞඛ්‍ය නිලධාරිතුමා ඔහුගේ බංගලාව හැටියට පාවිච්චි කරනවා. බටහිර වෛද්‍ය ක්‍රමය හා සමානවම ආයුර්වේද වෛද්‍ය පහසුකම්ද ඇති කිරීමට සෞඛ්‍ය දෙපාර්මේන්තුවේ කිසිම ඕනෑකමක් නැති බවයි, මෙයින් පැහැදිලි වන්නේ.

ගරු කථානායකතුමනි, මා කලින් මේ ගරු සභාවට ඉදිරිපත් කරන්ට අදහස් කළ කාරණය ප්‍රකාශ කරන්ට අවස්ථාව නොලැබීම ගැන මම කනගාටු වෙනවා. ඒ අවස්ථාවේදී මම කියන්ට අදහස් කළේ මේකයි.

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)
කරුණා කර ඒ කරුණු මගහරින්න. ඒවා වුවමනා නැහැ.

**සුමනපාල දහනායක මයා.**
*(திரு. ஸுமனபால தகநாயக்க)*
(Mr. Sumanapala Dahanayake)
කථානායකතුමනි, දෙණියාය ප්‍රදේශයට බටහිර හෝ ආයුර්වේද හෝ කිසිම වෛද්‍ය පහසුකමක් නැති බවයි මම කියන්නේ. මොරවක ආරෝග්‍යශාලාවට තවමත් දොස්තර මහත්මයෙක් පත් කර නැහැ. 1955 වර්ෂයේ පල්ලේගම මාතෘ නිවාසයට ජලය සැපයීම සඳහා රුපියල් හැට දහසක් සම්මත කර තිබෙනවාය කියනවා. එහෙත් තවමත් මේ ස්ථානයට ජල පහසුකම් සපයා නැහැ. එසේ රුපියල් හැට දහසක් වෙන් කර තිබුණත්, මේ ස්ථානයේ ළිඳක් කපා යන්ත්‍රයක් සවි කළත් ඒත් ප්‍රමාණවත් වෙනවා. නමුත් එයවත් කරන්ට මේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ කිසිම ඕනෑකමක් නැහැ. අප කියන්නේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ උනන්දුවක් නැතිකමයි. එමෙන්ම මේ මාතෘ නිවාසයට මේ තාක් විදුලි බලය සපයා නැහැ. මේ ස්ථානයට විදුලි බලය ලබාගන්න ඉතා ලෙහෙසියි; නමුත් දෙපාර්තමේන්තුවේ උනන්දුවක් නැතිකම නිසයි, ඒ අඩුපාඩු පවතින්නේ.

එම නිසා ගරු කථානායකතුමනි, බටහිර වෛද්‍ය පහසුකම් දෙණියාය ප්‍රදේශයට සලස්වා නැති නිසා අඩු ගණනේ ඒ ප්‍රදේශයේ ආයුර්වේද වෛද්‍ය පහසුකම්වත් ඇති කරන ලෙස මම ඉල්ලා සිටිනවා. ඒ වාගේම හැම ගම් කාර්ය සභා සීමාවකම අඩු ගණනේ ආයුර්වේද ආරෝග්‍ය ශාලා එකක්වත් ඇති කිරීමට නීතියක් ඇති කරන මෙන් ගරු ලේකම්තුමාට මතක් කරමින් මගේ වචන සවල්පය මෙයින් අවසාන කරනවා.

අ. භා. 2.48

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)
ගරු කථානායකතුමනි, මේ සාකච්ඡා කරන්නේ ඉතා වැදගත් වැය ශීර්ෂයක් ගැනයි. මා හිතන හැටියට රුපියල් හාර ලක්ෂ පණස් දහස් හත් සියයක් ආයුර්වේදය සම්බන්ධ පළාත් පාලන ආයතනවලින් පවත්වාගෙන යන දිස්පැන්සරිවලට වැය කිරීමයි මෙයින් වන්නේ. අද දින ආයුර්වේද අංශයෙන් ලංකාවේ ජනතාවට ලැබෙන වෙදහෙදකම් අති විශාලයි. ලංකාවේ ජනතාව බටහිර වෛද්‍ය ක්‍රමයට වඩා ආයුර්වේද වෛද්‍ය ක්‍රමය අනුව ප්‍රතිකාර ගන්නවා. නමුත් ලංකාවේ ජනතාවගෙන් සියයට 70ක් පමණ ප්‍රයෝජන ගන්න ආයුර්වේද වෛද්‍ය ක්‍රමය සඳහා වෙන් කර තිබෙන්නේ රුපියල් 4,50,700 ක මුදලක්. මෙය කනගාටුදායක කාරණයක්. බටහිර වෛද්‍ය ක්‍රමයේ ආරෝග්‍යශාලාවක් හැදීමට රුපියල් ලක්ෂ කෝටි ගණන් වියදම් කරද්දී ආයුර්වේදය වෙනුවෙන් වියදම් කරන්ට යන්නේ මේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.]

තරම් සුළු මුදලක් වීම ගැන බොහොම කනගාටුයි. මේ රටේ ජනතාවගේ සියයට 70 ක් පමණ ආයුර්වේද ක්‍රමය අනුව ප්‍රතිකාර ගන්නවා නම් ඒ වෛද්‍ය ක්‍රමයට මීට වඩා හොඳින් සැලකීමට ආණ්ඩුව සූදානම් නොවන්නේ ඇයි? ආයුර්වේද ප්‍රතිකාර වෙනුවෙන් ගම්කාර්ය සභා, සුළු නගර සභා, නාගරික සභා ආදියටයි, මේ මුදල දෙන්ට යන්නේ. නමුත් මේ ආණ්ඩුව බටහිර වෛද්‍ය ක්‍රමයේ එක ආරෝග්‍යශාලා ගොඩනැඟිල්ලක් සෑදීමට මේ වාගේ හතර පස් ගුණයක මුදලක් වියදම් කරනවා නේද? එසේ නම් ආයුර්වේදයට තැන දෙනවා කියමින් බටහිර වෛද්‍ය ක්‍රමය සඳහා පුළුවන් තරම් සල්ලි වක්කරන්නේත්, ආයුර්වේද වෛද්‍ය ක්‍රමය සඳහා වුවමනා තරම් මුදල් නොයොදවන්නේත්, ඇයි? බටහිර වෛද්‍ය ක්‍රමය සඳහා රුපියල් කෝටි ගණන් වක්කරනවා.

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)

ගරු මන්ත්‍රීතුමා මේ වැය ශීර්ෂය ගැන ඔය විධියට කථා කරන්නෙ ඇයි? ඔය කරුණු මේ ආධාර මුදලට අදාළ වන්නේ නැහැ නේද?

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

ආධාර දෙන විධිය පැහැදිලි කිරීම සඳහායි, ඒ විධියට කථා කරන්ට වුවමනා වී තිබෙන්නේ. බටහිර වෛද්‍ය ක්‍රමය වෙනුවෙන් කෝටි ගණන් වියදම් කරනවා; නමුත් ආයුර්වේදය වෙනුවෙන් සෑහෙන ආධාරයක් දෙන්නේ නැහැ. ඇයි මේ වෙනස්කම? බටහිර ක්‍රමයේ බෙහෙත් සඳහාම වර්ෂයකට රුපියල් ලක්ෂ දෙසිය ගණනක් වියදම් කරනවා. මේවායින් බොහොමයක් අපතේ යනවා. මේ අපතේ යන මුදලින් කොටසක්වත් පළාත් පාලන ආයතන මඟින් ආයුර්වේද ඩිස්පෙන්සරි පවත්වාගෙන යෑමට දෙන්නේ නැහැ. ඒ සඳහා ක්‍රමයක් සකස් කරන්නේ නැහැ. ආයුර්වේද බෙහෙත් ශාලා පවත්වාගෙන යෑම සඳහා පළාත් පාලන ආයතනවලට ගොඩනැඟිලි කීයක් සකස් කර දී තිබෙනවාද? කිරුළපනේට නම් ඒ සඳහා ගොඩනැඟිල්ලක් සාදවා දීමට මට පුළුවන් වුණා. ඒ හැර මා දන්න තැනක නම් ආණ්ඩුවෙන් වෙන ගොඩනැඟිල්ලක් සාදා දී නැහැ.

ආයුර්වේදය ගැන මේ ආණ්ඩුව දක්වන්නේ කුඩම්මාගේ සැලකිල්ලක්. සියයට 70 ක් ජනතාව බෙහෙත් ගන්න ආයුර්වේදයට මේ ආණ්ඩුව දක්වන්නේ කුඩම්මාගේ සැලකිල්ලක්. තමුන්නාන්සෙගෙ දෙපාර්තමේන්තුව යටතේ ආයුර්වේද වෛද්‍යවරයන් දහස් ගණනක් ලියාපදිංචි වී සිටිනවා. පළාත් පාලන ආයතන මඟින් ඩිස්පෙන්සරි සකස් කර දී නියම විධියට බෙහෙත් වර්ග බෙදා හැර නියම විධියට රෝගීන්ට ප්‍රතිකාර කිරීමට ඒ වෛද්‍යවරයන්ට ඉඩ ප්‍රස්තාව සලසා දෙන්ට ඕනෑ. අද වන තෙක් ඒක කරල නැහැ. මොකක්ද ඒක නොකරන්නට හේතුව? බටහිර ක්‍රමයෙන් ගන්ට පුළුවන් හොඳ ටික ඔක්කොම අපි ගනිමු. ඇතැම් රෝග සුව කිරීමට ඒ බටහිර ක්‍රමයේ තිබෙන ශක්තිය අපි සතුටින් භාර ගනිමු. ඒ අතර රටේ වැඩි ජනතාව ප්‍රතිකාර ලබා ගන්ට යන ආයුර්වේද වෛද්‍යවරුන්ගේ දිස්පෙන්සරි, ආරෝග්‍යශාලා දියුණු කරන්ට ඕනෑ. නමුත් තවම ඒක කරන්ට මේ ආණ්ඩුව අපොහොසත් වෙලා තියෙනවා. මම එක ප්‍රශ්නයක් අහනවා. මේ ගරු සභාවෙනුත් මුදල් ප්‍රමාණයක් පාස් කරල ගම්බද පළාත් පාලන ආයතනවලින් පාලනය කරන ආයුර්වේද දිස්පෙන්සරි තිබෙනවා. ඒවායේ වෙදකම් කරන වෙද මහත්මයාට ලැබිය යුතු නියම වරප්‍රසාදය දීල තියෙනවද? පොලිසියෙන් හෝ යම් කෙනෙක හෝ යම්කිසි පුද්ගලයකුට ගහල තුවාලයක් වුණාම, අර ආයුර්වේද දිස්පෙන්සරියේ වෛද්‍යවරයා තුවාළයට ප්‍රතිකාර කරල වෛද්‍ය සහතිකයක් දුන්නොත් අද තමුන්නාන්සේලාගේ රජය ඒ වෛද්‍ය සහතිකය පිළිගන්නවාද? මේ තැනැත්තාට මේ විධියේ තුවාළයක් කරල තියෙනවා, ඒ පිළිබඳව මගේ රපෝර්තුව මේකයි කියා ඒ වෛද්‍යවරයා රපෝර්තුවක් දුන්නොත් මේ රජය ඒ රපෝර්තුව පිළිගන්නවද? උසාවියක් ඒ රපෝර්තුව පිළිගන්නවද? ඇයි ඒ වරප්‍රසාදය ආයුර්වේද වෛද්‍යවරයගෙන් ඉවත් කර තියෙන්නෙ? ඇයි උසාවිය ඒ ගම්බද වෙද මහත්මයාගේ වෛද්‍ය සහතිකය පිළිගන්නෙ නැත්තෙ? මේ රජයෙන් ඒ අංශයට මුදල් වැය කරනවා. මුදල් වැය කරනවා නම් ගම්බද

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වෛද්‍යවරයාටත් ඒ වරප්‍රසාදය දෙන්ට ඕනෑ. ගමේ පළාත් පාලන ආයතනය මගින් ක්‍රියාත්මක කරන ආයුර්වේද දිස්පෙන්සරියේ වෛද්‍යවරයාට හෝ වෛද්‍යවරියට ඒ බලය තියෙන්ට ඕනෑ. පිහිය පාරකින්, නැ නැත්නම් පොලු පහරකින් අහවලාගෙ නහය කැඩිල තියෙනවාය කියා ආයුර්වේද වෛද්‍යවරයා සහතික කළොත් ඇයි ඒ සහතිකය පිළිගන්නෙ නැත්තෙ? බටහිර වෛද්‍ය ක්‍රමය අනුව දෙන සහතිකය විතරද පිළිගන්නෙ? පළාත් පාලන ආයතන මගින් ගෙන යන ආයුර්වේද දිස්පෙන්සරිවල ඉන්නෙ ලියාපදිංචි වූ වෛද්‍යවරුයි. ඇයි ඒ අයට අර වරප්‍රසාදය දීමට තමුන්නාන්සෙලා මැලි වී සිටින්නෙ? තමුන්නාන්සෙලා තවම තුප්පහි ගති අනුව ගමන් කරන නිසා නේද එහෙම කරන්නෙ?

ගරු කථානායකතුමනි, තමුන්නාන්සේගෙ කොට්ඨාශයෙත්, නාවලපිටිය පැත්තෙත්, නොයෙක් තැන්වල ආයුර්වේද බෙහෙත් ශාලා ඇති. ඒවායේ වැඩක් කිරීමට ඉඩක් නැහැ. ඒවා දිනෙන් දිනම දුර්වල කරනවා. ඒවාට යවන බෙහෙත් ටික නියම විධියට සකස් කරල නියම මධ්‍යස්ථානයකින් යවන්නෙ නැහැ. බටහිර වෛද්‍ය ක්‍රමය අනුව බෙහෙත් දෙන ආරෝග්‍යශාලා හා ඩිස්පැන්සරිවල නම්, සකස් කළ බෙහෙත් තිබෙනවා. ඇයි එවැනි ක්‍රමයක් අනුව අපේ වෙදමහතුන්ට වුවමනා කරන චූර්ණ, අරිෂ්ට ආදිය පිළියෙළ කර සපයන්න මධ්‍යස්ථානයක් රජය පිහිටුවන්නෙ නැත්තෙ? වෙදමහතුන්ගේ ඒකමතික ඉල්ලීමක් තමයි මේක. එසේ කළොත් වෙද මහතුන්ට මෙන්ම රෝගීන්ටද තමන්ගෙ බෙහෙත් ටික ලබා ගැනීමට කඩපොලවල රස්තියාදු වෙන්න වුවමනා කරන්නෙ නැහැ. අද දින ආයුර්වේදයට ලැබෙන්නෙ කුඩම්මාගෙ සැලකිල්ලයි. ඒ අන්දමට කටයුතු කර කවර දාවත් ආයුර්වේද ක්‍රමය මේ රටේ දියුණු කරන්න බැහැ. මේ රටේ මහජනතාවගෙන් සියයට හැත්තෑපස් දෙනකුට වඩා වැඩි පිරිසක් අද දින ලෙඩක් වූ විට සොයන්නෙ සිංහල වෙද මහතාගෙ පිහිටයි. ඒ හෙයින් වෙදමහතුන්ට වුවමනා කරන බෙහෙත් සපයා දීමට වහම කටයුතු කරන මෙන් ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා.

ආයුර්වේද බෙහෙත් සපයන මධ්‍යස්ථාන පවත්වා ගෙන යාම පිණිස පළාත් පාලන ආයතනවලට අද දින රජයෙන් සුළු ආධාර මුදලක් දෙන බව අත්තයි. නමුත් බටහිර ක්‍රමය අනුව බෙහෙත් දෙන ඩිස්පැන්සරි ආදියට දෙන පහසුකම් මේවාට නොදීමෙන් මේවා මත අමතර බරක් පටවා තිබෙන්නෙ ඇයි? බටහිර ක්‍රමය අනුව පවත්වාගෙන යනු ලබන රෝහල් වලට ඩිස්පැන්සරිවලට දොස්තරවරු, ඇටෙන්ඩන්ට්වරු, උපකරණ ආදි සියල්ලක්ම සපයනවා. නමුත් ජනතාවට වැඩි සේවයක් කෙරෙන ආයුර්වේද බෙහෙත් ශාලාවලට එවැනි කිසිවක් නොදීමෙන් බරක් නොවේද පටවා තිබෙන්නෙ? නැහැ ගරු කථානායකතුමනි, මේ කට්ටියට මේවා කරන්න වුවමනාවක් නැහැ, හිතක් නැහැ. ඕකයි නියම තත්ත්වය. මේ අයට ඕනෑකරන්නෙ රට රවටන්න පමණයි. මේ අය වැඩ කරන්නෙ මුණ ඉච්චාවට පමණයි.

මගේ ඡන්ද කොට්ඨාශයේ පෝරෙගම නැමති පළාතේ මේ අන්දමට බෙහෙත් ශාලාවක් විවෘත කරන්නය කියා ඒ පළාතේ ත්‍යාගශීලී තැනැත්තෙක් අවුරුදු 99 ක බද්දකට උඩ ගෙයක් එම පළාත් පාලන ආයතනයට දුන්නා. නමුත් අනෙක් සමහර පළාත්වල මා දන්නවා එවැනි තැන් ලැබුණායින් පසුව වුවද ඒවා හොඳ මදිය කියා කුලී ගෙවල බෙහෙත්ශාලා පිහිටුවනවා. මේවා ගැන පරීක්ෂා කර බලන්නය කියායි මා ඉල්ලා සිටින්නෙ.

එබඳු ආයුර්වේද වෛද්‍යවරුන් ඔවුන්ගේ වෙදකම උඩ අද ඒ ප්‍රදේශවල බොහොම ජනප්‍රිය වී තිබෙනවා. ඇතැම් අයට අත් ගුණයක් තිබෙනවා. එබඳු අත් ගුණය ඇති වෙදමහත්වරුන්ට ගම්බද ජනයා බොහොම සලකනවා. හැතැප්ම ගණන් ඈත සිට එබඳු උදවියගෙන් බෙහෙත් ගැනීම සඳහා මිනිසුන් යනවා. ඒ වෙදමහත්වරුන් සල්ලි හම්බ කිරීමට නොවෙයි, වෙදකම් කරන්නේ. ඔවුන් මුදල් අය කරන්නේ නැහැ. ඔවුන්ගෙන් වෙදකම් ගැනීමට යන අය ගෙන යන්නේ බුලත් අතක් පමණයි. මුදල් දෙන්නේ නැහැ. අවුරුදු දෙදහස් ගණනක් තිස්සේ ආයුර්වේද වෙදකම මේ රටේ මුල්බැස



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.]
ගෙන තිබුනේ ඒ තත්ත්වයෙනුයි. නමුත් එසේ මුදල් නොගෙන වෙදකම් කරන වෙදමහත්වරුන්ට අද මේ රටේ තත්ත්ව යක් ඇත්තේ නැහැ. මුදල් ගසා කෑමට යන අයට නම් තවත් මුදල් දී, ගොඩ නැඟිලි ආදියත් සකස් කර දී ආධාර කරනවා. මිල මුදල් නොගෙන අපේ පැරණි සමාජ සිරිත් විරිත් අනුව වෙදකම් කරන වෙදමහත්වරුන්ට අත දී ඔවුන්ගේ තත්ත්වය නඟාලීමට මේ රජය සූදානම් නැහැ.

මේ මුදල කොහෙත්ම සෑහෙන්නේ නැහැ. පළාත් පාලන ආයතනවලට දීමට කෝටි ගණනක් වෙන් කරන්න ඕන. ගම්බද පළාත් පාලන ආයතනවලට වෛද්‍ය මධ්‍යස්ථාන ඇති කොට, නියම උපකරණ හා බෙහෙත් ද්‍රව්‍ය සැපයීම සඳහා කෝටි ගණනක් වෙන් කරන්න ඕන. මේ කරන්නේ ප්‍රයෝගයක්. සාමාන්‍ය ජනතාවගේ ඇසට වැලි ගැසීමක්. අපි ආයුර්වේදය නඟා සිටුවීමටත් වැඩ කළාය කීමටයි, මේ වැඩ කරන්නේ. එසේ නැතිව පපුවේ ඇති අවංකභාවයකින් උප දින චේතනා අනුව වැඩ කිරීමට නොවෙයි.

බඩේ බිජු තියාගෙන වැඩ කරන්න එපා යයි මම රජයට කියනවා. අද රටේ සිටින ජනතාවගෙන් සියයට 70 ක් පමණ ආයුර්වේද වෛද්‍ය ක්‍රමයට ලෙඩ සුව කරගන්නයි, අදහස් කරන්නේ. ඒ නිසා රටේ ජනතාවගෙන් අය කර ගන්නා කෝටි සංඛ්‍යාත මුදල්වලින් කොටසක් ඒ ජනතාවගේ සිතුම් පැතුම් අනුව ඔවුන්ගේ ලෙඩ සුව කරගැනීම සඳහා පහසුකම් ඇති කිරීම පිණිස යෙදවිය යුතුයි. පසුගිය සතියෙදි මට දැන ගන්ට ලැබුණ අපේ ප්‍රදේශයේ වෙද මහත්ම යෙක්—

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)
කරුණා කරල වැය ශීර්ෂය ගැන කථා කරන්න. මේක තිබෙන්නෙ ආධාර මුදල් ගැන.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)
ආධාර මුදල් දීම හරියාකාර කරන්න ඕනෑ කියන එකයි මා කියන්නෙ.

මේ රුපියල් 4,50,700 කොහෙත්ම ප්‍රමාණවත් නැහැ, පළාත් පාලන ආයතන මඟින් ගම්බද ප්‍රදේශවල ආයුර්වේදය දියුණු කරන්න. නියම වෛද්‍යවරුන් ගන්ට බැහැ. වෛද්‍යවරයෙක් පසුගිය සතියේ මට ඇවිත් කිව්ව, අංශ භාගය හැදුණු ලෙඩෙක් පසුගිය කාලයේ මහා රෝගාශාලාවට ගෙනාවාය, ඉන්පසු ඔහු ගේ කකුල් පටිවලින් සම්පූර්ණයෙන් වෙළුවාය, ඒ අන්දමට මාස 2 කුත් දවස් 21 ක් ඔහුව වෙළා තැබුවාය, අන්තිම දවසෙ නැවතත් වෙළන විට හුස්ම ගැනීමට බැරිය මා මැරෙන්න එනවාය කියා ලෙඩා කිව්වම දොස්තර මහත්මයා ඒ පටි කැපුවාය—මම ඕනෑ නම් දිනය හිටන් දෙන්නම්—ඊට පසු වෙද මහත්මයා ගමට ගෙන ගියාය කියා. පක්ෂඝාත රෝගය හැදී අට මාසයක් ගත වී සිටි ඒ රෝගියා තව ටික දවසක් ආරෝග්‍යශාලාවේ සිටියා නම් මැරී යන්ට ඉඩ තිබුණාය කියාත් ඒ වෙද මහත්මයා මා සමඟ කිව්ව. වෙළල වෙළල මැරෙන තත්ත්වයටයි ලෙඩා වැටී සිටියෙ. අට මාසයක් විතර ගත වුණු ඒ රෝගය නොයෙක් තෙල් බෙහෙත් වර්ග ගාල අන්තිමේදී කඹයක් බැඳදී ඒක අල්ලාගෙන ලෙඩාට හක්මන් කරන්ටය කියා, මාස දෙකකින් විතර ඒ වෙද මහත්මයා ලෙඩය සනීප කර තිබෙනව. ඒ එක්කෙනා දැන් බස්වල වෙකර් කෙනකු විශයෙන් රක්ෂාවක් කරනව.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)
කවුද ඒ වෙද මහත්මයා?

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)
මම ඒ වෙද මහත්මයාගෙ නම ඕනෑ නම් පසුව කියන්නම්. එදා අංශ භාගය නිසා තව මාස ගණනකින් නැති වන්ට ඉඩ තිබුණු ඒ මහත්මයා අද බස් වෙකර් කෙනෙක්. ඉස්පිරිතාලයෙදි පරීක්ෂා කරල වෙදකම් කළේ ඔහොමයි. ඇතැම් වෛද්‍යවරුන් කල්පනා කරනව ඇති මේක හිනාවට කරුණක් කියා. මට පෙනුණා, අපේ ගරු බටහිර වෛද්‍යතුමා ටිකක් හිනා වෙනව. ඒක නිසයි, මම එහෙම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කිව්වෙ. සමහරවිට ඒක එහෙම වන්ට බැහැ කියන්ට පුළුවනි. නමුත් මෙය සිද්ධ වුණේ මහාරෝගයශාලාවේ නිසයි මම කියන්නෙ. වෛද්‍යවරයා හරි හැටි පරීක්ෂා කළාද, නොකළාද, කියා මම දන්නෙ නැහැ. අද පළාත් පාලන ආයතන මගින් නියම විධියේ දිස්පැන්සරි ඇති කළොත් එවැනි වෛද්‍යවරුන්ගේ සේවය ලබා ගන්න පුළුවනි.

අද ආයුර්වේද වෛද්‍යවරුන් දහස් ගණනක් රෙජිස්ටර් වී සිටිනව. ආයුර්වේද ක්‍රමය ඉගෙන ගෙන ලියාපදිංචි වුණු වෙද මහත්වරු කී දාහක් ඉන්නවද? මට ඒ ගණන එක පාර කියන්න මතක නැහැ.

**ඔබේසේකර මයා.**
*(திரு. ஒபயசேக்கர)*
(Mr. Obeyesekere)
6.000 යි.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

ලංකාවේ ගම් දහ හත් දහස් ගණනක් තිබෙනව. ඒ හැම ගමකම වගේ අපේ වෙද මහත්මයෙක් ඉන්නව. පෙළක් ගම්වල දෙතුන් දෙනෙක් ඉන්නවා. නමුත් ලියාපදිංචි වෙලා ඉන්නෙ 6.000 යි. ඒ කොටස අද යට කරන්නේ ඇයි? ඒ අය ලියාපදිංචි කරන්ට ලැහැස්ති නැහැ. ඒ අය ලියාපදිංචි කළත් වෙදකම් කරන්නෙ නිකම්. ඒ ලැයිස්තු පෙන්වන්ට ලැහැස්ති නැහැ. අසුවල් ගමේ අසුවල් වෙද මහත්මයා ඉන්නවාය කියා ප්‍රසිද්ධ කරන්නෙ නැහැ. මොකද, ලෙඩුන් එතැනට යන නිසා; එවිට බටහිර ක්‍රමය ඉගෙන ගත් වෛද්‍යවරුන්ට මුදල් යාම නවතින නිසා. අද ලියාපදිංචි වුණු වෙද මහත්වරුන් 6,000 ක් සිටිනවා නම්, ඒ වෙද මහත්වරුන් සිටින්නේ අසුවල් අසුවල් ගම්වලය, ඒ අය අසුවල් අසුවල් වෙදකමට දක්ෂය, කියා ඒ අයගේ ලැයිස්තුවක් ප්‍රසිද්ධ නොකරන්නේ ඇයි කියා මා අහනවා. ඒ විධියේ වාර්තාවක් තමුන්නාන්සේලා ප්‍රසිද්ධ කළාද? නැහැ. ඊට හේතුව එය අපේ බටහිර වෛද්‍යවරුන්ගේ සම්ප්‍රදායට විරුද්ධවීමයි. ඒ වෙද මහත්වරුන්ගේ විශෙෂඥතාව ප්‍රසිද්ධ කරනවාට විරුද්ධයි. ඔය සම්ප්‍රදායවල් ඕනෑ නැහැ. රටේ යම් යම් දක්ෂ වෙද මහත්වරුන් ඉන්නව නම් ඔවුන් අසුවල් අසුවල් වෙදකමට දක්ෂය කියා වාර්තාවක් ප්‍රසිද්ධ කරන්න ඕනෑ. එය ඉතා අවශ්‍ය දෙයක්. රටේ සිටින රෝගීන්ට ඒ දක්ෂ වෙද මහත්වරුන් ඉන්න තැන්වලට යාමට ඒ ගැන දැනීමක් ලබා දෙන්න ඕනෑ. තමුන්නාන්සේට මතක ඇති, බලල්ලේ හිටියා බොහොම දක්ෂ වෙද හාමුදුරු නමක්. ඒ හාමුදුරුවන් ළඟට රටේ හැම පළාතකින්ම වගේ මිනිස්සු ගියා බෙහෙත් බින්දු දෙකක් අරගන බොන්න. බෙහෙත් ටිකක් දුන්න ගමන් අත්ගුණයෙන් සුව වෙනවය කියල ප්‍රසිද්ධියක් තිබුණා. ඇතැම් රෝග සඳහා දක්ෂ වෛද්‍යවරු අප්‍රසිද්ධව හිටිය, මේ විදියට. පළාත් පාලන ආයතන මගින් ඔවුන්ගේ සේවය ලබා ගන්න පුළුවනි. අද ලංකාව වැඩි වශයෙන් පළාත් පාලන ආයතනවලට බෙදිලයි තියෙන්නෙ. එම පළාත් පාලන ආයතන මගින් ඒ වෛද්‍යවරුන්ට ප්‍රසිද්ධියක් ලබා දෙන්න ඕනෑ. මෙසේ සුළු වශයෙන් නොවෙයි, කෝටි ගණන් වුණත් වෙන් කරල මෙරට ජනතාව ලෙඩෙන් දුකෙන් මුදවා ගැනීම සඳහා, බඩේ බිජු තියාගෙන ක්‍රියා නොකර, කෙළින්ම ආයුර්වේදයට ආධාර දෙන හැටියට මා ඉල්ලා සිටිනවා.

අ. භා. 3.11

**ඉඹුලාන මයා.**
*(திரு. இம்புலான)*
(Mr. Imbulana)

ගරු කථානායකතුමනි, මෙම වැය ශීර්ෂය යටතේ වචන ස්වල්පයක් ප්‍රකාශ කරන්න මා බලාපොරොත්තු වෙනවා. කොට්ටාවේ ගරු මන්ත්‍රීතුමා ඉතා වැදගත්වූත් රසවත්වූත් කතාවක් පැවැත්වුවා. ආයුර්වේද ක්‍රමය ගම් ප්‍රදේශවල දියුණු කිරීම සඳහා ගතයුතු පියවරවල් ගැන අදහස් රාශියක් එතුමා ඉදිරිපත් කළා. එම අදහස් අනුව ගම්වල ආයුර්වේදය දියුණු කරන්න ගරු ඇමතිතුමා උත්සාහ ගන්නවා ඇත කියා අප කල්පනා කරනවා. ආයුර්වේදය දියුණු කළ යුත්තේ මොන මොන ක්‍රමවලින්ද කියන එක ගැන අදහස් රාශියක් දෙපාර්තමේන්තුවෙ තියෙනව. කෙසේ වෙතත් ආයුර්වේදය වෙනුවෙන් මීට වඩා සේවයක් අපි බලාපොරොත්තු වෙනවා. ආයුර්වේදය දියුණු කිරීම සඳහා විශාල වැඩ පිළිවෙළක් ගන්නව කියල ගිය රාජාසන කථාවේදීද කිව්ව. එම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]
පොරොන්දුවෙන් ගැළවෙන්ට වාගෙ තමයි, රුපියල් හාර ලක්ෂ පණස් දහසක් වෙන් කරල තියෙන්නෙ. මෙම මුදලෙන් ගම්බද මහජනයාට ප්‍රයෝජනවත් වන විධියට ආයුර්වේදය දියුණු කරන්න පුළුවන් වේවිය කියා මා විශ්වාස කරන්නෙ නැහැ. එය කවදාවත් පුළුවන් වන කරුණක් නොවෙයි. සුළු නගර සභා ආදිය හැරෙනකොට ලංකාවේ ගම්කාර්‍ය සභා දැනට 466 ක් පමණ තිබෙනවාය කියා මා සිතනවා. රුපියල් 4,50,000 ක් ගම්කාර්ය සභා අතරේ සම සමව බෙදුවොත් එක් ගම්කාර්ය සභාව කට ලැබෙන්නෙ ඉතා සුළු ප්‍රමාණයක් බව පෙනෙනවා. එම මුදල කොහෙත්ම ප්‍රමාණවත් නොවන බවයි මගේ පිළිගැනීම. ඊට පිළිතුරු වශයෙන් කියනවා ඇති හැම ගම් කාර්ය සභාවකම ආයුර්වේද බෙහෙත් ශාලාවක් බැගින් පිහිටුවන්නෙ නැත කියා. මහජනයාට ප්‍රයෝජනවත් වන ආකාරයට මේ රටේ ආයුර්වේද බෙහෙත් ශාලා ඇති කරනවාය කියන මේ ආණ්ඩුව අඩු ගණනේ එක් ගම්කාර්ය සභා ප්‍රදේශයකට එක් ආයුර්වේද බෙහෙත් ශාලාවක් බැගින්වත් ඇති නොකරන්නෙ ඇයි? මෙවැනි සුළු මුදලක් වෙන් කිරීමෙන් කවදාවත් ආයුර් වේද වෛද්‍ය ක්‍රමය ගම්වල පතුරුවා හරින්ට බැහැ. මේ මුදල ඒ ඒ පළාත් පාලන ආයතනය මගින් දැනටමත් පවත්වාගෙන යනු ලබන බෙහෙත් ශාලාවලට රුපියල් හාර පන්දාහ බැගින් ලැබෙන පරිදි බෙදා දීමට වත් මදිවේය කියා මා හිතනවා.

බටහිර වෛද්‍ය ක්‍රමය දියුණු කිරීම සඳහා හැම පළාතකම විශාල ගොඩනැගිලි ඉදි කර තිබෙනවා. එහෙත් ආයුර්වේදය දියුණු කරනවාය කියන මේ දෙපාර්තමේන්තුව ඒ සඳහා වුවමනා තරම් ගොඩනැගිලි ඉදි නොකරන්නේ ඇයි? ගම්කාර්ය සභා සියල්ලටම බැරි නම් එයින් අඩකටවත් ආයුර්වේද ආයතන සඳහා පහසුකම් දෙන්ට බැරිද? එහෙම නම් ඊටත් අඩු ප්‍රමාණයකට හෝ දෙන්ට බැරිද? සාමාන්‍ය ජනතාවට ආයුර්වේද ක්‍රමයෙන් නියම සෙතක් දෙන්ට ඔය විධියට නම් කවදාවත් බැහැ. මාත් අවුරුදු ගණනක් ගම්කාර්ය සභාවල වැඩ කර තිබෙනවා. සභාපති වරයෙකු හැටියට අවුරුදු 13ක් 14ක් වැඩ කර තිබෙනවා. දැනට ගම්කාර්ය සභාවලට ලැබෙන ආදායම පාරවල් හැදීම, බෝක්කු තැනීම, ආදිය සඳහා වෙන් කළාම වෙනත් වැඩ සඳහා සතයක්වත් ඉතිරි වෙන්නෙ නැති තරමයි. ඒ නිසා පළාත් පාලන ආයතනවලට ආධාර දීම සඳහා මීට වැඩි මුදලක් වෙන් කරන ලෙස ඉල්ලා සිටිනවා. මේ රුපියල් 4,50,000 නම් කිසිසේත් ප්‍රමාණවත් නැහැ. ඒ නිසා දෙපාර්තමේන්තුව මගින් අඩු වශයෙන් ගොඩනැගිල්ලක්වත් පළාත් පාලන ආයතන වෙනුවෙන් ගොඩ නඟා දෙනවා නම් හොඳයි. අඩු වශයෙන් ගොඩනැගිල්ලක් වත් තනා නොදී මහජනයාට කොයි තරම් පොරොන්දු දුන්නත් ආයුර්වේද යෙන් නියම ප්‍රයෝජනයක් ලබා දීමේ පොරොන්දුව ඉෂ්ට කරන්ට බැහැ. ආයුර් වේදය දියුණු වෙන්නේත් නැහැ.

අපේ පළාත්වල හැම ගමකටම වාගේ වෙද මහත්වරු එක්කෙනෙක් දෙන්නෙක් ඉන්නවා. එක්කෝ ආයුර්වේද ක්‍රමයට බෙහෙත් කරන වෙද මහත්මයෙක් එහෙම නැත්නම් පැරණි සිංහල ක්‍රමයට බෙහෙත් කරන වෙද මහත්ම යෙක් වෙන්ට පුළුවනි. රුවන්වැල්ල පළාතේ ජිනදාස වෙද මහත්මයා බාලක පක්ෂඝාත රෝගීන් 29 දෙනෙකු සනීප කර තිබෙනවා. දවසින් දවස ඒ මහත්මයා ළඟට ලෙඩුන් එනවා. එවැනි වෙද මහත් වරුන්ටවත් ආණ්ඩුවෙන් කිසිම ආධාරයක් ලැබෙන්නෙ නැහැ. මෙවැනි වටිනා සේවයක යෙදී සිටින අය තෝරා ගෙන ඒ අයගේ සේවයත් මහජනයාට ලබා දීමට ක්‍රියා කරනවා නම්, පළාත් පාලන ආයතන මගින් අතිරේක සේවයක් මහජනයාට ලැබෙන අතර, ඒ මගින් විශාල සෙතක් ලබාගන්න පුළුවනි. එහෙම නැතිව, ආයුර්වේදය දියුණු කරන වාය කියා රාජාසන කථාවේ නම් කිව්ව; ඒ අනුව ආවැඩුවාට නම් කවදාවත් මහජන යාට ආයුර්වේදයෙන් ප්‍රයෝජනයක් ඇති වන්නේ නැහැ. ආයුර්වේදය දියුණු කිරීමට අපේ පර්යේෂණාගාරයක් නැත කියා ඒ සමගම කියනවා. "රිසර්ච් ඉන්ස්ටිටියුට්" එකක් නැහැ.

**ඔබේසේකර මයා.**
*(திரு. ஒபயசேக்கர)*
(Mr. Obeyesekere)
නැගිට්ටා නේ තිබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ඉඹුලාන මයා.**
*(திரு. இம்புலான)*
(Mr. Imbulana)
නවම නම් නැහැ.

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)
ඕවා ඔක්කොම අවශ්‍ය නැහැ.

**ඉඹුලාන මයා.**
*(திரு. இம்புலான)*
(Mr. Imbulana)
දැනට අපි මේ බෙහෙත් සේරම වාගේ ලබා ගන්නේ කපාඩියාගෙ මාර්ගයෙන්. ඒ නිසා ආයුර්වේදය දියුණු කිරීමට නම් එය පළාත් පාලන ආයතනවලට ගන්න ඕනෑ. ඒකයි මාතෘකාව කරගෙන යන්නෙ. දියුණු වීමට නම් ඒවා මේ රටේම තිබෙන්නට ඕනෑ. ඒක ඉතා වැදගත් කාරණයක් හැටියට සලකනවා ඇතැයි මා බලාපොරොත්තු වෙනවා. ආයුර්වේදය දියුණු කරන්න නම් මීට වඩා අරමුදලක් වෙන් කරන්නය කියා පාර්ලිමේන්තු ලේකම්තුමාගෙන් විශේෂයෙන්ම ඉල්ලා සිටිනවා. ආධාර දීමෙන් පමණක් කවදාවත් මෙය දියුණු කරන්න බැහැ. මෙය දියුණු කරන්න නම්, පළාත් පාලන ආයතන මගින් එක ආයුර්වේද ආයතනය බැගින්වත් ඇති කරන්නය කියා මතක් කරමින් මගේ වචන සවල්පය අවසාන කරනවා.

අ. භා. 3.22

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ (අකුරැස්ස)**
*(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ—அக்குறஸ்ஸ)*
(Dr. S. A. Wickremasinghe—Akuressa)
ඊයේ සිට මේ අවස්ථාව දක්වාම සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂ සම්බන්ධව දීර්ඝ සාකච්ඡාවක් ඇති වුණා. ඒ අවස්ථාවේ දී කථා කළ මේ ගරු සභාවේ ආණ්ඩු පක්ෂයේත් විරුද්ධ පාර්ශ්වයේත් මන්ත්‍රීවරුන් රාශියක්ම එහි ඇති අඩුපාඩුකම් සම්බන්ධවත් අවශ්‍ය වැඩි දියුණු කිරීම් සම්බන්ධවත් කරුණු රාශියක් ඉදිරිපත් කළා. දැන් මේ අවස්ථාවේදීත් ආයුර්වේද සේවය සම්බන්ධවත්, මදිපාඩුකම් සම්බන්ධවත්, මුදල් යෙදීමේ මදිකම සම්බන්ධවත්, මීට කලින් කථා කළ ගරු මන්ත්‍රීවරුන් රාශියක්ම අදහස් ප්‍රකාශ කළා. මේ සම්බන්ධයෙන් අපි එක කාරණයක් පිළිගන්න ඕනෑ. එනම්, අද අවශ්‍ය කටයුතුවලට වියදම් කිරීමට මුදල් නැතිකමේ ප්‍රශ්නය භයානක ලෙස පවතිනවා. වෛද්‍ය සේවයට පමණක් නොවෙයි, අධ්‍යාපන කටයුතු, අවශ්‍ය ආහාර ද්‍රව්‍ය ලංකාවට ගෙන්වා ගැනීම, ඔය ආදී මනුෂ්‍ය ජීවිතය ගෙන යැමට අවශ්‍ය සෑම දේකටම මුදල් මදිකම ගැන මුහුණ දීමට අද ආණ්ඩුවට සිදු වී තිබෙනවා. සෑම දේකටම වුවමනා කරන මුදල් සපයා ගැනීමට අද ආණ්ඩුව අදක්ෂ වී සිටින බව අපි පැහැදිලි ලෙස කල්පනා කළ යුතුයි. එය අපේ වගකීමක් නොවන බව මා පිළිගන්නවා. අද වන තුරු ආදායම් ලබා ගැනීම සම්බන්ධව සංවර්ධන කටයුතු නොකිරීම ගැන අපි ආණ්ඩුවට දෝෂාරෝපණය කර තිබෙනවා. අපේ ඒ විවේචන යුක්තිසහගත වූ හරි විවේචන හැටියට අපි පිළිගන්නවා. ඒ සෑම අතින්ම අද මුදල් මදිකම ගැන වගකීම ආණ්ඩුවට බාර දී තිබෙන්නේ වී නමුත් අද අපට සාකච්ඡා කරන්න තිබෙන්නේ, තිබෙන මුදල් තත්ත්වය අනුවයි. ආණ්ඩුව ඒ වගකීම ඉටු නොකළා කියා අප පිළිගන්නා අතරම—ආණ්ඩුව පිළිගෙන ඇද්ද නැද්ද කියා මා දන්නේ නැහැ, එය පිළිගත්තත් නැතත්—දැන් තිබෙන මුදල් තත්ත්වය අනුව මේ අවුරුද්දේ මේ සේවය සඳහා මුදල් යොදන්න ඕනෑය කියන ප්‍රශ්නය ගැනයි අද අපට සාකච්ඡා කරන්නට තිබෙන්නේ. මෙය ආණ්ඩුවේ වගකීමක්ය කියා ආණ්ඩුවට දොස් පැවරීමෙන් වැඩක් වන්නේ නැහැ. ඒ මන්ද කියතොත්, ආණ්ඩුව අපේ අදහස්වල හැටියට දොස් ලබා ගැනීමෙන් පසුවත් වගකීමෙන් තොරවයි කටයුතු කර තිබෙන්නේ. ඒ දොස් පැවරීම් යුක්තිසහගතයි කියා මා පිළිගන්නවා. ඒ අතරම ඇති වී තිබෙන මදිකම් ගැන කල්පනා නොකර, වුවමනා තරම් මුදල් යොදවන්නය කියා මේ අවස්ථාවේදී කියා සිටීම කිසිම වගකීමකට ඇති ඉල්ලීමක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ]

නොවන බව මා මතක් කරනවා. මේ ප්‍රශ්නය ගැන එක් වැදගත් කරුණක් පාර්ලිමේන්තු ලේකම්තුමා පැහැදිලි කරනවාය කියා මම කල්පනා කරනවා. එනම් ආයුර්වේද සේවය සම්බන්ධයෙන් අද ආණ්ඩුව ගෙන යන ස්ථිර ප්‍රතිපත්තිය මොකක්ද යන්නයි. තව කිප දිනකින් නේරු තුමා මේ රටට පැමිණෙනවා. එතුමා ලවා ආයුර්වේද පරීක්ෂණාගාරයක් විවෘත කරවීමට බලාපොරොත්තු වෙනවා. නේරු තුමා පිළිගැනීම සම්බන්ධව සියලුම පක්ෂ නායකයන් කැඳවා සාකච්ඡා කර තිබෙනවා. එහෙත් ආයුර්වේදය සම්බන්ධයෙන් මේ ආණ්ඩුව ගෙන යන ප්‍රතිපත්තිය මට නම් පැහැදිලි නැහැ. මේ ගැන කරුණු පැහැදිලි කරන මෙන් මම පාර්ලිමේන්තු ලේකම්තුමාගෙන් ඉල්ලා සිටිනවා.

අපේ සෞඛ්‍ය ඇමතිතුමා ඉන්දියාවේ සෞඛ්‍ය ඇමතිතුමා සමග නවදිල්ලියේදී කළ සාකච්ඡාවක වාර්තාවක් පසුගිය ජනවාරි මස 27 වැනි දින "ඩේලි නිව්ස්" පත්‍රයේ පළ වී තිබෙනවා. ඒ වාර්තාවේ මෙසේ සඳහන් වෙනවා :

Mr. Jayasuriya who called on Mr. D. P. Karmarkar, Union Health Minister, while the latter was presiding over the meeting of the Central Council of Ayurvedic Research was requested by Mr. Karmarkar to address the Members of the Council.

Under the heading "Ceylon's Intentions" our Minister had made this statement according to the press :

The Ceylon Government intends also to open Ayurvedic dispensaries all over the country and Ayurvedic hospitals in important towns where treatment would be given on modern scientific lines. Plans are also being prepared for research in Ayurveda to be conducted on a scientific basis. Ceylon was also anxious to pool all the resources available in Asian countries for the development of Ayurveda and he was sure that India's co-operation in the matter would be forthcoming.

ගරු කථානායකතුමනි, ආයුර්වේද සේවය සම්බන්ධව නවීන විද්‍යානුකූලව ක්‍රියා කරනවාය කියායි මේ ප්‍රකාශනයෙන් පෙනී යන්නේ. ගිය අවුරුද්දේ ආයුර්වේද පණත ඉදිරිපත් කර පවත්වන ලද විවාදය සම්බන්ධව තමුන්නාන්සේලා මතක ඇති. ඒ අවස්ථාවේදී නවීන විද්‍යාව පදනම කොට මේ රටේ ආයුර්වේදය දියුණු කිරීමේ ප්‍රතිපත්තියක් ඒ නීති මාලාවට ඇතුළත් කිරීමට මම මහන්සි ගත්තා. එහෙත් පාර්ලිමේන්තු ලේකම්තුමා එවැනි ප්‍රතිපත්ති ආයුර්වේද පණතට අඩංගු කිරීමට විරුද්ධ වුණා. මෙය විද්‍යා දෙකක්ය, මෙය ක්‍රම දෙකක්ය, මෙයට නවීන විද්‍යාවේ කිසිම සම්බන්ධකමක් නැත, යන කරුණු වලට අදාළව ආයුර්වේදය නගා සිටුවීමට සෞඛ්‍ය ඇමතිතුමා අදහස් කරන බව එදා අපට පැහැදිලි වුණා. ඒ අදහස්වලට අනුකූලව ආයුර්වේද ආරෝග්‍යශාලා තැනවීම, ආයුර්වේද දිස්පෙන්සරි තැනවීම, ආදී සියලුම කටයුතු කරන්ට ඕනෑය, ආයුර්වේදයට නවීන විද්‍යාවේ කිසිම සම්බන්ධයක් නැත, යනාදී අදහස් උඩ එදා ආයුර්වේද පණත මේ ගරු සභාවේ අනුමත කළා. මා දැන් ගරු පාර්ලිමේන්තු ලේකම්තුමාගෙන් ආයුර්වේද පණත ලබා ගත්තා. එය පරීක්ෂා කර බැලුවා. නමුත් නවීන විද්‍යාව ආයුර්වේදයට සම්බන්ධ කිරීමේ ප්‍රතිපත්තිය පිළිගෙන තිබෙන බවට කිසිම වගන්තියක් එහි සඳහන් වී නැහැ.

**ඔබේසේකර මයා.**
*(திரு. ஒபயசேக்கர)*
(Mr. Obeyesekere)

මෙය ඒකට අයිති දෙයක් නොවෙයි.

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**
*(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)*
(Dr. S. A. Wickremasinghe)

ඒ නිසා අපට මෙය පිළිගන්ට පුළුවන්ද? වෛද්‍ය ක්‍රමය පිළිබඳ ස්ථිර අවබෝධයක් ඇති මා වැනි අයගේ මතය නම් විද්‍යා ක්‍රම දෙකක් නැති බවයි. විද්‍යාත්මක විධියට කටයුතු කරනවා නම් එය එකම ක්‍රමයයි; ක්‍රම දෙකක් නැහැ. වැදගත් අත්හදා බැලීම් සහිතව මනුෂ්‍යයාගේ ලෙඩ සුව කිරීම සඳහා පිළිගෙන ඇති නවීන විද්‍යාත්මක ක්‍රම ආයුර්වේදයට සම්බන්ධ කොට එය නියම විද්‍යාත්මක වෛද්‍ය සේවයක් බවට පත් කළ යුතුය යන්න අපේ හැඟීමයි. ඒ අදහස ගරු ඇමතිවරයා ඉන්දියාවේදී ප්‍රකාශ කර තිබෙනවා :

——where treatment would be given on modern scientific lines. Plans were also being prepared for research in Ayurveda to be conducted on a scientific basis.

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

ගරු ඇමතිවරයා මේ ප්‍රතිපත්තිය අනුගමනය කරනවාද? මෙය සත්‍ය ප්‍රකාශයක්ද?

ගරු කථානායකතුමනි, ආයුර්වේද පර්යේෂණාගාරය ගැන පැහැදිලි වාර්තාවක් මට ලැබී නැහැ. ඒ පිළිබඳ වාර්තාවක් නිකුත් කර තිබෙනවාද, එහෙම නැත්නම් අතපසු වීමකින් මට එය කියවන්ට බැරි වුණාද, කියා මට සැකයක් තිබෙනවා. එම නිසා විවෘත කරන්නට යන ආයුර්වේද පර්යේෂණාගාරයේ කටයුතු නවීන විද්‍යාව අනුව කරන්නට බලාපොරොත්තු වෙනවාද කියා දැන ගන්නට සතුටුයි. නවීන විද්‍යාව අනුව වැඩ කෙරෙනවා නම් අප බොහොම සන්තෝෂයි.

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)

ඔය කරුණු සියල්ලක්ම මේ වැය ශීර්ෂයට වුවමනා කරනවාද? මෙය නගර සභා සුළු නගර සභා ආදියට දෙන ආධාරයක් ගැන තිබෙන වැය ශීර්ෂයක් නේද?

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**
*(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)*
(Dr. S. A. Wickremasinghe)

ගරු ඇමතිවරයාගේ අදහස ගැන මට කථා කිරීමට ලැබුණු පළමුවැනි අවස්ථාව මෙයයි. මට දැන ගන්නට වුවමනා කරන්නේ ගරු ඇමතිවරයා අපේ අදහස් පිළිගෙන ක්‍රියා කරනවාද නැද්ද යන්නයි. එසේ පිළිගෙන ක්‍රියා කරනවා නම්, මේ ආධාර ගැන සතුටුයි. දැන් යෝජනාව ඉදිරිපත් කර තිබෙන්නේ කලින් තුබුණු ප්‍රතිපත්තිය අනුවද? නවීන විද්‍යාව අයින් කොට වැඩ කිරීමට, පළමුවෙන් අනුගමනය කළ ප්‍රතිපත්තියද දැනුත් තිබෙන්නේ? නැත්නම් නවීන විද්‍යාව අනුව කටයුතු කිරීමේ ප්‍රතිපත්තියද? මේ කාරණය පැහැදිලි කර දුන්නොත් ප්‍රයෝජනවත් වේය කියා මා කල්පනා කරනවා. මීට වඩා කථා කිරීමට මා බලාපොරොත්තු වන්නේ නැහැ. ඒ නිසා ඉහත කී කරුණ පැහැදිලි කරනවා ඇතැයි බලාපොරොත්තුවෙමින් මගේ කථාව අවසන් කරනවා.

අ. භා. 3.35

**ස්ටැන්ලි තිලකරත්න මයා. (කෝට්ටේ)**
*(திரு. ஸ்டான்லி திலக்கரத்ன—கோட்டே)*
(Mr. Stanley Tillekeratne—Kotte)

ගරු කථානායකතුමනි, අපේ කෝට්ටේ ප්‍රදේශය වැනි පළාත් ආණ්ඩු සභා ප්‍රදේශවල ආයුර්වේද වෛද්‍ය සේවය අද බොහොම අඩුවෙනුයි කෙරෙන්නෙ. අකුරැස්සේ ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළාක් මෙන් නවීන විද්‍යාව අනුව පුහුණුවක් ලැබූ ආයුර්වේද වෛද්‍යවරුන් පිරිසක් අපේ පළාත් ආණ්ඩු සභා ප්‍රදේශවලට පත් කිරීම ඉතාම අවශ්‍ය වී තිබෙනවා. අකුරැස්සේ ගරු මන්ත්‍රීතුමාගේ කථාව මේ වැය ශීර්ෂයට අදාළ නැත කියා තමුන්නාන්සේ කීවත්, එය වැය ශීර්ෂයට අදාළ වන්නේ මෙන්න මේ පිළිවෙළටයි. නවීන විද්‍යාව අනුව පුහුණුවක් නොලත් ආයුර්වේද වෛද්‍යවරුන් මේ ප්‍රදේශවලට එවීමෙන් කිසිම වැදගත් සේවයක් සිදු වන්නෙ නැහැ. ඒ නිසා තමයි, මේ ප්‍රශ්නය ගැන කල්පනා කරන විට රසායනාගාර පිළිබඳ ප්‍රශ්නයක් මතු වන්නෙ.

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)

මේ වැය ශීර්ෂය තියෙන්නේ ආධාර දීමක් ගැන පමණයි. ඒ නිසා කරුණා කරල ඒ ගැන පමණක් කථා කරන්න.

**ස්ටැන්ලි තිලකරත්න මයා.**
*(திரு. ஸ்டான்லி திலக்கரத்ன)*
(Mr. Stanley Tillekeratne)

ගරු කථානායකතුමනි, රසායනාගාර ප්‍රශ්නය පමණක් නොවෙයි, මතු වන්නෙ. ආයුර්වේද රසායනාගාරය පිහිටුවා තිබෙන්නේ මගේ කෝට්ටේ ප්‍රදේශයෙයි. නමුත් බෙහෙත් ද්‍රව්‍ය සැපයීමේ පැක්ටරිය වෙන කොට්ඨාශයකට ගෙන යාමට ලෑස්ති වෙලා තියෙනවා, දේශපාලන බලපෑම් අනුව.

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)

කරුණා කරල වැය ශීර්ෂය යටතේ කථා කරන්න.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ස්ටැන්ලි තිලකරත්න මයා.**
*(திரு. ஸ்டான்லி திலக்கரத்ன)*
(Mr. Stanley Tillekeratne)

ගරු කථානායකතුමනි, පළාත් ආණ්ඩු සභා ප්‍රදේශවලට හොඳ පුහුණු ආයුර්වේද වෛද්‍යවරුන් පත් කිරීම ඉතාමත් අවශ්‍යයි. ඒ සඳහා වැඩිපුර සල්ලි වියදම් කරන්ට ඕනෑ. එසේම රසායනාගාරය කෝට්ටේ විවෘත කරනවා නම් පැක්ටරියත් කෝට්ටේ විවෘත කරන ලෙස මම ඉල්ලා සිටිනවා. දේශපාලන බලපෑම් උඩ ඒක වෙන කොට්ඨාශයකට ගෙන යන්න එපා. ආයුර්වේද ක්‍රමය දියුණු කිරීමට නම් සෑම නගරයකම, සෑම සුළු නගරයකම, සෑම ගම් සභා ප්‍රදේශයකම ආයුර්වේද මධ්‍යස්ථාන ඇති කරන්ට ඕනෑ. නමුත් ඒ සමගම තවත් ලොකු ප්‍රශ්නයක් තියෙනවා. කොපමණ ආයුර්වේද මධ්‍යස්ථාන ඇති කළත් ආයුර්වේද සහතිකය බලපාන්නේ සුමාන දෙකකටයි. එසේම ආයුර්වේද මධ්‍යස්ථාන ඇති කරනවා වගේම, නවීන විද්‍යාව අනුව පුහුණු වූ ආයුර්වේද වෛද්‍යවරුන් ඒ මධ්‍යස්ථානවලට එවන්ට ඕනෑ. තමුන්නාන්සේ දන්නවා නේද, මූත්‍රවල සීනි තියෙනවද කියා සොයා බලන්නෙ කොහොමද කියා ඇසූ ප්‍රශ්නයට පිළිතුරු දෙකක් ලැබුණු බව. රසායනාගාර ක්‍රමය අනුව බැලිය යුතුය කියා එක්කෙනෙක් කිව්වම, මූත්‍ර බිම දමා කුඹි එන තෙක් ඉන්න ඕනෑය කියා තව කෙනෙක් කිව්වා. මූත්‍රවල සීනි තියෙනවාද කියා බලන්ට බිම දමා කුඹි එන තෙක් බලාගෙන සිටින වෛද්‍යවරුන් එව්වොත් ඔවුන්ගෙන් මහජනයාට නියම සේවයක් ඉෂ්ට වන්නෙ නැහැ. ඒ නිසයි, හොඳ පුහුණුවක් ඇති වෛද්‍යවරුන් පත් කිරීම සඳහා වැඩිපුර සල්ලි වියදම් කළ යුත්තේ. ඒ ඉල්ලීම කරන අතරම නාවින්නේ විවෘත කිරීමට යන බෙහෙත් ද්‍රව්‍ය පැක්ටරියත් කෝට්ටේ ප්‍රදේශයේම විවෘත කිරීමට වැඩ කරන ලෙස ඉල්ලමින් මගේ වචන සවල්පය අවසාන කරනවා.

අ. භා. 3.39

**වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. ඩී. ද සිල්වා (බොරැල්ල)**
*(டொக்டர் டப்ளியு. டீ. டி சில்வா—பொறளை)*
(Dr. W. D. de Silva—Borella)

ගරු කථානායකතුමනි, බටහිර වෛද්‍ය ක්‍රමය කරන තැනැත්තකු හැටියට මේ වැය ශීර්ෂය යටතේ මමත් වචන සවල්පයක් කියන්ට ඕනෑ. මේ රටේ සාමාන්‍ය උදවිය ආයුර්වේද වෛද්‍ය ක්‍රමයේ සහනය ලැබීමට බලාපොරොත්තු වන නිසා, මේ වැය ශීර්ෂය යටතේ වෙන් කර තිබෙන මුදල ප්‍රමාණවත් නොවන බව මට පෙර කථා කළ ගරු මන්ත්‍රීවරුන් කීප දෙනකු විසින්ම ප්‍රකාශ කර අවසානයි. බටහිර වෛද්‍ය ක්‍රමය අනුව පවත්වාගෙන යනු ලබන බෙහෙත්ශාලාවලට සහ ආයුර්වේද ක්‍රමය අනුව පවත්වාගෙන යනු ලබන බෙහෙත්ශාලාවලටද රජය මගින් වෙන් කරනු ලබන මුදල් ප්‍රමාණය ගැන කල්පනා කර බැලුවාම—ඒවා සංසන්දනය කළාම—මේ ආණ්ඩුව අනුගමනය කරන ප්‍රතිපත්තිය පැහැදිලිවම පෙනෙනවා. මේ ආණ්ඩුව පමණක් නොව මීට කලින් තිබූ ආණ්ඩුද ආයුර්වේද ක්‍රමය ගැන නොයෙකුත් ප්‍රකාශ නම් කර තිබෙනවා. නමුත් වෙන් කරනු ලබන මුදල්වලින් කර තිබෙන්නේ ආයුර්වේදය දියුණු කිරීම නොව ඊට සෑම අතින්ම බාධා කිරීම බව සකස් කර තිබෙන වැඩ පිළිවෙළින්ම පෙනෙනවා.

බටහිර වෛද්‍ය ක්‍රමය නම් අවුරුදු ගණනාවක් තිස්සේම මේ රටේ දියුණු වෙමින් පවතිනවා. එහි ප්‍රතිඵලයක් වශයෙන් අප රටේ ධනයෙන් විශාල කොටසක් පිටරටවලට ඇදී යන බව පැහැදිලි කාරණයක්. නමුත් ආයුර්වේද වෛද්‍ය ක්‍රමය දියුණු කර පිටරට ඇදී යන විශාල ධනස්කන්ධය මේ රටේම නවතා ගැනීමට මේ ආණ්ඩුව අද වන තුරු කිසි වැයමක් දරා නැහැ. බටහිර ක්‍රමය අනුව පාවිච්චි කරනු ලබන බෙහෙත් සම්බන්ධයෙන් ඒවා නිපදවන සමාගම් මගින් බලවත් ප්‍රචාරයන් ගෙන යන නිසා ඒ. පී. සී. වැනි සුළු බෙහෙත් අද අපේ ගම්වැසියන් අතර පවා බහුල ලෙස පාවිච්චි වෙනවා. කරුණු මේ අන්දමට පවතින්නේ රජය මෙවැනි ව්‍යාපාරයන් ගෙන යාමට සම්පූර්ණයෙන්ම ඉඩ දී තිබෙන නිසයි. අනික් අතින් කල්පනා කර බැලුවාම ආයුර්වේදය දියුණු කිරීමටද රජය කිසිම ආශාවක් නොදක්වන බවත් පැහැදිලිවම පෙනෙන්න තිබෙනවා.

මා මේ අන්දමට කථා කරන්නේ ආණ්ඩුව විවේචනය කිරීමේ අදහසින්ම නොවෙයි. බටහිර වෛද්‍ය ක්‍රමයේ තිබෙන්නාවූ නොයෙක් අඩුපාඩුකම් හොඳින් දන්න නිසයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පරිපූරක මුදල්

ඉංග්‍රීසි ආණ්ඩුව මේ රටේ පැවති කාලයේ පටන්ම රෝග සුව කිරීමේ චේතනාවෙන්ම නොව තමන් නිපදවන බෙහෙත් අලෙවි කිරීම පිණිස බලවත් ප්‍රචාරයන් බෙහෙත් නිපදවන සමාගම් ගෙන ගියා. ඒ නිසා මුදල් අතින් නොයෙක් අමාරුකම්වලට මුහුණ දී සිටින මෙම අවස්ථාවේදී හෝ ආණ්ඩුවේ යුතුකමක් තිබෙනවා, ආයුර්වේදය දියුණු කිරීමට නියම වැඩ පිළිවෙළක් යෙදීමට. ඒ වෙනුවට අද දින කොළඹ නගරය තුළ ඇවිදින ඕනෑම කෙනකුට පෙනෙන දෙයක් තමයි, බටහිර ක්‍රමය අනුව නිපදවන බෙහෙත් විකිණීම සඳහා වෙළඳුන් ගෙන යන්නේ කුමන අන්දමේ ප්‍රචාරයන්ද කියන එක. ඒවා නිසියාකාර ප්‍රචාරය කරන අතර විදේශීය සමාගම් විසින් දැනට කර ගෙන යන ප්‍රචාර නැවැත්විය යුතුයි. එසේ කිරීම ආණ්ඩුවේ යුතුකමක්. සමහර අවස්ථා වලදී ඇතැමුන් ඒ ඒ බෙහෙත්වලට නිකම්ම පුරුදු වෙනවා. ප්‍රචාරක පත්‍රිකා ආදිය කියවීමෙන් සමහරු ඒ ඒ බෙහෙත් වර්ග ගැනීමට පුරුදු වෙනවා. ඒ නිසා එවැනි ප්‍රචාර පිළිබඳව සුදුසු වැඩ පිළිවෙළක් යෙදවීමට ආණ්ඩුව කටයුතු කළ යුතුයි.

විදේශීය සමාගම් ඔවුන්ගේ බෙහෙත් විකිණීමෙන් විශාල මුදලක් පිටරට ඇද ගෙන යනවා. ආයුර්වේද වෛද්‍ය ක්‍රමය මේ රටේ දියුණු කළොත් අපට ඒ මුදල්ද මේ රටේම නවත්වා ගන්න පුළුවනි. අපට අවශ්‍ය නැති විදේශීය බෙහෙත් වර්ග රාශියක් තිබෙනවා. කොළඹ මහාරෝග්‍යශාලාවේත් අනිකුත් ස්ථානවලත් සිටින බටහිර වෛද්‍යවරුන් සමග ඒ කාරණය පිළිබඳව සාකච්ඡා පවත්වා අවශ්‍ය බෙහෙත් වර්ග මොනවාද, කොපමණ අවශ්‍යද, අනවශ්‍ය බෙහෙත් වර්ග මොනවාද, සීමා කළ යුතු බෙහෙත් වර්ග මොනවාද කියා තීරණයකට බැස අපට වුවමනා නැති බෙහෙත් වර්ග ගෙන්වීම නැවැත්වීමටත් සීමා කිරීමටත් කටයුතු කළොත්, එයින් ආයුර්වේදය නඟා සිටුවීමට ඉබේම වැඩ කෙරෙන අතර මෙරටින් පිටරට ඇදී යන විශාල මුදල් සංඛ්‍යාවක්ද නතර කරගන්න පුළුවන් වෙනවා. ආයුර්වේද බෙහෙත් ප්‍රමාණවත් වන තැන් වලදී බටහිර බෙහෙත් ගෙන්වීම තහනම් කරන්න පුළුවනි. ඉතා සුළු කාරණාවලට පවා අපි බටහිර බෙහෙත් පිටරටින් ගෙන්වීමට පුරුදුව සිටිනවා. හිසරදයටත් පිටරටින් පෙති වර්ග ගෙන්වනවා. ඒ පෙති වල මිළ සුළු වුවත් ඒ සඳහාත් විශාල මුදලක් පිටරට ඇදී යනවා. කොම්පැනි රාශියක් එකතු වීයි, මේ කටයුතු කරන්නෙ. ඒවා වළක්වන්න බැරි වී තිබෙනනේ ආණ්ඩුව ආයුර්වේදය පිළිබඳව නියම ප්‍රතිපත්තියක් අනුගමනය නොකරන නිසයි.

මේ මූලික කාරණා බල පාන්නේ ආයුර්වේදයට පමණක් නොවෙයි. අනික් අංශ වලත් මේ භේදය තිබෙනවා. සිංහල ගුරුවරයා හා ඉංග්‍රීසි ගුරුවරයා අතරත්, සිංහල වෛද්‍යවරයා හා ඉංගිරිසි වෛද්‍යවරයා අතරත්, සිංහල බෙහෙත් හා ඉංගිරිසි බෙහෙත් අතරත් මේ භේදය තිබෙනවා. ආණ්ඩුව ප්‍රතිපත්තියක් වශයෙන් ඒ භේද විසඳන්න ඕන. සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මේ කාරණා ගැන සලකා බලනු ඇතැයි මම විශ්වාස කරනවා.

ආයුර්වේද වෙදකම සඳහාත් අපි මුදල් වැය කළාය, ඒ නිසා ආයුර්වේද වෛද්‍යවරුන් සන්තෝෂ විය යුතුය, කියා රුපියල් ලක්ෂ 4ක් වියදම් කොට කරන්න යන මේ ක්‍රමයෙන් ආයුර්වේදය දියුණු වේ යයි මට නම් කියන්න බැහැ. මේ ක්‍රමයෙන් රෝගීන්ට නියම සහනයක් ලැබෙන්නේ නැහැ. ආයුර්වේද වෛද්‍ය ක්‍රමයත් බටහිර වෛද්‍ය ක්‍රමයත් අතර පන්ති භේදයක් ඇති බව මම මුලින් කිව්වා. මේ විධියට මුදල් වැය කිරීමෙන් ඒ පන්ති භේදය තව දුරටත් තහවුරු කිරීමයි, කරන්නේ. මේ ආණ්ඩුව සමාජවාදී ආණ්ඩුවක්යයි කියනවා නම්, ආයුර්වේද වෛද්‍ය ක්‍රමය දියුණු කිරීම ආණ්ඩුවේ අදහසක් නම්, ආයුර්වේද වෛද්‍යවරයාත් බටහිර වෛද්‍යවරයාගේ තත්ත්වයට ගෙන එන්න ඕන. එය ආණ්ඩුවේ යුතුකමක්. සිංහල වෛද්‍යවරුන්ට සමාදාන විනිශ්චයකාර තනතුරු ඒ පදවිය නිසාම ලැබෙන්න ඕනෑය කියා මා කීප වතාවක්ම කියා තිබෙනවා. මේ ආණ්ඩුවෙන් මා කීපවරක්ම එය ඉල්ලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, ආයුර්වේදයේ ඉතා දියුණු අංශ තිබෙන බව කවුරුත් වගේ පිළිගන්නව. මම කියන්නෙ නැහැ කොළඹ නගරයේ තිබෙන මහ රෝහලෙන් වැඩ කෙරෙන්නෙ නැහැ කියා. නමුත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. ඩී. ද සිල්වා]
ලංකාවේ වැඩි කොටසක් කාරණා ඇතුව පිළිගන්නවා, ආයුර්වේද ක්‍රමය අනුව කැඩුම් බිඳුම් වෙදකම ඉතා දක්ෂ ලෙස කෙරෙන බව. මා ආණ්ඩුවෙන් අහනවා, ඒ අංශය දියුණු කිරීමට ආණ්ඩුව යොදා තිබෙන වැඩ පිළිවෙළ මොකක්ද කියා. ඒ සම්බන්ධයෙන් රෝහලක් ඇති කර තිබෙනවාද? බටහිර ක්‍රමයේ වෙදකම් සඳහා නම් කැඩුම් බිඳුම් අංශයක් වෙනම ඇති කර තිබෙනව. නමුත් ආයුර්වේද වෛද්‍ය ක්‍රමයේ ප්‍රතිකාර ලබා දීමට මේ ආණ්ඩුව මොන ක්‍රියාමාර්ගයක්ද සකස් කර තිබෙන්නේ? මේ අන්දමට රුපියල් හාර ලක්ෂ ගණනක් වෙන් කිරීමෙන් ආයුර්වේද ක්‍රමය පිළිගන්නා පළාත් පාලන ආයතනවල කටයුතු කරන්ට පුළුවන්ද? මේ විධියේ සුළු මුදලක් වෙන් කිරීමෙන් ඒ කටයුතු කෙරේවිද කියා විශාල සැකයක් මට තිබෙනව. ඒ වගේම ආයුර්වේද ක්‍රම යට ප්‍රතිකාර කිරීමට ළදරු රෝහලක් මේ ආණ්ඩුව විසින් සකස් කරන්නේ නැද්ද කියා මා අහනව.

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)
මේ වැය ශීර්ෂයට ඒක අදාළ නැහැ.

**වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. ඩී. ද සිල්වා**
*(டொக்டர் டப்ளியு. டீ. டி சில்வா)*
(Dr. W. D. de Silva)
මේ වැය ශීර්ෂය යොදා තිබෙන්නේ දිස් පැන්සරි ගැන විතරයි. මම කියනවා ඒක මදි කියා. බටහිර ක්‍රමය අනුව වෙදකම් කරන්ට ළදරු රෝහලක් තිබෙනව නම්, ඇයි ආයුර්වේද ක්‍රමය අනුව වෙදකම් කරන්ට රෝහලක් ඇති නොකරන්නෙ? මගේ කොට්ඨාශයේ තමයි, ඉස්පිරිතාල වැඩි හරියක් තිබෙන්නෙ. කොළඹ මහ රෝහලත්, රිජ්වේ ආයසීා ළමා රෝහලත්, ආයුර්වේද ඉස්පිරිතාලයත්, මේ සියල්ලම තිබෙන්නෙ මගේ කොට්ඨාශයේයි. මා ආණ්ඩුවෙන් අහන්ට කැමතියි, ළදරුවන්ට ආයුර්වේද ක්‍රමය යටතේ බෙහෙත් කරන්නෙ නැද්ද කියා. ඒ අනුව වෙදකම් කිරීමට රෝහලක් පිහිටු වන්නෙ නැත්තෙ ඇයි? මේ ආණ්ඩුව ඒ ගැන වගකියයුතුයි. ආයුර්වේද වෛද්‍ය ක්‍රමය පිළිගන්න උදවිය අද ඒ නිසා විශාල කනගාටුවකින් ඉන්නව.



ආයුර්වේද වෛද්‍යවරුන්ට අත දෙනවාය, සමූ සහනයක්ම දෙනවාය, කියා ආණ්ඩුව නිතරම ප්‍රචාරය කරන නමුත් ඒ උදවිය වෙනුවෙන් කිසි දෙයක් කිරීමට ලැහැස්ති නැති බව ක්‍රියාවෙන් පෙනී යනවා. මේ වැය ශීර්ෂයෙන් මුදල් වෙන් කළ අන්දම දෙස බැලුවත් එය අපට හොඳින් පෙනී යනව.

අනික් කාරණය: ආයුර්වේද බෙහෙත් ශාලාවල සේවය කරන වෙද මහත්වරුන්ට පඩි නඩි ගෙවීමේ වැඩ පිළිවෙළ කුමක්ද කියා අපි ආණ්ඩුවෙන් ඇසිය යුතුයි. බටහිර වෛද්‍යවරයන්ට ගෙවන වැටුපම ආයුර්වේද වෛද්‍යවරුන්ට නොගෙවන්නෙ ඇයි? බටහිර වෛද්‍ය ක්‍රමයත් ආයුර්වේද වෛද්‍ය ක්‍රමයත් එක හා සමානව මේ ආණ්ඩුව පිළි ගන්නවාය කියනවා නම්, නැතහොත් සිංහල ක්‍රමය වැඩි වශයෙන් පිළිගන්නවාය කියනවා නම්, රෝහල්වල සේවය කරන ආයුර්වේද වෙද මහත්වරුන්ටත්, බටහිර ක්‍රමය උගත් වෛද්‍යවරුන්ටත් එක හා සමාන වැටුපක් නොගෙවන්නෙ ඇයි?

කථානායකතුමනි, තවත් කාරණයක් මතක් කරන්ට ඕනෑ. ආයුර්වේද බෙහෙත් ශාලාවලත් රෝහල්වලත් වැඩ කරන සේවකයන්ට කිසිම නිවාස ක්‍රමයක් මේ ආණ්ඩුව විසින් සකස් කර නැහැ. බටහිර වෛද්‍යවරුන්ටත්, නර්ස්වරුන්ටත්, අනි කුත් යම් යම් සේවකයින්ටත්, සමහර අවස්ථාවලදී නිවාස ක්‍රම සකස් කරගෙන යනව. මෙම සේවකයන්ට ගෙවල් ක්‍රම සකස් කරන්නය කියා මා සෑම වෙලේම ඉල්ලා තිබෙනවා. මෙය ඉටු නොකළොත් නියම විධියට වැඩ කරන්න බැහැ. මේ ගැන සැලකිල්ලක් දක්වන්නෙ නැහැ. ඒ ගැන මා කනගාටු වෙනවා. කොළඹ නගර සභාව යටතේ මෙවැනි ඩිස්පෙන්සරි රාශියක් තිබෙනවා. ඒවායේ සේවය කරන අය ගැන අප නිතර නිතර සාකච්ඡා කරනවා. පළාත් පාලන අංශය සමග සාකච්ඡා කීපයක් පැවැත්වූවා. දැන් මුළු ලංකාවටම වෙන් කර තිබෙන්නෙ හාර ලක්ෂයයි. එය ඉතාම අසතුටුදායකයි.

ලංකාවේ තත්ත්වය අනුව මේ වෛද්‍ය වරුන් නොපිළිගන්න තැනට පරිවර්තනය වෙලයි, තියෙන්නෙ. එම නිසයි, ඒ තත්ත්වය නැවත ලබා ගැනීමට සිදු වෙලා තියෙන්නෙ. අද සමාජය විසින් මිනිසාගේ තත්ත්වය මනින්නෙ සාක්කුවේ තිබෙන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මුදල් අනුවයි. එහෙම නැති නම් කොච්චර පඩියක් ලැබෙනවද කියා සොයා බලාලයි. ඒ අයට වැටුපෙන් තත්ත්වයක් දෙන්නෙ නැහැ. එම නිසා ඉල්ලා සිටිනවා, ගමේ සිංහල වෛද්‍යවරයාට සාමදාන විනිශ්චය කාර තනතුරක්වත් දෙන්නය කියා. දැන් සාමදාන විනිශ්චයකාර පදවි දෙන්නෙ— [බාධා කිරීම්] ඒකට නොවෙයි, මා යන්නෙ. ඒක සම්බන්ධ කිරීම සඳහායි මතක් කළේ. තමුන්නාන්සේලා ඒ අයට වැටුපක් දෙන්නෙ නැ. මා, නම් වශයෙන් කියන්න කැමති නැහැ. නොයෙක් විධියේ ජාවාරම් කාරයන්ට තමුන්නාන්සේලා සාමදාන විනිශ්චයකාර පදවි දීල තියෙනවා.

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)

කාරණයට අදාළව කතා කරන්න.

**වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. ඩී. ද සිල්වා**
*(டொக்டர் டப்ளியு. டீ. டி சில்வா)*
(Dr. W. D. de Silva)

ඇයි මේ අයට එවැනි ඨානාන්තර නොදෙන්නෙ? මේ අය විශාල සේවයක් කරනවා. 1960 රාජාසන කතාවේදී ප්‍රකාශ කළා, ආයුර්වේදයට නියම තැන දෙනවාය කියා. දැන් දෙවන ආණ්ඩුවත් රාජාසන කතා 3 ක් කියල හමාරයි. මෙම වැය ශීර්ෂයෙන් වෙන් කරල තියෙන්නෙ භාර ලක්ෂයයි. කොළඹ නගරයට එයින් ලැබෙන්නෙ ඉතා සුළු ප්‍රමාණයක්. තමුන්නාන්සෙලාගෙ පළාත්වලට වැඩ කර ගන්නවට අපේ අකමැත්තක් නැහැ. නමුත් මුළු ලංකාවටම වෙන් කර තියෙන්නෙ භාර ලක්ෂය බව කියන්න ඕනැ. සුළු පළාත් පාලන සභා 500 කට වඩා තිබෙනව. ඒ වගෙම නගර සභාත් රාශියක් තිබෙනව. මෙවැනි ප්‍රමාණයකට මුදල් වෙන් කරල ආයුර්වේදය දියුණු කරන්න බැරි බව පේන්නෙ නැද්ද? තමුන්නාන්සේලා කියනවා ඇති, මුදල් නැ කියල. නමුත් බටහිර ක්‍රමයත් ආයුර් වේද ක්‍රමයත් සංසන්දනය කර බැලුවොත්, ඇත්ත තත්ත්වය පෙනේවි.

වැටුප් ප්‍රශ්නය ගැන තරයේම කියන්න ඕනැ. අද ආයුර්වේද වෛද්‍යවරයකුට ලැබෙන වැටුප කුමක්ද?

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)

තව කොච්චර වෙලා ගන්නවද?

**වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. ඩී. ද සිල්වා**
*(டொக்டர் டப்ளியு. டீ. டி சில்வா)*
(Dr. W. D. de Silva)

තව මිනිත්තු 10 ක් 15 ක් විතර.

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)

අ. භා. 4.30 වන තුරු රැස්වීම තාවකාලිකව අත්සිටුවනවා.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්සිටුවන ලදින්, අ. භා. 4.30 ට නැවත පවත්වන ලදී.

## අග්‍රාණ්ඩුකාරතුමාගෙන් ලත් සන්දේශය

### மகா தேசாதிபதியிடமிருந்து வந்த செய்தி

### MESSAGE FROM THE GOVERNOR-GENERAL

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)

අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේගෙන් ලැබී තිබෙන සන්දේශයක් මම දැන් කියවනවා:

අංකය: සී. 21/1962

1962 සැප්තැම්බර් 28.

මහත්මයාණනි,

1946 යේ ලංකා (ආණ්ඩුක්‍රම) රාජාඥාවේ 36 (2) වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් ආකාරයට නම් කරන ලද ව්‍යවස්ථා කෙටුම්පතට මහා රාජිණීන් වහන්සේගේ ශ්‍රී නාමයෙන් මම අද දින අනුඥාව දුන් බව ගෞරව පූර්වකව ඔබට දන්වමි.

"An Act to provide for the service of the financial year, 1962-63, to authorise the raising of loans in or outside Ceylon for the purpose of such service, to make financial provision in respect of certain activities of the Government during that financial year, to enable the payment by way of advances out of the Consolidated Fund of Ceylon or any other Fund or moneys of, or at the disposal of, the Government, of moneys required during that financial year for expenditure on such activities, to provide for the refund of such moneys

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කථානායකතුමා]

to that Consolidated Fund, and to make provision for matters connected with or incidental to the aforesaid matters.".

මේවගට,

ඔබගේ කීකරු සේවක,
ඩබ්ලිව්. ගොපල්ලව,
අග්‍රාණ්ඩුකාර.

නියෝජිත මන්ත්‍රණ සභාවේ ගරු කථානායකතුමා.

## පරිපූරක මුදල: ස්වදේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුව

## குறைநிரப்புத் தொகை: சுதேச வைத்தியத் திணைக்களம்

## SUPPLEMENTARY SUPPLY: DEPARTMENT OF INDIGENOUS MEDICINE

**වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. ඩී. ද සිල්වා**
*(டொக்டர் டப்ளியு. டீ. டி சில்வா)*
(Dr. W. D. de Silva)

ගරු කථානායක තුමනි, තේ පානය සඳහා රැස්වීම තාවකාලිකව අත්සිටුවන අවස්ථාව වන විට මා කියමින් සිටියේ මේ වැය ශීර්ෂය යටතේ වෙන් කර තිබෙන මුදල් ප්‍රමාණය මදි බවයි. එය ප්‍රමාණවත් නොවන බව කියන්නේ කාරණා රාශියක් නිසයි. බෙහෙත් හේත් වෙනුවෙන් අද පිටරටවලට විශාල මුදලක් මේ රටින් ඇදී යනවා. ඒ අතර තව තවත් උදවියට මේ රටට පැමිණ බටහිර ක්‍රමයේ බෙහෙත් හේත් හදන්ටත් ඉඩ ප්‍රස්තාව දී තිබෙන බව තමුන්නාන්සේ දන්නවා ඇති. ආයුර්වේද වෛද්‍ය ක්‍රමය දියුණු කිරීමට නම් කළ යුත්තේ ඒ සඳහා අදාළ වැඩ පිළිවෙළක් සකස් කිරීමයි. එවැන්නක් සකස් කළා නම් අපට සන්තෝෂ වන්නට ඉඩ තිබුණා. එහෙත් රාජාසන කථා තුනෙන්ම රජයේ ප්‍රතිපත්තිය වශයෙන් ප්‍රකාශ කළේ කුමක්ද? විදේශීන්ට තව තවත් මේ රටට එන්ට කියන එකයි ආණ්ඩුව කියා සිටියෙ. විදේශීය බෙහෙත් වර්ග මේ රටේ හැදීම පිණිස විදේශීන්ට මේ රටට එන්ට එක් අතකින් නියම කරනවා, ඉඩ දෙනවා. ආයුර්වේදය ජාතික ක්‍රමයක්. නමුත් ජාතික බෙහෙත් නිෂ්පාදන කර්මාන්තය දියුණු නොකර ආයුර්වේදය දියුණු කරන්ට බැහැ. ආයුර්වේද බෙහෙත් සෑදීමේදී නොයෙක් අමාරුකම්වලට මුහුණ පාන්ට සිදු වෙනවා. නමුත් රජය කර තිබෙන්නෙ කුමක්ද? විදේශීන්ට බටහිර ක්‍රමයේ බෙහෙත් මේ රටේ හදන්ට ඉඩ සලසා දෙනවා. ග්ලැක්සෝ කොම්පැනිය වැනි කොම්පැනි අද මේ රටේ ගෙන යන ව්‍යාපාරය මොකක්ද කියා තමුන්නාන්සේ දන්නවා.

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)

කරුණා කර වැය ශීර්ෂයට අදාළව කථා කරන්න.

**වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. ඩී. ද සිල්වා**
*(டொக்டர் டப்ளியு. டீ. டி சில்வா)*
(Dr. W. D. de Silva)

ආයුර්වේදය වෙනුවෙන් මීට වැඩි මුදලක් වෙන් කරන්ට මේ ආණ්ඩුවට පුළුවන්කම තිබුණා. මීට වඩා වටිනා වැය ශීර්ෂයක් ඉදිරිපත් කරන්ට තිබුණා. ඒ වාගේම විදේශීය කොම්පැනිවලට ඉඩ නොදී දේශීය බෙහෙත් හේත් දියුණු කිරීමේ ආයතන සකස් කරන්න ඕනැ. ඒ ආයතනවලින් පළාත් පාලන ආයතනවලට බේත් හේත් සපයා දෙන්න ඕනැ. මා ප්‍රශ්නයෙන් පිට යන්නේ නැහැ. මා කියන්නේ මේ පළාත් පාලන අංශයේ දිස්පැන්සරිවලට ප්‍රමාණවත් අන්දමින් බේත් හෙත් ලැබෙන්නේ නැහැ. ඒවා සපයා ගැනීම අමාරුයි. කොළඹ නගරයෙ තත්ත්වය මා දන්නවා. පිට පළාත්වල තත්ත්වයත් ඒ ඒ මන්ත්‍රීවරු දන්නවා ඇති. නමුත් රජය කටයුතු කර තිබෙන්නේ ජාතික ප්‍රතිපත්තියට විරුද්ධ වයි. රාජාසන කථාවෙන්ම විදේශිකයන්ට ආරාධනා කර තිබෙනවා. මම දන්නවා එක තැනක විදේශිකයන් ඇවිත් කොම්පැනි හදා තිබෙන්නේ මොකටද? දේශීය කර්මාන්තය දියුණු කරන්න නොවෙයි; බේත් හේත් දියුණු කරන්න නොවෙයි; විදේශීය කටයුතු මගින් මේ රටේ ධනය ඔවුන්ගේ මව් රටට අරගෙන යන්නයි.

ඒ වාගේම ආයුර්වේද අංශයට ගොඩ නැගිලි ප්‍රමාණවත් නැහැ. තමුන්නාන්සේත් හොඳටම දන්නවා. ගම්බද ප්‍රදේශවල තත්ත්වය ඒ මන්ත්‍රීවරුනුත් දන්නවා ඇති. නමුත් කොළඹ නගරය දෙස බලන විට ඉතා කනගාටුදායකයි. බටහිර අංශයට කොළඹ මහ රෝහල තිබෙනවා. ඒ වාගේම කොළඹ නගර සභාව මගිනුත් ඇති කර තිබෙනවා. ආයුර්වේද අංශයකුත් තිබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඒවායේ ගොඩනැගිලි දක්කාම කනගාටු හිතෙනවා. මා වරක් රජයෙන් ඉල්ලා සිටියා රජයට මුදල් නැත්නම් වෙන වැඩ පිළිවෙළක්වත් යොදන්නය කියා. කොළඹ නගරයේ ගොඩනැගිලි රාශියක් තිබෙනවා. ඒවා පෞද්ගලික ගෙවල්. සමහර අයට ගෙවල් දෙක තුන තිබෙනවා. මේ වගේ අවශ්‍ය මහජන වැඩ සඳහා ඒවා රජයට ගන්නය කියා මා කියනවා. මේ රජයෙන් එය කීප විටක්ම මා ඉල්ලා සිටියා. ගෙවල් හදන්න මුදල් නැත කීම යුතුකමක් නොවෙයි. කාටත් පෙනෙනවා මේ වැය ශීර්ෂය යටතේ තිබෙන මුදල ගොඩනැගිලි තනන්නට ප්‍රමාණවත් නැහැ.

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)

ගරු මන්ත්‍රීතුමා ඔය කථාවම කී වරක් කීවාද ? ඕකම කී වරක් කීවාද ?

**වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. ඩී. ද සිල්වා**
*(டொக்டர் டப்ளியு. டீ. டி சில்வா)*
(Dr. W. D. de Silva)

මම මේ පටන් ඉත්තා විතරයි. මීට කලින් කිව්වා.

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)

කරුණාකර කථාව කෙටි කරන්න.

**වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. ඩී. ද සිල්වා**
*(டொக்டர் டப்ளியு. டீ. டி சில்வா)*
(Dr. W. D. de Silva)

ගරු කථානායකතුමනි, ගොඩනැගිලි ප්‍රශ්නය ගැන මම වැඩි දුර කියන්න යන්නේ නැහැ ; නමුත් තව වරක් රජයට කියනවා, බටහිර අංශයට පමණක් නොවෙයි, ආයුර්වේද අංශයටත් ගොඩනැගිලි සකස් කරන්න මුදල් ප්‍රමාණවත් නැත්නම්, කොළඹ නගරයේ තිබෙන විශාල පෞද්ගලික ගෙවල් මුදල් දීලා හෝ නොදී හෝ වහාම රජයට ගන්නය කියා.

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)

ගරු මන්ත්‍රීවරයාට වෙන කියන්න දෙයක් නැති නිසා ඕකම කියනවා. වෙන කියන්න දෙයක් නැත්නම් කරුණා කර වාඩි වෙන්න.

**වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. ඩී. ද සිල්වා**
*(டொக்டர் டப்ளியு. டீ. டி சில்வா)*
(Dr. W. D. de Silva)

ගරු කථානායකතුමනි, තව කරුණු කීපයක් තිබෙනවා. මේ ලංකාව බෞද්ධ රටක්. තමුන්නාන්සේ දන්නවා සත්ව වෛදකම ගැන. ඒ සම්බන්ධවත් ආයුර්වේද අංශයට යම්කිසි වැඩ පිළිවෙළක් තිබිය යුතුයි.

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)

ඒක මේකට අදාළ නැහැ. එය මේ වැය ශීර්ෂය යටතට වැටෙන්නේ නැහැ.

**වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. ඩී. ද සිල්වා**
*(டொக்டர் டப்ளியு. டீ. டி சில்வா)*
(Dr. W. D. de Silva)

ඒ අංශයට ආධාර දෙන්නේ නැත කියායි කියන්නේ. මේක බෞද්ධ රටක්. බෞද්ධ රටක සතුන්ටත් නියම වෛද්‍ය ක්‍රම සකස් කරන එක අපේ යුතුකමක්. බටහිර දිස් පැන්සරිවල ඒක කරනවා. මේ බෞද්ධ රටේ ආයුර්වේද ක්‍රමයෙන් ඒවා නොකරන්නේ ඇයි ? ඇයි, මේ කරුණු සම්බන්ධව ක්‍රියා කරන්නෙ නැත්තේ ? ආයුර්වේද වෛද්‍ය ක්‍රමයට සම්බන්ධ කාරණා රාශියක් තිබෙනවා. බුද්ධදාස රජතුමා ලංකාවේ ප්‍රසිද්ධ රජ කෙනෙක්. එතුමා ආයුර්වේදයට විශාල සේවයක් කළ බව තමුන්නාන්සෙලා දන්නවා. එහෙත් අද ආයුර්වේදය දියුණු කිරීමේ වැඩ පිළිවෙළක් මේ ආණ්ඩුව සකස් කර නැහැ. ආයුර්වේදයට ආධාර දීමට කිසිම වැඩ පිළිවෙළක් මේ රජය ඇති කර නැහැ. ඇයි මේ කරුණු අතපසු කරන්නේ ? මුදල් වෙන් කර, අපි ආයුර්වේදය දියුණු කරන්ට යනවාය කියා කීවාට මදි. ආයුර්වේදය හා සම්බන්ධ අංශ කීපයක් තිබෙනවා. මහලු රෝග, ළදරු රෝග, සත්ත්ව රෝග යනුවෙන් ඒවා කොටස් කරන්න පුළුවන්. මේ සම්බන්ධව ආයුර්වේද විශේෂඥවරු කීප දෙනෙක් සිටිනවා. එහෙත් මේ අයට ආණ්ඩුවෙන් කිසිම ආධාරයක් ලැබෙන්නෙ නැහැ. ආයුර්වේද විශෙෂඥ වෛද්‍යවරුන් තුන් දෙනෙකු ගැන මම පුද්ගලිකව දන්නවා. එහෙත් ඒ උදවිය අද ආධාර සොයා ගැනීම සඳහා නොයෙක් තැන්වල ඇවිදිමින් වෙහෙස වෙනවා. ඒ වාගේම ගම්බද

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. ඩී. ද සිල්වා]

ගොවීන්ගේ සත්වයන්ට නොයෙකුත් විධියේ ලෙඩ රෝග සෑදෙනවා. මේ රෝග වලට පිළියම් කළ හැකි දක්ෂ ආයුර්වේද වෛද්‍යවරුන් මේ රටේ සිටිනවා. එහෙත් තමුන්නාන්සේලා මේ කාරණා සම්බන්ධයෙන් නියමාකාරයට කටයුතු කරන්නේ නැති බව මම මතක් කරනවා.

ගරු කථානායකතුමනි, කොලොන්නාව ප්‍රදේශයේ මගේ කොට්ඨාශයට සම්බන්ධ ප්‍රදේශයක්. ඒ ප්‍රදේශයේ දිස්පැන්සරි කීපයක් තිබෙනවා. බරවා රෝගයට ඒ දිස්පැන්සරිවලින් ලබාගත හැක්කේ බටහිර වෙදකම් පමණයි. එහෙත් බරවා රෝගයට පිළියම් කළ හැකි දක්ෂ ආයුර්වේද වෛද්‍යවරුන් සිටිනවා. ඒ වෛද්‍යවරුන්ට ප්‍රතිකාර කිරීමට අවසථාවක් ලැබෙන්නේ නැහැ. කොලොන්නාව ප්‍රදේශයේ බරවා රෝගය පතුරුවන්නේ රජය බව මට මේ අවසථාවේදී කියන්ට සිදු වී තිබෙනවා. ඒ ප්‍රදේශයේ තිබෙන ඇළවල් වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් ශුද්ධ නොකරන නිසයි බරවා රෝගය පැතිරෙන්නේ. කොලොන්නාව ප්‍රදේශයේ බරවා රෝගීන් දහස් ගණනක් සිටින බව මගේ විශ්වාසයයි. ඒ රෝගීන්ට ප්‍රතිකාර කිරීමට ආයුර්වේද වෛද්‍යවරුන්ට අවසථාවක් ලැබෙන්නේ නැහැ. මම මීට කලිනුත් ප්‍රශ්න මගින් මේ කරුණු මතක් කර තිබෙනවා. බටහිර ක්‍රමය අනුව මේ රෝගයට නියම කරන හෙට්රසාන් නමැති බෙහෙතට අවුරුද්දක් පාසා කෙතරම් මුදලක් වැය වෙනවාද කිය තාමුන්නාන්සේ දන්නවා. එහෙත් බරවා රෝගය සුව කළ හැකි දියුණු සිංහල ක්‍රම තිබෙනවා. ආයුර්වේද වෛද්‍යවරුන්ට මේ ආණ්ඩුව තැනක් දෙනවාය කියනවා නම්, කොලොන්නාව ප්‍රදේශයේ හෝ වැල්ලවත්ත-ගල්කිස්ස ප්‍රදේශයේ ආයුර්වේද බරවා රෝග අංශයක් විවෘත නොකෙළේ මන්ද කියා මම අහනවා. ගරු කථානායකතුමනි, මගේ කොට්ඨාශයේ, බොරැල්ල, දෙමටගොඩ, නාරාහේන්පිට ආදී සථානවල ශුද්ධ නොකළ ඇළවල් වහාම ශුද්ධ කරවිය යුතුයි.

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)

දූන් වෙන කාරණයක් ගැන කියන්න.

**වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. ඩී. ද සිල්වා**
*(டொக்டர் டப்ளியு. டீ. டி சில்வா)*
(Dr. W. D. de Silva)

ඒ වාගේම සමාජ රෝග ගැන සළකා බලමු. සමාජ රෝගවලට ප්‍රතිකාර කරන්නේ බටහිර වෛද්‍ය ක්‍රමය අනුව පමණක්ද කියා මා අහනවා. ආයුර්වේද ක්‍රමය අනුව සමාජ රෝගවලට ප්‍රතිකාර කිරීමේ ක්‍රමයක් සකස් නොකරන්නේ ඇයි? ඇයි බටහිර වෛද්‍ය ක්‍රමයේ පැත්තම ගන්නේ? ආයුර්වේද ක්‍රමය අනුව මේ විධියේ රෝග වලට ප්‍රතිකාර ගැනීමට අවසථාව සලසා නොදෙන්නේ ඇයි? මා වෙද මහතුන් දෙතුන් දෙනකු ගැන දන්නවා. මේ රෝග වලට ප්‍රතිකාර කිරීමට ඒ උදවියට අවසථාවක් නැහැ. ඉතින් කොහොමද ඔහොම ආයුර්වේද වෛද්‍ය ක්‍රමය දියුණු කරන්නේ? සමාජ රෝග ගැන තමුන්නාන්සේ දන්නවා ඇති. ආයුර්වේද ක්‍රමය අනුව සමාජ රෝග ගැන ප්‍රතිකාර කිරීමට අවසථාවක් සලසා දී නැහැ නේද? මෙය වැදගත් කාරණයක්.

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)

මේ වැය ශීර්ෂය යටතේ ඔය කරුණු සියල්ලක්ම කථා කිරීමට වුවමනා නැහැ. මේ වැය ශීර්ෂය ඉදිරිපත් කර තිබෙන්නේ පළාත් පාලන ආයතනවලට ආධාරයක් දීම ගැන පමණයි. ඔය කරුණු ගැන පසුව කථා කරන්ට පුළුවන්. ඒ නිසා කරුණාකර කථාව කෙටි කරන්න.

**වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. ඩී. ද සිල්වා**
*(டொக்டர் டப்ளியு. டீ. டி சில்வா)*
(Dr. W. D. de Silva)

ගරු කථානායකතුමනි, පළාත් පාලන ආයතනවලට දෙන ආධාරයක් ගැන තමයි, මේ වැය ශීර්ෂයෙන් කිය වෙන්නේ. මම පළාත් පාලන ආයතනයක සාමාජිකයෙක්.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)
කරුණා කර කථාව කෙටි කරන්න.

**වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. ඩී. ද සිල්වා**
*(டொக்டர் டப்ளியு. டீ. டி சில்வா)*
(Dr. W. D. de Silva)
ආයුර්වේද වෛද්‍ය ක්‍රමය වෙනුවෙන් පළාත් පාලන ආයතනවලට දෙන ආධාරය මේ විධියට සීමා කරන්නේ ඇයි? ආයුර් වේදය මගින් උණ හෙම්බිරිස්සාවට පමණක් වෙදකම් කිරීමටද ආණ්ඩුව කල්පනා කරන්නේ ?

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)
කරුණා කර ගරු මන්ත්‍රීතුමා කථාව කෙටි කරන්න. මේ ආධාරය දෙනවාට ගරු මන්ත්‍රීතුමා විරුද්ධ නම්, විරුද්ධව ඡන්දය දෙන්න.

**වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. ඩී. ද සිල්වා**
*(டொக்டர் டப்ளியு. டீ. டி சில்வா)*
(Dr. W. D. de Silva)
කාරණා කියලයි, විරුද්ධව ඡන්දය දෙන්නේ. ඒ නිසා තව කාරණයක් කියන්න ඕනෑ. ආයුර්වේදය අනුවත් බටහිර වෛද්‍ය ක්‍රමය අනුවත් හොඳින් පුහුණු වූ තැනැත්තෙක් කොළඹ නගරයේ ඉන්නවා. ඒ මහතාට—ආචාර්ය බිබිලේ මහතාට—මේ වෛද්‍ය ක්‍රම දෙක ගැනම හොඳ දැනුමක් තියෙනවා. ඒ මහතාට නියම තැනක් දී රට පුරා ගොස් ආයුර්වේද ප්‍රතිකාර ගැන සොයා බලා එය දියුණු කිරීමට අවසථාවක් නොදෙන්නේ ඇයි? බටහිර වෛද්‍ය ක්‍රමයේ බෙහෙත් සඳහා අවුරුදු පතා විශාල මුදලක් මේ රටින් පිටරට යවනවා. ආයුර්වේදය දියුණු කළහොත් පිටරට ඇදී යන මුදල හුඟක් දුරට අඩු වේවි. මේ විධියට ලක්ෂ තුන හතරක් දී මේ වැඩේ කරන්ට අමාරුයි.

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)
ඔය කරුණු දැන් කීප වරක්ම කීවා නොවැ ?

**වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. ඩී. ද සිල්වා**
*(டொக்டர் டப்ளியு. டீ. டி சில்வா)*
(Dr. W. D. de Silva)
ආචාර්ය බිබිලේ මහත්මයා හොඳ දක්ෂ වෛද්‍යවරයෙක්.

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)
කියන දේ නැවත නැවත කියනවා නම්, කරුණා කර වාඩි වෙන්න.

**වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. ඩී. ද සිල්වා**
*(டொக்டர் டப்ளியு. டீ. டி சில்வா)*
(Dr. W. D. de Silva)
ඒ මහතා ඩිස්පෙන්සරිවලට යවා, ඒ මහතා ලවා තොරතුරු පරීක්ෂා කරවන්න.

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)
ඒක වෙනම කාරණයක්. එය මේ වැය ශීර්ෂයට සම්බන්ධ නැහැ.

**වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. ඩී. ද සිල්වා**
*(டொக்டர் டப்ளியு. டீ. டி சில்வா)*
(Dr. W. D. de Silva)
මා කථාව දික් කරන්නේ නැහැ. ප්‍රමාණවත් බෙහෙත් ඩිස්පෙන්සරිවලට නොදෙන එකයි, වැරද්ද. එම නිසා සෑහෙන ප්‍රමාණයක මුදල් දීමෙන් වුවමනා කරන බෙහෙත් ඒ ඩිස්පෙන්සරිවලට ලබා ගැනීමට අවසථාවක් දෙන්න ඕනෑ. එක්කෝ ප්‍රමාණවත් බෙහෙත් ඒවාට සපයන්ට ඕනෑ. එසේ කර ආයුර්වේද වෛද්‍ය ක්‍රමය දියුණු කරන හැටියට ආණ්ඩුවෙන් ඉල්ලමින් මගේ කථාව අවසන් කරනවා.

අ. භා. 4.55

**යූ. බී. වන්නිනායක මයා.** (යාපහුව)
*(திரு. யூ. பி. வன்னிநாயக்க—யாப்பஹுவ)*
(Mr. U. B. Wanninayake—Yapahuwa)
ගරු කථානායකතුමනි, ආයුර්වේදීය වෛද්‍ය ක්‍රමය අනුව ප්‍රතිකාර කරන්නට රජය බලාපොරොත්තු වන්නේ පළාත් පාලන ආයතන මගින් පමණක්ද, කියා මා ගරු පාර්ලිමේන්තු ලේකම්තුමාගෙන් දැන ගන්ට කැමතියි. එහෙම නම් පොහොසත් පළාත් පාලන මණ්ඩල නැති පළාත්වලට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වන්නිනායක මයා.]

මේ ආයුර්වේද වෛද්‍ය ක්‍රමයේ සේවය ලබා ගන්නට පුළුවන් කමක් නැහැ. යම් ප්‍රදේශයක තිබෙන පළාත් පාලන මණ්ඩලයක ධන ශක්තිය අනුව ආයුර්වේද බෙහෙත් ශාලාවක් නඩත්තු කිරීමේ වියදමින් කොටසක්වත් ඒ පළාත් පාලන මණ්ඩලයට දරන්නට පුළුවන්කමක් තිබෙනොත් පමණක් ආයුර්වේද බෙහෙත් ශාලා ඇති කිරීමයි, දැන් අනුගමනය කරන ප්‍රතිපත්තිය. ඒ අනුව ඉතාමත් දුර්වල තත්ත්වයක ඇති පළාත් පාලන මණ්ඩල තිබෙන සමහර පිටිසර පළාත් තිබෙනවා. රජයෙන් අවුරුද්දක් පාසා ලැබෙන ආධාර මුදලේ පිහිටෙන්, බොහොම අමාරුවෙනුයි, ඒවායේ වැඩ කටයුතු කරගෙන යන්නේ. දැන් රජය අනුගමනය කරන ප්‍රතිපත්තිය අනාගතයේදීත් අනුගමනය කරන්ට රජය අදහස් කළොත් එවැනි පළාත්වලට ආයුර්වේද වෛද්‍ය සේවය ලබා ගන්න පුළුවන් කමක් නැහැ. සමහර පිටිසර පළාත්වල පළාත් පාලන ආයතන දුප්පත්වා පමණක් නොවෙයි, ඒ පළාත්වල බටහිර ක්‍රමය අනුවවත් සැලකිය යුතු ප්‍රමාණයකට වෛද්‍ය පහසුකම් සපයා නැහැ. ඒ දෙපක්ෂයෙන්ම ඒ දුප්පත් පළාත්වලට විශාල පහරක් වැදී තිබෙනවා. ඒ නිසා ඒ නොදියුණු පළාත්වලට රජයේ සම්පූර්ණ වියදමින්වත්, වුවමනා කරන සම්පූර්ණ ආයුර්වේද වෛද්‍ය සේවය ආරම්භ කිරීමට රජය එකඟ වෙනවා නම් හොඳ බව මගේ අදහසයි.

ගරු කථානායකතුමනි, ආයුර්වේද ක්‍රමය යටතේ විවෘත කරන ආයතනවල තත්ත්වය, බටහිර වෛද්‍ය ක්‍රමය යටතේ විවෘත කරන ආයතනවල තත්ත්වයට කිට්ටු වෙන් තියෙන්ට ඕනෑ. ඒ ආයතනවලටත් හොඳ ගොඩනැගිලි දෙන්ට ඕනෑ. එසේම ඒවායේ සේවය කරන අයට අනික් ආයතනවල සේවය කරන අයට වගේ හොඳ පඩි නඩි නොගෙවා මේ ආයතන පවත්වාගෙන ගියොත් ඒවායින් ලැබෙන සේවය දෙවැනි පෙළේ, තුන් වැනි පෙළේ සේවයක් හැටියෙන් මහජනයා සලකන්ට ඉඩ තියෙනවා. වැඩි ආදායමක් නැති පළාත් පාලන මණ්ඩලවලට පුළුවන් කමක් ඇති වන්නෙ නැහැ, ඒ පළාත්වල ආයුර්වේද වෛද්‍ය ශාලා ආරම්භ කරනට, රජය අවුරුදු පතා යන වියදමෙන් කොටසක් පමණක් දෙන්න බලාපොරොත්තු වෙනවා නම්. ඒ නිසා සම්පූර්ණ වියදමම රජය දරා එවැනි දුර්වල පළාත් පාලන මණ්ඩල ඇති ප්‍රදේශවල ආයුර්වේද වෛද්‍ය ශාලා ඇති කිරීම රජයේ යුතුකම බව මම නැවතත් මතක් කරන්ට කැමතියි.

අ. භා. 4.57

**කේ. එම්. පී. රාජරත්න මයා.** (වැලිමඩ)
*(திரு. கே. எம். பீ. ராஜரத்ன—வெலிமடை)*
(Mr. K. M. P. Rajaratna—Welimada)

ගරු කථානායකතුමනි, මේ වැය ශීර්ෂය යටතේ පළාත් පාලන සභා මගින් ආයුර්වේද බෙහෙත් ශාලා පවත්වාගෙන යාමට ආධාර දීම සඳහා රුපියල් 4,50,700 ක මුදලක් වෙන් කර තිබෙනවා. මේ මුදල කිසිසේත් ප්‍රමාණවත් නොවන බව මම මුලින්ම කියන්ට ඕනෑ. ගම්බද ප්‍රදේශවල වෛද්‍ය පහසුකම් ඉතාම අඩු බව ඔබතුමා දන්නවා. කොයි තරම් අඩුද කියනවා නම් සමහර ගම්බද පළාත්වල ගැමියන්ට බෙහෙත් ලබා ගැනීම සඳහා ආරෝග්‍ය ශාලාවකට හෝ බෙහෙත් ශාලාවකට එන්න හැතැප්ම 10, 12 ගමන් කිරීමට සිදු වී තිබෙනවා. බටහිර වෛද්‍ය පහසුකම් රටේ සෑම තැනම බහුල වශයෙන් පතුරුවා හරින්ට ඕනෑය කියා බලාපොරොත්තු වෙනවා නම්, මේ ආණ්ඩුව ගෙන යන වැඩ පිළිවෙළ අනුව තව අවුරුදු 25 කටවත් ඒ කර්තව්‍යය සාර්ථක වේය කියා අපට හිතන්ට බැහැ. ඒ අඩුපාඩුව පිරිමැසීම පිණිස දේශීය වෛද්‍ය පහසුකම් සැපයීමට ආයුර්වේද වෛද්‍ය ක්‍රමය උපයෝගි කර ගැනීම ඉතාමත් කාලෝචිතයි. නමුත් මේ වෙන් කර තිබෙන මුදලින් ඒ අඩුපාඩුව පිරිමසන්ට පුළුවන් වේය කියා කිසිසේත් හිතන්ට පුළුවන්කමක් නැහැ.

ගරු කථානායකතුමනි, මේ විස්තරයේ සඳහන් කර තිබෙනවා, මේ මුදල මෙසේ වෙන් කර තිබෙන්නේ ගිය අවුරුද්දේ වාර්තා ලැබුණේ නැති නිසාය, 1960 වාර්තා අනුවය කියා. 1961 සහ 1962 වාර්තා ළඟදීම එනවා. ඒ වාර්තා දැන්ම එන්නෙ නැත්නම් ඒවා පුළුවන් තරම් ඉක්මනින් ලබා ගෙන හෝ මේ මුදල තව විශාල ප්‍රමාණයකින් වැඩි කරන්ට ඕනෑ. ඒ වාර්තා බලාලා පමණක් මදියි. මේ මුදල වගේ හතර පස් ගුණයක්, ආයුර්වේද බෙහෙත් ශාලා පවත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වාගෙන යාම සඳහා රජය වියදම් කරනවාට මේ ගරු සභාවේ කවුරුවත් විරුද්ධ වේය කියා මම හිතන්නෙ නැහැ.

**ඔබේසේකර මයා.**
*(திரு. ஒபயசேக்கர)*
(Mr. Obeyesekere)

පස් ගුණයක් නොවෙයි, හය ගුණයක් දෙනවා.

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

ගරු කථානායකතුමනි, මේ වාතීං පමණක් බලාලා මදි. හුඟක් පළාත් පාලන මණ්ඩලවලින් ආයුර්වේද බෙහෙත් ශාලා පවත්වාගෙන යන්නෙ නැහැ. මෙම වෛද්‍ය ක්‍රමය අනුව පවත්වාගෙන යන ස්ථාන ප්‍රමාණවත් මදි. අළුතෙන් පත් කළ ආයුර්වේද මණ්ඩලය මෙම වැඩ පිළිවෙළ ගෙන යාම පිණිස මීට වඩා වැඩි මුදලක් වෙන් කරාවිය කියා මා විශ්වාස කළා. පළාත් ආණ්ඩු සභා සහ සුළු නගර සභා යනුවෙන් [බාධා කිරීමක්]—ගරු කථානායකතුමනි, මෙහි සඳහන් කර තිබෙන්නෙ යූ. සී. සහ ටී. සී. ආයතන ගැනයි. යූ. සී. කියන්නෙ මධ්‍යම පංක්තියේ ගැණෙන නගර සභායි. ටී. සී. නොහොත් ටවුන් කවුන්සිල්ස් කියන්නෙ පොඩි නගර සභාවලටයි. මෙම ආයතන දෙවර්ගයට ලැබෙන ආදායම් අතර විශාල වෙනසක් තිබෙනවා. නමුත් මෙහි ප්‍රධාන වරද වී තිබෙන්නෙ මේ දෙකොටසම එකට ගොනු කර එකම ආධාර ක්‍රමයක් අනුව ආණ්ඩුවෙන් ආධාර දීමයි. පළාත් ආණ්ඩු සභාවලට සහ සුළු නගරසභාවලට මෙම ආයුර්වේද බෙහෙත්ශාලා පවත්වාගෙන යාම පිණිස සියයට හැත්තෑපහක ආධාර මුදලක් දෙනවා. නමුත් මෙහි වෙනසක් තිබිය යුතු බවයි මා කියන්නෙ. ඒ සමඟම ගම්කාර්ය සභාවලට සියයට අනූවක ආධාර මුදලක් දෙන්ට යනවා. මෙය නම් කොහෙත්ම සතුටුදායක නැහැ. මෙම පළාත්වල සිටින උදවිය තමයි වැඩි වශයෙන්ම මේවායින් ප්‍රයෝජන ගන්නෙ. සාමාන්‍ය වශයෙන් කල්පනා කර බැලුවාම සුළු නගරසභා සීමාවන් තුළ පිහුටුවනු ලබන බෙහෙත් ශාලාවලට අවට සිටින ගම්වල උදවිය මෙන්ම නගරයේ අද්දර ජීවත් වෙන උදවියත් බහුල වශයෙන් ඇදී යාවිය කියා අපට හිතා ගන්න පුළුවන්. ඒ නිසයි මා මුලින් කීවේ මෙම ආයතන දෙකම එකට ගොනු කර එකම ක්‍රමයක් අනුව ආධාර දීම සුදුසු නැතෙයි කියා.

ගරු කථානායකතුමනි, ගම්කාර්ය සභාවලට නම් සියයට 90 ක ආධාරයක් දුන්නත් මදි බවයි මා කියන්නෙ. මගේ කොට්ඨාශයේ තිබෙන එක් ගම්කාර් සභාවක් ගැන මා හොඳින් දන්නවා. එහි වාර්ෂික ආදායම රුපියල් 6,000 ක් පමණයි. එම සභාවේ සේවකයින්ගේ පඩි නඩි ආදිය ගෙව්වායින් පසුව කිසිවක් එම මණ්ඩලයට ඉතිරි වන්නෙ නැහැ. බොහෝ ගම්කාර්ය සභාවල ආදායම් තත්ත්වය සතුටුදායක නැති බව අප සැම දෙනාම දන්නවා. ඒ නිසයි මා කියන්නේ ගම්කාර්ය සභා මගින් පාලනය වනු ලබන පළාත්වල පිහිටුවන ආයුර්වේද බෙහෙත් ශාලා ස්වදේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුව මගින්ම පිහිටුවිය යුතුය කියා. මෙම වෛද්‍ය ක්‍රමයෙන් වැඩි වශයෙන්ම ප්‍රයෝප්‍රයෝජනය ගනු ලබන ජනතාව ජීවත් වන්නේ ගම්බද පළාත්වලයි. ඒ හෙයින් එම පළාත්වල පිහිටුවනු ලබන බෙහෙත් ශාලා කෙලින්ම ආණ්ඩුව මගින්ම පවත්වාගෙන යාම පිණිස කටයුතු කරන්නය කියා මා ගරු පාර්ලිමේන්තු ලේකම්තුමාගෙන් ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා.

ඒ සමඟම මතක් කළ යුතු තවත් කාරණයක් තිබෙනවා. තවමත් මේ ආණ්ඩුව ආයුර්වේදයට සලකන්නේ ඉතා පහත් තත්ත්වයකිනුයි. මේ ආණ්ඩුව බලයට පැමිණීමට ආයුර්වේද වෛද්‍යවරුන්ගේ උපකාර ලැබුණා. ආයුර්වේද වෛද්‍ය ක්‍රමය දේශීය දෙයක්. ඒ ස්වදේශීය වෛද්‍ය ක්‍රමයට නිසි තැනක් දුන්නොත් විදේශීය වෙළඳ හුවමාරු මුදල් අඩුවේගන යනවාය කියා මහජනයා පිට බදු බර පටවන මේ වකවානුවේදී වෛද්‍ය පහසුකම් හා බෙහෙත් ද්‍රව්‍ය සඳහා පිටරට ඇදී යන මුදල්වලින් සෑහෙන ප්‍රමාණයක් මේ රටේම ඉතුරු කරගන්න පුළුවනි. නමුත් එවැනි තත්ත්වයක් තවමත් ආයුර්වේදයට දී නැහැ. 1956 සිට අද වන තුරු අනන්ත වාරයක් ශ්‍රී ලංකා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කේ. එම්. පී. රාජරත්න මයා.]

නිදහස් පක්ෂ ආණ්ඩුව ප්‍රතිඥා දී තිබෙනවා, ප්‍රකාශ කර තිබෙනවා, ආයුර්වේද වෛද්‍ය ක්‍රමයට නිසි තැන දෙනවාය කියා. නමුත් ඒ ගැන කිසිත් කර නැති බව මම පෙන්වන්නම්.

පළාත් පාලන ආයතන මඟින් බටහිර වෛද්‍ය ක්‍රමයේ බෙහෙත්ශාලාත්, දේශීය වෛද්‍ය ක්‍රමයේ බෙහෙත්ශාලාත් පවත්වාගෙන යනවා. නමුත් බටහිර වෛද්‍ය ක්‍රමය අනුව බෙහෙත්ශාලාවල වැඩ කරන වෛද්‍යවරුන්ටත්, දේශීය ක්‍රමය අනුව බෙහෙත්ශාලාවල වැඩ කරන වෛද්‍යවරුන්ටත්, ගෙවන පඩිවල ලොකු වෙනසක් තිබෙනවා. බටහිර වෛද්‍ය ක්‍රමයේ ආධුනිකයෙක් බැඳුනොත් ඔහුගේ පඩියේ පටන්ගැන්ම මාසයකට රුපියල් 400යි. සාමාන්‍යයෙන් මෙවැනි බෙහෙත්ශාලාවලට පත් වන්නේ ආධුනිකයින් නොවෙයි. අවුරුදු 4 ක් 5 ක් පළපුරුද්ද ඇති අයයි, මේවාට ගන්නේ. එවැනි පළපුරුදු ඇති බටහිර වෛද්‍යවරුන්ගේ පඩිය මාසයකට රුපියල් 700 ක් පමණ වෙනවා. නමුත් දේශීය වෛද්‍යවරුන්ගේ පඩිය රුපියල් 200 යි. වැඩිම වුවහොත් මාසයකට රුපියල් 200 ටත් 300 ටත් අතර ගණනක් ලැබෙනවා. මොකක්ද, මේකෙ තේරුම? මෙහෙමද ආයුර්වේදයට නැති නම් දේශීය වෛද්‍ය ක්‍රමයට සලකන්නේ? ඇයි මේ පරතරයක් තියන්නේ? එකම ආයතනයක සේවය කරන මේ වෛද්‍යවරුන් දෙකොටස අතර මේ තරම් පරතරයක් තබන්නේ ඇයි? මෙවැනි පඩි පරතරයක් තබා ගැනීමෙන් ආණ්ඩුව පෙන්නුම් කරන්නේ බටහිර වෛද්‍ය ක්‍රමය තරම් උසස් තත්ත්වයකට ආයුර්වේද වෛද්‍ය ක්‍රමය පැමිණ නැතැයි කියායි. වෙන හේතුවක් නම් අපට පෙනෙන්නේ නැහැ.

අපේ දේශීය වෛද්‍ය ක්‍රමය මේ රටේ වැසියාට ආවේණික වූ දෙයක්. මේ රටේ අවුරුදු දහස් ගණනක් තිස්සේ පැවත එන උසස් දෙයක්. ආයුර්වේද වෛද්‍ය ක්‍රමය බටහිර වෛද්‍ය ක්‍රමය පෝෂණය කිරීම සඳහා උපයෝගී කරගත් දෙයක්. මේ වෛද්‍ය ක්‍රමය සිංහල රාජ්‍යයේ සමාජවාදී අංශයේ ප්‍රධානම කොටසක්. එදා සිංහල රජදරුවන් ගමක් ගමක් පාසා බෙහෙත්ශාලා පිහිටෙව්වා. සෑම ගමකම සිංහල ආණ්ඩුවෙන් පත් කරන ලද වෛද්‍යවරයෙක් සිටියා. මේ වැදගත් සමාජ සේවා අංශය එදා සියලුම සිංහල රජදරුවන් විසින් පවත්වාගෙන ආවා. එදා අපේ සමාජවාදය ඒ තත්ත්වයෙන් තුබුණු නමුත් අද මේ 20 වන ශත වර්ෂයේ සමාජවාදී ආණ්ඩුවක්යයි උදන් අනන මේ ආණ්ඩුවට තවමත් පුළුවන්කමක් ඇති වී නැහැ, ගමක් ගමක් පාසා බෙහෙත්ශාලා පිහිටුවීමට. එදා පටන් පැවත එන්නාවූ මේ දේශීය වෛද්‍ය ක්‍රමයට විද්‍යාත්මක පදනමක් තිබෙනවා. බටහිර වෛද්‍ය ක්‍රමය අනුව සුව කර ගත නොහැකි අනන්තවත් රෝග දේශීය වෛද්‍ය ක්‍රමය අනුව සුව කර තිබෙනවා. රෝගියා නොමරා, දුර්වල නොකර රෝග සුව කරන්ට පහසුකම් ආර්වේද වෛද්‍ය ක්‍රමයේ තිබෙද්දී ආණ්ඩුව ඒ වෛද්‍ය ක්‍රමයට අතදී එය යථා තත්ත්වයට නංවා නොදී, ඒ වෛද්‍ය ක්‍රමයේ යෙදී සිටින වෛද්‍යවරුන්ට නිසි තැනක් නොදී, පිටින් ගෙනා වෛද්‍ය ක්‍රමයක් උසස් ලෙස සලකා කටයුතු කිරීම කනගාටුදායක කරුණක්. බටහිර වෛද්‍ය ක්‍රමය නරක යයි මා කියන්නෙ නැහැ. එයින් ලබා ගැනීමට පුළුවන් පහසුකම් අනන්තයි. නමුත් ඒ වගේම රෝග සුව කර ගැනීමට ආයුර්වේදයෙනුත් ලබා ගැනීමට පුළුවන් පහසුකම් අනන්තයි. අද අපි ලබා ගන්නෙ බටහිර වෛද්‍ය ක්‍රමයේ පහසුකම් පමණයි. බටහිර ක්‍රමය වෙදකම් කරන වෛද්‍යවරුන් විශාල ධනස්කන්ධයක් පිටරට ඇදී යන අන්දමට කටයුතු කරනවා. බටහිර වෛද්‍යවරුන් අද ඒක ජාවාරමක් කරගෙන තිබෙනවා. එසේ තිබෙද්දී බටහිර වෛද්‍ය ක්‍රමය ගෙන යන වෛද්‍යවරයාට වැඩි පඩියකුත්, ආයුර්වේද වෛද්‍යවරයාට ඉන් අඩකටත් අඩු පඩියකුත් දීම ඉතා කනගාටුදායක තත්ත්වයක්. ඒ නිසා පාර්ලිමේන්තු ලේකම්වරයාගෙන් මා දැනගන්න සතුටුයි, මේ රුපියල් 4,50,700 යොදා ඉදි කරන්ට යන බෙහෙත්ශාලාවල සේවයට ගන්න වෛද්‍යවරුන්ට බටහිර වෛද්‍යවරුන්ගේ වැටුප් ක්‍රමය දෙනවාද නැද්ද කියා. ඒකට අපට පැහැදිලි පිළිතුරක් ඕනෑ. අපි දැනගන්ට කැමතියි, අද තිබෙන අන්දමටම විශාල පරතරයක් තබාගෙන තවදුරටත් ඒවායේ කටයුතු කරන්ට යනවාද කියා. කටයුතු කරන්ට අදහස් කරන්නෙ ඒ අන්දමට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නම් විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන් බොහෝ දෙනකු ප්‍රකාශ කළාක් මෙන් මෙහි නියම ප්‍රතිඵල මහජනයාට ලැබෙන්නෙ නැහැ. මේ කුඩම්මාගේ සැලකිල්ල නිසා එවිට ආයුර්වේද වෛද්‍යවරුන්ට නියම තැනක් ලැබෙන්නෙ නැහැ. ඒ නිසා ඔවුන්ට හරියාකාර කටයුතු කරන්ට පුළුවන්කමක් ලැබෙන්නෙ නැහැ. මේ ගැන අප්‍රමාදව සැලකිල්ලක් දක්වන්ට ඕනෑ. 1956 සිට දැන් කල් දැම්මා ඇති. 1956 හිටන්ම ආයුර්වේදය ගැන කථා කළා. ආයුර්වේදය ගැන ප්‍රකාශන කළා. ආයුර්වේදය ගැන ප්‍රතිඥා දුන්නා. එහෙත් ඒ ප්‍රතිඥා එකක්වත් අදවන තුරු ක්‍රියාවට පරිවර්තනය කිරීමේ වැඩ පිළිවෙළක් යෙදී නැහැ. දැනට කරන්නෙ අතනින් මෙතැනින් පැලැස්තර දැමීම යි.

ගරු කථානායකතුමනි, තවත් වැදගත් කරුණක් මතක් කරන්ට තිබෙනව. මේ මුදල් වැය කරන්නෙ පළාත් ආණ්ඩු සභා මගින් බෙහෙත්ශාලා ඉදි කර පවත්වා ගෙන යාමටයි. ඒවායින් බෙහෙත් ගන්ට ලෙඩුන් එනවා. එපමණක් නොවෙයි, අසනීප සෑදුණු ආණ්ඩුවේ සේවකයනුත්, ඒ වගේම පෞද්ගලික ආයතනවල සේවකයනුත්, ඒ ස්ථානවලින් බෙහෙත් ලබා ගන්නවා. ඔවුන් තමන් රැකියාව කරන ස්ථානයට ඉදිරිපත් කිරීමට සහතික ලබා ගන්න ඕනෑ. එම නිසා වෛද්‍ය සහතික දීමත් ඒ බෙහෙත්ශාලාවලින් කළයුතු වැඩක්. එය වෛද්‍යවරයාගේ කර්තව්‍යයක්. ඒක නැහැ කියන්ට බැහැ. ඒ ගැන මට ප්‍රශ්නයක් අහන්ට තිබෙනවා. දැනට ආයුර්වේද වෛද්‍ය සහතික පිළිගන්නෙ නැති තැන් අනන්තයි. ඒ සහතික පිළිගන්නෙ දවස් 7 කට හෝ 14 කට පමණයි. අසනීපයකට ඊට වඩා වැඩි දවස් ගණනක් නිවාඩු ගන්න වුවමනා නම් ඒ සඳහා බටහිර දොස්තර කෙනකුගේ සහතිකයක් වුවමනා කරනවා. මොකක්ද මේකෙ තේරුම ? සිංහල වෙදමහත්මයකුගෙන් බෙහෙත් ගෙන ඉංග්‍රීසි දොස්තර මහත්මයෙකුගෙන් වෛද්‍ය සහතිකයක් ගන්න බැහැ.

**චන්ද්‍රසේන මුණවීර මයා.** (රත්තොට)
*(திரு. சந்திரசேன முனவீர—ரத்தோட்டை)*
(Mr. Chandrasena Munaweera—Rattota)
සරම අඳින නිසා.

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)
සරම අඳින නිසාද ඒ අයට සලකන්නෙ නැත්තෙ ? රත්තොට ගරු මන්ත්‍රීතුමා ඇත්තක් කිව්වා. සිංහල වෙද මහත්මයෙක් බෙහෙත් දුන්හැටියෙ අසනීපය සනීප වෙන්නෙ නැහැ. ආයුර්වේද ක්‍රමය අනුව ක්ෂණික සුවය දකින්න බැහැ. ඉංග්‍රීසි ක්‍රමය අනුව ලෙඩක් ක්ෂණිකව සුව කරන්න පුළුවන්කම තියෙනවා. නමුත් ඒක තව රෝගයකට මුල පිරීමක්. එම නිසා ප්‍රතිකාර ලබන්නා හැමදාම ලෙඩෙක්, රෝගියෙක්. ආයුර්වේද ක්‍රමය අනුව, රෝග නිධානය සොයා බලා ක්‍රමානුකූලව තුන් දොස් සමනය කරලයි, සනීප කරන්නෙ. ඉංග්‍රීසි වෙදකමේ එහෙම එකක් නැ. කල් ගත වීම ආයුර්වේද ක්‍රමයෙහි නිරායාසයෙන්ම අන්තර්ගත වී තිබෙන දෙයක්. ආයුර්වේද වෛද්‍ය සහතික භාර ගන්නෙ දින හතකටයි, නැතිනම් දාහතරකටයි. දහතරකට වැඩි නම් බාර ගන්නෙ නැති බව මා ස්ථිර වශයෙන්ම දන්නවා. නමුත් බටහිර දොස්තරවරුන් ගෙ වෛද්‍ය සහතික මාස ගණනකට වුවත් භාර ගන්නවා. ඒ ගැන දැන් පැහැදිලි ප්‍රකාශයක් කරන්න ඕනෑ. මෙම ක්‍රමය වෙනස් කරන්න ඕනෑ. ධනය බැහැල තියෙනවය කියල කියන්න ඕනෑ නැහැ. මෙතන කිසිම මුදල් ප්‍රශ්නයක් නැහැ. මෙහි බැරෑරුම් කමක් නැහැ. ආණ්ඩුවෙ අවංක චේතනාවක් තියෙනව නම් හෙටම වුණත් පුළුවනි, මේක කරන්න. "මෙන්න, ආයුර්වේද ක්‍රමයට නියම තැන දීමේ පියවරක් වශයෙන්, ආයුර්වේද වෛද්‍ය සහතික පිළිගැනීමද බටහිර වෛද්‍යවරුන්ගෙ සහතික පිළිගැනීමේ තත්ත්වයටම පත් කළා." කියන්න පුළුවනි. දෙපාර්තමේන්තු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කේ. එම්. පී. රාජරත්න මයා.]

ප්‍රධානීන් අද ආයුර්වේද වෛද්‍ය සහතික ගැන සැලකිල්ලක් දක්වන්නෙ නැහැ. ඒ අය හිතන්නෙ ඒවා යාළුකමට, මිත්‍ර කමට, දෙන සහතික කියලයි. ඒ නිසා ඒ ගැන වැඩි සැලකිල්ලක් දක්වන්නෙ නැහැ. මාරුවක් හෝ නිවාඩුවක් ගන්න ඕනෑ කරන කෙනෙක් ආයුර්වේද සහතිකයක් ඉදිරිපත් කළොත් එක බාර ගන්න බැහැ කියනව. බටහිර වෛද්‍ය සහතිකයක්ම ඉල්ලනව. එම තත්ත්වය නැති කරන්න ඕනෑ. මෙ තත්ත්වය නැති කරන්න කට යුතු යොදනවාද කියා දැනගන්න කැමතියි. පළමුවන කාරණය එයයි.

දෙවන කාරණය මෙයයි; රජයේ සේවක යකුට අසනීප වීම නිසා වැඩ කටයුතු කර ගෙන යන්න බැරි කමක් තියෙනවා නම් විශ්‍රාම යවන්න වැඩ පිළිවෙළක් තියෙ නවා. සෞඛ්‍ය හේතූන් උඩ විශ්‍රාම යැවීමේ රෙගුලාසියක් තියෙනවා. එවැනි තත්ත්ව යක සිටින රජයේ සේවකයකු සුව කරන්න පුළුවන්ද බැරිද කියන එක හොයා බලන්න වෛද්‍ය මණ්ඩලයක් තියෙනවා. ඒ සඳහා ඔහුව යවන්නෙ බට හිර වෛද්‍යවරුන් පිරිසක් ඉදිරිපිටටයි. බටහිර වෛද්‍ය මණ්ඩලයක් ඉදිරිපිටට නැතිනම් මෙඩිකල් බෝඩ් එකක් ඉදිරි පිටට යවනවා. ඇයි එම මණ්ඩලයට ආයුර් වේද වෛද්‍යවරු පත් නොකරන්නෙ? ආයුර්වේද වෛද්‍යවරුන්ට රෝග නිධානය හොයන්න පුළුවන් නම්, බෙහෙත් දෙන්න පුළුවන් නම්, කපන්නෙ කොටන්නෙ නැතුව බරපතළ රෝග කසායෙන් දෙකෙන් සුව කරන්න පුළුවන් නම්, ඇයි බැරි එවැනි අය කීප දෙනෙක්ම එම මණ්ඩලයට පත් කරන්න. රෝගියාගේ තත්ත්වය අනුව ඔහුට දිගටම සේවයේ ඉන්න පුළුවන් ද බැරිද කියල විනිශ්චය කරන්න ඒ අයට බැරිද? කරන්න පුළුවනි. නමුත් අද වන තුරු ක්‍රියාවේ යොදවන්නෙ අධි රාජ්‍ය ක්‍රමයක්. අද වන තුරු ආයුර්වේද වෛද්‍යවරුන් පත් කර නැහැ, එවැනි වෛද්‍ය මණ්ඩලවලට. පත් කරන්නෙ, බට හිර වෛද්‍යවරුයි. එම ක්‍රමය ඉවත් කරන වද? ආයුර්වේද වෛද්‍යවරයකුගෙන් බෙහෙත් ගත්ත අයෙක් කියනව නම් තමන්ගෙ රෝගාතුරකම ගැන විමසා බලා වාර්තා කරන්න ආයුර්වේද වෛද්‍යවරුන් ගෙන් සමන්විත මණ්ඩලයක් ඕනෑය කියා, එසේ ඉඩ දෙනවාද, නැද්ද? ඒ ගැන පිළිතුරක් මේ අවස්ථාවේදී අප බලා පොරොත්තු වෙනවා.

තුන් වන කරුණය මෙයයි; තමුන්නාන් සේ දන්නවා අර්ථසාධක අරමුදල ගැන. යම්කිසි ආබාධයක් නිසා දිගටම රාජකාරී කටයුතු කිරීම අපහසු වූ තැනැත්තන් සෞඛ්‍ය හේතූන් උඩ සේවයෙන් අස් වෙන්නෙ අවුරුදු 55 වීමට කලිනුයි. වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කළොත් ඒ අයට තමන්ගෙ වයස අවුරුදු 55 වන්නට කලින් අර්ථසාධක අරමුදල් ලබා ගන්ට පුළුවනි. ඒ සඳහා ආයුර්වේද වෛද්‍ය සහතික භාර ගන්නෙ නැහැ. බටහිර ක්‍රමයේ වෛද්‍ය වරයෙකුගෙන් සහතිකයක් ගෙනෙනතුරු ඒ මුදල් ගන්ට බැහැ. ඇයි මෙහෙම කරන්නෙ? ආයුර්වේද වෛද්‍යවරුන්ගෙ සහතික පිළිගන්නෙ නැත්තෙ ඇයි? ඒ ගැනත් පිළිතුරක් ආණ්ඩුවෙන් බලා පොරොත්තු වෙනවා. මේ සහතික පිළි ගැනීම සම්බන්ධයෙන් වැඩ පිළිවෙළක් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව නැත්නම් අමාත්‍යාංශය යොදන්නෙ නැද්ද කියා මා අහනවා. සෞඛ්‍ය අමාත්‍යාංශයට තනිවම මෙය කරන්ට බැරි දෙයක් බව මා දන් නවා. ඒ නිසා කම්කරු අමාත්‍යාංශයත් සමග මෙය කරන්ට පුළුවනි. සෞඛ්‍ය අමාත්‍යාංශය මේ ගැන තරයේ කිව්වොත් කම්කරු දෙපාර්තමේන්තුව එය ප්‍රතික් ෂේප කරන්නෙ නැහැ. වැඩි වියදමක් නැතිව, වැඩි කරදරයක් නැතුව කරන්ට පුළුවන් මෙවැනි දේවල් නොකරන්නෙ ඇයි?

ආයුර්වේද වෛද්‍යවරුන් ආයුර්වේද බෙහෙත් ශාලාවලට පත් කරනවා. පත් කිරීම සඳහා තෝරා ගනු ලබන්නෙ ලියා පදිංචි කරනු ලැබූ වෛද්‍යවරුන් පමණයි කියා මා හිතනවා. මම හරියටම දන්නෙ නැහැ. ලියා පදිංචි නුවූ අය පත් කරන් නෙ නැත්නම් ඒ ගැනත් වචනයක් කියන්ට ඕනෑ. වෛද්‍යවරුන් ලියා පදිංචි කිරීම අවසන් කළේ 1952 දීය කියා මා හිතනවා. ඊට පස්සෙ නවම වෛද්‍යවරුන් ලියා පදිංචි කර නැහැ. මා නියෝජනය කරන වැලිමඩ කොට්ඨාශයේත්, ඌව- පරණගම කොට්ඨාශයේත් සමහර දක්ෂ වෛද්‍යවරුන්ට 1952ට කලින් තමන්ගේ නම් ලියා පදිංචි කරවා ගන්ට බැරි වුණා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මොන හේතුවක් නිසා හෝ එවැනි තත්ත්වයක් ඇති වූ නිසා, පැරණි සිංහල වෛද්‍ය ක්‍රමය හොඳාකාර ප්‍රගුණ කර සිටින එම වෛද්‍යවරුන්ට මුහුණ පාන්ට සිදු වූ ඒ කනගාටුදායක තත්ත්වය ගැන දැන ගන්ට ලැබුණු වහාම ඒ ගැන වෛද්‍ය මණ්ඩලයට දන්වා සිටියා. අලුත් පණත එන්ට ඉස්සරවෙලා මේ වෛද්‍යවරුන් ලියා පදිංචි කළ යුතුය කියා දැන්නුවා. ඊට අපට ලැබුණු උත්තරය මොකක්ද ? 1952ට පෙර ලියා පදිංචි කරවා ගන්ට බැරි වුණා නම් නැවත දන්වන තුරු යළිත් ලියා පදිංචි කරන්ට බැරිය කියලයි දැන්නුවෙ. පරම්පරාගත වෛද්‍ය ක්‍රම අනුවත්, උගත් කම අනුවත් දක්ෂ ලෙස රෝග සුව කරන අය වුවත් මේ අයට ලියා පදිංචි නොවීම නිසා ලෙඩුන්ට ප්‍රතිකාර කිරීමට නීත්‍යානුකූලව අවසරයක් නැහැ. ඒ නිසා මේ අයගෙන් ප්‍රතිකාර ලත් යම් රෝගියෙක් අවාසනාවකට මළොත් ඒ වෙනුවෙන් අර වෛද්‍යවරයාට සිදු වෙන්නෙ දණ්ඩ නීතිය යටතේ බරපතළ දඬුවමකට ලක් වීමටයි. පළ පුරුදු දක්ෂ වෛද්‍යවරුන් වුවත් යම්කිසි කාරණයක් නිසා 1952ට පෙර ලියා පදිංචි වීමට නොහැකි වූ බැවින් සිදුවන දේ තමයි ඒ. මේ වෛද්‍යවරුන්ට දැන්වත් අවස්ථාවක් දුන්නොත් පමණයි මේ බෙහෙත් ශාලාවලට දක්ෂ වෛද්‍යවරුන් පත් කර ගන්ට පුළුවන් වන්නෙ. ලියා පදිංචි කිරීම නතරකර දැන් අවුරුදු 10ක් ඉකුත් වී තිබෙනවා. ඒ කාලයේ ලියා පදිංචි කරවා ගැනීමට බැරි වූ වෛද්‍යවරුන්ට නැවත වරක් ඒ සඳහා වැඩ පිළිවෙළක් ඇති කරනවාදැයි ගරු පාර්ලිමේන්තු ලේකම්තුමාගෙන් දැනගන්ට කැමතියි.

ස්වදේශීය වෛද්‍ය විද්‍යාලයේ ඉගෙනීම ලබමින් සිටි වෛද්‍ය ශිෂ්‍ය පිරිසක් කල්කටාවට ගිහිල්ල වෛද්‍යවරුන් වශයෙන් සහතික ලබා ගත්තා. ඒ අයට කල්කටාවට යන්ට සිද්ධ වුණේ යම්කිසි අර්බුදයක් නිසයි. ඒ අර්බුදය ගැන යමක් කියන්ට අදහසක් නැහැ. ඒ අර්බුදය සම්බන්ධයෙන් මා දරන මතය ගැන හෝ වෙනත් මතභේද ආදියක් ගැන මේ අවස්ථාවේ යමක් කියන්ට වුවමනාවක් නැහැ. කෙසේ වෙතත් ඒ ශිෂ්‍යයින් කල්කටාවේ පුහුණුව ලබා සහතික සහිතව පැමිණ සිටිනවා. ඒ අය වෛද්‍යවරුන් වශයෙන් ලියා පදිංචි කරන්නෙ නැහැ. ඒ නිසා ඒ අයට බෙහෙත් හේත් නියම කරන්ට නීතියෙන් අවසරයක් නැහැ. යම් විධියකින් ඒ අය ලෙඩුන්ට ප්‍රතිකාර කළොත් බැරි වෙලාවත් ඒ ලෙඩකු මළොත්, ලියා පදිංචි නොවී ප්‍රතිකාර කිරීම නිසා දණ්ඩ නීතියේ හැටියට ඒ අයට දඬුවම් විඳින්ට සිදු වෙනවා. ඒ අය බෙහෙත් ශාලා දමාගෙන බෙහෙත් දෙන නිසා, ඒ අයගේ බෙහෙත් බීමෙන් මහජනයාට හිරිහැරයක් කරදරයක් නොවන නිසා, අකාලයේ මිනිසුන් නොමරපු නිසා, ඔවුන්ගේ බෙහෙත්වලින් මිනිසුන් සනීප වී තිබෙන නිසා—ඒවා වාර්තා වී ඇති ; කරදරයක් නැතිව සොයා ගන්නට පුළුවනි—ඒ වෛද්‍යවරුන්ටත් ලියාපදිංචිවීමට අවස්ථාවක් දෙන්ට ඕනෑ. එසේ නොකොළොත් එය ලොකු අසාධාරණයක්. ඒක තරුණයින් එකසිය ගණනකගේ ජීවිත කාලකන්නි කිරීමක්. ඒ නිසා මේ ලියා පදිංචි කිරීමේ ප්‍රශ්නය ඉතා වැදගත් ප්‍රශ්නයක්. මේ ප්‍රශ්නය ගැන ආණ්ඩුව කරන්න යන්නේ කුමක්ද කියා දැන ගන්න කැමතියි.

අවසාන වශයෙන් තවත් එක කරුණක් මතක් කරන්න තිබෙනවා. ආයුර්වේදයට ආණ්ඩුව දක්වන සැලකිල්ල කුමක්ද කියා තමුන්නාන්සේ දන්නවා. අද යුද්ධ හමුදාවේ සොල්දාදුවන්ට ආයුර්වේද වෛද්‍ය පහසුකම් ලබා ගැනීම බටහිර වෛද්‍ය පහසුකම් ලබා ගැනීම තරම් පහසු නැහැ. බටහිර වෛද්‍ය පහසුකම් ලබා ගන්නට ඕනෑ තරම් නිවාඩු දෙනවා, නමුත් ආයුර්වේද පහසුකම් ලබා ගන්නට හරියාකාර නිවාඩුවක් දෙන්නේ නැහැ. ඒ අයට හිරිහැර කරනවා. ඒ ප්‍රශ්නය යුද්ධ හමුදා වැය ශීර්ෂය පැමිණි විට මතු කිරීමට බලාපොරොත්තු වෙනවා. ඒ අවස්ථාව පැමිණි විට දීර්ඝ වශයෙන් කියන්නට බලාපොරොත්තු වෙනවා. දැන් එය කෙටියෙන් මතක් කරන්නේ. මේ කාරණය ආයුර්වේද වෛද්‍ය මණ්ඩලයට ගත යුතු ප්‍රශ්නයක්. මෙය ආයුර්වේද වෛද්‍ය ක්‍රමයට කරන ලොකු අපහාසයක්. මෙය ආයුර්වේද වෛද්‍ය ක්‍රමය හෙළාදැකීමේ වැඩ පිළිවෙළක් නිසා කවදා හරි වෛද්‍ය මණ්ඩලයට ඉදිරිපත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කේ. එම්. පී. රාජරත්න මයා.]

කළ යුතු ප්‍රශ්නයක්. ඒ නිසයි මේ අවසථා වේදී මේ ප්‍රශ්නය කෙටියෙන්ම මතක් කළේ.

මීට වඩා වේලාව ගන්නට මා අදහස් කරන්නේ නැහැ. මා ඉල්ලා සිටින්නේ එකයි. මේ මුදල නම් කිසිසේත්ම ප්‍රමාණ වත් නැහැ. ඒ කෙසේ වෙතත් මේ මුදල යම්කිසි සේවයක් සඳහා යෙදවේය කියා බලාපොරොත්තු වෙනවා. ඒ සේවය ලබන්නට නම්, ආයුර්වේද වෛද්‍යවරුන්ටත් බටහිර වෛද්‍යවරුන්ටත් එක හා සමාන තත්ත්වයක් දෙන්නට ඕනෑ. මෙපමණ කලක් ආයුර්වේද වෛද්‍යවරුන්ට තිබුණු කුඩම්මාගේ සැලකිල්ල, පහත් සැලකිල්ල, බටහිර වෛද්‍යවරුන්ට තිබුණු උසස් සැල කිල්ල, දැන්වත් වෙනස් කරන්න ඕනෑ. එසේ කළොත් පමණයි, මේ සම්මත කරන රුපියල් 4,50,700යේ හැම සතයකම සේවය නියමාකාරයෙන් මහජනතාවට ලැබෙන්නේ.

අ. භා. 5.27

**ඒ. රත්නායක මයා.** (වත්තේගම)
*(திரு. ஏ. ரத்னாயக்க—வத்தேகம)*
(Mr. A. Ratnayake—Wattegama)

ගරු කථානායකතුමනි, ආයුර්වේදය සම්බන්ධව වචනයක් දෙකක් කියන්නට සතුටුයි. විප්ලවයක් ඇති කර 1956 දී මේ ආණ්ඩුව බලයට පත් වුණේ, ආයුර්වේද වෛද්‍යවරුන්, ගුරුවරුන්, කලාකරුවන්, භාමුදුරුවරුන්, ඔය ආදී චතුර්විධ බලයකින් මට මතකයි ආයුර්වේදය පුරාණ කාලයේ තිබුණු තත්ත්වයටම පත් කරනවාය කියා ඒ කාලයේ නොයෙකුත් පොරොන්දු දුන්නා.

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)

ඔය සියල්ල මේ වැය ශීර්ෂයට අදාළද ?

**ඒ. රත්නායක මයා.**
*(திரு. ஏ. ரத்னாயக்க)*
(Mr. A. Ratnayake)

ආයුර්වේදය පුරාණ කාලයේ තිබුණු තත්ත්වයටම පත් වේය කියා ලොකු බලාපොරොත්තුවක් තිබුණා. ලංකාවේ ආයුර්වේද වෛද්‍යවරුන් පත් දහසක් නැත්නම් දහ දහසක් පමණ ඉන්නවා. ඒ කවුරුත් බලාපොරොත්තු වුණා ආණ්ඩුවේ පඩියකට පත් වේය කියා. හැම කෙනකුටම මාස් පතා පඩියක් ලැබේය කියා, හැම වෙද මහත්මයෙක්ම මේ ආණ්ඩුව බලයට පත් කරන්නට ඒ පක්ෂයට බැඳී කටයුතු කළා. නමුත් අද මුළු ආයුර්වේදයම ඉතා පහත් තත්ත්වයකටයි වැටී තිබෙන්නේ. ආයුර් වේද ඉතිහාසයේම එය මෙවැනි පහත් තත්ත්වයකට වැටී තිබෙනවාය කියා මා හිතන්නේ නැහැ. මේ කරුණු ගැන දන්න ආයුර්වේද වෛද්‍යවරයෙක් මා සමග කථා කරමින් සිටින විට ඔහු කිව්වා, අද තරම් ආයුර්වේදය දුර්වල තත්ත්වයක තිබුණේ නැත කියා. ආයුර්වේදය සඳහා විශාල වියදමක් කර තිබෙනවා. ආයුර්වේද පර්යේෂණ පවත්වන ආයතනයක් විවෘත කරන්නට ලබන මාසයේදී නේරු මහත්මයාත් එනවා. ඒ අතින් අද බොහෝ වැඩ කර තිබෙනවාය කියන නමුත්, දිනෙන් දින වඩ වඩා ආයුර්වේදය දුර්වල වෙනවාය කියා මට මේ වෙද මහත්මයා කීවා. පුරාණයේ සිටම වෙද මහත්වරු නොයෙක් නොයෙක් බෙහෙත් වර්ග සෑදුවා. එහෙත් අද එසේ බෙහෙත් සාදන වෙදමහතුන් සිටින්නේ ඉතා සවලපයයි. ඊට හේතුව ඖෂධ නැති වීමයි. පිටකොටුවේ ගබෝස් ලේන් වීදිය සම්පූර්ණයෙන්ම බෙහෙත් කඩවලින් ගහණව තිබුණා. නමුත් අද බෙහෙත් සාප්පු ක්‍රමක්‍රමයෙන් වසා ගෙන යනවා. මීට ටික කලකට පෙර වෙදමහත්වරුන්ට වුවමනා වූ සෑම බෙහෙත් ද්‍රව්‍යයක් ම මේ බෙහෙත් කඩවල තිබුණා. එහෙත් අද එහෙම තත්ත්වයක් නැහැ. බෙහෙත් වෙළඳුන්ටත් වෙදමහතුන්ටත් වුවමනා කරන බෙහෙත් ද්‍රව්‍ය අද සොයා ගැනීමට අමාරුයි. යම් හෙයකින් තිප්පිලි වුවමනා වුවහොත්, මිනිහෙක් යොදවා තිප්පිලි හොණ්ඩර ගණනක් සොයා ගැනීමට ඒ කාලයේ පුළුවන්කම තිබුණා. එහෙත් අද ජනගහනය වැඩි වීම, කැළෑ එළි කිරීම, යනාදී කරුණු උඩ මේ බෙහෙත් ද්‍රව්‍ය මේ රටින්ම සොයා ගැනීම අසීරු කාර්යයක් වී තිබෙනවා. ඒ කාලයේ නොයෙක් නොයෙක් බෙහෙත් වර්ගවලින් චූර්ණ, ගුලි, ආදී බෙහෙත් ද්‍රව්‍ය නිෂ්පාදනය කළ වෙදමහතුන් අද එසේ කරන්නේ නැහැ. දැන් හැම දෙනාම බෙහෙත් ගෙන්වන්නේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඉන්දියාවෙන්. සිද්ධාර්ථය, නේත්‍රා නන්දය, ආදී බෙහෙත් තෙල් වර්ග පවා දැන් ඉන්දියාවෙනුයි ගෙන්වන්නේ. මේ සඳහා රුපියල් ලක්ෂ ගණනක් වැය වෙනවා.

ගරු කථානායකතුමනි, අද ආයුර්වේද ශිෂ්‍යයන්ට ඖෂධ අඳුනා ගන්ට බැරි වෙනවා. හොඳ ඖෂධ සාදන ස්ථානයක් රජය මගින් ඇති කරන්ට යනවාය කියා මට ආරංචියි. ඒක හොඳයි. එහෙත් අද ආයුර්වේද ශිෂ්‍යයන් පවා අමුක්කරා කියන්නේ මොනවාද කියා දන්නේ නැහැ. තත්ත්වය ඒකයි. එහෙත් පෙර සිටි වෙද මහතුන් අමුක්කරා හෝ වෙන ඕනෑම බෙහෙත් වර්ගයක් තිබෙන තැනුත්, ඒවා වුවමනා ප්‍රමාණයක් සපයා ගැනීමටත්, දැන සිටියා. එහෙත් අද එහෙම තත්ත්වයක් නැහැ. දසමූල අරිෂ්ට යනාදිය අද වෙදමහතුන් මිළ දී ගන්නේ පිට කොටුවේ වෙළඳ සැල්වලිනුයි. පෙර මේ බෙහෙත් නිෂ්පාදනය කළ වෙදමහතුනුත් අද කපාඩියා වැනි සමාගම්වලින් මේ බෙහෙත් මිළ දී ගන්නවා. මෙවැනි තත්ත්වයක් උඩ ආයුර්වේදය දියුණුය කියා අප කියන්නේ කොහොමද? ගරු කථානායකතුමනි, තවම වෙදමහතුන්ට සහතික පත්‍ර දෙන්නවත් බැරි වුණා. මේ තත්ත්වය පාර්ලිමේන්තු ලේකම්තුමා අවබෝධ කරගන්නවා නම් හොඳයි.

ගරු කථානායකතුමනි, ඉංග්‍රීසි ක්‍රමයට, සිංහල ක්‍රමයට, ආයුර්වේද ක්‍රමයට හෝ වේවා, සිද්ධ ක්‍රමයට, යුනානි ක්‍රමයට හෝ වේවා, අපට වුවමනා කරන්නේ ලෙඩ සුව කර ගැනීමයි. කෙසේ හෝ අපට වුවමනා කරන්නේ ලෙඩ සුව කිරීමයි; සෞඛ්‍යය ආරක්ෂා කිරීමයි. ඒ නිසා ඉංග්‍රීසි වෛද්‍යවරුන් ආයුර්වේද බෙහෙත් වර්ග අඳුනා ගෙන ඒවායිනුත් ප්‍රයෝජන ගන්නවා නම් බොහොම හොඳයි. ඉංග්‍රීසි වෛද්‍යවරුන් බොහොම දෙනකු සිංහල වෙදකම් කරන බව මා දන්නවා. කොළ වර්ග කන්න ඒ අය දැන් නියම කරනවා. ඒ වගේම උණ රෝගය වැළඳුණු විට කොත්තමල්ලි බොන්න නියම කරනවා. වෛද්‍ය විද්‍යාලයේ ශිෂ්‍යයන්ටත් ආයුර්වේදය පිළිබඳව උගන්වා ආයුර්වේද බෙහෙත් වර්ගවල ගුණාගුණ දැනගන්න සැලැස්විය යුතුයි. එසේ කරතොත් බොහොම හොඳයි. පුරාණයේදී වෙදකම් පිළිබඳව ලොකු ප්‍රසිද්ධියක් ඇති වෙදවරුන් හිටියා.

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)

මේ වැය ශීර්ෂය පළාත් පාලන ආයතනවලට ආධාර මුදලක් දීම ගැනයි.

**ඒ. රත්නායක මයා.**
*(திரு. ஏ. ரத்நாயக்க)*
(Mr. A. Ratnayake)

ඔව්, මා වැඩි වේලාවක් කථා කරන්ට යන්නේ නැහැ. පුරාණයේ සිට පැවත එන හුඟක් ප්‍රසිද්ධ වෙද පරම්පරාවල් තිබෙනවා. ඉස්සර නම් හොඳ දක්ෂ වෙදවරුන් හිටියා. අත්තරගම වෙදකම අජීර්ණ රෝගය සඳහා බොහොම ප්‍රසිද්ධයි. මඩපාත සීනිගම ආදී තවත් ප්‍රසිද්ධ වෙද පරම්පරා ගණනක් තිබෙනවා. නමුත් දැන් මේ වෙද පරම්පරාවල දරු මුණුපුරන් සම්පූර්ණයෙන්ම වාගේ වෙදකම අත්හැරගෙන යනවා. අත්තරගමට හුඟක් ලෙඩුන් යනවා. එහි ආණ්ඩුවේ ආධාරය ලැබෙන පොඩි ඉස්පිරිතාලයක් තිබෙනවා නම් ඒ ලෙඩුන්ට ලොකු පහසුවක් ලැබෙනවා ඇති. ඒ නිසා ඒ පහසුකම ආණ්ඩුව මගින් සලසා දෙනු ලැබෙතොත් බොහොම හොඳයි. මේ කරුණු ගැන සලකා බලනවා ඇතැයි විශ්වාස කරමින් මගේ කථාව අවසන් කරනවා.

අ. භා. 5.38

**මැතිව් මයා.**
*(திரு. மதியூ)*
(Mr. Mathew)

ගරු කථානායකතුමනි, මේ වැය ශීර්ෂය යටතේ නියම විධියට වැඩ කරනවා නම් මා නියෝජනය කරන කොට්ඨාශයට විශාල සේවයක් සැලසෙනවා ඇති. මා නියෝජනය කරන කොට්ඨාශයේ සිටින ලෙඩුන් බටහිර වෛද්‍ය ක්‍රමයේ සරණ සොයා ගෙන යතොත් ආරෝග්‍යශාලාවට යා යුත්තේ පැදුරු කොට්ට, පිඟන් කෝප්ප රැගෙන පමණක් නොව සාත්තුව සඳහා යම්කිසි නෑනැත්තකු කැඳවා ගෙනයි. එසේ නැත් නම් නියම අත්දමින් ප්‍රතිකාර ලබා ගන්න

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[මැතිව් මයා.]

බැහැ. බටහිර වෛද්‍ය ක්‍රමය යටතේ තිබෙන ආරෝග්‍යශාලා දැන් පාලනය වන ආකාරය අනුව ඒ විධියේ තත්ත්වයක් පවතින බව කියන්ට සිදු වී තිබෙනවා. මේ කාරණය මා ඊයේත් මතක් කළා. එම නිසා ස්වදේශීය වෛද්‍ය ක්‍රමය අනුව කිසියම් ක්‍රියා මාර්ගයක් හරියාකාර ලෙස ක්‍රියාවේ යොදනවා නම් එයින් මා නියෝජනය කරන කොට්ඨාශයේ දුප්පත් ජනතාවට විශාල සේවයක් සිදු වන බව ඒකාන්තයි. නමුත් මා නියෝජනය කරන කොට්ඨාශයේ එකම නගර සභාවක්වත් නැහැ. ඒ වගේම එකම සුළු නගර සභාවක්වත් නැහැ. පළාත් ආණ්ඩු සභා ඇත්තෙත් නැහැ. [බාධා කිරීමක්] ටිකක් ඉන්නකෝ කියනකල්. ගම්කාර්ය සභා නම් තුනක් තියෙනවා. නමුත් මේ ගම් කාර්ය සභාවලට ලැබෙන්නේ ඉතාමත් සුළු මුදලක්.

එම නිසා සියයට අනුවක ආධාර මුදලක් රජයෙන් දුන්නත් මේ එකම ගම් කාර්‍ය්‍ය සභාවකටවත් නොමිළයේ ස්වදේශීය වෛද්‍ය සේවයක් ලබා දෙන්නට පුළුවන් කමක් නැහැ. එබැවින් බටහිර වෛද්‍ය සේවයත් නිසියාකාර ලැබෙන්නෙ නැති නිසා, විශේෂයෙන් කොළොන්න කොට්ඨාශය වැනි නොදියුණු පළාත් බොහොම තියෙන නිසා, එවැනි නොදියුණු පළාත්වල රජය සම්පූර්ණයෙන්ම මුදල් යොදා ගොඩනැගිලි ඉදි කොට, වෙද මහත්වරුන් නවත්වා, බෙහෙත් හේත් ආදිය සපයා දී ඒ පළාත්වල ඉන්න ලෙඩුන්ට සහනය සැලසීමේ ක්‍රියා මාර්ගයක් ඇති කළ යුතු බව ප්‍රකාශ කරන්නට කැමතියි. මා මුලින් කීවා වගේ, මේ වැය ශීර්ෂය යටතේ අපේ කොට්ඨාශයට නම් කිසිම සේවයක් ලැබෙන්නෙ නැහැ. එසේ සේවයක් ලැබෙන්නෙ නැත්තේ රජයෙන් සියයට අනුවක ආධාරයක් ලබාගෙනවත් මෙවැනි සේවයක් කරන්නට ඒ ගම් කාර්‍ය්‍ය සභාවලට ශක්තියක් නැති නිසයි. මේ අළුත් මුදල් වර්ෂයේදීවත් දැන් යොදා තිබෙන ක්‍රමය සම්පූර්ණයෙන් වෙනස් කර කොළොන්න කොට්ඨාශය වැනි නොදියුණු ප්‍රදේශවල, රජය මාර්ගයෙන් බටහිර ක්‍රමයේ බෙහෙත් ශාලා ඉදි කර තිබෙන්නාක් මෙන්ම, ස්වදේශීය වෛද්‍ය සේවය නොමිළයේ ලබා දීමට ආයුර්වේද බෙහෙත් ශාලාත් ඇති කිරීමට කටයුතු කරන ලෙස ඉල්ලමින් මගේ වචන සවල්පය අවසාන කරනවා.

අ. භා. 5.42

**ඔබේසේකර මයා.**
*(திரு. ஒபயசேக்கர)*
(Mr. Obeyesekere)

ගරු කථානායකතුමනි, මේ මුදල සම්මත කිරීම ගැන කිසිම විරුඬත්වයක් නැති බව විරුඬ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන්ගෙන් දැන ගන්නට ලැබුණා. ඒ නිසා විරුඬ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන්ට අපි ස්තුතිවන්ත වන්නට ඕනෑ. එපමණක් නොවෙයි, මේ මුදලටත් වඩා වැඩි මුදලක් වියදම් කරන්නය කියා ඒ ගරු මන්ත්‍රීවරුන් විසින් ඉල්ලා තිබෙනවා. ඒ ගැනත් අපි සන්තෝෂ වෙනවා. ඒ ඒ ගරු මන්ත්‍රීවරුන් විසින් තවත් ප්‍රශ්න කීපයක් ඉදිරිපත් කර තිබෙනවා. අකුරණ දෙවන ගරු මන්ත්‍රීතුමා ඒ ඒ වර්ගවල ආයුර්වේද දිස්පෙන්සරි කීයක් තිබෙනවාද කියා ඇහුවා. ඒකට මම පිළිතුරු දෙන්නට කැමතියි. නාගරික දිස්පෙන්සරි 29 යි; පළාත් ආණ්ඩු සභා දිස්පෙන්සරි 29 යි; සුළු නගර සභා දිස්පෙන්සරි 5 යි; ගම් කාර්‍ය්‍ය සභා දිස්පෙන්සරි 26 යි. යුනානි දිස්පෙන්සරි දැනට තිබෙන්නෙ 1යි. කොළඹ තියෙන එකටයි, අපි ආධාර දෙන්නෙ.

**හමීඩ් මයා.**
*(ஜனாப் ஹமீத்)*
(Mr. Hameed)

That is why I said there is discrimination. I hope you will look into it.

**ඔබේසේකර මයා.**
*(திரு. ஒபயசேக்கர)*
(Mr. Obeyesekere)

ඒක ගැන සලකා බලන බව මම එතුමාට මතක් කරන්න කැමතියි.

පළාත්පාලන ආයතන යටතේ ඇති දිස්පෙන්සරිවලට ඇර තවත් දිස්පෙන්සරිවලට ආධාර දෙනවාද කියා යාපහුවේ ගරු මන්ත්‍රීතුමා ප්‍රශ්න කළා. මුදල් අතින් දුර්වල තත්ත්වයේ තිබෙන පළාත්වල ආණ්ඩුව මගින් දිස්පැන්සරි පිහිටුවනවාද යන ප්‍රශ්නයක් ඉදිරිපත් කළා. ඒ සම්බන්ධයෙන් මට දැන් කියන්න පුළුවන්කම තිබෙන්නේ, ලබන අවුරුද්ද තුළදී දිස්පැන්සරි 10 ක් පමණ ආණ්ඩුවෙන් පටන් ගන්න බලාපොරොත්තු වන බව පමණයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඊළඟට රසායනාගාරයක් පිහිටුවීමේ ප්‍රශ්නයත් ඉදිරිපත් වුණා. ඒ සම්බන්ධ යෙන් මට කියන්න තිබෙන්නෙ, නාවින්නෙ පිහිටුවනු ලබන සෙන්ට්‍රල් ඩ්‍රග් පැක්ටෙරි යේ ළඟදීම රසායනාගාරයක් පිහිටුවන්න බලාපොරොත්තු වන බවයි.

දැන් පවතින ක්‍රමය අනුව ආයුර්වේද වෛද්‍ය සහතික පිළිගනු ලබන්නෙ දින 14ක කාල සීමාවකට පමණයි. මේ අන්දමට ආයුර්වේද වෙද මහතාගේ බලතල සීමා කර තිබෙන්නෙ මන්ද, දොස්තර මහතුන්ට දී තිබෙන අයිතියම වෙද මහතුන්ටද දෙන්නෙ කවරදාද, යන ප්‍රශ්නත් වැලිමඩ ගරු මන්ත්‍රීවරයා (කේ. එම්. පී. රාජරත්න මයා.) ඉදිරිපත් කළා. ඒ සමගම ආයුර්වේද වෙදමහතුන් ලියා පදිංචි කිරීම ගැනත් එම මන්ත්‍රීතුමා ප්‍රශ්න කළා. පසුගිය කාල යේ දී සම්මත කර ගත් ආයුර්වේද පනත ලබන මස පළමුවනදා සිට ක්‍රියාවේ යොදව නවා. එම මණ්ඩලය යටතේ පත් කර සිටින නිලධාරීන් මෙම ප්‍රතිපත්තීන් ක්‍රියා වේ යොදාවිය කියා මා බලාපොරොත්තු වෙ නවා. ඒ හෙයින් දැනට මට මීට වැඩි යමක් කියන්නෙ නැහැ.

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

## පරිපූරක මුදල: රක්ෂණ සිරකරුවන් ගෙන යාම සහ භාරව යාම

## குறைநிரப்புத் தொகை : விளக்க மறியற் கைதிகளைக் கூட்டிச் செல்லலும் கொண்டு செல்லலும்

## SUPPLEMENTARY SUPPLY: ESCORT AND CONVEYANCE OF REMAND PRISONERS

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

I move,

That a supplementary sum not exceeding Rupees Seventy-five thousand (Rs. 75,000) be payable out of the Consolidated Fund of Ceylon or any other fund or moneys of, or at the disposal of the Government of Ceylon, or from the proceeds of any loan obtained by the Government of Ceylon, for the service of the Financial Year beginning on 1st October, 1961, and ending on 30th September, 1962, and that the said sum may be expended as specified in the Schedule hereto:—

*Schedule*

| | Rs. |
|---|---|
| Head 74—Department of Prisons. | |
| Vote No. 2—Administration Charges—Recurrent Expenditure .. .. | 75,000 |

Provision exists in the Estimates for the current financial year in a sum of Rs. 410,000 under Head 74, Vote 2, sub-head 16—Escort and conveyance of remand prisoners. The anticipated total expenditure this year is estimated at Rs. 485,000 which exceeds the total provision by Rs. 75,000. The increase in expenditure is due to the general increase in custodial duties and productions in courts and to the increase in the number of prisoners remanded, which necessitated the employment of additional escort staff. These prisoners had also to be escorted frequently to distant courts by public conveyance.

The expenditure on this sub-head in 1959-60 and 1960-61 was Rs. 435,000 and Rs. 452,000 respectively.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදි.

හමීඩ් මයා.
(ஜனாப் ஹமீத்)
(Mr. Hameed)

I have one point. It is on the question of overcrowding in the remand prisons.

Today, there is authorized accommodation only for 724 unconvicted prisoners, but according to the administration report of the Commissioner of Prisons for 1960, 39,326 unconvicted persons have gone through the remand prisons, and of them 23,078 had lodged one night in the prisons where the authorized accommodation is for only 724 persons. This is a serious matter.

ගරු මෛත්‍රීපාල සේනානායක
(கௌரவ மைத்திரிபால சேனாநாயக்க)
(The Hon. Maithripala Senanayeke)

Not on the same night.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

හමීඩ් මයා.
*(ஜனாப் ஹமீத்)*
(Mr. Hameed)

One night. You go through the figures in the administration report.

ගරු මෛත්‍රීපාල සේනානායක
*(கௌரவ மைத்திரிபால சேனநாயக்க)*
(The Hon. Maithripala Senanayeke)

It does not mean the same night.

හමීඩ් මයා.
*(ஜனாப் ஹமீத்)*
(Mr. Hameed)

Now, Sir, 39,326 unconvicted persons passed through the remand prisons. Of that number, as I said, 23,078 lodged one night, 4,114 two nights and 3,615 on more than two nights. Go through Prisons Department administration report and satisfy yourself. Shall I pass it on to you ?

ගරු මෛත්‍රීපාල සේනානායක
*(கௌரவ மைத்திரிபால சேனநாயக்க)*
(The Hon. Maithripala Senanayeke)

They were not there on any particular night.

හමීඩ් මයා.
*(ஜனாப் ஹமீத்)*
(Mr. Hameed)

He can explain it later. Does the Hon. Minister admit that 39,326 people had passed through the prisons during the year ?

ගරු මෛත්‍රීපාල සේනානායක
*(கௌரவ மைத்திரிபால சேனநாயக்க)*
(The Hon. Maithripala Senanayeke)

That is possible.

හමීඩ් මයා.
*(ஜனாப் ஹமீத்)*
(Mr. Hameed)

Does he admit that ?

ගරු මෛත්‍රීපාල සේනානායක
*(கௌரவ மைத்திரிபால சேனநாயக்க)*
(The Hon. Maithripala Senanayeke)

I said that that is possible.

හමීඩ් මයා.
*(ஜனாப் ஹமீத்)*
(Mr. Hameed)

And out of that 23,078 were there for one night, 4,114 for two nights, and 3,615 for more than two nights.



That is for your information. I have given these figures from the administration report.

Let it be one night or two nights or the first night—let it be anything; but the fact remains that there is overcrowding in the remand prisons now. Surely, we do not want unconvicted people, whoever they may be, to go through untold suffering.

ගරු මෛත්‍රීපාල සේනානායක
*(கௌரவ மைத்திரிபால சேனநாயக்க)*
(The Hon. Maithripala Senanayeke)

That is not within my power to decide, whether they should be kept in the prisons. I do not convict them.

හමීඩ් මයා.
*(ஜனாப் ஹமீத்)*
(Mr. Hameed)

You are taking the path of least resistance. What I am saying is, it does not matter who has put them inside, but you must provide the necessary accommodation.

වී. ධර්මලින්ගම් මයා. (උඩුවිල්)
*(திரு. வீ. தர்மலிங்கம்—உடுவில்)*
(Mr. V. Dharmalingam—Uduvil)

On a point of Order, Sir, there is no Quorum.

හමීඩ් මයා.
*(ஜனாப் ஹமீத்)*
(Mr. Hameed)

It is wrong and grossly unfair to treat unconvicted prisoners like convicted prisoners. If you visit the remand prisons today you will find they are like the Black Hole of Calcutta or even more gruesome than that. In the Kandy Remand Prison, which has accommodation for about a hundred-odd people, there are I think nearly a thousand. So the Hon. Minister cannot get away by saying, " I am not putting them there ". It may be logically argued, perhaps, that the basic cause for their being there is the Government.

ගරු මෛත්‍රීපාල සේනානායක
*(கௌரவ மைத்திரிபால சேனநாயக்க)*
(The Hon. Maithripala Senanayeke)

I said : " the bad influence of people roundabout Kandy ".

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**හමීඩ් මයා.**
*(ஜனாப் ஹமீத்)*
(Mr. Hameed)

If that is so, the greater is the influence of the Hon. Minister. The Hon. Minister must qualify himself according to his name—there must be *maithriya* about him, and surely *maithriya* does not mean that unconvicted prisoners should be subject to the same treatment as convicted prisoners. At the same time, you have one prison for twenty-three coup suspects. A large number of remand prisoners would wish that they were coup suspects for then, at least, they will not be put to so much of inconvenience.

**ගරු මෛත්‍රීපාල සේනානායක**
*(கௌரவ மைத்திரிபால சேனநாயக்க)*
(The Hon. Maithripala Senanayeke)

I appreciate your sympathy for the coup suspects !

**හමීඩ් මයා.**
*(ஜனாப் ஹமீத்)*
(Mr. Hameed)

The Hon. Minister appreciates my sympathy for the coup suspects. Truth is stranger than fiction, and we do not know ; perhaps psychologically it lies somewhere deep, deep in his heart for him to come out with it. Anyway, Sir, let us not get involved in useless talk.

I appeal to the Hon. Minister to see that something is done so that unconvicted prisoners are not treated like convicted prisoners, that they are not put to so much of suffering. Please do hurry up and find more accommodation.

අ. භා. 5.57.

**කේ. ඇම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

ගරු කථානායකතුමනි, මාස දෙකහමාරක් පමණ සිරකරුවකු වශයෙන් වැලිකඩ බන්ධනාගාරයේ සිටි කෙනකු නිසා මා මේ වැය ශීර්ෂය යටතේ වචන දෙක තුනක් කියන්න අදහස් කරනවා. මට එහිදී සිරකරුවන්ගෙන් කරුණු හුඟක් දැනගන්න ලැබුණා. ඔවුන්ට සිදු වන අසාධාරණකම් ගැන සමහර විට ඇමතිතුමා දන්නේ නැතිව ඇති. ඒ නිසා මා දැනගත් කරුණු ටිකක් කීම මගේ යුතුකමක්. බන්ධනාගාරයේ සිට පාර්ලිමේන්තුවට එන්න හැම කෙනකුටම වාසනාව ලැබෙන්නේ නැහැ. මා ඒ වාසනාව ලැබූ නිසා සිරකරුවන්ට විඳින්ට සිදු වන කරදර ගැන වචනයක් කිය යුතුයි.

බන්ධනාගාරයේ අහිංසක මිනිසුනුත් ඉන්නවා. ඒ අතර අපරාධකාරයනුත් ඉන්නවා. කෙසේ වෙතත්, එහි සිටින සියලුම සිරකරුවන් අහිංසක තත්ත්වයකටයි, වැටී සිටින්නේ. ඒ නිසා ඔවුන්ට මිනිසුන් වශයෙන් ලැබිය යුතු සහන ආණ්ඩුවෙන් දිය යුතුයි. ආණ්ඩුවේ නීති රීති අනුව ඔවුන්ට ලැබිය යුතු සහනවත් ඔවුන්ට හරියාකාර ලැබෙන්නේ නැහැ. වැරදිකරු වශයෙන් තීරණය වී දණ්ඩ නීතිය යටතේ බන්ධනාගාරයට නියම වූ කෙනෙක් බන්ධනාගාරයෙන් ආපසු එන විට නැවතත් අපරාධකාරයකු වශයෙන් නොව යහපත් පුරවැසියකු වශයෙන් පිට කිරීමයි, ආණ්ඩුවේ බලාපොරොත්තුව. එසේ නැතිව ඔහු නැවතත් දාමරික ක්‍රියා කොට බන්ධනාගාරයට නැවතත් ඇතුළුව සදහටම සිරකරුවකු වන අයුරු ඔහු පිට කිරීම නොවෙයි, ආණ්ඩුවේ බලාපොරොත්තුව. ඒ සඳහා සිරකරුවන් යහපත් පුරවැසියන් කිරීම සඳහා—යම් කිසි වැඩ පිළිවෙළක් තිබෙන්න ඕන. ඒ වෙනුවෙන් රජය මුදල් වියදම් කළත් ඒ වැඩ පිළිවෙළ හරියාකාර ක්‍රියාවේ යෙදෙන්නේ නැහැ.

මම මුලින්ම ඇමතිතුමාගේ අවධානය එක් කරුණක් ගැන යොමු කරන්න කැමතියි. ඇතැම් බෞද්ධ සංවිධාන මගින් මේ කරුණු ඉදිරිපත් කරන්න ඇති. බෞද්ධාගමික හිරකරුවන්ට අනිකුත් ආගමික හිරකරුවන්ට නැති අන්දමේ කරදර හිරිහැර තාඩන පීඩන රාශියක් කෙරෙනවා. වෙන කිසිම දෙයක් නිසා නොවෙයි, ඔවුන් ගේ ආගම බෞද්ධාගම නිසා. එතැන නිලධාරීන් ගෙන් වැඩි දෙනෙක් කතෝලික ආක්‍රමණිකයෝයි. ඒ අයගේ බලපෑම නිසයි මේවා කෙරෙන්නෙ. ඒ ගැන කියන විට තමුන්නාන්සෙට පුදුම හිතෙයි. කෙටියෙන් වුණත් එයින් එකක් කියන්ට කැමතියි. හිරකාරයන් කවුරුත් එකයි. හිරකාරයන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කේ. එම්. පී. රාජරත්න මයා.]

හැටියට කොයි හිරකාරයාටත් එක සමානව සලකන්න ඕනෑ. තමුන්නාන්සේ දන්නවා ඇති සමහර බෞද්ධයන් බෝකොළ එල්ලාගෙන සිටින බව. බෞද්ධ හිරකාරයන්ට ඒ බෝකොළ එල්ලාගෙන හිරගෙදර ඉන්න ඉඩ දෙන්නෙ නැහැ. නමුත් කතෝලික හිර කාරයන්ට කුරුසයක් නැත්නම් දේවමෑණි කෙනෙකුගේ රූපයක් එල්ලා ගන්න ඉඩ දෙනවා. ඒ විධියෙ වෙනසක් කරන්නේ ඇයි? ඒක වැරදියි. ඇමතිතුමා මේවා ගැන දන්නවා කියා මා කියන්නෙ නැහැ. මෙය සුළු දෙයක් කියා ඇමතිතුමා හිතන්ට පුළුවන්. නමුත් සුළු දේවලින් තමයි, ලොකු දේවලට මුල පිරෙන්නෙ. ඒ ගැන සොයා බලන මෙන් මා ඉල්ලා සිටිනවා. දෙනවා නම් හැම දෙනාටම ඉඩ දෙන්ට ඕනෑ, නැත් නම් හැමෝටම තහනම් කරන්ට ඕනෑ.

අනික් කාරණය ආණ්ඩුව හිරකරුවන් වෙනුවෙන් විශාල මුදලක් වියදම් කරනවා. කෑම සඳහා වැය කරනවා. නඩත්තුව සඳහා වැය කරනවා, හිරගෙවල ගොඩනැගිලි පිරිසිදුව තබාගැනීමට වැය කරනවා; මේ අන්දමට විශාල මුදලක් හිර ගෙවල් සඳහා අවුරුදු පතා වැය කරනවා. එහෙත් මා හිරයට ගිය අවස්ථාවේ දී මට දැන ගන්ට ලැබුණා, සමහර ගොඩනැගිලි පසුගිය අවුරුදු 15 ක පමණ කාලය තුළ ශුද්ධ කර නැති බව. හිර මැදිරිවල මකුණෝ ටොන් ගණන් ඉන්නවා. හිරගෙවල නිදාගෙන අපට දැන් මකුණන් කෑම හොඳට පුරුදු වෙලා. විදුලි එළිය නැවැත්තුවාට පසු මකුණු හමුදාව එනවා. මා හිතන්නෙ ඒ ගොඩනැගිලි පිරිසිදු කිරීමට, හුණු ගෑම ආදි කටයුතුවලට, වෙනම වැය ශීර්ෂයක් තිබෙනවා කියායි. මා හිතන්නෙ අවුරුදුපතා යම්කිසි මුදලක් ඒ සඳහා වෙන් කරනවා. ඇමතිතුමා ඒ ගැන පරීක්ෂා කර බැලුවොත්, සඳහන් කර ඇති ඒ වැඩ කටයුතු කළාය කියා; හුණු ගෑවාය; කොන්ත්‍රාත්කරුවන්ට මෙපමණ මුදලක් දුන්නාය කියා සඳහන් කර ඇති.

අ. භා. 6.2

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)

කරුණා කර නිශ්ශබ්ද වෙන්න. නියෝජ්‍ය කථානායකතුමා දැන් මූලාසනය ගන්නවා ඇති.



අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවුරුදු ගණනකින් ඒ ගොඩනැගිලි ශුද්ධ කර නැහැ; නමුත් මුදල් අරගෙන තිබෙනවා. එතැන කෙරෙන්නෙ ලොකු වංචාවක්. ගොඩනැගිලි පිරිසිදුව තබා ගැනීම අවශ්‍යය කියා ආණ්ඩුව මේ සභාවෙන් මුදල් වෙන් කර ගන්නවා නම්, ඒ ගොඩනැගිලි අළුත් වැඩියා කරන්ට ඇයි හරි හැටි ක්‍රියා නොකරන්නේ? එම නිසා එය විශේෂයෙන්ම සොයා බැලිය යුතු කාරණයක්. ඒ මුදල් ආණ්ඩුවට ඉතිරි වෙනවා නම් ඒකත් එක්තරා සහනයක්. ඒ මුදල් වෙන වැඩකටත් යොදවන්න පුළුවන්. නමුත් ඉතුරු වෙන්නෙ නැහැ; නිලධාරීන්ගෙ සාක්කුවලටයි යන්නෙ. මා කියන කාරණය ගැන වහාම පරීක්ෂණයක් කරන මෙන් මා කරුණාවෙන් ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. පසුගිය අවුරුදු ගණනාව තුළ වැලිකඩ හිරගෙදර ගොඩනැගිලි කීපයක හුණුගෑමක් හෝ ශුද්ධ කිරීමක් හෝ කර නැහැ. මට එය ඔප්පු කරන්ට පුළුවන්.

හිරගෙවල ඇති වන හැම කෝලහලයකටම, සිරකරුවන් අතර ඇති වන හැම මත භේදයකටම, මුල් හේතුවක් තමයි, හිරකරුවන්ට දුම්බීම තහනම් කර තිබීම. හිරකරුවන් අමනුෂ්‍යයන් හැටියට සලකා, තළල පෙළල ඔවුන් වහලුන් හැටියට පත් කරන්ට පුළුවන්කම තිබෙන ලොකුම දේ තමයි, මේ දුම්බීම තහනම් කර තිබීම. කොතරම් දුම් බීම තහනම් කර තිබුණත් ධූම පානය කරනවා. අද හිරගෙදර වටිනාම දේ තමයි, බීඩිය! මුදල් අතින් කල්පනා කර බලනව නම් හිර ගෙදර බීඩියක් රුපියලකටත් වඩා වටිනවා. දුම් බීම කොච්චර තහනම් කළත් හැම දෙනා අතේම බීඩි ආදිය තිබෙනවා. තමුන්නාන්සෙට පුදුම හිතෙයි, වැඩි වයස් හිරකාරයන්ට දුම් බීමට ඉඩක් නැත, තරුණ හිරකාරයන්ට දුම් බීමට ඉඩ දී තිබෙනවාය, කියන විට. මොන නීතියක් යටතේද මා දන්නෙ නැහැ, අධිරාජ්‍ය නීතියක් යටතේ වෙන්න ඇති, බොස්ටල් හිරගෙදර ඉන්න බාල වයස්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කාර සිරකරුවන්ට දුම් බීමට ඉඩ දී තිබෙනවා. දුම් බොන්න ඕනෑ නම් ඒ සඳහා රජයෙන්ම සල්ලි වියදම් කර අවසර දෙන බව පේනවා, එක්තරා කොටසකට.

**ඩී. ජී. එච්. සිරිසේන මයා.** (අකුරණ පළමුවන මන්ත්‍රී)
*(திரு. டீ. ஜீ. எச். சிரிசேன—அக்குறணை முதலாம் அங்கத்தவர்)*
(Mr. D. G. H. Sirisena—First Akurana)

බීඩි බොන්න අවසර දුන්නහම මොකද වෙන්නෙ?

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

එහෙම දෙනව නම් මන්ත්‍රීතුමාටත් හොඳයි. ඒ නිසා ඇමතිතුමාට කියන්න. විශාල කරදර ඇති වන්නෙ මේ ප්‍රශ්නය නිසයි. බාල වයස් සිරකරුවන්ට දුම් බොන්න ඉඩ දෙනව නම් වැඩි වයස් අයට ඉඩ නොදී ඉන්න කිසිම හේතුවක් නැහැ. සිරකරුවන්ගේ තත්ත්වය ගැන සොයා බැලීමට ග්‍රේෂන් කොමිෂන් සභාවද කොහේද කියලා කොමිෂන් සභාවක් පත් කර තිබුණු බව මට මතකයි. එහි නම මට හරියටම කියන්න බැහැ. දුම් බොන්න අවසර දීම නිසා ආණ්ඩුව බලාපොරොත්තු වන විදියට සිරකරුවකු හැදීමට අමාරුවක් ඇති වන්නේ නැහැ කියල තිබුණා, එම කොමිෂන් සභාවෙනුත්. දූෂණ ක්‍රියා විශාල ගණනාවක් අඩු වෙන්න හේතු වෙනවා ඇති, මෙයට ඉඩ දීමෙන්. එම නිසා, මේ කරුණ ආණ්ඩුවේ සැලකිල්ලට භාජන කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සිරකරුවකුගෙන්, මට ලියමනක් ලැබී තිබෙනවා. මේක එවනවා අහු වුණා නම් එයාට තව අවුරුදු පහක්වත් වැඩිපුර සිරේ ඉන්න වෙනවා. කෙසේ වෙතත් මෙවැනි ලියුම් අපට ලැබෙනවා. සිරකරුවන් බලන්න ඔවුන්ගේ නෑදෑ හිත මිත්‍රයන් ගියාම ඇඟේ ගාන්න සබන් කැල්ලක්, දත් සුද්ද කර ගන්න බෙහෙත් ටිකක් දීල යන සිරිතක් තිබුණා. එවැනි දෙයක් ලැබුණාම ඒකෙන් සිරකරුවකුට මැරෙන්න බැරි බව අපි දන්නවා. එවැනි ද්‍රව්‍ය ලබා ගන්න මෙපමණ කාලයක් ඉඩ දී තිබුණා. වැලිකඩ බන්ධනාගාරයෙන් ඊයේ පෙරේදා දැන්වීමක් නිකුත් කර තිබුණා නෑදෑයකුගෙන් හෝ වෙන කෙනෙකුගෙන් හෝ සබන් කැල්ලක්වත් ගන්න බැරිය කියා. කලක් තිබුණු වරප්‍රසාදයක් නැති කරලයි තියෙන්නෙ. ඇයි මේ වරප්‍රසාදය නැති කළේ? මේකෙන් ඇති වන පාඩුව නැතිනම් කරදරය මොකක්ද? අපට මෙය පෙනෙන්නෙ පොඩි දෙයක් විදියටයි. නමුත් සිරේ සිටින මිනිහෙකුට මේක පෙනෙන්නෙ පොඩි දෙයක් විදියට නොවෙයි. මෙන්න මා වෙත එවා තිබෙන ලියමන. මා මෙය කියවන්න අදහස් කරන්නෙ නැහැ; බලා ගන්න එවන්නම්. මේ කාරණය ගැන සොයා බලා දී තිබුණු වරප්‍රසාදය නැවත සිරකරුවන්ට ලබා දෙන හැටියට මෙම අවස්ථාවේදී ඉල්ලා සිටින්ට කැමතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තවත් කාරණයක් මතක් කරන්න කැමතියි. සිරෙන් නිදහස් වී එන අයට අද සමාජයෙන් ලොකු පීඩා විඳින්ට සිදු වී තිබෙනවා. මේ අය හොඳට හිටි බවට කොපමණ වාර්තා තිබුණත්, නැවත රක්ෂාවක් ලබා ගැනීම ඉතාම දුෂ්කරයි. රජයේ සේවයට ඇතුළු වන්නත් ඉඩ දීල නැහැ. ඊයෙ පෙරේදා පත්‍රවල ප්‍රසිද්ධ කර තිබුණා, ස්වදේශ ඇමතිතුමා විසින් කරන ලද නිවේදනයක්. සිරේ යෑම සංයුක්ත මණ්ඩලවල රක්ෂා ලබා ගැනීමට බාධාවක් නොවෙයි කියා එහි සඳහන් වී තිබුණා. විශෙෂයෙන් මුදල් වංචා කිරීම් යනාදියට අසු වී සිරේට ගිය අය මුදල් පරිහරණය කිරීමට තිබෙන රක්ෂාවල් වලට නැවත බඳවා ගැනීම හරි නැහැ. නමුත් එසේ නොවන අයටත් එවැන්නක් ක්‍රියාවේ යෙදවීම වැරදියි. වෙනත් වැරදිවලට සිරේ ගොස් ආපසු පැමිණි අයටත් රජයේ සේවයට හෝ සංයුක්ත මණ්ඩලවල සේවයට හෝ ඇතුළත් වන්න තවම අමාරුයි. එයින් වන්නේ ඔවුන් නැවතත් දරුණුකමට පෙළඹීමයි. මේ ගැන සැලකිල්ල යොමු කරන ලෙස මා ඉල්ලා සිටිනවා. මේ කාරණය ගැන සම්පූර්ණයෙන් සලකා බලා සිරෙන් නිදහස් වී පැමිණෙන අයගේ තත්ත්වය හොඳ නම් ඔවුන්ට නැවත රක්ෂා ලබා ගැනීමට වැඩ පිළිවෙළ සකස් කරන ලෙස මා ඉල්ලා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කේ. එම්. පී. රාජරත්න මයා.]

සිටිනවා. මෙය රජය පටන් ගත්තොත් අනික් අයත් පටන් ගනීවි. එම නිසා මෙම වැඩ පිළිවෙළ පටන් ගන්නා ලෙස මා රජයෙන් ඉල්ලා සිටිනවා. හොඳින් කල ගෙවා ආපසු පැමිණි හිරකරුවන්ට රක්ෂා ලබා දෙන්න කටයුතු සලස්වන්න ඕනෑ. රජයේ වෙනත් නිලධාරීන්ට ලැබෙන වර ප්‍රසාද ගණනාවක්ම බන්ධනාගාර නිල ධාරීන්ට ලැබෙන්නෙ නැහැ. වෘත්තීය සමා ගමක් පිහිටුවා ගැනීමේ වරය එයින් එකක්. අධිරාජ්‍යවාදීන්ගෙ කාලෙ පටන් පවත්වාගෙන එන සිරිතක් තවමත් ඒ ආකාරයටම පවත්වාගෙන යනවා. බන් ධනාගාරවල සේවය කරන නිලධාරීන්ට වෘත්තීය සමාගමක් මගින් තමන්ගේ අයිතිවාසිකම් ඉදිරිපත් කිරීමට ඉඩක් නැහැ. පොලීසියටත් ඒ අවසරය නැහැ. යුද්ධ හමුදාවටත් නැහැ. ඒ වගේම බන් ධනාගාර නිලධාරීන්ටත් නැහැ. යුද්ධ හමු දාවේ අයත් බන්ධනාගාර නිලධාරීනුත් අතර ලොකු වෙනසක් තිබෙනවා. තමන් ඉල්ලන දේ ලැබුණත් නොලැබුණත් වෘත්තීය සමිතියක මාර්ගයෙන් තමන්ගේ අයිතිවාසිකම් ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලැබෙනවා නම් ඒකත් මේ අයට එක්තරා ප්‍රමාණයක සහනයක්. ඒ සහනය පවා නොලැබෙන නිසා දූෂිත වූ හිත් ඇති මේ නිලධාරීන් කරන්නෙ සුළු වැරද්දක් දුටු වත් අසරණ හිරකාරයින්ට ගහන එකයි. අනෙකුත් රජයේ සේවකයන්ට දී තිබෙන් නාක් මෙන් බන්ධනාගාර නිලධාරීන්ටත් වෘත්තීය සමිති ඇති කර ඒ මගින් සිය දුක්ගැනවිලි සහ අයිතිවාසිකම් ඉදිරිපත් කිරීමේ වරය දිය යුතුයි. සියලු දෙනාටම වෘත්තීය සමිති පිළිබඳ අයිතිවාසිකම දෙන වාය යනුවෙන් මේ ආණ්ඩුවත් නිතර නිතර කියනවා. ඉතින් බන්ධනාගාර නිල ධාරීන්ට පමණක් එය නොදෙන්නෙ ඇයි? ඒ ගැන පිළිතුරක් බලාපොරොත්තු වෙනවා.

බන්ධනාගාරවල සේවය කරන ගාඩ් වරුන්ට ජේලර්ලා වශයෙන් උසස් වීමට සෑහෙන තරම් ඉඩක් නැහැ. දහ පහළොස් දෙනකු වුවමනා කළ නමුත් ඉන්න අය ගෙන් උසස්වීම් දී තිබෙන්නෙ එක්කෙනා ටයි. කොපමණ කාලයක් සේවය කළත් උසස් වීමට ඉඩක් නැති නිසා ඒ අය අතරේ දැන් ලොකු කලකිරීමක් තිබෙනවා. පිට තින් නිලධාරීන් බඳවා ගන්නවා මිස දෙපාර්තමේන්තුවේ ඉන්න අයට උසස්වීම් දෙන්නෙ නැහැ. පිටතිනුත් ගත්තට කමක් නැහැ. ඒ අතර දෙපාර්තමේන්තුවේ ඉන්න අයටත් තැනක් ලැබෙන විධියට වැඩ පිළිවෙළක් සකස් කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

**ගරු මෛත්‍රීපාල සේනානායක**
*(கௌரவ மைத்திரிபால சேனநாயக்க)*
(The Hon. Maithripala Senanayeke)

සුදුසුකම් තිබෙන අය ඉන්නවා නම් සේවයේ ඉන්න අය අතරිනුත් ගන්නවා.

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

නිදර්ශනයක් වශයෙන් මා කිව්වෙ සුදුසුකම් තිබුණත් නොගන්න බව පෙන් වන්නටයි. පිටතින් ගන්න සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් දෙපාර්තමේන්තුවේ ඉන්න අය අතරිනුත් ගන්ට ඕනෑ. සුදුසු කම් නැත්නම් ගන්ට බැහැ තමයි. නිල ධාරීන් තෝරීමේදී පිටතින් ගත යුතු සංඛ්‍යාවත්, දෙපාර්තමේන්තුවේ ඉන්න අයගෙන් ගත යුතු සංඛ්‍යාවත්, බන්ධනා ගාර කොමසාරිස්වරයාට දනුම් දුන්නොත් ඒ අනුව ඔහුට ක්‍රියා කරන්ට පුළුවන් වෙනවා ඇති. පහළ ශ්‍රේණිවල ඉන්න අයට ඉහළ නැඟීමට හිණිමගක් වැනි උසස්වීම් හා සම්බන්ධ වැඩ පිළිවෙළක් තිබිය යුතුයි. සුදුසුකම් නැති අයට නඟින්ට බැරි බව අපි පිළිගන්නවා. වැඩි උනන්දුවකින් දක්ෂ ලෙස රාජකාරි කිරීමට එවැනි වැඩ පිළිවෙළක් තිබීම කාලෝචිත බව මතක් කරන්ට කැමතියි.

සිරකරුවන්ගේ නඩත්තුව පිණිස රජය වියදම් කරන මුදල ඇත්ත වශයෙන්ම නිසි පරිදි වැය වෙනවාය කියන්ට බැහැ. නිලධාරීන්ගේ සාක්කුවලට එයින් කොට සක් යනවා. නැවත වරක් කොමිෂන් සභාවක් පත් කර හෝ මේ ගැන සොයා බලන්ට ඕනෑ. වෙන් කරන මුදල් හරියාකාර පාවිච්චි නොවන බවයි මගේ නම් පිළිගැනීම. රජය බලාපොරොත්තු වන ඉලක්කයට කිට්ටුවෙන්වත් වැඩ කෙරෙනවද කියා හොඳින් පරීක්ෂා කළ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

යුතුයි. එසේ කිරීමට ආණ්ඩුවට යුතු කමක් තිබෙනවා. කැම වෙනුවෙන් එක්තරා මුදලක් රජය වෙන් කරනවා. වේලක් වෙනුවෙන් මේ තරම් මුදලක් වියදම් කළ යුතුය කියා නියමයක් තිබෙනවා. ඒ මුදලින් නියම ප්‍රයෝජනය ලැබෙන්නෙ හිරකාරයාට නොවෙයි, කොන්ත්‍රාත්කරුවාටයි. නිලධාරීන් වංචා කරනවා. ඒ නිසා සිරකරුවාට හරියාකාර කෑම වේලක්වත් ලැබෙන්නේ නැහැ. අණ්ඩුව මුදල් වියදම් කරනවා නම් ඒවා හරියට යන්නට ඕනෑ. මේක අපරාධයක්. ඒ අයට කථා කරන්න ඉඩක් නැහැ. කෑම නරකයි කිව්වොත් තවත් වැඩිපුර දවසක් හිරේ ඉන්නට සිදු වෙනවා. එහෙම නැත්නම් බරපතළ චෝදනාවකට අහු වෙනවා. කරුවල කාමරයකට දමනවා; එහෙම නැත්නම් ගුටිබැට කන්නට සිදු වෙනවා. ඒ නිසා තම අදහස් ප්‍රකාශ කරන්න අවස්ථාවක් නැති, පැමිණිල්ලක් කරන්න බැරි, කථා කරන්න ඉඩක් නැති, පිරිසකට ආණ්ඩුවෙන් වැය කරන මුදල යම්කිසි කෙනෙක් හොරකම් කරනවා නම්, එය මහ ලොකු අපරාධයක්; පවක්. ඒ නිසයි මේ තත්ත්වය ගැන සොයා බලන්නය කියා මා ඉල්ලා සිටින්නේ.

ඒ වාගේම ඔය හිරකාරයින් වශයෙන් සිටින මනුෂ්‍යයන් යහපත් අය හැටියට සමාජයට ඒය කියා බලාපොරොත්තුවක් තිබෙනවා නම්, එසේ කරන්නේ කොහොමද; මේකේ සිදු වන්නේ කුමක්ද; සල්ලිවලට වන්නේ මොකක්ද; ඔවුන් යහපත් මිනිසුන් කරන්න වැඩ කටයුතු කරන්නේ කෙසේද; යන කරුණු ගැන සොයා බලන්නට කොමිෂන් සභාවක් පත් කරන්නට ඕනෑ.

තමුන්නාන්සේට පුදුම හිතේවි· මට නිදර්ශන ගණනාවක් දෙන්නට පුළුවන්. එල්ලුම් ගහට නියම වූ බෞද්ධ හිරකරුවා බෞද්ධාගම අත්හැරියොත් එල්ලුම් ගහෙන් නිදහස් කරනවා. එල්ලුම් ගහෙන් නිදහස් කර ජීවිතාන්තය දක්වා හිරගෙට යවන්නට සමාව ලබා දෙන කුට වැඩ පිළිවෙළක් තිබෙනවා. ඒක ඉතා මත්ම වැරදි දෙයක්. ඇයි බෞද්ධයන්ට මේ විධියේ අසාධාරණ තත්ත්වයක්?

මේවා විස්තර වශයෙන් මා නොකීවාට බෞද්ධ උපදේශක සභාවත්, තවත් සමිති සමාගම්වලිනුත් පත්‍රවල ලිපි ලේඛන පළ කර තිබෙනවා. ඇමතිතුමාටත් සන්දේශ එවා තිබෙනවා. එල්ලුම් ගහට නියම කරන්න ආගමේ ප්‍රශ්නයක් නැහැ. දඬුවම් ලබන්නට ඕනෑ. බෞද්ධ ආගමේ හැටියට ක්‍රියාවක් කළොත් කර්මයක් තිබෙනවා. එයින් වළකින්නට බැහැ. වෙන ප්‍රශ්නයක් නැහැ. නමුත් මෙතනදී බෞද්ධ ආගම අත්හැරියොත් නිදහස ලැබෙනවා. එවැනි ඒවා කීපයක් තිබෙනවා.

**ගරු මෛත්‍රීපාල සේනානායක**
*(கௌரவ மைத்திரிபால சேனநாயக்க)*
(The Hon. Maithripala Senanayeke)

කොහොමද ඒක වෙන්නෙ? එහෙම වෙන්න බැහැ. නිදහස දෙනවා නම් දෙන්නෙ අග්‍රාණ්ඩුකාරතුමායි. ආගම වෙනස් කළාට එසේ වෙන්නෙ බැහැ.

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

එහෙම තමයි වෙන්නෙ. සමහරවිට අග්‍රාණ්ඩුකාරතුමා ඔය ප්‍රශ්නය බලන්නේ නැහැ. නමුත් එල්ලුම්ගහට නියම වී සිටි පුද්ගලයා හිතන්නේ වෙන එකක්. ඔවුන් හිතන්නේ බුද්ධාගම අත්හැරිය නිසා නිදහස ලැබුවා කියායි.

**ගරු මෛත්‍රීපාල සේනානායක**
*(கௌரவ மைத்திரிபால சேனநாயக்க)*
(The Hon. Maithripala Senanayeke)

හිරගෙවල නිලධාරීන් ඒ රෙකමදාරුවට සම්බන්ධ නැහැ.

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

ඇමතිතුමා කියන එක පිළිගන්නවා. ඒ කරුණ සම්බන්ධව මේ ඇමතිවරයා හෝ අධිකරණ ඇමතිවරයා හෝ අග්‍රාණ්ඩුකාර තුමා හෝ සම්බන්ධ නැහැ. ඒක පිළිගන්නවා. නමුත් මම නිදර්ශන එකක් දෙකක් දුන්නොත් ඒ ගැන සොයා බලන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කේ. එම්. පී. රාජරත්න මයා.]

වාද? පසුගිය අවුරුදු තුන හතර ඇතුළතදී බුද්ධාගම අත්හැර නිදහස ලැබූ හිර කාරයෝ අද ඉන්නවා. ඒ අය හිතන්නේ බෞද්ධාගම අත්හැරි නිසා නිදහස ලැබුණාය කියා. පිටස්තර ඒවා දන්නේ නැහැ. එතකොට පිට සිටින එක්කෙනත් ආගම අත්හරිනවා. ඒ ගැන සොයා බලන්න ඇමතිතුමා පොරොන්දු වන නිසා ඒ සම්බන්ධව වැඩිපුර කියන්නේ නැහැ. කෙසේ වෙනත්, කොමිෂන් සභාවක් පත් කර, මෙහි තිබෙන දූෂණ මොනවාද, මේ සල්ලිවලට වන්නේ මොකක්ද, කියා සොයා බැලීමට වැඩ පිළිවෙළක් යොදන වාද කියා ප්‍රශ්න කරමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

ඩබ්ලිව්. දහනායක මයා.
(திரு. டப்ளியு. தகநாயக்க)
(Mr. W. Dahanayake)

I wish to refer to a forgotten and neglected aspect of prison work, namely, the after-care of ex-prisoners. This work is not being done systematically nor is it being considered as a very important part of prison work. The amount of money that is expended on it is very meagre. There are a very large number of applications each year from *ex*-prisoners and their dependants and it is not possible for the two associations that deal with this work to assist all the applicants.

The number of cases of applicants is about a thousand per year. I suppose that if come comprehensive scheme of after-care assistance is drawn up the number of applicants for assistance would be much greater. At present the number of applicants is about a thousand per year and the total amount of money that is allocated for the purpose by the Government is only Rs. 45,000 each year.

Now with this money there is a good deal that has to be done. For instance, it becomes necessary to pay monthly allowances to dependants of prisoners. Now this is a very important matter. When the bread-winner of a family is on remand or is sentenced to a term of imprisonment what is the fate of his wife and children? Is it right for the State to say, "We care nought for how the wife and the dependants will live."? Are you going to drive the poor wife of a prisoner—maybe a remand prisoner—to a position in which she will have to either beg on the streets or resort to questionable means of livelihood.

I think it is your duty, as you send a man to prison or even to the remand prison, to examine carefully the circumstances of his wife and dependants. Now that can be done if more money is given to the After-care Association. Very pathetic applications are made by the wives of prisoners. It may be that a prisoner would have earned about Rs. 100 a month and the utmost that any kind of After-care Association, as things stand today, can give to the dependants of a prisoner may be Rs. 10 to Rs. 15 a month. What then is the fate of the wives and children of remand prisoners? This is an extremely important question and any Government that ignores this problem cannot call itself progressive or even, I would say, civilized.

There are other aspects of the same question. When a prisoner comes back to normal life why is it that the Government still looks down upon him and fails to give him work? I know of several cases where ex-prisoners had succeeded in obtaining Government employment in minor posts. I know of a case of a very deserving young man who secured a post as a watcher in the Nurses' Training School. He worked very well for nearly one year, but it was discovered that he had not mentioned the fact that he was an ex-prisoner. He was found fault with on a technical point and he was taken away from his work. An appeal made by me personally to the Permanent Secretary, who was in a position to regularize the appointment, fell on deaf ears.

I believe, it is the Permanent Secretary of a Ministry who has the power to permit an ex-prisoner to continue in Government service. I have yet to come across a single

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Permanent Secretary who has exercised this function in the proper way.

I recall the case of an ex-prisoner who became a conservancy labourer in the Galle Hospital. There is no humbler service in this country than that of a conservancy labourer. The Government finds it difficult to recruit Sinhalese as conservancy labourers. Here was a man who, after he came out of jail, became a conservancy labourer in a hospital. As soon as it was discovered that he was an ex-prisoner, he was thrown out of his job.

I made repeated appeals to the Permanent Secretary and to the Ministry that this conservancy labourer should be permitted to continue in his work. All my appeals were in vain. I sometimes feel that Government officers like Permanent Secretaries lose all their feelings of humanity and charity when they are placed in positions of authority. Such human beings are not worthy of positions of responsibility.

The Permanent Secretaries must realize that it is an extremely important part of prison work to attend to the after-care of prisoners. Now in both those cases that I mentioned the men lost their jobs. In one of those cases the person concerned returned to a life of crime. You are responsible for that ex-prisoner going back to his evil ways.

I should like the Hon. Minister to lay down definite rules on this question. If an *ex*-prisoner secures Government employment, he should be permitted to continue in such employment. *Ex*-prisoners should not be debarred from holding posts such as those of labourers. I can understand your saying that *ex*-prisoners should not hold positions of responsibility, but why do you prevent them from holding posts as labourers, watchers and minor employees ? Therefore, the Hon. Minister must lay down some definite rules on this subject to enable *ex*-prisoners to secure employment under Government in minor grades.

It is necessary to provide money for *ex*-prisoners to set themselves up in trades. The Prisoners' After Care Association, I believe, makes an effort to do so, but they do not have enough money to assist *ex*-prisoners as much as they would like to. It is necessary, therefore, to make it incumbent on the Social Services Department to assist *ex*-prisoners to set themselves up in trades. There must be some sort of supervision in such cases. There are many cases that have come to my notice where applications that have been made for the purchase of tools and implements of trade to work as carpenters, tailors, blacksmiths or barbers have been turned down because the applicants were unable to furnish the proper type of security for the loans. In such cases, what is necessary is not that there should be a perfect form of security ; what is necessary is that the work of the *ex*-prisoners should be properly supervised.

When a man is in gaol he is taught a trade. He is trained as a tailor, a blacksmith, a mason, or a carpenter. So, as he comes out of gaol, is it not your duty to set up an organization which would help the *ex*-prisoners ? That is an aspect of the question which I would like to stress. As each prisoner leaves the prison and steps once again out into the world a free man, he should be permitted to set up in the trade which he learned while he was in prison. Facilities should be given him to obtain easy credit. You can recover what you give him, but you must not make things so hard for him that he is unable to secure the loan.

Then it is necessary to give casual grants to *ex*-prisoners. For all these purposes the Government must be ready to give more money as grants in aid to the two associations that look after this type of work. The two associations are the Prisoners' After-care Association and the Prisoners Welfare Association. At present the grants given to these two associations are inadequate. I find from a perusal of the reports of these


Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

associations that the greatest drag on their work is the lack of funds to do more work.

Reference has been made to the pardons that had been offered to certain prisoners. I wish to make reference to a special case—that of Mr. Eddie Perera. It is well known that Eddie Perera figured in the most sensational and the biggest case of smuggling known in Ceylon. He was sentenced to a rather long term of imprisonment. I am not saying that there were no extenuating circumstances in the case; there may have been. I remember, the wife of this unfortunate person made an appeal to the late Mr. S. W. R. D. Bandaranaike that he be released from prison. The late Mr. Bandaranaike turned down the request. I would also mention on this occasion that when I was Prime Minister for a brief period an appeal was made to me that this person should be released. I looked into the case carefully, but I was not willing to intervene because Eddie Perera had been found guilty of smuggling in the biggest case that had been recorded in Ceylon. Thus the application on behalf of Eddie Perera was turned down by two Prime Ministers. I want to emphasize that fact. Then there came on the present Government, and it so happened that Eddie Perera got away from his sentence of, I believe, over ten years and came out of prison within about two or three years of entering it. I attempted to raise this question on the Floor of this House on two occasions through Questions. I am sorry that on both occasions the replies were evasive. Proper information was not given to the House and to the public about the pardon that was offered to Eddie Perera. It was said on his behalf that the normal rules of pardon had operated in his case. I asked for chapter and verse. I wanted a full answer to my questions. Even now I ask the Government to state in the greatest possible detail how, in what way, why, through what regulation passed on what date, the period of the sentence of Eddie Perera was reduced.



**එන්. එච්. ඒ. එම්. කරුණාරත්න මයා. (අධිකරණ කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්)**

*(திரு. என். எச். ஏ. எம். கருணாரத்ன—நீதி யமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*

(Mr. N. H. A. M. Karunaratne—Parliamentary Secretary to the Minister of Justice)

All that was given in detail.

**ඩබ්ලිව්. දහනායක මයා.**

*(திரு. டப்ளியு. தகனாயக்க)*

(Mr. W. Dahanayake)

No. The information that was given to me was hopelessly inadequate.

**එන්. එච්. ඒ. එම්. කරුණාරත්න මයා.**

*(திரு. என். எச். ஏ. எம். கருணாரத்ன)*

(Mr. N. H. A. M. Karunaratne)

You would not have understood it.

**ඩබ්ලිව්. දහනායක මයා.**

*(திரு. டப்ளியு. தகனாயக்க)*

(Mr. W. Dahanayake)

I must admit that the hon. Parliamentary Secretary was very very smart in the way he answered the Question. His smartness will not make up for the lack of information in his Answers.

**එන්. එච්. ඒ. එම්. කරුණාරත්න මයා.**

*(திரு. என். எச். ஏ. எம். கருணாரத்ன)*

(Mr. N. H. A. M. Karunaratne)

What you have questioned, I have answered.

**ඩබ්ලිව්. දහනායක මයා.**

*(திரு. டப்ளியு. தகனாயக்க)*

(Mr. W. Dahanayake)

I do not wish to be hard on the Parliamentary Secretary who is so very enthusiastic and energetic and full of high spirits. I do not wish to be hard on him. All I say is that the information I was looking for, which the public would have welcomed, was not given to us. Let it be given to us even now. I mean let a statement be made that Mr. Eddie Perera was released under the following

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

regulations—state what the regulations are, give the dates on which they came into operation, and let the country know exactly how the 11 years of a hard jail sentence got reduced to 1 or 2 years. This is an extremely important subject. You cannot dismiss it airily. It has been alleged that the counsel who appeared for Mr. Eddie Perera was the gentleman who now holds the high office of Minister of Justice in the other place.

එන්. එච්. ඒ. එම්. කරුණාරත්න මයා.
*(திரு. என். எச். ஏ. எம். கருணாரத்ன)*
(Mr. N. H. A. M. Karunaratne)

What prevents him from holding it ?

ඩබ්ලිව්. දහනායක මයා.
*(திரு. டப்ளியு. தகநாயக்க)*
(Mr. W. Dahanayake)

Therefore, it becomes your bounden duty to give out the full details of Mr. Eddie Perera's release in your own interests.

එන්. එච්. ඒ. එම්. කරුණාරත්න මයා.
*(திரு. என். எச். ஏ. எம். கருணாரத்ன)*
(Mr. N. H. A. M. Karunaratne)

Not on anything you have asked.

ඩබ්ලිව්. දහනායක මයා.
*(திரு. டப்ளியு. தகநாயக்க)*
(Mr. W. Dahanayake)

We have been told that a large number of persons have been pardoned during the last few years. I brought to the notice of the Hon. Minister of Justice a case in which a person in the Galle District who had been convicted in the lower courts had had his sentence affirmed in appeal, but he did not go to jail for a single day. I was given a certified copy of the case record. I forwarded it to the Hon. Minister of Justice and asked him, why did you pardon this man who had been convicted in the lower courts and whose conviction had been affirmed in appeal ? The Hon. Minister of Justice sent me a letter to the effect that he would like me to call at his office in order that I may be furnished with the reasons. I did not consider that a satisfactory reply. If there was a valid reason that could have been given, it should have been given to me and to the public in the open. It was not a case in which the Minister of Justice and I sat at a table in an office and discussed the matter over a cup of tea. If judgments that are given in our courts are to be set aside, then let the public know the why and the wherefore for such decisions by the Minister of Justice or by the Governor-General.

In the bad old days of colonialism when the British were misruling this country, did you ever hear of a case in which a man was convicted in a lower court and his conviction was affirmed in appeal and he went back home without entering the jailhouse for even a day ? I suppose we have advanced a great deal since those bad old days of colonialism ! But progress, it would appear, is a relative term. Nowadays there can be the progress of the crab—sideways ; there can be the progress of the *ex*-Minister of Finance—backwards. I do not know how far we have progressed when it is possible for a prisoner whose sentence has been affirmed in appeal to get back home without stepping into jail for even one day !

There have been more than one instance of such cases. I brought to the notice of this honourable House a case from Welimada ; no proper explanation was given.

Now, this is all that I ask : I beg of the Government not to utilize the powers they have of offering pardons to prisoners as a weapon for political patronage. You have power vested in you of a tremendous magnitude and effect. You can do anything in this country except perhaps to make a man a woman and a woman a man. You can, Mr. Deputy-Speaker, free a prisoner at once and you can lock up the most innocent man immediately. But for goodness sake, Mr. Deputy-Speaker, do not use your powers as a political weapon.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩබ්ලිව්. දහනායක මයා.]

Now, how are we to know that you are not using your powers as a political weapon? I do not say that the powers of offering a pardon to a prisoner should be taken away. Certainly not; that is not my argument. The power of offering a pardon should vest in the Head of the Government. I agree with that principle. But I ask that, whenever you exercise it, you should let the public know the full circumstances under which you exercise that power and your full reasons for exercising it on behalf of the prisoner. Therefore, I do make an application once again on the Floor of this honourable House that you come out with all the details of the release of Mr. Eddie Perera.

අ. භා. 6.50

**ඩී. බී.ආර්. ගුණවර්ධන මයා.**

*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*

(Mr. D. B. R. Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බන්ධනාගාරවලට වෙන් කරන්ට යන මේ රුපියල් හැත්තෑ පන් දහසක වැය ශීර්ෂය ගැන මමත් වචන ස්වල්පයක් කථා කරන්ට ඕනෑ. මේ අවස්ථාවේදී ලංකාවේ සිරගෙවල් ගැනත්, අසාධාරණ නීති උඩ සිරකරුවන් වශයෙන් සිටින ඒ පිරිස ගැනත්, අප කල්පනා කර බලන්න ඕනෑ. ඒවාගේම මේ මුදල නිසි ආකාරයට වියදම් කරනවාද කියාත් අප විමසිලිමත් වෙන්ට ඕනෑ. ප්‍රථමයෙන්ම අපි අද සිරගෙවල තත්ත්වය දෙස බලමු. මේ සිරගෙවල අද සමාජයට නොහොබිනා වැඩ බොහොමයක් සිද්ධ වෙනවා. මේ තත්ත්වය ඇති වී තිබෙන්නේ අධිරාජ්‍යවාදී යුගයේ ඇති කරන ලද නීති රීති නිසා මෙන්ම බන්ධනාගාරවල සේවයේ නියුක්තව සිටින නිලධාරීන් හැඩ ගැසී තිබෙන ආකාරය නිසයි. මමත් සිරකරුවකු වශයෙන් සිටි කෙනකු නිසා සිරගෙවල් ඇතුළේ දෙන දඬුවම් ගැනත් මට කියන්ට පුළුවන්. යම් වැඩ පිළිවෙළක් උඩ, යම් නීති මාලාවක් උඩ, සිරගෙවල ඒ වැඩ කටයුතු කරගෙන ගියත් මේ නීති සියල්ලක්ම උල්ලංඝනය කරන අවස්ථාවල් තිබෙනවා. සිරකරුවෙක් යම් නිලධාරියකුට රැව්වත් දඬුවම් දෙන අවස්ථා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමාජයේ නොයෙකුත් ආකාරයේ කොටස් සිරගෙවල් ඇතුළේ සිටිනවා. සමාජයේ හැම තරාතිරමකම අය සිරගෙවල සිටිනවා. ඇතැම් වැරදි කළ සමාජයේ උසස් අයත් විශාල ගණනක් සිරගෙවල සිටිනවා. තමන්ගේ මුදල් හදල් උඩ විශාල වරප්‍රසාද භුක්ති විඳින යම් යම් පුද්ගලයන් සමහර අවස්ථාවලදී කරන ඇතැම් වැරදි හේතු කොටගෙන බන්ධනාගාර ගතවන අවස්ථා තිබෙනවා. බන්ධනාගාර ගත වූවාට පසුත් මේ අයට තමන් කලින් භුක්ති විඳින ලද ඒ වරප්‍රසාද ලබා ගැනීමට ඉඩ තිබෙනවා. ආහාර දීම සම්බන්ධයෙන් අපි බලමු. සාමාන්‍යයෙන් බන්ධනාගාර ගතවන උදවියට නියම විධියේ ආහාරයක් දෙන්ට ඕනෑ. ඒ සඳහා අප මුදල් වෙන් කරනවා. එහෙත් ආහාර දීමේදී බන්ධනාගාර නිලධාරීන් ඇතැම් අයට විශේෂ සැලකිලි දක්වනවා. ඒ වගේම බන්ධනාගාර ගතවන අය පන්ති වශයෙන් කොටස් කරනවා. සාමාන්‍ය සිරකරුවන්ටත් විශේෂ සිරකරුවන්ටත් දෙන ආහාරවල විශාල වෙනසක් තිබෙනවා. මේ උසස් පන්තියේ සිරකරුවන්ට "යුරෝපියන් ඩයට්" කියා අමුතු විධියේ ආහාරයක් ලැබෙනවා. සිරගෙදරට ගියායින් පසු එබඳු පන්ති ඇති කිරීමෙන් විශාල භේද ඇතිවෙනවා. මේ එක් විශේෂ පන්තියකට කියන්නේ "ස්ටාර් ක්ලාස්" කියායි. පසුගිය දිනවලදී මේ සම්බන්ධ කරුණු කීපයක් ගරු ගාල්ලේ මන්ත්‍රීතුමා විසින් (ඩබ්ලිව්. දහනායක මයා.) මේ ගරු සභාවට ඉදිරිපත් කරන්ට යෙදුණා. මුදල් හදල් තිබෙන උදවිය යම් කාලසීමාවකට බන්ධනාගාර ගතකළත්, අපේ මැති ඇමතිවරුන්, උසාවියේ තීන්දුවලට පටහැණිව විශේෂ වරප්‍රසාද සළසා මේ උදවිය සිරෙන් එළියට ගත් අවස්ථා තිබෙනවා. ඒ ආකාරයට සමාජයේ මුදල් හදල් තිබෙන අයට පිටදී මෙන්ම සිරගෙවල් ඇතුළතදීත් යම් යම් වරප්‍රසාද ලැබෙනවා. සමාජයේ සිටියදී තිබෙන සියලුම පහසුකම් හිරගෙට නියම වූ පසුවත් ලබා දිය යුතු නැහැ; නමුත් දැන් නම් එවැනි පහසුකම් ලබා ගන්න අය ඉන්නවා. මුදල් හදල් නිසා හිර ගේ ඇතුළෙදීත් පිටදී මෙන්ම පහසුකම් ලබා ගන්න අය ඉන්නවා. බන්නාගාරය ඇතුළේත් මේ විධියට අමුතු "ක්ලාස්" එකක් ඇති

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කරන්නේ ඇයි? අමුතු "ක්ලාස්" ඇති කිරීම, අමුතු "ඩයට්" ඇති කිරීම වැරදියි. කොටසකට වැඩි සත්කාර සලසන එක වැරදියි. එක නීතිය නම්, එක දඬුවම නම්, කර ඇත්තේ එකම විධියේ වැරැද්ද නම්, කොටසකට වැඩි සත්කාර කරන්නේ ඇයි? සමාජයේ සිටින විට, ලොකු වත් පොහොසත්කම් ඇති, ලොකු නෑදෑයන් ඇති අයට ලැබෙන සැලකිල්ල හිර ගේ ඇතුළේදීත් ඒ විධියටම ලැබෙනොත් එය සාධාරණ නැහැ. නමුත් අද කෙරෙන්නේ ඒකයි. සමහරුන්ට අමුතු විධියේ ඇඳුම් ලැබෙනවා. ඒ වගේම අමුතු ආහාර දෙනවා. බිත්තර මස් ඇතිව "යුරෝපියන් ඩයට්" සමහරුන්ට දෙනවා. සියලු දෙනාටම පෝෂ්‍යදායක ආහාර දිය යුතු බව ඇත්තයි. නමුත් එක කොටසකට එක විධියකටත් තව කොටසකට තව විධියකටත් සලකනවා නම් එය වැරදි වැඩක්. එයින් වන්නේ සිර ගේ ඇතුළෙත් අමුතු පන්තියක් ගොඩ නැඟීම පමණයි. බොහෝ දෙනකු පිට සිටිය දීවත් "යුරෝපියන් ඩයට්" නොගන්න නමුත් සිර ගේ ඇතුළෙදි ලැබෙනවා.

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**
*(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)*
(Dr. S. A. Wickremasinghe)

අප දෙදෙනා හිරේ ඉන්න කොටත් ඒ විධියට ලැබුණා.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

අප හිර කොට සිටියේ උසාවියේ තීන්දුවක් නැතිවයි. අප හිරේ සිටි කාලයේදී තමුන්නාන්සෙත් අමුතු විධියෙ වැඩ පිළිවෙළක් ගෙන යෑම ගැන මම බොහොම කනගාටුයි. අප හිරේ තබා ගෙන හිටියේ නඩුවක් නැතිවයි, උසාවියේ තීන්දුවක් නැතිවයි. මා නම් හිරේ දමාගෙන හිටියේ නිකම් නොවෙයි, කකුලක් කඩා දම්වැලකුත් දමලයි. බයිනෙත්තු ගත් මුරකරුවන් දෙදෙනකුත් තව ගාඩ්ලා දෙදෙනකුත් මා මුර කිරීමෙහි යෙදී සිටියා. ඒවා සිදුවුණේ අධිරාජ්‍යවාදී යුගයේදීයි. අධිරාජ්‍යවාදීන් මේ රට පාලනය කළ කාලයේ, මේ රට අධිරාජ්‍යවාදීන්ගේ යටත් විජිතයක් වශයෙන් පැවති කාලයේ, තුබුණු නීති රීති දඬුවම් තවමත් සංශෝධනය කර නැහැ. යම්කිසි රටක් යටත් විජිතයක්ව පැවතෙද්දී තුබුණු නීති රීති ඒ රට නිදහස් වුණාට පසුවත් තිබිය යුතු නැහැ. අධිරාජ්‍යවාදී යුගයේ තුබුණු දඬුවම්වලට වඩා පහසු දඬුවම් කිසියම් රටක් නිදහස් වූ පසු ඇති කිරීම අවශ්‍යයි. නමුත් අපේ රටේ තවම එවැන්නක් සිදු වී නැහැ. අධිරාජ්‍යවාදී යුගයේදී පැවති දඬුවම් දැන් අපේ රටේ තිබිය යුතු නැහැ. ඒවා සංශෝධනය කළ යුතුයි. නමුත් මිනිමරුවන්ට, පොදු ආයතනවල දේපොල හොරකම් කරන අයට, බරපතල දඬුවම් දිය යුතුයි. පොදු ආයතනවල සේවය කරමින් වැරදි වැඩ කරන අයට, පගා ගසන අයට, බර පතළ දඬුවම් දෙන්නට නීති සකස් කරන්ට ඕනෑ. නමුත් නීති රීති පොතේ අද ඒක නැහැ. සමාජයේ පොදු ආයතනවල වංචනික වැඩ කරන අයට, හොරකම් කරන අයට, ඒ විධියේ දඬුවම් අපේ නීති රීති පොතේ නැහැ. ඒ නිසා මේක වහාම වෙනස් කරන්ට ඕනෑ. තුන්මාසෙන් තුන් මාස යට බන්ධනාගාරයට යන පික් පොකට් කාරයෝ අද ඉන්නවා. ඒ වගේම මුදලක් ගෙවන්නට බැරි නිසා බන්ධනාගාරයේ ලැගගෙන ඉන්න උදවියත් ඉන්නවා. සමාජයේ දේපළ සම්බන්ධයෙන් තියෙන වැරදි ක්‍රමය නිසා, ගම්බදව අක්කර කාල, බාගය, අයිති කාරයෝ නොයෙක් පැටලිලි වලට අහු වෙලා බන්ධනාගාරයට ගිහින් ඉන්නවා. සමාජයේ තියෙන වැරදි ක්‍රමය නිසා වැටක් කඩන්නට ගිහිල්ල, පාරක් වහන්නට ගිහිල්ල, පැටලිල්ලකට අහු වෙලා බන්ධනාගාරයට යන අය ඉන්නවා. ඒ නිසා මේ තත්ත්වය වෙනස් කරන්නට ඕනෑ. හිර ගෙදරට යන සියලු දෙනාටම එක ලේබලය ගැසීම වැරදියි. හිරේට යාමට බල පෑ හේතුව අනුව හිර ගෙදර ඇතුළේදීත් පාලනයේදීත් ඒ අයට පහසුකම් සලසන්නට ඕනෑ. අද එහෙම නොවෙයි කෙරෙන්නෙ. වත්කම තිබුණු නිසා—සමාජයේ උසස් තත්ත්වයක් ඇතිව හිටපු නිසා—හිර ගෙදර ඇතුළෙදි විශේෂයෙන් සලකනවා. ඒ බෙදීම වෙනස් කරන්නට ඕනෑ. සුළු නිලධාරියාගේ පටන් ලොකු නිලධාරියා දක්වා සියලු දෙනාම එදා සිට පුරුදු කරලා තියෙන්නේ ඒ පිළිවෙළට සලකන්නයි. ඒ පිළිවෙළ වෙනස් කරන්න ඕනෑ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.]

ගරු කථානායකතුමනි, ඒ සමගම මතක් කළ යුතු තවත් කාරණයක් තියෙනවා. හිර ගෙදරට යන අයට රැකියාවල් පුරුදු පුහුණු කරනවා ; නමුත් බන්ධනාගාරයෙන් පිට වුණාට පස්සෙ ඔවුන්ට ඒ පුරුදු පුහුණු වූ රැකියාවල යෙදීමට නියම වැඩ පිළිවෙළක් සකස් කර නැහැ. එසේ සකස් කර නැති නිසා ඒ තැනැත්තා සමාජයට බැස්සට පස්සෙ නැවත අර වැරද්ද කිරීමට ඉඩ ප්‍රස්තාව සැලසෙනවා. ඒ නිසා බන්ධනාගාරයට නිතර නිතර යන කොටස්වලට අපි විශේෂ තැනක් දෙන්නට ඕනෑ. රැකියාවල් පුරුදු පුහුණු කරලා හිරෙන් එළියට ආවට පස්සෙ ඒ රැකියාවල යෙදෙන්නට වැඩ පිළිවෙළක් සලස්වන්නට ඕනෑ. මේ රජය කල්පනා කරනවා ඇති රැකියාවල් නැති අය ලක්ෂ ගණන් එළියේ ඉන්දැද්දී හිර ගෙවල්වල ඉන්න අයට රැකියාවල් සපයන්නේ මොකටද කියා. එහෙම කල්පනා කළොත්, ඒක වැරදියි. "එක්ස්-ප්‍රිස්නර්ස් එසෝශියේෂන්" කියා විශේෂ සමාගමක් තියෙනවා. ඒකට මුදල් ලැබෙනවා. සමාජයේ තියෙන පැටලිලි නිසා හදිසි කෝපයකින් ඇති වූ යම් කිසි සිද්ධියක් නිසා, කෙනෙක් හය අවුරුද්දක් හිර ගෙදර හිටපු පළියට ඒ තැනැත්තා එළියට ආවම රක්ෂාව නැති වෙනවා නම් ඒක අපරාධයක්. හිර ගෙදර සිටි කාලය තුළදී පුරුදු පුහුණු වූ යම්කිසි කර්මාන්තයක් කිරීමේ අවස්ථාව ලබා දීමට අද වන තුරු වැඩ පිළිවෙළක් සකස් කර නැහැ. සුළු වශයෙන් වඩු කර්මාන්තයක් පටන් ගැනීමට හෝ වෙන යම් සුළු කර්මාන්තයක් පටන් ගැනීමට හෝ රුපියල් දෙතුන්දහක ආධාරයක් "එක්ස්-ප්‍රිස්නර්ස් එසෝශියේෂන්" එකෙන් ඉල්ලුවාට ලබා ගන්න බැහැ. තමන් ඉගෙන ගත් කර්මාන්තයක් දියුණු කරගෙන එමගින් තමන්ට මෙන්ම සමාජයටත් සේවය කරන්න අවස්ථාවක් නොලැබෙන්නෙ අයි.ආර්.සී. හෝ වෙන ලේබලයකින් හෝ මේ අයව හඳුන්වන නිසයි. ඒ නිසා මින් මත්තට හෝ මෙම වැඩ පිළිවෙළ වෙනස් කරන්න කටයුතු යොදන්න ඕනෑ. කුණ්ඩසාලේ එළිමහන් සිරගෙදර පවතින තත්ත්වය දෙස බලන්න. බස් ඩ්‍රයිවරුන් වශයෙන්, කාර් ඩ්‍රයිවර්වරුන් වශයෙන්, හොඳ පුහුණුවක් ලබා ගත් අය මෙවැනි ස්ථානවල සිටිනවා. නමුත් මේ අයට නැවතත් සමාජයට බැසීමට තිබෙන අවහිරකම් මඟහැරවීමට තමුන්නාන්සේලා වැඩ කටයුතු යොදා නැහැ.

ගරු කථානායකතුමනි, ඉතා හොඳට වඩු වැඩ කරන්න පුළුවන් උදවිය සිර ගෙවල සිටින බව මා හොඳින් දන්නවා. දිගු කලක් පවතින අන්දමට—සමහර විට පරම්පරා දෙක තුනක් පාවිච්චි කරන්න පුළුවන් වන අන්දමට—බඩු මුට්ටු හදන්න පුළුවන් අය සිර ගෙවල සිටින බව මා දන්නවා. ඇයි තමුන්නාන්සෙලාගේ කාර්යාලවලට වුවමනා කරන බඩු මුට්ටු ආදිය සපයා දෙන්නය කියා ඕඩර් දෙන්නෙ නැත්තෙ මේ කට්ටියට? ඇයි තමුන්නාන්සෙලාගෙ "එයාකන්ඩිෂන්ඩ්" කාමරවල තිබෙන වැඩ කරන්නය කියා මේ අයට ඕඩර් දෙන්නෙ නැත්තෙ?

**ගරු මෛත්‍රීපාල සේනානායක**
*(கௌரவ மைத்திரிபால சேனநாயக்க)*
(The Hon. Maithripala Senanayeke)

මට නැහැ, "එයාර්කන්ඩිෂන්ඩ්" කාමර.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

වෙන්න පුළුවන්, නමුත් අනික් අයට තිබෙනවා. [බාධා කිරීම්]

ඔව්, ඔව්, මෙතනත් එක්තරා විධියක හොරකම් කෙරෙන බව මා දන්නවා. මේස පුටු ආදිය එක්තරා ගණනකට යම්කිසි ස්ථානයකට ඕඩර් කළාම ඒ හා සමාන ගණනක් එහි සිටින නිලධාරීන්ගේ හෝ ඔවුන්ගේ යහළුවන්ගෙ ගෙවලට යන අවස්ථාත් තිබෙනවා.

රුපියල් හාර පන්දහ වටිනා අල්මාරි, පුටු ආදිය එතැන හැදුවා. නමුත් ඒවා නිලධාරීන්ට වුවමනා ගෙවලට ගියා. ලංකාවේ තිබෙන හොඳම බුරුතවලින් පළමුවන වර්ගයේ මල් බුරුතවලින්—පිටරට යවනවා නම් ඒ බුරුත කියුබික් අඩියක් රුපියල් දහස් ගණන්වලට යාවි—එවැනි හොඳ ලීවලින් බඩු හැදුවා. ඒවා පිළිබඳව දැනුත් සෝදිසි කර බලන්න පුළුවනි. ඒවා කාගේ ගෙවලට ගියාදැයි සෝදිසි කර බලන්න පුළුවනි. නමුත් තමුන්නාන්සේලා එසේ සෝදිසි කිරීමට සූදානම් නැහැ. මෙවැනි වැඩ කරන සිරකරුවන්ට යම් කිසි වේතනයක් දෙන්න පුළුවනි. හොඳ බඩු හදන අයට ඒ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

බඩු තක්සේරු කොට—කියමු හොඳ අල්මාරියක්ය කියා; එය පිටත මාකට් එකේ රුපියල් 500 කට විකුණන්න පුළුවන් නම් එය ඒ ගණනට තක්සේරු කර—ලීවලට යම් මුදලක් වෙන් කොට, ඒ වැඩ කරන සිරකරුවන්ට සපයන කෑම බීම ආදියටත් සෑහෙන මුදලක් වෙන් කොට, යම් කිසි ලාභයක් තිබෙනවා නම් ඒ ලාභය ඒ සිරකරුවන්ගේ පොතක තැන්පත් කොට ඔවුන් හිරෙන් නිදහස් වී යන විට දුන්නොත් ඔවුන් නිදහස් පුරවැසියන් වශයෙන් සිරෙන් ගොස් යම් කිසි රැකියාවක් කිරීම සඳහා ඒ මුදල යොදවන්න පුළුවනි. සිරගෙදර නොයෙකුත් වැඩ දන්නා අය සිටිනවා. වේවැල් වැඩ, යකඩ වැඩ ආදී නොයෙකුත් වැඩ දන්නා සිරකරුවන් සිටිනවා. යකඩ වැඩ මම හිතන්නේ දන් සිරගෙදර ඇතුලේ කරන්න ඉඩ දෙන්නේ නැහැ. පිටතදී මේ කර්මාන්ත කිරීමට පුරුදු පුහුණු වූ කම්කරුවන් සිටිනවා. ඒ වාගේම ඇතුළතදී පුරුදු පුහුණු වූ අයත් සිටිනවා. ඔවුන් යම් කිසි ප්‍රයෝජනවත් වැඩ කිරීම සඳහා යොදවන්න පුළුවනි. නමුත් ඔවුන්ගේ සේවය ලබාගෙන කට යුතු කිරීමට අද වන තුරු නියම සැලැස්මක් සාදා නැහැ.

සිරගෙදර ඇතුළතදී ඇඳීමට වුවමනා රෙදිපිළි මසාගැනීමට පමණක් නොවෙයි, ඒ රෙදි වියා ගැනීමටත් සිරකරුවන් යොදවන්න පුළුවනි. ඔවුන්ට ඉඳ ගැනීමට වුවමනා බංකු පුටු ආදිය මෙන්ම අනිකුත් උපකරණද සිරගෙදරම සිරකරුවන් ලවාම සකස් කරවා ගන්න පුළුවනි. නමුත් ඒවා කිරීමට නියම සැලැස්මක් තිබෙනවාද? නැහැ. ඒ නිසා මම ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, ඒවා සකස් කරවා ගැනීම සඳහා සුදුසු වැඩ පිළිවෙළක් යොදවන්නය කියා.

ඒ වාගේම සිරගෙදර සිටින සිරකරුවන්ට වුවමනා ආහාර ටිකත් සපයාගන්න පුළුවනි. කුණ්ඩසාලේ අක්කර ගණනක්ම තිබෙනවා. කිරි හරක් ඇති කිරීමට දන්නා සිරකරුවන් සිටිනවා. ඒ කිරි, දෙපාර්තමේන්තුවේ අනික් අංශයෙන් නොගෙන, ඒ හිරකරුවන් ලවාම පිළියෙල කර ගන්න පුළුවනි. ගම්බද ගවයන් ඇති කර පුරුදු පුහුණු වූ කට්ටිය හිරගෙවල ඉන්නව. ඒ උදවියට එහෙම වැඩ පිළිවෙළක් සකස් කර දුන්නොත් තමන් ගමේදී කර සළ පුරුද් දක් ලබා ඇති රක්ෂාව නිසා එය දියුණු කර හිරකරුවන්ට වුවමනා විධියට ඒ ආහාරය සපයා දීමට පුළුවන් වන අතර හිරගෙයින් පිට වුණාට පසු ඒ රැකියාව හොඳින් කර ගැනීමටත් එයින් මාර්ගය සැලසෙනව. නමුත් ඒ අන්දමේ වැඩ පිළිවෙළක් අද සැලැස්මක් උඩ ගෙනයන්නෙ නැහැ. ඒ වැඩ කෙරෙන්නෙත් පාර්ලිමේන්තුවෙ කෙරෙන විධියටයි. හෙට කෙරෙන දේ මොකක්ද කියා අද දන්නෙ නැහැ. හැම එකම ඔය විධියයි.

බරපතල සිර දඬුවම් ලබා සිටින උදවිය ගැන කල්පනා කර බලමු. එල්ලුම් ගහට යන්ට නියමව එල්. හෝල් එකේ ඉන්න අය ඒ දවස් දෙක තුන ඉන්න කාමරවලට තමුන්නාන්සෙ ගිහින් බලා තිබෙනවාද? ඒ අංශය භාර ඇමතිතුමා එල්. හෝල් එකේ කාමර බලලා නැහැ. ඒකට දන්ට ඉස්සර හිරකාරයාගේ ඇඟේ ලේ උණු වෙනවා. පෝරකේට යනතුරු ඒ ඉන්න කාලයවත් ටිකක් පිළිවෙළකට ඉන්න පහසුකම් එහි නැහැ. ඒ වගේම වටේ තිබෙන ගොඩනැගිලි අතනින් කැඩිල, මෙතනින් දෙකෙන් පංගුවක් ගරා හැලිල. අනික් පැත්තෙ කානුව ගඳ ගහනව. එතැන තත්ත්වය ඔය විදියයි. මාසෙන් දෙකෙන් මැරෙන්ට ඉන්න උදවියටත් ඒක හරිහැටි සකස් කර දෙන්න.

හිරගෙදර කෑම ගැන කල්පනා කර බලමු. අද කුස්සියෙ වැඩ කරන්නෙ මේ කොටසය කියා දවසින් දවස කෑම උයන්න එක එක කණ්ඩායම් දමනවා. ඒ උදවියගේ කෑම ටික අද ගෙනෙන්නෙ කොන්ත්‍රාත් ක්‍රමය උඩද? නැත්නම් වෙළඳ දෙපාර්තමේන්තුවෙන්ද? පසුගිය කාලයේදී නම් පෞද්ගලික කොන්ත්‍රාත්කාරයකුටයි කෑම සැපයීම භාර දී තිබුණේ. ඒකෙන් කට් එක හම්බ වෙනවා. පෙළක් දිනවල ඒ කුස්සියේ ඉන්න කොටස උයන්න ගියාම බොහොම කලකෝලාහල ඇති වෙනවා. තවමත් එතැන තිබෙන්නෙ කොන්ත්‍රාත් ක්‍රමයද? එහෙම නැත්නම් පිටින් එතැනට අමු ද්‍රව්‍ය ටික යවන්ට මග සලසා තිබෙනවාද? තමුන්නාන්සේ ගමනාගමන ඇමති වශයෙන් සිටිය නිසා තමුන්නාන්සෙ දන්නව ඇති, ඔවර්සියර්ල පාරවල් හදන හැටි. අන්න ඒ විධියටයි මේ වැඩත් කෙරෙන්නෙ. වැඩ කෙරෙන්නෙ නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.]

එතැනට අද නිලධාරින් පත් කරන්නේ කොයි විධියටද කියා මා අහනවා. තවමත් එතැන අධිරාජ්‍යවාදී යුගයේ තිබුණු ක්‍රමයම නේද ගෙන යන්නෙ ? යම් යම් නිලධාරින් ගැනීමට පරීක්ෂණ ඇති කරනව. ඒ පරීක්ෂණවලින් කොයි විධියේ කොටස්ද වැඩි වශයෙන් තේරෙන්නෙ ? අධිරාජ්‍ය යුගයේ යම් වැඩ පිළිවෙළක් එතැනට ඇම්මද, ඒ විධියටමයි තවමත් ඒ ස්ථානයට නිලධාරින් බඳවා ගන්නෙ. ඒක වෙනස් කරන්න ඕනෑ. එසේ කරන්න දැන් පුළුවනි. විශ්ව විද්‍යාලවලින්, මහා විද්‍යාලවලින්, සාමාන්‍ය ජනතාවගේ ළමයි පිට වෙනවා. එවැනි කොටස් ඔවැනි පාලන ස්ථානවලට ඇතුළත් කර ගත්තොත් හුඟක් දුරට අධිරාජ්‍යවාදී වැඩ පිළිවෙළවල් ඉවත් කර ගන්න පුළුවන් වේවි.

සිරකරුවන් ගෙන එන පුදුම වෑන් එකක් තිබෙනවා, “ Black Maria ” කියන නමින්. නමුත් රිමාන්ඩ් එකේ ඉඳලා සිරකරුවන් හැටියට නම් නොකළ අය ගෙන එන විටත්, ඒ කියන්නෙ නීතියෙන් අච්චු නොලබපු අය ගෙන එන විටත්, එබඳු වෑන් රථවල ගෙන එන්නේ ඇයිද කියා මා අහනවා. ඇයි එවැනි අය ඊට වඩා පහසු විදියකට නොගෙනෙන්නෙ ? තවමත් ඒ අය උසාවියට ගෙන එන්නෙ “ Black Maria ” කියන නම දීල තියෙන වෑන්වලයි. ඇයි මේ තත්ත්වය වෙනස් කරන්න බැරි ? ඒ අය නීති මාර්ගයෙන් දඬුවම් විඳල නොවෙයි, රිමාන්ඩ් එකේ ඉන්නෙ. සැක පිටයි. චෝදනාවකට අහු වෙලා ඒකෙ තීරණය ලබා ගන්න කලින් අර විදියට සලකන එක හරි නෑ. වැරදිකාරයන් වන්න ඉස්සෙල්ලා අර විදියට සලකන එක හරිද කියා මා අහනවා. එම නිසා ඊට වඩා වෙනස් වැඩ පිළිවෙළක් ඔවුන් වෙනුවෙන් යොදන්න ඕනෑ. නුඹුන්නාන්සේලාත් ඒවායේ ටික කලක් ගිහින් හිටියොත් තත්ත්වය පෙනේවි.

සිර ගෙය තුළ සිටියදී අපට පවා නියම විදියට වෙදකම ලබා ගන්න බැරි වුණා. මගේ කකුල පහකට කඩල හිරගේ ඇතුළේ අමුතු කුඩුවක දමලා හිටියා, මුර පිට. ඒ කාලයේදී මගේ වැයම් කිරීම උඩ, බල කිරීම උඩ, කෝලාහල කිරීම උඩ, කැඩුම් බිඳුම්වලට ප්‍රතිකාර කිරීම සඳහා සිර ගෙය තුළට සිංහල වෙදකම ඇතුළු කර ගන්න පුළුවන් වුණා. දැන් සිටින සිරකරුවන්ටත් ටිකක් දුරට මෙම වරප්‍රසාදය තිබෙනවාය කියා මා සිතනවා. 1944 දීයි, මගේ උද්ඝෝෂණය ඇති වුණේ. ආයුර්වේද වෙදකම, සිංහල වෙදකම, ලබා ගන්න විට ඒ වෙදකම අනුව ආහාර ගන්නත් වෙනවා. එවැනි ආහාර වෙද මහත්වරුන් නියම කළහම ඒවා ලබාගන්නත් අවසර තියෙන්න ඕනෑ. එසේ නියම කරන ආහාර ලබා ගන්න සිරකරුවන්ට ඉඩ සලස්වා තිබෙනවාද ? නැහැ. බටහිර වෛද්‍යවරයකු විසින් නියම කරනු ලබන දෙයක් නම් ලබා ගන්ට බොහොම පහසුයි. ආයුර්වේද ක්‍රමයට ප්‍රතිකාර ලබන උදවියටත් ඒ ලෙඩේ සුව වීමට දිය යුතු ආහාර ටික දෙන්ට ඕනෑ. මුලින් තිබුණු වැඩ පිළිවෙළ අද කොයි තරම් ප්‍රමාණයකට වෙනස් කර තිබෙනවාද යන්න මම දන්නෙ නැහැ. කෙසේ වෙතත් තවම ඒ අනුව ආහාර දීම සකස් වී නැත කියා මා හිතනවා.

දරුවන් හතර පස්දෙනා ඉන්න අයත් සිරකරුවන් අතරේ ඉන්නවා. තමන්ගෙ නඩත්තුව ගෙන ගිය ගෙදර මූලිකයා සිර භාරයට ගියේ මොන කරුණක් නිසාද කියාවත් ඒ අසරණ දරුවන් දන්නෙ නැහැ. මූලිකයා හිරේ වැටුණාම ගමට වී දුක් විඳින්නෙ ඔහුගෙ දරුවනුත් භාර්යාවත් බව කවුරුත් දන්නවා. ගෙදර ප්‍රධානයා මාස ගණනකට හෝ අවුරුදු ගණනකට හෝ සිර භාරයට ගියාම දරු මල්ලන්ගෙ යැපීම සඳහා යම්කිසි මුදලක් දෙන ක්‍රමයක් තිබුණා. එහෙත් අද එය නියම විධියට ක්‍රියාවේ යෙදෙන්නෙ නැහැ. එය සමාජ සේවා අංශය යටතටයි වැටෙන්නෙ. කාත් කවුරුත් නැති, කිසිම දේපොළකුත් නැති, ඒ නිසා ජීවිකාව ගෙන යාමට මාර්ගයකුත් නැති දරු පවුල්වලට හිරේ වැටුණු ගෘහ මූලිකයා ආපසු ගෙදරට එනතුරු යම් ආධාර මුදලක් දීම සඳහා වැඩ පිළිවෙළක් තිබුණා. ඒ ආධාරමුදල් ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍ර සම්බන්ධයෙන් සහනදායක පිළිතුරු බලාපොරොත්තුවෙන් අද දහස් ගණනක් ඉන්නවා. ඒවා ගැන සිරකරුවන් අපට ලියා එවනවා. මට දරුවන් හතර දෙනයි, භාර්යාවයි ඉන්නවා, ඒ අය ගමේ දුක් විඳිනවා ඇති, යනාදී වශයෙන් අපට ලියා එවනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)
ගණපූරණයක් නැහැ, නියෝජ්‍ය කථානායකතුමනි.

මන්ත්‍රී මණ්ඩලය ගණින් කොට, ගණපූරණයක් නොමැති වූයෙන්, බෙදුම් සීනු ශබ්ද කිරීමට නියෝග කරන ලදී.

පසුව ගණපූරණයක් තුබූයෙන්—

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)
සිය ගණනකට නොවෙයි, දහස් ගණනකට ආධාර මුදල් නැතිකම නිසා කරදර විඳින්ට සිදු වෙනවා. අද වනතුරු ඒ අය සම්බන්ධයෙන් නියම සැලකිල්ලක් දක්වා නැහැ. ඒ අය වෙනුවෙන් මේ රජයත් සැලකිලිමත් වී නැහැ. ගෙදර මූලිකයා හිරේ වැටුණාම ඔහුගෙන් යැපුණු අය හැඩගැස්සීමට වැඩ පිළිවෙළක් තිබිය යුතුයි. එවැන්නක් නොතිබීමේ අනිෂ්ඨ විපාකය මොකක්ද ? හිරේ වැටුණු පියා අට අවුරුද්දක් සිර ජීවිතය ගෙවා ගෙදර එනවා. හිරේ යන විට වයස අවුරුදු දහයේ ළමයෙක් හිටියා නම් පියා ආපසු ගෙදර එන විට ඒ ළමයා අවුරුදු දහ අටක තරුණයෙක්. කෑම බීම ආදිය හිඟ නිසා අතන මෙතන රස්තියාදු වීමට සිදු වීම නිසා ඒ ළමයා නරක් වෙනවා. ඒ ගැන සැකයක් නැහැ. පියා හිරේ වැටුණේ යම් වරදකට පෙළඹුන නිසාද, පියා එයින් මිදී ආපසු ගෙදර එන විට ඔහුගෙ දරුවත් එම වරදටම ඇබ්බැහිවෙලා අවසානයි. ඒක වළක්වන්ට බැහැ, නියම වැඩ පිළිවෙළක් නැතුව. සුදුසු වැඩ පිළිවෙළක් යොදා ඒ දරුවා හැඩ ගස්සන්ට පුළුවන් නම් එයින් සමාජයට විශාල ප්‍රයෝජනයක් ලැබෙනවා. නමුත් ඒක පිරිමැසීම පිණිස රජය තවම නියම අඩියක් අර ගෙන නැහැ. පසුගිය දිනවල සිර ගෙවල සිටින අයගෙන් මට ලිපි කීපයක් ඇවිත් තිබෙනවා. මම අහවල් කරුණ නිසා හිරේට ගියා ; හදිසි කෝපය නිසා ඇතිවූ කෝලාහලයකදී අතක් කඩා නැත්නම් කකුලක් කඩා හිරේට ගියා ; මගේ දරුවන්ට නැත්නම් භාර්යාවට කිසිවක් නැහැ ; මම රැකියාව කළේ අහවල් තැන ; කරුණා කර මට ආධාරයක් දෙන්න ; ඔය ආදී වශයෙන් ලිපි එවනවා. නමුත් තවම මේ රජයෙන් මේවාට කිසිම සහනයක් ලැබී නැහැ. එබඳු සමහර හිරකරුවන් හිරගෙයිදීම වඩු කර්මාන්තය හෝ වේවැල් කර්මාන්තය හෝ එහෙම නැත්නම් රෙදි විවීම හෝ කරනවා නම්, එයින් යම් දෙයක් උපයන්නට පුළුවන් නම්, එයින් කීයක් හරි අර ගෙදර සිටින දරු පවුලට යවන්නට වැඩ පිළිවෙළක් යොදන්නට පුළුවනි.

**ගරු මෛත්‍රීපාල සේනානායක**
*(கௌரவ மைத்திரிபால சேனநாயக்க)*
(The Hon. Maithripala Senanayeke)
කර්මාන්ත 18 ක් කරනවා.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)
ඒක බොහොම හොඳයි. ඒ මාර්ගයෙන් ලැබෙන මුදල් අර විධියේ පවුල්වලට යොදවන්නට පුළුවන්. එය මාස්පතා ගෙදරට දෙන ආධාර මුදල් හැටියට යොදන්නට පුළුවනි. කෙනෙක් සිරගෙයි ඉඳගෙන අර විධියට නියම කාල වේලාවට වැඩ කර රුපියල් 15 ක්, 20 ක්, 25 ක් උපයනවා නම්, එය අර විධියේ අයගේ ගෙවලට යවන්නට පුළුවන්. ඔවුන් නිෂ්පාදනය කරන භාණ්ඩ විකුණා හෝ හිරගෙයි ප්‍රයෝජනයට ගෙන මුදලක් තක්සේරු කර එය දෙනවා නම්, පවුල නඩත්තු කරන්න පුළුවනි. බන්ධනාගාරයේ සිටගෙනම දරු පවුල නඩත්තු කරන්න පුළුවනි. ඒ ක්‍රමය නොයොදන්නේ ඇයි ? මේ කාරණය ක්‍රියාවේ යොදවන්නය කියා විශේෂයෙන්ම ඉල්ලා සිටිනවා. මේ හිරකරුවෙක් හිරගේ ඇතුළේ ඉඳගෙන යම් කර්මාන්තයක යෙදෙනොත්, ඒ මුදල ගමේ සිටින ඔහුගේ පවුලට යවන්න. ඒ ප්‍රතිපත්තිය තමුන්නාන්සේලා පිළිගන්නවාද කියා මා අහනවා.

මෙතන වෙන් කර තිබෙන්නේ විශාල මුදලක් නොවෙයි ; රුපියල් 75,000 යි. මේ මුදලෙන් අද හිරගේ ඇතුළේ පාවිච්චි කරන කෝප්ප, පිඟන්, තැටි ආදිය තිබෙනවා. ඒවා ගැන ටිකක් බලන්න. එහි පාවිච්චි කරන කෝප්ප, තැටි ආදිය හිරකාරයින්ම ශුද්ධ කර තබා ගන්නවා. නමුත් ඒවා ආහාර ගන්න අවස්ථාවක පාවිච්චි කරන්න බැරි විධියේ ඇතැම් අවස්ථා තිබෙනවා. ඒ වගේම නාන ස්ථානත් තිබෙනවා. නාන්න තිබෙන්නේ මිනිත්තු ගණනයි. එතනට ඇවිත් වතුර බාල්දි දෙක තුනක් ඔළුවට වක්කරගෙන යනවා. හිරකාරයෝ වුණාටම අර හිට්ලර්ගේ "කොන්සෙන්ට්‍රේෂන් කෑම්ප්" එකේ වගේ වැඩ ගෙනියන්න

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.]

වටින්නෙ නැහැ. රටේ සමාජයේ ජනතාව හිරගෙවල දමා දඬුවම් දෙන එක ඊට වඩා වෙනස්. එහෙයින්, ඔවුන් නියම මනුෂ්‍යයන් වශයෙන් සලකා, නෑමට බීමට වතුර ටික, නිදාගැනීමට පහසුකම්, ආදී මනුෂ්‍යයන්ට ලැබිය යුතු අයිතිවාසිකම් මනුෂ්‍යයින් වශයෙන් ඒ අයටත් දිය යුතුයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මීට වඩා මම මේ ගැන යමක් කියන්නට අදහස් කරන්නේ නැහැ. බන්ධනාගාරගත වන යම් සිරකරුවකුගේ නඩත්තු කළ යුතු දරු පවුලක් සිටින අවස්ථාවකදී, බන්ධනාගාරයේදී ඒ සිරකරුවා නිපදවන භාණ්ඩවල වටිනාකමින් කොටසක් එම සිරකරුවාගේ දරු පවුලට යැවීමට වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයි. එය මූලික කරුණක් වශයෙන් සැලකිය යුතුයි. අධිරාජ්‍ය යුගයේ පණවන ලද දරුණු නීතිරීති තවමත් මේ රටේ ක්‍රියාත්මක වෙනවා. විශේෂයෙන්ම සිරගෙවල කටයුතු කරන්නේ ඒ නීතිරීතිවලට අදාළවයි. ඒ නිසා නිදහස් රටක සමාජයට ඔබින විධියට මේ නීතිරීති වහාම සංශෝධනය කරන්ට ඕනෑ. අධිරාජ්‍ය යුගයේ පණවන ලද අද තිබෙන නීතිරීති නිදහස් මනුෂ්‍ය කොටසකට යෝග්‍ය වන පරිදි ලිහිල් කරන්ට ඕනෑ. මේ නීතිරීති වෙනස් කර, බන්ධනාගාර වැඩ පිළිවෙළ ශුද්ධ කිරීමෙන් සමාජය හොඳාකාර හැඩ ගැසීම නිසා විශාල ප්‍රයෝජනයක් අත් වෙනවා. මේ කරුණු ගැන මම ආණ්ඩුවේ විශේෂ සැලකිල්ල යොමු කරනවා.

ඒ අතරම අසාධාරණ පගා ක්‍රමයක් උඩ, උසාවියේ තීන්දුවලටත් පටහැණිව, හත් අට අවුරුද්දකට බන්ධනාගාරගත වුණු සමාජ දූෂකයින් තමන්ගේ දේශපාලන බලය යොදා නියමිත කාලයට පෙර සිරගෙයින් එළියට ගැනීමට ක්‍රියා කළ අයට තදින්ම දෝෂාරෝපණය කරමින් මගේ කථාව මෙයින් අවසාන කරනවා.

අ. භා. 7.37

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்கிரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බන්ධනාගාර සම්බන්ධයෙන් මමත් වචන ස්වල්පයක් කියන්ට අදහස් කරනවා. මට ප්‍රථමයෙන් කථා කළ ගරු මන්ත්‍රීවරුන් සිරකරුවන් සම්බන්ධවත් සිරගෙවල් සම්බන්ධවත් දීර්ඝ ! විස්තර කරන්ට යෙදුණා. එහෙයින් රිමාන්ඩ් සිරකරුවන් සම්බන්ධයෙන් කරුණු කීපයක් ගැන මේ අවස්ථාවේදී ගරු ඇමතිතුමාගේ සිත යොමු කරවන්න මම බලාපොරොත්තු වෙනවා.

රිමාන්ඩ් සිරකරුවන් කියන්නේ වැරදිකරුවන්ට නොවෙයි. ඔවුන් චෝදනාවලට ලක් වූ අය පමණයි. මෙසේ චෝදනාවලට ලක් වන අය රිමාන්ඩ් සිර භාරයට ගැනීමේදී ඔවුන්ට මනුෂ්‍යයන්ට මෙන් සැලකීම යුතුකමක්. එහෙත් අද රිමාන්ඩ් සිරකරුවන්ට නිදා ගැනීමට පැදුරක් පවා නොලැබෙන අවස්ථා තිබෙනවා. සමහර රිමාන්ඩ් සිරකරුවන්ට ගෙදරින් කොට්ට මෙට්ට ගෙන්වා ගැනීමට සිද්ධ වී තිබෙනවා.

රිමාන්ඩ් සිරකරුවන් පිළිබඳ මාතර තිබෙන තත්ත්වය ගැන ඇමතිතුමාගේ අවධානය යොමු කරවන්න කැමතියි. ගාල්ලේ සිට මාතරට දුම්රියෙන් රිමාන්ඩ් සිරකරුවන් ගෙනෙනවා. ඉන් පසු දුම්රිය ස්ථානයේ සිට සැතපුම් දෙකහමාරක් පමණ මහ පාර දිගේ පයින්ම මොවුන් රැගෙන යනවා. මාංචු දමා, දම්වැලකින් එකිනෙකා ඇදා, මේ සිරකරුවන් එසේ සැතපුම් දෙකහමාරක් පමණ මහ පාර දිගේ පයින්ම රැගෙන යන්නේ හරියට හරක් දක්කන්නා වාගෙයි. ඒ අන්දමට ඒ සිරකරුවන් නැවත වරක් ආපසු ගාල්ලට ගෙන යනවා.

වැරදිකරුවන් නොවූ රිමාන්ඩ් සිරකරුවන්ට අද මේ කරන්නේ විශාල නින්දාවක්. මේ සම්බන්ධව මීට කලිනුත් මම පැමිණිලි කර තිබෙනවා. එහෙත් අද වන තුරු රිමාන්ඩ් සිරකරුවන්ට සලකන තත්ත්වය පිළිබඳව කිසිම වෙනසක් සිදු වී නැහැ. එදා මෙන්ම අදත් හරකුන්ට මෙන් රිමාන්ඩ් සිරකරුවන්ට මාංචු දමා, දම්වැල් දමා, එකට ඇදා උසාවිය දක්වා මහපාර දිගේ පයින්ම ගමන් කරවනවා. එසේ ගමන් කරන රිමාන්ඩ් සිරකරුවන් ගැන මහජනයා කල්පනා කරන්නේ ඉතාමත් පහත් අන්දමටයි. ඒ නිසා මේ තත්ත්වය වහාම වෙනස් කරන ලෙස මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. යටත් පිරිසෙයින් වැරදිකරුවන් නොවූ ඒ රිමාන්ඩ් සිරකරුවන් එහා මෙහා ගෙන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

යෑමේදී ඔවුන්ගේ ගරුත්වය රැකෙන අන්දමට ඔවුන්ට වාහනයක්වත් සපයන මෙන් මම ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. චෝදනා එල්ල වුණු අහිංසක උද වියට මේ විධියේ තත්ත්වයකට මුහුණ පාන්නට සිදු වී තිබෙනවා. මෙය ඉතාමත් වැරදි වැඩ පිළිවෙළක්ය කියන එකයි, මා මතක් කරන්නේ. මාතර රිමාන්ඩ් හිර ගෙදර නම් සම්පූර්ණයෙන්ම අපායක්. කිසිම හිරකරුවකුට මොන ක්‍රමයකටවත් ඒ හිරගෙදර ජීවත් වන්ට බැහැ. අද එහි තත්ත්වය ඒ විධියයි. මාතර හිරගෙදර කටයුතු සම්බන්ධයෙන් බොහෝ කාලය කින් පරීක්ෂා කර බලා නැහැ. මේ ආණ්ඩුව හෝ මීට කලින් තුබුණු ආණ්ඩු හෝ ඒ හිරගෙදර කටයුතු ගැන සොයා බලා නැහැ. ඒ නිසා මාතර හිරගෙදර ගැන වහාම සොයා බැලීමට දැන් කාලය පැමිණ තිබෙනවා. කොමිෂන් සභාවත් පත් කරල නම් වැඩක් නැහැ. ඊට හේතුව කොමිෂන් සභාවල වාර්තා අපට දකින්ට නොලැබීමයි. අනික් කාරණය කොමිෂ මක් පත් කළොත් එහි නිර්දේශ අනුව වැඩ කරන්ට ඕනෑ. මාතර රිමාන්ඩ් හිර ගෙදර සිටින හිරකරුවන්ගේ දුක්ගැනවිලි ගැන වහාම විභාග කර බැලිය යුතුයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, උසාවිය මඟින් හිර දඬුවම් නියම කරනු ලැබුවත් කුමක් හෝ හේතුවක් නිසා බොහොම සුළු කාලයකින් හිරෙන් නිදහස් වෙනවා. ලොකු හිර දඬුවම් ලැබූ අය හය මාසයෙන් ගෙදර එනවා. ඒ වගේම යම් තැනැත් තකු, සුප්‍රිම් උසාවියේදී බොරු සාක්කි දීම හේතු කොට ගෙන, විත්තිකාරයකු විය යුතු හැටියට විනිශ්චයකාරතුමා විසින් ප්‍රකාශ කරනු ලැබ, හාර පස් මාසයකට හිර ගෙට නියම කරනු ලබන නමුත් දින හයෙන් ගෙදර එනවා. එවැනි සිද්ධි ඇති වී තිබෙනවා. යම්කිසි තැනැත්තකු හිරෙන් නිදහස් කළ විට ඇමතිවරයාගේ යුතුකම ඒ පිළිබඳව මේ ගරු සභාවට දැන්වීමයි. යමකු හිරෙන් නිදහස් කිරීමේ හේතු මේ ගරු සභාවට දැන්විය යුතුයි. එවිට ගරු මන්ත්‍රීවරුන්ට ඒ පිළිබඳ අදහස් ප්‍රකාශ කරන්ට පුළුවනි. නමුත් හය මාසයක් හිරේට නියම වූ අය දින හයකින් හිරෙන් නිදහස් කිරීමට ඇමතිවරයාට බලයක් තිබෙනවා නම් ඊට හේතු දැන ගැනීමට මහජනයාට අවශ්‍යයි.

පරිපූරක මුදල්

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බෞද්ධ හිරකරුවන්ගේ ආගමික කටයුතු සම්බන්ධයෙන්, පාදිලි පූජකයන්ට තිබෙන තැන බෞද්ධ භික්ෂූන් වහන්සේ ලාට නැත. මීට පෙරත් ගරු ඇමතිතුමා ඒ ගැන දැන ගන්ට ඇති. සෝමාරාම එල්ලා මරනු ලැබුවාද නැද්ද කියා මා ගරු ඇමති තුමාගෙන් අහනවා. ඒ ගැන ඇමතිතුමා දන්නවාද? සෝමාරාම එල්ලනු ලැබුවේ නැත, එල්ලනු ලැබුවේ පිටර් කෙනෙක්ය කියා දැන් මහජනයා කියනවා. දැන් තිබෙන්නේ මේ විධියේ තත්ත්වයක්. කවුදෝ පාදිලි කෙනකු ගොස් මොකක් දෝ වැඩක් කළාට පස්සේ සෝමාරාම පිටර් කෙනෙක් වුණාලු. රජය භාරයේ තිබෙන හිරගෙදරට මේ සිදු වන්නේ මොනවාද? එහි බෞද්ධ භික්ෂූන් වහන් සේලාට නියම තැනක් නැතිලු. ඒ නිසා ගරු ඇමතිතුමා ඒ ගැන පරීක්ෂණයක් පවත්වන්නට ඕනෑ. පුරාණ අධිරාජ්‍යවාදී කාලයේදී වගේ හිරගෙදර නිලධාරීන් ඉතාමත් පහත් විධියට හිරකරුවන්ට දඬුවම් කරනවාලු. ඒ විධියේ නිලධාරීන් කොටසක් සිටින බව දැනගන්ට ලැබී තිබෙනවා. දෙන අච්චු මොනවාද කියා පරීක්ෂා කරන්නට ඕනෑ. වේවැලක් අර ගෙන හිරකරුවන්ට තළනවා නම් ඒ තළන්නේ මොන විධියටද, හිරකරුවන්ට වුණත් දිගට හරහට තැළීමට අවසර දී තිබෙනවද, හිර ගේ ඇතුළේ කෙරෙන වැඩ මොනවාද, කියා පරීක්ෂා කර බලන්නට ඕනෑ. අද හිර ගෙදර ඉන්න නිලධාරීන්ගේ තත්ත්වය කුමක්ද? හිර ගෙදර නිලධාරියකුට මාරුවක් ලබා ගැනී මට වුවමනා වූ අවස්ථාවක කොතෙක් කාරණා ඉදිරිපත් කළත්, හය මාසයක් කාරණා ඉදිරිපත් කළත්, අවුරුද්දක් කාරණා ඉදිරිපත් කළත්, ඒ මාරුව ලබා ගන්නට බැරි තත්ත්වයක්—ඔවුන්ට ඔවුන්ගේ අයිතිවාසිකම් ලබා ගන්නට බැරි තත්ත්වයක්—තියෙනවා. පහළ නිල ධාරි කොටසටයි, මේ විධියේ තත්ත්වවලට මුණපාන්නට සිදු වී තියෙන්නෙ. ඒ නිල ධාරීන්ගේ තත්ත්වය ගැනත්, විශේෂ යෙන්ම වැරදිකරුවන් නොවූ, රිමාන්ඩ් භාරයේ සිටින පුද්ගලයන්ට කරන සැල කිලි සම්බන්ධවත්, පරීක්ෂණයක් පවත් වන ලෙස මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අ. භා. 7.46

**වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. ඩී. ද සිල්වා**
*(டொக்டர் டப்ளியு. டீ. டி சில்வா)*
(Dr. W. D. de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි කොළඹ නගරයේ තිබෙන හිර ගේ තිබෙන්නෙ මගේ කොට්ඨාශයේ යි. ඒ නිසා මේ වැය ශීර්ෂය යටතේ කාරණා කීප යක් ගරු ඇමතිතුමාට ඉදිරිපත් කරන්නට මම කැමතියි. දවසක් හිර ගෙදරට ගිහින් පරීක්ෂණයක් පවත්වන මෙන් මම ගරු ඇමතිතුමාගෙන් කරුණාවෙන් ඉල්ලා සිටිනවා. හිර ගෙදර ප්‍රශ්න ගැන සලකා බැලීමට කාරක සභා කීපයක් පත් කරනවා. නමුත් තවම ඒවායින් කිසිම සතුටුදායක වැඩක් සිදු වී නැති බව කව්රුත් දන්නවා. ඒ නිසා මේ වැය ශීර්ෂය යටතේ හිරකරුවන්ගේ තත්ත්වය පහදා දීම මගේ යුතුකමක් හැටියට මම සලකනවා. ඇත්ත වශයෙන්ම කොළඹ නගරයේ සමහර උදවිය තමන්ගේ මුළු ජීවිතයෙන් වැඩි කොටසක් ගත කරන්නේ හිරගෙදරයි. නොයෙක් කාරණා නිසයි, එසේ වන්නේ. සමහර විට හිර ගෙදරින් එළියට එන උදවියට සමාජයේ වැදගත් පිළිවෙළට ජීවත් වන්නට අවස්ථාවක් ලැබෙන්නෙ නැහැ. ඒ නිසා ඒ අයට තවත් වැරදි කරන්නට සිදු වෙනවා. ඒ නිසා ඒ උදවියට තව වරක් හිර ගෙදරට යන්නට සිදු වන බව කනගාටුවෙන් ප්‍රකාශ කරන්නට ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද උදේ එක්තරා මනුෂ්‍යයෙක් මා සමග කථා කරමින් සිටියා. ඒ තැනැත්තා විසි වරක් පමණ හිර ගෙදරට ගොස් තිබෙනවා. තමුන්නාන්සේ අපට හොඳින් ජීවත් වන්නය කියා අවවාද දෙනවා, නමුත් හිර ගෙදරින් ආ විට අපට රැකියාවක් ලබා ගන්නට අවස්ථාවක් රජය හෝ සමාජය සලස්වා තියෙනවාද කියන ප්‍රශ්නය ඒ තැනැත්තා අහනවා.

ඒ කාරණය කෙසේ වුණත් හිර ගෙදර කෑම ප්‍රශ්නය ගැන තමුන්නාන්සේ සොයා බලන්නට ඕනෑ. විශේෂයෙන් හිරේට නියම වන්නට කලින් රිමාන්ඩ් භාරයේ සිටින උදවියගේ කෑම ප්‍රශ්නය ගැන ගරු ඇමතිතුමා කරුණාවෙන් සලකා බලන්නට ඕනෑ. හිර ගෙදර කෑම උයන විදිය ගැන තමුන්නාන්සේ දන්නවා. දාහකට, දෙදාහකටයි, කෑම උයන්නේ. ඒ කෑම ප්‍රිය නැති බව තමුන්නාන්සේ දන්නවා. කරුණා කර තමුන්නාන්සේ හිර ගෙදරට ගොස් ඒ ගැන පරීක්ෂා කර බලා සුදුසු වැඩ පිළිවෙළක් යොදන්න. ඒ උදවිය මනුෂ්‍යයෝයි. ශීලාචාර සමාජයක කිසිම කෙනකුව කාමරයක් ඇතුළට දාලා, කම්බි ගහලා සතකු වගේ තබා ගැනීම හොඳ වැඩක්ය කියා මම නම් කල්පනා කරන්නෙ නැහැ. ඒ උදවිය හරි මග යැවීමට සමාජය වැඩ පිළිවෙළක් යොදන්නට ඕනෑ. යම් කිසි කෙනකුව හිර භාරයට ගත් පසු ඒ අයවත් මනුෂ්‍යයන් හැටියට සැලකීම ශීලාචාර සමාජයක යුතුකමක් බව අපි කල්පනා කරන්නට ඕනෑ. හිර ගෙදරත් පංති භේදය පවතිනවා. පොහොසත් තැනැත්තෙක් හිර ගෙදරට ගියාම ස්ටාර් ක්ලාස් එකක් ලබාගෙන සාමාන්‍ය තැනැත්තකුට වඩා හොඳට කෑම් බීම් ආදිය ලබා ගනිමින් ජීවත්වෙනවා.

වනාතමුල්ල, පුංචි බොරැල්ල, ආදී පළාත් වලින් හිර ගෙදරට ඇතුල් වී සිටින උදවිය බැලීම පිණිස අඩු ගණනේ මසකට වතාවක් වාගේ මාත් සිර ගෙදරට යන සිරිතක් තිබෙනවා. එහෙම යන සෑම අවස්ථාවකම පාහේ මට කරන පැමිණිල්ලක් තමයි "බලන්න මහත්මයා, අසුවල් තැනැත්තා හිර ගෙදරට වැටී සිටින්නේ අසුවල් බලවත් අපරාධය කරලයි, නමුත් ඒ අයට හොඳ සත්කාර සැලකිලි නම් කිසිම අඩුවක් නැතිව ලැබෙනවා" ය කීම. මෙවැනි ස්ථාන වලට ගියත් මිනිසුන්ට මිනිසුන් වශයෙන් ජීවත්වීමේ අවස්ථාව සැපයීම අප සතු යුතුකමක්. ඒ හෙයින් සිර ගෙවල තිබෙන පංති භේදය නැති කර දමන්න ඕනෑ. සමාජවාදි ආණ්ඩුවකැයි කියා ගන්න මෙම ආණ්ඩුව මේ අන්දමට පංති භේදය පැවැත්වීම ගැන සාමාන්‍ය මහජනයා මවිත වී සිටිනවා. මම නිලධාරීන්ට චෝදනා කරන්නෙ නැහැ, මා කියන්නෙ මෙම ක්‍රමය නැති කර දැමිය යුතුය කියායි.

සුද්දන්ගෙ කාලයේදී නම් පංති භේදයක් පවත්වා ගෙන යාමට හේතුන් තිබුණාය කියන්න පුළුවන්. එම ක්‍රමයම තවමත් පවත්වාගෙන යනවාය කියා එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුව පැවති කාලයේදීත් එම ආණ්ඩුවට අප චෝදනා කළා. ඒ හෙයින් තමුන්නාන්සෙලාගෙ කාලය තුළදී කළ ප්‍රතිසංස්කරණය කුමක්ද

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කියා මේ ගරු සභාවට පැහැදිලි කර දෙන්නය කියා මා ඉල්ලා සිටිනවා. හිර ගෙදරත් පොලිස් ස්වරූපයකින්ම පවත්වා ගෙනයාමට කිසිම යුතුකමක් නැහැ, තමුන්නාන්සේලාට. පොලිස් අත් අඩංගුවට ගත්තායින් පසුවත් සාමාන්‍ය මහජනයාට නොයෙක් විධියේ අඩන්තේට්ටම් කරන්න තමුන්නාන්සෙල ඉඩ දෙනවා. ඒ නිසා සිර ගෙදරට ගිය විට හෝ ඒ අය මිනිසුන් වශයෙන් සලකා ක්‍රියා කිරීමට තමුන්නාන්සෙලාට යුතුකමක් තිබෙනවා. ඒ අයත් මිනිස්සු. ප්‍රේතයන් නැත්නම් භූතයන් නොවෙයි. සිර ගෙවල සිටින අයට නිදා ගන්න ඇඳන්වත් සපයා දී නැති බව තමුන්නාන්සේ දන්නවාද?

දුප්පත් මිනිසුන් හිරගෙදරට ගියාම ඔවුන්ට මනුෂ්‍යයින් හැටියට සලකන්න ඕන. නමුත් අවාසනාවකට මෙන් දුප්පත් නැනැත්තෙක් හිරගෙදරට ගියත් පොලීසියට ගියත් ඔහුට සලකන්නේ මනුෂ්‍ය ලීලාවකින් නොවෙයි. දුප්පත් මිනිහෙක් පොලීසියට ගත්තාම ඔහු කූඩුවකට දානවා. එහි එළියක් ඇත්තේ නැහැ. වාඩි වෙන්න පුටුවක් ඇත්තේ නැහැ. නිදාගන්න ඔහුට තැනක් ලැබෙන්නේ නැහැ. එතැනින් අළුත්කඩේට ගෙනගියාම එතැනත් කූඩුවකට දානවා. අළුත්කඩේ උසාවියේ කූඩුවේ තත්ත්වය නම් හරියට සත්තු ගාලක් වගෙයි. 150ක් 200ක් පමණ ඒ කූඩුවට දානවා. එතැනදී ඒ තැනැත්තා වැරදිකාරයකු වුවොත් නැවතත් කූඩුවට දමා පසුව සම්පූර්ණයෙන්ම වැසූ බස් එකක දමාගෙන වැලිකඩ හිරගෙදරට ගෙන යනවා. ඔවුන් දුප්පත් බවට පත් වී ඇත්තේ සමාජ තත්ත්වය නිසයි. නැති නම් රජයේ ක්‍රියාකාරී තත්ත්වය නිසයි. මෙය ලොකු සමාජ ප්‍රශ්නයක්.

මෙසේ හිරගෙදරට ඇතුළු වන සිරකරුවන්ට මනුෂ්‍යයින් ලෙස සැලකිය යුතුයි. එපමණක් නොවෙයි, ඔවුන් නිදහස් වී ආපසු පැමිණි විට ඔවුන්ට යහපත් පුරවැසියන් වශයෙන් මේ සමාජයේ සිටීමට රජය කටයුතු සැලසිය යුතුයි. එසේ පැමිණෙන අයට රක්ෂා සපයා දීම ආණ්ඩුවේ යුතුකමක්. එමෙන්ම ඒ දුප්පත් වැසියන් හිරගෙදරට ගියාම ඔවුන්ගේ අඹු දරුවන් රැකබලා ගැනීමට විධි විධාන සැලසිය යුත්තේද ආණ්ඩුව මඟිනුයි. ඔවුන්ගේ අනාගතය ආරක්ෂා කර දීම ආණ්ඩුවේ යුතුකමක්. පියා යම් හෙයකින් වරදකරුවෙක් වුවාට දරුවන් මොනවා කරන්නද? සමහර විට පියා අහිංසක වෙන්නත් පුළුවනි. අපි දන්නවා, අද බොරු චෝදනා උඩ මිනිසුන් අල්ලාගෙන යන හැටි. සමහර විට නීතිඥයින් නඩුවට පෙනී නොසිටීම නිසත් මිනිසුන්ට හිරගෙදරට යන්න වෙනවා. ඒක වෙනම කාරණයක්. කෙසේ හෝ එසේ කෙනකු හිරගෙදරට නියම වූවාට ඔහුගේ අඹු දරුවන් මොනවා කරන්නද? ඒ නිසා එවැනි හිරකරුවන්ගේ අඹු දරුවන් රැකබලාගැනීම ආණ්ඩුවේ යුතුකමක්.

අද දුප්පත් කෙනකු හිරගෙදරට ගියාම ඔහුට කිසිම සහනයක් ලැබෙන්නේ නැහැ. ඒ ගැන නිලධාරීන්ට චෝදනා කිරීමෙන් වැඩක් නැහැ. ඒ තත්ත්වයට වගකිය යුත්තේ රජයයි. හිරකරුවන්ට ලැබිය යුතු සහනය ලබාදීමට මේ රජය කිසිම උත්සාහයක් ගෙන නැහැ. මගේ කොට්ඨාශයේ වනාතමුල්ල ප්‍රදේශයේ පවුල් රාශියක් සිටිනවා, මේ කාරණා නිසා අනාථ බවට පැමිණි. සාමාන්‍ය කෙනෙක් හිරගෙදරට යන්නේ කැමැත්තෙන් නොවෙයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නිලධාරීන් ගැනත් කරුණක් දෙකක් කියන්ට තිබෙනව. ඒ නිලධාරීන්ගේ දුක්ගැනවිලි රාශියක් තිබෙනව. ඒ උදවිය රජයට කීප වරක්ම ඒවා ඉදිරිපත් කර තිබෙනව. ඒ නිලධාරීන්ගෙ ජීවන ප්‍රශ්න, වැටුප් ප්‍රශ්න, වෘත්තීය සමිති පිහිටුවා ගැනීමේ ප්‍රශ්න ආදිය නොයෙක් අවස්ථාවලදී ඉදිරිපත් කර තිබෙනව පොලීසිය ආදි අනිකුත් හමුදාවලට වෘත්තීය සමිති පිහිටුවා ගන්න ඉඩක් නැතිවා වගේම ඒ අයටත් වෘත්තීය සමිති පිහිටුවා ගන්න ඉඩ ප්‍රස්තාවක් නැහැ. මේ ආණ්ඩුවත් මීට ප්‍රථම තිබුණු ආණ්ඩුවත් ඒ නිලධාරීන් සඳහා නිවාස ක්‍රම කීපයක් සකස් කර තිබෙනව. එහෙත් ගෙවල් ලබාගැනීමට අමාරුකම් රාශියක් තිබෙන තවත් පවුල් කීපයක් ඒ අතර ඉන්නව. ඒ සේවක පිරිසට නිවාස ක්‍රමයක් සකස් කර දීම ආණ්ඩුවේ යුතුකමක්. ඒ නිලධාරීන්ට ගෙවල් කුලී වශයෙන් ලැබෙන දීමනාව කිසි සේත් ප්‍රමාණවත් නැහැ. මා එසේ කියන්නෙ වගකීමක් ඇතිවයි. වැලිකඩ හිරගෙයත්, රිමාන්ඩ් හිරගෙයත් තිබෙන්නේ මගේ ප්‍රදේශයේයි. ඒ දෙකේ සේවය කරන නිලධාරීන්ගෙන් වැඩි දෙනෙක් පදිංචිව සිටින්නේ බොරැල්ල අවට ප්‍රදේශවලයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. ඩී. ද සිල්වා]

මා පසුගිය අවුරුද්දේත් ඇමතිතුමාට පෙත්සමක් යැව්ව, ඒ උදවියගේ වැටුප් සම්බන්ධව සහ වෘත්තීය සමිති පිහිටුවා ගැනීමට ඉඩ දීම සම්බන්ධව. නමුත් මට මේ දක්වා ඒට ඇමතිතුමාගෙන් පිළිතුරක් ලැබී නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හිරගෙවල නිලධාරින්ගේ ප්‍රශ්න ගැන රජය නියම අන්දමට සලකා බලන්නෙ නැත්නම් ඒ උදවියගෙන් නියම අන්දමේ සේවයක් ලබා ගැනීමට පුළුවන්ද කියන එක අපි කල්පනා කරන්න ඕනෑ. නොයෙක් අවස්ථාවල තමුන්නාන්සේටත් අපටත් අසන්ට ලැබෙනවා, හිරගෙවල නොයෙක් විධියේ දූෂණ සිදු වෙනවාය කියා. අපට පුවත් පත් මාර්ගයෙන් දකින්ට ලැබෙනව, එ එවැනි වාර්තා. සමහර අවස්ථාවලදී අපට අසන්ට දකින්ට ලැබෙනව, සිරගෙවලට නොයෙක් බඩු භාණ්ඩ යැව්වාය, සිරකරුවන්ට නොයෙක් ද්‍රව්‍ය දුන්නාය කියා නිලධාරීන්ට දඬුවම් කරන බව. ඒ විධියේ වරදක් කර තිබෙනවා නම් දඬුවම් දීම යුතුකමක්. එහෙත් ඇමතිවරයා බලන්න ඕනෑ, මේ නිලධාරින්ගේ තත්ත්වය කෙබඳුද කියා. එසේ නැත්නම් එය ඇමතිතුමාගේ යුතුකමක් පැහැර හැරීමක්. ඒ නිලධාරින්ගේ දුක්ගැනවිලි ගැන දෙපාර්තමේන්තුව ක්‍රියා නොකරන නිසා ඒ නිලධාරින් හොර රහසේ සංගම් හදාගෙන යනව. ඒවා හදාගෙන යන්නෙ භයෙන්. සමහර සුළු නිලධාරීන් වෘත්තිය සමිති සමාගම් හදාගන්ට භයේ සිටිනව. ඒ නිලධාරීන්ගේ ජීවන තත්ත්වය නඟා සිටුවීම ගැන රජය කිසිම සැලකිල්ලක් දක්වන්නෙ නැහැ.

සමහර අවස්ථාවලදී මේ රජය මගින් සිරකරුවන් යොදවා තිබෙනවා, වැඩ කරන සාමාන්‍ය කම්කරුවන්ගේ සටන් කඩාකප්පල් කිරීමට. මේ විධියේ නොයෙකුත් ව්‍යාපාර සිර ගෙවල් ඇතුලේ ගෙන යනවා. සිරකරුවන් එවැනි වැඩවලට යොදවන්න ආණ්ඩුවට කිසිම යුතුකමක් නැහැ. වරාය වැඩ වර්ජන අවස්ථාවලදී මේ ගරු ඇමතිතුමා භාරයේ සිටින සිරකරුවන් යෙදෙව්වා, එම ව්‍යාපාරය කඩාකප්පල් කිරීමට. නියම වශයෙන් සිරකරුවන් වැඩදායක ව්‍යාපාරයක යෙදවීමට වුවමනා නම්, ඔවුන්ට නිසි නිදහස දීලා ගොවිපළවලට යවන්න. එම ව්‍යාපාර ඔවුන් ලවා දියුණු කරවාගෙන ඔවුන්ටත් මනුෂ්‍යයන් හැටියට සමාජයේ ජීවත් වීමට අවස්ථාව සලසා දෙන්න. ලංකාව දියුණු කිරීම පිණිස සිරකරුවන් නියම ආකාරයට යොදවන්න අදහසක් නැහැ. සිරකරුවන් බන්ධනාගාරවලට රොක් කරගෙන කඩාකප්පල්කාරී වැඩවලට පමණක් යොදවන්නයි, අදහස් කරගෙන සිටින්නෙ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සිරකරුවන් සඳහා, බන්ධනාගාර කටයුතු සඳහා, මෙම රජයට විශාල මුදලක් වැය වෙනවා. සමහර මිනිස්සු අපරාධ කරන්නෙ, සමාජයේ තිබෙන අමාරු තත්ත්වය නිසයි. සමහරු රැකී රක්ෂා ප්‍රශ්නයෙන් පීඩාවට පත් වී සිටිනවා. රක්ෂා නැති අය මොනව කරලද ජීවත් වෙන්නෙ ? තමන්ට සහ තමන්ගේ ළමයින්ට නියම විධියට කෑම සකස් කර ගන්න අමාරු නම්, හොරකමක් හරි කරලා තමන්ට සහ තමන්ගේ දරුවන්ට කෑම සපයා ගන්න සිදු වෙනවා. එසේ කිරීම වරදක් නොවෙයි කියල ප්‍රකාශ කරන්න සිදු වී තිබෙනවා. රට සංවර්ධනය කරන්න තමුන්නාන්සේලාට ආසාවක් තිබෙනවාලු. නොයෙකුත් කර්මාන්ත දන්න අය සිර ගෙවල සිටිනවා. සමහර අයට තියුණු දේශපාලන අදහස් තියෙනවා. කර්මාන්ත පිළිබඳව විවිධ දැනුම් ලැබූ අය සිටිනවා. ඒ අයට තමන්ගේ දස්කම් පෙන්වන්න අවස්ථාවක් සලසා දෙන්නෙ නැහැ. ඒ අය වැඩ කරන්න කැමතියි. සිර ගෙදරට ගිහින් මේ අය සමග සාකච්ඡාවක යෙදෙන්න. වැරදිකාරයාද නිවැරදිකාරයාද කියල අහල, ඔහු හිරකරුවෙක් කියල සීල් එකක් ගහල මුළු ජීවිතයම සිර ගෙදර ගත කරන්න වැඩ සලස්වා තිබීම යුතුකමක් නොවෙයි. සිරකරුවන් සමග ඇමතිතුමා සාකච්ඡා ආරම්භ කර බලන්න. තමුන්නාන්සේලා මෙහෙම කරන්නෙ මොකද කියා ඒ අයගෙන් විමසා බලන්න. තමුන්නාන්සේලා යන්න කැමති කොයි ගමනද කියල අහන්න. හිරගෙවල් සඳහා රජයට මෙච්චර මුදලක් වැය කරන්න වෙනවාය ; මේ තත්ත්වය සමාජයට ලොකු බරක්ය ; කියන අදහස ඔවුන්ට වටහා දෙන්න බලන්න. ගරු ඇමතිතුමා වෙන වෙනත් ගමන් නොගිහින් යන්න හිර ගෙදර හිරකරුවන් හමු වන්න. ඔවුන් සමාජයේ දියුණුවට යොදවා ගන්න.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මා මේ කියන්නෙ තමුන්නාන්සේලාට තිබෙන බරක් අඩු කරන මාර්ගයක්. මිනිසුන් වැඩියෙන් සිරගෙට යැවීම රජයට බරක්, සමාජයට බරක්. සිරකරුවන් වෙනුවෙන් ද අවුරුද්දක් අවුරුද්දක් පාසා මුදල් වෙන් කරන්න ඕනෑ. මේ ගැන කල්පනා කර බලන්න. අපේ සමාජයේ සහෝදර කොටසක් බන්ධනාගාර කූඩු ඇතුළට යවලා සත්වයන් වාගෙ ජීවත් වන්න ඉඩ තබා තිබීම ශීලාචාරකමේ අංගයක් නොවෙයි. මා නියෝජනය කරන කොට්ඨාශයේ රක්ෂාවල් නැති අය විශාල සංඛ්‍යාවක් ඉන්නවා. ඒ උදවියට නොයෙක් අතවරවලට මුහුණ පාන්ට සිදු වෙනවා. රක්ෂාවල් නැති නිසා බොහෝ දෙනා නොයෙක් අපරාධවලට යොමු වෙනවා. ඒ නිසා පොලීසියටත්, එතනින් හිරගෙදරටත් යන්ට ඇතැම් අයට සිදු වෙනවා. තමුන්නාන්සේ හිරගෙදරවල් පමණක් භාර ඇමතිවරයා නොවෙයි. කර්මාන්ත සම්බන්ධ වැඩත් තිබෙන්නෙ තමුන්නාන්සෙගෙ පාලනය යටතේමයි. බොරැල්ල කොට්ඨාශයේ එක කර්මාන්තයක්වත් තමුන්නාන්සෙ ඇති කළේ නැහැ. මේ අංශය යටතේ කථා කරන්ට මම අදහස් කරන්නෙ නැහැ. නමුත් තමුන්නාන්සෙ වෙනත් ප්‍රදේශවල කුම් නොයෙක් නොයෙක් කර්මාන්ත ඇති කර තිබෙනවා. නොයෙක් කර්මාන්තවල පුහුණුව ලත් උදවිය මගේ ප්‍රදේශයෙන් ඉන්නවා.

**මැතිව් මයා.**
*(திரு. மதியூ)*
(Mr. Mathew)

නියෝජ්‍ය කථානායකතුමනි, ගණපූරණයක් නැහැ.

මන්ත්‍රී මණ්ඩලය ගණන් කොට ගණපූරණයක් නොමැති වූයෙන්, බෙදුම් සීනු ශබ්ද කිරීමට නියෝග කරන ලදී.

පසුව ගණපූරණයක් තුබූයෙන්—

**වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. ඩී. ද සිල්වා**
*(டொக்டர் டப்ளியு. டீ. டி சில்வா)*
(Dr. W. D. de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සිර ගෙවල් භාර අමාත්‍යාංශය පමණක් නොව කර්මාන්ත පිළිබඳ අමාත්‍යාංශයත් භාරව කටයුතු කරන ඇමතිවරයා වශයෙන් මේ ගරු ඇමතිතුමාට මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් විශාල වගකීමක් තිබෙනවා. ගරු ඇමතිතුමා නියම විධියට කර්මාන්ත සකස් කරනවා නම්, නගරබදව නියම විධියට කර්මාන්ත ශාලා සකස් කරනවා නම්, පෞද්ගලික ව්‍යාපාරිකයින්ට ඉඩ නොදී රජය මගින් ගරු ඇමතිතුමාගේ පාලනය යටතේ කර්මාන්ත ඇති කරනවා නම්, හිරගෙවලට යන සංඛ්‍යාව බොහෝ සෙයින් අඩු කරන්ට පුළුවනි. ඒ මගින් රජයට උසුලන්ට තිබෙන බර අඩු කර ගන්ට පුළුවනි. ඒ බව මේ ගරු සභාවේදී ප්‍රකාශ කරන්ට ඕනෑ. ඇත්ත වශයෙන් ගරු ඇමතිතුමා පිළිගන්න ඕනෑ, අද කොළඹ නගරයේ වැඩ පොලවල් වහන බව, වැඩ කරන උදවිය සේවයෙන් පහ කරන බව. පුද්ගලික ආයතනවල පමණක් නොවෙයි, ආණ්ඩුවේ ආයතනවලත් එසේ කරනවා. 1960 අප්‍රේල් මාසයට පසුව මේ අවුරුදු දෙකට 1026 දෙනෙක් වරායේ රැකියාවෙන් තල්ලු කර දමා තිබෙනවා. 1960 අප්‍රේල් මාසයෙන් පසු ලංගම සේවයෙන් පන්සිය ගණනක්, හය සියයකට කිට්ටු ගණනක්, රැකියාවෙන් තල්ලු කර දමා තිබෙනවා. ඒ වාගේම කොළඹ නගරයේ තිබෙන විශාල කොම්පැනි රාශියක් වසා දමා තිබෙනවා. හිර ගෙවල් ප්‍රශ්නයට පමණක් සීමා කර මෙය විසඳන්ට බැරි බව ගරු ඇමතිතුමා දැනගන්න ඕනෑ. ආණ්ඩුවේ මුදල් මේ විධියට නිකරුණේ වියදම් කරන්න ඉඩ දෙන්ට බැහැ. මහජන මුදල් නිකරුණේ වියදම් කරන්ට ඉඩ දෙන්ට බැහැ. ගරු කර්මාන්ත ඇමතිතුමාගේ අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තුවක ප්‍රශ්නයක් ගැන මෙතනදී කියන්න ඕනෑ. ගරු ඇමතිතුමා මේක ගැන කර තිබෙන්නේ මොනවාද ? ඩොඩ්වෙල් සහ සමාගම වසා දමා තිබෙනවා. සිලෝන් කෝල්ඩ් ස්ටෝර්ස් එකේ ශාඛාවක් වසාදමා තිබෙනවා. සේවකයින් 200 ක් පමණ එළියට දමා තිබෙනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(பிரதிச் சபாநாயகர்)*
(Mr. Deputy-Speaker)

We are discussing about remand prisoners.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. ඩී. ද සිල්වා**
*(டொக்டர் டப்ளியு. டீ. டி சில்வா)*
(Dr. W. D. de Silva)

Sir, there is no Quorum.

මන්ත්‍රී මණ්ඩලය ගණන් කොට, ගණපූරණයක් නොමැති වූයෙන්, බෙදුම් සීනු ශබ්ද කිරීමට නියෝග කරන ලදී.

[බෙදුම් සීනු ශබ්ද කරද්දී]

**වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. ඩී. ද සිල්වා**
*(டொக்டர் டப்ளியு. டீ. டி சில்வா)*
(Dr. W. D. de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ වචන සවල්පය මෙයින් අවසාන කරනවා.

පසුව ගණපූරණයක් තුබූයෙන්—

**ගරු මෛත්‍රීපාල සේනානායක**
*(கௌரவ மைத்திரிபால சேனுநாயக்க)*
(The Hon. Maithripala Senanayeke)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රිමාන්ඩ් සිරකරුවන් එහා මෙහා ගෙන යෑමට වුවමනා කරන මුදල් පිළිබඳ වැය ශීර්ෂය යටතේ බන්ධනාගාරය සම්බන්ධව කරුණු රාශියක් මන්ත්‍රීවරුන් විසින් මේ අවස්ථාවේදී ඉදිරිපත් කළා. පළමුවෙන්ම අකුරණ දෙවන ගරු මන්ත්‍රීතුමා රිමාන්ඩ් හිරකරුවන් සම්බන්ධව ප්‍රශ්නයක් සභාවට ඉදිරිපත් කළා.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(பிரதிச் சபாநாயகர்)*
(Mr. Deputy-Speaker)

Order, please! The hon. Deputy-Chairman of Committees will now take the Chair.

අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, කාරක සභා නියෝජ්‍ය සභාපතිතුමා මූලාසනාරූඪ විය.

**ගරු මෛත්‍රීපාල සේනානායක**
*(கௌரவ மைத்திரிபால சேனுநாயக்க)*
(The Hon. Maithripala Senanayeke)

එතුමා ඒ සම්බන්ධයෙන් විශේෂයෙන්ම ප්‍රකාශ කළා, සෑම අවස්ථාවකදීම සුළු කාරණයකට වුවත් හිරකරුවන් එහෙම නැත්නම් චෝදනා ලැබූවන් රිමාන්ඩ් කරන බව. එතුමා කථා කරගෙන යන අවස්ථාවේදීම මා ප්‍රකාශ කළා ඒ කාරණය මට භාර කටයුත්තක් නොවේය කියා. එසේම චෝදනාවලට ලක්වන අය රිමාන්ඩ් සිරභාරයට ගැනීමේදී රටේ තිබෙන නීතිරීතිවලට අනුකූලවයි ක්‍රියා කරන්නේ. එම නීතිරීතිවල වෙනස්කමක් ඇති වුණොත් රිමාන්ඩ් සිරභාරයට ගන්නා සිරකරුවන්ගේ සංඛ්‍යාව අඩු වන බව අපට ද පිළිගන්ට පුළුවන්. ඒ කෙසේ වෙතත් මේ වැය ශීර්ෂය යටතේ ඒ සම්බන්ධයෙන් වැඩි විස්තරයක් කරන්ට මට පුළුවන් කමක් නැහැ. ගොඩනැගිලි සම්බන්ධවත්, ඒවායේ නඩත්තුව සම්බන්ධවත්, සිරගෙවල සිටින අයගේ කර්මාන්ත සම්බන්ධවත් ගරු මන්ත්‍රීවරු කීප දෙනෙක්ම සඳහන් කරන්ට යෙදුණා. සමාජයට ප්‍රයෝජනවත් පිරිසක් හැටියට සිරගෙට නියම වන පුද්ගලයන් හැඩගැස්වීමට විශේෂ වැඩ පිළිවෙළක් සකස් කර තිබෙනවා. මේ වැඩ පිළිවෙළ නිසා රටට මෙන්ම සිරගෙවලින් නිදහස් වන අයටත් විශාල සෙතක් සැලසෙනවා. සිරගෙවලට නියම වන පුද්ගලයන් සඳහා බන්ධනාගාරය මගින් කර්මාන්ත දහ අටක් ඇති කර තිබෙන බව මම ඉතා සන්තෝෂයෙන් කියන්ට කැමතියි. ඒ කර්මාන්ත නම් මැහීම, වඩු කර්මාන්තය, ඇඳුම් පිරිසිදු කිරීම, වේවැල් පැළලි වැඩ කිරීම, පැදුරු විවීම, රෙදි විවීම, කොහු භාණ්ඩ සෑදීම, කම්හල් වැඩ කිරීම, දර හා ගල් අඟුරු වැඩ කිරීම, සපත්තු සෑදීම, සබන් හා පාන් සෑදීම, කෘෂිකර්මය හා සම්බන්ධ සතුන් ඇති කිරීම, ගඩොල් සෑදීම, ඔප දැමීම, මුද්‍රණය කිරීම, පුටු සෑදීම යනාදියයි. මේ සියලුම කර්මාන්තවල දැනට සිරකරුවන් නියුක්ත වී සිටින බව මම සන්තෝෂයෙනුයි මතක් කරන්නේ. මේ කර්මාන්තවල සිරකරුවන් යෙදීමෙන් 1958-59 වර්ෂයේදී රුපියල් 15,54,595.03ක ආදායමක් රජයට ලැබී තිබෙන බව ප්‍රකාශ කරන්ට සතුටුයි. බොරැල්ලේ ගරු මන්ත්‍රීතුමා (වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. ඩී. ද සිල්වා) එක් ප්‍රශ්නයක් මතු කළා. සිරකරුවන් වරායේ බඩු බෑමට යෙදවීම ගැනයි, ඒ. සිරකරුවන් වරායේ බඩු බෑමට යෙදුවේ වැඩ වර්ජන කැඩීමට නොවන බව මම විශේෂයෙන්ම මතක් කරන්ට කැමතියි. රට වෙනුවෙන්, සමාජය වෙනුවෙන් සිරකරුවන් හා යුද්ධ හමුදාව අත්‍යවශ්‍ය සේවාවල යෙදවීම රජයේ යුතුකමක්. ඒ වගේම අවදානම් අවස්ථාවල දී සිරකරුවන් හා යුද්ධ හමුදාව අත්‍යවශ්‍ය සේවාවන්හි යෙදවීම ප්‍රතිපත්තියක්. එයින්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අප කරන්නේ සිරකරුවන් හොරිකඩයන් වශයෙන් පාවිච්චි කිරීමක් නොවෙයි. රජයෙන් සමාජයට ඉටු විය යුතු සේවයක්, යුතුකමක් ඉෂ්ට කිරීමයි.

බන්ධනාගාරවල සුභසාධක වැඩ සම්බන්ධව තවත් ප්‍රශ්නයක් මතු කළා. බන්ධනාගාරවලින් නිදහස්ව නැවත වරක් නිදහස් සමාජයට පා තබන සිරකරුවන්ට මොන විධියේ සුභසාධක කටයුතු ඇති කර තිබෙනවාද කියායි ප්‍රශ්න කළේ. මේ සුභසාධක කටයුතු සඳහා අප වෙන් කර තිබෙන මුදල් ප්‍රමාණය සීමා සහිතය කියා මමත් පිළිගන්නවා. සිරකරුවන් බන්ධනාගාරයෙන් නිදහස් වී යන විට ණය තුරුස් දීමටත්, ආධාර දීමටත්, සුභසාධක සමිතිය රජයෙන් දෙන මුදල් පාවිච්චි කරන බව කියන්ට කැමතියි. එවැනි සුභසාධක සමිතියක කලින් සාමාජිකයකු වශයෙනුත් ඊට පසුව සභාපති වශයෙනුත් පසු ගිය අවුරුදු කීපයක් තිස්සේම වැඩ කළ නිසා මේ සුභසාධක සමිතිවලින් ලොකු සේවයක් හිරෙන් නිදහස් වී සමාජයට එන අයට සිදු වන බව මට කියන්ට පුළුවනි. මුදල් ප්‍රමාණයේ මදිකම නිසා බලාපොරොත්තු වන තරම් මුදලක් නිදහස් වී යන හිරකරුවන්ට දීමට නොහැකි වෙතත් ඒ සුභසාධක සමිතිවලින් ලොකු සේවයක් සිදු වෙනවා. රජයෙන් දෙන මුදල වැඩි කරන්ට පුළුවන් නම් ඒ සේවය තව දුරටත් ඉටු කරන්ට පුළුවන් වෙනවා ඇති.

බෞද්ධ ලාංඡන එල්ලා ගෙන සිටින හිරකරුවන්ට වෙනස්කම් කරන බවට වැලිමඩ ගරු මන්ත්‍රීතුමා චෝදනාවක් කළා. මෙවැනි දෙයක් මා ඇසූ පළමුවැනි අවස්ථාව මෙයයි. අසුවල් හිරකරුවාට එසේ වෙනස්කම් ඇත්වූවාය කියා මට දන්වතොත් ඒ ගැන පරීක්ෂා කර බැලීමට සූදානම් බව කියන්ට කැමතියි. බන්ධනාගාර සේවකයන්ගේ සේවා තත්ත්වය ගැනත් කරුණු ඉදිරිපත් කරන්ට යෙදුණා. දැනට තිබෙන ප්‍රතිපත්තිය අනුව ඒ අයට උසස් වීම් ලබා ගන්ට කිසිම බාධාවක් නැහැ. සුදුසුකම් තිබෙනවා නම් උසස් වීම් ලබන්ට පුළුවනි. උසස් වීම් සම්බන්ධ වැඩ පිළිවෙළේ අඩුපාඩු තිබෙනවාය කියා කියනවා නම් ඒ සම්බන්ධව සොයා බැලීමට මා පොරොන්දු වෙනවා. බන්ධනාගාර සේවකයන්ට වෘත්තීය සමිති අයිතිවාසිකම් නැත කියන කාරණයක් ඉදිරිපත් කරන්ට යෙදුණා. අපේ ප්‍රතිපත්තිය අනුව, පොලිසිය, යුද්ධ හමුදාව, බන්ධනාගාරය යන ස්ථානවල සේවය කරන අයගේ වෘත්තීය සමිති අයිතිවාසිකම් පිළිබඳව සීමාවක් තිබෙන බව ඇත්තයි. බන්ධනාගාර සේවකයන්ට වෘත්තීය සමිති පිහිටුවා ගැනීමට ඉඩ දුන්නොත් යම්කිසි අයිතිවාසිකමක් පිළිබඳව ස්වරයික් එකක් කිරීමට ඒ අය පෙළඹුණහොත් ඇති වන්නේ කුමන තත්ත්වයක්ද කියන කාරණය පමණක් ඒ පිළිබඳව මේ අවස්ථාවේදී සඳහන් කරනවා. අන්න ඒ නිසයි, වෘත්තීය සමිති පිහිටුවා ගැනීම පිළිබඳව බන්ධනාගාර සේවකයන්ට යම්කිසි සීමාවක් ඇති කර තිබෙන්නේ කියන කාරණය නොකියාම බැහැ.

සිරකරුවන්ට දුම් බීම සැහේද කියන කාරණයක් ඉදිපරිත් වුණා. මේ පිළිබඳව දැනට කිසිවක් ප්‍රකාශ කිරීමට මට පුළුවන්කමක් නැහැ. නමුත් මගේ පෞද්ගලික අදහස වශයෙන් මා ඊට විරුද්ධ නැති බව කියන්ට කැමතියි. ඒ ගරු මන්ත්‍රීතුමා කී කාරණා මාත් අසා තිබෙනවා. විශේෂයෙන් නිලධාරීන් සම්බන්ධයෙන් චෝදනා ඇති වී තිබෙනවා. යම් යම් නිලධාරි කොටස්වලින් දුම් බීමට ධෛර්‍ය ලැබෙනවාය කියා චෝදනා ඇති වී තිබෙනවා. මේ කාරණය පිළිබඳව ආණ්ඩුවේ ප්‍රතිපත්තිය ප්‍රකාශ කිරීමට මට දැන් පුළුවන්කමක් නැහැ. නමුත් පෞද්ගලිකව මා නම් ඊට විරුද්ධ නැති බව ඒ සමගම මතක් කරන්ට කැමතියි. සබන්, දත් බෙහෙත්, ලිපි ද්‍රව්‍ය ආදිය පාර්සල් මඟින් හෝ නෑදෑයින් මඟින් ලබා ගැනීම සඳහා හිරකරුවන්ට දැනට තිබෙන අයිතිය අවලංගු කිරීමක් පිළිබඳව ලිපියක්ද වැලිමඩ ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන්ට යෙදුණා. ඒ සම්බන්ධවද පෞද්ගලිකව සොයා බැලීමට මේ අවස්ථාවේදී මම පොරොන්දු වෙනවා. මීට වඩා යමක් කියන්ට මේ අවස්ථාවේදී මම බලාපොරොත්තු වන්නෙ නැහැ. මේ ඉදිරිපත් කර තිබෙන වැය ශීර්ෂය අනුමත කරන මෙන් ගරු සභාවෙන් මම ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**කාරකසභා නියොජ්‍ය සභාපති**
*(குழுக்களின் பிரதி அக்கிராசனர்)*
(The Deputy-Chairman of Committees)
අ. භා. 9.30 වන තෙක් රැස්වීම තාවකාලිකව අත්සිටුවනවා .

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් සිටුවන ලදින්, අ. භා. 9.30 ට නැවත පවත්වන ලදී.

## පරිපූරක මුදල : බාලාපරාධකරුවන් රැකබලා ගැනීමේ වියදම්

குறைநிரப்புத் தொகை : பாலியக் குற்றவாளர் பராமரிப்புச் செலவு

## SUPPLEMENTARY SUPPLY : EXPENDITURE ON CARE OF JUVENILE OFFENDERS

**ගරු මෛත්‍රීපාල සේනානායක**
*(கௌரவ மைத்திரிபால சேனநாயக்க)*
(The Hon. Maithripala Senanayeke)

I move,

That a supplementary sum not exceeding Rupees Fifty thousand (Rs. 50,000) be payable out of the Consolidated Fund of Ceylon, or any other fund or moneys of, or at the disposal of the Government of Ceylon, or from the proceeds of any loans obtained by the Government of Ceylon for the service of the financial year beginning on 1st October, 1961, and ending on 30th September, 1962, and that the said sum may be expended as specified in the Schedule hereto :—

*Schedule*

| | *Rs.* |
|---|---|
| Head 79—Department of Probation and Child Care Services. | |
| Vote No. 4—Services provided by the Department—Recurrent Expenditure .. .. | 50,000 |

This is to meet the increased number of juvenile offenders that have to be cared for and for that purpose a sum of Rs. 50,000 is required for the Financial Year 1961-62.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardene)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ වැය ශීර්ෂය යටතේ එක්තරා කරුණක් ගැන ගරු ඇමතිතුමාගේ විශෙෂ අවධානය යොමු කරවන්නට සිදු වෙලා තියෙනවා. පානදුරේ මොරවින්න නමැති ගමේ ගෝතම ළමා නිවාසය යනුවෙන් ළමා නිවාසයක් තියෙනවා. ඒ නිවාසයේ පිරිමි ළමයි 15 දෙනෙක් පමණ සිටිනවා. ළමා උසාවියේ අසන නඩුවල ප්‍රතිඵල වශයෙනුයි, අවුරුදු දෙකකට හෝ තුනකට ඒ ළමයින්ව ඒ නිවාසයට යවා තිබෙන්නේ. මේ නිවාසය රජයේ ආයතනයක්වත් රජයේ පාලනය යටතේ ගෙන යන ආයතනයක්වත් නොවෙයි. රජයෙන් ආධාර ලබන ආයතනයක් හැටියටයි, එහි කටයුතු කෙරෙන්නේ. මා දන්න හැටියට ඒ ආයතනයේ සිටින ළමයකු වෙනුවෙන් දවසකට යටත් පිරිසෙයින් රුපියලක්වත් වියදම් වෙනවා. ඒ ආයතනය ගෙන යන සමිතියට ආධාරයක් වශයෙන් රජයෙන් මාස් පතා ආධාර මුදලක් දෙන සිරිතක් තියෙනවා. නමුත් දැන් මාස ගණනක් තිස්සේ රජයෙන් මාස්පතා ගෙවන ඒ ආධාර මුදල නතර කරල තියෙනවා, මේ මාසයේ 30 වැනිදායින් අවසන් වන්නට යන මුදල් වර්ෂය තුළදී, මාස්පතා ඒ ආයතනයට යම් කිසි මුදලක් ගෙවීමට වර්ෂය මුලදී තීන්දු වුණා ; නමුත් රජය ඒ සඳහා වෙන්කර තිබෙන මුදල අවසන්වීම නිසා දැන් මාස පහක් හයක් තිස්සේ මේ ආයතනයට ගෙවිය යුතුව තිබුණු මුදල ගෙවන්නට බැරි වෙලා තියෙනවා. ඒ මුදල ගෙවීමට බැරි වී තිබෙන්නේ මන්ද කියන ප්‍රශ්නයට ස්ථිර පිළිතුරක් මට දෙන්නට පුළුවන්කමක් නැහැ. මේ ආයතනයට වෙන් කර තිබුණු මුදල රජය විසින් වෙන කාරණාවලට වැය කර තිබෙන බවයි, මට දැන ගන්නට ලැබිල තියෙන්නෙ.

**ඩබ්ලිව්. දහනායක මයා.**
*(திரு. டப்ளியூ. தகநாயக்க)*
(Mr. W. Dahanayake)
ආණ්ඩුව බංකොලොත් වෙලා.

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardene)

මේ වැය ශීර්ෂය යටතේ වියදම් කරන්නට බැරි දේ සඳහා නොව, පසුව වියදම් කළ යුතුයයි තීරණය කළ වෙනත් කටයුතු සඳහා මේ ආයතනයට දිය යුතුව තිබූ මුදල් වියදම් කරල තියෙනවා. ඇත්ත වශයෙන්ම කියනවා නම්, මෙය මහා අපරාධයක්. මෙම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නිවාස පාලනය කරන තැනැත්තන් රජයෙන් ලැබෙන මුදල් බලාපොරොත්තුවෙන් රජය දී තිබෙන පොරොන්දුව උඩ—එහි සිටින ළමයින් වෙනුවෙන් යම්කිසි ප්‍රමාණයක වියදමක් දරා තිබෙනවා. එම ශිෂ්‍යයන් සඳහා වෙන් කර තිබෙන මුදල් වෙන කාරණයක් සඳහා වෙන් කර තිබෙනවාය කියා මෙම ආයතනයට දෙන මුදල නැවැත්වීම අපරාධයක් නොවේද කියා මා අහනවා. මේ කාලය තුළදී පානදුරේ වාසය කරන මහජනතාවගේ ආධාරය නොලැබෙන්න මෙම ආයතනය වසා දමන්නයි සිදු වෙන්නෙ. යම්කිසි පිළිවෙළකින් මෙම ආයතනය වසා දමන්න සිදු වුණා නම්, එය රජය සතු වගකීම පැහැර හැරියා වනවා නොවේද ?

ළමා උසාවි නියම කරනවා මෙම ආයතනවලට ළමයින් එවන්නය කියා. ඒ නිසා වර්ෂය මැද හරියේදී මේවාට ලැබෙන මුදල නවතා දැමුවොත් එහි ප්‍රතිඵලයක් වශයෙන් මෙම ආයතනය වසා දමන්න සිදු වුණා නම් එය රජය සතු යුතුකමක් පැහැර හැරියා නොවේද කියා මා තමුන්නාන්සේගෙන් අහනවා. මා මෙහි සඳහන් කරන ගෝතම ළමා සමාජය ඉතා හොඳින් ඉතා ලක්ෂණට වැඩ කටයුතු කරන ආයතනයක්. මෙම ආයතනයෙන් ඒ පළාතේ ළමයින්ට විශාල සේවයක් කෙරෙනවා. මෙම නිවාසයට ඇතුල් කරන ළමයින් ඉතා හොඳටත් ශිෂ්ට අන්දමටත් හදා වඩා ගන්න බවට මට පෞද්ගලිකව සාක්ෂි දරන්න පුළුවන්.

මෙම නිවාසයේ ජීවත් වුණ එක්තරා ළමයෙක් ළඟදී ජේෂ්ඨයෙන්ද සමත් වී දැන් ආණ්ඩුවේ කාර්යාලයක වගකිව යුතු රක්ෂාවකද යෙදී සිටිනවා. මෙම වැය ශීර්ෂය යටතේ රුපියල් 50,000 ක මුදලක් ඉල්ලා සිටින්නේ මෙවැනි ස්ථානවල තිබෙන අඩුපාඩුකම් පිරිමසා ගන්නය කියා මා කල්පනා කරනවා. ඒ හෙයින් මෙම මුදල සම්මත වුණ වහාම මෙම ළමා නිවාසයට අවශ්‍ය මුදල් ප්‍රමාණය දෙන මෙන් මා ඉතා කරුණාවෙන් ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. එමෙන්ම මේ අන්දමේ කටයුතු මින් මත්තට නොවන අන්දමට වග බලා ගන්න ලෙසද නිලධාරීන්ට අණ කරන මෙන් මා ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. යම්කිසි ආයතනයක් සඳහා වෙන් කරනු ලබන මුදල, එම වර්ෂය තුළදී එම ආයතනයට ලැබෙන්න කටයුතු සලස්වන්නය කියාත් මා ගරු ඇමතිතුමාගෙන් ඉතා කරුණාවෙන් ඉල්ලා සිටිනවා.

අ. භා. 9.45

**ඩබ්ලිව්. දහනායක මයා.**
*(திரு. டப்ளியு. தகநாயக்க)*
(Mr. W. Dahanayake)

I am very thankful to you, Sir, for having given me the opportunity of speaking a few words on this extremely important subject. This sum of Rs. 50,000 is needed for two purposes. The first of these purposes is the care of juvenile offenders and the second is the care of children who need protection and care. So, you will notice that this Supplementary Estimate is not limited to the subject of juvenile offenders.

Now the department under which this money is asked for is the Department of Probation and Child Care Services. I consider this department to be one of the most important departments that we have. It is a department which should have the greatest care and attention. It is a department for which the Government should expend zeal and enthusiasm.

It is interesting to note that the Department of Child Care was started by the Government of the late Mr. S. W. R. D. Bandaranaike. Prior to 1956 there was no Department of Child Care. There was a Department of Probation Services. In 1956 the Cabinet of the late Mr. S. W. R. D. Bandaranaike decided to have a Child Care Department and to entrust it with the function of probation services as well. Thus the Department of Probation and Child Care Services was started in 1956.

If you will look up page 20 of the Estimates of Revenue and Expenditure you will find that the expenditure of the Department of Probation and Child Care Services in 1951-52 was Rs. 150,000. In 1955-56 the expenditure was Rs. 287,000. However, in the year 1956-57 it rose to Rs. 1.5 million. From three lakhs of rupees the expenditure rose to Rs. 1.5 million. That was because a

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩබ්ලිව්. දහනායක මයා.]

new department, the Department of Child Care was started by the Bandaranaike Government.

Now this Government has taken credit for many thngs which the late Mr. Bandaranaike did. Among the items which had never been mentioned in the past is the one that I am pointing out now. The Government of the late Mr. Bandaranaike started what is undoubtedly one of the most important departments that we have.

I remember the time that the late Mr. Bandaranaike started this department. It was expected that the department would some day take under its wing all children who needed care and attention and who were orphaned or destitute. That was the aim in starting this department. So it was expected that the work of this department would be expanded as the years went on and as more and more experience was gained.

While the department was expected to look after the child population of the country it had also another aim. It was expected to be a mirror, as it were, to the other departments as to how they should work in regard to certain matters. I think, that that statement of mine needs some explanation. How can the Department of Child Care become a mirror to the other departments as to how they should work ?

Now Department of Child Care has during the past few years done very good work. I am happy to be able to say that this is one of the departments of which we can be proud. It was only last evening that we had to mercilessly castigate another department—the Department of Health Services—and so it is with added pleasure that I wish to pay a tribute to the officers of the Probation and Child Care Department. Not only have they done their work excellently but they have also been true to their aims. They have indicated to us how many other matters which do not come directly within their purview should be managed. The Department of Child Care analysed in 1960 the cases of 1,057 juveniles that came to their notice. The analysis they made showed certain very important conclusions. I shall mention these conclusions to pinpoint certain things which ought to have been done but which have been left undone by this Government.

The first conclusion was that the largest number of delinquents come from unsatisfactory family situations. The second conclusion was that poor economic conditions continued to be a major contributory factor to delinquency and deprivation in Ceylon. The third conclusion was as follows: Bad housing conditions with their attendant overcrowding is one of the main contributory factors to delinquency and deprivation. The fourth important conclusion was: Delinquency and deprivation is prevalent to a large extent in the unsettled and unemployed sections in the community. And the fifth of these important conclusions was, there is a percentage of illiteracy among delinquents and deprived persons.

These are five important conclusions. I shall not on this occasion dwell at length on these conclusions one by one. Suffice it for the present to point to the part played by unemployment in delinquency. What have you done to solve the problem of unemployment ? Nothing ! You have allowed the problem to become worse and worse each day, each week, each month and each year during which you hold office. The problem of unemployment has never been so bad as it is today.

As pointed out by the hon. Member for Borella you have been the means of making certain workshops to close down. You have sent out of employment workers in the port of Colombo and in the Ceylon Transport Board. You are introducing measures which you think are sound, but those measures are depriving people who are in employment now of their employment. So by increasing the unemployment in the country you are spreading

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

delinquency among the child population of this country. Then, one other contributory factor is the bad housing in this country. From the day that you assumed office it has been pointed out to you that a comprehensive national housing plan is a *sine qua non* for the well-being of the people of this country. You have done nothing in this direction. According to your rate of progress you will need 300 years from now to give the country the number of houses that it needs today. You have a Minister of Housing; he is not in the House. He is really the Minister for dehousing. I will tell you why.

සුමනපාල දහනායක මයා.
*(திரு. ஸுமனபால தகநாயக்க)*
(Mr. Sumanapala Dahanayake)

He is to resign I hear.

කාරක සභා නියෝජ්‍ය සභාපතිතුමා
*(குழுக்களின் பிரதி அக்கிராசனர்)*
(Mr. Deputy-Chairman of Committee)

Order, please! And please be relevant.

ගරු සී. පී. ද සිල්වා
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

He is talking clean out of the point, Sir.

ඩබ්ලිව්. දහනායක මයා.
*(திரு. டப்ளியு. தகநாயக்க)*
(Mr. W. Dahanayake)

There was a law under which it was difficult for tenants to be ousted. That law expired on the 19th of June this year. The Hon. Minister of Housing was asked by various tenant associations in the country to bring up an amending law to take its place. He was guilty of a grave dereliction of duty in not bringing up that piece of legislation. Today, over 3,000 cases have been filed in the courts of Colombo against poor tenants. Now, that will spread delinquency in the City of Colombo and in the other cities in the country.

The third conclusion is the high percentage of illiteracy found among delinquents. Where is our Minister of Education? He must be reminded occasionally of the fact that there are 500,000 children in this country in the age group 5 to 14 who do not attend any school, and he has done nothing whatsoever during the last two years to give these 500,000 children a schooling.

වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ
*(டொக்டர் எஸ். ஏ. விக்கிரமசிங்ஹ)*
(Dr. S. A. Wickremasinghe)

He is a delinquent.

ඩබ්ලිව්. දහනායක මයා.
*(திரு. டப்ளியு. தகநாயக்க)*
(Mr. W. Dahanayake)

These various Ministers whom I have mentioned, the one responsible for employment, namely the Minister of Labour and Nationalised Services, the one responsible for schooling, the Minister of Education, and the one responsible for housing, the Minister of Local Government and Housing, are jointly responsible for the massacre of innocents in this country, the massacre of the juvenile population, particularly in the cities of this country.

I told you that the Department of Probation and Child Care was expected to be a mirror to the other departments as to how they should work. If the work that has been done by the Department of Probation and Child Care Services is to be of any benefit, then the conclusions that have been reached in their investigations should form the basis of new programmes of work by other Ministers. What have they done? Has any one of these Ministers even cared to study these conclusions? Did you know anything about these conclusions before I announced them to you today on the Floor of the House? You are a set of lotus eaters. You recline like Gods, careless of mankind. I ask you, what is the attention you have paid to the problem of child care?

Let us see how many organizations there are in the country that look after the children. The majority of the children's homes are maintained by voluntary agencies. This is the socialist Government which goes for many things. It hands over a subject

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩබ්ලිව්. දහනායක මයා.]
of paramount importance, the care of children, to voluntary organizations. Why do you not nationalize them ? Why do you not take them over ?

හමීඩ් මයා.
(ஜனாப் ஹமீத்)
(Mr. Hameed)
It will be like dried fish.

ඩබ්ලිව්. දහනායක මයා.
(திரு. டப்ளியு. தகனுயக்க)
(Mr. W. Dahanayake)
I do not agree with that view. Because nationalization of the dried fish trade has been a failure, we must not put the blame on the principle of nationalization. Let us by all means put the blame on the Minister and his officers who keep on blundering and, perhaps, robbing. We must not put the blame on the principle of nationalization. That is a principle of which we approve.

It is your duty to take over the children's homes of this country. Why do you not take them over ? Did you not, in a moment of great piety, take over all the schools ? When you took over the schools you said : " Here we are practising something that is socialistic, taking over the schools ". Of course, you did not attend to the details. You had no plan in mind. And yours was the besetting sin of not even planning after the event. Why have you not planned for your schools after the take-over if you did not have a plan before the take-over ? Those are not your concerns. You are satisfied with the mere taking over of the schools and you think you can dupe the people of this country with a slogan. The people of this country refuse to be duped by you.

Why do you not take over these voluntary agencies that look after the children of this country ? Can you give me an answer ? Today you pay each voluntary organization Rs. 25 per child. Is that figure correct ? Is it Rs. 25 or Rs. 30 ?

ගරු මෛත්‍රීපාල සේනානායක
(கௌரவ மைத்திரிபால சேனனுயக்க)
(The Hon. Maithripala Senanayeke)
Rs. 25.

ඩබ්ලිව්. දහනායක මයා.
(திரு. டப்ளியு. தகனுயக்க)
(Mr. W. Dahanayake)
You now pay a voluntary organization Rs. 25 per child per month. Are you not ashamed of yourselves ? Do you think it is possible to maintain a child on Rs. 25 ? Have you worked out the bill of costs, namely, the price of rice, dhal, fish and meat—if no fish or meat is given, then dried fish —vegetables, firewood ? Have you worked out the cost ? Do you think it is fair to ask a voluntary organization to maintain a number of children, most of whom must be having voracious appetites, on Rs. 25 per child per month ? If there is nothing else for the children, let them have plenty of good, wholesome food, so that they may grow up to be healthy citizens of this country. Do you think it is possible to bring up a child on Rs. 25 a month ? You cannot bring up half a child on Rs. 25 a month. You are evading your duty ; you are shirking your responsibility ; you are offering excuses to yourselves. If you want the children well looked after you must pay the voluntary organizations the money they need to give wholesome food to the children.

What are you doing now ? When you pay Rs. 25 for a child what is it that you are encouraging ? These voluntary organizations must go to the public for help. Are you aware, Mr. Minister, that the voluntary organizations have told the ex-Minister of Finance that they cannot continue to run the orphanages under present conditions ? Your allowance for a child remains at the fixed figure of Rs. 25 a month, but the cost of living has mounted up tremendously. Furthermore, voluntary organizations are today finding it more and more difficult to obtain charitable grants. There is hardly anybody who can offer to give money on charity. There is the income tax, the N. D. T., the professional tax, the wealth tax, the sales tax, the birth tax, the death tax and the living tax ; tax in front, tax behind, tax to the right and tax to the left. With all these it has become impossible for charitable

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

folk to give any charity. Now the voluntary organizations have told the Minister that they are unable to get contributions and that they must send away numbers of children whom they have on their rolls. Are you satisfied with the position ?

What have you done to examine the finances of the voluntary agencies ? You dole out a sum of money to them, but have you ever taken the trouble to go into the questions that arise in connection with the running of an orphanage ? Have you tried to find out from where the rest of the money comes ? If you do that you will find that from now onwards all the fountains of charity in this country have dried up under the draconian and unjust system of taxation of the ex-Minister of Finance.

Then have you tried to find out what the type of food is that is given in an orphanage ? When we take the country as a whole, we know that 21 per cent. of the children of this country are under-nourished. One-fifth of our child population do not get enough to eat and, in regard to orphanages, not one child in an orphanage in this country is properly fed. They are all under-nourished. I ask you, why do you not take over all these voluntary organizations ? You must take them over. You cannot call yourself a Socialist Government or a Welfare State if you shut your eyes to this extremely important problem. There is no reason whatsoever why voluntary organizations should be made to look after the children who need care and attention. It is the duty of the State to look after them. You have only a few State homes for children.

The number of children in voluntary agencies was 5,493 in the year 1960. There were hardly 6,000 children in the voluntary agencies. That is because voluntary agencies are not able to carry on their activities with the dole that you give them. The amount of charity they get is limited. So they must depend on the money that you give them. Because the money you give them is so hopelessly inadequate, they limit their numbers. So the scheme of the voluntary agencies looking after the children who need care has been a failure in this country. Do you realize that ? Why do you not take over these institutions instead of doling out something to them and pretending you are doing the correct thing whereas you are not touching even the fringe of the problem ?

There are only 89 voluntary agencies that take in children who need care. The contribution made by Government to them is Rs. 25 per child. They have now told you they are unable to carry on. Probably many of them will close down in the coming year. Can you say that because you have no money you should not look after the children who need care ? Was that the principle on which this department was formed ?

I, therefore, ask you either to take over these children's homes and to expand the work so as to bring in all the children in the country who need care or to give a substantial contribution to these voluntary agencies. We prefer that you should take the first step of nationalization of all children's homes in the country.

Are you aware that a large number of children who are destitute are girls ? An analysis was made of all the children in voluntary agency institutions by status and sex. It would appear from that analysis that destitution has become a bigger problem than desertion or orphanhood. 66 per cent of the total children in these institutions are girls, while 33.4 per cent are boys. That is what the Administration Report of the Commissioner of Probation and Child Care Services for 1960 states.

Let me read out the relevant portion. It would appear from this that destitution is becoming a bigger problem than desertion or orphanhood. You can understand desertion and orphanhood. What is the real reason for destitution ? It is the poverty of parents. What have you

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩබ්ලිව්. දහනායක මයා.]

done to solve that problem? You have done nothing. Then the report continues to say that 66.6 per cent. of the children in these institutions are girls. Two-thirds of the destitute children are girls.

Now, what does that mean? It means that a large number of girls in our country, young girls become destitute and because of the lack of care and attention by the State they are virtually thrown to the wolves. It is a very serious matter. If the Government has a conscience, if it is really bent on building up a strong and healthy nation it must pay more attention to this problem. The very fact that is revealed by these figures show that the number of destitute children among girls is double the number among boys. It is something that should make the Government to think furiously.

The Hon. Minister of Industries, Home and Cultural Affairs has twenty departments to look after. I wonder whether he gives a thought to the problems of Child Care Services. He cannot physically do so. I do not know whether he can even give the names of the various departments over which he presides.

Here is such an important department as the Department of Child Care under him. There are also various other departments, such as Provincial Administration, under him. Is it any wonder that now for nearly two years the Grama Sevakayas have not been appointed?

He has the department of Provincial Administration under him. He has the Department of Rural Development and Small Industries under him. The small industries are becoming smaller and smaller under his vigilant eye. He has the Department of Social Services under him. The social services are getting stripped in this country because he has no time to look after them. He has the Salt Department under him. Of the Salt Department we have to ask: With what shall it be salted? He has the Excise Department under him. The Excise Department has produced for us the greatest industry—the *kasippu* industry! He has the Department of Cultural Affairs under him. The Department of Cultural Affairs stinks today. He has the College of Fine Arts. It is perennially on strike! He has various other departments under him and we are now pin-pointing the Department of Child Care towards which he expends no care whatsoever.

I am not inclined to be too critical of my good Friend the Hon. Minister of Industries, Home and Cultural Affairs. Now we are told that he is going to be saddled with Agriculture and Lands too. I know that the real trouble is that he is not given money for this Department of Probation and Child Care. I wish to make a plea that the amount of money allotted to this department should be increased.

When the late Prime Minister started this department in 1956 he expected it to develop and to expand by leaps and bounds. In the second year of its existence in 1958-59 the expenditure on the department was Rs. 3.3 million. Today, it is Rs. 4 million. That is, in the space of five years there has been an addition of Rs 700,000 thrown in to meet the working of this department.

The increased expenditure on the army is something on which I shall not dwell. I shall leave my Friends to deal with it when we get to the Supplementary Estimate on the army. You are asking us for millions of rupees for the army to keep up an Emergency in order to prop you up in power. The very next item is, I think, a request for more money for the army. You cannot spend a few million rupees on the children of this country but you are prepared to spend millions upon millions of rupees on the army.

What is the meaning of this? Is there any reason behind your action? You call yourselves a Welfare State! You say that you wish to further the policies of the late Mr. Bandaranaike.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Let not the late Mr. Bandaranaike be honoured with your lips but let real service that is rendered to the downtrodden, the oppressed and the needy be your tribute to the late Mr. Bandaranaike.

He started this Department of Child Care. It was a child of his of which we can well be proud. But what have you done to this department? You have not allowed it to grow. You have not given it the money that it needs. It is one of the orphans of the state. You are finding things difficult. Expenditure and revenue clashes are taking place. You have got to face an economic crisis. But whatever crisis that you have got to face do not grudge any expenditure on the Department of Child Care. That is my plea.

I hope that the few words that I have spoken about this department will make you open your eyes to the fact that this is a department about which you must think more, to which you must pay greater attention, and for which you must spend more.

හමීඩ් මයා.
*(ஜனாப் ஹமீத்)*
(Mr. Hameed)

I think it is nothing but fair that we should offer a bouquet to the Hon. Minister for the splendid work ——

ගරු මෛත්‍රීපාල සේනානායක
*(கௌரவ மைத்திரிபால சேனநாயக்க)*
(The Hon. Maithripala Senanayeke)

The officer.

හමීඩ් මයා.
*(ஜனாப் ஹமீத்)*
(Mr. Hameed)

——that has been done by the Department of Probation and Child Care Services.—[*Interruption.*] I mean it very seriously. If there is one department that has done some sincere work it is this department. Its success may be because, one never knows, the Hon. Minister must have been a good delinquent when he was young.

ගරු මෛත්‍රීපාල සේනානායක
*(கௌரவ மைத்திரிபால சேனநாயக்க)*
(The Hon. Maithripala Senanayeke)

I will not challenge your position.

හමීඩ් මයා.
*(ஜனாப் ஹமீத்)*
(Mr. Hameed)

The hon. Member for Galle has dealt in detail with the causes of child delinquency. According to, I think, Sir Hamlin, the Colombo Plan crime specialist, the main causes of delinquency are poverty and illiteracy. In order to get a correct picture of this situation we might pose the question: Who is a delinquent; what type of boy or girl turns out to be a delinquent?

A delinquent is normally one who is either too intelligent or below normal. When I say that one is intelligent I refer to the type who would sell a refrigerator to an Eskimo! Then you get the other type that is below normal. In either of these cases there must be the correct approach to them if we are to deal with these types properly. Personally, I am very sorry for those who come under the category " below normal ", because we do not have in this country up till today a school for the mentally deficient. As long as you do not have a school for such persons it is not possible for us to fight juvenile delinquency by the most modern methods.

There is also this question. When we say that a boy or girl is a delinquent we mean that that particular child is mentally ill, and that child has to be given psychiatric treatment. Unless you give such persons psychiatric treatment—you may send them to certified schools for correction but that will not help them—you will not get over the problem, because, if you study the figures in detail of people who go to prison you will find that

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[තම්බි මයා.]

a large number of them are those who had been at one stage or another to certified schools. Therefore, if we are to fight juvenile delinquency and fight it well and truly, we have to make sure that in this country we have these two instruments. That is, we have a school for these mentally deficient children, and we have enough psychiatrists. Unless we have these two instruments we can never fight juvenile delinquency successfully.

I would like to ask the Hon. Minister how many psychiatrists we have in the department. We have two. And these two psychiatrists are not only to deal with the juvenile deliquents, they are there to deal with all the prisoners in the country. It is the same story. If you look at the number of people who go to prison in this country, you will find that 50 per cent. of them are people who have been reconvicted. Why is it that 50 per cent. of the people who go to prison are people who have been reconvicted ? That is because they are mentally ill. Sending them to the prisons does not solve the problem, they have to be given psychiatric treatment. We think if we send a man to a prison or a boy or a girl is sent to a certified school, we could reform him or her. In the 20th century, countries that have progressed in this direction will laugh at us if we tell them that 50 per cent. of our prisoners are reconvicted. This problem cannot be approached in the proper manner unless the country has a sufficient number of psychiatrists.

Secondly, it is also a human issue. I wish to stress that, the burden is on us, on this assembly, to see that the Government establishes a school for those who are mentally deficient. It is a pathetic thing, it is a sad thing, that these children who are mentally deficient cannot be put on the correct lines because we have not a school to treat them.

We have one that is run by a voluntary organization at Pannipitiya on a very small scale. That is not what I envisage. I want a school for those who are mentally deficient, in the correct sense, in its proper context. Unless we have such a one, we can never fight juvenile delinquency.

In this Supplementary Estimate the Hon. Minister says that juvenile delinquency is on the increase. That is granted. Maybe because of economic reasons, maybe because of environmental reasons, maybe because of illiteracy on the part of the parents but whatever it is, this question remains unsolved. We have only six certified schools in this country. We do not have a single certified school in the Central Province. We have only one certified school for girls, at least you are launching on it. That is about all. We need more certified schools. You have to make sure that those certified schools are staffed, manned by the correct type of people. It is not like staffing a Government school, it is not like filling a Ministerial vacancy ; the principal of a certified school has to be a human being. He has to understand human problems. That is not a problem. That is not a job. That is not a vocation. That is a calling. That is a mission. Everybody cannot do it. So to man these institutions we must have personnel that is devoted to the work. We must have more certified schools, at least there should be one for the Central Province and you must have one for the girls. There is at the moment, one in the North and also one in the South. The one at Welimada has already started functioning. But we do not have one for the Central Province.

According to this Supplementary Estimate you have asked this money for approved homes. Approved homes can never deliver the goods ; they can never function the way they should. I will tell you the simple reason why. What is meant by an approved home ? Why do you need an approved home ? We have asked these questions before.

When we find that a boy or a girl has to be temporarily taken out of his or her home for certain reasons,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පරිපූරක මුදල්

we recommend that child to be sent to an approved home. The defect with the approved home is this : most of these approved homes have an old bachelor or an old spinster in charge, who is already dissatisfied and jealous of various things they have missed in life. I do not say that the Hon. Minister is an old bachelor, he is still eligible ; so is the Hon. Leader of the House.

The person in charge of these approved homes is either an old bachelor or an old spinster full of venom against society, are perhaps, to a series of frustrations. Now, Sir, how can you expect such people to deal with these children ? I do not say that all these associations must be nationalized. My contention is that the personnel to man these voluntary associations do not have the proper make up, the proper set-up, the correct attitude, temperament, towards deserted and destitute children. That is the most important thing.

Probation Officers may give it a try. We are a very fortunate country in that we have an exemplary probation service. But what can they do if they do not get the correct type of co-operation from these voluntary organizations ? What can they do ? Once these children are sent to the voluntary organizations the authorities and the people who run the voluntary organizations have to co-operate with the probation officer in rehabilitating these children. It is not an easy task. That is my contention. There is only one solution, and that is, the Government should start such homes.

We have still another serious defect. That is, the voluntary associations that run these homes are also approved as remand homes. That is a very important thing. Not only are these children sent to these homes but these homes are approved as remand homes. In this country we have only two remand homes, one at Galle and the other at Colombo. This is a very serious situation and it has many serious drawbacks. When a child is sent from a court to a remand home, that child's mind is in a state of turmoil. When that child goes to the remand home, those who are in charge of the remand home are the first people who will have to start probation activities in the case of that child.

It will not be out of place for me to mention here that in some of the advanced countries, when a child is sent from a court to a remand home, the personnel there are so well trained that they tell the child : "Hullo, my dear son, come in. What can we do for you ?" They make the child feel at home, because rehabilitation is not easily possible. In Ceylon it is a gruesome story. In some of these children's homes or approved remand homes, when a child is sent there from a court, they beat him, get him to do the washing, get him to grind chillies, and so on. And we speak of rehabilitating children !

That is what is happening today in this country. Does the Hon. Minister know that ? After all, the children are the wealth of the country. They are those who will run this country one day. Is the Hon. Minister aware that this is what is happening in the remand homes today—private homes which are approved as remand homes ? That is where the rehabilitation of the child should begin. I am saying this to the Hon. Minister with all conviction. I feel very bad about it because I know of cases where this sort of thing has happened. As soon as a child is sent to a remand home they say :

"යකෝ වරෙන් කෝ, උඹ තමයි ගණන් කාරයා."

That is the sort of treatment meted out to the child. That is the reception he gets. From that time that poor boy develops a sort of venom and hatred towards society as a whole. Do we want him to turn out to be a criminal? Rehabilitation of children is not a simple thing. It has to be dealt with in the most systematic and scientific manner. It is a human problem.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[තම්බි මයා.]

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

No.

ඩී. ෂෙල්ටන් ජයසිංහ මයා. (වත්තල)
(திரு. டீ. செல்டன் ஜயசிங்ஹ—வத்தளை)
(Mr. D. Shelton Jayasinghe—Wattala)

Then withdraw it.

ප්‍රශ්නය සභාහිමුඛ කරන ලදී.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පූ. භා. 1.53

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

ගරු කථානායකතුමනි, මෙය ඉතා වැදගත් වැය ශීර්ෂයක්. සංවර්ධන වැඩ පිළිවෙලක් නුවූවත් මේ රටේ ජාතික හමුදාවක් ඇති කිරීමට මේ මුදල ඇතැම් විට ප්‍රයෝජනවත් වෙනවා. යුද්ධ හමුදා වටය කියා මේ වැය ශීර්ෂය යටතේ රුපියල් 35,12,921ක් වෙන් කර තිබෙනවා. එය සුළු මුදලක් නොවෙයි. මේ රටේ අභ්‍යන්තර ආරක්‍ෂාව සඳහා ජාතික හමුදාවක් ඇති කිරීම ගැන අපේ විරුද්ධත්වයක් නැහැ. මේ වැය ශීර්ෂයේ පුද්ගලික පඩිනඩි සහ කාර්ය මණ්ඩලයේ අතිකුත් දීමනා සඳහා රුපියල් 16,56,024කුත් පාලන ගාස්තු—පුනරාවර්තන වියදම්—සඳහා රුපියල් 18,56,897කුත් යනුවෙන් රුපියල් 35,12,921ක් වැනි විශාල මුදලක් වෙන් කර තිබෙනවා. කාර්ය මණ්ඩලය යනුවෙන් මෙහි සඳහන් කර තිබෙන්නෙ ඉහළ නිලතල දරණ අයත් ඇතුළුව වෙන්ට ඇති ඉහල නිලතල දරණ අයට විශාල මුදලක් වැය වෙනවා. මුලදීත් මේ ගැන මා කියා තිබෙනවා. කොමාන්ඩර්, ලෙෆ්ටිනන්ට් කොමාන්ඩර්, කැප්ටන් යනාදි උසස් නිලධාරීන් වෙනුවෙන් යන මුදල බොහොම වැඩියි. මේ රටට ඔබින ආකාරයටයි වැඩ කෙරෙන්ට ඕනෑ. අධිරාජ්‍යවාදීන්ගේ කාලයේ තිබුණු හැටියටම හැඩගස්සාගෙන මේ දුප්පත් රටේ ඒ විධියට මුදල් වැය කරන්ටයි ලැස්තිවෙලා ඉන්නෙ. අද ඒ පරණ සැලැස්ම අනුව ගෙන යන්ට බැහැ.

රටේ සාමාන්‍ය ජනයාගෙ දරුවන්, ඉලන්දාරි, දහස් ගණනක් අද හමුදාවෙ ඉන්නවා. ගම්බද ගොවියගෙ පුතා අද එස්. එස්. සී. විභාගයෙනුත් පාස්වෙලා—ඉස්සර කාලෙ වගේ හය හත පාස් කරල නොවෙයි—අද හමුදාවට බැඳිල ඉන්නව. වැඩපොළේ කම්කරුවගෙ පුතා හොඳට ඇඟ පත ඇතුව, හොඳට වැඩුණු පපුව ඇතුව, තුවක්කුව කරේ තබාගෙන, හැතැප්ම ගණන් දුවන්ට පුළුවන්කම ඇතුව අද හමුදාවෙ ඉන්නවා. මධ්‍යම පාසැලේ හොඳ ඉගෙනීමක් ලබා පිට වුණු උදවිය අද හමුදාවෙ ඉන්නවා; නමුත් අද ඒ උදවියට තැන නැහැ. දහස් ගණනින් ඉන්න ඒ උදවියට අද පඩිනඩි වැඩි වන තැන් ලැබෙන්නෙ නැහැ. ඒ අයට සිය ගණන් පඩි ලැබෙන්නෙ නැහැ. දහස් ගණනින් පඩිය ලැබෙනොත් ලැබෙන්නෙ බොහොම කලාතුරකින් එක්කෙනෙකුටයි. මේකෙ රහස මොකක්ද කියන එක මම අහනවා කෙලින්ම. ගරු ඇමතිතුමාට උත්තර දෙන්ට පුළුවන්ද මේකෙ රහස මොකක්ද කියා ?

**ජයසිංහ මයා.**
*(திரு. ஜயசிங்ஹ)*
(Mr. Jayasinghe)

එතුමා ඊයෙ පෙරේදා තමයි මුදල් ඇමති හැටියට වැඩ භාර ගත්තෙ.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

ඊයෙ පෙරේද වැඩ භාර ගත්තට බොහොම කාලයක් මේ ගරු සභාවෙ ඉඳල තියෙනව. සාමාන්‍ය ගැමියෙකුගෙ පුතාට අද ඉහළ නිලතල ලබන්ට බැරි තත්ත්වයක් අද හමුදාවෙ තියෙන්නෙ මොකද? ඒක වෙනස් කරන්ට ඕනෑ. වලන්ටියර් හමුදාවත් ඊයෙ පෙරේද විසුරුවා හැරල ජාතික හමුදාවක් හදන්ට ලැස්ති වුණා. කාටද ඒ ජාතික හමුදාවෙ නිලතල දෙන්ට යන්නෙ? කොහොමද ඒ අය තෝරන්නෙ? තමුන්නාන්සේට මතක ඇති පසුගිය කාලෙ—මේ අවුරුද්දෙ ජනවාරි මාසෙ—ඇති වුණු සිද්ධිය.

අද මේ අළුත් අංශයට—" Third Field Regiment " කියන අංශයට—හටයින් ගන්නවා. අළුත් යුනිට් එකෙනුත් ගන්නවා. පිටතිනුත් ගන්නවා. එදා, 28 වනදා, පුත්තලමේ සිටි නිලධාරියායි, ගත්තේ. ඔහුට විරුද්ධව පසු ගිය කාලයේ දී දෙපාර්තමේන්තුවේ තුබුණු " ස්වෙට් මන්ට් " මතක ඇති. කවුද, එදා පුත්තලමේ සිටි නිලධාරියා? අසවල් කොටස් අසවල් දවස්වලට එනවාය, " රේල්වේ " එක " ඇම්බුෂ් " කරන්න ඕනය, කියා හේවායින් පෝලිං ගසා වැඩ කළ කැප්ටන් ජේපාන්සේකායි. ඔහු ගැන ටිකක් සොයා බලන්න. මම එදා කිව්වා, අමුතු සංස්කෘති යක් අනුව එතැන නිලතල හැඩගස්සනවාය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කියා. හමුදාවේ සිටින දහස් ගණන් භටයින් මේ කරුණු ගැන විරුද්ධයි. හැබැයි, අළුත් කැප්ටන්ලා වෙන්න ක්‍රියා කරන උදවිය එතැන ඉන්නවා. ඔය විධියේ කැප්ටන්ලා තියාගෙන ඉදිරියට හමුදාව ගෙනයන්න බැරි වේවි. ජාතික ස්වරූපයක් අනුව හමුදාව හැඩගස්සන්න ඕන. අද හමුදාවේ සිටින දහස් ගණන් භටයින්ගේ මතයට ගරු කරන්න ඕන. අණ දෙන කොටස්වලට පමණක් තැන දී, ආසාවෙන් බැඳී හැදෙන වැඩෙන මේ රටට ලැදි කොටස්වලට තැන නොදී, වැඩ කිරීමේ ස්වරූපයක් මේ අළුත් යුනිට් එකේත් ඇති වේගෙන යනවා. අපි කල්පනා කළා, ඒ තත්ත්වය ඉවත් වේය කියා. නමුත් ඒ තත්ත්වය ඉවත් කරන්න ලැස්ති නැහැ.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

මේ මුදල ඉල්ලා තිබෙන්නේ අළුත් යුනිට් එකේ පඩිනඩි ගෙවීම සඳහා නොවෙයි. ස්වේච්ඡා හමුදාවේ සේවකයින් නිත්‍ය හමුදාවත් සමඟ අභ්‍යන්තර ආරක්ෂක කාර්යයන් වෙනුවෙන් සක්‍රිය සේවය සඳහා කැඳවීම සම්බන්ධයෙනුයි. —[බාධා කිරීමක්]

The position is this: In connection with the continuance of the emergency declared on 17.4.61 the Volunteer Force personnel of the Army who were placed on compulsory leave without pay were called out on active service for internal security duties along with the Regular Force. Some of these personnel have not been demobilised yet. On account of this and the intensive deployment of the Regular Force the Army had to engage additional civilian employees like cooks, waiters, labourers, sweepers and conservancy labourers.

It is for the staff that has already been employed from the Volunteer Force during the current financial year that this money is required and not for any new staff going to be employed or any new army formation that is now taking place or that will take place in the future. This is purely to pay the salary of the Volunteer Force that was already there.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

වොලන්ටියර් ෆෝස් එකට ගෙවන්නෙයි කියනවා. අද වොලන්ටියර් ෆෝස් එක ඩිස්බෑන්ඩ් කර, අර අලුතෙන් හදන යුනිට් එකටම ඇතුළත් කරනවා නේද? එසේ කිරීමෙදි අර නිලධාරීන් එන්නේ නැද්ද?

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

ඒක එන අයවැය ලේඛනයේ.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

එන අයවැය ලේඛනයේ නොවෙයි. අර කලින් කිව්වේ. ඒ වොලන්ටියර්ස්ලා දැන් මේ යුනිට් එකට ඇතුළු වෙනවා නේද? අලුතෙන් සංවිධානය වන මේ යුනිට් එකට අර වොලන්ටියර්ස්ලාමයි එන්නෙ. නමුන්නාන්සේ මේකෙ මොනම තේරුමක්වත් දන්නේ නැහැ. නිකම් ඔතන සභානායක හැටියට ඉන්නවා. සභානායක වශයෙන් නමුන්නාන්සෙ දන්නෙ නැහැ, ඇති වන වැඩ පිළිවෙළ. නිකම් කඩදාසි කෑල්ලක මොකවත් ලියා දුන්නාම කථා කළාට හරි යන්නේ නැහැ. ඒකෙ නියම තත්ත්වය දැනගන්නට ඕනැ.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

සාමාන්‍යයෙන් අනික් මන්ත්‍රීවරුන් දන්න තරම්වත් දන්නවා ඇතිනෙ?

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

නමුන්නාන්සෙ මේක සම්බන්ධව දන්න තරම කියනවාද, දන්න තරම වහ ගෙන ඉන්නවද කියා දන්නේ නැහැ. අන්න ඒක මම කෙළින්ම කියනවා.

**විජයබාහු විජයසිංහ මයා.** (මීරිගම)
*(திரு. விஜயபாஹு விஜயசிங்ஹ—மீரிகம)*
(Mr. Wijayabahu Wijayasinha—Mirigama)

කොහොමද දන්නේ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

කවුද තමුන්නාන්සේ ? තමුන්නාන්සේ එතන ඉඳලා තිබෙනවා නේද? දැන්ද නින්දෙන් නැගිට්ටේ ?

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)

ළඟදී ඇමෙරිකාවට ගිහිල්ල ආවේ.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

නැගිටල ආවෙ දන්ද? දන්නෙ නැති කෙහෙල්මල්වලට කට ගහන්න එන්න එපා. නොදන්න දේවලට ඇවිත් වරිගෙ නහගන්න එපාය කියා කෙළින්ම කිය නවා.

**විජයබාහු විජයසිංහ මයා.**
*(திரு. விஜயபாஹு விஜயசிங்ஹ)*
(Mr. Wijayabahu Wijayasinha)

ඔය කෑ ගැහැව්වට මම බය නැහැ.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

තමුන්නාන්සෙ බය නැති බව දන්නවා. එදා මේසය යටට ගිය හැටි අපි දන්නවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)

කොච්චෙ යට හිටියේ.

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)

කරුණා කර නිශ්ශබ්ද වන්න. ප්‍රශ්න යට අදාළව කථා කරන්න. මේකෙ අලුතෙන් බඳවා ගැනීමක් ගැන නැහැ. මේකෙ කියා තිබෙන්නේ—In connection with the continuance of the Emergency declared on—කියල.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

තමුන්නාන්සෙ නොකීවාට මටත් තේරෙනවා. අද වැය කරන හැටි මම කියන්නම්. මේකෙ තිබෙන ඒවා අමුතුවෙන් කියන්න ඕනෑ නැහැ. එක එක ඉලක්කම ගැන මට කියන්නට ඕනෑ නැහැ. මමත් මෙතන 16 අවුරුද්දක් කථා කර තිබෙනවා.

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)

ගරු මන්ත්‍රීතුමා කීවා අලුතෙන් බන්දනවාය කියා. එහෙම අලුතෙන් බන්ද වන්නේ නැහැ.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

දැන් ඉන්න වොලන්ටියර්ස්ලා අලුතෙන් බඳවනවා. මේ එමජන්සි එකේදී පසුගිය කාලයේ වැඩ කළ අය දැන් පඩි දීලා නැවත අලුත් එකට ගන්නවා. ඒක ඩිස්බෑන්ඩ් කළා කිවා. මේ ජාතික හමුදාව කියා නමක් දමාගෙන යන එකට ඒකෙන් දෙකෙන් පංගුවකට වඩා ඇතුළත් කර ගෙන යනවා. තමුන්නාන්සෙ දැනගන්න.

**විජයබාහු විජයසිංහ මයා.**
*(திரு. விஜயபாஹு விஜயசிங்ஹ)*
(Mr. Wijayabahu Wijayasinha)

කොච්චාවෙ යුනියන් එකට බාර දුන්නා නම් හරි.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

නොදන්න කෙහෙල්මලකට කට දමන්න එපා. තමුසෙ වෙරි වෙලා නම් ඔන්න ඔහේ නිදා ගන්නවා.

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)

මීරිගම ගරු මන්ත්‍රීතුමා (විජේබාහු විජේසිංහ මයා.) නිශ්ශබ්දව ඉන්න.

**විජයබාහු විජයසිංහ මයා.**
*(திரு. விஜயபாஹு விஜயசிங்ஹ)*
(Mr. Wijayabahu Wijayasinha)

කසිප්පු බීල වගෙයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

කසිප්පු බිලද මොනව බිලද මම දන්නෙ නැහැ, ඒ කාලෙට කථා කරන්නෙ. මේ හමුදාවයි, "පීස් කෝ" එකයි ගැන කියන විට බොහොම රිදෙනවා. බොහොම කැක්කුමයි. [බාධා කිරීමක්] නිච්චිය නැතුව දොඩවනවා. බෝතල් කීයක් ගැහැව්වද ?

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)

කරුණා කර නිශ්ශබ්ද වන්න. ගරු මන්ත්‍රීතුමා ප්‍රශ්නයට අදාළව කථා කරන්න.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

මෝඩයෙක් වුණාට මේ ගරු සභාවේ මෝඩ වචන කියන්ට එපාය කියා මම එතුමාට කියනවා. ඔබතුමා කථා නොකර ඉන්ඩ [බාධා කිරීමක්]—

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)

මීරිගම මන්ත්‍රීතුමා කරුණා කර නිශ්ශබ්ද වෙන්න. නැත්නම් එළියට යන්න.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

තමුන්නාන්සේ කිව්වාට එතුමා අහන්නේ නැහැ. එතුමාට වෙරි. ඔය කථා කරන්නේ මත්ගතිය ! භූතයෙක් !

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)

කථානායකතුමනි, භූතයෝ වැහිල.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

එතුමාට රාජ්‍යාරක්ෂක කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්කම ලැබෙන්ට යනවා. ඒකයි මේ ටිකක් ඉගෙන ගන්ඩ එපායැ.



ගරු කථානායකතුමනි, හමුදාවට වැය කරන මුදල් සම්බන්ධවයි මම කීවේ. මේ පෙරේදා හමුදා නිලධාරියෙක් දවස් දෙකක් නිවාඩු අරගෙන රජයේ ජීප් රථය කිනුයි ගියේ. ඔහු ආපසු ආවේ අදයි. කවුද ඒ ? මම දන්නවා, ඔහු ඒ ජීප් රථයෙන් ආවේ අදයි. මෙන්න හමුදාවේ වාහන පාවිච්චි කරන හැටි. එහෙත් සාමාන්‍ය භටයෙකුට සුළු වේලාවකට, පැයකට දෙකකට මළ ගෙයකට යන්න වුණත් රජයේ වාහනයක් ලැබෙන්නේ නැහැ. එහෙත් අර නිලධාරියා දවස් දෙකක් නිවාඩු අරගෙන ගියේ ජීප් රථයකින්. අදයි ආවේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)

කව්ද ඒ ? ඒ නිලධාරියාගේ නම මොකක්ද ?

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

හමුදාවට වෙන් කරන මුදල් නාස්ති වන්නේ මේ ආකාරයටයි. "වරාන්ස් පෝට්, ඊරුවිලින්" වලට කියා රුපියල් හතළිස් දහසක් පමණ වෙන් කර තිබෙනවා. මේවා ගැන හොඳට පරීක්ෂා කර බලන්න. මම තමුන්නාන්සේට දැන් කීවේ අද සිදු වූ දෙයක්. පෙරේදා අරගෙන ගිය ජීප් රථය අදයි ගෙනාවේ. තමුන්නාන්සේට මම තවත් කාරණයක් මතක් කරන්ට කැමතියි. පසුගිය දිනවල කිරි බෝතලයක් ගැනීමට හමුදා රථයකින් පනාගොඩ සිට කිරිල්ලපොනට ආවා. මේවා අද දින සිද්ධ වන දේවල්. මෙවැනි කරුණු තවත් කීපයක් තිබෙනවා.

ගරු කථානායකතුමනි, ඊළඟට ඒ ස්ථානයේ ගොඩනැගිලිවල තත්ත්වය ගැන බලමු. ලක්ෂ ගණන් වැය කළ ගොඩනැගිලි අද පුපුරගෙන යනව. ඊයෙ පෙරේදා පනාගොඩ තිබෙන පරණ බංගලාව රෙපයාර් එකට දැම්ම. ඒ රෙපයාර් එකට රුපියල් 15,000 ක් ගියා. රුපියල් 15,000කින් අළුත් ගෙයක් සෑදිය හැකියි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
මේ ගමනාගමනයට තිබෙන රේල්වේ වොරන්ට්ස්වලට ගිය වියදම්.

This is for railway warrants issued to 8,000 volunteers to come from the nearest railway station to their homes in Colombo.

**වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. ඩී. ද සිල්වා**
*(டொக்டர் டப்ளியு. டீ. டி சில்வா)*
(Dr. W. D. de Silva)
This Supplementary Estimate is over your Army Vote.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
Yes.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)
කථානායකතුමනි, අහරෙ ඉඳන් රේල්වේ වොරන්ට්ස්වලින් එයි. ජීප් එකෙන් නැත්නම් ට්‍රක් එකෙන් යන ඒවට මුළු වෝට් එකෙන් යයි.

**හමීඩ් මයා.**
*(ஜனாப் ஹமீத்)*
(Mr. Hameed)
Sir, there is no Quorum.

මන්ත්‍රී මණ්ඩලය ගණන් කොට ගණපූරණයක් නොමැති වූයෙන්, බෙදුම් සීනු ශබ්ද කිරීමට නියෝග කරන ලදි.

පසුව ගණපූරණයක් තුබුයෙන්—

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)
මම මතක් කළා අපි මෙහෙම පාස් කරන මුදල් වියදම් කරන ආකාරය. දුම්රියේ ගමනාගමන කරන්ටය කියා මුදලක් දානව; පාවිච්චි කළ විදුලි බලයටය කියා මුදලක් දානව. අර රෙපයාර් කළ ගෙට රුපියල් 15,000 ක් ගියා. ඒකට එස්ටිමේට් කළ මුදලට වඩා වැඩියෙන් වියදම් වී තිබෙනව. ඒ වැඩිය ගිය මුදල කොතැනින් ගන්ටද කියා දැන් හොයනව. ඔක සමහරවිට ඉස්සර ශ්‍රීයාකන්දවත්තෙ තිබුණු පරණ බංගලාවක් වෙන්ට පුළුවන්. මේ විධියට කරුණු සිද්ධ වෙන්නෙ එක තැනක පමණක් නොවෙයි; හැම තැනම මේ විධියයි. "ආම්ස්, ඇමුනිෂන් ඇන්ඩ් ස්ටෝර්ස්" කියා මේකට රුපියල් ලක්ෂ 3 ක් දමා තිබෙනව. එහෙ යාපනයට ගෙන ගියෙත් මෙහෙ ස්ටෝර්ස් වලින් නොවැ.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
ස්ටෝරුවෙන්.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)
ඔව්, හමුදාවෙ තිබුණු ඒව. ඇයි අර ජනවාරි මාසෙ 25 වැනිදා වෙඩි උණ්ඩ 65,000 ක් නැති වුණා නේද? ඒව මේකට නොදැම්මෙ ඇයි? මෙතැන වාර්තා කළා නේද? ඒව සේරම හම්බ වුණාද? නැහැ. ගණන් ලැයිස්තු අනුව 65,000 කට කිට්ටු ගණනක් තිබුණා.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
ඒව නැති වුණේ නැහැ.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)
ඒව සේරම හම්බ වුණේ නැහැ. 65,000 කට කිට්ටු ගණනක් අඩුව තිබුණා.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
ඒ පිට කර තිබුණු ඒව ආපසු ගත්ත.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)
ඔක්කොම ගත්තෙ නැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ඩී. පී. ආර්. ගුණවර්ධන මයා (අවිස්සාවේල්ල)**
*(திரு. டீ. பீ. ஆர். குணவர்தன—அவிசாவலை)*
(Mr. D. P. R. Gunawardena—Avissawella)

බේරෙට වැටිච්ච හරිය ගත්ත.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

ඇතැම් කොම්පැනිවල තුබුණු උණ්ඩ ගෙනැවිත් බේරෙට හැලීම ගැනත් සටහන් වෙලා තියෙනවා. ඒක නැතෙයි කියන්න බැහැ. මන්නාරමේ යුනිට් එක භාරව සිටි අණ දෙන නිලධාරියා උණ්ඩ ගන්නා ලෙස දුන්න නියෝගය තමුන්නාන්සේ දන්නේ නැද්ද? සේරම්, දිසානායක, මැල් යනාදී අය අසු වුණු බවත්, ආණ්ඩුව ඒ අයට විරුද්ධව ක්‍රියා කරන්ට යන නිසා ඒ අය ආරක්ෂා කළ යුතුය කී උදවිය තවමත් හමුදාවේ ඉන්නවා. මේ කොටස්වලින් ටිකක් බේරිලා ඉන්න. බේරේ තිබී හමු වුණු උණ්ඩ යුද්ධ හමුදාවේ ඒවා නොවෙයි. ඒවාට වියදම් කෙළේ නැද්ද? තවත් උණ්ඩ තිබුණේ කොහේද? ඒවා යුද්ධ හමුදාවේ උණ්ඩ නොවෙයි නම් කොම්පැනියක තිබුණු ඒවාද? කවුද ඒවා බේරෙට දැම්මේ? කවුද ඒවා හමුදාවට දුන්නේ? ඒවා පොලිස් ට්‍රේනිං මධ්‍යස්ථානයේ තුබුණු ඒවාද? ඒවා ගෙනත් දුන්නේ සිඩ්නි ද සොයිසා ද? එහෙම නැත්නම් ජේසුදාසන් ද?

පූ. භා. 2.21

ගරු කථානායකතුමනි, අද දින වැඩ කෙරෙන ආකාරය ගැන මා කරුණු ටිකක් මතක් කළා. යුද්ධ හමුදාවේ හේවායන් ඉන්නේ සීලිං නොගසන ලද ගෙවල්වලයි. අව්ව තදින් තිබෙන වෙලාවල ඒ ගෙවල් වල ඉන්ට පුළුවන්කමක් නැහැ. නිලධාරීන් ඉන්නේ නම් හොඳට සීලිං ගසන ලද ගෙවල්වලයි. නිලධාරීන් දෙතුන් දෙනකු ඒ හේවායන්ගේ කාමරවල බැඳ තැබුව හොත් සීලිං නැති එකේ අමාරුව ඔවුන්ට තේරෙනු ඇති බවත්, එසේ තේරෙන තුරු හේවායන්ගේ කාමරවලට සීලිං නොලැබෙනු ඇති බවත් සමහර හේවායන් කියනවා. සොල්දාදුවන් වාසය කරන ගෙවල් ඒ තරම් උෂ්ණ වන ආකාරයටයි සාදා තිබෙන්නේ. හේවායන්ගේ ගෙවල් මේ විධියට සාදා ඇති නමුත් නිලධාරීන්ගේ ගෙවල් හොඳට සාදා තිබෙනවා.

අපටත් පහසුකම් වුවමනා බව, අපටත් උෂ්ණය වැඩි කාමරවල ඉන්න බැරි බව එතකොට තේරේය කියා ඒ හේවායෝ අද කියනවා. අපේ සභානායකතුමා මේවා ගැන දන්නෙ නැති නිසයි, මම මේවා මතක් කළේ. ඉදිරියට ඇති කරන්ට යන යුනිට් එකවත් නියම පිළිවෙළට හදන්න ඕනෑ. තුප්පහි සංස්කෘතියට අනුව කටයුතු කරන නිලධාරීන් ඉවත් කරල රටේ ගම්බද ගොවියාගේ, කම්කරුවාගේ දරුවාට ඒ තැන දෙන්න ඕනෑ. ඒ අය අතර දැන් උගත් පිරිස ඉන්නවා. ඒ අයට උසස් නිලතල ලබා ගන්ට ඉඩ දෙන්න ඕනෑ. ඒක කරන්න ලැස්ති නැහැ. ගරු සභානායක තුමා ඔළුව වැනුවට මදියි. තමුන්නාන්සෙ කරන්නෙ නැති එකයි, වැරද්ද.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

ගරු කථානායකතුමනි, මගේ වරදක් නොවෙයි. අපේ ආණ්ඩුව බලයට පත් වුණාට පස්සෙ සරඹ කරන්නෙ සිංහලෙන් බව තමුන්නාන්සෙ දන්නව. අණ දෙන්නෙත් සිංහල භාෂාවෙන්. සිංහල භාෂාව රාජ්‍ය භාෂාව කළේ ඕවා කරන්ට අදහස් කරගෙනයි.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

සිංහල භාෂාවෙන් කටයුතු කරනවා නම් එතන ලියකියවිලි ගනුදෙනු කරන්නෙ මොන භාෂාවෙන්ද? සිංහලයෙන් යම් කිසි අණක් පනවා ලියවිල්ලක් අරින්ට පුළුවන් නිලධාරී 5 දෙනෙක් ඉන්නවාද? හේවායන් අතර නම් එස්. එස්. සී. පාස් කළ, සිංහලයෙන් වැඩ කරන්ට පුළුවන් අය ඉන්නවා. කරනවාය කිව්වට මදියි, කෙරෙන්නෙ නැහැ. අද එතන ගෙන යන වැඩ පිළිවෙළ මේකයි. "චීප් ඔප් ස්ටාප්" සිංහල දන්නවාද කියා මම අහන්ට කැමතියි. තමුන්නාන්සෙ මේ ලෝකෙ දෙයක් ගැන දන්නෙ නැහැ.



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)
ගරු මන්ත්‍රීතුමා දන්නවාද?

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பீ. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)
මම දන්න ඒවා ගැන මට කියන්ට පුළුවන්. සිංහල භාෂාවෙන් හමුදාවෙ කට යුතු කරනව නම්, ඒ සඳහා සුදුසු වැඩ පිළිවෙළක් ක්‍රියාවේ යොදවනව නම්, ඒ හමුදාව ජාතික ස්වරූපයක් ඇතිව, ජාතික ඇල්මක් ඇතිව රටේ ආරක්‍ෂාව සඳහා කටයුතු කරන පිරිසක් හැටියට හැඩගසා ගන්ට පුළුවන්; තුප්පහි ගති වලට ඇදෙන්නෙ නැති වන පිළිවෙළට හමුදාව හදා ගන්ට පුළුවන්. එතන ඉන්නාවූ 340 ක් පමණ වූ නිලධාරින් ගෙන් සියයට අනුවක්ම තුප්පහි ගති වලට යට වූ අයයි. අපේ කොමාන්ඩර්තුමා ඉන්නවා. අහගන්න පුළුවනි. ඒ පිළි වෙළ හරිගස්සන්ට එතන ඉඩක් නැහැ. විදේශික රටවල ඉඳල බලපාන කතෝලික ඇක්ෂන් එක ගැන, දේශපාලන බලපෑම් ගැන මම මුලින් කිව්වා. ඒක තමයි අදත් තියෙන්නෙ. පසුගිය දිනවල මම විභාග ගැන කිව්වා. ප්‍රොමෝෂන් දෙන්න විභාග පවත්වන හැටි, විදේශික රටවලට උදවිය යවන හැටි, මම කිව්වා. මේ රටේ ජාතික හමුදාවක් හැඩගැසීමේදී නිලතල භාර ගන්ට පුළුවන් කී දෙනෙක් පිට රට යැවී මට සිටින අයගේ ලැයිස්තුවේ ඉන්නවද දන්නෙ නැහැ. එදා මම මෙතන කළ කථා වෙන් පස්සේ ඒ විභාගය අවලංගු කරල තියෙනවා. ඒ විභාගය අවලංගු කළාට පසු ආශාවක් ඇතිව යන්න හිටපු එක් කෙනකුට දෙන්නකුට යන්න තිබුණු ඉඩ කඩ අනික් අවස්ථාවෙදි නැති කරන්ට පුළුවන්. එතන විභාග කරන පරීක්‍ෂක යන් වෙනස් කළාද? නැහැ. හොරාගෙ අම්මාගෙන් පේන අහන්නයි වෙන්නෙ අද. නිලතල සම්බන්ධයෙන් ඒ විධියටයි හමුදාව හැඩගස්වා ගෙන යන්නෙ. ඒ ක්‍රමය වෙනස් කරන්න ඕනෑ.

**වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. ඩී. ද සිල්වා**
*(டொக்டர் டப்ளியு. டீ. டி சில்வா)*
(Dr. W. D. de Silva)
මොනව කිව්වත් උත්තරයක් දෙන්නෙ නැතෙ.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பீ. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)
සිංහලෙන් වැඩ කරනවාය කියන මේ ආණ්ඩුවෙන් මා අහනව. සිංහල ටයිප් රයිටර් කීයක් හමුදාවෙ තියෙනවද කියල. ඒව වැඩ කරනවාද? ඒවායෙ වැඩ කරන දක්ෂ අය වෙන තැන්වලට මාරු කර ගෙන යනව නේද? හමුදාවෙ රාජ්‍ය භාෂාව නියම විධියට ක්‍රියාවෙ යොදවන්න තවම ලෑස්ති නැහැ.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
සිංහල ටයිප් යන්ත්‍ර 113 ක් තියෙනවා.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)
වැඩ කරන උදවිය මොන මොන තැන් වලටද දාල තියෙන්නෙ.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
ටයිප් යන්ත්‍ර තියෙන තැන්වලට.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)
ගිහින් බැලුවද? අතනින් එවන තුණ්ඩුව විතරක් පිළිඅරගෙන වැඩ කරන්න ගියොත් තමුන්නාන්සෙත් අන්තරාවේ වැටේවි.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
මෙම සභාවේ ගරු මන්ත්‍රීවරුන් කියන හැම දෙයක්ම බොහොම හොඳින් කල් පනා කර බලනවා, ගරු අගමැතිනිය. මට ඒක පැහැදිලි වශයෙන් කියන්න පුළු වනි. යුද්ධ හමුදාව ගැන වුණත් අනිකුත් කරුණු ගැන වුණත් එතුමියට අයිති දේවල් පිළිබඳව මෙම මන්ත්‍රීවරුන් කියන කරුණු එතුමිය හැන්සාඩ් වාර්තාව මගින් කියවා බලා බොහොම ඕනෑකමින් කල්පනාවට ගන්නවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

කල්පනාවට ගත්තට මොකටද, ක්‍රියාවෙ යොදවන්න ශක්තියක් නැතිනම්? කවුරුත් කල්පනාවට නම් ගන්නව, නමුත් ක්‍රියාවෙ යෙදෙන්නෙ නැහැ කල්පනාව විතරයි. කරන්න අදහසක් නැහැ. ක්‍රියාවේ යොදවන්න ශක්තියක් නැහැ. කෘෂිකර්ම ඇමතිතුමාත් හැමදාම මෙතන කියනව මෙච්චර අස්වැද්දුව, අච්චර අස්වැන්න තියෙනව කියල. බැලුවහම එය ගුවනෙ මාලිගා හැදීම වාගෙයි. [බාධා කිරීම්.] මේ කරුණු පිළිබඳව කෙළින් තීරණයක් ගන්න තමුන්නාන්සේට ශක්තියක් තියෙනවද? මේවා පරීක්ෂා කර බලා ක්‍රියාවෙ යොදවන්න අගමැතිනියට ශක්තියක් තියෙනවද? අද වන තුරු මේවා ගැන කෙළින් ප්‍රකාශයක් කළාද? මේ ගරු සභාවේදී අපි මෙම කරුණු කීප වතාවක්ම කියා තිබෙනවා. නමුත් කෙළින් ප්‍රකාශයක් කළේ නැහැ. තමන්ගේ රටට ආදරයක්, ආසාවක්, ආලයක් තියෙන සාමාන්‍ය භටයන්ට රාජ්‍ය භාෂාවෙන් වැඩ කිරීමට ඇති දක්ෂකම් අනුව "ප්‍රමෝෂන්" දීමේ වැඩ පිළිවෙළක් සකස් කරන්න ඕනෑ. දැනට එසේ සලස්වා තිබෙනවද? අද වන තුරු සලස්වා නැහැ. රට නිදහස ලබා ගත්තායින් පසුව සමාජය ප්‍රගතිය කරා ගමන් කිරීමේදී එම ගමනට අවහිර ඇති වන අන්දමේ බලවත් අකුල් හෙළනවා නම් එයින් වන්නෙ මුළු රටටම විපතක්. පසුගිය වතාවේ යම්තම් කත අගින් ගහල ගියා. එදා නම් ඒ කට්ටිවලට විරුද්ධව ටිකක් තදින් සිටි නමුත් දැන් ටිකක් නිසොල්මන් වෙලා ඉන්නවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)

උසාවි තිබෙනවා.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

උසාවි නම් හුඟක් තිබෙනවා. නමුත් ඒ උසාවිවලටත් ක්‍රියා කරන්න බැරි ආකාරයටයි තමුන්නාන්සෙලාගෙ රජය වැරදි ආකාරයට ක්‍රියා කර තිබෙන්නෙ. අනෙක් රටවල නම් ඔය විධියේ ද්‍රෝහිකම් කරන උදවියට ඔය අන්දමට නොවෙයි සලකන්නෙ. හමුදාවෙ සිටි තැනැත්තෙකුට විරුද්ධව චෝදනාවක් ඉදිරිපත් කළා නම් ඒ අයට අච්චු කරන්නෙ කොහොමද? අනික් රටවල මෙවැනි අය සම්බන්ධයෙන් ක්‍රියා කර තිබෙන්නෙ කොහොමද පසුගිය කාලවලදී නම් නොයෙකුත් දෙනාට වෙඩි තබා මරා දමූ බව අප දන්නවා. අදත් එම නීති රටේ තිබෙනවා. රට ආරක්ෂා වන අන්දමට රජයේ සංවිධානයන් තිබෙන්න ඕනෑ. එම සංවිධාන ක්‍රමවත් පිළිවෙළට තබා නොගත්තොත් රටටත් ජනතාවටත් සිදු වන්නෙ බලවත් විපත්තියක්. ඒ නිසා ජනතාවගේ උපකාරද ඇතිව ජනතාව ආරක්ෂා කිරීම පිණිස මූලික බලසම්පන්න ආයුධය වන යුද්ධ හමුදාව හැඩගස්වා ගන්න ඕනෑ. අණ දෙන කොටස ඊට විරුද්ධව හිටියොත් රටට විපතක් සිද්ධ වෙනවට සැකයක් නැහැ. අන්න ඒක ගැන වැඩ පිළිවෙළක් යොදන්ට තමුන්නාන්සෙලට නම් බැහැ. හමුදාවෙ ලොකු නිලධාරීන් කොයි විධියට හිටියත් මේ රටට ආදරයක් ඇති දහස් ගණන් භටයින් ඒවට ඉඩ දෙන්නෙ නැහැ. තුප්පහි ගතියට වැඩ කරන අයට, මේ රටට අහිත විධියට කටයුතු කරන්න ඉඩ නොදෙන අය භටයින් අතර සියේට 95 ක් ඉන්නවා. රටට ද්‍රෝහිකම් කරන නිලධාරීන් කොයි තරම් අණ දුන්නත් රටට හිත ඇති භටයින්ගෙන් ඒවට ඉඩ ලැවෙන්නෙ නැහැ.

**සුමනපාල දහනායක මයා.**
*(திரு. ஸுமனபால தகனாயக்க)*
(Mr. Sumanapala Dahanayake)

ගණපූරණයක් නැහැ, කථානායකතුමනි.

මන්ත්‍රී මණ්ඩලය ගණන් කොට, ගණපූරණයක් නොමැති වූයෙන්, බෙදුම් සීනු ශබ්ද කිරීමට නියෝග කරන ලදී.

පසුව ගණපූරණයක් තුබූයෙන්—

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

තුප්පහි සංස්කෘතියට අනුව වැඩ කරන නිලධාරීන්ට වුවමනා විධියට අයුතු වැඩ කරන්ට මූලික හමුදාවෙ ඉන්න රටට ආදරයක් තිබෙන භටයෝ දෙන්නෙ නැති බවයි මම කිව්වෙ. භටයින්ට ඉහළට නැගල යන්ට ඉඩ දෙන්නෙ නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

ගරු කථානායකතුමනි, නිලධාරීන් හැටියට පුහුණු කිරීම සඳහා ළඟදී "සිලෙක්ෂන් බෝඩ්" එකක් මගින් "අදර් රෑන්ක්ස්" කියන කොටසින් 21 දෙනෙකු තෝරා ගත්තා. එක පාරටම ඒවායෙ කටයුතු කරන්ට බැහැ, පුහුණුවක් දෙන්ට ඕනෑ. ලොකු දෙයක් හැටියට නොවෙයි මේ කාරණය මතක් කළේ. ආණ්ඩුව එහෙම දෙයක් කරගෙන යන බවට සාක්ෂියක් වශයෙනුයි.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

ඒ ගැන මා බොහොම සන්තෝෂ වෙනවා. අර සංස්කෘතියෙන් පිට අය වෙන්ට ඇති තෝරා ගන්ට ඇත්තෙ. ඊයෙ පෙරේද කතාවෙන් පස්සෙ ටිකක්වත් ඒ විධියට හැඩ ගස්සනව නම් ඒ ගැන අපි සතුටුයි. මේ විධියට ගියොත් ආරක්ෂාව සල සන්ට පුළුවන් වේවි. ඉහළට නඟින්ට ඉඩ නොදී අවහිර කරන ගතියක් පෙනෙන නිසයි මම අර විධියට කිව්වෙ. රටින් පිට යන්න ලැස්තියෙන් කී දෙනෙක් ඉන්න වද කියන එක පසුගිය දිනවල මට දැන ගන්ට ලැබුණා. විශෙෂ වරප්‍රසාද ලබාගෙන රටින් පිට ගොස් පුහුණුව ලබාගැනීමට ලැයිස්තුවේ කී දෙනෙක් ඉන්නවාද ? ඒ ලැයිස්තුවේ මුලින් ඉන්නේ කවුද ? ඒවා ගැන පරීක්ෂා කර බලන්න. රටින් පිට ගොස් පුහුණුව ලැබීමට අදහස් කරන අයගේ ලැයිස්තුවේ මුලින් සිටින අය අතර මේ රටට ජාතියට ආදරයක් ඇති කී දෙනෙක් ඉන්නවාද ? ලැයිස්තුවේ හත් අට දෙනෙක් ඇති. ඉන් එක්කෙනකු දෙන්නකුවත් එවැනි අයයයි කියන්න අමාරුයි. එක්කෙනකුට වඩා ඇතැයි කියන්න අමාරුයි. අවුරුද්දට කී දෙනෙක් පිටත් කරනවාදැයි මම දන්නේ නැහැ.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

මේ තත්ත්වය වෙනස් වූයේ 1956 දී ආණ්ඩුව වෙනස් වූවාට පසුවයි. ඊට කලින් නොයෙක් විධියේ ඒවා තිබෙන්න ඇති. නමුත් 1956 දී විශාල වෙනසක් ඇති වුණා. දැන් ගරු මන්ත්‍රීවරුන් විසින් කියන සියලුම දේ ගැන ගරු අගමැතිනිය කල්පනා කර බලනවා ඇති. ඒ සමඟම ගරු අගමැතිනිය සිතේ තබා ගන්නවා ඇති, මේ රටේ මහජනයා පසු ගිය මැතිවරණයෙන් පසු යුද්ධ හමුදාවේ පාලනය ගරු අගමැතිනියට බාරදුන් බව.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

බොහොම වැදගත් වචන. ගරු අගමැතිනියට යුද්ධ හමුදාවේ පාලනය ලැබුනේ අගමැතිනිය වූ නිසයි. නමුත් ජනතාව දැනගෙන සිටියේ නැහැ, හමුදා සංවිධානය කොයි ආකාරයට තිබුණාද කියා. ජනතාව දැනගෙන සිටියේත් නැහැ ; මෙතැන සිටින බොහොමයක් මැති ඇමතිවරුන් දැනගෙන සිටියේත් නැහැ ; ගරු අගමැතිනිය දැනගෙන සිටියේත් නැහැ. එසේ දැනගෙන සිටියේ නැති නිසා තමයි, ජනවාරි මාසයේ ඇතැම් සිද්ධීන් ඇති වූයේ. ජනතාව දැනගෙන සිටියා නම් එබඳු සිද්ධීන් ඇති වීමට කිසිම ඉඩක් තබන්නේ නැහැ. අද ජනතාව දන්නවා. හමුදාවේ සිටින සියයට 90ක් පමණ හටයිනුත් දන්නවා. අර මා කී සංස්කෘතිය අනුව වැඩ කරන උද විය පුළුවන් තරම් ඉක්මනින් තල්ලු කර දමා වැඩ නොකළොත් හමුදාව ජාතික හමුදාවක් වශයෙන් හැඩගැස්සීමට නැවතත් අවහිර වෙන්න පුළුවනි. අවහිර වෙන්න පෙර සමහර විට පුපුරන්නත් පුළුවනි. ඔය පුටුවේ ඉඳගෙන සිටියාට සභානායකතුමාට ඒවා තේරෙන්නේ නැහැ. අගමැතිනියට තේරෙන්නේත් නැහැ. රටවල් දියුණු වේගෙන යන වැඩ පිළිවෙලවල් ගැන ටිකක් කල්පනා කර මේවා ඉක්මනින් සුද්ද කර ගන්ට ඕනෑය කියන එකයි මේ කරුණුවලින් පහදා දුන්නේ. එම නිසා මේ වැය ශීර්ෂය සම්මත කළත් නොකළත්—මේ මුදල දැන් දීලා තිබෙන මුදලක් ; එය වැය කළ මුදලක් ; එය දැන් දෙන්ට වෙනවා—මා මේ මූලිකව කී කරුණු ටික හිතට අරගෙන යුද්ධ හමුදාව රටට ජනතාවට ඔබින ආකාරයට, ජනතාවගේ හිතුම් පැතුම් ආරක්ෂා වන ආකාරයට සකස් කරන ලෙස අපි ඉල්ලා සිටිනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අධිරාජ්‍ය යුගයේදී ඇතැම් නිලධාරීන් විදේශිකයින්ට වහල් වී වැඩ කළා නම්, ඇතැම් කොටස් ඒ ඇට්ටඹිකම් තවදුරටත් ගෙනියන්න ඒ සංස්කෘතියට යටවෙලා සිටිනවා නම් හමුදාවෙන් ඒ අය තුරන් කර එය වහාම ප්‍රතිසංස්කරණය කරන්නය කියා කියමින් මගේ වචන ටික හමාර කරනවා.

පූ. භා. 2.51

**වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. ඩී. ද සිල්වා**
*(டொக்டர் டப்ளியு. டீ. டி சில்வா)*
(Dr. W. D. de Silva)

I think a lot of ground was covered by the previous speaker, my friend from Kottawa. The Government is asking for a Supplementary Estimate of Rs. 3½ million on this Vote. I am not too sure of the figure that was passed as the army Vote during the Budget. It was something to the tune of about Rs. 60 million. The Hon. Minister can correct me. The budgetary Estimates were passed not long ago and I think a sum of about Rs. 60 million was voted for the army. The last Budget was presented somewhere at the end of July. Now this is the end of September and this Government is asking for Rs. 3½ million.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

I must explain that point. This is a Supplementary Estimate for the current financial year 1961-62.

**වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. ඩී. ද සිල්වා**
*(டொக்டர் டப்ளியு. டீ. டி சில்வா)*
(Dr. W. D. de Silva)

You got Rs. 60 million for the army.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

For the army Rs. 36 million.

**වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. ඩී. ද සිල්වා**
*(டொக்டர் டப்ளியு. டீ. டி சில்வா)*
(Dr. W. D. de Silva)

I think you are wrong. Add up the figures. It is about Rs. 60 million. Will you ask your officials please?

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

Rs. 63 million for the army, navy and air force, but this money is for the current financial year.

**වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. ඩී. ද සිල්වා**
*(டொக்டர் டப்ளியு. டீ. டி சில்வா)*
(Dr. W. D. de Silva)

I am not disputing that point. What I am saying is that there was a budgetary estimate of Rs. 63 million for the army, navy and air force at the end of July and now you have come before Parliament for another Rs. 3½ million for the current year. And the Hon. Minister pointed out in this House that this was for the Emergency and that the House had ample opportunity always to discuss financial provision and other matters pertaining to the Emergency. But that is not so. I think this is the first occasion or one of the few occasions during the long term of the Emergency——

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

Why, you had four or five days to discuss this matter during the Budget Debate.

**වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. ඩී. ද සිල්වා**
*(டொக்டர் டப்ளியு. டீ. டி சில்வா)*
(Dr. W. D. de Silva)

Say, even it was discussed for more than forty days, what does it matter ? I think, the Emergency was there for over a year and this is one of the very few occasions when this House has been given an opportunity of discussing the Emergency, the moneys necessary for the Emergency and the purposes for which those moneys are to be spent. I think, the Hon. Minister was not fair in trying to shut out the debate in the early stages. He suggested that because he was sleepy. But this is a very serious matter ; the Government has now asked for 35 lakhs of rupees from the Consolidated Fund for army purposes, to have the Emergency on and to provide the army with the supplies needed during the Emergency.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. ඩී. ද සිල්වා]

What kind of Government is this that is asking for this 35 lakhs of rupees. Your Government went to the extent of cutting down two chundus of rice from the ration to save Rs. 11 million——

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பி. டி சில்வா)
(The Hon. C. P. de Silva)

Rs. 55 million.

ඩබ්ලිව්. දහනායක මයා.
(திரு. டப்ளியு. தகனாயக்க)
(Mr. W. Dahanayake)

Shame, shame !

වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. ඩී. ද සිල්වා
(டொக்டர் டப்ளியு. டீ. டி சில்வா)
(Dr. W. D. de Silva)

And just a few hours ago this very same Government passed a Supplementary Estimate for Rs. 50,000. And for what purpose ? For the welfare and care of children. Your Government at the end of July voted nearly Rs. 60 million for the army, navy and air force and is still not satisfied. You passed money in the last Budget also for the army, navy and air force but you are not satisfied and you come to this House and now ask for 35 lakhs of rupees to maintain the Emergency.

There are many questions that must be asked : Is this money absolutely necessary ? Can you afford this money ? Is the Emergency necessary ? Is it necessary for the Government to maintain this Emergency any longer specially in view of the increasing expenditure from the public purse every year ? What is the argument of this Government when there is a demand for essential works ? What is the argument of the Hon. Prime Minister ? She goes round the country calling for sacrifice. She says, "We are in great difficulty ; we are in financial straits ; we have to go round the world asking for loans." And what are you doing here ? The Minister of Agriculture, Land, Irrigation, Power,



Finance, Deputy Prime Minister, Parliamentary Secretary for Labour and what not, comes here and says, "I have nothing to do with this ; this is a matter for the Prime Minister who has got power from the people through an election ; I am her good and faithful servant and her voice in Parliament." And I do not like his tone either. Is that the language of a responsible Minister ? He represents the Prime Minister in Parliament. The Prime Minister is not here. Our Friend says she reads HANSARD at home. What use is that to us ? We want a Prime Minister who is responsible to this House personally.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பி. டி சில்வா)
(The Hon. C. P. de Silva)

The hon. Member has got it wrong. I was only answering a question asked by the hon. Member for Kottawa (Mr. D. B. R. Gunawardena) He wanted what he said to be acted upon and I said it would be noted by the Prime Minister. He made a useful suggestion.

වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. ඩී. ද සිල්වා
(டொக்டர் டப்ளியு. டீ. டி சில்வா)
(Dr. W. D. de Silva)

Certainly, he was not answering me. How could he when I was not speaking then ? I am only showing you the attitude of this Government, how the Minister of Finance is running away from the issue.

Here the Government is asking for Rs. 35 lakhs but there is no one directly responsible for answering questions about it. You said that the Prime Minister is reading HANSARD and giving due consideration to what is being said in the House. I hope you will come back and convey to us what she has to say about our comments. May be you will do so in the next Budget Debate if you happen to be Finance Minister then.

These matters must be treated more seriously. You curtail essential expenditure and you want to increase expenditure on the army. You have

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

cut down wages, you have deliberately retrenched staff in all corporations and Government departments. You have curtailed the social services, you have cut down the Education Vote and the food bill; you even proposed to cut down the rice ration. You are now asking for more money to maintain the army. Did you ask the people whether they are in favour of this? You always talk in the name of the people, in the name of socialism. Did you ask the people whether they want to expand the army and cut the rice ration? Your Cabinet approved the rice cut. So it was said in Parliament. Every Minister's Vote has been cut; every Ministry's expenditure has been curtailed. Now you have the audacity to come here and ask for more money for army officers.

I am objecting to this Supplementary Estimate on two grounds. One is that the present Rs. 35 lakhs is unnecessary. The people do not need the Emergency or any expansion of the army. My second objection is that next year also, if your Government were to survive, you will come here and ask for more money for the army. You cannot stop this Emergency. You have tied yourself in knots. You gave all types of excuses from the beginning to continue this Emergency: first there was the Federal Party, then the strikes, next the coup and now I do not know what reason you are giving for continuing it today. You are unable to give up the Emergency. This Government has tied itself in knots and next year they will ask for more money for the army. At the rate this Government is going, the people will be left with one social service, and that is the army. For their industrial work they will have the army; for their agricultural work they will have the army; and for all their other needs they will have the army.

From the day this Government came into power they have been expanding the army and they have come to Parliament and ask for more money, and yet they have given only a few opportunities to discuss the army. I am sorry this Supplementary Estimate should have come up for discussion at this hour. If the Government was fair it should have taken it up on another day and given this House an opportunity for a full discussion on the Emergency. That would have been fair. We have no idea and this country has no idea when this Emergency is going to stop. In fairness to this House, the Government should not ask for this money but it should declare why the Emergency is being maintained. The people of this country should know that.

When the Hon. Minister presented this Supplementary Estimate and read something the Government was apparently satisfied because being in a majority they could command a number of votes to pass it. They are satisfied to come and read a few words written by their officials or printed for them. Some cannot read either; they come to the House and read some muck and get their Votes passed.

A few weeks ago we read in the papers that the Federal Party had organized certain units in the Central Province. This Emergency was declared in the first instance to counter the moves of the Federal Party. Is this Emergency being continued for that purpose? Why do you not answer these questions? The Hon. Minister is very clever in not talking too much like his predecessor, but it is his duty to tell the House and the country whether the continuance of the Emergency is to curb the Federal Party, or whether it is to curb trade unions which might rise up against the Government any day even though you have given up your intention to cut the rice ration.

Your taxes are weighing heavily on the people and they are feeling the burden of unemployment. There is a shortage of everything. You are inserting press notifications to lull the people saying that you are going to get money from so and so. You are not getting any money from anybody. Nobody trusts you. Not a single country trusts you and not a single section of society trusts you. The

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පරිපූරක මුදල්

[වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. ඩී. ද සිල්වා]

peasants do not trust you, the Sinhalese do not trust you, the Tamils do not trust you, the Buddhists do not trust you, the Christians do not trust you, the Americans do not trust you and the Russians do not trust you. Nobody trusts you.

You are putting out press notifications to mislead the people and you have frightened the Lake House press and the Times press into publishing banner headlines in the way you want. You are perpetrating the biggest fraud, you have not the courage to say why you want this money. You say it is for trucks and transport, etc. Is that an answer. You say you are speaking for the Hon. Prime Minister ; I say that you are disgracing her in the House.

Long before these things occurred we told these people that there was a crisis. In 1961 I told you that there was a crisis. You lulled the public and said that it was only a temporary imbalance. Last year what did you say ? When the workers would have risen against a pay cut you said there was to be no pay cut but only a National Development Tax.

Tell us the reason why you are having the Emergency and why you want more and more monies for the army. Is it because you are frightened of the consequences of the taxes imposed on every section of the people ! You say that you speak for the peasants. It may be that their life is a bed of roses. I will speak of the workers whom I know : they are unable to bear these taxes. The people will rise against these taxes and then this army is going to be used against them. Is that an answer by a responsible Government which has prolonged the Emergency for such a long time ? Where are the workers ? Can they bear the burden you have put on them ? Where is the middle class ? You have imposed heavy taxes and you have killed them. Your Government is trying to destroy every intellectual section in this country ; you are driving them out of this country. You have even frightened capital ; you have frightened them to such an extent that you say they have hidden their moneys. I am sorry to say that you now cannot see the stage into which you are moving. You think with your majority you can put everything before the House and get them passed. You think this is a joke. But do you know where you are going ?

We would like to know what your policy is. Where are you going, and what are you going to achieve ? Tell us ! What is the purpose of this army Vote ? It is necessary to know these things because we want to find out where you are going. On the last occasion when I told you that you were going to cut the rice ration you all stood up and shouted me down. But in 1962 you have the courage to come before us and announce that you are cutting the rice ration.

You are too small to rule this country. There are bigger people above your heads who can take power from your hands and crumple you, crush you like little ants. You are only pigmies——

කථානායකතුමා
(சபாநாயகர்)
(Mr. Speaker)

Order, please !

වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. ඩී. ද සිල්වා
(டொக்டர் டப்ளியு. டீ. டி சில்வா)
(Dr. W. D. de Silva)

I am using metaphorical language. You are pigmies !

එන්. එච්. ඒ. එම්. කරුණාරත්න මයා.
(திரு. என். எச். ஏ. எம். கருணாரத்ன)
(Mr. N. H. A. M. Karunaratne)

It is not easy to crush pigmies.

වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. ඩී. ද සිල්වා
(டொக்டர் டப்ளியு. டீ. டி சில்வா)
(Dr. W. D. de Silva)

I wish you were in the Front Bench. At least you can——

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)

Blackguard the U. N. P.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. ඩී. ද සිල්වා
(டொக்டர் டப்ளியு. டீ. டி சில்வா)
(Dr. W. D. de Silva)

I would, therefore, ask the Hon. Minister of Finance, the Minister who is responsible to this House on the question of the army: What control do you have over the army?—[*Interruption.*] He says the Hon. Prime Minister has control over the army. I hope she has. After all she is the Prime Minister of this country, and we have a democratically elected Government, and I hope the elected representatives of the country will have that power of ruling the country and of putting their views before the people in due course when Parliamentary elections are held in a democratic manner. But do you honestly believe that Mrs. Bandaranaike, Prime Minister, has full control over the army? Do you honestly believe that the Hon. Minister of Finance, the Minister responsible to the House about the army, has any control over the army? That position, I think, does not prevail.

Why are you asking for more and more money for the army, a monster over whom you do not have any control. You are creating a monster day by day and making it bigger and bigger. It will not become small suddenly—does the army become small suddenly? That is what you promised last year. But you said there was a state of public unrest and you must continue the Emergency. You continued and extended the period of Emergency month by month. Now you have no control over the Emergency itself. The Emergency has control over the Government. You cannot release yourself from its clutches. And the army is growing wider and wider. Maybe a section of it is out, but that does not mean anything when other sections are in.

May I say this? The army has been used for very bad purposes in the past, not only by this Government but by other Governments as well. This army has been used against the organized workers in their demand for their legitimate rights and in their legitimate struggles. Maybe there was disagreement. My good Friend the hon. Member for Mahara had disagreed on this point. The army has been used to disrupt the organized workers and you are asking for more money. There was a coup and you are going into a second one. The Hon. Minister is laughing.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

I did not laugh at all.

වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. ඩී. ද සිල්වා
(டொக்டர் டப்ளியு. டீ. டி சில்வா)
(Dr. W. D. de Silva)

I am glad at least you see some sense even at this hour. I remember you were warned of these things, but you took no notice of it. We can see what you are doing in this House.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

I am listening to you.

වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. ඩී. ද සිල්වා
(டொக்டர் டப்ளியு. டீ. டி சில்வா)
(Dr. W. D. de Silva)

No. You are reading chits that are sent from that Box there. You do not know what is happening. You are a very pitiable Finance Minister. You have no control over your departments. There is the army. And you are speaking in the name of the Prime Minister, and do we trust what you say? I do not. I am not saying this on a personal note. I am telling you, you cannot humanly control all those departments, irrigation, agriculture, and other departments under your Ministries. You are Leader of the House and now you are Parliamentary Secretary.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

I am not.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. ඩී. ද සිල්වා
*(டொக்டர் டப்ளியு. டீ. டி சில்வா)*
(Dr. W. D. de Silva)

Then with what authority are you speaking. You are not the voice of the Hon. the Prime Minister. We are not going to read what is in the newspapers and accept that. The Prime Minister can give a statement to the press. We will not take any notice of that. We are not interested. But we must take notice of what you say.

I know the position is intolerable. You do not have control either as Parliamentary Secretary or Deputy Prime Minister or Leader of the House. You have a multitude of departments now under your control. That is the position as it stands today, and you are asking for this Rs. 3,500,000.

In this country people do not believe that certain things can happen. People did not believe that invaders can come and bomb this country. They did not believe that Prime Ministers can be assassinated in this country. These things do happen. What is happening in Ghana? We know with what enthusiasm Nkrumah was elected. See the position today. It has advanced by stages. He was elected perpetual president. Now he asks to be king. It is not only in Ghana that that has happened. See what is happening in Southern Rhodesia and Nigeria. There are emergencies and perpetual troubles there.

The same troubles are brewing in this country. The Government thinks it is very clever. It has imposed new types of taxes. It has removed the cut in the rice ration, but people know what it is going to do. We do not believe that the Government will get any loans. You are quite satisfied sitting there. I think certain people have ulterior motives. By December you will realize the implications of these taxes. I am not predicting anything, but there may be a public uprising against oppressive taxation. I ask whether you are going to use the Emergency to suppress it. Are you asking for the money under this Supplementary Estimate for the purpose of using the army against the people if they do rise against these taxes? It is the duty of the Government to answer these questions.

The same position prevailed in Ghana. The same type of arguments were going on there too. Today the demand in Ghana is for a single party government. I know that certain people entertained the same idea of forming a single party government in Ceylon. I will not mention names. In Ghana they now want to elect kings. They want to elect kings and perpetual presidents. I hope certain people here are not having the same ideas.

Take Britain. They are a nation whom you follow very closely in regard to parliamentary democracy and in other respects. During the war there was an emergency and public unrest in Britain. A wartime Prime Minister was thrown out. There was a public upheaval in Britain at that time, but they removed the emergency because it was a burden on the public purse.

You are mortgaging this country to foreign vested interests by asking foreign capital to come into the country. In all your Budget proposals you have invited foreign capital In Asia the tendency has been to get rid of all that is imperialistic, but your Government has invited foreign capital to come here. You have increased taxes day by day and you have expanded the army.—[*Interruption.*]

You are laughing. You may not laugh very long.

ගරු සී. පී. ද සිල්වා
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

He is also laughing.

වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. ඩී. ද සිල්වා
*(டொக்டர் டப்ளியு. டீ. டி சில்வா)*
(Dr. W. D. de Silva)

I am laughing at you.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු සී. පී. ද සිල්වා
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

I am laughing at you.

වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. ඩී. ද සිල්වා
*(டொக்டர் டப்ளியு. டீ. டி சில்வா)*
(Dr. W. D. de Silva)

But I laughed first.

I do not want to cover any more ground, but I think the Government should take notice of these small details. There were small details last year and a few details the previous year. There were a few details during election time. I remember certain people had details about the schools issue also. Let us not mention names. Now you have come to a small detail of Rs. 3½ million. It is a minor matter of course, but what is the progress of your chart ? What is your graph ? Your graph is a larger and larger army and lower and lower public utility services. That is your graph, and more and more foreign capital flowing in and promised loans. You are the new Minister of Finance. There was the older one. Let us not speak of him. He also had a tune. Now you are playing another tune. You are saying you are going to balance all these things by getting bogus loans from so and so.

ගරු සී. පී. ද සිල්වා
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

I have been very silent. I never said anything.

වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. ඩී. ද සිල්වා
*(டொக்டர் டப்ளியு. டீ. டி சில்வா)*
(Dr. W. D. de Silva)

That is your trouble. Then you must be giving silent interviews to the press. How do these get into the press ? Why do you not contradict them ? I saw banner headlines that you are getting Rs. 100 million from some country. Why are you shaking your head ? Why do you not stand up and say, yes or no.



කථානායකතුමා
*(சபாநாயகர்)*
(Mr. Speaker)

You cannot question him like that.

ගරු සී. පී. ද සිල්වා
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

He should sit down.

වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. ඩී. ද සිල්වා
*(டொக்டர் டப்ளியு. டீ. டி சில்வா)*
(Dr. W. D. de Silva)

The Hon. Minister said he did not say that and this.

කථානායකතුමා
*(சபாநாயகர்)*
(Mr. Speaker)

He will reply.

වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. ඩී. ද සිල්වා
*(டொக்டர் டப்ளியு. டீ. டி சில்வா)*
(Dr. W. D. de Silva)

Then why did he reply while I was speaking ? I am now discussing the army Vote. I think every sensible man in this country must protest in view of the fact that the Prime Minister goes round the country asking the people to sacrifice. The Government is asking the people to sacrifice day in and day out. Whatever the purpose, why are you voting all these moneys for the Army ? That question must be simply answered by the Hon. Minister and I hope he will give us a satisfactory answer at the end of the Debate.

පූ. භා. 3.32

හමීඩ් මයා.
*(ஜனாப் ஹமீத்)*
(Mr. Hameed)

I should like to have one or two points clarified. This Government has been in power for 26 months. Out of this, there has been an Emergency for 18 months. This Government could be correctly described as an Emergency Government with an Emergency Cabinet living on Emergency Regulations. I think that is the best way in which we could describe this Government. I said that out of 26 months for 18 months there has been an Emergency.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[හමීඩ් මයා.]

We are all freedom-loving people. There is an important aspect to this whole story. While questioning the Government as to what justification there is for the continuation of the Emergency we should bear in mind a serious danger that lies ahead. You will find that today the people in this country have actually forgotten that there is an Emergency on. What I want to drive home to you is this, that the people of this country are being "doped" with the Emergency. That is the truth. Nobody could deny it, that the people in this country have today actually forgotten that there is an Emergency. This is a very dangerous thing. When the people of the country feel that the Emergency is nothing but just an ordinary event then that gives room for a dictatorship.

So, we charge this Government with "doping" the people with the Emergency and thereby preparing the people for a dictatorship. That is exactly what has happened.

I am sure that the Hon. the Leader of the House will bear me out when I say that he himself perhaps has very often forgotten that there is an Emergency on. That is not good for anyone in this country. Psychologically you are working up the people to a dictatorship and if dictatorship should come I do not think anybody would be surprised. Why? Because by the continuation of the Emergency you are training the people to that way of thinking. Therefore, before we vote this money we should like to have from the Government a definite statement as to how long they propose to continue this Emergency and for what reason they want to continue it and what the causes are that justify its continuation today? You may well argue and say that due to certain occurrences it became imperative to continue the Emergency but today the country is quite peaceful. So how do you justify its continuation? I should like to tell this Government that they must learn to cut the banian according to the cloth. You have come here for another Rs. 3½ million and this surprises me because there are 75 *sinha pataws*. Of whom are you frightened? Of what are you frightened?

විජයබාහු විජයසිංහ මයා.
(திரு. விஜயபாஹு விஜயசிங்ஹ)
(Mr. Wijayabahu Wijayasinha)

Sir, this unnecessary phraseology is taking a lot of time.

හමීඩ් මයා.
(ஜனாப் ஹமீத்)
(Mr. Hameed)

It is necessary to make this quite clear to you.

විජයබාහු විජයසිංහ මයා.
(திரு. விஜயபாஹு விஜயசிங்ஹ)
(Mr. Wijayabahu Wijayasinha)

We are used to it so much; we know you study a lot of poetry before you come here.

හමීඩ් මයා.
(ஜனாப் ஹமீத்)
(Mr. Hameed)

I did not know that you take my normal prose as poetry. Thank you for the compliment.

Seventy-five *sinha pataus*—bold and brave they came! And today you come before this House and ask for money. What is the exact financial position? You have borrowed, you have begged, you have stolen. You have done all three. You have borrowed from every source possible; you have gone begging to many a country for loans; and you have stolen the day to day needs of the people.

Can you, who came on the promise of championing the causes of the ordinary man, of furthering all that is noble in the aspirations of the ordinary man, frankly and openly, true to your conscience, say whether it is fair for you to spend millions of rupees this way, when in the ordinary hospitals today on a bottle of mixture that you give you spend only three cents when patients are dying in the hospitals without drugs? Why go that far? You, who shed crocodile tears for the ordinary man are prepared to spend roughly Rs. 6½ million to maintain an army, and to reduce

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

the *pin padi,* the public assistance, you give to people who live on the verge of starvation—could we, true to our conscience, agree to this proposal? Are we fair by the people of this country to allow you to go on maintaining an army?

You speak of your Pioneer Corps. I should like to ask you: why do you not release the Pioneer Corps? You say that this money became essential because of the Pioneer Corps. Well, today there is no trouble in the country and why do you retain the Pioneer Corps?

**ඒ. එල්. අබ්දුල් මජීඩ් මයා. (මුතූර් දෙවන මන්ත්‍රී)**

*(ஜனாப் ஏ. எல். அப்துல் மஜீது—மூதூர் இரண்டாவது அங்கத்தவர்)*

(Mr. A. L. Abdul Majeed—Second Mutur)

They are cutting sugar cane in Kantalai.

**හමීඩ් මයා.**

*(ஜனாப் ஹமீத்)*

(Mr. Hameed)

They are not cutting sugar cane in Kantalai. I will come to it. A few months back in this House the Army (Amendment) Act was passed. In presenting it the then Finance Minister spoke to us in beautiful language, outlining the type of work the army in this country would do in the future. What did he say? He said that the army will be used to cut roads, to build bridges, to build schools, to irrigate paddy fields, and he went one step further and said to make aerial surveys. Those are the things.

**අබ්දුල් මජීඩ් මයා.**

*(ஜனாப் அப்துல் மஜீது)*

(Mr. Abdul Majeed)

They are cutting sugar cane.

**හමීඩ් මයා.**

*(ஜனாப் ஹமீத்)*

(Mr. Hameed)

If you say that they are cutting sugar cane you must be caned.

You come from a poverty stricken area where the people's public assistance is being cut. I ask you, are you going to vote for this Supplementary Estimate? You know the ferry could not move because the river was flooded due to the amount of tears you shed for the ordinary man during the Mutur by-election. You cannot go on hoodwinking the people. You have been warned of the danger of maintaining the army, building up the army and giving the Army more and more power. Do not forget that it will be like fire in the hands of the Chinese bobo. Therefore we cannot, if we are fair by our conscience, give you this money.

Can you cite another Government in the history of the world that ruled for 26 months of which 20 months were under Emergency laws? I know that the S. L. F. P. has a large number of records—records for bribery, for corruption, for inefficiency. I would add one more item to this—it is another feather in your cap; you will go down to history as the Government which was voted into power with so much warmth but which had to rule by means of Emergency laws for 20 out of 26 months.—[ *Interruption* ].

They are cowards who dare not be in the right with two or three, my Friend from Mutur.

**කථානායකතුමා**

*(சபாநாயகர்)*

(Mr. Speaker)

Leave all these things aside.

**හමීඩ් මයා.**

*(ஜனாப் ஹமீத்)*

(Mr. Hameed)

I am not digressing. I am strictly confining myself to this Supplementary Estimate.—[ *Interruption* ].

The hon. Member for Mirigama is not properly clad.

**ඩබ්ලිව්. දහනායක මයා.**

*(திரு. டப்ளியு. தகனாயக்க)*

(Mr. W. Dahanayake)

Is it the latest fashion that he has adopted? The tie looks like a noose round his neck. Is it the noose round the neck of the Government?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු සී. පී. ද සිල්වා
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

He has got everything the hon. Second Member for Akurana has but only on a larger scale.

හමීඩ් මයා.
*(ஜனாப் ஹமீத்)*
(Mr. Hameed)

I thank you for the complement. But I am not fattened like him.

You will, have to tell the country and this House whether you have any concrete argument——

ඉඹුලාන මයා.
*(திரு. இம்புலான)*
(Mr. Imbulana)

Mr. Speaker, there is no Quorum.

මන්ත්‍රී මණ්ඩලය ගණන් කොට, ගණපූරණයක් නොමැතිවූයෙන්, බෙදුම් සීනු ශබ්ද කිරීමට නියෝග කරන ලදී.

පසුව ගණපූරණයක් තුබූයෙන්—

හමීඩ් මයා.
*(ஜனாப் ஹமீத்)*
(Mr. Hameed)

We should like to know from the *sinha pataws* whether they want the army because the people in this country are fast collecting rotten eggs, rotten tomatoes and *kalu gal* to welcome them. We would like to know whether you have any argument to support your continuance of the Emergency. Do you want the army bscause of the "battle of the blues", and do you want to continue the state of Emergency because of this battle ? I am very hapy to know that there are hon. Members here who agree that they want the Emergency to continue——

විජයබාහු විජයසිංහ මයා.
*(திரு. விஜயபாஹு விஜயசிங்ஹ)*
(Mr. Wijayabahu Wijayasinha)

No !

හමීඩ් මයා.
*(ஜனாப் ஹமீத்)*
(Mr. Hameed)

——because of the "battle of the blues", the battle between the Royalist and the Thomian.

ඩබ්ලිව්. දහනායක මයා.
*(திரு. டப்ளியு. தகநாயக்க)*
(Mr. W. Dahanayake)

C. P. de Silva and Felix Dias.

කථානායකතුමා
*(சபாநாயகர்)*
(Mr. Speaker)

Order, please !

හමීඩ් මයා.
*(ஜனாப் ஹமீத்)*
(Mr. Hameed)

I am not digressing in any way, with all respect to you. I am trying to analyse the possible causes for the continuation of the Emergency. I am not trying to be aggressive—[*Interruption.*]

කථානායකතුමා
*(சபாநாயகர்)*
(Mr. Speaker)

Will you please address the Chair ?

හමීඩ් මයා.
*(ஜனாப் ஹமீத்)*
(Mr. Hameed)

I like a little bit of disturbance so that these hon. Members may get over their sleepiness literally and metaphorically. So we would like to know whether this Government will give the country and also this House any valuable or sensible explanation. We should like to know whether this Government proposes to end the Emergency. If not, we would like to know why. We have a right to know that.

The people in this country are burdened with taxes——

කථානායකතුමා
*(சபாநாயகர்)*
(Mr. Speaker)

You have made mention of that. This is the third time you are going to speak on that subject.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**හමීඩ් මයා.**
*(ஜனாப் ஹமீத்)*
(Mr. Hameed)

No, Sir, I am coming to a new point. You cannot keep an army, spending Rs. 63½ million per year.

ගරු කථානායකතුමනි, අවසාන වශයෙන් මෙන්න මේ කාරණය කියන්න මම කැමතියි. බලයට පත්වෙලා බලයෙන් මත්වෙලා ඉන්න මේ ආණ්ඩුවට රුපියල් කෝටි ගණන් වියදම් කරලා යුද්ධ හමුදාවක් තියා ගන්න ඉඩ දීමට අද මේ රටේ මහජනයා සූදානම් නැති බව ප්‍රකාශ කිරීම අපේ යුතුකමක් වී තිබෙනවා. කොයි තරම් කිව්වත් ඔය ප්‍රතිගාමී බල වේගය කියන මන්ත්‍රවලින් මහජන ප්‍රශ්න විසඳන්න බැහැ. මහජනයාගේ බඩට තට්ටු කර යුද හමුදාවක් මගින් බලය තියා ගන්ට මහජනයාගේ කැමැත්ත ලබාගෙන මේ ආණ්ඩුව පත් වුණාද කියන ප්‍රශ්නය මම තමුන්නාන්සේගෙන් අහන්න කැමතියි. නිල්පාට රෙදිත් ඇද්දා. දැන් කාර්යාලවලට නිල්පාට ටෙලිපෝන් කම්බිත් අදිමින්——

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)

කරුණාකර මේ වැය ශීර්ෂයට ආදාළව කථා කරන්න. ඔය කාරණය මේ වැය ශීර්ෂයට අදාළද ?

**හමීඩ් මයා.**
*(ஜனாப் ஹமீத்)*
(Mr. Hameed)

මේ කාරණයට මා කියන දේ අදාළ වෙනවා සර්. You do not allow me to complete my sentence. You must really wait till I have finished. Then you can say whether I am right or wrong. I had only gone half way with my sentense. දන්නවාද නිල්පාට නරියට මොකද වුණේ කියල ? අහල තියෙනවද ඒ කථාව ? එවැනි දේවල් කරල මහජනතාව රවටන්ටත් බැහැ.

**විජයබාහු විජයසිංහ මයා.**
*(திரு. விஜயபாஹு விஜயசிங்ஹ)*
(Mr. Wijayabahu Wijayasinha)

ඒ කාලෙ ගියා.

**හමීඩ් මයා.**
*(ஜனாப் ஹமீத்)*
(Mr. Hameed)

ඒක තමුන්නාන්සෙලා පිළිගන්න ඕනෑ. මහජනයා වෙනුවෙන් කිඹුල් කඳුළු කොච්චර හෙළුවත් මහජනයාගේ දියුණුව උදෙසා සටන් කරන්ට පොරොන්දු වූ තමුන්නාන්සේලා, දුප්පතාගෙ දුක දන්නවාය කියා කෑ ගහපු තමුන්නාන්සෙලා, අද සූදානම් වෙන්නෙ යුද්ධ හමුදාවක් මගින් මහජනයාට පහර ගහන්ටද ? ඒ නිසා මම කියන්න කැමතියි, ආත්ම ගෞරවයක් තියෙන ආණ්ඩුවක් නම් මේ ආණ්ඩුව වහාම අස්විය යුතුයි කියල.

**විජයබාහු විජයසිංහ මයා.**
*(திரு. விஜயபாஹு விஜயசிங்ஹ)*
(Mr. Wijayabahu Wijayasinha)

ඒක වෙන්නෙ 1965 දී.

**හමීඩ් මයා.**
*(ஜனாப் ஹமீத்)*
(Mr. Hameed)

I do not want to continue any more, but may I end my speech by saying:

Rouse up, Sirs ! Give your
brains a racking
To find a remedy we are lacking.
Or as sure as fate we will send
you packing,
Give you a fine sacking,
And send you to the masses who
are smacking
To give you a right royal licking.

පූ. භා. 3.59

**ඩබ්ලිව්. දහනායක මයා.**
*(திரு. டப்ளியு. தகநாயக்க)*
(Mr. W. Dahanayake)

ගරු කථානායකතුමනි, මේ වැය ශීර්ෂයෙන් ඉල්ලා සිටින්නෙ පසුගිය දොළොස් මාසය තුළ හදිසි නීතිය යටතේ කටයුතු කිරීම වෙනුවෙන් යුද්ධ හමුදාවට ගිය වියහියදම් සඳහා රුපියල් ලක්ෂ 35 ක් දෙන ලෙසයි. යුද්ධ හමුදාව පිළිබඳ වැය ශීර්ෂය පරීක්ෂා කර බැලුවොත් මුලින්ම අපට පෙනී යන්නෙ 1961-62 අයවැය ලේඛනයෙන් පසුගිය දොළොස් මාසයටම රුපියල් ලක්ෂ 338 ක් වෙන් කර තිබුණු බවයි. ඒ රුපියල් ලක්ෂ 338 ට මේ ලක්ෂ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩබ්ලිව්. දහනායක මයා.]

35 ක් එකතු කළාම 1961-62 ආදායම් වර්ෂයට අයිති දොළොස් මාසය තුළ යුද්ධ හමුදාව පවත්වාගෙන යාම සඳහා රුපියල් ලක්ෂ 373 ක් වියදම් ගොස් තිබෙන බව පෙනෙනවා. ඉදිරියට තිබෙන දොළොස් මාසය සඳහා යුද්ධ හමුදාවට රුපියල් ලක්ෂ 363 ක් දැන් සතියකට පෙර වෙන් කළා. එතකොට දැනට එස්ටි මේට් කර තිබෙන පිළිවෙලට පසුගිය දොළොස් මාසයට ඉදිරියට තිබෙන දොළොස් මාසයට වඩා රුපියල් දස ලක්ෂයක් වැය කරන්ට සිදු වී තිබෙනවා. ඒ දැනට තිබෙන ඇස්තමේන්තුව අනුවයි. නමුත් මේ හදිසි නීති ඉදිරියටත් තිබෙන නිසා ගිය සතියේ සභාසම්මත කළ වැය ශීර්ෂය තවත් වැඩිවන එක ගැන කිසිම සැකයක් නැහැ. පසුගිය අවුරුද්දෙ වැය ශීෂීය වැඩිවුණා. ඉදිරියටත් ඒ ක්‍රමයටම වැඩිවෙන්න ඕනෑ. එම නිසා මේ වැය ශීෂීය රුපියල් ලක්ෂ 35 ක් ඉල්ලන වැය ශීර්ෂයක් හැටියට මා සලකන්නේ නැහැ. මේ වැය ශීර්ෂයෙන් ඊටත් වැඩි මුදලක් ඉල්ලීමේ ලකුණු තිබෙනවා, ප්‍රතිඥා තිබෙනවා. දැන් තිබෙන ඇස්තමේන්තුව අනුව ඉදිරියට වුවමනා වන ප්‍රමාණය තවත් ලක්ෂ 35 කින් වැඩි වන්න පුළුවන්. ඊටත් වැඩි මුදලක් වෙන්නත් පුළුවනි. මෙවැනි මුදලක් වැය කරන්ට අපට ශක්තියක් තිබෙනවාද කියා අපි මුලින්ම පරීක්ෂා කර බලන්න ඕනෑ. අපි දන්නවා අද තිබෙන මුදල් තත්ත්වය අනුව මේ ආණ්ඩුව පුළුවන් තරම් වියදම් අඩු කරගෙන යනවා. ඒ ප්‍රතිපත්තිය හරි ප්‍රතිපත්තියක් හැටියට පිළිගන්න ඕනෑ. හැබැයි අවශ්‍ය කටයුතුවලට මුදල් අඩු කරන එක වැරදියි. මුදල් අපතේ යනවා නම් පුළුවන් තරම් ඒ මුදල් කපා හරින්න ඕනෑ. යම්කිසි විධියකින් මේ ආණ්ඩුව ප්‍රතිපත්තියක් වශයෙන් අපතේ යන මුදල් කපා හරිනවා නම් ඒ ගැන අප සියලු දෙනාම සන්තෝෂ වෙනවා. නමුත් දැන් අපට පෙනෙන හැටියට මුදල් නොකැපිය යුතු තැන්වලිනුත් මුදල් කපා ගෙන යනවා. නිදර්ශණයක් වශයෙන් පෙන්වා දෙන්න පුළුවන් කාස රෝග ලෙඩුන්ට දෙන ආධාර මුදල් කපා ගෙන යෑම. එම ආධාර මුදල් දැනටමත් කපා තිබෙනවා. එමෙන්ම පාසැල් සිසුන්ට දෙන දහවල් ආහාරය සඳහා දෙන මුදලත් කපා තිබෙනවා. පාසැල් ගොඩනැගිලිවලට දෙන මුදල කපා හැර තිබෙනවා. ගම්බද ජනයාගේ වැඩ කටයුතුවලට ගම්කාර්ය සභාවලට දෙන මුදල කපා හැර තිබෙනවා. රෙදි වියන මධ්‍යස්ථානවලට දෙන මුදල කපා හැර තිබෙනවා. මේ සියලු දේම කපා තිබෙන අවස්ථාවේදී, ඉතාමත්ම අවශ්‍ය, මහජනයා ඉල්ලන, මහජනයාට වුවමනා කරන, මහජන සුභසිද්ධියට අවශ්‍ය, කට යුතු කපා හරින අවස්ථාවේදී, යුද්ධ හමුදාවට මුදල් වැඩි කිරීම ප්‍රතිපත්තියක් වශයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට, මහජනයාට, පිළිගන්ට පුළුවන්ද කියා අපි කල්පනා කර බලමු.

ගරු කථානායකතුමනි, යුද්ධ හමුදාවක් මේ රටට අවශ්‍ය නැත කියා අපේ සමහර අය තුළ අදහසක් තිබෙනවා. යුද්ධ හමුදාවක් හෝ නාවුක හමුදාවක් හෝ අහස් හමුදාවක් හෝ මේ රටට අවශ්‍ය නැත කියා ඔවුන් කල්පනා කරනවා. එම තර්කය මේ අවස්ථාවේදී කල්පනා කරන්ට වුවමනා වැදගත් තර්කයක්. මෙවැනි බෞද්ධ රටකට, බෞද්ධ ප්‍රතිපත්ති පිළිගන්න, බෞද්ධ ශිෂ්ටාචාරයක් තිබෙන, අවුරුදු දෙදහසක දීප්තිමත් බෞද්ධ ඉතිහාසයක් තිබෙන, බෞද්ධ ජීවිත ගත කරන වැසියන් සිටින, මුළු ලෝකයටම බුද්ධාගම අනුව ආලෝකයක් හැටියට තිබෙන මේ රටට, යුද්ධ හමුදාවක් අවශ්‍යද කියන ප්‍රශ්නය ඉතා වැදගත් ප්‍රශ්නයක්. ප්‍රතිපත්තියක් වශයෙන් මේ ආණ්ඩුව යුද්ධ හමුදාව, අහස් හමුදාව හා නාවුක හමුදාව විසුරුවා හැරියොත්, අවිහිංසා ධර්මයේ ප්‍රතිපත්ති පිළිපදින රටක් හැටියට මුළු ලෝකයාම අපට ප්‍රශංසා කරාවි. ගරු කථානායකතුමනි, 1947 හෝ 1948 වර්ෂයේදී, යුද්ධ හමුදාවක් මුලින්ම ආරම්භ කරන අවස්ථාවේදී, මෙම තර්කය එවකට තිබුණු රාජ්‍ය මන්ත්‍රණ සභාවට මම ඉදිරි කළා මට මතකයි. අපේ රටට යුද්ධ හමුදාවක් මොනවාටද? අපි කා සමග යුද්ධ කරන්ටද? රුසියාව, ඇමෙරිකාව, එංගලන්තය, ජපානය, ඉන්දියාව හෝ චීනය සමග යුද්ධ කරන්ට අපට පුළුවන්ද? අපේ බෞද්ධ ප්‍රතිපත්ති අනුව යුද්ධ හමුදාවක් පිහිටුවන එක හරිද? ඒ අවස්ථාවේදී ගරු ඩී. එස්. සේනානායක අගමැතිතුමාත් එම තර්කයේ වැදගත්කම පිළිගත්තා. එය පිළිගෙන, යුද්ධ හමුදාවක් ඇති කරන්නෙ මොන කරුණක් නිසාද

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කියා විස්තර කරමින්, ලකුණක් හැටියට පමණක් අපි යුද්ධ හමුදාව පිහිටුවනවාය කියා තර්කයක් ඉදිරිපත් කළා. කිසිම අන් දමකින් පිළිගත්තෙ නැහැ, ස්ථිර යුද්ධ හමුදාවක් මේ රටට වුවමනාය කියා. සමහර විට ඉදිරියට එන ආණ්ඩුවක් විසින් යුද්ධ හමුදාව සම්පූර්ණයෙන් අස් කර දමන්ටත් ඉඩ තිබෙනව. ඊට පසු අපි මේ පාර්ලිමේන්තුවේ ඒ තර්කය විටින් විට ඉදිරිපත් නොකිරීමටත් එය හේතුවක් වෙනවා ඇති. පසුගිය එකම ආණ්ඩුවක්වත් මේ ආණ්ඩුවවත් මේ රටේ රැකීරක්ෂා ප්‍රශ්නය ගැන කිසිම උනන්දුවක් දැක්වූයේ නැහැ. සියලුම ආණ්ඩු එය අමතක කර දැම්ම. මේ ආණ්ඩුවටත් එක ප්‍රශ්නයක් අමතක වී තිබෙනව නම් ඒ රැකීරක්ෂා ප්‍රශ්නයයි. ඒ නිසා අපි සමහරක් කල්පනා කළා මෙප පණ රැකීරක්ෂා හිඟ රටක යුද්ධ හමුදාවක් තිබුණොත් පික දෙනෙකුටවත් රක්ෂාවල් ලැබෙයි, එම නිසා ඔය යුද්ධ හමුදාව නාවුක හමුදාව හා අහස් යාත්‍රා හමුදාව තිබුණාවේ කියා. රැකීරක්ෂා ප්‍රශ්නය සුළු වශයෙන්වත් විසඳීමට එය ප්‍රතිකර්මයක්. නමුත් යම්කිසි විධියකින් රටේ රැකීරක්ෂා ප්‍රශ්නය සම්පූර්ණයෙන් විසඳිය හැකි ශක්තියක් තිබෙන ආණ්ඩුවක් බලයට පත් වුණොත්, මා හිතනවා, පාර්ලිමේන්තුවේ වැඩි දෙනකු තමන්ගේ ඡන්දය පාවිච්චි කරාවිය කියා, ඒ හමුදා තුන අවලංගු කර දැමීමට. ඒ ගැන මට කිසිම සැකයක් නැහැ. ඒ හමුදාවල සේවය කරන සියලු දෙනාටම වෙන රක්ෂාවල් දෙන පිළිවෙළක් පෙන්නුවොත් මා හිතන්නෙ වැඩි දෙනකු හමුදා අවලංගු කරනවාට පක්ෂව ඡන්දය දෙයි කියායි. ඒ ප්‍රතිපත්තිය ගැන මට කිසිම සැකයක් නැහැ. එසේ නම් මේ අන්දමට යුද්ධ හමුදාව මේ රටේ ක්‍රම ක්‍රමයෙන් තර කිරීම ආණ්ඩුවට පිළිගැනීමට බැරි ප්‍රතිපත්තියක්. එසේ පිළිගැනීම වැරදි ප්‍රතිපත්තියක්.

ගරු කථානායකතුමනි, දැන් අපට කියා සිටිනව, යුද්ධ හමුදාවට රුපියල් ලක්ෂ තිස්පහමාරක් වැඩිපුර දෙන්ටය කියා පසුගිය සති දෙක තුන තුළ සම්මත කළ අයවැය ලේඛනය දෙස බැලුවත් අපට පෙනී යනව, මේ ඉල්ලන මුදලට වඩා අඩු මුදලක් සමහර දෙපාර්තමේන්තුවලට වැය කරන බව. 1962-63 වර්ෂයේදී ආයුර්වේද දෙපාර්තමේන්තුව සඳහා වැය කිරීමට සම්මත කර ගත් මුදල රුපියල් ලක්ෂ 23යි. ආයුර්වේද දෙපාර්තමේන්තුව සඳහා වැය කරන මුදල ඒ තරම් වන නමුත්, පරිපූරක ඇස්තමේන්තුවකින් යුද්ධ හමුදාව සඳහා රුපියල් ලක්ෂ 35ක් දැන් ඉල්ලනවා. අපේ වැඩ කටයුතුවල පිළිගන්නට පුළුවන් ප්‍රමාණයක්—sense of proportion—තිබිය යුතුයි. ආයුර්වේදයේ කටයුතු සඳහා වෙන් කෙළේ රුපියල් ලක්ෂ 23යි; නමුත් යුද්ධ හමුදාවේ හදිසි වැඩ කටයුතු සඳහා දැන් රුපියල් ලක්ෂ 35ක් ඉල්ලනවා. තවත් කාරණයක් බලමු. ඉදිරි 12 මාසය තුළ ලංකාවේ කාර්මික අධ්‍යාපනය සඳහා වැය කරන්නට යන්නේ රුපියල් ලක්ෂ 21යි. ඉතින් අර මා කී sense of proportion— එක කෝ? රටට ඉතාමත් අවශ්‍ය කාර්මික අධ්‍යාපනය සඳහා වියදම් කරන්ට යන්නේ රුපියල් ලක්ෂ 21 ක් පමණයි. විභාග දෙපාර්තමේන්තුව සඳහා ඉදිරි 12 මාසයේදී රුපියල් ලක්ෂ 35 ක් වැය කරන්නට නියම වී තිබෙනවා. නමුත් යුද්ධ හමුදවට වැඩිපුර රුපියල් ලක්ෂ 35ක් ඉල්ලනවා. එහෙම නම් මෙය මේ ආණ්ඩුවේ යුක්තිසහගත ක්‍රියාවක් හැටියට අපට පිළිගන්ට පුළුවන්ද?

තවත් පැත්තක් ගැන බලමු. අද රටේ සියලු දෙනාටම උහුලන්නට බැරි තරමට බදු බර පටවා තිබෙනවා. ආදායම් බදු ගෙවන අයට පමණක් බදු බර උහුලන්නට බැරිව සිටිනවා කියා තමුන්නාන්සේ හිතන්ට එපා. ආදායම් බදු ගෙවන අය දැන් බදු බරින් මිරිකී සමතලා වී ඉවරයි. ආදායම් බදු නොගෙවන අයටත් බදු බර තිබෙනවා. මේ ආණ්ඩුව සෑම බඩු වර්ගයකම වාගේ මිළ උස්සා තිබෙනවා. දැන් පිටින් ගෙන්වන බඩුවල පමණක් නොව මෙරට බඩුවලත් මිළ හොඳටම නැගලා. අපට නිදහස ලැබුණු අවුරුද්දේ සිට අද වන තුරු ගණන් බැලුවොත් ජීවන වියදම ඉතාමත් ඉහළ නැග තිබෙන්නේ මේ වර්ෂයේදී බව පෙනෙනවා ඇති. මස්, මාලු, කරවල, ආදියේ පමණක් නොව, ඒ වගේම ගොටුකොළ, මුකුණුවැන්න හා වෙනත් පළා වර්ග ඇතුළු එළවලු වර්ගවල පමණක්ද නොව, තුන පහ බඩුවලත් මිළ දැන් කවදාවත් නොතිබුණු විධියට ඉහළ නැගලා. මෙපමණ බදු බර තිබෙන කාලයක් මේ රටට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩබ්ලිව්. දහනායක මයා.]

කවදාවත් ලැබුවේ නැත කියා ප්‍රකාශ කරන්න පුළුවනි. මෙපමණ බදු බර මේ රටේ මහජනයා කොහොම උහුලනවාද කියන්න මා දන්නෙ නැහැ.

රටේ එවැනි තත්ත්වයක් තියෙන කොට තමුන්නාන්සේලා යුද්ධ හමුදාවට මෙ පමණ මුදල් වෙන් කරන එක හරිද? වෙන කිසිම අංශයකට වෙන් කර තිබෙනවාද මෙතරම් මුදලක් ?

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

අනුකම්පාවක් නැහැ.

**ඩබ්ලිව්. දහනායක මයා.**
*(திரு. டப்ளியு. தகனாயக்க)*
(Mr. W. Dahanayake)

කිසිම වැය ශීර්ෂයක් සඳහා මෙතරම් මුදලක් වෙන් කර නැහැ. මේ ආණ්ඩුව මෙතරම් මුදල් දෙන්නෙ යුද්ධ හමුදාවට පමණයි. මොකටද මෙතරම් මුදලක් යුද්ධ හමුදාවට දෙන්නෙ ?

ගරු කථානායකතුමනි, මෙම පාර්ලිමේන්තුව තර්කානුකූලව කතා පවත්වන ස්ථානයක්. නුවණට හුරු නැති, තර්කානුකූල නොවන, මෝඩ කථා පවත්වන සභාවක් නොවේය මේක. මෙතන අනන්මනන් දොඩවන්න සුදුසු ස්ථානයක් නොවෙයි. හොඳට කල්පනා කර, පිළිගන්න පුළුවන්, ස්ථිර තර්ක ඉදිරිපත් කරන ස්ථානයක් මේක. මෙම වැය ශීර්ෂය ඉදිරිපත් කරන කොට ආණ්ඩු පක්ෂයේ කවුරුවත් අපට කිව්වද, මෙන්න මේ කාරණය නිසා මෙතරම් මුදලක් මේ අංශයට වෙන් කර තිබෙනවාය කියා.

මොන කාරණයක් නිසාද හදිසි නීතිය පනවගෙන ඉන්නේ? අපට නොතේරෙන දෙයක් මේක. හදිසි නීතිය මොකටද? යාපනයේ සත්‍යග්‍රහ ව්‍යාපාරය තිබෙන කාලයේ හදිසි නීතිය තිබුණා. හදිසි නීතිය එවැනි අවස්ථාවක දැමීම හරිය කියා සමහර මන්ත්‍රීවරුන් කිව්වා. සමහර මන්ත්‍රීවරුන් කිව්වා වැරදිය කියල. දෙපැත්තටම වැදගත් තර්ක තිබුණා. සත්‍යග්‍රහ ව්‍යාපාරය යාපනයේ තිබෙන අවස්ථාවේදී මහජනයා ඉදිරියේ කියන්න පුළුවන්කම තිබුණා හදිසි නීතිය දමා තිබෙන්නෙ එම තත්ත්වය නිසාය කියා.



නමුත් ඒ ගැන එක කරුණක් කියන්න මා කැමතියි. යම්කිසි විධියකින් ඒ යාපනයේ ඇති වුණු අරගලය තමුන්නාන්සෙලාට මැඩ පවත්වා ගන්ට වුවමනා වුණා නම්, හදිසි නීතිය යාපනේ පැත්තට පමණක් දැම්මා නම් ඒකට කමක් නැහැ. කොළඹට, ගාල්ලට, තිස්සමහාරාමයට, බදුල්ලට හදිසි නීතිය දැම්මෙ මොනවටද? මොකක්ද මේකෙ තේරුම? ඒක නුවණට හුරු වැඩක් හැටියට කාටවත් පිළිගන්ට පුළුවන්ද? යාපනයේ කලබල තිබුනට මාතර මිනිස්සු වෙව්ව වෙව්ලා ඉන්න ඕනැද? කිසි තේරුමක් තියෙනවද ඒකෙ? යාපනයේ පටලැවිල්ලක් නැති වෙලා ගියා. දැන් තමුන්නාන්සෙලාට තියෙන්නෙ මොන පටලැවිල්ලද මම දන්නෙ නැහැ. ආණ්ඩුවේ හිතේ තියෙන බය නිසා යුධ හමුදාව තව තවත් ශක්තිමත් කර ගනිමින් මහජනයාට තර්ජනයක් හැටියට හදිසි නීතිය තබාගෙන ඉන්නවා. දැන් හදිසි නීතිය තබා ගැනීමට තිබෙන හේතුව කුමක්ද කියා තමුන්නාන්සෙලා අපට කිව්වෙ නැහැ. හදිසි නීතිය තබා ගැනීමට දැන් කිසිම හේතුවක් නැහැ. සමහර විට, දැන් කුමන්ත්‍රණ නඩුව තියෙනවාය කියා තමුන්නාන්සෙලා කියන්ට පුළුවනි. කුමන්ත්‍රණ නඩුව තියෙන නිසා මේ හදිසි නීතිය තියා ගන්නවාය කියා යම් කිසි විධියකින් තමුන්නාන්සේලා කිව්වොත් ඒ කියමන කුමන්ත්‍රණ උසාවියට කරන අවනම්බුවක් හැටියට සලකන්ට පුළුවනි. කුමන්ත්‍රණ නඩුවක් තිබෙනවා. නීත්‍යානුකූලව ඒ නඩුවෙ වැඩ කටයුතු කෙරී ගෙන යනවා. මොනවටද හදිසි නීති? කාව බය කරන්නද? කව්රුන්ව අල්ලන්නද? කිසිම අරගලයක් නැතිව කිසි කලබලයක් නැතිව සාන්ත දාන්ත පිළිවෙළට තිබෙන රටකට තමුන්නාන්සේලා හදිසි නීති ඉදිරිපත් කරන්නෙ මොකටද? කුමන්ත්‍රණ නඩුව තියෙන නිසා නොවෙයි. ඒ කුමන්ත්‍රණ නඩුව නීතිය රැක ගනීවි. මේ ශිෂ්ට ලෝකයේ තිබෙනවා, රූල් ඔෆ් ලෝ කියා ප්‍රතිපත්තියක්. ප්‍රජාතන්ත්‍රවාදය පිළිගන්නා රටවල නීති සම්ප්‍රදාය පිළිගන්නා ප්‍රතිපත්තියක් තියෙනවා. රූල් ඔෆ් ලෝ හෙවත් නීති සම්ප්‍රදාය ශ්‍රේෂ්ඨ ක්‍රියා මාර්ගයක් හැටියට ශිෂ්ට රටවල පිළිගන්නවා. නමුත් මේ රටේ මාස 17ක් තිස්සෙ ඒ රූල් ඔෆ් ලෝ නොහොත් නීති සම්ප්‍රදාය පිටුවහල් කරල තියෙනවා. ඉතාමත් වැදගත් දෙයක් හැටියටයි, ඒ නීති සම්ප්‍රදාය අපි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පරිපූරක මුදල්

පිළිගන්නෙ. අපේ සියලුම වැඩ කටයුතු ගෙන යන්න ඕනෑ ඒ අනුවයි. ඒක සෑම ආණ්ඩුවකම ප්‍රතිපත්තියක් හැටියට පිළි ගන්න ඕනෑ. නමුත් මේ ආණ්ඩුව 17 මාස යක් තිස්සෙ පිළිගෙන තිබෙන්නෙ මොන විධියේ සම්ප්‍රදායක්ද? රූල් ඔෆ් ලෝ වෙනුවට රූල් ඔෆ් ලෝලෙස්නස් හෙවත් නීති කැඩීමේ සම්ප්‍රදායයි මේ ආණ්ඩුව පිළි ගෙන තිබෙන්නෙ. ඒ නිසා තමයි, ආණ්ඩු පක්ෂයේ ඕනෑම මන්ත්‍රීවරයකුට අපි අභි යෝග කරන්නේ, ඉතාමත් සන්සුන් ලීලා වෙන් තිබෙන මේ රටට හදිසි නීතිය ඉදිරි පත් කරන්නේ කුමක් නිසාද කියා තෝරා දෙන්නය කියා. හදිසි නීතියක් තබාගෙන වැලිමඩ සහ මුත්තූර් යන ඡන්ද කොට්ඨාශ වල අතුරු මැතිවරණ කල් දමාපු එක හරිද? ඒක නීතිවිරෝධි වැඩක්. මෙයින් පෙනෙන්නෙ මොකක්ද? හදිසි නීතිය තිබෙන නිසා තමුන්නාන්සෙලාට පුළුවන් ඕනෑම දෙයක් කරන්න. ඕනෑම වංචනික, වැරදි, නීති විරෝධි, අශීලාචාර, ක්‍රිමිනල් දෙයක් කරන්න පුළුවන් හදිසි නීතිය තිබෙන නිසා. බෞද්ධ ආණ්ඩුවකැයි කියා ගන්න මෙම ආණ්ඩුව මේ විධියට ක්‍රියා කරන්නෙ චේතනාව හොඳ නැති නිසයි. සමහර අය කියනවා මහජනයාට තිබෙන භය නිසා, ඔවුන් කලබලයක් කරාවිය කියා හිතන නිසා, ආණ්ඩුව හදිසි නීතිය තබා ගෙන ඉන්නවාය කියා. ඒක ඇත්ත වෙන්න පුළුවන්. ඒක සාධාරණ කෝපයක්. අපට ආරංචියක් ලැබී තිබෙනවා ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ කොට්ඨාශවලට රුපියල් ලක්ෂ ගණනක් වියදම් කරන විට විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන්ගෙ කොට්ඨාශවලට රුපියල් 30,000ක වියදමක් පමණක් කළ යුතුයි කියා නියමයක් කර තිබෙනවාය කියා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)
බොරු, බොරු.

**ඩබ්ලිව්. දහනායක මයා.**
*(திரு. டப்ளியு. தகநாயக்க)*
(Mr. W. Dahanayake)
තමුන්නාන්සෙ බොරුයි කියා කීවාට අප පිළිගන්නෙ නැහැ. ඒ ප්‍රකාශය ඇමතිවර යෙක් කියන්න ඕනෑ. නැති නම් තමුන් නාන්සේ මගේ කථාව අවසන් වුණාට පසු

තර්කානුකූලව කරුණු ඉදිරිපත් කරන්න, හදිසි නීති තවම තබාගෙන ඉන්නේ මන්ද කියා. මේ හදිසි නීති තබාගෙන සිටීමෙන් කාටවත් හොඳක් වන්නේ නැහැ. මේ හදිසි නීති තබාගෙන සිටීමෙන් යුධ හමුදාව ටත් හොඳක් වන්නේ නැහැ. හදිසි නීති තබාගෙන සිටීමෙන් යුධ හමුදාවටත් මහත් හානියක් සිදු වෙනවා. යුධ හමුදාවේ තත්ත්වය පහළ බසිනවා. යුධ හමුදාවය කියන්නේ එක්තරා රාජකාරි කොටසක් කිරීම සඳහා සංවිධානය කරන ලද කොට සක්. යුධ හමුදාව නියම විධියට ක්‍රියා කරන්න ඕන ආයතනයක්. එවැනි යුධ හමුදාවක් තමාට කිසිම විධියකින් ගැළ පෙන්නේ නැති රාජකාරි කොටසක් කිරීම සඳහා 17 මාසයක් නොකඩවා යොදවනවා නම් ඒ යුධ හමුදාවේ සිටින පුද්ගල යින්ගේ සිත් සතන්, වැඩ පිළිවෙල, ඔවුන්ගේ ස්වරූපය වෙනස් වෙනවා නොවේදැයි මම අහනවා. යුධ හමුදාව සම්පූර්ණයෙන්ම දූෂණය වන්නේ නැද් දැයි මම අහනවා. තමුන්නාන්සේලා යුධ හමුදාව මෙවැනි දීර්ඝ කාලයකට යුධ හමුදා වට අයිති නැති වැඩ කිරීම සඳහා යෙදවීම නිසා යුධ හමුදාව දූෂණය වන බැවින් ඉදිරියට එන ආණ්ඩුවකට සිඹ වෙනවා, මේ යුධ හමුදාව සම්පූර්ණයෙන්ම අවලංගු කර දැමීමට. මන්ද? අද තිබෙන යුධ හමුදාව වැරදි අදහස් පිළිගත් යුධ හමුදාවක්. පසු ගිය ජනවාරි 27 වන ද ඇති වූ කුමන්ත්‍රණ යට හේතුව කුමක්දැයි තමුන්නාන්සේලා මොහොතක් කල්පනා කර බැලුවාද? ඊට නියම හේතුව වූයේ මේ හදිසි නීතියි. ඒ කුමන්ත්‍රණයේ උපත ඇති වූයේ මේ හදිසි නීතිවලයි. ඒ කුමන්ත්‍රණයට රුකුල් දුන්නේ මේ හදිසි නීති බව අපට ස්ථිර වශයෙන්ම කියන්න පුළුවනි. හදිසි නීතිය බොහොම භයානකයි. හදිසි අවස්ථාවක් ඇති වීම නිසා හදිසි නීතිය පාවිච්චි කළාට කවදාවත් අපි විරුඞත්වය ප්‍රකාශ කරන්නෙ නැහැ. හදිසි කියන වචනයේ තේරුම තමුන්නාන්සෙලා දන්නවද? ඒ ගැන තමුන්නාන්සෙලා කල්පනා කළාද? හදිසිය කියන්නෙ සදාකාලිකත්වයටද? හැම තිස්සෙම තියෙන දෙයකටද හදිසිය කියන්නෙ? හදිසිය කියන්නෙ ස්වභාව ධර්මයටද? නොකඩවා ගෙන යන දෙය කටද හදිසිය කියන්නෙ? එක්තරා අවස්ථා වකට ගැළපෙන පරිදි, එක්තරා විධියක

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩබ්ලිව්. දහනායක මයා.]

අධිෂ්ඨානයක් අනුව පමණක් හදිසි නීතිය පාවිච්චි කිරීම නොවෙයිද හරි? 1961 අප්‍රේල් මාසයේ සිට අද වනතුරු නොකඩවා තමුන්නාන්සෙලා මේ හදිසි නීතිය පවත්වාගෙන යන්නෙ ඇයි කියන ප්‍රශ්න යයි මා දැන් මතු කරන්නෙ. එදා සිට අද වනතුරු යුද්ධ හමුදාවට තමුන්නාන්සෙලා වැරදි අදහස් දුන්නා. තමුන්නාන්සෙලා කළ වැරදිවලින්, කරගෙනයන වැරදිවලින්, මේ ආණ්ඩුවට විරුද්ධව ඉදිරිපත් කළ හැකි චෝදනා අතර ඉතාමත්ම බරපතළ චෝදනාව හැටියට මා සඳහන් කරන්නෙ දහ හත් මාසයක් තිස්සෙ නොකඩවා හදිසි නීතිය අනුව රට පාලනය කිරීමයි. ඒක එක් පැමිණිල්ලක් බව තමුන්නාන්සෙලා තමුන්නාන්සෙලාගේ හිත්වල තබා ගන්න. මේ ගැන තමුන්නාන්සෙලා ලජ්ජා වෙන්න ඕනෑ.

**කේ. අබ්දුල් ජබාර් මයා.**
*(ஜனாப் கே. அப்துல் ஜபார்)*
(Mr. K. Abdul Jabbar)
ඇයි?

**ඩබ්ලිව්. දහනායක මයා.**
*(திரு. டப்ளியு. தகநாயக்க)*
(Mr. W. Dahanayake)

ඇයි කියන එකට මම හොඳට උත්තර දෙන්නම්. තමුන්නාන්සේ කරුණා කර නිශ්ශබ්දව මගේ කථාවට සවන් දෙන්න. ලංකා ඉතිහාසයේ සිදු වුණු විශාලම, භයානකම, දරුණුම රට හොල්ලන සිද්ධිය කුමක්ද කියා මම තමුන්නාන්සෙට මතක් කර දෙන්නම්. අපේ රට පමණක් නොව මේ මුළු ලෝකෙ ම හොල්ලන තරම් දරුණු සිද්ධිය ඇති වුණේ 1959 සැප්තැම්බර් මාසෙ 26 වනදා බව තමුන්නාන්සෙලා කරුණා කර මතක තබා ගන්න. ලංකා ඉතිහාසයේ එවැනි භයානක, දරුණු, ලොව හොල්ලන, සිද්ධියක් මීට පෙර ඇති වුණේ නැහැ. ඒ අවස්ථාවේදී නැසී ගිය නායකයාගේ අනුමැතිය පිට 1959 සැප්තැම්බර් 25 වනදා හදිසි නීතිය ඇති කළා. හදිසි නීතිය මේ රටේ එදා ක්‍රියාත්මක කළේ එ වකට හිටපු අග්‍රාණ්ඩුකාර වර සර් ඔලිවර් ගුණතිලක විසින් බවත් එතුමා එසේ කළේ නැසී ගිය ගරු එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක අගමැතිතුමාගේ අනුමැතිය පිට බවත් අපි දන්නවා. [බාධා කිරීමක්.]

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)
කරුණා කර නිශ්ශබ්ද වෙන්න.

**වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. ඩී. ද සිල්වා**
*(டொக்டர் டப்ளியு. டீ. டி சில்வா)*
(Dr. W. D. de Silva)

I rise to a point of Order, that the House cannot proceed to discuss this Vote in this House because there is no Minister of Defence and External Affairs or Parliamentary Secretary in the House.

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)

We have already spoken on that. You should be aware of this.

**ඩබ්ලිව්. දහනායක මයා.**
*(திரு. டப்ளியு. தகநாயக்க)*
(Mr. W. Dahanayake)

ඊනි ප්‍රශ්නයට මම ටිකක් ඉඩ දුන්නා ගරු කථානායකතුමනි.

**විජයබාහු විජයසිංහ මයා.**
*(திரு. விஜயபாஹு விஜயசிங்ஹ)*
(Mr. Wijayabahu Wijayasinha)

ගරු මන්ත්‍රීතුමා අපටත් කථා කරන්න අවස්ථාව දෙනවද?

**ඩබ්ලිව්. දහනායක මයා.**
*(திரு. டப்ளியு. தகநாயக்க)*
(Mr. W. Dahanayake)

ඉඩ දෙනව; ඉවසන්න. තමුන්නාන්සෙට ඉඩ දෙනව. තමුන්නාන්සෙ කථා කරන විට අල්පෙනෙත්තියක් වැටෙන තරමටවත් ශබ්දයක් ඇති නොවන්නට ඉන්නම්. තමුන්නාන්සෙ කථා කරන ඔක්කොටම අපි හොඳින් ඇහුම්කන් දෙන්නම්. තමුන්නාන්සෙට ඉඩ දෙන්න අපි හැම විටම ලැහැස්තියි. තමුන්නාන්සෙලාගෙ කථාවලට ඇහුම්කන් දීමට බොහොම සන්තෝෂයෙන් සිටිනව. අපි ප්‍රශ්න කීපයක් මතු කර තිබෙනවා. ඒ ප්‍රශ්නවලට පිළිතුරු දෙන ලෙස ඉතාමත් ම ඕනෑකමින් ඉල්ලනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු කථානායකතුමනි, මේ ලංකා ඉති හාසයේ ඇති වූ ඉතාමත් ම දරුණු භයානක, ලෝකය හොලවන අපරාධය ඇති වුණේ 1959 සැප්තැම්බර් මාසයේ 25 වැනි දා. ඒ බව මේ ගරු සභාවේදී මා දැන් මතක් කළා. ඒ අවස්ථාවේදී ලංකා අග්‍රාණ්ඩුකාරතුමා හදිසි නීතිය පැනෙව්වේ නැසී ගිය බණ්ඩාරනායක මැතිතුමාගේ අනුමැතිය අනුව යි. ඒ අවස්ථාවේදි මේ රටේ ඇති වුණේ මොන විධියේ තත්ත්වයක් ද කියා තමුන්නාන්සේට මතක ඇති. එක කරුණක් මා මතක් කරනවා. එනම් මේ සංඝයා වහන්සේලා ගැනයි. ඒ අවස්ථාවේ සංඝ රත්නයට විශාල භයානක අවස්ථාවකට මුහුණ පාන්නට සිදු වුණා. නොයෙකුත් තැන්වල සංඝ රත්නයට අවනම්බු කරන්න, අවහිර කරන්න, ගහන්න පටන් ගත්තා. ඒ බව ඒ කාලයේ පොලිස් වාර්තාවල තිබෙනවා. ඒ කාලයේ තත්ත්වය අනුව ඇති වූ තමුන්නාන්සේ නොදන්න රහසක් මම තමුන්නාන්සෙට කියන්ට කැමතියි. මම අගමැතිවරයා වශයෙන් වැඩ කළ අවස්ථාවේදී මට දුන් අවවාදය මේකයි. මේ රටේ සිටින නායකයින්, දේශපාලන නායකයින්, විස්සකට වඩා හිරබාරයට ගන්නය කියා මට අවවාද දුන්නා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)

කවුද ඒ ? සිඞ්නි සොයිසද ?

**ඩබ්ලිව්. දහනායක මයා.**
*(திரு. டப்ளியு. தகனாயக்க)*
(Mr. W. Dahanayake)

අර ඝාතන කොමිෂන් එක ආවාම මම සාක්ෂි දෙන්නම්. ඇයි ඒවා කල් දැම්මේ, කියා මා අහනවා. මට දුන් අවවාදය රටේ වැදගත් අය, මේ ගරු සභාවේ ඉන්න නායකයින්, දේශපාලන නායකයින්, හිර බාරයට ගන්නය කියන එකයි. මන්ද එහෙම කිව්වේ ? මට දුන් ඒ අවවාද අපිරිසිදු සිත්වලින් දුන් අවවාද හැටියට මා පිළිගත්තේ නැහැ. එතරම් ලොකු බියක්, ඒ තරම්ම කණගාටුවක් ඇති වුණේ. ඒ අවස්ථාවේදි රට මුහුණ පෑ තත්ත්වය, හදිසියේ අර යාපනේ සුළු පිරිසක් එකතු වී පාරේ වැටී නමස්කාර කරමින් සිටි සත්‍යග්‍රහය, වගේ නොවෙයි. එදා ඇති වුණේ ඉතාමත් ම භයානක හිත් කම්පාවන තත්ත්වයක්. එවැනි භයානක අවස්ථාවක් ඇති වූ විට රටේ අගමැතිවරයා හැටියට භාර පස් මාසයක් මා හදිසි නීතිය තබා ගත්තා නම් එක්කෙනෙක්වත් මට විරුද්ධ වන්නේ නැහැ. නමුත් මා එය තබා ගත්තේ කොපමණ කල් ද කියා තමුන්නාන්සේට මතක් කර දෙන්නට කැමතියි. නැසීගිය බණ්ඩාරනායක අගමැතිතුමා මිය ගොස් දවස් 66 කට පසුව 1959 දෙසැම්බර් 3 වැනි දා ප්‍රවෘත්ති පත්‍රයේ හදිසි නීතිය සම්පූර්ණයෙන් ම ඉවත් කර ගත්තා කියන ආරංචිය දී තිබුණු අන්දම මෙහෙමයි :

EMERGENCY ENDS

The state of Emergency which was proclaimed on September 26 and renewed in October and November ended last night. All regulations proclaimed under the Public Security Ordinance were rescinded in a series of *Gazette Extraordinary* issued by the Governor-General on the advice of the Prime Minister. The Emergency was lifted last night after the Governor-General gave his assent to the Bill to restore the death penalty after the Senate passed the Bill by 23 votes to 4.

අර භයානක තත්ත්වය ඇති වූ අවස්ථාවේදීත් 66 දවසකින් ඒ හදිසි නීතිය අත් හැර දැම්මා. ගරු කථානායකතුමනි, ඒ කාලයේ නොයෙකුත් අවස්ථාවල, නොයෙකුත් අය මට දොස් කීවා. එවැනි දෙස් වලට, පහරවලට, මුහුණපාන්ට අප ලැහැස්තිව සිටින්ට ඕනැ. එහෙත් ඒ අවස්ථාවේදී මම මගේ යුතුකම කිරීමට අමතක කළේ නැහැ. මගේ දේශපාලන හතුරන් මට කොතරම් පහර ගැසුවත් මගේ යුතුකම මම නොපිරිහෙළා ඉටු කළා. හදිසි නීති කියන්නේ හදිසි නීති මිසක් සදාකාලික ඒවා නොවෙයි. හදිසි නීති කියන්නේ නොකඩවා පවත්වාගෙන යන නීති නොවෙයි. හදිසි නීති කියන්නේ අවස්ථාවට ඔබින නීතියි. එමනිසා ඒ අවස්ථාවේදී මම මගේ යුතුකම ඉෂ්ට කළා. ඊළඟ සතියේ එනම් දෙසැම්බර් මස පස් වැනි දින ප්‍රවෘත්ති පත්‍රයක පළ වූ මේ ආරංචියත් මම මේ ගරු සභාවට ඉදිරිපත් කරනවා :

The Governor-General acting on the advice of the Prime Minister last night dissolved Parliament and fixed March 19 for a general election. Nomination on January 4th.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩබ්ලිව්. දහනායක මයා.]

හදිසි නීතිවලට මොකද වුණේ? මහජන අයිතිවාසිකම්වලට මොකද වුණේ? හැබැයි, එක්තරා කටහැකර නායක ස්වාමීන් වහන්සේ කෙනෙක් ඊයේ "දිනමිණ" පත්‍රයේ මා ගැන ප්‍රකාශයක් කර තිබුණා. උන්වහන්සේ කියා තිබෙනවා, මා අරලිය ගහ මන්දිරයේ සිටි කාලයේදී මට භූත යෙක් වැහී සිටියාය කියා. මම එදා අරලිය ගහ මන්දිරයේ සිට සිහි නුවණින් කටයුතු නොකළා නම් ඒ කටහැකර මෝල් හාමුදුරු වන්ගේ සිවුරවත් ඉතිරි නොවන බව මම මතක් කරන්ට කැමතියි. ඒ හාමුදුරුවන්ට පිළිතුරක් වශයෙන් මම මේ කියන කාරණය ප්‍රවෘත්ති පත්‍රවල පළ කරන හැටියට මම පත්‍ර වාර්තාකරුවන්ගෙන් ඉල්ලා සිටිනවා. මම එදා සිහිනුවණින් කටයුතු කළ නිසාම සංඝ රත්නයට ඉඩ ලැබුණු බව මම ඒ හාමුදුරුවන්ට මතක් කරන්ට කැමතියි. ඒ කටහැකර හාමුදුරු වන් මට භූතයෙක් වැහී සිටිනවාය කීවත් මම ඒ හාමුදුරුවන්ගේ ගැලවුම්කාරයා බව මතක් කරන්ට ඕනෑ. ඒ හාමුදුරුවන් කියන විධියෙ භූතයෙක් ඇතුළත් වෙනවා නම් අපි කැමති වන්න ඕනෑ.

ගරු කථානායකතුමනි, ප්‍රජාතන්ත්‍ර වාදයට ගරු කරන ඇමතිවරු, ආණ්ඩු පක්ෂයේ සිටිනවා නම් අපි සන්තෝෂ වෙන්න ඕනෑ. එදා ඒ භයානක තත්ත්වය පැණ නැගී 66 දවසකින් පසුව හදිසි තත්ත්වය පහසුවෙන්ම මට ඉවත් කරන්ට පුළුවන්කම ලැබුණා. මම ඒ අවස්ථාවේ ක්‍රියා කළ ආකාරය තමුන්නාන්සේලා පාඩමක් හැටියට ගන්න ඕනෑ. තනි පුද්ගලයකු වශයෙන් මම කළ ක්‍රියාව ගැන කල්පනා කරන විට තමුන්නාන්සේලා අසූ දෙනාම ලජ්ජා වෙන්ට ඕනෑ. එබඳු පියවරක් අද තමුන්නාන්සේලාට ගතහැකිද කියා මම අභියෝග කරනවා. [බාධා කිරීමක්] වචන දෙකක් තුනක් කියා මට බාධා කර මාව භය ගන්වන්න පුළුවන් වේය කියා තමුන් නාන්සේලා කල්පනා කරන්න එපා. මට පුළුවන් වුවමනා නම් නොකඩවා තවත් පැය 13 ක් වුණත් කථා කරන්න. තමුන් නාන්සෙලා ඒ බව දන්නවාද?

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)

අපි දන්නව; අපි දන්නව.

**ඩබ්ලිව්. දහනායක මයා.**
*(திரு. டப்ளியு. தகனுயக்க)*
(Mr. W. Dahanayake)

ගරු කථානායකතුමනි, මම වාර්තා කැඩූ කවිකයෙක්. පැය 13½ ක් කථා කර සියලුම වාර්තා මා කඩා තිබෙනවා.

**විජයබාහු විජයසිංහ මයා.**
*(திரு. விஜயபாஹு விஜயசிங்ஹ)*
(Mr. Wijayabahu Wijayasinha)

ගරු කථානායකතුමනි, ඒ මන්ත්‍රීතුමාට ඒ තරම් වෙලාවක් කථා කරන්ට ඉඩ දෙනවා නම් අපටත් ඒ වගේම කථා කරන්ට ඉඩ දෙනවාද කියා මා දැනගන්ට කැමතියි.

**ඩබ්ලිව්. දහනායක මයා.**
*(திரு. டப்ளியு. தகனுயக்க)*
(Mr. W. Dahanayake)

මා ඒ මන්ත්‍රීතුමාට ඉඩ දුන්නෙ මට ටිකක් හුස්ම ගන්ට නිවාඩුවක් වුවමනා නිසයි. ඒ කවිකයෙකුගෙ ශාස්ත්‍රයක්. තමුන්නාන්සේ මට බාධා කිරීම ගැන මා ස්තුතිවන්ත වෙනවා.

ගරු කථානායකතුමනි, 1959 සිදු වූ කරුණු අනුව හදිසි නීතිවල සම්ප්‍රදාය මා තමුන්නාන්සේලාට මතක් කළා. ඒ කාලයේ හදිසි නීති පටන් ගන්න විට සමහර මැතිවරණ කල් දමා තිබුණා. හදිසි නීති යටතේ සම්පූර්ණයෙන්ම තහනම් කර තිබුණු කොළඹ නගර සභා මැතිවරණය පැවැත්වීමට මා ඒ අවස්ථාවේ බලය දුන්නා. "හදිසි නීති යටතේ රැස්වීම් පවත්වන්නෙ කොහොමද? නිතර නිතර රැස්වීම් පවත්වන්ට පොලීසියෙන් බලපත්‍ර ගන්න අමාරුය, එම නිසා අපට හරිහැටි මැතිවරණ කටයුතු ගෙන යන්න බැහැ" යන විධියේ උද්ඝෝෂණයක් ඒ අවස්ථාවේ ඇති වුණා. නමුත් හදිසි නීතිවලින් කිසිම අවහිරයක් ඇති නොවන අන්දමට කොළඹ නගර සභා මැතිවරණය පවත්වන්ට මා ඉඩකඩ සලසා දුන්නා.

**විජයබාහු විජයසිංහ මයා.**
*(திரு. விஜயபாஹு விஜயசிங்ஹ)*
(Mr. Wijayabahu Wijayasinha)

There is a Motion of No Confidence in the Minister of Local Government which is coming up soon. This matter can be brought up then.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ඩබ්ලිව්. දහනායක මයා.**
*(திரு. டப்ளியு. தகனாயக்க)*
(Mr. W. Dahanayake)

Thank you for giving me information about a possible argument in the future. That does not prevent me from using the argument now.

**විජයබාහු විජයසිංහ මයා.**
*(திரு. விஜயபாஹு விஜயசிங்ஹ)*
(Mr. Wijayabahu Wijayasinha)

I rise to a point of Order. That matter is also on the Order Paper. We are all waiting to speak on this Supplementary Estimate. The hon. Member should not discuss a subject that is to come up next week.

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)

This has nothing to do with the No Confidence Motion.

**ඩබ්ලිව්. දහනායක මයා.**
*(திரு. டப்ளியு. தகனாயக்க)*
(Mr. W. Dahanayake)

කථානායකතුමනි, ඒ මන්ත්‍රීතුමාගෙ තර්කය ඇත්ත තර්කයක්. ඒ මන්ත්‍රීතුමාට මා ඒ ගැන ස්තුති කරනව. නමුත් ඒ වැදගත් තර්කය දනුත් ඉදිරිපත් කරන්ට මට අවශ්‍යකමක් තිබෙනව. [බාධා කිරීමක්] නැති කර තිබුණු මැතිවරණය කට ඉඩ දුන්න පමණක් නොවෙයි, මැතිවරණයට හදිසි නීති බල නොපාන අන්දමින් ගෙන යන්ටත් වැඩ පිළිවෙළ යොදා දුන්න. කිසිම ක්ලබලයක් නැතිව එක දවසේ පවත්වන මහා මැතිවරණයක් තමුන්නාන්සෙලාට මට දෙන්ට පුළුවන් වුණා. කථානායකතුමනි, මම එය තමුන්නාන්සෙට මතක් කරන්නෙ විශේෂ කරුණක් අනුවයි. තමුන්නාන්සෙලා දැන ගන්න ඕනෑ අපේ රටේ වැසියන්ගෙ සම්ප්‍රදාය කුමක්ද කියා. අපේ රටේ මනුෂ්‍යයන්ගේ හික්මීම ගැනත් අපේ රටේ මනුෂ්‍යයන්ගේ ධර්මය ගැනත් තමුන්නාන්සෙල දැන ගන්න ඕනෑ. ඒ ධර්මය අනුව, ඒ ශිෂ්ටාචාරය අනුව හදිසි නීති වුවමනා කරන්නෙ නැහැ.

**විජයබාහු විජයසිංහ මයා.**
*(திரு. விஜயபாஹு விஜயசிங்ஹ)*
(Mr. Wijayabahu Wijayasinha)

සම්පූර්ණයෙන් පිළිගන්නවා.

**ඩබ්ලිව්. දහනායක මයා.**
*(திரு. டப்ளியு. தகனாயக்க)*
(Mr. W. Dahanayake)

හදිසි නීති ඕනෑ නැහැ. බලපෑම් ඕනෑ නැහැ. හොඳින් යමක් කීවොත් අපේ රටේ වැසියා එය පිළිගෙන ඉතාමත් හොඳ පිළිවෙළට ක්‍රියා කරන බව මුළු ලෝකයාම පිළිගෙන ඉවරයි. ඒ නිසා මේ හදිසි නීති මොකටද ?

**විජයබාහු විජයසිංහ මයා.**
*(திரு. விஜயபாஹு விஜயசிங்ஹ)*
(Mr. Wijayabahu Wijayasinha)

හදිසි නීති ඕනෑ නැහැ. ඒ බව අවංකවම පිළිගන්නවා.

**ඩබ්ලිව්. දහනායක මයා.**
*(திரு. டப்ளியு. தகனாயக்க)*
(Mr. W. Dahanayake)

ගරු කථානායකතුමනි, මීරිගම ගරු මන්ත්‍රීතුමාට මා අනේක වාරයක් ස්තුති වන්ත වෙනවා පමණක් නොව මුළු විරුද්ධ පාර්ශ්වයේම ස්තුතිය පුදකර නවා. වුවමනා තැනේදී ඇත්ත ඇති සැටියට කියන පුද්ගලයා වීරයෙක්. ඒ අනුව මීරිගම ගරු මන්ත්‍රීතුමා වීරයකු බව ප්‍රකාශ කරන්නට කැමතියි. දැන් ප්‍රකාශ කළ ඔය අදහස තව පැය ගණනකින් වෙනස් නො කරනවා නම් මීරිගම ගරු මන්ත්‍රීතුමා වීරයෙක්.

**විජයබාහු විජයසිංහ මයා.**
*(திரு. விஜயபாஹு விஜயசிங்ஹ)*
(Mr. Wijayabahu Wijayasinha)

කවදාවත් වෙනස් කරන්නේ නැහැ.

**ඩබ්ලිව්. දහනායක මයා.**
*(திரு. டப்ளியு. தகனாயக்க)*
(Mr. W. Dahanayake)

තමුන්නාන්සේ හැමදාම ඒ අදහසෙහි පවතිනවා ඇතැයි බලාපොරොත්තු වෙනවා.

අපේ රටේ වැසියන්ට නීති වුවමනා නැහැ. විජය රජ්ජුරුවන්ගේ කාලයේ සිට ශ්‍රී වික්‍රමරාජසිංහ රජ්ජුරුවන්ගේ කාලය තෙක් අපේ රටේ හදිසි නීති තුබුණේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩබ්ලිව්. දහනායක මයා.]
නැහැ. දුටුගැමුණු රජතුමා යුද්ධ හමුදා වක් එකතු කරගෙන අනුරාධපුරයතෙක් මහා ගමනක් ගියේ හදිසි නීති ඇතිව නොවෙයි. 1960 ජූලි මාසයේදී ආරම්භ වුණු මෙම පාර්ලි මේන්තුව නීති රීති පැන වීම අතින් වාර්තාවක් පිහිටුවා තිබෙනවා. දුටුගැමුණු රජතුමා විශාල යුද්ධ හමුදාවක් එකතු කරගෙන හැතැප්ම 300 ක මහා ගමනක් ඇරඹුවේ, සියලුම යුද්ධායුධ බඩු මුට්ටු රැගෙන මහා ගමනක් ඇරඹුවේ, රටේ විනයද ආරක්ෂා කර ගනිමින් ඒ මහා ගමන ආරම්භ කෙළේ, මොන හදිසි නීති යක් යටතේ ද? ඒ කාලයේ මොන හදිසි නීතියක් තුබුණේ ද? එදා එක හදිසි නීති යක්වත් තුබුණේ නැහැ. රටේ ජනතාව තමන්ගේ ශිෂ්ටාචාරය අනුව, ඇතිවෙච්ච ධර්මය අනුව විනය අනුව හැඩ ගැසී වුව මනා කරන බඩුමුට්ටු රැගෙන එදා රුහුණේ සිට අනුරාධපුරය බලා ගමන් කළා. දුටු ගැමුණු රජතුමා අනුරාධපුරයේදී බිලගතු සටනක් කොට ලොකු සතුරකු පරාජය කර බොහොම සන්සුන් ලීලාවෙන් දස රාජ ධර්මයෙන් රට පාලනය කෙළේ හදිසි නීති අනුවද? එපමණක් නොව, පරාජය වුණු ඒ සතුරාට කොපමණ ආදර්ශමත් විධියට සංග්‍රහ කළාද කියා අපේ ඉතිහාස යේ සඳහන් වී තිබෙනවා. සියලුම රටවැසි යන් එළාර රජුගේ සොහොන අසලින් යන කොට තමතමන්ගේ වාහනවලින් බැස යා යුතුය යන රාජ වචනය එදා හැම රට වැසියාම පිළිපැද්දේ මොන හදිසි නීති යටතේද කියා මා අහනවා. [බාධා කිරීම්.] ගරු කථානායකතුමනි, කථා කරනකොට අලංකාර ශාස්ත්‍රය යොදනව නේද? මිනිසුන් දස දහස් ගණන් වැඩට යොදල සිංහල රජදරුවන් ලෝකයේ සියලු දෙනාම පුදුමයට පත් වන අන්ද මේ වැව් ඇති කළේ මොන හදිසි නීතිය යටතෙද කියල මා අහනවා.

පූ. භා. 5.05

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)

ගරු මන්ත්‍රීතුමා කරුණා කර වැය ශීර්ෂ යට අදාල ව කතා කරන්න. එසේ නො කළොත් වාඩි වෙන්නැයි කියන්න මට සිදු වෙනවා.

**විජයබාහු විජයසිංහ මයා.**
*(திரு. விஜயபாஹு விஜயசிங்ஹ)*
(Mr. Wijayabahu Wijayasinha)

ගරු කථානායකතුමනි, මටත් කථා කරන්න අවස්ථාවක්—

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)

Order Please!

**ඩබ්ලිව්. දහනායක මයා.**
*(திரு. டப்ளியு. தகநாயக்க)*
(Mr. W. Dahanayake)

ගරු කථානායකතුමනි, මා තමුන්නාන් සේගේ කීමට හැම තිස්සෙම ගරු කරනව. අපි වැඩිහිටි සභාපතිවරුන්ගෙ කීම්වලට, මූලාසනවල කීම්වලට, හැම තිස්සෙම ගරු කරන්න ඕනෑ. තමුන් නාන්සේගේ කියමනට බොහොම සන් තොෂයෙන් අපි ගරු කරනව. මේ හදිසි නීතිය මොන කරුණක් නිසාද පනවා තියෙන්නෙ?

**විජයබාහු විජයසිංහ මයා.**
*(திரு. விஜயபாஹு விஜயசிங்ஹ)*
(Mr. Wijayabahu Wijayasinha)

කිසි ඕනෑකමක් නෑ.

**ඩබ්ලිව්. දහනායක මයා.**
*(திரு. டப்ளியு. தகநாயக்க)*
(Mr. W. Dahanayake)

ගරු මන්ත්‍රීවරුනි, තමුන්නාන්සේලාට මහජන අප්‍රසාදයෙන් බේරෙන්න වුවමනා නම් අගමැතිණිය ළඟට ගිහින් වහාම මේ හදිසි නීතිය ඉවත් කරන්නය කියා ඉල්ලා සිටින්න. මේ මුදල් මොන මොන කරුණු වලටද වෙන්කර තියෙන්නෙ? මෙසේ සඳහන් වෙනවා:

They were called out on active service, for internal security duties along with the regular forces. The Volunteer Force personnel of the Army who were placed on compulsory leave without pay were called out on active service along with the regular forces.

බලන්න එක වරදකින් වැරදි වැළක් කෙරිල තියෙන හැටි. එකකින් තවත් එකක්, ඒකෙන් තවත් එකක් යන විදියට වැරදි බෝ වෙනව. වැරදි පැටව් ගහනව. මේ වැරදි අද දවසේ පැටව් ගහල. එක

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වරදක්. වැරදි රාශියක් වෙලා. Volunteer Force කියන්නෙ කාටද? සථිර රාජකාරියක් කරන අයට නොවෙයි. අතුරු රාජකාරියකට බැඳිල සිටින කොටසක් තමයි මේ අංශයට ඇතුළත් වන්නෙ. මේ අතුරු රාජකාරියක් කරන්නන් සථිර රාජකාරියක් කරන්නන් බවට පත් කිරීම හරිද? වැදගත් සේවයක යෙදුණු ලිපිකරුවෙක් කන්තෝරුවක ඉන්නවය කියල හිතමු. එයා වොලන්ටියර් ෆෝස් එකට අතුරු රාජකාරියක් කරන්නෙකු හැටියට බැඳිල ඉන්නවය කියල හිතමු. මේ හදිසි නීතියට අනුව එම අතුරු රාජකාරිය එයාට සථිර රක්ෂාවක් වුණා. නමුත් එයා කරපු රාජකාරියට අලුත් කෙනෙක් ගන්නත් බැහැ. අර පරණ රස්සාව හැමවිටම හිස් වෙලා තියෙන්න ඕනැ, එයා එන වෙලාවට ඇතුළු වෙන්න. මේකෙන් කොයිතරම් පාඩු සිදු වෙනවද? කොපමණ අමාරුකම් ඇති වෙනවද?

**හමීඩ් මයා.**
*(ஜனாப் ஹமீத்)*
(Mr. Hameed)
ගණපූරණයක් නැහැ.

මන්ත්‍රී මණ්ඩලය ගණන්කොට, ගණපූරණයක් නොමැති වූයෙන්, බෙදුම් සීනු ශබ්ද කිරීමට නියෝග කරන ලදී.

පසුව ගණපූරණයක් තුබූයෙන්—

**ඩබ්ලිව්. දහනායක මයා.**
*(திரு. டப்ளியு. தகநாயக்க)*
(Mr. W. Dahanayake)

වොලන්ටියර් ෆෝස් කියන්නෙ තාවකාලික අවසථාවලදී වැඩ කිරීමට කථා කරන කණ්ඩායමක්. අද ඒ වොලන්ටියර් ෆෝස් එකේ රාජකාරිය සථිර රාජකාරියක් වෙලා තියෙනවා. ඒකෙන් අපේ පාඨශාලා වලට කොපමණ හානියක් වෙලා තියෙනවද? අපේ පාඨශාලාවලට ඉතාමත් අවශ්‍ය ගුරුවරු තමයි, විද්‍යා ගුරුවරු. විද්‍යා ගුරුවරයෙක් වොලන්ටියර් ෆෝස් එකට බැඳිලා 17 මාසයක් ඉන්නවා නම් ඒ ගුරුවරයාට කොපමණ හානියක් වුණාද, ඒ ගුරුවරයා උගන්වන පාසලට කොපමණ හානියක් වුණාද, රටට කොපමණ හානියක් වුණාද කියා තමුන්නාන්සෙට මණින්න පුළුවන්ද? දීර්ඝ කාලයක් තමුන් නාන්සෙලාට හදිසි නීතිය තබා ගන්න වුවමනා නම් වොලන්ටියර් ෆෝස් කියන කට්ටිය ගන්න එපා. සථිර කට්ටියක් බඳවා ගන්න. ඇයි සථිර කට්ටියක් බඳවා ගන්න බැරි? මොකක්ද මේකෙ තේරුම? මේක සූරාකෑමක් නේද? තාවකාලිකය කියා අරගෙන තියෙන්නෙ 17 මාසයකට. 17 මාසය 36 මාසයක් වන්න වත් පුළුවනි. මේ ආණ්ඩුව තියෙන තෙක් හදිසි නීතිය තියෙන්න පුළුවනි. එහෙම නම් ඒක සූරාකෑමක් නොවෙයිද? තාවකාලික කට්ටිය ගන්නෙ නැතිව සථිර කට්ටිය ගන්න බැරි මන්ද? අළුත් තර්කයක් මම ඉදිරිපත් කරන්නෙ. තමුන්නාන්සෙ පිළිතුරු දෙන විට මේ ප්‍රශ්නවලට පිළිතුරු දෙන්න ඕනැ. කාව කාවද බඳවාගෙන තිබෙන්නෙ කියා බලන්න. 1962 මාර්තු වන තෙක් කෑම පිසන අය 46 දෙනෙක් බඳවා ගත්තා. එයින් 6 දෙනකුව ඉතිරි කරගෙන 40 දෙනකුට ගෙදර යන්න කිව්වා. එක පාරට පලයන් බන් පිකට් දුන්නා 40 දෙනකුට. වේටර්ලා, ලේබරර්ස්ලා සම්බන්ධයෙනුත් ඒ විධියටයි කරල තියෙන්නෙ. වැසිකිළි සෝදන කම්කරුවන් කණ්ඩායමකුත් අරගෙන ටිකක් කල් ඉන්දගෙන ටික දෙනකුව අස් කරනවා. ඇයි මේ සියලුම වැඩ කටයුතුවලට තමුන්නාන්සෙලාට සථිර යුධ හමුදාව පළල් කර ගන්ට බැරි? අපි විරුද්ධ නැහැ ඒකට. තමුන් නාන්සෙලා යුධහමුදව සථිර වශයෙන් වැඩි කර ගන්නවා නම්, ඒක තාවකාලික වශයෙන් වැඩි කර ගන්නවාට වඩා හොඳයි. තාවකාලික වශයෙන් යුධ හමුදාවට බඳවා ගන්න අය යුධ හමුදාවේ අයත් නොවෙයි, සාමාන්‍ය ගිහි අයත් නොවෙයි. ඒ ගොල්ලො දෙකට මැද්දෙන් ඉන්න කොටසක්. ඒ අය යුධ හමුදාවට අවශ්‍යයි. ඒ අයට තමන්ගේ රාජකාරියත් හරියට කරන්න බැහැ. යුධ හමුදාවේ ටික කලක පුහුණුවක් ලබා තිබෙන නිසා ඒ පුරුද්ද අනුව නොනිසි අන්දමට හැසිරෙන්න පටන්ගනිව් ටික කලක් යන විට. යුධ හමුදාවට තව තවත් බඳවා ගන්න යනවා නම් එසේ කරන්න. වලන්ටියර් ෆෝස් එකට බඳවා ගැනීමේ ඇති වැඩක් නැහැ. අළුතෙන් වලන්ටියර් ෆෝස් එකක් ඇති කරන්න මෙම මුදල ඉල්ලා තිබෙන වාද කියා මා දන්නෙ නැහැ. සථිර ලේකම්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩබ්ලිව්. දහනායක මයා.]

එන්. කියු. ඩයස් මහතා "තමන්ගෙ මිනිසුන්" බඳවා ගත්තාය කී මෙම වලන්ටියර් හමුදාව සම්බන්ධයෙන් මෙම මුදල් වියදම් කරනවාද කියා අප දන්නෙ නැහැ. නමුත් එය එසේ නම්, එන්. කියු. ඩයස්ගේ "යුද්ධ හමුදාවට" මෙම මුදල් වලින් යම්කිසි ප්‍රමාණයක් වෙන් කරනවා නම්, අපගේ විරුද්ධත්වය මීට වඩා තදින් පෙන්වන්න ඕනෑ. යුද්ධ හමුදාවට භටයින් බඳවා ගැනීමේදීත් අනෙක් සේවයන්ට බඳවා ගනු ලබන අවස්ථාවලදී මෙන් යම්කිසි ස්ථිර ක්‍රියා මාර්ගයන් අනුව එය කළ යුතුයි. එක එක තැනැත්තාගේ හිතු මනාපයට කටයුතු කරන්න ඉඩ තැබීම ඉතාමත්ම අසතුටුදායකයි.

පසුගිය දිනවල නොයෙක් තැන්වලින් කළ චෝදනාවක් තමයි වැඩිපුර කතෝලිකයන් යුද්ධ හමුදාවට බඳවා ගත්තාය යන්න. ඒක වැරදියි. යුද්ධ හමුදාව වැනි තැනක කණ්ඩායම් වශයෙන් කටයුතු කිරීම හරි නැහැ. එන්. කියු. ඩයස් මහතාගේ කණ්ඩායම හරි නැතිවාක් මෙන්ම කතෝලික යන්ද කණ්ඩායමක් වශයෙන් සිටීම හරි නැහැ. ඒ නිසා මා ඉල්ලා සිටින්නේ එක් එක් පුද්ගලයාට වුවමනා අන්දමට කටයුතු කරන්න ඉඩ නොතබා යම් ප්‍රතිපත්තීන් සමූහයක් මත පිහිටා ක්‍රියා කරන ලෙසයි. පා පන්දු ක්‍රීඩාවේ පාවිච්චි කරන බෝලයක් මෙන් එක් එක් තැනැත්තාට වුවමනා හැටියට ගසන්න ඉඩ තබන්න බැහැ. මේ දෙකම එක වල්ලෙ ගෙඩි. ඒ නිසා මේ වැය ශීර්ෂයෙන් ශතයක් වත් එම කටයුත්තට—එන්. කියු. ඩයස් රිජිමන්ට් එකට—පාවිච්චි කිරීම ගැන අප සම්පූර්ණයෙන්ම විරුද්ධයි. මෙවැනි වැරදි, අපරාධ, අවිනීත වැඩවලට මා සම්පූර්ණයෙන්ම විරුද්ධයි. දැන් මේ සඳහා ඉල්ලා තිබෙන්නෙ රුපියල් තිස්පන් ලක්ෂයක මුදලක්.

අයවැය විවාදය තිබූ අවස්ථාවේදී හිටපු මුදල් ඇමතිතුමා කීවා යුද්ධ හමුදාව සම්බන්ධයෙන් සම්පූර්ණ ප්‍රතිසංස්කරණයක් කරන්න යනවාය කියා. ඒ අවස්ථාවේදී ගරු මන්ත්‍රීවරුන් එය අසා ඉතා සතුටු වුණා. යුද්ධ හමුදාව ගරු කථානායකතුමනි, එක් පක්ෂයකට පමණක් අයිති දෙයක් නොවෙයි. මෙය එක් කණ්ඩායමකට හෝ එක් පක්ෂයකට හෝ අයත් කරුණක් නොවෙයි. මුළු රටම ඉල්ලා සිටිනවා, යුද්ධ හමුදාව ප්‍රතිසංස්කරණය කරන්නය කියා. මොන විධියට ප්‍රතිසංස්කරණය කළ යුතුද කියා මම දැන් කියන්නම්. මෙන්න එක් ප්‍රතිසංස්කරණයක්. රුසියාවේ රතු හමුදාව වැඩ කරන පිළිවෙලට අපේ යුද්ධ හමුදාවත් සකස් කරන්න. ඒ කියන්නේ යුද්ධ භටයින් හදිසි නීති යටතේ බැටන් පොලු අරගෙන සාමාන්‍ය පොදු ජනතාවට තර්ජනය කරන අය හැටියට පරිවර්තනය කිරීම නොවෙයි, මේ රටේ සංවර්ධන වැඩවලදී මහ ජනයා සමග එක් වී ඔවුන්ට ආධාර කරන පිරිසක් හැටියට පරිවර්තනය කිරීමයි. සමහර විට කුඹුරු වැඩ කරන්න වෙන්න පුළුවනි. අස්වැන්න වැඩි කිරීමේ ව්‍යාපාරයක් කෘෂිකර්ම ඇමතිතුමා විසින් ඉදිරිපත් කර තිබෙනවා. අස්වැන්න වැඩි පුර ලබාගැනීම සඳහා පැළ සිටුවීමේ ක්‍රම තිබෙනවා. ඒ වාගේම කුඹුරු නෙළීමේ වැඩ තිබෙනවා. වැඩි පුර අස්වැන්න ලබාගැනීම සඳහා සහතික කරන ලද බිත්තර වී පාවිච්චි කරන්න ඕන. මේ කටයුතුවලදී ගොවියාට ආදර්ශයක් දීම සඳහා යුද්ධ හමුදාවේ එක් අංශයක් සකස් කොට "කල්ටිවේෂන් රෙජිමන්ට්" නැතහොත් "ගොවි රෙජිමේන්තුව" කියා නම් කොට ඒ ඒ පළාත්වලට ගොස් කුඩාරම් ගාසගෙන ගොවිරාළලා මෙන් අමුඩ ගසාගෙන කුඹුරට බැස වැඩ කරවීමට යෙදවිය හැකියි. ඇයි එවැනි වැඩ පිළිවෙලක් ඇති කරන්න බැරි? එවැනි වැඩ පිළිවෙලක් ඇති කොට ගමක් ගමක් පාසා ආදර්ශ ගොවි කණ්ඩායම් යැව්වොත් දැනට අක්කරයකින් ලබාගන්නා බුසල් 39 වෙනුවට අක්කරයකින් බුසල් 80 ක් ලබාගන්න පුළුවන් වෙනවා. එය ඉතා අනර්ඝ ශ්‍රේෂ්ඨ උතුම් නිවන් දකින්න පුළුවන් සේවයක් වෙනවා නොවෙද?

යුද්ධ හමුදාව ගොවිතැන් වැඩ සඳහා පමණක් නොවෙයි, යෙදවිය හැක්කේ. වෙනත් කර්මාන්තයන් කිරීම සඳහාත් යෙදවිය හැකියි. මෙරට මුදල් ලක්ෂ ගණනින් පිටරට යනවා, මාළු, කරවල, ජාඩි වැනි ද්‍රව්‍ය ගෙන්වීම සඳහා. අපට වුවමනා සියලුම මාළු ලංකාව හතර වටේ ඇති මුහුදේ තිබෙනවා. ඇයි තමුන්නාන්සේලා ධීවර රෙජිමේන්තුවක් පිහිටුවා ආදර්ශවත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පිළිවෙලකට කෙලවල්ලන් බලයින් හුරුල්ලන් වැනි මාළු ඇල්ලේම් කටයුතු කිරීමට යොදවා පිටරට ඇදී යන මුදල් මෙහි නවතා නොගන්නේ ?

**විජයබාහු විජයසිංහ මයා.**
*(திரு. விஜயபாஹு விஜயசிங்ஹ)*
(Mr. Wijayabahu Wijayasinha)

On a point of Order, the hon. Member is referring to fish and other things.

**ඩබ්ලිව්. දහනායක මයා.**
*(திரு. டப்ளியு. தகநாயக்க)*
(Mr. W. Dahanayake)

I am suggesting how the Army should be reformed. My good Friend does not understand a thing. They are very valuable suggestions. If you take my advice, you will remain in power for the next 20 years. If you do not take my advice, you will fall within the next six months. Take that from me.

යුද්ධ හමුදාවේ ප්‍රතිසංවිධානය කරන ලෙස අපි ඉල්ලුවා. සපත්තු පොලිෂ් කිරීම වැනි දේවලට පමණක් නොව වුවමනා වුණොත් උදලු පහර ගහන්ට උවත් ශක්තියක් තිබෙන රෙජමේන්තුවක් ඇති කරන්ටය කියා උපදෙස් දුන්නා. ඉතින් මොන විධියේ රෙජමේන්තුවක් ඇති කරන්වද මේ රුපියල් ලක්ෂ 35 ක් ඉල්ලන්නෙ ?

හදිසි නිතිය හෙවත් ඒමර්ජෙන්සි රෙගියුලේෂන් කියන්නෙ කම්කරුවන්ගෙ හතුරු කණ්ඩායමකටයි. ඔවුන්ගේ අයිතිවාසිකම් කැඩීමටයි ඒක පාවිච්චි කරන්නෙ. ඒක මහජනයාගෙ ජීවිතයට විරුද්ධව ක්‍රියා කරන කණ්ඩායමක්. තමුන්නාන්සෙල මේ කරන්නෙ බොරුවක්. නමුත් අපි තමුන්නාන්සෙලාගෙන් ඉල්ලුවෙ මහජනයා සමග උරෙන් උර ගැටී ජාතික සේවයක් කරන කණ්ඩායමක් ඇති කරන ලෙසයි. ඉතින් කෝ තමුන්නාන්සෙලාගෙ ප්‍රතිසංවිධානය ?

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

What about the Pioneer Corps ?

සීනි කපනවා.

**හමීඩ් මයා.**
*(ஜனாப் ஹமீத்)*
(Mr. Hameed)

සීනි කපනවලු! කොහොමද සීනි කපන්නෙ ? උක්ගස් කපනවද ?

**විජයබාහු විජයසිංහ මයා.**
*(திரு. விஜயபாஹு விஜயசிங்ஹ)*
(Mr. Wijayabahu Wijayasinha)

ගරු කථානායකතුමනි, අපටත් කථා කිරීමට අවස්ථාවක් දෙන ලෙස ගාල්ලේ ගරු මන්ත්‍රීතුමාගෙන් මම කරුණාවෙන් ඉල්ලා සිටිනවා.

**ඩබ්ලිව්. දහනායක මයා.**
*(திரு. டப்ளியு. தகநாயக்க)*
(Mr. W. Dahanayake)

ගරු කථානායකතුමනි, මම වුවමනාවට වැඩියෙන් කල් ගන්නෙ නැහැ. මටත් හුඟක් කරුණු කියන්ට තිබෙනවා. හැකි තාක් ලුහුඬින් මගේ අදහස් ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

Have we not debated this question enough ? I move that the Question be now put.

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)

I accept the Closure Motion.

**ඩබ්ලිව්. දහනායක මයා.**
*(திரு. டப்ளியு. தகநாயக்க)*
(Mr. W. Dahanayake)

ගරු කථානායකතුමනි, මේ ශීර්ෂය යටතේ අපේ අදහස් සම්පූර්ණයෙන්ම ඉදිරිපත් කිරීමට තමුන්නාන්සේ ඉඩ දෙන්න ඕනෑ. ඔය රීති ප්‍රශ්නය අනුව මම තමුන්නාන්සෙට මේ කාරණය මතක් කරන්න කැමතියි. මේ වැය ශීර්ෂයෙන් රුපියල් ලක්ෂ 35ක් ඉල්ලනවා. මොකටද? තමුන්නාන්සෙත් මේ ගරු සභාවේ මන්ත්‍රීවරයෙකු හැටියට මේ ගැන වගකිවයුතු කෙනෙක් වෙනවා. මේවා කජු ඇට කොස් ඇට නොවෙයි. කජු ඇට 35 ක් නොවෙයි ඉල්ලන්නෙ; රුපියල් ලක්ෂ 35 කුයි ඉල්ලන්නෙ. ඒ තරම් විශාල මුදලක් වැය කරන අවස්ථාවක ඒ ගැන අපට කථා කරන්න නිදහසක් නැත්

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

[ඩබ්ලිව්. දහනායක මයා.]

නම් මොන නිදහසක්ද, මොන මනුෂ්‍ය අයිතිවාසිකමක්ද, අපට තියෙන්නෙ? මේ ප්‍රශ්නය උඹ අපට බැරිද යු. එන්. එකට යන්න කියා මම අහන්න කැමතියි.

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)

I shall put the Question now.

ප්‍රශ්නය විමසන ලදී.

**ඩබ්ලිව්. දහනායක මයා.**
*(திரு. டப்ளியு. தகனுயக்க)*
(Mr. W. Dahanayake)

මම ඒකට විරුද්ධ වෙනවා.

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)

Ayes have it.

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

ගරු කථානායකතුමනි, අපටත් කථා කරන්න ඕනෑ. මේ ගැන මාත් කථා කරන්ටම ඕනෑ. මොකක්ද මේකෙ තේරුම? මම කථා කරනවා. තමුන්නාන්සෙ ඕන නම් මාව එළියට යවන්න. ඇයි ඒකාධිපති විධියට වැඩ කරන්නෙ? ඒකට අපි විරුද්ධයි.

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)

කරුණා කර නිශ්ශබ්ද වන්න.

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

අපටත් කථාකරන්න අවස්ථාවක් ඕනෑ.

**ගරු ඩී. එස්. ගුණසේකර (වාණිජ, වෙළඳ, ආහාර හා නැව් කටයුතු පිළිබඳ වැඩ බලන ඇමති)**
*(கௌரவ டீ. எஸ். குணசேக்கர—வர்த்தக, வியாபார, உணவு, கப்பற்றுறைப் பதில் அமைச்சர்)*
(The Hon. D. S. Goonasekera—Acting Minister of Commerce, Trade, Food and Shipping)

කරුණාකර වාඩි වෙන්න. නිකම් කෑ ගහන්න එපා මහත්මයෝ. දුක් දවස් කීයක් මේ ගැන ගත වුනාද?

**ඩබ්ලිව්. දහනායක මයා.**
*(திரு. டப்ளியு. தகனுயக்க)*
(Mr. W. Dahanayake)

May I make one appeal to you, Sir? You are full of generosity and the milk of human kindness. You are one of the kindest souls on God's earth. If you think I weary you, if you do not like my type of eloquence, I will give way to my friend. I will sit down. Please do not cut short a speech. I will stop my speech in obedience to your Order.

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)

Order, please!

**ඩබ්ලිව්. දහනායක මයා.**
*(திரு. டப்ளியு. தகனுயக்க)*
(Mr. W. Dahanayake)

Sir, will you please listen to me? You must give me a hearing. I accept your ruling and I will sit down. Please allow the next hon. Member to get up and speak.

**විජයබාහු විජයසිංහ මයා.**
*(திரு. விஜயபாஹு விஜயசிங்ஹ)*
(Mr. Wijayabahu Wijayasinha)

The next Member is myself.

**ඩබ්ලිව්. දහනායක මයා.**
*(திரு. டப்ளியு. தகனுயக்க)*
(Mr. W. Dahanayake)

I will take my seat. Please allow the next Member to speak.

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)

Order, please!—[*Interruption.*]

**ඩබ්ලිව්. දහනායක මයා.**
*(திரு. டப்ளியு. தகனுயக்க)*
(Mr. W. Dahanayake)

I sat down expecting that you will allow the next Member to speak.

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)

Order, please!—[*Interruption.*]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඩබ්ලිව්. දහනායක මයා.
*(திரு. டப்ளியு. தகநாயக்க)*
(Mr. W. Dahanayake)

I obey you, Sir. Please listen to me. Please allow the others to speak. I have stopped my speech. I could have gone on for another five hours. I have 21 other arguments. I give up stating all those arguments in obedience to your request.

ගරු සී. පී. ද සිල්වා
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

If the hon. Member for Galle will stop his arguments, I will withdraw my Motion.

ඩබ්ලිව්. දහනායක මයා.
*(திரு. டப்ளியு. தகநாயக்க)*
(Mr. W. Dahanayake)

Please allow the others to speak.

ගරු සී. පී. ද සිල්වා
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

I withdraw my Motion.

ඩබ්ලිව්. දහනායක මයා.
*(திரு. டப்ளியு. தகநாயக்க)*
(Mr. W. Dahanayake)

With my utmost thanks for your great patience, kindness and generosity, I conclude my speech.

කථානායකතුමා
*(சபாநாயகர்)*
(Mr. Speaker)

Let us suspend the Sitting for about half an hour.

ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.
*(திரு. டீ. பீ. ஆர். குணவர்தன)*
(Mr. D. P. R. Gunawardena)

One hour.

විජයබාහු විජයසිංහ මයා.
*(திரு. விஜயபாஹு விஜயசிங்ஹ)*
(Mr. Wijayabahu Wijayasinha)

Mr. Speaker, I would like to speak for just five minutes.

ආචාර්ය එන්. එම්. පෙරේරා
*(டொக்டர் என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

I think the hon. Member for Mirigama should be allowed to speak before the Sitting is suspended.

පූ. භා. 5.30

විජයබාහු විජයසිංහ මයා.
*(திரு. விஜயபாஹு விஜயசிங்ஹ)*
(Mr. Wijayabahu Wijayasinha)

ගරු කථානායකතුමනි, මේ අවස්ථාවේදී හදිසියේ වුණත්, වේලාවක් නැති වුණත්, මේ සම්බන්ධයෙන් වචනයක් දෙකක් කථා කරන්ට මම බලාපොරොත්තු වෙනවා. ඉතාමත්ම වටිනා කරුණු දෙක තුනක් පමණයි කියන්නේ. මේ සම්බන්ධයෙන් අපේ ගාල්ලේ ගරු මන්ත්‍රීතුමා [ඩබ්ලිව්. දහනායක මයා.] කී කරුණු කීපයක් අනුමත කරන්ට මා කැමතියි. විශේෂයෙන්ම මේ හදිසි නීති ප්‍රශ්නය ගැන සම්පූර්ණයෙන්ම මම එකඟ වෙනවා [බාධා කිරීම්] මා ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙක් හැටියට මීට කලිනුත් විරුද්ධ වුණා, අදත් විරුද්ධ වෙනවා, මේ හදිසි නීතිය පවත්වාගෙන යෑම ගැන. දිවංගත බණ්ඩාරනායක අගමැතිතුමාගේ ප්‍රතිපත්ති තිබුණා. අපේ ආණ්ඩුව පටන්ගත් දවසේ සිට අද වන තුරුම මේ විධියට හදිසි නීතිය ගෙන යන්න ඒ ප්‍රතිපත්තිය අනුව වටින්නේ නැහැ. මම එය අවංක අදහසින් තමුන්නාන්සේලාට ප්‍රකාශ කරන්න ලැහැස්තියි.

ගරු මන්ත්‍රීවරු
*(கௌரவ அங்கத்தவர்கள்)*
(Hon. Members)

Resign ! Resign !

විජයබාහු විජයසිංහ මයා.
*(திரு. விஜயபாஹு விஜயசிங்ஹ)*
(Mr. Wijayabahu Wijayasinha)

මම මේ සම්බන්ධව ප්‍රසිද්ධ මහජන සභා රැස්වීම්වලදීත් කියා තිබෙනවා. මේ හදිසි නීතිය කිසිම වුවමනාවක් නැති එකක්. [බාධා කිරීම්] Shut up.

මුණවීර මයා.
*(திரு. முனவீர)*
(Mr. Munaweera)

ගරු කථානායකතුමනි, ඒ වචනය ඉල්ලා අස් කර ගන්න ඕනෑ. [බාධා කිරීම්]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**විජයබාහු විජයසිංහ මයා.**
*(திரு. விஜயபாஹு விஜயசிங்ஹ)*
(Mr. Wijayabahu Wijayasinha)

හිටපු අගමැතිතුමාගේ ප්‍රතිපත්ති අනුව කටයුතු——

**මුණවීර මයා.**
*(திரு. முனவீர)*
(Mr. Munaweera)

ගරු කථානායකතුමනි, ඒ වචනය ඉල්ලා අස් කර ගන්න කියන්න. එය මේ ගරු සභාවේ මන්ත්‍රීවරුන්ට කරන අපහාසයක්.

You had better cross over and then criticise the Government.

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)

I suspend the Sitting until 6.30 A.M.

**රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්සිටුවන ලදින්, පූ. භා. 6.30 ට නැවත පවත්වන ලදී.**

**ඩබ්ලිව්. දහනායක මයා.**
*(திரு. டப்ளியு. தகநாயக்க)*
(Mr. W. Dahanayake)

Sir, I understand that HANSARD reporting and simultaneous interpretation have both collapsed. We therefore ask you to adjourn the House until next week.

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)

The Reporters have been kind enough to agree to carry on. They came and saw me and said that they are prepared to carry on with their work in spite of the long hours and the severe strain under which they have worked. I am very grateful and thankful to them.

**ගරු මන්ත්‍රීවරු**
*(கௌரவ அங்கத்தவர்கள்)*
(Hon. Members)

Hear! Hear!

පූ. භා. 6.30

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)

Order, please! The hon. Deputy-Speaker will now take the Chair.

**අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන් නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.**

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තේ පානය සඳහා අප විසිර යාමට පෙර මේ යුද්ධ හමුදා අතිරේක වැය ශීර්ෂය සම්බන්ධයෙන් කථා කරමින් සිටියේ මීරිගම ගරු මන්ත්‍රීතුමායි. වැරදි දේ වැරදි හැටියට දැක්වීමට මීරිගම ගරු මන්ත්‍රීතුමා අවංකවත් නිර්භීතවත් කථා කළ නිසා අපි ඉතාමත්ම සන්තෝෂ වෙනවා. හදිසි තත්ත්වය සම්බන්ධව නියම අවබෝධයක් තිබෙන එක මන්ත්‍රීතුමෙකුවත් ආණ්ඩු පක්ෂයේ සිටීම ගැනත් අප සන්තෝෂ වෙනවා. තමුන්නාන්සේලා දන්න හැටියට හදිසි තත්ත්වය ආරම්භ වුණේ 1961 වර්ෂයේයි. එසේ හදිසි තත්ත්වයක් ඇති කිරීමට හේතු වූයේ දිවයිනේ උතුරේ හා නැගෙනහිර පළාත් වල පෙඩරල් පක්ෂය ගෙන ගිය සත්‍යග්‍රහ ව්‍යාපාරයයි. ඒ දිනවල උතුරේ හා නැගෙනහිර ප්‍රදේශවල හදිසි තත්ත්වයක් ඇති කරන ලෙස අපිත් රජයට කියා සිටියා. එහෙත් ආණ්ඩුව කළේ කුමක් ද? හදිසි තත්ත්වය උතුරු හා නැගෙනහිර පළාත් වලට සීමා නොකර ලංකාව පුරාම හදිසි නීතිය පැණවීමයි. එදා පණවන ලද හදිසි තත්ත්වය අද වන තුරු තිබෙනවා. මේ හදිසි තත්ත්වය උඩ යුද්ධ හමුදාවේ වියහියදම් සඳහා මහජන මුදලින් ලක්ෂ තිස් පහක මුදලක් දැන් ඉල්ලනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රුපියල් ලක්ෂ 35 ක පමණ විශාල මුදලක් ඉල්ලන විට, ඒ වගේම වැදගත් අමාත්‍යාංශයක් සාකච්ඡාවට භාජන වන විට, ඒ අංශය භාර අගමැතිනිය මේ ස්ථානයේ නැති නිසා එතුමිය වෙනුවෙන් පිළිතුරු දෙන්ට පාර්ලිමේන්තු ලේකම්වරයෙක්වත් මේ ස්ථානයේ නොමැති වීම ගැන මා පළමුවෙන්ම මගේ කනගාටුව ප්‍රකාශ කරනව. හිටපු පාර්ලිමේන්තු ලේකම්වරයා අස් වුණා. ඒ වෙනුවට තවමත් පාර්ලිමේන්තු ලේකම්වරයෙක් පත් කර නැහැ, අපේ ප්‍රශ්නවලට හරි හැටි පිළිතුරු දෙන්න. අපි කරන කථාවලට පිළිතුරු දෙන්නෙ සභානායකතුමායි. අපේ කථාවලට හරි හැටි පිළිතුරු දෙන්ට සභානායකතුමාට පුළුවන්කමක් නැහැ. මන්ද? අගමැතිනියගේ පාර්ලිමේන්තු ලේකම්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වරයා වශයෙන් එතුමාව තවම පත් කර නැති නිසා. කවදා පත් කරයිද කියා මා දන්නෙ නැහැ. මේ ලොකු අඩුපාඩුව තිබෙද්දීයි, අපට මේ වැදගත් ප්‍රශ්නය ගැන සාකච්ඡා කරන්ට සිදු වී තිබෙන්නෙ. මේක ලජ්ජාවට කරුණක්. එය මේ ගරු සභාවට කළ ලොකු අගෞරවයක් හැටියට අප සලකනව. හිටපු පාර්ලිමේන්තු ලේකම්තුමා අස් වුණා නම්, අගමැතිනිය වෙනුවෙන් අඩු ගණනේ මේ ගරු සභාවේ කථා කිරීමටවත් පාර්ලිමේන්තු ලේකම් කෙනෙක් පත් කිරීමට ඉඩ තිබුණ. එය සුළු කර්තව්‍යයක් වුණත් එය ඉෂ්ට නොකර තිබෙද්දියි අපට මෙම වැය ශීර්ෂය අද සාකච්ඡා කරන්ට සිදු වී තිබෙන්නෙ.

නියෝජ්‍ය කථානායකතුමනි, ෆෙඩරල් සත්‍යග්‍රහයෙන් පටන් ගත් හදිසි තත්ත්වය අද වෙන කොට ඒ ස්වරූපයෙන් සම්පූර්ණයෙන්ම වෙනස් වී තිබෙනවා. අද හදිසි නීති පවත්වාගෙන යන්නෙ රටේ කලබල තිබෙන නිසා නොවෙයි. අද රටේ කිසිම හදිස්සියක් නැහැ. හදිසි තත්ත්වය තව දුරටත් පවත්වාගෙන යන්ට අද කිසිම වුවමනාවක් නැහැ. අද ඒක තබාගන්ට තිබෙන එකම ඕනෑකම මහජනයාට තිබෙන භයයි. ආණ්ඩුවේ වැරදි දේශද්‍රෝහී ක්‍රියා කලාපය නිසා, මහජනයාට අසාධාරණ බදු බර පටවා තිබෙන නිසා, ඒ වගේම මහජනයාගේ අනිකුත් සෑම ප්‍රශ්නයක්ම අවුල් කර තිබෙන නිසා, හැම කොටසක්ම අද රජයට විරුද්ධයි. එම නිසා හදිසි නීති නැතිව රට ආණ්ඩු කරන්ට මේ ආණ්ඩුවට පුළුවන්කමක් නැහැ. මා මුලින් කිව්වා වගේ, ෆෙඩරල් පක්ෂය උත්සාහ කළේ උතුරු සහ නැගෙනහිර පළාත්වල වෙනම රාජ්‍යයක් පිහිටුවන්ටයි. එහෙත් හදිසි තත්ත්වය පැනවීමෙනුත් යුද්ධ හමුදාව ඒ ප්‍රදේශවලට යැවීමෙනුත් එය නතර වුණා. එහෙත් මේ ඇමතිවරයා කෘෂිකර්ම ඇමතිවරයා හැටියට ත්‍රිකුණාමලයේ තිබෙන ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක ෆෙඩරල් පක්ෂයේ කොඩිය එසවීමට ඉඩ දී තිබෙනව.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
ඒක වැරදියි.

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)
මෙන්න බලන්න ඊයේ "දවස පත්‍රය" "ෆෙඩරල් කොඩිය ලෙල දේ." 26 වැනිදා ත්‍රිකුණාමලයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පැවැත්වූ ප්‍රදර්ශනයක—ඔබේ දෙපාර්තමේන්තුව ගෙන ගිය ප්‍රදර්ශනයක—සිංහ කොඩිය අකුලා කුණු කූඩයට දමා ෆෙඩරල් කොඩිය ඔසවන්ට ඉඩ දී තිබෙනව: කවුද? ඔබේ දෙපාර්තමේන්තුව.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
ඒක වැරදියි. මම එහෙම ඉඩක් දුන්නෙ නැහැ. ඒ පත්‍රය අච්චු ගැහැව්වෙ මම නොවෙයි.

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)
එහෙම නම් මේක වැරදියි කියා අදවත් කිව්වද? මේ කාරණය සම්පූර්ණයෙන්ම ඇත්ත. අප මේ ගැන සොයා බැලුවා. එවිට මෙය සම්පූර්ණ ඇත්තක් බව පෙනී ගියා. සිංහ කොඩිය නැතිව, එක සිංහල වචනයක්වත් නැතිව, ෆෙඩරල් කොඩිය සහ දෙමළ වචන පමණක් පාවිච්චි කරමින් මේ ප්‍රදර්ශනය කර ගෙන ගොස් තිබෙනවා.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
මා කීවේ කොඩිය ගැන නොවෙයි. ඒ විධියට කටයුතු කරන්නට ඇමති අංශයෙන් ඉඩ දුන්නාය කියන එකයි.

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ විධියට මොන වැඩේ කළත් ඒවා ගැන තමුන්නාන්සෙල ක්‍රියා නොකරන එක ගැනයි, මා කීවේ. එසේ ක්‍රියා නොකරන නිසා කිසිම නිලධාරියකු බිය සැක නැතිව කරනවා. ඒ සඳහා තමුන්නාන්සෙලාගෙ අනුග්‍රහය ලැබෙන බවත් කිව යුතුයි. සභානායකතුමා ෆෙඩරල් පක්ෂයත් සමග එකතු වී ආණ්ඩුවක් පිහිටුවන්නට සතුටු බව කවුරුත් දන්න කාරණයක්. මෙච්චර වැදගත් කාරණයක් ගැන ගරු ඇමතිතුමා අහන්නේ මගෙනුයි. මේ විධියේ ප්‍රවෘත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කේ. එම්. පී. රාජරත්න මයා.]

තියක් පළ වුණාම වහාම ක්‍රියා කරන්නට ඕනෑ නේද? නමුත් තමුන්නාන්සෙලා ඒ විධියට වහාම තබා කොහොමවත් ක්‍රියා කරන බවක් පෙනෙන්ට නැහැ.

හදිසි තත්ත්වයේ මුවාවෙන් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවල පෙඩරල් කොඩි ගසා ගෙන කරන මේ වැඩේ මොකක්ද? පෙඩරල් රාජ්‍යය කියන්නේ මීට මිස වෙන මොකකටද? ආණ්ඩුවේ ආයතනයක පෙඩරල් කොඩිය ගැසීමට ඉඩ දුන්නා නේද? මෙවැනි වැඩ කරන නිලධාරීන් කනෙන් අල්ලා දොට්ට ඇද දැමිය යුතු නේද? මෙය රාජද්‍රෝහී වැඩක් වශයෙන් සලකා මේ වැඩ කළ නිලධාරීන්ට සුදුසු දඬුවම් දිය යුතුයි. මේ කාරණය ගරු කෘෂිකර්ම ඇමතිතුමා ලියා ගන්න බවක් පෙනෙනවා. නමුත් ඔය විධියට ලියා ගත්තාට වැඩක් නැහැ. ලියා ගන්න එක පමණයි, සිදු වන්නේ. අහිංසක සිංහලයකු මොකක් හෝ කළොත් ඔහු හිරේට යවනවා. නමුත් ආණ්ඩුවේ සේවයේ යෙදී සිටින අයම රාජද්‍රෝහී වැඩ කරන විට ඒ අයට විරුද්ධව කරන්නේ මොනවද? මොකුත් නැහැ.

මේ කාරණය පිළිබඳ ප්‍රවෘත්තිය ඊයේ පත්‍රයේ පළ වුණා. නමුත් ඇමතිවරයා මේ දන් වන තුරු ඒ ගැන දන්නේ නැහැ. වැඩ කරන්නේ මේ විධියට නම් මොකටද මේ හදිසි තත්ත්වය? මේක ලොකු පාවා දීමක්. මේක ලොකු ද්‍රෝහි කමක්. මේ විධියට වැඩ කරමින් මේ හදිසි තත්ත්වය පවත්වාගෙන යන්නේ මොකටද? මොකටද මේ සඳහා විශාල මුදලක් වියදම් කරන්නේ? අනිද්දායින් පටන් ගන්න මුදල් වර්ෂයේදී වියදම් කිරීම සඳහා මේ අංශයට තවත් මුදල් වෙන් කර තිබෙනවා. හදිසි තත්ත්වය දික් කරන නිසා රුපියල් ලක්ෂ ගණනින් වැය වෙනවා නේද? හදිසි තත්වය පවත්වා ගෙන යෑමට මේ තරම් මුදල් කන්දක් වියදම් කරන නමුත් මේ රටේ ජනතාවට හරියට කන්ට නැහැ, ඉන්ට නිවාස නැහැ; වෛද්‍ය පහසුකම් නැහැ; ගමන් පහසුකම් නැහැ. එවැනි තත්වයක් තිබියදී නොවුවමනා හදිසි තත්ත්වයක් සඳහා මේ තරම් මුදල් කන්දක් වියදම් කරන්නේ ඇයි? මහජන ආණ්ඩුවක් පිහිටුවා තිබෙනවායයි කියන තමුන්නාන්සේලා මොකටද මේ හදිසි තත්ත්වය පවත්වා ගෙන යන්නෙ. මහජන ආණ්ඩුවක් නම්



ඇයි මේ විධියට දිගින් දිගටම හදිසි නීතියක් තබා ගෙන ඉන්නෙ? මෙයින් තමුන්නාන්සෙලා බලාපොරොත්තු වන්නේ මොකක්ද? කුමන්ත්‍රණ නඩුව නිසා හදිසි නීතිය පවත්වා ගෙන යන බව අගමැතිනිය නැත්නම් අධිකරණ ඇමතිවරයා දනට සති කීපයකට ඉහතදී සෙනෙට් මන්ත්‍රී මණ්ඩලයේදී තර්කයක් වශයෙන් කියා තුබුණා. කුමන්ත්‍රණ නඩුවත් හදිසි තත්ත්වයත් අතර තිබෙන සම්බන්ධය මොකක්ද? පසුගියදා අපරාධ විශේෂ විධිවිධාන පණත නම් ව්‍යවස්ථාවකට මේ සභාවේ අනුමැතිය ලැබුණා. ඒ වගේම හමුදාවේ කාර්යයන්ටත් පිටස්තර කාර්යයන්ටත් හමුදා නිලධාරීන් යෙදිය හැකි වන පරිදි හමුදා ආඥාපණත සංශෝධනය කරන්ට යෙදුණා. මේ පණත් දෙක නිසා හදිසි නීතිය නැතිව වුවත් දනට චෝදනා ලැබ සිටින කුමන්ත්‍රණකරුවන් රැකීමට පුළුවනි. කුමන්ත්‍රණ සැකකරුවන් ආරක්ෂා කිරීමට මේ හදිසි නීතිය නැතිවාට පුළුවනි. හදිසි නීතිය නැතිවාට එවැනි කටයුතු සඳහා හමුදාව යෙදීමට ආණ්ඩුවට බලතල තිබෙනවා. මෙම නීතිය පවත්වාගෙන යාමට කුමන්ත්‍රණ නඩුව හේතුවක් වන්නේ කොහොමද? එම නඩුව ඒකට කිසිම හේතුවක් වෙන්නේ නැහැ. නඩුව උසාවියේ විභාග වේවි. හදිසි තත්ත්වය උඩ ඒකට බලපෑමක් කරන්න බැහැ. මේක බොරුවක්, වරදක්, මායාවක්. එසේම මහජනයා රැවටීමක්. මේක පිළිගන්න බැහැ, අපිට. ඉතින් හදිසි තත්ත්වය තව දුරටත් තියාගන්නෙ ඇයිද කියල ගරු සභානායක තුමා කියන්න. ද්‍රවිඩ මුන්නේත්‍ර කසාගම් ව්‍යාපාරය තහනම් කරන්න හදිසි තත්ත්වය පාවිච්චි කළාලු. මේක මේ රටේ සාමයට භයානක තර්ජනයක්. එම ව්‍යාපාරය නවත්වන්න නීතියක් දමන්න කිව්වහම හදිසි තත්ත්වය පාවිච්චි කෙරුවා. එසේ කිරීමෙන් ද්‍රවිඩ මුන්නේත්‍ර කසාගම් ව්‍යාපාරය තහනම් වෙලා නැහැ. එම ව්‍යාපාරය වෙන වෙන ස්වරූපවලින් වැඩ කරනවා. විශෙෂයෙන් උඩරට වතුකරය අවට ඉඩම් අත්පත් කර ගැනීම පිණිස කූට ව්‍යාපාරයක් ගෙනියනවා. කෘෂිකර්ම අමාත්‍යාංශයට පුළුවන් වෙලා නැහැ, එය නවත්වන්න. අළුත් නීති රීතිවලට අනුව රුකුල් ලැබිල තියෙනව මේ රටේ ඉඩම් ටිකත් අල්ල ගන්න, රක්ෂා අල්ලගෙන වෙලා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

හදිසි තත්ත්වය උඩ ද්‍රවිඩ මුන්නේත්‍ර කසාගම් ව්‍යාපාරය තහනම් කළාය කීවට වැඩක් නැහැ. ඔවැනි ද්‍රෝහි ව්‍යාපාරයකට නැවත වරක් මේ රටේ නැඟිටින්න බැරි වන විධියට තහනම් කරන්න ඕනෑ. හදිසි තත්ත්වය උඩ නතර කළාය කියනව. අප ඉල්ලන්නෙ සම්පූර්ණයෙන් නවත්වන්න කියලයි. බොහොම කල් තිබුණා, මෙම ව්‍යාපාරය තහනම් කරන්න. හදිසි තත්ත්වය උඩ මෙය තහනම් කරල මාස එක හමාරකට දෙකකට වැඩිය නැහැ. මේ සඳහා නීති ගෙනෙන්න බොහෝ කල් තිබුණා. මෙවැනි දේශද්‍රෝහි ව්‍යාපාරයක් සම්පූර්ණයෙන් තහනම් කර එහි නිලධාරීන් සහ සාමාජිකයන් හිර බාරයට ගන්න බොහෝ කලක් තිබුණා. දැන් එවැනි නීතියක් සකස් කර තිබෙනවද? ආණ්ඩුව වෙනුවෙන් ගරු සභානායකතුමා ඒ පිළිබඳව ප්‍රකාශයක් කරන්න ඕනෑ. ද්‍රවිඩ මුන්නේත්‍ර කසාගම් ව්‍යාපාරය හැමදාම තහනම් කරන්න යන්නෙ මේ හදිසි නීති යටතේ සි. නමුත් වැඩි කලක් ඔය විධියට කරන්ට ඉඩ ලැබෙන්නෙ නැහැ. මේ ආණ්ඩුව තව මාස 6 කට වැඩි කලක් තියෙන එකකුත් නැහැ. එතකොට හදිසි තත්ත්වය නැති වෙනවා. ඊට පස්සෙ ද්‍රවිඩ මුන්නේත්‍ර කසාගම් ව්‍යාපාරය නැවතත් එළියට එනවා. මේ ආණ්ඩුවට දේශප්‍රේමී චේතනාවක්, රටට ඇල්මක් හෝ ආදරයක් තිබෙනවා නම් මෙම ව්‍යාපාරය තහනම් කරන්න නීතියක් ගෙනෙන්න පුළුවනි. මෙම ගරු සභාවේ සම්පූර්ණ සහයෝගය ආණ්ඩුවට ලබා ගන්න පුළුවන් වෙනවා ඇති. එවැනි දේශ ද්‍රෝහි ව්‍යාපාරයක් සම්පූර්ණයෙන් තහනම් කරන්න. මේ පිළිබඳව ආණ්ඩුව දරන අදහස් මොනවාද කියා දැන ගන්න අපි කැමතියි. අද මේ හදිසි තත්ත්වය ආණ්ඩුවට ලොකු ආයුධයක් වෙලා තියෙනවා. ආණ්ඩුව විවේචනය කරන්නන්, ඒ කියන්නෙ ආණ්ඩුවේ ප්‍රතිමල්ලවයන් මර්ධනය කිරීම සඳහා හදිසි තත්ත්වය ලොකු ආයුධයක් කරගෙනයි තියෙන්නෙ. ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් විනාශ කර දමා ඔවුන්ට පහර ගැසීමට මගක් කර ගෙනයි තියෙන්නෙ, මේ හදිසි තත්ත්වය වැලිමඩ සහ මුතුර් අතුරු මැතිවරණ කල් දැම්මා, හදිසි තත්ත්වය නිසා. විශෙෂයෙන් වැලිමඩ අතුරු මැතිවරණය කිසිම යුක්ති සහගතකමක් නැතුව කල් දැම්මා. තවත් දේවල් කර තිබෙනවා.

මා තව කරුණක් මතක් කරන්න කැමතියි. අධිකරණ කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්තුමාත් මෙතන සිටින බව පේනවා. ලංකා ඉතිහාසයේ අධිකරණ ක්‍රමය ඇති වුණු දා පටන් මේවන තුරු මෙවැනි සිද්ධියක් ඇති වුණාද කියා මා පළමු කොට එතුමන්ගෙන් ප්‍රශ්න කර සිටිනවා. සිද්ධිය මේකයි : මා හිර ගෙට යවන කොට හදිසි නීතිය පාවිච්චි කළා. නීතිය අනුව මට මූලික දඬුවම් දුන්නෙ බදුල්ල උසාවියෙන්. එම නිසා බදුල්ලෙ උසාවියෙන් නියම කළා බදුල්ලෙ හිර ගෙදරට යවන්න. ඒ අවස්ථාවෙදිත් හදිසි නීතිය පාවිච්චි කරල බදුල්ලෙ උසාවියේදී දෙන්නට තිබුණු අවසාන නඩු තීන්දුව බදුල්ලෙ උසාවියෙදී දෙන්නෙ නැතිව, නඩු කොපි කොළඹට ගෙනැල්ලා කොළඹදී තීන්දුව දුන්නා. ඒ අනුව මාවත් කොළඹට ගෙනා නිසා මගේ නෑදෑයන්ට මාව බලන්නට බැරි වුණා. කොහේ ගියත් මම යන්නෙ හිර ගෙදරටයි. කොළඹින් ඇරියත් හිරේ යන්න ඕනෑ ; බදුල්ලෙන් ඇරියත් හිරේ යන්න ඕනෑ. ඒක වෙනම දෙයක්. නමුත් මෙතෙක් අනික් සෑම නඩුවලදීම නඩු තීන්දුව දුන්නෙ නඩුව පටන් ගත් උසාවියෙනුයි. නමුත් මගේ නෑදෑයන්ට, මගේ හිත මිතුරන්ට, මාව බලන්නට බැරි වෙන්න මගේ නඩුවේ තීන්දුව දුන්නෙ කොළඹ උසාවියෙනුයි. මීට වඩා දරුණු හදිසි නීති තියාගෙන ආඥාදායක ආණ්ඩු ගෙන ගිය රටවල් දෙකකට වෙලා තියෙන්නෙ මොකක්ද කියා තමුන්නාන්සෙලා දන්නවා ඇති. අවුරුදු දෙකකට උඩදී ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු ක්‍රමය විනාශ කර දැමූ නේපාලයේ රජුට විරුද්ධව කැරැල්ලක් ගහල තියෙනවා. ඒ වගේම යේමනයේ රජතුමාට අද මොකක්ද වෙලා තියෙන්නෙ ? මිනිස්සු යුද්ධ හමුදාවවත් පොලිසියවත් බලන්නෙ නැතුව මාළිගාවට ගිහින් රජතුමාත්, රජ පවුලත්, මාළිගාවත් පුච්චල තියෙනවා. ඒකාධිපති වැඩ කරන්නට යන විට ආණ්ඩුවලට වෙන්නෙ ඔය ටිකයි. මහජනයාගෙ කෝපය ඇති වුණාම ඔවැනි දේ සිදු වීම නවත්වන්නට බැහැ. මේ



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පරිපූරක මුදල්

[කේ. එම්. පී. රාජරත්න මයා.]

ආණ්ඩුවත් එවැනි තත්ත්වයකට මුහුණ පාන්නටයි, අද වැඩ කටයුතු කරගෙන යන්නෙ. මේ වගේ හදිසි නීති තියාගෙන ප්‍රජාතන්ත්‍රවාදී බලය විනාශ කරල තමන්ගේ ආණ්ඩු බලය තහවුරු කර ගැනීමට වැඩ කටයුතු කරගෙන යන විට මහජන කෝපය උග්‍ර වුණාම, මහජනයා කරන්නෙ කුමක්ද කියා තමුන්නාන්සෙට පෙනෙයි. අපේ ලංකාවේම ඇත ඉතිහාසයත් මෑත ඉතිහාසයත් දෙස බලන විට පෙනෙනවා, වෙන්නට පුළුවන් දේ.

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)

ඒවා දහනායක යුගයේදී.

කේ. එම්. පී. රාජරත්න මයා.
(திரு. கே. எம். பீ. ராஜரத்ன)
(Mr. K. M. P. Rajaratna)

හදිසි නීතිය තියෙන්නෙ ඒ නිසාද? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවුරුදු දෙකකට ආසන්න කාලයක් මේ හදිසි නීතිය පවත්වාගෙන එන්නෙ ඇයි? තවත් හේතුන් අතර ඔය හදිසි නීතියත් එක හේතුවක් වුණා, පසුගිය ජනවාරි මාසයේ යුද්ධ හමුදාවට මේ රටේ කුමන්ත්‍රණයක් ඇති කිරීමට. බුද්ධාගම විනාශ වන්නට ගියාය, සිංහල ජාතිය විනාශ වන්නට ගියාය, අපි ඒක නැවැත්වුවාය, කියා මහජනයාගේ අනුකම්පාව ලබා ගන්නට මේ ආණ්ඩුව උත්සාහ කළා. නමුත් එදා සිට අද වන තුරුත් එසේම මින් ඉදිරියටත් අපි අහනවා, කුමන්ත්‍රණයට පසුබිම කුමක්ද කියා මේ ආණ්ඩුව හෙව්වද, රෝග නිධානය කුමක්ද කියා මේ ආණ්ඩුව සෙව්වද? නැහැ. නියම පිළියමක් කිරීමට තවම කටයුතු කළේ නැහැ. හදිසි නීතිය, කතෝලික ආක්‍රමණය, විදේශීය බලපෑම්, අධිරාජ්‍යවාදි බලපෑම්, මේ කුමන්ත්‍රණයට කොයි තරම් දුරට මුල් වුණාද කියා හෙව්වද? කුමන්ත්‍රණය පටන් ගත්ත දිනයට දැන් අවුරුද්දක් ගත වන්නටත් කිට්ටුයි. හැමදාම කියනවා, හමුදාව ප්‍රතිසංවිධානය කරනවලු. කෝ ප්‍රතිසංවිධානය? අද වන තෙක් කිසිම ප්‍රතිසංවිධානයක් තියෙනවද? නැහැ. එදා හිටපු බල කණ්ඩායමම අද වඩා බලසම්පන්නව ඉන්නවා. යම් කිසි වෙනසක් ඇති කළාය කියන්නට දෙයක් කළා නම් කළේ, බෞද්ධ නාමයෙන් රදලයන් ටිකක් අරගෙන ගිහින් යුද්ධ හමුදාවෙ තැන්පත් කිරීමයි. බෞද්ධ නාමයෙන් රදලයන්ට තැන දීල තියෙනවා. බෞද්ධ ජනතාව බලාපොරොත්තු වුණේ ඒක නොවෙයි. ආරක්ෂක හමුදාවෙ ප්‍රධාන නිලධාරියා හැටියට අගමැතිනියගේ ඥතිවරයකු වන කර්නල් ස්ටැන්ලි රත්වත්තේව පත් කරල තියෙනවා. බෞද්ධ යන නාමයෙන් රදලයන් පවුල් බලය උඩ යම් යම් වැදගත් ස්ථානවලට පත් වී බෞද්ධාගම ආරක්ෂා කරනවාය කීවාට මේ රටේ ජනතාව පිළිගන්නෙ නැහැ. කතෝලික ආක්‍රමණික බල වේගය අඩු වී ගොසින් තිබෙනවාය කීවත් දැන් එය වැඩි වී තිබෙනවා. හොඳයි, මෙම ආණ්ඩුව පිළිගන්නවාද කතෝලික ව්‍යාපාරයේ බල වේගය දැන් අඩු වී ගොසින් තිබෙනවාය කියා? මන්ත්‍රීවරුන් නම් ආක්‍රමණය පවතිනවාය කියා රැස්වීම්වල කියනවා. ව්‍යාප්ත වූ කුමන්ත්‍රණයේ පසුබිම වී තිබෙන්නේත් කතෝලික ව්‍යාපාරය බව මන්ත්‍රීවරුන් රැස්වීම්වලදී ප්‍රකාශ කරනවා. යුද්ධ හමුදාවේ කතෝලික බල වේගය තදින්ම තිබෙනවාය කියා අප කියනවා. හොඳයි, මේ ආණ්ඩුවේ වගකිවයුතු ඇමතිවරයෙක් එය එසේ නොවේය කියනවාද? එසේ නොවේ නම් මන්ත්‍රීවරුන් මෙවැනි ප්‍රකාශ කරන්නෙ මහජනයා රවටන්නද? ඒ නිසා මේ සම්බන්ධයෙන් ප්‍රකාශනයක් කරන්නය කියා මා ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. යුද්ධ හමුදාවේ කතෝලික බල පෑම් ඉතා දරුණු අන්දමට තිබෙනවාය කියා අපේ පක්ෂය හැර මේ ගරු සභාවේ සිටින මහජන එක්සත් පෙරමුණත් එමෙන්ම අනෙක් සමහර දේශපාලන පක්ෂත්, පිළිගන්නවා. හොඳයි ආණ්ඩුව මෙම අදහස පිළිගන්නවා නම් කතෝලික ආක්‍රමණික ව්‍යාපාරය මැඩලීමට ආණ්ඩුව ගෙන තිබෙන වැඩපිළිවෙල කුමක්ද? එවැනි වැඩ පිළිවෙළක් ගැන තමුන්නාන්සේ හිතලාවත් තිබෙනවාද? නමුත් ආණ්ඩුව මෙම ප්‍රශ්නය සම්බන්ධයෙන් මොන විධියේ අදහස් දරනවාද කියා අප දැනගන්න ඕනෑ.

විරුද්ධ පාර්ශ්වයේ පක්ෂවල අවසරයක් නැතිව මේ ගරු සභාවේ පිරිත් පිංකමක් පැවැත්වුවා බෞද්ධාගම ආරක්ෂා කරන්නය කියා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)
ඒකට විරුද්ධද?

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)
අපෙන් අහන්නෙ නැතිව එකඟත්වයක් දැක්වූ එක ගැනයි එදත් අදත් විරුද්ධ වන්නෙ. මේ ගරු සභාව ආණ්ඩුවේ ආය තනයක් නොවෙයි. මෙම ගරු සභාව ස්වා ධීන ආයතනයක්. අපි සාධාරණකමටයි යුක්තියටයි හිස නමනවා විනා අගමැති නිය කීවාට ගණන් ගන්නෙ නැහැ. අපෙන් අහන්නෙ නැතිව සම්ප්‍රදාය කඩ කොට මේ සභාවේ පිරිත් පිංකම පැවැත්වීම ගැන අප සම්පූර්ණයෙන්ම විරුද්ධ බව කෙලින් ම කීවා. කතෝලික ආක්‍රමණ ව්‍යාපාරය යුද්ධ හමුදාවටත් නාවුක හමුදාවටත් පොලිස් හමුදාවටත් රිංගාගෙන බෞද්ධා ගම විනාශ කරන්න සෑම තැනම කටයුතු යොදන නමුත්, බෞද්ධාගම ආරක්ෂා කර නවාය කියන මෙම ආණ්ඩුව බොරුවට මහජනයා රැවටීම පිණිස පිරිත් පිංකම් ආදිය පැවැත්වුවත් කතෝලික ආක්‍රමණ යෙන් මේ රට බේරා ගන්න කිසිම වැඩ පිළිවෙළක් අද වන තුරු යොදා නැහැ.

පාර්ලිමේන්තු සම්ප්‍රදාය ගරු කරන ආණ්ඩුවක් නම්, ප්‍රජාතන්ත්‍රවාදි ප්‍රතිපත් තීන් ගරු කරන ආණ්ඩුවක් නම්, විරුද්ධ පාර්ශ්වයේ අදහස්ද විමසිය යුතුව තිබුණා. නේරුතුමාගේ පැමිණීම ගැන අප සමග සාකච්ඡා කළා නම්, ඇයි මේ තරම් වදගත් කටයුත්තක් සම්බන්ධයෙන් අපෙන් ඇහැව්වෙ නැත්තෙ? තමන්ගෙ ඒකාධි පති බලය යොදා මෙම ආයතනයත් තමන් යටතේ පවත්වාගෙන යන දෙපාර්තමේන් තුවක් මෙන් සලකා, තමන්ගෙ නින්ද ගමක් මෙන් සලකා, ක්‍රියා කරන්න අපට ඉඩ දෙන්න බැහැ. අප තුළ තිබෙන අව සාන ලේ බිංදුව සිඳෙන තෙක් එවැනි දේවලට විරුද්ධව සටන් කරනවා. මෙම ගරු ආයතනය ආණ්ඩුවේ දෙපාර්තමේන් තුවක තත්ත්වයට පත් කරන්න අප නම් ඉඩ දෙන්නෙ නැහැ. මෙහි නිදහස ආරක්ෂා කර ගැනීමට එහා පැත්තෙ මන්ත්‍රීවරුන් වත් ඇමතිවරුන්ටත් වුවමනාවක් නැති වුවත්, අපට මෙහි තිබෙන ස්වාධීනත්වය රැක ගන්න ඕනෑ. තමුන්නාන්සේටත් එහි ඕනෑකම දැනෙන්නෙ මී ළඟ වතාවේ දී හෝ තමුන්නාන්සේ මේ පැත්තට ආවොත් පමණයි.

බෞද්ධ අයිතිවාසිකම් රකිනවා නම් කරන්න තිබෙන්නේ අපෙනුත් නොඅසා කිසිත් වග විභාගයක් නොකර පාර්ලි මේන්තු සම්ප්‍රදාය කඩකරමින් මෙහි පිරිත් පිංකමක් කිරීමට නොවෙයි. මේ රටේ බෞද්ධ ජනතාව, ප්‍රගතිශීලී ජනතාව අන්‍ය ආගම්වලට ගරහන්නේ නැහැ. අපි හැම ආගමකටම ගරු කරනවා. කතෝලික ආක්‍රමණ ව්‍යාපාරය ආගමක් නොවෙයි. එය පිටරට හා සම්බන්ධකම් ඇති දෙශ ද්‍රෝහි සියුම් දේශපාලන ව්‍යාපාරයක්. ඒ ව්‍යාපාරය නැති කළ යුතුයි. එය ලෝකයේ හැම රට කම වාගේ ප්‍රතිගාමීන් එකතුවී ප්‍රගතිශීලී වැඩ කඩාකප්පල් කොට ප්‍රතිගාමී ව්‍යාපාර යට ඔවුනු පැළඳවීම සඳහා ගෙන යන ව්‍යාපාරයක්. ඒ ව්‍යාපාරයේ කටයුතු පරීක්ෂා කිරීමට හෝ ඒ ව්‍යාපාරයේ කට යුතු නැවැත්වීමට හෝ මේ රජය එක පිය වරක්වත් ගත්තාද? නැහැ. යුද්ධ හමු දාව තුළ කතෝලික ව්‍යාපාර වැඩ කෙරෙන වාද නැද්ද යන්න ගැන තවමත් ආණ්ඩුව ප්‍රසිද්ධ ප්‍රකාශයක් කර නැහැ. එවැන්නක් කරන්නේ නැතිව මෙහි පිරිත් පිංකමක් කොට මහජනයා මුලා කරන්න හදනවා. ඒවාට මහජනයාවත් අපිවත් මුලා වන්නේ නැහැ.

යුද්ධ හමුදාවේ යම් කිසි ප්‍රතිසංවිධාන යක් කරන්නේයයි කලින් කියා තිබෙන වා. ඒ අනුව යම් කිසි වැඩ පිළිවෙලක් ඇති කරාවියයි අපි බලාපොරොත්තු වුණා. මේ රටේ සිංහල පමණක් කියන පණත සම්මත කරගෙන තිබෙනවා. ඒ අනුව එකම රාජ්‍ය භාෂාව සිංහලයි. සිංහල මාධ්‍ය යෙන් සමත් වූ අය පමණයි, ආණ්ඩුවේ සේවයට ඒ අනුව බන්දවා ගත යුත්තේ. නමුත් යුද්ධ හමුදාවේ පත්වීම් කරන්නේ කොහොමද? ලයිතන් තනතුරෙන් ඉහළ අය බන්දවා ගන්නේ ඉංගිරිසි මාධ්‍යයෙන් සමත් වී තිබෙනවා නම් පමණයි. සිංහල ජ්‍යෙෂ්ඨ විභාගයෙන් සමත් වූ එක් කෙනෙක්වත් බන්දවාගෙන තිබෙන්නේ යයි කියන්න පුළුවන්ද? මොකක්ද කරන්න යන ප්‍රතිසංවිධානය? කොයි භාෂා පණතද, මේ ආණ්ඩුව ක්‍රියාත්මක කරන්නේ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩබ්ලිව්. දහනායක මයා.]

මහජනයා අතරේ වැරදි මතයක් ඇති වී තිබෙනව. ප්‍රවෘත්ති පත්‍රවලත් මේ නැව් දඩ ගැන වැරදි අදහස් පළ වෙනව. අපේ රටේ බොරුවක් පතුරුවා හැර තිබෙනව, මේ නැව් දඩ ගෙවන්ට සිද්ධ වෙන්නෙ කොළඹ වරායෙ කම්කරුවන්ගේ වරද නිසාය කියා. කොළඹ වරායෙ කම්කරුවන් ඊට වරදකරුවන් නොවෙයි. මා පෙන්වා දී තිබෙනව, කොළඹ වරායෙ කම්කරුවන් ඉක්මනින් නැව්වල බඩු ගොඩ බාන්ට ඉතාමත් ආසාවෙන් ඉන්න බව. එය කම්කරුවන්ගෙ වරදක් නොවෙයි. කොළඹ වරායෙ නිලධාරීන් ඕනෑකමින්ම ඔවුන්ගේ කූට උපක්‍රම අනුව වාසි ලබාගැනීමේ බලාපොරොත්තුවෙන් නැව්වල බඩු බෑම ප්‍රමාද කරනව. මන්ද? පිටකොටුවේ වෙළෙන්දන්ගෙන් පගාව ලබාගන්න කොළඹ වරායෙ නිලධාරීන් ඇනු අර්තාපල් වැනි ඉක්මනින් නරක් වන බඩු බෑම ප්‍රමාද කරවනව. එවිට පිටකොටුවේ වෙළෙන්දන්ට පුළුවන් වෙනවා තමන් ළඟ තිබෙන අර්තාපල් සහ ඇනු තොගය වැඩි ගණනකට විකුණන්න. ඒ පමණක් නොව පගාව වශයෙන් දුන් මුදලට පොළියකුත් සමග ඒ තිබෙන බඩු තොගය විකුණා ගන්න ඔවුන්ට අවස්ථාව ලැබෙනව.

ඒ වගේම අර්තාපල් ඇනු වැනි ඉක්මනින් නරක් වන ද්‍රව්‍ය ගාලු වරායට එවන්නය කියා ගාලු වරායෙ කම්කරුවන් ඉල්ලා තිබෙනව. ගාල්ලෙ සමිති සමාගම් කීපයකුත් ඒ ඉල්ලීම කර තිබෙනව. ගාල්ලෙ මන්ත්‍රීවරයා වශයෙන් මමත් මෙය විටින් විට කියා තිබෙනව. නමුත් කොළඹ වරායෙ කූට නිලධාරීන්, හොරකමෙහි යෙදෙන නිලධාරීන්, ඒ බඩු නැව් ගාලු වරායට යවන්නෙ නැහැ. මට මතකයි, 1958 එක්තරා අවස්ථාවකදී ඇනු අර්තාපල් වැනි ඉක්මනින් නරක් වන ද්‍රව්‍ය ගොඩ බාන්න නැව් වගයක් ගාලු වරායට යැව්වා. මොකක්ද සිද්ධ වුණේ? කොළඹ වරායෙදී "demurrage" හෙවත් නැව් ප්‍රමාද වීමේ ගාස්තු ගෙවන්නට සිදු වුණා. නමුත් ගාලු වරායෙදී "despatch money" හෙවත් නියම කාලයට කලින් බඩු බාගැනීම වෙනුවෙන් මුදලක් අපට ලැබුණා. ඒ කියන්නේ, ගාලු වරායට නැව් පිටත් කර යැවීම නිසා අපට ලාභයක් ලැබුණා. කොළඹ වරායෙදී නම් මේ අපට ලැබෙන "despatch money" වෙනුවට "demurrage" යනුවෙන් අපෙන් මුදලක් ගෙවන්නට සිදු වුණා. "demurrage" මුදල අපතේ යන මුදලක් නිසා අපට ඒ ගැන කිසි සේත්ම සතුටු වන්නට බැහැ. එසේ "demurrage" ගෙවන්නට සිදු වුණේ නිලධාරීන්ගේ වරද නිසයි. "demurrage" ගාස්තු නිසා කොළඹ වරාය මුළු ලෝකයේම අපකීර්තියට පත් වුණා. කොළඹ වරායේ නැව් ප්‍රමාද වීම නිසා ලොකු අපකීර්තියක් ලැබුණා. ඒ අපකීර්තිමත් නාමය දැන් ලෝකය පුරා පැතිරී තිබෙනවා. මේ නිසා සමහර නැව් කොළඹ වරායට නොපැමිණ සිංගප්පූරුවට යනවා. සමහර නැව් කොළඹ වරායට නොපැමිණ කොචින් වරායට යනවා. ඒ වගේම ඕස්ට්‍රේලියාවේ වරායවලට යනවා. කොළඹ වරායට ලැබී තිබෙන නරක නාමය නිසා මේ රටට සිදු වී තිබෙන්නේ ලොකු පාඩුවක්. ඒ බව තමුන්නාන්සේලා දැන ගත යුතුයි. මේ පාඩුවට හේතු වී තිබෙන්නේ කොළඹ වරායේ සේවය කරන කම්කරුවන්ගේ වරද නොවෙයි. නිලධාරීන් ලොකු වෙළඳුනුත් සමග එකතු වී කරන ජාවාරම් නිසා මේ විධියේ තත්ත්වයක් ඇති වී තිබෙන බවයි, මා කියන්නේ.

ඒ නිසා තමුන්නාන්සේලා මේ කාරණය ගැන සොයා බලන්ට ඕනෑ. මේ කාරණය ගැන සොයා බැලීම සඳහා කාරක සභාවක් පත් කරන්න. එසේ වුවහොත් නම් නියම තත්ත්වය දැන ගැනීමට තමුන්නාන්සේට පුළුවන් වේවි. දඩ මුදල් හෙවත් "demurrage" ගෙවන්න වන්නේ මොන හේතුවක් නිසාද කියා එතකොට තමුන්නාන්සේලාට පැහැදිලි කර ගන්නට පුළුවන් වේවි. කොළඹ වරායේ කම්කරුවන්ට නරක නාමයක් ලැබී තිබීම ගැන මා කනගාටු වෙනවා. කොළඹ වරායේ කම්කරුවන්ගේ නම නරක් කිරීම සඳහා පුවත්පත්වල පළ කරන වාර්තා ගැන මා කනගාටු වෙනවා. මේ කම්කරුවන් පිට අය නොවෙයි; අපේම අයයි. සමහර විට ඔවුන් අපේ නෑදෑයන් වන්ට පුළුවනි. කොළඹ වරායේ සිටින රටට ඇයට හිතැති කම්කරුවන්ට මේ විධියේ නරක නාමයක් දෙන එක ගැන කනගාටු නොවී බැහැ. මගේ අත්හදා බැලීම අනුව, මගේ දැනීම අනුව, මම ඇත්ත ප්‍රකාශ කරන්නම්. මම කොළඹ වරායේ කම්කරුවන්ගේ වෘත්තීය සමිති

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කරන ලද කැලෑ පත්තරයක්. යාපනේ තැපැල් කාර්යාලයේ මුද්‍රාවයි එහි තිබුණේ. කවුරු නමුත් යාපනයට ගිහිල්ලයි මේවා තැපැල් කරන්ට ඇත්තෙ. මේ විධියට කැලෑ පත්තර ගහන්නෙ මොකද? හමුදාව තුළ නොසන්සුන්කමක් තිබෙනවා. ඒ නිසා කැලෑ පත්තර ගහන්නෙ කවුද කියාවත් සොයා ගන්ට බැහැ. හමුදාව ඇතුළතම නොසන්සුන්කමක් තිබෙන නිසයි ඒක හොයා ගන්ට බැරි. දැන් හමුදාව ඇතුළේ ලොකු කලකිරීමක් තිබෙනවා. දේශප්‍රේමීන් එක් පැත්තක ඉන්න අතර දේශද්‍රෝහීන් අනෙක් පැත්තෙ ඉන්නවා. සොල්දාදුවන්ටත් තාඩන පීඩන කෙරෙනවා. ඒවාට විරුද්ධව නැගී සිටීමට සමිති සමාගම් මගින් සංවිධානය වන්ට ඒ අයට ඉඩක් නැහැ. ඒ නිසා සොල්දාදුවන් එකතු වී සමිති සමාගම් පිහිටුවාගෙන තමන්ගෙ දුක්ගැනවිලි ඉදිරිපත් කළොත් ඒ අයට ගෙදර යන්ටයි වෙන්නෙ. ඒ නිසා කැලෑ පත්තර ගැහිල්ලත් කෙරෙනවා. තමුන්නාන්සේලා කැමතිද මෙවැනි තත්වයක් යටතේ යුද්ධ හමුදාව පාලනය වෙනවා දකින්ට? මේ ආණ්ඩුව රෝග නිධානය බලා ප්‍රතිකාර කරන්ට ඕනෑ. සොල්දාදුවන්ට තමන්ගේ අයිතිවාසිකම් ආදිය පිළිබඳව අදහස් ඉදිරිපත් කිරීමට ඉඩ දෙන්න ඕනෑ. එසේ නොකරනවා නම් මීළඟට මෙම අංශය යටතේ වැය ශීර්ෂයක් ආවාම මේ කැලෑ පත්තර සියල්ලක්ම ගෙනැවිත් මේ ගරු සභාවට ඉදිරිපත් කරන්ට මට සිදු වෙනවා ඇති. සාමාන්‍යයෙන් මා කැමැති නැහැ කැලෑ පත්තර ඉදිරිපත් කිරීමට. ඊට හේතුව ඒවායේ අඩංගු කරුණු ඇත්තද නැද්ද කියන්ට බැරිකමයි. මීට පෙර නම් මා කැලෑ පත්තර කියෙව්වෙ නැහැ මේ ගරු සභාවේ. නමුත් ඔය විධියට දැන් ඒකත් කරන්ට සිදු වෙනවා. මේ තරම් කාලයක් ගත වී තිබෙන නමුත් හමුදාවෙ අයගේ දුක්ගැනවිලිවලට ඇහුම්කන් දුන්නෙ නැහැ. එහි දේශප්‍රේමී කොටස්වලත් මේ රටේ ජනතාවගෙත් අදහස් බලන්න ඕනෑ. මේවට ආණ්ඩුව ඇහුම්කන් දෙන්නෙ නැතිව පරණ තාලයටම වැඩ කටයුතු කරගෙන යනවා. ඒ නිසා හමුදාවේ නොසන්සුන්කමක් වැඩි වේගෙන යනවා. කවදා හෝ පිපිරීමක් ඇති වෙනවා. එහි ලකුණක් තමයි කැලෑ පත්තර පිටවීම. හමුදා නායකයාගේ මුද්‍රාවක් ඇතිව සිය ගණනින් පිට වෙනවා. ඒ නිසා මේ ගැන හරි ප්‍රතිසංවිධානයක් කළොත් හමුදාවේ ඒ කොටස් සමග සාකච්ඡා කර, අධිරාජ්‍යරාමුව කඩා දමා කතෝලික බල වේගය නැති කළොත් තමයි, ඒ නොසන්සුන්කම නැති වන්නේ. එහෙම නැතිව නිශ්ශබ්දව සිටියොත් එය වැඩි වෙනවා. ඒ හැම එකක්ම ගෙනැවිත් මේ ගරු සභාවේ කියවන්නයි දැන් සිදු වී තිබෙන්නේ. ඒ නිසා මෙය කරනවාද නැද්ද කියා අහන්න කැමතියි. ඇමති අංශ හතරක් පහක් බදාගෙන, ඇමති පුටු රත් කර ගෙන හිටියාට මදි, මෙහි තිබෙන ප්‍රශ්න නිරාකරණය කරන්නට ඕනෑ. නැත්නම් මහජනයාට ඕනෑ පිරිසක් තෝරා ගන්න ඔන්න අපි රටට යනවා යයි කියන්නට ඕනෑ. එහෙම නැතිව බල ලෝභයෙන් යුතුව, බලයෙන් මත් වී, කටයුතු කළොත් රටේ ඇති වන්නේ භයානක තත්ත්වයක්. ඒක තමයි කුමන්ත්‍රණවල බීජය; අධිරාජ්‍යවාදයේ බීජය. යුද්ධ හමුදාව තමන්ගේ වැඩ කටයුතු අතහැර දමා රට පාලනය කිරීමට අදහස් ඇති කරවන බීජ ඔවා තමයි. ඒ නිසා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හැටියට, පාර්ලිමේන්තු ක්‍රමය ආරක්ෂා කරන උදවිය හැටියට, මේ ගරු සභාවේ ගෞරවය ආරක්ෂා කරන පිරිසක් හැටියට, එවැනි නොසන්සුන් වැඩ පිළිවෙලක් තිබෙනවා නම්, ඒක මර්දනය කිරීමට ආණ්ඩුවටයි මේ රටේ මහජනයාටයි කියා දීමයි අපේ යුතුකම කියා නැවත වරක් මේ ගරු සභාවේදී කියන්නට කැමතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ආණ්ඩුව කරන ලැජ්ජ නැති වැඩේ තේරුම මොකක්ද? කොහේ හෝ කවුරු හෝ සේවයක යෙදී සිටිනවා නම්, ඔහුට අර්ථසාධක අරමුදලක් තිබෙනවා. පෞද්ගලික ආයතනවලත් තිබෙනවා; රජයෙත් තිබෙනවා. එහෙනම් යුද්ධ හමුදාවෙ සොල්දාදුවන්ට එය නැත්තෙ ඇයි? ඔවුන්ට අර්ථසාධක අරමුදල් පහසුකම් නැහැ. ඒ අය එතන වැඩ කරනවා. ඕක ස්ථිර රක්ෂාවක් නොවෙයි. නිලධාරීන්ට තරහ ගියොත් අවුරුද්දෙන් දෙකෙන් පන්නා දමනවා. නිලධාරීන්ට ඔළුව පාත් කරලා, ඔළුව කහලා, හිටියොත් අවුරුදු 10 ක් 12 ක් ඉන්න පුළුවන්. විශේෂයෙන්ම සොල්දාදු

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

[කේ. එම්. පී. රාජරත්න මයා.]

වන්ට මොන පඩියක්ද ලැබෙන්නෙ? නිලධාරීන්ට නම් ලොකු පඩි ලැබෙනවා. ඔවුන්ට නම් ලොකු ආදායමක් තිබෙනවා. මොවුන්ට මෙය නොදෙන්නෙ ඇයි? මේක ලොකු අඩුපාඩුවක්. මේ ගැන ආණ්ඩුවේ හිත් යොමු නොකළ එක කනගාටුවට කාරණයක්. සොල්දාදුවා මනුෂ්‍යයෙක් හැටියට සලකන්නේ නැහැ; නිලධාරීන් පමණයි මිනිසුන් හැටියට සලකන්නේ. සොල්දාදුවන් වෙනුවෙන් කිසිවක් කරන්නේ නැහැ. ඒ නිසා මේ අර්ථසාධක අරමුදලට බැඳීමට සොල්දාදුවන්ටත් ඉඩ දෙනවාද කියා මා අහනවා.

ඒ වාගේම තමුන්නාන්සේ දකින්න ඇති—න්‍යායපත්‍රයටත් අඩංගු වී තිබෙනවා—හිටපු හමුදාපතිවරයෙක්. වූ බ්‍රිගේඩියර් මුතුකුමාරු මහතාට විශ්‍රාම වැටුපක් දෙන්නට යනවා. ඒ මහත්මයා දැන් තානාපතිවරයෙක්. විශ්‍රාම ගියාට පසුව විශ්‍රාම වැටුපක් දුන්නා, නැත්නම් දෙන්නට යනවා. දැනුත් හොඳ පඩියක් ගන්නවා. උසස් නිලධාරීන් නම් ඉල්ලන ගණනක් විශ්‍රාම වැටුප් පහසු වෙන්ම දෙනවා.

මේ සම්බන්ධයෙන් නිදර්ශන කීපයක්ම මේ ගරු සභාවට ඉදිරිපත් කරන්ට යෙදුණා. මමත් එක නිදර්ශනයක් ඉදිරිපත් කරන්ට කැමතියි. යුද්ධ හමුදාවේ කතෝලික බලවේගයට විරුද්ධව කටයුතු කළ, පීටර් ගමන්පිල්ලේ කියා නිලධාරියෙක් සිටියා. යුද්ධ හමුදාවේ කතෝලික බලවේගයට විරුද්ධව මොහු කෙළින්ම මුහුණ දී සටන් කළා. ඒ වාගේම මොහු ඉතා දක්ෂ නිලධාරියෙක්. අවාසනාවකට වගේ දැනට අවුරුද්දකට පමණ ඉහත දී මොහුට පිළිකා රෝගය සැදුණා. ඉන්පසු රෝහලේදී කරන ලද ශල්‍ය කර්මයකින් පසුව මේ නිලධාරියා මිය ගියා. මෙම නිලධාරියාට පිළිකා රෝගය සැදුණේ හදිසියේ බැවිනුත්, යුද හමුදා නීතිරීතිවලට සම්පූර්ණයෙන්ම අවනතව මෙම නිලධාරියා කටයුතු කළ බැවිනුත් ,ඔහුට හරි හැටියට බෙහෙතක්වත් පාවිච්චි කරන්න අවසථාවක් ලැබුණේ නැහැ. දැනට මෙම නිලධාරියා මිය ගොස් අවුරුද්දක් පමණ වන නමුත්, තවමත් ඒ නිලධාරී මහත්මයාගේ නෝනාට විශ්‍රාම වැටුපක් ලබා දීමට මේ රජය ක්‍රියා කර නැහැ. ඒ මහත්මියට විශ්‍රාම වැටුපක් වෙනුවට දැන් පාරිතෝෂික මුදලක් දෙන්න යනවාලු. කතෝලික ව්‍යාපාරයේ බලමහිම යයි ඒ. මෙම ආණ්ඩුවට පක්ෂපාතව සේවය කර අවසානයේ අවාසනාවන්ත ලෙස මරුමුවට පත් නිලධාරියකුගේ භාර්යාවටවත් මේ ආණ්ඩුව විශ්‍රාම වැටුපක් දෙන්නේ නැහැ. ඒ වෙනුවට පාරිතෝෂික මුදලකුයි දෙන්න යන්නේ. මේ කරුණු සම්බන්ධයෙන් වගකිවයුත්තෝ කවුද? මේ කරුණු සම්බන්ධව ක්‍රියා කිරීමට සභානායක තුමාට බලයක් තිබෙනවා නම් කරුණා කර මේ ගැන පරීක්ෂා කර බලන්න. මේවා සම්බන්ධව නිලධාරීන්ගෙන් ලැබෙන කඩදාසි පමණක් කියවා තමුන්නාන්සේට සත්‍ය කරුණු අවබෝධ කර ගන්ට බැහැ. ඒ කඩදාසිවල තිබෙන්නේ අප කියන දේවලට විරුද්ධ කරුණුයි. ඒ නිසා මේවා ගැන සම්පූර්ණ පරීක්ෂණයක් පවත්වන්න ඕනෑ. මේ කරුණු අප මීට පෙරත් මේ ගරු සභාවට ඉදිරිපත් කළා. මේ සියල්ලටම හේතුව ආණ්ඩුවේ අකාර්‍යක්ෂමතාවයි. මා සඳහන් කළ කාරණය ගැන පරීක්ෂණයක් කර එම නිලධාරියාගේ භාර්‍යාවට විශ්‍රාම වැටුපක් දෙනවාද කියා මම ප්‍රශ්න කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, යුද්ධ හමුදාව ගැන අප දීර්ඝ වශයෙන් කරුණු ඉදිරිපත් කර තිබෙනවා. අදත් සුළු වශයෙන් මම කරුණු සවල්පයක් ඉදිරිපත් කළා. මා කරන ලද විවේචන භාර ගෙන යුද්ධ හමුදාවේ ප්‍රතිසංස්කරණයක් ඇති කරාවියයි මම බලාපොරොත්තු වෙනවා. තවද යුද හමුදාව ඇතුළත සිංහල පණත ක්‍රියාත්මක කරවිය යුතුයි. ඉංග්‍රීසි විභාග සමර්ථවූවන්ට නොව සිංහල උගතුන්ට යුධ හමුදාවේ තැන දිය යුතුයි. ඒ වාගේම යුද හමුදාවේ කතෝලික බලවේගය කඩා දැමිය යුතුයි. නිලධාරීන්ට මෙන්ම සාමාන්‍ය සොල්දාදුවන්ටත් මනුෂ්‍යයන්ට මෙන් සැලකීමේ වැඩ පිළිවෙළක් ඇති කළ යුතුයි. මේ සියලුම කාරණා සම්බන්ධව රජය මොන අන්දමේ පියවරක් ගන්නවාද කියා අපි දැනගන්ට සතුටුයි. අවසාන වශයෙන් හදිසි තත්ත්වය තවදුරටත් පවත්වා ගෙන යෑම ගැන අපේ බලවත් විරුද්ධත්වය ප්‍රකාශ කරනවා.

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

පූ. භා. 7.25

**සුමනපාල දහනායක මයා. (දෙණියාය)**
*(திரு. ஸுமனபால தகநாயக்க—தெனியாய)*
(Mr. Sumanapala Dahanayake—Deniyaya)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, යුද්ධ හමුදාව සඳහා රුපියල් ලක්ෂ 35 ක් මේ වැය ශීර්ෂයෙන් බලාපොරොත්තු වෙනව. මේ රටේ තව දුරටත් හදිසි නීති පවත්වාගෙන යෑම ගැන මා පළමුකොටම මගේ විරෝධය ප්‍රකාශ කරන්ට කැමතියි. අපි දන්නවා, මේ හදිසි නීති එදා උතුරේත්, නැගෙනහිරත් ඇති වුණු සිද්ධීන් නිසා ප්‍රකාශයට පත් කළ බව. ඒ අවස්ථාවේදී මා සිටියේ ආණ්ඩු පක්ෂයේයි. ඒ අවස්ථාවේ හදිසි නීති පැනවීම ගැන අපි සම්පූර්ණයෙන්ම එකග වුණා. මන්ද? ඒ අවස්ථාවේ පැනනැගුණු තත්ත්වය උඩ එය කළ යුතු කටයුත්තක් නිසා. නමුත් අද එවැනි කලබලකාරී තත්ත්වයක් මේ රටේ නැහැ. එම නිසා මේ හදිසි නීති තව දුරටත් පාවිච්චි කරන්නේ රජය ආරක්ෂා කරගෙන බලය තහවුරු කර ගැනීමට බව අපට හොඳ හැටි පෙනී යනව.

අද රට මුහුණ පා තිබෙන තත්ත්වයේ හැටියටත්, අද රජය අනුගමනය කරන ආර්ථික වැඩ පිළිවෙළේ හැටියටත්, යුද්ධ හමුදාව වෙනුවෙන් රුපියල් ලක්ෂ 35 ක් වියදම් කිරීම කොපමණ අපරාධයක්ද කියා මට කල්පනා වෙනව. පසුගිය අයවැය ලේඛනයේදී මුදල් නැතිකම නිසා දුප්පත් ජනතාවට ලැබෙන හාල් සේරු දෙකෙන් සේරු භාගයක් කපන්ට මේ රජය ලැහැස්ති වුණු බව තමුන්නාන්සේට මතක ඇති. එපමණක් නොවෙයි, පිටරට වලින් මෙරටට ගෙන්වන බඩුවල තීරු බද්ද සියයට 20 කින් වැඩි කළා. මුදල් අමාරුය කියමින් මහජනයා මත මෙවැනි බර පටවන මේ ආණ්ඩුව මහජන මුදල් කොයි අන්දමටද පාවිච්චි කරන්නේ කියන එක අපට මෙයින් හොඳ හැටි පෙනී යනව. හදිසි නීති නඩත්තු කිරීම සඳහා යුද්ධ හමුදාවට රුපියල් ලක්ෂ 35 ක් වියදම් කිරීම සුළු දෙයක් නොවෙයි. මේ හදිසි නීති තව දුරටත් පවත්වාගෙන යාම අවශ්‍යය කියා අපට පෙනෙන්නෙ නැහැ. අද මුළු රටම පිළිගෙන තිබෙනව, මේ හදිසි නීති මාස ගණනක් තිස්සේ දික් කරගෙන ගිය නිසාය පසුගිය ජනවාරි 27 වැනිදා, යුද්ධ හමුදාවෙත් පොලිස් හමුදාවෙත් පිරිසක් මේ රජය පෙරලීමට කුමන්ත්‍රණයක් ඇති කළේ කියන කාරණය. එදා හදිසි නීතිය කියා කිව්වාම ඊට මිනිස්සුන්ගෙ සැලකිල්ලක් තිබුණා. මේ දිග්ගැස්සීම නිසා දැන් ඒ ගැන කිසිවෙක් සැලකිල්ලක් දක්වන්නෙ නැහැ. පසුගිය ජනවාරි 27 වැනිදා ඇති වූ කුමන්ත්‍රණය අසාර්ථක වුණත්, මේ හදිසි නීති තව දුරටත් මේ අන්දමට පවත්වාගෙන ගියොත් සාර්ථක වන කුමන්ත්‍රණ ඉදිරියේ දී ඇති වන්ට ඉඩ තිබෙන බව අපට කිසි සැකයක් නැතිව කියන්ට පුළුවනි. මේ හදිසි නීති තව දුරටත් පවත්වාගෙන යාමෙන් ඊට මේ රජය අනුබල දෙනවාය කියන්ට පුළුවනි.

මේ රජය නිතර ගම්බද ජනතාව ගැන කථා කරනවා ; නමුත් ගම්බද පළාත්වලට කිසිම සේවයක් කරන්නෙ නැහැ. මේ හදිසි නීති දිග්ගස්සමින් යුද්ධ හමුදාවටත් ස්වේච්ඡා සේවක හමුදාවටත් වියදම් කරන මුදල ගම්බද පළාත්වලට වැය කරනව නම්, එයින් විශාල සේවයක් සිදු වෙනව. අපේ ආසනවල තිබෙන පාසැල් වලට ගොඩනැගිලි නැහැ, ගුරුවරුන් බඩුමුට්ටු නැහැ. අපි කනගාටු වෙනවා. එහෙම අවස්ථාවක මේ අන්දමේ විශාල මුදලක් යුද්ධ හමුදාවට වියදම් කිරීම ගැන. ගම්බද ප්‍රදේශවල සෞඛ්‍ය තත්ත්වය ගැන කල්පනා කර බලමු. ඒ පළාත්වල ආරෝග්‍යශාලා වලට අවශ්‍ය දොස්තරවරුන් නැහැ. ඒ පළාත්වල ආරෝග්‍යශාලාවල ගොඩනැගිලි ආදිය තනා දීමට රජයේ කිසිම උනන්දුවක් නැහැ. රජයේ එකම උනන්දුව අපට පැහැදිලිව පෙනී යනව. රජයේ අදහස මැතිවරණ කාලයේ දුන් පොරොන්දු ඉටුකර ගම්බද පළාත් වලට සේවයක් කිරීම නොවෙයි. එසේ නැත්නම් ගම්බද ජනතාවගේ දුප්පත්කම නැති කිරීම නොවෙයි. ආණ්ඩුවේ බලාපොරොත්තුව නොයෙක් විධියේ පොරොන්දු උඩ මහජනයාගෙන් ලබා ගත් බලය හදිසි නීතිවල මුවාවෙන් ආරක්ෂා කරගෙන ඒ බලයේ රැඳී සිටීමයි.

එක කාරණයක් මතක් කරන්ට කැමතියි. ස්වේච්ඡා හමුදාවේ උසස් නිලධාරීන් බොහෝ දෙනකු ආණ්ඩුවේ වෙනත් දෙපාර්තමේන්තුවල සේවය කරන අයයි. හදිසි නීතිය දිගටම පවත්වාගෙන යන නිසා—වෙනත් විධියකට කියතොත් ඒ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සුමනපාල දහනායක මයා.]
අය ස්වේච්ඡා හමුදාවේ සේවයෙහි රඳවා ගෙන සිටින නිසා—රජයේ සේවකයන් වශයෙන් ඒ අයගෙන් සිදු වියයුතු සේවය සිදු වන්නේ නැහැ. අපේ පළාත්වලට ඒ අයගේ සේවය ලැබෙන්නේ නැහැ. නමුත් ඒ අය රජයේ දෙපාර්තමේන්තුවලින් ලැබෙන වැටුපත් හමුදාවෙන් ලැබෙන වැටුපත් යන දෙකම ලබා ගන්නවා. මුදල් නාස්ති වන්නේ මේ විධියටයි.

මා මේ වැය ශීර්ෂය ගැන වැඩි දුර කථා කරන්නට නම් බලාපොරොත්තු වන්නේ නැහැ. කෙළින්ම කිව යුතුව තිබෙන්නේ මා මේ වැය ශීර්ෂයට සම්පූර්ණයෙන්ම විරුද්ධ බවයි. මහජනයා පිට නොයෙකුත් බදු බර පටවමින්, ඔවුන්ට ලැබෙන සහල් සලාකයෙන් සේරු බාගයක් පවා කැපීමට ලැස්ති වෙමින්, ඒ වගේම ඔවුන්ට බොරු පොරොන්දු දෙමින්, තමන් ලබා ගත් බලය තහවුරු කර ගැනීමට රජය ක්‍රියා කිරීම ගැන බලවත් විරුද්ධත්වය ප්‍රකාශ කරන අතර හමුදාව සඳහා මේ රුපියල් ලක්ෂ 35 වෙන් කිරීම ගැනත් විරෝධය පළ කර මින් මගේ වචන ස්වල්පය අවසන් කර නවා.

පූ. භා. 7.33

**ඉඹුලාන මයා.**
*(திரு. இம்புலான)*
(Mr. Imbulana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා මේ ගරු සභාවේ කාලය වැඩි වේලාවක් ගන්නට බලාපොරොත්තු වන්නේ නැහැ. මේ වැය ශීර්ෂය යටතේ කථා රාශියක් කෙරුණා. ඒ නිසා මා කරන්නේ සුළු කථාවක්. දැනට මාස ගණනකට පෙර ස්වේච්ඡා හමුදුවට ආධුනිකයන් බඳවා ගන්නට යෙදුණා. මේ කාරණයේදී බොහෝ අක්‍රමිකතා සිදු වුණා. අපේ ප්‍රදේශයේ තල්දුව කියා ගමක් තිබෙනවා. බණ්ඩාරනායක මිනී මැරුමට වැරදිකරු වී දඬුවම් ලැබූ සෝමාරාම මේ ගමේ උපන් කෙනෙක්. ඒ පුද්ගලයාට ලැබුණු ඉරණම කවුරුත් දන්නවා ඇති. ඒ ගමේ තවත් තරුණයන් බොහෝ දෙනෙක් සිටිනවා. වයෝවෘද්ධ අයත් සිටිනවා. මේ අයගෙන් බොහෝ දෙනකුට රක්ෂා නැහැ. රක්ෂා නැති තරුණයන් කීප දෙනෙක් ස්වේච්ඡා හමුදාවේ ආධුනිකයන් වශයෙන් බැඳීමට ඉදිරිපත් වුණා. ඒ අයට හොඳ සුදුසුකම් තුබුණත්

**සුමනපාල දහනායක මයා.**
*(திரு. ஸுமனபால தகநாயக்க)*
(Mr. Sumanapala Dahanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගණපූරණයක් නැහැ.

මන්ත්‍රී මණ්ඩලය ගණන් කොට ගණපූරණයක් නොමැති වූයෙන්, බෙදුම් සීනු ශබ්ද කිරීමට නියෝග කරන ලදී.

පසුව ගණපූරණයක් තුබූයෙන්—

**ඉඹුලාන මයා.**
*(திரு. இம்புலான)*
(Mr. Imbulana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තල්දුව ගමේ තරුණයන් රාශියක් යුද හමුදාවට බැදෙන්න ඉදිරිපත් වී තිබෙනවා. ඔවුන්ට විශේෂ සුදුසුකම් තිබුණත්, ඔවුන්ගේ ඇඟපත නිසි පරිදි වැඩී තිබුණත්, ඔවුන් අවශ්‍ය විභාග ආදියෙන් සමත් වී තිබුණත්, එම කටයුත්ත සඳහා ඉදිරිපත් වූ විට ලැබී තිබෙන ප්‍රතිඵලය කුමක්ද? "උඹලා තල්දුව ගමේ මිනිස්සු, එම නිසා යුද හමුදුවට බඳවා ගන්නෙ නැහැ" කියන පිළිතුරයි, ලැබිල තියෙන්නෙ.

**ඩබ්ලිව්. දහනායක මයා.**
*(திரு. டப்ளியு. தகநாயக்க)*
(Mr. W. Dahanayake)
කවුද එහෙම කියල තියෙන්නෙ?

**ඉඹුලාන මයා.**
*(திரு. இம்புலான)*
(Mr. Imbulana)
"රික්රූටිං ඕෆිසර්" නැතිනම් "ඉන්ටවිව් ඕෆිසර්" තමයි, කියල තියෙන්නෙ. එවැනි තත්ත්වයක් අද යුද හමුදුවෙ පවතිනවා. එසේ පක්ෂග්‍රාහීව යුද හමුදුව ක්‍රියා කරනවා නම්, මෙම වැය ශීර්ෂය යටතේ මේ මුදල් වියදම් කිරීම ගැන අපේ සම්පූර්ණ විරුද්ධත්වය පළ කරනවා. හමුදුවට බැඳීමට ගිය අස්ථාවලදී පමණක් නොවෙයි, රජයේ වෙනත් සේවාවලට බැදෙන්නට ගිය අවස්ථාවලදීත් ඔවුන්ට ලැබිල තියෙන පිළිතුර එයයි. "උඹල තල්දුව ගමේ—සෝමාරාමගෙ ගමේ—මිනිස්සු. එම නිසා ආණ්ඩුවේ සේවයට බඳවා ගන්න බැහැ" කියන පිළිතුරයි ලැබිල තියෙන්නෙ. විශෙෂයෙන් යුදහමුදුවටත්, ඒ වාගේම පොලිස්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පරිපූරක මුදල්

හමුදාවටත් වෙනත් රජයේ දෙපාර්තමේන්තුවලටත් බැදෙන්න ඉදිරිපත් වුණු අවස්ථාවලදී මෙසේ සිදු වෙනවා නම් එය මොන තරම් අපරාධයක්ද කියා මා ප්‍රශ්න කරනවා. සෝමාරාම උපන් තල්දූව නමැති ගමේ ඉපදුනු පලියට මෙහෙම සලකනව නම් ඒක විශාල අපරාධයක්.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

කී දෙනෙකුට එහෙම බැදෙන්න බැරි වුණාද ?

**ඉඹුලාන මයා.**
*(திரு. இம்புலான)*
(Mr. Imbulana)

මා දැනුවත්ව හතර දෙනෙකුට. "තොපි" කියලයි ආමන්ත්‍රණය කරල තියෙන්නෙ. මා මෙහිදී "උඹල" කියා යෙදුවෙ ශිලාචාරකම සලකාගෙනයි.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

එහෙම වැඩ පිළිවෙළක් තියෙනව නම් ඒක සම්පූර්ණයෙන්ම වැරදි බව කියන්න කැමතියි. එසේ කියා තිබෙන නිලධාරීන්ගේ නම් සහ ඒ අන්දමට රාජ්කාරිය ලබා ගන්න බැරි වෙච්ච අයගේ නම් ඉදිරිපත් කළොත් පරීක්ෂා කර බලන්න පුළුවනි.

**ඉඹුලාන මයා.**
*(திரு. இம்புலான)*
(Mr. Imbulana)

ඒ නම් දෙවනුව ඉදිරිපත් කරන්නම්. මේ අවස්ථාවේදි ඒ නම් මා ළඟ නැහැ. "රික්රූටිං ඕෆිසර්" ගෙ නමත් මා ළඟ නැහැ, මේ අවස්ථාවෙදි. විභාගවලට ඉදිරිපත් වුණු අයගෙ පැමිණිලි අනුවයි, මා මෙම කරුණු ඉදිරිපත් කළේ. යුද හමුදාවේ මෙවැනි අක්‍රමිකතා කෙරෙනව නම් එය බරපතළ අපරාධයක්. මෙහෙම පක්ෂග්‍රාහි ක්‍රියා කරන අයගේ ව්‍යාපාර කටයුතු සඳහා මහජන මුදල් යොදවනවා නම් ඒ ගැන අපේ සම්පූර්ණ විරුද්ධත්වය ප්‍රකාශ කරන්න කැමතියි.

ඒ සමගම මම දැනගන්න සතුටුයි, යුධ හමුදාවට ආධුනිකයන් බඳවා ගන්න අවස්ථාවේදී තරුණයන් කී දෙනකු ආධුනිකයන් වශයෙන් බඳවා ගත්තාද කියා. එසේම දොම්පේ ආසනයෙන් කී දෙනකු බඳවා ගත්තාද, අත්තනගල්ල ආසනයෙන් කීදෙනකු බඳවා ගත්තාද, මොරටුව ආසනයෙන් කීදෙනකු බඳවා ගත්තාද, පානදුර ආසනයෙන් කීදෙනකු බඳවා ගත්තාද, ආදි වශයෙන් දැන ගන්නට සතුටුයි. අද බැරි වුණත් පසුව හෝ ඒ විස්තර ලැයිස්තුව මේ ගරු සභාවට ඉදිරිපත් කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

ඒක දැන් කියන්න පුළුවන්කමක් නැහැ. ගරු මන්ත්‍රීතුමා ප්‍රශ්නයක් ඉදිරිපත කළොත් ඒ විස්තර සියල්ලම ඉදිරිපත් වෙයි.

**ඉඹුලාන මයා.**
*(திரு. இம்புலான)*
(Mr. Imbulana)

මම ප්‍රශ්නයක් ඉදිරිපත් කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ අභිනව මුදල් ඇමතිතුමා මෙවැනි කරුණු ගැන මේ ගරු සභාවේ අදහස් විමසන ගතියක් පෙනෙනවා. අප කරන පැමිණිලිවලට එතුමා ඇහුම්කන් දෙන ගතියක් පෙනෙනවා. එතුමා කලින් හිටපු උජාරු මුදල් ඇමතිවරයා වගේ නොවෙයි. එයාගෙ නම් ළඟටවත් කිට්ටු වන්නට බැරි තත්ත්වයක් තිබුණේ. ඉංග්‍රීසියෙන් කියනවා "බම්ෂස්" කියා. ඒ මුදල් ඇමතිවරයා ප්‍රපාතයට වැටීමට හේතු වුණේත් ඒ ආඩම්බරකම, උජාරුකම, බව මම කිසිම සැකයක් නැතිව මේ සභාවේ කියනවා. විරුඬ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන්ගෙන් සියයට සියයකගේ නැත් නම් අඩුම ගණනේ සියයට අනුවකගේවත් අදහසයි, මම මේ ඉදිරිපත් කරන්නෙ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, යුධ හමුදාවේ ප්‍රතිසංස්කරණ රාශියක් කරන්නට ඕනෑ. අක්‍රමිකතා රාශියක් එතන කෙරෙනවා. සමහර විට මේවා උසස් නිලධාරීන් නොදන්න කාරණා වෙන්න ඇති; දෙවැනි, තුන්වැනි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉඹුලාන මයා.]

තත්ත්වයේ නිලධාරි දන්නවා ඇති. මේවා සුළු නිලධාරීන්ගෙ වැරදි නිසා කෙරෙන දේ වන්නට ඇති. එම නිසා විශේෂයෙන් පරීක්ෂා සහිතව මේ දෙපාර්තමේන්තුවේ වැඩ කටයුතු ගෙන යන සැටියට මම ඉල්ලා සිටිනවා.

රුවන්වැල්ල පළාත්වාසීන් වෙනුවෙන් හදිසි නීතිය ගැන වචන දෙක තුනක් කියන්නට ඕනෑ. හදිසි නීතිය පවත්වා ගෙන යෑමෙන් වැඩක් නැති බව ඇමති තුමාටත් ආණ්ඩුවටත් අවබෝධ වෙනවා ඇති. ඒ නිසා මහජනයාට තව තවත් දඬුවම් නොදී, මේ අභිනව මුදල් ඇමති තුමා රාජකාරිය භාර ගත්තට පස්සෙ මේ ගැන විශේෂ සැලකිල්ලක් යොදා, කැබිනට් මණ්ඩලයේ තීරණයක් අරගෙන, මේ හදිසි නීතිය වහම ඉවත් කරගෙන මහජනයාට ප්‍රයෝජනවත් වන විධියට මේ ආණ්ඩුවේ වැඩ කටයුතු කරගෙන යන ලෙස මම ඉල්ලා සිටිනවා.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

Several hon. Members wanted to know whether I am Parliamentary Secretary to the Minister of Defence and External Affairs. I wish to say that I am not. I also wish to say that in any matter before the House any one Minister can speak on behalf of another Minister. It is in that capacity that I, as Minister of Agriculture, Land, Irrigation and Power, have undertaken to pilot this Supplementary Estimate through the House.

Questions were asked about the reorganization of the army. Reorganization has taken place and is taking place. Three regiments of the Volunteer Force have been disbanded ; a completely new volunteer regiment has been raised ; two regular artillery regiments are in the process of being reduced to one : an intermediate headquarters between the army headquarters and the units has been established for closer control of units, and an army security section has been created.

As for Colonel Ratwatte, as you are aware, he is a senior volunteer officer and he is now merely officiating as Commandant, Volunteer Force, till a permanent appointment is made from the regular army. It is incorrect to say that he is to be second in command of the regular army.

In regard to selections for training abroad, this work is done by army selection boards. The names of members of these boards are approved by the Ministry of Defence and External Affairs.

The question was asked as to what chances Sinhalese-speaking and Sinhala-educated youths have of becoming officers. Recently, 21 other ranks have been selected by the army selection boards for training as officers. That is a good beginning. Some time back it was thought impossible to carry out the official language policy in the army in respect of commands, and so on, but after this Government came into power commands are given and drills are carried out in Sinhala. We have made that important change.

Reference was made to Catholic Action and Catholics in the army. There was a time before this Government came into power when certain classes of people did not wish to join the army while, on the other hand, there were others who were keen to do so. Naturally, the senior posts in the army came to be held by those who had joined earlier.

ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பி. ஆர். குணவர்தன)
(Mr. D. B. R. Gunawardena)

That is an incorrect statement.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

There was also a time when regular army officers were not specially recruited. It just happened that certain people held certain posts in the army. Of course, our Government in 1956 did not make a clean sweep of the army. Certain reforms were carried out gradually, and not as fast as certain people would have wished.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

Certain privileged schools were recommending their students for places in the army.

ගරු සී. පී.ද සිල්වා
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

That may have been so. And certain other schools may have discouraged their students from joining the army on religious and other grounds. That really is what had happened and that explains the composition of the army. I am not discussing the motives or reasons why people chose to act in this way ; I am only telling you what happened.

ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

If that is what happened you must completely change the state of affairs.

ගරු සී. පී. ද සිල්වා
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

That is exactly what we are doing.

The Hon. Prime Minister as Minister of Defence and External Affairs controls the army. As I said earlier she goes through HANSARD carefully, studies what has been said by hon. Members and tries to put into operation whatever she thinks is reasonable and which she accepts. She is always very responsive to the views and ideas expressed in this House.

It is correct to say that the frank of the commander of the army has been forged and used on envelopes to send some anonymous circulars to Government officials as well as outsiders. Both the C. I. D. and the Army Investigations Branch are trying to find out the culprits who are doing this.

I believe the hon. Member for Welimada (Mr. Rajaratna) spoke about pensions and provident funds for army personnel. There is a Pension and Gratuities Code under which all army personnel in certain circumstances are entitled to pensions and gratuities. There is no contributory provident fund as yet in the army. I shall bring the point mentioned by the hon. Member regarding a provident fund for army personnel to the notice of the Hon. Prime Minister. I believe that army personnel are entitled to pensions in the event of their death while in military service, but what the hon. Member was speaking of was the case of soldiers going back to civilian life after a period of military service. I think it is a useful idea.

To conclude, this question of the army has been examined for about four days during the Committee stage of the Budget Debate. The Supplementary provision now asked for is for money already spent during the current financial year and for services rendered by the Volunteer Force on account of the Emergency.

නියෝජ්‍ය කථානායකතුමා
*(பிரதிச் சபாநாயகர்)*
(Mr. Deputy-Speaker)

I will now put the Question to the House.

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

## පරිපූරක මුදල : තාවකාලික ණය සඳහා පොලී

## *குறைநிரப்புத் தொகை : தற்காலிக கடன் மீதான வட்டி*

## SUPPLEMENTARY SUPPLY : INTEREST ON TEMPORARY BORROWINGS

ගරු සී. පී. ද සිල්වා
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

I move,

That a supplementary sum not exceeding Rupees seven hundred and sixty three thousand two hundred (Rs. 763,200) be payable out of the Consolidated Fund of Ceylon, or any other fund or moneys of, or at the disposal of, the Government of Ceylon or from the proceeds of any loans obtained by the Government of Ceylon,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු සී. පී. ද සිල්වා]

for the service of the financial year beginning on 1st October, 1961, and ending on 30th September, 1962, and that the said sum may be expended as specified in the Schedule hereto :—

*Schedule*

| | Rs. |
|---|---|
| Head 44—Miscellaneous Services. | |
| Vote No. 2—Administration Charges—Recurrent Expenditure .. | 763,200. |

A sum of Rs. 400,000 has been provided in the current year's estimates under Head 44, Vote 2, Sub-head 22 to meet the interest payable on temporary borrowings made by Treasury from Government institutions. This amount is found to be insufficient and an additional sum of Rs. 763,200 is required under this sub-head.

It is not possible to estimate accurately in advance the extent of liability in respect of interest on temporary borrowings made by the Treasury from Government institutions as such borrowings are made in order to meet Government's immediate cash requirements. Sums deposited with the Treasury by Government institutions up to the end of June 1962, included Rs. 26,500,000 from the Tea Subsidy Fund, Rs. 17,989,258 from the Rubber Replanting Subsidy Fund and Rs. 2,600,000 from the Special Areas (Colombo) Development Board. In consequence the interest on temporary borrowings for the first half of the financial year amounted to Rs. 602,677 of which Rs. 378,427 only has been paid. Interest falling due for payment in the second half of the year is estimated at Rs. 595,523. On the basis of these figures and having regard to the anticipated saving of Rs. 35,000 available for transfer from sub-heads of Vote 4, Head 44, it is estimated that a sum of Rs. 1,163,200 approximately is required for the current year necessitating an additional provision of Rs. 763,200 on the amount already provided.

This is to pay interest.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

These borrowings have been made from other moneys.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

Moneys deposited with the Treasury by Government departments.

පූ. භා. 7.53

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මහා භාණ්ඩයේ නැන්පත් කරන මුදල් නැති වන කාරණයද ඒ නිසා සිදු වන දෙයද පිළිබඳ විස්තරයක් මා දෙන්න ඕනෑ. තේ රබර් ආදිය අළුතෙන් වගා කිරීම පිළිබඳව ඇති කර තිබෙන අරමුදලේ ආධාර ලැබෙන අයට තමන්ට ඕනෑ වේලාවට එම මුදල් ලබාගන්න නැහැ. මෙසේ මුදල් ලබා ගන්න ප්‍රමාද වීම හේතුකොටගෙන සිදු වන්නෙ මෙයයි. පළමුවන කාර්තුවට ලැබෙන ආධාර මුදල ලබාගෙන ඉඩම එළි පෙහෙළි කර අනික් වැඩ කටයුතු කිරීමට අනික් කාර්තුවෙන් ලැබෙන ආධාර මුදල බලාපොරොත්තුවෙන් සිටින නමුත්, මුදල් වේලාවට මහා භාණ්ඩයෙන් ලබා ගන්න බැරි වීම නිසා එම ඉඩම නැවතත් වල් බිහි වී යනවා. මේ කාරණය නිසා ආධාර මුදල් ලබා ගන්න තැනැත්තාට 2 වන කාර්තුවේ මුදල් ප්‍රමාද වී ලැබුණාම මුලින් කර තිබුණ දේ නැවතත් කිරීමට සිදු වෙනවා. මේ ප්‍රමාදය සිදු වන්නේ— මේ අන්දමේ අමාරුකම්වලට මුහුණ පාන්න සිදු වන්නේ—මහා භාණ්ඩයෙන් මෙම දෙපාර්තමේන්තුවට යවන මුදල ප්‍රමාද වන නිසයි.

එක තැනක දෙකක නොවෙයි, මේ පමාව ඇති වී තිබෙන්නේ. මුළු රටේම අළුත් වගාව, අවුරුදු ගණනක් ගෙන ගිය එක, තමුන්නාන්සෙලාගේ ප්‍රමාද කිරීමේ වැඩ පිළිවෙල උඩ, මුදල් වුවමනා වෙලාවට දෙපාර්තමේන්තුවට නොදීම නිසා, කලට වෙලාවට කර ගන්න බැරුව තිබෙනවා. පොඩි වතු හිමියන්ට වතු එළිපෙහෙළි කර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගැනීමට බැරි වීම නිසා කලට වෙලාවට පැළ නගා සිටුවා ගැනීමට බැරි වී තිබෙනවා. පෝර ගැනීමට බැරි වී තිබෙනවා. මේ නිසා මේ අළුතින් වගාකිරීමේ වැඩ පමා වෙනවා. මුදල් වුවමනා වෙලාවට නොදීම නිසා වන්නේ භයානක දෙයක්. රබර් වගාව වත්, තේ වගාවටත් අනිකුත් වගාවන් වත් ආධාර දීමේ වැඩ දෙපාර්තමේන්තුව බොහොම හොඳින් කරගෙන ආවා. නමුත්

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

අක්කර ලක්ෂ දෙකයි, වවන්න තිබුණේ. 1960-61 වර්ෂයේදී 1,60,000 ක් වවා තිබෙනවා. 1961-62 වර්ෂයේදී 20,000ක් වවා තිබෙනවා. 1962-63 වර්ෂ යේදී 20,000ක් වවන්න මුදල් වෙන් කර තිබෙනවා. ඒ ඉඩම් ප්‍රමාණයත් වවනවා ඇතැයි මම විශ්වාස කරනවා. 1962-63 මුදල් වර්ෂය අවසන් වන විට අක්කර ලක්ෂ දෙකම වගා වී අවසන් වේවි. මහා භාණ්ඩාගාරයෙන් ගන්න මුදල් ඒ කාරණා වලට අවශ්‍ය මුදල් ඇරලයි, ගන්නේ. ගෙවීමේ යම් ප්‍රමාදයක් තිබෙනවා නම් ඒ වෙන්නේ වෙනත් කාරණා නිසයි. අළු තෙන් රබර් වැවීමේ ව්‍යාපාරය දස අවුරුදු සැලැස්ම අනුව හොඳින් කෙරීගෙන යනවා.

ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பி. ஆர். குணவர்தன)
(Mr. D. B. R. Gunawardena)

තමුන්නාන්සේ කොයි ආකාරයට කිව් වත් ඒ දෙපාර්තමේන්තුව බොහොම හොඳින් ඒ කටයුතු කළා. වුවමනා වෙලා වට පරීක්ෂා කර බැලුවා. තමුන්නාන්සේ කොයි විධියට කිව්වත් වුවමනා මුදල් එතැනට නියම වෙලාවට ලැබෙනවා අඩුයි. ඒ නිසා අළුත් වගාවන් දියුණු කිරීම ප්‍රමාද වෙනවා. මුදල් භාණ්ඩාගාරයේ තිබෙනවාය කියනවා, නමුත් ලැබෙන්න ප්‍රමාද වෙනවා.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

ප්‍රමාද වී තිබෙනවාය කියන පුද්ගලයින් ගේ නම් රබර් පාලන නිලධාරීන්ට දැන්නු වොත් එය නවත්වනවාට කිසිම සැකයක් නැහැ. එක අවුරුද්දයි තියෙන්නෙ. එත කොට ලක්ෂ දෙකහමාර අවසන් වෙනවා.

ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பி. ஆர். குணவர்தன)
(Mr. D. B. R. Gunawardena)

එතකොට මොකක්ද තත්ත්වය ?

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

1963 දී පැළ ප්‍රමාණය වවන්ට පුළුවන් වෙයි. අපේ ඉලක්කය, "ටාගට්" එක ලක්ෂ දෙකයි. දැනට 1,80,000ක් සිටුවා තිබෙනවා.

ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பி. ஆர். குணவர்தன)
(Mr. D. B. R. Gunawardena)

දෙපාර්තමේන්තුවට සුමානෙකට කොච්චර " රිලීස් " කරනවාද ?

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

අවුරුද්දකට අවශ්‍ය මුදල තේ දෙපාර්තමේන්තුවට භාර දී තිබෙනවා. ඉතිරි ගණන භාර දෙනවා භාණ්ඩාගාරයට.

ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பி. ஆர். குணவர்தன)
(Mr. D. B. R. Gunawardena)

සතියකට වෙන් කරන්නෙ ලක්ෂයක්ය කියා සිතමු. හොඳයි, එතකොට ගෙවන්ට තිබෙන මුදල රුපියල් 1,25,000ක් වෙතොත්, ඉතිරි 25,000 ගෙවීම කොයි තරම් ප්‍රමාද වෙනවාද ? වතු කැබලි කියකට ඒ ප්‍රමාදය බල පානවද ?

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

There is no question of weekly or monthly release of money ; the entire amount required for the whole year is at the disposal of the Rubber Controller and he can provide the money as and when he wants. That is what I am told. The final payment, I understand, is sometimes withheld by the Rubber Controller because

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු සී. පී. ද සිල්වා]

they want the matter to be completed. There will be a delay for the final payment because the department wants the assurance that everything is done completely before the final payment is made. This department is very efficient as the hon. Member said.

ඞී. බී. ආර්. ගුණවර්ධන මයා.
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

In certain small lands two or three acres in extent, the people have uprooted, dug the holes and cleared everything and are awaiting the subsidy. Payment is delayed—it may be due to lack of funds. You are not ready to come out with particular facts about the financial affairs in different sections of the Treasury.

අර්ථසාධක අරමුදලත් හිර වෙලා තිබෙනවා. වුවමනා වෙලාවට මුදල් ගන්ට අමාරුයි. වුවමනා වෙලාවට මේ සියලුම මුදල් ලබා ගන්ට පුළුවන් විය යුතුයි. නමුත් එහි ප්‍රමාදයක් තිබෙනවා. අන්න ඒකයි මම කියන්නෙ. තේ දෙපාර්තමේන්තුවෙත් රබර් දෙපාර්තමේන්තුවෙත් ඉන්න නිලධාරීන් අනර්ඝ ලෙස වැඩ කර තිබෙන බව ඒ නිලධාරීන්ට ප්‍රශංසාත්මකව සඳහන් කරන්ට කැමතියි. යු. එන්. පී. කාලෙදි පමණක් නොවෙයි, ඊට පසුවත්, දැනුත්, ඒ මහත්වරුන් බොහොම ලක්ෂණට වැඩ කර තිබෙන නිසා මම ඒ මහත්වරුන්ගෙ සේවය ගැන එතුමන්ලාට ප්‍රශංසා කරනවා. දෙපාර්තමේන්තු භාරව ඉන්න නිලධාරියාට විශේෂයෙන්ම මා ප්‍රශංසා කරනවා. ඒ නිලධාරියා කොයි තරම් උනන්දුවක්, ආශාවක්, දක්වුවත් භාණ්ඩාගාරයෙන් නම් ඔහුට අවහිර කරන බවයි මට පෙනෙන්නෙ. අන්න ඒකට ඉඩ නොතබා ඔය කරගෙන යන වැඩ ටික හරියාකාර කරගෙන යන්ට ඉඩ දෙන ලෙසයි මා ඉල්ලා සිටින්නෙ.

ඩබ්ලිව්. දහනායක මයා.
*(திரு. டப்ளியு. தகனாயக்க)*
(Mr. W. Dahanayake)

The answer given by the Hon. Minister of Finance to the query raised by the hon. Member for Kottawa is not a satisfactory one. I wish to point out that there are two categories of funds from which the Treasury makes borrowings from time to time for its day to day needs. One category of such funds is that which comprise deposits made by the people. In this category are the Employees' Provident Fund, the moneys in the Post Office Savings Bank and various other provident funds. Can you know or estimate beforehand how much the depositors will draw from the Post Office Savings Bank during a particular period? You cannot make an estimate.

ගරු සී. පී. ද සිල්වා
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

May I answer that question? Every bank of that type does not know the exact amount, but they have an idea of how much will be withdrawn. That is how every commercial bank operates. They know exactly from past experience the amount of money that will be required to honour the demands of the depositors. But for the balance they may have a safety margin of investment. Every bank does it, and so also the Post Office Savings Bank and the provident funds.

ඩබ්ලිව්. දහනායක මයා.
*(திரு. டப்ளியு. தகனாயக்க)*
(Mr. W. Dahanayake)

The Hon. Minister admits that the Post Office Savings Bank cannot make a correct estimate, but it has an idea of what they have to pay during a given period. Let me accept the Hon. Minister's statement.

ගරු සී. පී. ද සිල්වා
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

The money is put into the Treasury in order to draw interest.

ඩබ්ලිව්. දහනායක මයා.
*(திரு. டப்ளியு. தகனாயக்க)*
(Mr. W. Dahanayake)

Very well! If a person wishes to draw Rs. 5,000 from the Post Office Savings Bank do you know that it

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

takes an inordinately long time. This is the experience of depositors. These are complaints that have come to us.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர்)
(Mr. Deputy-Speaker)

The Supplementary Estimate refers to the Tea Subsidy Fund and the Rubber Replanting Subsidy Fund. Only two funds are mentioned here.

ඩබ්ලිව්. දහනායක මයා.
(திரு. டப்ளியு. தகனாயக்க)
(Mr. W. Dahanayake)

The word "included" means that there are others. The main things are mentioned here. The Treasury borrowings are not restricted to the funds mentioned here. The Treasury borrowings are made from various funds. What I am pointing out is that there is indiscriminate borrowing by the Treasury from various funds.

The second point I wish to raise is a question of principle. You charge an interest on the borrowings. If the money comes from the Rubber Replanting Subsidy Fund the interest accrues to the fund and therefrom to the Government who is the owner of the fund. But in the case of the Post Office Savings Bank or the Employees' Provident Fund, when there is a borrowing and some interest accrues the interest must be held in deposit by the Government as trustee for the depositors. Therefore all interest accumulated from Treasury borrowings, by funds which comprise deposits of the public, should be put in account to the credit of the depositors. That is an extremely important principle. In the case of the Employees Provident Fund and the Post Office Savings Bank you should not touch a cent unless you are prepared to give back the interest to the depositors. At the present moment the amount of interest that you pay to depositors is not adequate. You are exploiting the position. Your rates of interest stand at what they were 20 years ago. If the transaction is a proper transaction as between one government department and another, you are entitled to allow the old rate of interest to stand as it used to be 20 years ago. But as many things have changed and as the rates of interest have increased you must give a higher rate of interest to borrowings from funds that comprise the deposits of savings, and you must give back that money on a greater rate of interest to the depositors. I think this request of mine is an eminently reasonable one.

I should also like to know the full extent of these borrowings. There is a common impression that the *Anduwa* is *bankoloth*. Now, one should like to know how much money has been borrowed, from which funds, at what rates of interest. The Hon. Minister of Finance should table a full statement for the information of the House and the public from the day that this Government assumed office. If there is any truth in the commonly accepted belief *ape anduwa bankoloth*, then the position is a very serious one. But if there is no truth in it, there is no reason why you should refrain from tabling the full information in the House.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பி. டி சில்வா)
(The Hon. C. P. de Silva)

I am very grateful to the hon. Member for Galle for making a very valuable suggestion. I think in the interests of everybody and the country, and the Government, it is a good idea. I shall get the information from the Treasury and table it*. I cannot give it offhand.

I wish to thank the hon. Member for Galle, though it is a little belated, I hope he will not mind it, for stopping his speech when the earlier Supplementary Estimate was being discussed. I must thank the hon. Member for Galle for not reading the book which he was threatening to read. I went through the book in the interval and I am sure he could have read the book till next week. I am very grateful to him and the hon.

* Statement tabled reproduced as Appendix at end of this Day's proceedings.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු සී. පී. ද සිල්වා]
Member for Mirigama (Mr. Wijayabahu Wijesinghe) for stopping a long speech which he was threatening to make, and I am sure which he would have made. I am very grateful to him as he gave up that speech at my personal request.

**ඩබ්ලිව්. දහනායක මයා.**
*(திரு. டப்ளியு. தகனுயக்க)*
(Mr. W. Dahanayake)

And went home !

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சී. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

He went to have a heavy meal.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

Because he had taken about two bottles last night.

**ඩබ්ලිව්. දහනායක මයා.**
*(திரு. டப்ளியு. தகனுயக்க)*
(Mr. W. Dahanayake)

We are still not out.

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

## පරිපූරක මුදල : වාර බලපත්‍ර සහ නිවාඩු බලපත්‍ර

## குறைநிரப்புத் தொகை : தவணை அனுமதிச் சீட்டு, விடுமுறைப் பிரயாணச் சீட்டு

## SUPPLEMENTARY SUPPLY : SEASON TICKETS AND HOLIDAY WARRANTS

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சී. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

I move,

That a supplementary sum not exceeding Rupees One million three hundred and twenty-five thousand (Rs. 1,325,000) be payable out of the Consolidated Fund of Ceylon, or any other fund or moneys of, or at the disposal of, the Government of Ceylon or from the proceeds of any loans obtained by the Government of Ceylon, for the service of the financial year beginning on 1st October, 1961, and ending on 30th September, 1962, and that the said sum may be expanded as specified in the Schedule hereto :—

*Schedule*

| | Rs. |
|---|---|
| Head 44—Miscellaneous Services. | |
| Vote No. 2—Administration Charges—Recurrent Expenditure .. | 1,325,000 |

This is a straightforward Supplementary Estimate. It is to pay the extra cost of season tickets and holiday warrants.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදි.

පූ. භා. 8.16

**ඩබ්ලිව්. දහනායක මයා.**
*(திரு. டப்ளியு. தகனுயக்க)*
(Mr. W. Dahanayake)

There is just one point that I have been asked to mention. This is a supplementary sum that is asked for in connection with season tickets for Government servants. Some of the season tickets issued are second class tickets while others are third class tickets. Today there is classless travel on the railway, particularly in the office trains. Therefore, there need not be two or three categories of tickets.

I have been asked by the season ticket holders, particularly Governments servants who patronize the railway, to bring to the notice of the authorities, on the Floor of this House, the fact that the new colour light system that has been adopted by the Railway tends to delay trains more and more. I had the same experience. I trust that the season ticket holders, the majority of whom are Government servants who have to attend their offices in time, will not be put to the inconvenience of being delayed and, sometimes, their increments being stopped. The Ceylon Government Railway must put itself in order. The colour light system should have been tried out as an experiment before it was put into effect. I trust that the General Manager of Railways will take due notice of the claim that has been made.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**

*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*

(Mr. D. B. R. Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ගැනත් වචනයක් කියන්ට ඕනෑ. මේ සීසන් ටිකට් දිය යුතු උදවිය තව බොහොම ඉන්නවා. මේ වරප්‍රසාදය නැති අය රජයේ දෙපාර්තමේන්තුවල ඉන්නවා. සමහර සංයුක්ත මණ්ඩල තිබෙනවා ; ඒවා අර්ධ රජයේ සේවාවල්. ඒ වායෙ උදවිය මේ සීසන් ටිකට් පහසුකම ඉල්ලා තිබෙනවා ; නමුත් ලැබී නැහැ. විශාල සංයුක්ත මණ්ඩල තිබෙනවා ; වරායේ ජනසතු සේවාව තිබෙනවා ; විශේෂයෙන් රජය මගින් වැඩ කරන තවත් නොයෙකුත් ආයතන තිබෙනවා ; ඒවායේ වැඩ කරන උදවියට සීසන් ටිකට් වරප්‍රසාදය ලබා ගැනීමට අපහසුකම් තිබෙනවා. භාණ්ඩාගාර මුදල් රෙගුලාසි අනුව ඒවා ඒ අයට දීම වළක්වා තිබෙනවා. එම නිසා ඒ වරප්‍රසාදය ගැන බලාපොරොත්තුවෙන් සිටින ආණ්ඩුවේ අර්ධ සේවකයන්ට එය දෙන්ට ඕනෑ. ඒ අය කෙළින්ම ආණ්ඩුවේ සේවකයින්ය කියා කියන්නත් පුළුවනි. ඒ අයටත් රේල්වේ සීසන් ටිකට් ලබා ගැනීමේ වරප්‍රසාදය දිය යුතුය කියා මා ඉල්ලා සිටිනවා.

**ගරු සී. පී. ද සිල්වා**

*(கௌரவ சீ. பீ. டி சில்வா)*

(The Hon. C. P. de Silva)

The hon. Member has made a very good suggestion. I shall bring it to the notice of the Government.

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

## පරිපූරක මුදල : රික්වෙස්ට් උසාවි හා මහෙස්ත්‍රාත් උසාවි

### குறைநிரப்புத் தொகை : விண்ணப்பக் கோடு கள், நீதவான் கோடுகள்

### SUPPLEMENTARY SUPPLY : COURTS OF REQUESTS AND MAGISTRATES' COURTS

**ගරු සී. පී. ද සිල්වා**

*(கௌரவ சீ. பீ. டி சில்வா)*

(The Hon. C. P. de Silva)

I move,

That a supplementary sum not exceeding Rupees Thirty-three thousand (Rs. 33,000) be payable out of the Consolidated Fund of Ceylon, or any other fund or moneys of, or at the disposal of, the Government of Ceylon or from the proceeds of any loans obtained by the Government of Ceylon, for the service of the financial year beginning on 1st October, 1961, and ending on 30th September, 1962, and that the said sum may be expended as specified in the Schedule hereto :—

| *Schedule* | *Rs.* |
|---|---|
| Head 56—Courts of Requests and Magistrates' Courts. | |
| Vote No. 2—Administration Charges .. | .. 33,000 |

This is in regard to Courts of Requests and Magistrates' Courts. I have no doubt that the hon. Parliamentary Secretary to the Minister of Justice will give a full explanation of this Supplementary Estimate.

**එන්. එච්. ඒ. එම්. කරුණාරත්න මයා.**

*(திரு. என். எச். ஏ. எம். கருணாரத்ன)*

(Mr. N. H. A. M. Karunaratne)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රුපියල් 33,000 ක අතිරේක වැය ශීර්ෂයක් සභාසම්මතිය සඳහා ඉදිරිපත් කර තිබෙනවා. එය ඉතාමත්ම කෙටියෙන්, පැහැදිළිව, තේරුම් කර දෙන්ට මා කැමතියි. අධිකරණ අමාත්‍යාංශයේ 56 වන වැය ශීර්ෂය යටතේ ඉදිරිපත් කර තිබෙන මේ රුපියල් 33,000 මුදල උප ශීර්ෂ තුනකට බෙදෙනවා. පළමුවෙන්ම හතර වැනි උප ශීර්ෂය යටතේ රුපියල් 20,000 ක් ඉල්ලා තිබෙනවා. එය ඉල්ලා තිබෙන්නේ සංචාරක උසාවි සැසි වාර පැවැත්වීම හා යම් යම් අපරාධ සිදු වූ ස්ථාන බැලීමට යන විනිශ්චයකාරවරුන්ගේ ගමන් වියදම් සඳහායි. නමුත් රුපියල් 20,000 ක් අත්‍යාවශ්‍ය මුදලක් හැටියට සභාවෙන් සම්මතිය ඉල්ලන්නේ ඒ කාරණා උඩම පමණක් නොවෙයි. අලුතෙන් උසාවි 4 ක් ඇති කර තිබෙනවා, හඟුරන්කෙත, කඩුගන්නාව, ඇල්පිටිය, මාදුගොඩ යන ස්ථාන වල. අලුතෙන් ඒ සංචාරක උසාවි හතර ඇති කර තිබෙන නිසා, ඒ සම්බන්ධ ගමන් වියදම්, නඩත්තුව, ආදිය සඳහාත් මෙම මුදල අවශ්‍ය වෙනවා. ඊළඟට 7 වැනි උප ශීර්ෂය යටතේ රුපියල් පන්දහසක් අවශ්‍ය වී තිබෙනවා. එය අවශ්‍ය වන්නේ අලුතෙන් උසාවි දෙකකට, සංචාරක උසාවි සි. එනම් කළවාන හා මලාතන් කියන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එන්. එච්. ඒ. එම්. කරුණාරත්න මයා.]
ස්ථානවල තිබෙන උසාවි දෙකට විදුලි ආලෝකය ලබා දීම පිණිසයි. 8 වැනි උප ශීර්ෂය යටතේ රුපියල් අට දහසක් ඉල්ලා තිබෙනවා. එය හදිසි මරණ පරීක්ෂක වරුන්ට ගෙවීම සඳහායි. මේ මුදල් ගෙවීමේදී සීමාවක් තබන්ට බැරි බව තමුන්නාන්සෙලා දන්නවා. මේ මුදල අඩු කරන්ට හෝ නැත්නම් ප්‍රමාණය සීමා කරන්ට හෝ පුළුවන්කමක් නැත්තේ ඒ හදිසි මරණ පරීක්ෂකවරුන්ට ගෙවන මුදල මෙපමණ විය යුතුය කියා සීමා කරන්ට පුළුවන්කමක් නැති නිසයි. මේ සම්බන්ධයෙන් දැනටමත් රුපියල් අනූ තුන් දහසක මුදලක් වියදම් කර තිබෙනවා. එම නිසා තමයි මේ අතිරේක මුදලක් සභා සම්මතිය සඳහා තබා ඇත්තේ. ගරු මන්ත්‍රීවරුන්ට දැන් කරුණු ඉතා පැහැදිලි හෙයින් විවාදයක් නැතිවම මෙය සභා සම්මත වේයයි මම බලාපොරොත්තු වෙනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

## ලංකා සංවර්ධන ණය පනත යටතේ සම්මතිය

### இலங்கையபிவிருத்திக் கடன் சட்டப் பிரமாணம்

### RESOLUTION UNDER CEYLON DEVELOPMENT LOANS ACT

ගරු සී. පී. ද සිල්වා
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

I move,

That this House hereby resolves that the sum of money specified in Column II of the Schedule hereto, which was expended out of the Consolidated Fund of Ceylon during the Financial Year ending on September 30, 1958, for work specified in the corresponding entry in Column I of that Schedule, being work connected with or incidental to the development of Ceylon, shall be replaced out of the moneys raised by way of loan under sub-section (1) of section 2 of the Ceylon Development Loans Act (Chapter 407).

SCHEDULE

| | *Column I* | *Column II* Rs. | c. |
|---|---|---|---|
| 1. | Major buildings and Central Garage for Police Department .. | 2,183,950 | 74 |
| 2. | Ceylon Army, Navy and Air Force .. .. .. | 12,669,735 | 86 |
| 3. | Residence and Office of the High Commissioner for Ceylon in India and quarters for Staff .. .. .. | 240 | 0 |
| 4. | Opening up Police Stations in areas newly developed .. .. | 1,155,435 | 5 |
| 5. | Buildings for Department of Immigration and Emigration .. | 22 | 61 |
| 6. | Cost of taking over the Bases at Trincomalee and Katunayake .. | 4,400,000 | 0 |
| 7. | Additions and Improvements to explosives magazines, Welisara .. | 6,820 | 7 |
| 8. | Proposed new extensions to Government Press .. .. | 203,937 | 81 |
| 9. | Proposed construction of a New Secretariat and Conference Hall, Kandy | 85,170 | 45 |
| 10. | Construction of General Service Quarters in Badulla and Galle .. | 23,389 | 73 |
| 11. | Borstal Expansion Scheme (3rd Stage) .. .. | 4,599 | 73 |
| 12. | Seven sets of quarters and offices for Divisional Revenue Officers .. | 7,224 | 88 |
| 13. | Quarters for Prison Officers .. .. .. | 782,025 | 87 |
| 14. | Improvements to Record Presses, Registrar-General's Department .. | 31,097 | 62 |
| 15. | New Land Registries .. .. .. | 281,704 | 55 |
| 16. | Establishment of Second Powerloom Project .. .. | 12,560 | 77 |
| 17. | Construction of and additions and improvements to Certified Schools .. | 115,940 | 74 |
| 18. | Establishment of three coir workshops .. .. .. | 66,165 | 36 |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

| Column I | Column II | |
|---|---|---|
| 19. Village works undertaken by Rural Development Societies on a self-help basis .. .. .. | 1,286,899 | 87 |
| 20. Madhu Water Supply Scheme, Stage II .. .. .. | 88,335 | 10 |
| 21. Conversion of the Magazine premises Welikada to a Prison .. | 44,051 | 52 |
| 22. Quarters for D. R. OO's Clerks .. .. .. | 1,233 | 0 |
| 23. Extensions to Court buildings at Hulftsdorp .. .. | 198,464 | 97 |
| 24. New Courthouse at Nuwara Eliya .. .. .. | 4,124 | 43 |
| 25. New Rural Court at Blackpool, Nuwara Eliya District .. .. | 4,675 | 54 |
| 26. New Rural Courts (Muthur, Maho, Pilessa, Kadawata, etc.) .. | 135,026 | 65 |
| 27. New Courthouse at Polonnaruwa .. .. .. | 32,810 | 81 |
| 28. Construction of Central Dispensaries .. .. .. | 2,305 | 35 |
| 29. Construction of Maternity Homes .. .. .. | 9,189 | 0 |
| 30. Construction of a Children's Hospital, Colombo .. .. | 401,847 | 81 |
| 31. Colombo North Hospital, Ragama .. .. .. | 531,948 | 95 |
| 32. Negombo Hospital extensions .. .. .. | 14,192 | 69 |
| 33. Jaffna Hospital extensions .. .. .. | 149,754 | 75 |
| 34. General Hospital, 5-storyed Ward and Nurses' Quarters .. | 194,691 | 62 |
| 35. Ratnapura Hospital .. .. .. | 652,252 | 56 |
| 36. Kandy Hospital four-storeyd block, Nurses' Quarters and Training School and Religious Sister's Quarters .. .. .. | 13,193 | 78 |
| 37. Mulleriyawa New Psychopathic Hospital, House of Observation and extensions to Pelawatta Mental Home .. .. .. | 605,492 | 24 |
| 38. Maharagama Cancer Institute .. .. .. | 177,547 | 66 |
| 39. Eye Hospital, Colombo extensions .. .. .. | 811,913 | 38 |
| 40. Watupitiwela Hospital extensions .. .. .. | 165 | 96 |
| 41. Buttala and Moneragala Hospital extensions .. .. | 20,098 | 0 |
| 42. Kankesanturai Sanatorium extensions .. .. .. | 2,025 | 0 |
| 43. Castle Street Maternity Hospital, Stages 2 and 3 .. .. | 96,815 | 2 |
| 44. Construction of Medical buildings out of pre-fabricated materials .. | 1,082,445 | 27 |
| 45. Expansion and improvements to hospitals .. .. | 835,964 | 71 |
| 46. Badulla Hospital Administration Block, Operation Theatre, Ward of 104 beds and Conversion of Administration Block to Paying Ward .. | 166,187 | 42 |
| 47. Medical facilites in Gal Oya Valley .. .. .. | 299,083 | 99 |
| 48. New hospital for Colombo South .. .. .. | 562,762 | 76 |
| 49. Batticaloa hospital extensions, Administration Block (2 storeyed), kitchen block, nurses quarters and quarters for Lady House Officers, Mortuary and cartshed 3 ward blocks of 104 beds each and quarters for 8 House Officers .. | 70,996 | 9 |
| 50. Additions and Improvements to the Hospital of Indigenous Medicine, 1st Stage .. .. .. .. .. | 316,107 | 38 |
| 51. Leprosy campaign, extensions to Uragaha, Mantivu and Hendala Leprosy Hospitals .. .. .. | 46,745 | 51 |
| 52. Kurunegala Hospital extensions .. .. .. | 165,045 | 61 |
| 53. Kegalle new Hospital .. .. .. .. | 511 | 0 |
| 54. Trincomalee Hospital extensions .. .. .. | 12,258 | 52 |
| 55. Pipe-borne Water Supply, Sewerage and Drainage Schemes for Medical Institutions and buildings and maintenance thereof .. .. | 618,753 | 3 |
| 56. Pilot plant for iodization of crude salt .. .. .. | 17,588 | 58 |
| 57. Bedlift Orthopaedic Clinic, General Hospital, Colombo .. .. | 95 | 53 |
| 58. Construction of permanent buildings for Schools and Training Colleges, Additions and Improvements to existing buildings and construction of Teachers' Quarters .. .. .. .. | 9,184,819 | 44 |
| 59. Construction of School Workshops .. .. .. | 461,390 | 50 |
| 60. Establishment of Provincial Polytechnics (Junior Technical Schools) .. | 14,156 | 64 |
| 61. Construction of Admin. Block, Faculty of Medicine, University of Ceylon | 23,085 | 75 |
| 62. Accommodation for Technical Assistants Branch in Head Office and Provincial Offices .. .. .. .. | 12,331 | 16 |
| 63. Grant to the Ceylon Institute of Scientific and Industrial Research .. | 290,384 | 61 |
| Total .. | 41,689,800 | 0 |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු සී. පී. ද සිල්වා]

These are all items which had been passed in the Budget for 1957-58. The items as well as the moneys had been passed by Parliament in the Budget for 1957-58. Now it is only a question of transferring the amount to the loan fund. No fresh sums of money are involved.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

පූ. භා. 8.22

**ඩබ්ලිව්. දහනායක මයා.**

*(திரு. டப்ளியு. தகஞயக்க)*

(Mr. W. Dahanayake)

I want to make a few comments. I do not want to talk at length on this matter. I want to mention only three items.

The first is item 58, construction of permanent buildings for schools and training colleges, additions and improvements to existing buildings and construction of teachers' quarters, Rs. 9.2 million. This is money which was expended on the construction of permanent buildings for schools and training colleges in the year 1958.

First of all, I want to point out that this amount meant a very heavy programme of school works, and I take pride in the fact that in two years it was possible for us to do such a volume of work. This was not the only amount expended on the construction of school buildings. This was the amount expended from loan funds.

There were other moneys from voted expenditure which were also spent on the construction of school buildings. What I wish to point out is that there is today a big decline and a fall in the school works building programme. That is a very serious matter. It is a matter which should engage the attention of all of us. Construction of school buildings should be an item that should continue from year to year on a planned and systematic basis. That there is a decline of such work today is a damnable indictment against the Minister of Education. We would like the money that is expended on school buildings to be greater than it was before. It should increase from year to year. It should not decrease. Particularly after the schools take-over of 1960, the building programme of the schools of the Education Department should have doubled itself. So I am bringing this to the notice of the Government with a view to making them alive to the great need for a bigger, a more sustained and a continuous programme of construction of school buildings.

I want also to make a few remarks about item 61, Construction of Administration Block, Faculty of Medicine, University of Ceylon. We made a beginning on this in about the year 1957. You will see that the money expended in 1958 was Rs. 23,000. Can you believe it, this work is not yet completed? With what result? The students, about a hundred of them, were shifted from Colombo to the Medical Faculty at Peradeniya. One of them, if you wish to know, is the son of the hon. Appointed Member (Dr. M. P. Drahaman). Dr. Drahaman has confessed to me with great pain of heart that the buildings in Peradeniya are not complete and that the students who have been there are not getting their money's worth. They are not being given the full medical course that should have been given to them. This is a very very serious matter. It is a matter that should be taken up immediately by the Minister who is in charge of the P. W. D. The building programmes of all departments should be streamlined. There should be a special committee of inquiry to inquire into P. W. D. delays. The construction of a bridge takes ten years or more. The construction of a building takes six to eight years. A water supply service is not done for even ten years. The work of the P. W. D. must be streamlined. You must inquire into the cause of the delays and if any good is to come out of the monies that are voted by this Parliament on the various constructional works the P. W. D. must make a job of it.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

I hope that the Hon. Minister of Transport and Works will take note of this criticism.

පූ. භා. 8.29

**ඉඹුලාන මයා.**

*(திரு. இம்புலான)*

(Mr. Imbulana)

I wish to make one comment on Item No. 55 ; that is :

Pipe borne water supply, sewerage and drainage schemes for medical institutions and buildings and maintenance thereof.

There has been a water supply scheme which had been started about 2½ years ago for the Karawanella Hospital in my electorate. After the first instalment of the work had commenced the work had been abandoned and for the last 2½ years which have elapsed since then no work has been done at all on this scheme.

There is a water tower there and about halfway down there are iron rods jutting out of the main base of the tower. As continuation of the work is being delayed the iron rods meant for the fabric of the concrete wall of the water tower have more or less perished and as time passes the condition of the iron rods will deteriorate further. This water scheme has to be expedited so that it may serve the hospital and not cause any inconvenience to the hospital patients and those occupying the staff bungalows.

I earnestly request that the Hon. Minister take up this matter immediately with the department and have this work completed without any further delay.

පූ. භා. 8.31

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**

*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*

(Mr. D. B. R. Gunawardena)

ගරු කථානායකතුමනි, හමුදා සම්බන්ධයෙන් මීට කලින් සාකච්ඡා වූ වැය ශීර්ෂයක් ගැන මා ප්‍රථමයෙන් කථා කළ අවස්ථාවේදී ඒ ගොඩනැගිලි සම්බන්ධව කරුණු කීපයක් කිව්ව. ඒ ගොඩනැගිලි කොන්ත්‍රාත්කරුවන් මාර්ගයෙන් සාදන නිසා විශාල මුදලක් අපතේ යනව. මා ඉල්ලා සිටිනව, හමුදාවට වුවමනා ගොඩනැගිලි හදා ගන්ට හමුදාවේම කොටසක් යොදවන්න කියා. ඒ සඳහා හමුදාවේ අංශයක් සකස් වී තිබෙනව. නමුත් නාත්සේට මතක ඇති, යුද්ධ කාලයේදි හමුදාව විසින්ම ගොඩනැගිලි තැනුවා ; පාලම් හැදුව ; තවත් වුවමනා වැඩ බොහොමයක් කළා. ඒ අන්දමේ වැඩපිළිවෙළක් ඇති කරනව නම් කොන්ත්‍රාත්කරුවන් ලබා ගන්න විශාල ලාභය හමුදාවටම ඉතිරි කර ගන්ට පුළුවනි. හමුදාවට අවශ්‍ය ගොඩනැගිලි සහ උපකරණ ආදිය තනා ගැනීමට හමුදාවේම අංශ ඇති කර තිබෙනව. ඒ කොටස යොදවන්න ඕනැ. ගොඩනැගිලි සහ අනිකුත් උපකරණ—ඒ කියන්නෙ මැෂින් තුවක්කු යුද්ධ ටැංකි ආදිය නොවෙයි—මේ රටේ සාදා ගන්න පුළුවන් උපකරණ සෑදීමට. එසේ කළොත් පිටරට ඇදී යන විශාල මුදලක් මේ රටේ නවත්වා ගන්ට පුළුවන්. අද හමුදාවල විශේෂ අංශවලට විශේෂ තුවක්කු, විශේෂ ටැංකි, ආර්මර්ඩ් කාර් ආදිය කලින් කල පිටරටින් ගෙන්වනව. එසේ ගෙන්වන්ට පෙර ඒවා සාදන රටවල පැක්ටරිවලට යවා ඒවා සෑදීම පුරුදු පුහුණු කළ උදවිය ලංකාවේ සිටිනව. ආර්මර්ඩ් කාර් එකක් නරක් වුණාම එය සෑදීමට ඉතා දක්ෂ ලෙස පුරුදු පුහුණු වූ අය හමුදාවල සිටිනව. නමුත් අද ආර්මර්ඩ් කාර් එකක සුළු දෝෂයක් ඇති වුණාම එය එවූ රටේ කොම්පැණිකාරයාට නැවත යවනව.

පුහුණු කරවන ලද කාර්මිකයන්ට ඒ වාහන අලුත්වැඩියා කිරීමට ඉඩ නොදී ඒවා පිට රට යැවීමෙන් විශාල මුදලක් නිරපරාදේ වියදම් වෙනවා. ඒ අන්දමේ ක්‍රියා මාර්ගයක් අනුගමනය කරන්නේ ඇයි ? කොම්පැනිවලට ඒ කටයුතු භාර දෙන්නේ එයින් නිලධාරීන්ට වාසියක් වන නිසයි. මේ ක්‍රමය වළක්වන්න ක්‍රියා කළ යුතුයි. බොහෝ වැඩවලදී නිලධාරීන් අතට කොමිස් එක යනවා. කොයි ආකාරයෙන් හෝ තමන්ට කොමිස් එක ලැබෙන ක්‍රමයක් අනුගමනය කිරීමටයි, නිලධාරීන් ලෑස්ති වන්නේ. පාරවල් සෑදීමේ කාර්යයේදීත් ඒ විධියේ තත්ත්වයක් තිබෙ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.]

නවා. පාරවල් පිළිබඳ ඔවර්සියර්වරුන්ට වැඩක් භාර දුන්නාම ඒකෙනුත් "කට්" එක එනවා. මහජන මුදල් ලක්ෂ ගණනින් මේ ආකාරයට නාස්ති වෙතත් ඒවා වළක්වන්න වැඩ පිළිවෙළක් අනුගමනය කරන්නේ නැහැ. ඒ ආයතන වලම සිටින අය ලවා ඒ වැඩ නොගැනී මෙන් විශාල මුදලක් අපතේ යනවා. හමුදාව යටතේ. වූ මීට කලින් සාකච්ඡාවට භාජනය වූ වැය ශීර්ෂය ගැන කථාකරමින් මා මේ පිළිබඳ කරුණු කීපයක් සඳහන් කළා. සුළු හේවායන්ගේ ගෙවල් ගැනත් ඒ අවස්ථාවේදී මා ප්‍රකාශ කළා. සුළු හේවා යන්ගේ ගෙවල්වලට සීලිං නොගැසීම නිසා තද උෂ්ණයෙන් පීඩා විඳීමට ඒ අයට සිදු වෙනවා. නමුත් ලොකු නිලධා රීන්ගේ ගෙවල්වලට නම් සීලිං තිබෙනවා. මා විසින් කිව යුතු තවත් කාරණයක් නම් හමුදාවට අවශ්‍ය ගොඩනැඟිලි කටයුතු හමුදාව ලවාම කරවා ගත යුතු බවයි. කොන්ත්‍රාත්කාරයන්ට ඒ වැඩ භාර දුන් නොත් ඔවුන් රුපියල් ලක්ෂ ගණනක් එයින් ලාභ ගන්නවා පමණක් නොව වැඩත් හරියට කෙරෙන්නේ නැහැ. මේ කාරණයත් මා කලින් සඳහන් කළා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙහි 19 වැනි අංකය යටතේ ග්‍රාමසංවර්ධන සමිති ඇතුලු වෙනත් ගම්බද සමිති මඟින් කර ගෙන යන වැඩ ගැන සඳහන් වෙනවා. සුළු වාරිමාර්ග කටයුතු, සුළු පාරවල් පිළිබඳ කටයුතු, සුළු ගොඩනැඟිලි පිළිබඳ කටයුතු ආදිය ගැන සඳහන් වී තිබෙනවා. ගම්බද සමිති මඟින් මේ වැඩ කරගෙන යන විට ඒවා පරීක්ෂා කරන නිලධාරීනුත් ඒ සමිතිත් අතර සමහර විට හැප්පීම් ඇති වෙනවා.

**ජී. ඩබ්ලිව්. සමරසිංහ මයා.** (කුලියාපිටිය)

*(திரு. ஜீ. டப்ளியு. சமரசிங்ஹ—குளியாப் பிட்டிய)*

(Mr. G. W. Samarasinghe—Kuliyapitiya)

අල්ලස් නොදෙන නිසා.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**

*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*

(Mr. D. B. R. Gunawardena)

ඔව්, කොතරම් හොඳට වැඩ කළත්, කොමිස් එක නොලැබෙනොත් ඒ කටයුතු වලට අවශ්‍ය මුදල් ගැනීමට අවහිර කරන නිලධාරීන් සිටිනවා. පාඨශාලාවලට අවශ්‍ය ගොඩනැඟිලි සෑදීම පිළිබඳව මම එකක් කියන්නම්. ගුරු දෙගුරු සමිති මඟින් ශක්තිමත් ලී යොදා හොඳට පාඨශාලා ගොඩනැඟිලි සාදනවා. කොන්ත්‍රාත්කාර යන් වගේ ඒ සමිති හොර වැඩ කරන් නේ නැහැ. මගේ ප්‍රදේශයේ තලාහේනේ ගුරු දෙගුරු සමිතිය මඟින් රජයේ මුදල් වලින් රුපියල් දොළොස් දහසක් විතර වියදම් කරල පාඨශාලාවක් තැනුව. කොන්ත්‍රාත්කාරයන් වාගෙ හොර වැඩ නොකර හොඳට එම පාඨශාලාව හැදුවා. මට හරියට වියදම් වුණු ගණන මතක නැහැ. රුපියල් දොළොස් දහසක් විතර ගණන් තබන්න පුළුවනි. ඊට පස්සෙ එම මුදල ලබා ගැනීමට පුළුවන් වුණේ කොටස් වශයෙනුයි. නමුත් ඒකෙනුත් රුපියල් එක්දාස් ගණනක් කපාගෙනයි දුන්නෙ. කවුද ගියෙ ඒක පරීක්ෂා කර බලන්න කියා මා ප්‍රශ්න කරනවා. ඒ පරීක්ෂා කරන්න ගිය තැනැත්තාට කොමිස් එකක් ලැබුණෙ නැති නිසයි, එසේ වී තිබෙන්නෙ. කොන්ත්‍රාත්කරුවකුට දුන් නොත් එයාගෙන් එම කොමිස් මුදල ලැබෙනව. ගුරු දෙගුරු සමිතියක් මඟින් මෙවැනි වැඩක් කළාම එහෙම ගෙවන්නෙ නැහැ. එම නිසා අර මුදල අඩු වී තිබෙනවා. දූෂණ වැඩ පිළිවෙළවල් දෙපාර්තමේන්තුව මඟින් උගන්වා තිබෙන නිසයි, මෙසේ සිදු වන්නෙ. තලාහේන පාසැලේ ගුරු දෙගුරු සමිතියට රුපියල් එක්දාස් ගණ නක් දුන්නෙ නැහැ. කීප වතාවකටයි, අනික් මුදල් දුන්නෙත්. අන්තිමට එය පරීක්ෂා කරන්න ගිය තැනැත්තාට නැති නම් එය පාස් කරන්න ගිය ඉංජිනේරු වාට කොමිස් එකක් ලැබුණෙ නැති නිසා මුදල් අඩු වුණා. අද වැඩ කෙරෙන්නෙ ඔය විදියටයි. එම ගුරු දෙගුරු සමිතිය මඟින් හොඳට හැදූ ගොඩනැඟිල්ල පරීක්ෂා කර බලා දියයුතු මුදල් සම්පූර්ණයෙන් දෙන් නය කියා මා ඉල්ලා සිටිනවා. ගරු ඇමති තුමාට මේ කරුණු ඇහෙන්නෙ නැතුව වගෙයි. මේ කරුණු කියනකොට බීරි අලින්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ලංකා සංවර්ධන ණය පනත යටතේ සම්මතිය

වාගෙ ඉන්නවා. ඇතැම් නිලධාරීන් කරන වැඩ කටයුතු ගැනයි මා කියන්නෙ. ගම්වල සමිති සමාගම් මගින් මෙවැනි වැඩ කළාම හරියට මුදල් ලබා ගන්න බැහැ. හරියට වැඩක් කළාම මුදල් ලැබෙන්නෙ නැහැ. හොරට වැඩක් කළාම, ඒ හොර වැඩේ කළ අයගෙන් ලැබෙනව කොටස නැතිනම් කොමිස් එක. එතකොට තමයි, එම මුදල සම්පූර්ණයෙන් පාස් වෙන්නෙ. ඔය විධියට කෝටි ගණන්, ලක්ෂ ගණන් කැපි කැපි පිට අයගෙ සාක්කුවලට යනවා.

ඊළඟට තියෙන්නෙ "Construction of Maternity Homes" නමැති අංකයයි. මේ මාතෘ නිවාස ඉදි කිරීමේ කාර්යයත් කල් දමනවා. වෙන් කර තිබෙන මුදල් ඒ අංශයට යොදවන්නෙ නැහැ. මගේ කොට්ඨාශයේ කඩුවෙල ප්‍රදේශයට එම කටයුතු සඳහා රුපියල් හැත්තෑ පන් දහසක් වෙන් කර තිබුණා. නමුත් එම කොට්ඨාශයේ වැඩ කල් දමා තිබෙනවා. මේ වතාවේ කරන බවට පොරොන්දු වෙලා තිබෙන බව පේනවා. නමුත් ඉංජිනේරු මහත්වරු ගිහින් කියනවා, වතුර ලබා ගන්න අමාරුයි කියල. එහෙම කියන්නෙ වෙන ඉඩමකට දිස්ටි දමාගෙනයි. ඔය විධියටයි, වැඩ කටයුතු කෙරෙන්නෙ. ඉඩම් කැබෙල්ලක් අරගෙන ඒකෙ ගොඩනැගිල්ලක් ගහන්න මුදල් වෙන් කළාම ඒ ගැන පරීක්ෂා කරන්න යන ඉංජිනේරුවා හදනවා කොහොමහරි ඒ වැඩේ "කන්ඩෙම්" කරල දමන්න. වතුර නැතෙයි කිව්වාම ළිඳක් කපල හොඳට සකස් කරල පෙන්නුවට ඒක නම් ඉංජිනේරුවට වහන්න බැහැ. හැම තැනම වැඩ කරන්නෙ ඔය අන්දමටයි. වෙන්කර තිබුණු මුදල් නිසියාකාර පාවිච්චි කර මෙම ගොඩනැගිලි වහාම සකස් කර දෙන්නය කියා අපි ඉල්ලා සිටිනවා. ඇතැම් අයගේ රපෝර්තු අනුව මේ වැඩ අවුරුදු ගණන් යටපත් කරගෙන ඉන්නෙ නැතුව ඉක්මණින් නිම කරන ලෙස මා ඉල්ලා සිටිනවා. මේව ප්‍රමාද වෙන්නෙ අර කට්ටියට කොමිස් එක නොලැබෙන නිසයි.

මුල්ලේරියාවෙ රෝහල ගැන කියන්න ඕනැ. විශාල මුදලක් වැය කොට එම ගොඩනැගිල්ල තැනූ බව පේනවා. ලෙඩුන්ද බොහෝ දෙනෙක් එහි ගෙනගොස් දමා සිටිනවා. නමුත් ඒකෙ ආරක්ෂාවට කම්බි වැටක්වත් ගහල නැහැ. සිහි විකල් වෙච්ච කොටසවයි, එතනට දමන්නෙ. ආරක්ෂාව මදි නිසා එතනින් පැනල යනවා. ඒවට වැය කරන මුදල්වලින් ගොඩනැගිලි වටේ ආරක්ෂාව ඇති කරන්න ඕනැ. නමුත් එසේ කරන්නෙ නැහැ. එතනට යන පාර නියම විධියට සකස් කරල නැහැ. එතන ඉන්න සුළු සේවකයන්ගේ පදිංචිය සඳහා ගොඩනැගිලි කීපයක් ගැහුවා. ඒවා හදල අවුරුදු ගණනක් තිස්සෙ දිරාපත් වන්නට ඇරියා මිසක් තවම ඒ සේවකයන්ට ඒවා පාවිච්චියට දුන්නෙ නැහැ. ඒ සේවකයන් ගෙවල් නැතුව ඉන්නවා. යම් තැනක මුදලක් තැන්පත් කළාම පොළියක් උපදින්නට වුවමනා බව තමුන්නාන්සෙලා දන්නව නේද? ලක්ෂ ගණන්, කෝටි ගණන්, යට කරල එතන ගොඩනැගිලි ගහල තියෙනවා. ඒවායේ නියම ප්‍රයෝජනය අරගෙන දෙන්නට ලැස්ති නැහැ.

රුපියල් ලක්ෂයක් වැය කරල සුළු සේවකයන්ට ගෙවල් 25ක් හැදුවා. අවුරුදු එකහමාරක් තිස්සෙ ඇයි මේවා පාවිච්චි කරල යට කරපු මුදලට පොළිය වශයෙන්වත් ප්‍රයෝජනයක් ලබා ගැනීමට මාර්ගයක් සකස් නොකළේ? හැම තැනම එහෙම නේද කරන්නෙ? ආරෝග්‍යශාලාවල ඇතැම් ගොඩනැගිලි අවුරුදු ගණන් වහල දාලා. බාගෙට තනපු පාඨශාලා හුඟක් තැන්වල තියෙනවා. සමහර ආරෝග්‍යශාලාවලට මුල් ගල් විතරක් තියල තියෙනවා. මේවට යට කරන මුදලින් රටට නියම ප්‍රයෝජනය ගැනීමට ලැස්ති නැහැ. අපේ රටේ යොදවන මුදලින් ප්‍රයෝජනයක් නොලැබෙන්නෙ, සංවර්ධනයක් ඇති නොවන්නෙ, මේ නිසයි. අද ආරෝග්‍යශාලාවල ඉඩ නැතිලු.

ජූනි මාසයේ 28 වැනිදා අංගොඩ ආරෝග්‍යශාලාවට ලෙඩෙක් බාර දීල තියෙනවා. ඒ ලෙඩා සනීප වුණාය කියා පිට කළාලු. දැන් දවස් ගණනක් ගත වෙනවා. භාර දීපු දෙමාපියන් ළඟට ලෙඩා තවම ගිහින් නැහැ. කොහෙද ගියේ කියා පොලීසිය තවම ලෙඩාව හොයනවා. තලවතුගොඩ පෙරේරා කියා ඉලන්දාරියෙක් ඒ නැති වෙලා තියෙන්නෙ. ඔහුගෙ වයසක පියා ඇවිත් මට පැමිණිලි කළා. මේ දේ වුණේ එතන ආරක්ෂාව නියම විධියට සකස් කළේ නැති නිසයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.]

ඊ ළඟට අංක 43 :

කාසල් වීදියේ සූතිකාරෝග්‍යශාලාව, 2 සහ 3 අවසථා රු. 96,815.02 යි.

මේක ගැන නම් ප්‍රශංසා කරන්නට ඕනෑ. අද ලංකාවේ මව්වරුන්ට ළමයින් ප්‍රසූත කිරීමට පහසුකම් සලස්වා තිබෙන ආරෝග ශාලාවක් තිබෙනවා නම් ඒක කාසල් වීදියේ ආරෝග්‍යශාලාවයි. ඒකට තව උප කරණ දෙන්නට ඕනෑ. හොඳ සැලැස්මක් ඇතිව ඉතා පිරිසිදු ලෙස එතන වැඩ කර ගෙන යනවා. මෙහි තිබෙන පහසුකම් නිසා බොහෝ දෙනා මෙම සථානයට එන්න කැම තියි. මෙතන තිබෙන එක් අඩුපාඩුවක් තමයි මෙම රෝහල වටා තාප්පයක් නො තිබීම. මෙහි අළුත් ගොඩනැගිලි ආදිය තනන්න බලාපොරොත්තු වන නිසා ටිකක් ප්‍රවේසමෙන් කටයුතු කරන්න ඕනෑ. කොන්ත්‍රාත්කරුවන් ලවා මෙහි අත්ති වාරම් ආදිය දමන විට දෙදරා යන්න පුළු වන් නිසා ටිකක් ප්‍රවේසමෙන් කටයුතු කරන්න.

එමෙන්ම මෙම ආයතනයට වුවමනා කරන උපකරණ, හෙදියන් සහ උපසථායි කාවන්ද, අඩුපාඩුවක් නොකට, මේ සථාන යට සපයා දෙන්නය කියාත් මා ඉල්ලා සිටිනවා. ඒ සමගම මෙම සථානයට රෝගීන් බැලීමට පැමිණෙන අයටද සෑහෙන ආවරණයක් සකස් කර දිය යුතුයි. මෙවැනි ආවරණයක් නැතිකම නිසා වැහි දවස්වලට මෙන්ම අනික් දවස්වලටද ලෙඩුන් බැලීමට එන අයට බලවත් කරදරයකට මුහුණ පාන්න සිදු වෙනවා.

මී ළඟට 55 වන අංකය යටතේ වෛද්‍ය ආයතනවලට නල මාර්ගයෙන් ජලය සැප යීම, කැළි කසළ ඉවත් කිරීම සහ ඒවා හා සම්බන්ධ ගොඩනැගිලි නඩත්තුව සඳහා රුපියල් 6,18,753 ක මුදලක් වෙන් කර තිබෙනවා. මෙම අංකය යටතේ වෙන් කර තිබෙන මුදල් ප්‍රමාණය කොහෙත්ම මදි. බොහෝ තැන්වල අද දක්වාත් ළිංවලින් වතුර රැගෙන රෝහලේ වැඩ කටයුතු කරන බව මා දන්නවා. වතුර සැපයීමේ තිබෙන අසතුටුදායක තත්ත්වය නිසා රෝග සුව කර ගැනීමට යන බොහෝ දෙනා ආපසු ගෙදර එන්නෙ රෝග බෝ කරගෙනයි. ඒ නිසා වතුර පයිප්ප ආදිය සැපයීමට වැඩ පිළිවෙළක් සකස් කරන මෙන් ඉල්ලා සිටිනවා.

58 වන කාරණය : පාඨශාලා සහ ගුරු අභ්‍යාස විද්‍යාල සඳහා සථිර ගොඩනැගිලි ඉදි කිරීම, දැනට තිබෙන ගොඩනැගිලිවලට එකතු කිරීම් හා වැඩි දියුණු කිරීම්, ගුරු නිවාස තැනවීම්. මහා විද්‍යාලවල ප්‍රධානා චාර්යතුමාටවත් සිටීමට ගොඩනැගිලි නැති තැන් අද තිබෙනවා. ඇයි, මේ අවශ්‍ය යෙන්ම කළ යුතු දේ නොකරන්නේ ? ගුරුවරුන් පාසලේ සිට සැතැප්ම 3 කට ඈතින් පදිංචි නොවිය යුතුයයි දෙපාර්ත මේන්තුවේ චක්‍ර ලේඛයක කියා තිබෙනවා. එසේ නම් තමුන්නාන්සේලා සැතැප්ම තුනක් ඇතුළත ගුරු නිවාස තනන්න ඕන. දැන් බස්නාහිර පළාතේ අවුරුදු 10ක් සේවයක් කර ඇති ගුරුවරුන් මොනරා ගල ආදී පළාත්වලට මාරු කරනවා. ඔවුන්ට පවුල් පිටින්ම හෙට අනිද්දා යන්න සිද්ධ වී තිබෙනවා. ඒ අය නිවාස සොයාගන්නෙ කොහොමද ? දෙපාර්ත මේන්තුව චක්‍ර ලේඛයන් යැව්වාට ඒවා ක්‍රියාවේ යොදන්නෙ නැහැ. ඒ නිසා—ගුරු වරුන්ට අවශ්‍ය ගොඩනැගිලි තනා නැති නිසා—ඈත සිටයි, සමහර ගුරුවරුන්ට එන්න සිද්ධ වන්නේ. ඈත සිට එන විට නියම වේලාවට පාසලට එන්න බැරි වෙනවා. සැතපුම් 10, 15, දුර සිට එන අයට බස් නියම වේලාවට නැති නිසාත්, වෙනත් ගමන් පහසුකම් නැති නිසාත්, වෙලාවට පාසලට එන්න බැරි වෙනවා. උදේ 8 ට පාසලට පැමිණිය යුතු වුවත් සමහර විට 9 ට වත් එන්න බැරි වෙනවා. සාමාන්‍ය වශයෙන්ම එසේ දුර සිට ගුරු වරුන් පැමිණීමෙන් ළමයින්ට පැය බාග යක් පමණ ඉගැන්වීමක් කෙරෙන්නේ නැහැ. දවසකට පැය බාගය බැගින්, මෙසේ බලන විට, සතියකට පැය දෙකහමාරක් ළමයින්ට අධ්‍යාපනය ලැබෙන්නේ නැහැ. දවස් 150 ට පැය 75 ක් ළමයින්ගේ අධ්‍යා පනය අඩු වෙනවා. දවසකට පැය 5 යි, පාසලක උගන්වන්නේ. එවිට ළමයින්ට දවස් 15 ක් සම්පූර්ණයෙන්ම ඉගැන් වෙන්නේ නැහැ. ගුරු නිවාස නැති නිසා, ගුරුවරුන්ට ඈත සිට එන්න සිදු වීම නිසා, ළමයින්ට දවස් 15 ක පමණ අධ්‍යාපනය නොලැබී යනවා. ගුරු නිවාස හදන්න බැරි ඇයි ? ඇයි මේ සම්බන්ධයෙන් තමුන් නාන්සෙල තවත් අඩියක් කෙලින්ම ගන්නෙ නැත්තෙ ? හැම පාසැලකටම ගිහින් බලන්න මොකද වෙලා තියෙන්නෙ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කියා. චක්‍ර ලේඛය අනුව නිවාස ක්‍රමයක් ඇති නොකළ නිසා මේ රටේ අධ්‍යාපනය එන්ට එන්ටම හීන වෙනවා. ඒ නිසා වහ වහා ගුරු නිවාස දෙන්ට ඕනෑ. චක්‍ර ලේඛ යක් තිබෙනවා නම් එය අකුරටම පිළි පදින්ට ඕනෑ.

ගුරුවරුන් වශයෙන් අවුරුදු පතා ජ්‍යෙෂ්ඨ සමතුන් බඳවා ගන්න බව තමුන් නාන්සෙ දන්නවා. තමන්ගෙ ගම්වල සිට හැතැප්ම සිය හමාර ඈත ප්‍රදේශවලට තරුණ තරුණියන් පත්වීම් ලබාගෙන යනවා. ඒ අයට තමන් පත් වී ගිය පළාත් වල වාසය කරන්ට සැහෙන ගෙයක් තබා පැල්පතක්වත් සොයා ගන්න අමාරු වෙනවා සමහර තැන්වල. ඇයි එවැනි තත්ත්වයක් පවතින්ට ඉඩ හැර තිබෙන් නෙ? පාසැලකට යවන ගුරුවරුන්ට ඒ අවට තැනක පදිංචි වීමට වැඩ පිළිවෙළක් ඇති කරන්නෙ නැද්ද? ගරු ඉඩම් ඇමති තුමාට පුළුවන්කමක් නැද්ද 36 වන වගන් තිය යටතේ ඉඩම් අත්පත් කරගෙන ගෙවල් සෑදීම සඳහා අධ්‍යාපන දෙපාර්ත මේන්තුවට දෙන්ට? හැම පාසැලකටම වුව මනා කරන ඒ ඉඩම් ඉක්මනින් ලබා දෙන්ට එතුමාට පුළුවනි. ඉඩම් ලබා දුන් නම ගෙවල් හදන්ට මුදල් නැත්නම් පැල් පතක්වත් ගහගෙන ඉන්ට පුළුවන් වේවි.

ග්‍රාම සංවර්ධන සමිති මගින් සමහර තැන් වල රෙදි වියන මධ්‍යස්ථාන ඇති කර තිබෙ නවා. මේ අවුරුද්දේ එවැනි ආයතන එකක් වත් දෙන්නෙ නැහැ. ඒවා තහනම් කර තිබෙනවා. මුළු රටටම 49 ක් පමණයි දෙන්නෙ මේ අවුරුද්දෙ. එයින් අවසන් කරනවාලු. ගමේ තරුණ තරුණියන්ට එකතු වී යමක් නිෂ්පාදනය කිරීම අද එත කොට තහනම්. සමහර තැන්වල ගොඩ නැගිලි ගහල තියෙනවා. ඒවායේ වැඩ පටන් ගත්තොත් තමන්ගේ ශ්‍රමය යොදා වැඩ කිරීමට තරුණ තරුණියන් හැම ගම කම පාහේ ලෑස්තියෙන් ඉන්නවා. නමුත් දැන් ඒකත් නැති කරල තේද? ගම්බද ළමයින්ට මාසෙකට රුපියල් 50ක්, 100ක්, 150ක් උපයා ගන්ට තිබුණු මාර්ගය සම් පූර්ණයෙන්ම නැති කළා. ඒ ගොඩනැගිලි පාවිච්චි කිරීමට වහාම ඉඩ දෙන්ට ඕනෑ. සමහර ගොඩනැගිලි දැන් බාගයක් හදල ඉව රයි. යම්තම් වහලෙ ගහලත් තියෙනවා. මේ රටට ගෙන්වන රෙදි ප්‍රමාණය තුනෙන් එකක් දැන් අඩු කරලයි තියෙන්නෙ. ඒ ප්‍රමාණය මේ රටේ ගම්බද උදවියට මෙහිදීම නිෂ්පාදනය කරන්ට පුළුවන් නිසා ඒ අයට ආධාර කරන්න. මේ වැය ශීර්ෂය උඩ ඔය කරුණු ගැන මතක් කළේ ඒවා අවශ්‍යම කරුණු වශයෙන් තිබෙන නිසයි. මේ සම්බන්ධව මීට වඩා කථා කරන්න මා අදහස් කරන්නේ නැහැ. මේ වැය කරගෙන යන මුදල්, නැත්නම් වැය වී තිබෙන මුදල්, පාස් කිරීම ගැන අපේ විරුද්ධත්වයක් නැහැ. නමුත් අපි කියන්නේ වැඩ කෙරෙනවා මදි බවයි. දැන් මේ 59 වන අංකය—පාසැල් වැඩ පොළවල් තැනවීම—ගැන බලමු. මෙය මෙකට ඇතුළත් කරනවා පමණයි. වැඩක් වන්නේ නැහැ. මේවා බොහෝ පාසැල්වලට අවශ්‍ය වී තිබෙනවා. ඇතැම් බඩු නිපදවීම පුරුදු පුහුණු කරන්න ඒ ඒ පාසැල්වල ශිෂ්‍යයන්ට ඉඩකඩ සකස් කර දෙන්න ඕනෑ. එය අද ඉල්ලුම් කර තිබෙනවා. මගේ හිතේ හැටියට නම් දැන් එය නවත්වලා. මගේ ප්‍රදේශයේ මහා විද්‍යාල තිබෙනවා. [බාධා කිරීමක්] ඒවා වැය කළා නම් ඒ ගැන බලන්ට තිබුණා. ඒවා තැනීමේදී බැලුවේ නැත්තෙ ඇයි? එසේ නො බැලූ නිසා මතක් කර දීමක් මේ කළේ. මගේ කොට්ඨාශයේ බත්තරමුල්ලේ මහා විද්‍යාල විද්‍යාලයයේ ගොඩනැගිලි තනා තිබෙනවා. විද්‍යාගාරයකුත් එහි තිබෙනවා. ඒකට වතුර ටික සපයන්න මාර්ගයක් යොදා නැහැ. එත නට විදුලි බලය දෙන්න මාර්ගයකුත් ඇත්තේ නැහැ. නමුත් එහි "සයන්ස්" උගන්වන්නේ. මගේ කොට්ඨාශයේ බෝමිරියේ මහා විද්‍යාලය තිබෙනවා. ඒකට තවම ගොඩනැගිලි සකස් කර දී නැහැ. නමුත් එය පැරණි මහා විද්‍යාලයක්. ඒකට විද්‍යාගාරයක් ඇති කර වුවමනා කරන උප කරණ සපයා දෙන්ට වැඩ පිළිවෙළ සකස් වී නැහැ. මේවා කරන්න කියායි ඉල් ලන්නේ. මේවා අවශ්‍ය දේවල්.

ඒ වගේම අද රටවල් හැඩගැසීගෙන යන විධියට මේ රට දියුණු කරන්න ඕනෑ නම්, විද්‍යා අංශයෙන් නියම අධ්‍යාපනයක් දීමට වැඩ පිළිවෙළ හැම පාසැලකම සකස් විය යුතුයි. විද්‍යාගාර හා ඒවාට අවශ්‍ය උප කරණ දීල රට දියුණු කරන්ට ඕනෑ. එහෙම නැතුව නිකම් බොරුවට කෑගහන්න ඕනෑ නැහැ. සංස්කෘත පාලි පමණක් ඉගෙන ගත්තාට රටක් දියුණු වන්නෙ නැහැ. අද

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.]

විශ්ව විද්‍යාලයට ගොස් බලන්න විද්‍යා අංශයට යන්නේ සියයට කීයද කියා. එම නිසා හැම පාසැලකම "සයන්ස්" ඉගැන්වීමේ වැඩ පිළිවෙල මුල් කරගෙන කටයුතු කරන්න ඕනෑ. විද්‍යා අංශයට අවශ්‍ය ගොඩ නැගිලි ටික මේ වැය ශීර්ෂවලින් හෝ එසේ නැත්නම් ඉදිරියට ඇතුළත් කරගෙන හෝ ඒ වැඩ කරන්නය කියා මා ඉල්ලා සිටිනවා. ළමයින් හය සියයක්, හත් සියයක් සිටින පාසැල්වලට ඒවා අවශ්‍ය පිළිවෙළට ලබා දෙන්න. අපේ අධ්‍යාපන ඇමතිතුමාට නම් ඕවා කීවාට පලක් නැහැ. විද්‍යා අංශයෙන් අධ්‍යාපනයක් දීමට එතුමා ලැහැස්ති නැහැ. විද්‍යා අංශයෙන් අධ්‍යාපනයක් දීම සඳහා මේ පාඨශාලාවලට අවශ්‍ය ගොඩනැගිලි හා උපකරණ දෙන්න පසුගිය කාලයේ නොහැකිවූවා නම් ඉදිරියටවත් එය දෙන්න වැඩ පිළිවෙලක් සකස් කරන හැටියට ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

**වෛද්‍යාචාර්ය එම්. පී. ඩ්‍රහමන්** (පත් කරන ලද මන්ත්‍රී)

*(டொக்டர் எம். பீ. டிரஹ்மன்—நியமன அங்கத்தவர்)*

(Dr. M. P. Drahaman—Appointed Member)

There are about 101 students who are due to start their pre-clinical training in the second Medical College at Peradeniya in January, 1963. This training can be had only in the Kandy Hospital if the Government is not going to build a clinic at Peradeniya itself before January. I should like to have an assurance that the clinic at Peradeniya will be ready in time. If the clinic at Peradeniya will not be ready before January, arrangements should be made now itself for the students to be transferred to Colombo for their pre-clinical training. If even this is not possible the training should be given at the Kandy Hospital.

The Kandy Hospital is about two miles away from the University. The road connecting the two is very narrow and often one sees buses being repaired on it. It is difficult for the students to be conveyed along this road. Once they get to the hospital they have to spend the whole day there and get back to the University by whatever means possible.

I understand the clinic at Peradeniya is making very slow progress. Cannot the P. W. D. be ordered to see that it is ready by January? If that cannot be done I would appeal to the Government to transfer the students to Colombo because they have already suffered a great deal by the late starting of the second Medical College.

පූ. භා. 9.13

**සුමනපාල දහනායක මයා.**

*(திரு. ஸுமனபால தகனாயக்க)*

(Mr. Sumanapala Dahanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වැය ශීර්ෂය යටතේ මගේ ඡන්ද කොට්ඨාශයට අදාළ කරුණු දෙකක් තුනක් ගරු සභාවට පෙන්නුම් කර දීමට මම අදහස් කරනවා. 29 වැනි අංකය යටතේ, මාතෘ නිවාස ඉදි කිරීම සම්බන්ධව වෙන් කරන මුදලින් අපේ කොට්ඨාශවලට නම් කිසිම වැඩක් සිදු නොවන බව මම කියන්ට ඕනෑ. මගේ කොට්ඨාශයේ පල්ලේගම නමැති ස්ථානයේ මාතෘ නිවාසයක් සඳහා ගොඩනැගිල්ලක් සාදා තිබෙනවා. මෙය සෑදුවේ 1955 වර්‍ෂයේයි. එහෙත් දැනට අවුරුදු 7 ක් ගතවීත් ජල ප්‍රශ්නය විසඳා නැති නිසා මේ මාතෘ නිවාසය විවෘත කිරීමට මේතාක් රජයට නොහැකි වුණා. මේ කාරණය ගැන අපි නොයෙක් වර රජයට කරුණු පෙන්නුම් කළා. එහෙත් ඒ සෑම අවස්ථාවකම, දැන් ටෙන්ඩර් කළාය, අහවල් ටෙන්ඩර්කරුවාටයි කොන්ත්‍රාත්තුව භාර දුන්නේ, යනාදී කරුණු කියනවා මිසක් අද වන තුරු මේ මාතෘ නිවාස ගොඩනැගිල්ලේ ජල පහසුව විසඳා නැහැ. අවුරුදු හතක් තිස්සේ මේ ගොඩනැගිල්ල කිසිම ප්‍රයෝජනයක් නැතිව වවුලන්ගේ වාස භවනයක් බවට පත් වී තිබෙනවා. මේ ගොඩනැගිල්ලේ ජල ප්‍රශ්නය විසඳීම සඳහා රුපියල් හැට දහසක මුදලක් වෙන් කර තිබෙන බව මට දැනගන්ට ලැබුණා. එහෙත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව ඒ සම්බන්ධව අද වන තුරු කිසිම පියවරක් ගෙන නැහැ. මේ වෙන් කර තිබෙන රුපියල් හැට දහස වියදම් කිරීමට යම් අපහසු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කමක් තිබෙනවා නම් මම එක්තරා යෝජනාවක් ඉදිරිපත් කරන්න කැමතියි. එනම් ළිඳක් කපා, ඊට මෝටරයක් හෙවත් වතුර ඉහළට අදින යන්ත්‍රයක් සවි කිරීමයි. එසේ නැත්නම් එම ළිඳෙන් වතුර ඇදීම සඳහා මිනිසුන් දෙදෙනෙක් හෝ තුන් දෙනෙක් යොදවන්න පුළුවනි. මෙවැනි ක්‍රමයක්වත් අනුගමනය කිරීමෙන් මේ මාතෘ නිවාසය විවෘත කරන්ට පුළුවන් වන බව මම රජයට පෙන්වා දෙන්න සතුටුයි. තමුන්නාන්සේලාට මතක ඇති, කල් දැමීමේ යෝජනා අවස්ථාවකදී මම මේ කාරණය ප්‍රශ්නයක් වශයෙන් මේ ගරු සභාවට ඉදිරිපත් කළා. එහෙත් මේ වන තුරු අප විසින් කරන ලද එකම ඉල්ලීමකටවත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සැළකිල්ල යොමු කර නැති බව මම ඉතා කනගාටු වෙන් කියනවා. ඒ ගොඩනැගිල්ල දිනෙන් දින ජරාවාස වෙනවා. ඒ නිසා වහාම මේ ගොඩනැගිල්ලේ ජල ප්‍රශ්නය විසඳා මේ මාතෘ නිවාසය විවෘත කළ යුතුයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එහෙම නැත්නම් රුපියල් දහදහසක් පමණ වියදම් කර මේ ගොඩනැගිල්ලේ එන්ජිමක් සවි කරන්ට ඕනෑ. එසේ කළොත් ජලය පමණක් නොවෙයි, විදුලි බලයත් ලබා ගන්න පුළුවන් වෙනවා. මේ කාරණය අතපසු කරන්නේ මන්ද කියා මම ප්‍රශ්න කරනවා. ඒ නිසා සෞඛ්‍ය පහසුකම් නැතිව දුක් විඳින මගේ කොට්ඨාශයේ ජනතාව වෙනුවෙන්, මේ කටයුත්ත ඉක්මණින්ම සපුරාලීමට සෞඛ්‍ය කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම් තුමා ක්‍රියා කරාවිය කියා මම බලාපොරොත්තු වෙනවා. එසේ කළොත් ඒ මාතෘ නිවාසය ඉක්මණින් විවෘත කරන්ට පුළුවන් වන අතර එයින් ඒ පළාතේ ජනතාවට විශාල ප්‍රයෝජනයක් අත් වෙනවා.

ඊළඟට ගරු නියෝජ්‍ය කථනායකතුමනි, ආරෝග්‍ය ශාලා පුළුල් කිරීම සඳහා අංක 45 දරණ අංකය යටතේ මුදල් වෙන් කර තිබෙනවා. මොරවක ග්‍රාමීය ආරෝග්‍ය ශාලාවට තවත් වැඩිපුර වාට්ටු දෙකක් එකතු කළ යුතුව තිබෙනවා. මෙය අත්‍යවශ්‍ය කරුණක්. පසුගිය අවුරුදු දෙක තිස්සේම මේ ගැන අප කරුණු ඉදිරිපත් කළා. එහෙත් තවමත් එම ආරෝග්‍ය ශාලාවේ වාට්ටු ගණන වැඩි කර නැහැ. දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු මහත්වරුන් ගොස් එම ස්ථානය මණින එක පමණයි කරන්නේ. මෙම ආරෝග්‍ය ශාලාවේ දැනට ඇත්තේ එක වාට්ටුවයි. එම වාට්ටුවේ ඇඳන් විස්සයි තිබෙන්නේ. එම වාට්ටුවේ ඉඩකඩ තිබෙන්නේ ලෙඩුන් තිස් දෙනෙකුට පමණයි. එහෙත් දැනට ඒ ආරෝග්‍ය ශාලාවේ ලෙඩුන් පණහකට වඩා සිටිනවා. ලෙඩුන් ඉතාම අඩු දවසටත් 50 ක් විතර ඉන්නව. ලෙඩුන් සිටින්නේ පිල්වල සහ ඇඳන් යට ආදී තැන්වලයි. මා මේ කාරණය මාතර සෞඛ්‍ය සේවා අධිකාරී මහත්මයාටත් පෙන්වා දුන්නා. ඒ වගේම මීට ප්‍රථමයෙන් මේ ගරු සභාවේදී ගරු ඇමතිතුමාටත් මතක් කළා. නමුත් අද දක්වා ඒ ගැන උනන්දුවක් දක්වා නැහැ. එය මනින්ට ගිය මහත්වරුන්ට ගමන් ගාස්තු ආදිය ගෙවා තිබෙනවා. එය මැන ඉවරයි. මොරවක ආරෝග්‍යශාලාවට වාට්ටු දෙකක් තැනීමටයි ආණ්ඩුව බලාපොරොත්තුව සිටියේ. පුළුවන් තරම් ඉක්මණින් අඩු වශයෙන් එක වාට්ටුවක්වත් තනා දෙන මෙන් ගරු ඇමතිතුමාගෙන් ඉල්ලමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසාන කරනවා.

**හමීඩ් මයා.**
*(ஜனாப் ஹமீத்)*
(Mr. Hameed)

Looking at the Schedule I began to feel that there is some form of hide and seek game in it, because some of the items are specific, for instance, they say hospital extensions at such and such a place and water supply at such and such a place ; but there are certain items which are not specific, for instance, seven sets of quarters and offices for Divisional Revenue Officers—we do not know where they are to be established.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

I may say, Sir, that all the details were mentioned in the 1957-58 Budget and were debated in this House and accepted. This is only a summary for transferring funds.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

හමීඩ් මයා.
*(ஜனாப் ஹமீத்)*
(Mr. Hameed)

If that is so, well and good, otherwise I had a sneaking feeling it was an attempt to hide some of these things because you are establishing them in electorates of Government Members of Parliament.

Whatever it is, we have to make one thing clear, that is, these moneys are not pilfered, are not robbed, are not misused.

ගරු සී. පී. ද සිල්වා
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

Unfortunately, I do not know whether the hon. Member was here when this money was voted and spent in 1957-58. You cannot take it up now.

හමීඩ් මයා.
*(ஜனாப் ஹமீத்)*
(Mr. Hameed)

As long as you come before this House with this Motion——

ගරු සී. පී. ද සිල්වා
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

The Motion is not to approve the works, but to approve the transfer of funds to the Consolidated Fund of Ceylon.

හමීඩ් මයා.
*(ஜனாப் ஹமீத்)*
(Mr. Hameed)

I am afraid we will have to go very far into it. As long as you table a Motion you cannot say whether an hon. Member was there or not at that time.

ගරු සී. පී. ද සිල්වා
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

You referred to pilfering and so on.

හමීඩ් මයා.
*(ஜனாப் ஹமீத்)*
(Mr. Hameed)

That is what I still maintain. We have to make sure that these moneys have been utilized in the correct way. To cite a parallel example, a building for the Salt Corporation was put up at a cost of Rs. 68,000, and what was the timber used? Sawn rubber timber. That was at Boondala. Do you want the particulars?

ගරු සී. පී. ද සිල්වා
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

No, no; you are right.

හමීඩ් මයා.
*(ஜனாப் ஹமீத்)*
(Mr. Hameed)

What is the guarantee that these people will not use sawn papaw trees? That is what we want to make sure. Even if the work has been done and finished, we have a right to ask that question.

I am sorry the Hon. Minister of Education is not here, otherwise I would like to point out to him with regard to these school buildings, when a certain amount of money is allocated, you have no objection to a contractor doing it and you pay the full estimated sum, but when it comes to a case of a Parent-Teacher Association using the best material and doing it in the most correct manner, you are not prepared to allow anything more than 55 per cent. and in some cases 75 per cent. of the subsidy. That is the practice. I am sure hon. Members of the Government will bear me out when I say that when a Parent-Teacher Association puts up a building they do have a certain amount of feeling for that building, they feel they are putting it up for their children. If you are prepared to give the full estimated sum to a private contractor why do you not allow it to a Parent-Teacher Association?

I have one more point to make. That is about items under village works undertaken by Rural Development Societies on a self-help basis. Voting money like this is not going to help. It is not going to help you to promote the very principle of "self-help" basis. We will be throwing cold water on "self-help" basis.—[*Interruption.*]—I am happy that the Hon. Minister says he will not do so.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

When you take this "self-help" basis what are the items that come under that? They are, opening up of roads, putting up R. D. S. halls and putting up community centre halls. Most of these things come under "self-help" basis. I think during the last one year the roads that had been opened up by the people were done not on the principle of "self-help" basis but on the *shramadana* principle. Now on this principle how many roads can you take up and how many rural development society halls can you put up? When we speak of reconstruction and development of the rural areas I would like to appeal to the new Finance Minister to pay more attention to and vote more money for this purpose so that the people who are today wedded to the *shramadana* movement will not be discouraged. After all, the people who are wedded to the *shramadana* movement are helping the Government. The Government must recognize their work and meet them halfway by seeing to it that they do not vote such poor sums of money.

Those are the two things that I wanted to bring to the notice of the Hon. Minister and I believe the new Minister of Finance will be more liberal and not start chopping the vote here and there and "try to build a house out of jam."

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

## පරිපූරක මුදල : ජාතික සංවර්ධන ණය පණත යටතේ සම්මතිය

## குறைநிரப்புத் தொகை : தேசிய அபிவிருத்திக் கடன் சட்டத் தீர்மானம்

## SUPPLEMENTARY SUPPLY : RESOLUTION UNDER NATIONAL DEVELOPMENT LOAN ACT

**ගරු සී. පී. ද සිල්වා**

*(கௌரவ சீ. பீ. டி சில்வா)*

(The Hon. C. P. de Silva)

I move,

That this House hereby resolves, under section 5 (2) of the National Development Loan Act (Chapter 409), that the sum of Rs. 2,950 expended out of the Consolidated Fund during the Financial Year ending on September 30, 1958, for work connected with or incidental to national development and specified in the Schedule hereto, shall be charged to the loan raised under section 2 of that Act:—

| *Schedule* | *Rs.* |
|---|---|
| 1. Grant to the Ceylon Institute of Scientific and Industrial Research .. .. | 2,950 |

This is similar to item No. 12. It is a Resolution under the National Development Loan Act for a small sum of Rs. 2,950 spent in the year 1957-58 by the Ceylon Institute of Scientific and Industrial Research.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

පූ. භා. 9.28

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**

*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*

(Mr. D. B. R. Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ස්ථානය විශේෂයෙන්ම නියම ආකාරයට ක්‍රියාත්මක කළ යුතු ස්ථානයක්ව තිබෙනව. විද්‍යා අංශයෙන් දියුණුවන්ට බලාපොරොත්තුවන උදවියට මේ ලංකා විද්‍යාත්මක සහ කාර්මික පර්යේෂණායතනයෙන් නියම ප්‍රයෝජන ලබා ගත හැකි වන අන්දමට එය සකස් කරන්න ඕනෑ. එය මේ රට දියුණු කිරීමට විශාල ආධාරයක් වෙනවා. එම නිසා ඒ ස්ථානයට කොයි තරම් මුදලක් වියදම් කරනවාද, මොන මොන කරුණු ගැන එහි පර්යේෂණ පවත්වාගෙන යනවාද, ඒ පර්යේෂණ මාර්ගයෙන් කොයි කොයි කර්මාන්ත දියුණු කිරීමට රපෝර්තු ආදිය පිළියෙළ කර ප්‍රසිද්ධ කර තිබෙනවාද, යන කරුණු ගැන අපි දැනගන්ට සතුටුයි. මන්ද? අද කෘෂිකර්ම අංශයෙන් පමණක් නොවෙයි, කාර්මික අංශයෙනුත් මේ රට දියුණු කළ යුතුව තිබෙනව. රට කාර්මික අංශයෙන් දියුණු කිරීමට නම් මේ ආයතනය මගින් යම් යම් කර්මාන්ත ගැන පර්යේෂණ පවත්වා ඒ කර්මාන්ත දියුණු කිරීමට විශේෂ උපදෙස් ලබා දෙන්න ඕනෑ. ඒ උපදෙස් ආදිය රටේ ප්‍රසිද්ධ කළ යුතුයි. අපි පසුගිය දිනවලදී පත්‍ර මගින් ඉල්ලා සිටියා, ඒ ස්ථානයේ කරනු ලබන පර්යේෂණ ආදිය සම්බන්ධ නිවේදන ආණ්ඩුවේ අච්චු කන්තෝරුව මාර්ගයෙන් මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන්ටය කියා. එසේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.]

නැතිව රපෝර්තුවක් පමණක් ප්‍රසිද්ධ කළාට මදි. ඒ ආයතනයෙන් අද රපෝර්තු පිට කරනව. නමුත් විද්‍යාව ඉගෙන ගන්න සිසුන් ඉන්න මහා විද්‍යාලවලට පරීක්ෂණ ගැන වැඩි විස්තර ඇති වාර්තා යවනව නම් කුඩා කාලයේ සිට විද්‍යා අංශයේ ඉගෙන ගනිමින් සිටින ඒ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට තමන්ගේ අනාගතය හැඩ ගස්වා ගත යුත්තේ කොයි ආකාරයටද, තමන් බැසිය යුත්තේ කොයි අංශයටද කියන එක මා හිතන්නෙ පැහැදිලි වෙනවා ඇති කියායි. මේ පර්යේෂණායතනයේ වාර්තා විශ්ව විද්‍යාලවලටත්, මහා විද්‍යාල ආදියටත් කෙලින්ම යැවීම අධ්‍යාපන දෙපාර්තමේන්තුව භාර ගන්න ඕනෑ. එසේ කරගෙන ඒවායේ පුස්තකාලවලට මෙම වාර්තා යවන්න ඕනෑ. ඒවා ළමයින් හැඩ ගැසීමට උපකාර වෙනව. තමන් බැසිය යුත්තේ කොයි අංශයටද, තමන් යෙදිය යුත්තේ කොයි කර්මාන්තයේද, ඒ ඒ කර්මාන්ත මේ රටේ කොයි අන්දමට දියුණු කළ හැකිද, කියන කාරණා ළමයින්ට අවබෝධ වෙනව. එසේ පාඨශාලාවල විද්‍යා අංශවල ඉගෙන ගන්නා උසස් පන්තිවල ළමයින්ට ඇතැම් සාකච්ඡා සඳහා මේවා ප්‍රයෝජනවත් වෙනව. පර්යේෂණාගාරවලින් නිකුත් කරන රපෝර්තු විද්‍යාව උගන්වන ස්ථාන වලට යවා ඒ ළමයින්ට ඒ කරුණු ගැන අවබෝධයක් ලබා දී රට දියුණු කරගැනීමට මග සලස්වන්න. මේකත් ඉතාමත් වැදගත් අංශයක්. මෙයත් මුදල් වැය කරන්ට ඕනෑ තැනක්. එම නිසා මේ ලංකා විද්‍යාත්මක සහ කාර්මික පර්යේෂණායතනයේ වාර්තා සෑම මධ්‍යම විද්‍යාලයකටත්, මහා විද්‍යාලයකටත්, ඒ වගේම පුස්තකාලයටත් බෙදා හැර ශිෂ්‍යයන්ගේත්, ඒවා කියවන වෙන අනෙක් උදවියගේත් මේ පිළිබඳ දැනුම වැඩිදියුණු කරන ලෙස ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

## පරිපූරක මුදල : දුම්රිය සේවය

## குறைநிரப்புத் தொகை : புகையிரதப் பகுதி

## SUPPLEMENTARY SUPPLY : RAILWAY

**ගරු පී. බී. ජී. කලුගල්ල (ප්‍රවාහණ හා රජයේ වැඩ පිළිබඳ ඇමති)**

*(கௌரவ பீ. பி. ஜீ. களுகல்ல—போக்குவரத்து, கட்டுவேலை அமைச்சர்)*

(The Hon. P. B. G. Kalugalla—Minister of Transport and Works)

That a supplementary sum not exceeding Rupees One million nine hundred and eighty-four thousand five hundred (Rs. 1,984,500) be payable out of the Consoliated Fund of Ceylon, or any other fund or moneys of, or at the disposal of the Government of Ceylon or from the proceeds of any loans obtained by the Government of Ceylon, for the service of the Financial Year beginning on 1st October, 1961, and ending on 30th September, 1962, and that the said sum may be expended as specified in the Schedule hereto :—

| *Schedule* | *Rs.* |
|---|---|
| Head 164—Railway. | |
| Vote No. 1—Personal Emoluments and other allowances of staff .. .. | 1,984,500 |

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

පූ. භා. 9.33

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**

*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*

(Mr. D. B. R. Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන් කැලණිවැලි දුම්රිය මාර්ගය සම්බන්ධයෙන් වචන කීපයක් කියන්ට තිබෙනවා. මේ දුම්රියෙන් අද බොහෝ දෙනා ගමන් කරනවා. මේ දුම්රිය මාර්ගය ඉතාමත් පටුයි. ඒ නිසා දුම්රිය තරමක් වේගයෙන් ගමන් කරන විට එක ආසනයක සිටින කෙනකු තවත් ආසනයක සිටින කෙනකු හා එකට හැප්පෙනවා. සමහර විට ඉස්සරහ ආසනයක සිටින කෙනකු පස්සා ආසනයක සිටින කෙනකු හා හැප්පෙනවා. දැන් හෝමාගම ඔරුවල යකඩ කර්මාන්ත ශාලාවක් සාදා ගෙන යන නිසා මේ දුම්රිය මාර්ගයද දියුණු කිරීම විශේෂයෙන් අවශ්‍ය වී තිබෙනවා. මේ දුම්රිය මාර්ගය වැටී තිබෙන්නේ "හයි ලෙවල්" බස් රථ මාර්ගය හා සමාන්තරවයි. හයි ලෙවල් පාර දෑල විශාල ජනකායක් සිටිනවා. ඒ පාර දෑල ජනගහනය ඉතා තදයි. එම නිසා අඩු වශයෙන් අවිස්සාවේල්ල දක්වාවත් මේ දුම්රිය මාර්ගය පළල් කොට ක්‍රමානුකූල දුම්රිය ධාවනයක් ඇති කළහොත් විශාල ජනකායකට ලොකු සේවයක් සැලසෙන බව කියන්නට කැමතියි. මේ දුම්රිය මාර්ගය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දියුණු කළහොත් මේ ප්‍රදේශයේ සිටින ජනතාවට ලොකු දියුණුවක් ලබන්ට පුළුවනි. බස් කොම්පැනි තිබෙන කාලයේදී නම් ඒ කොම්පැනිකාරයන් මේ දුම්රිය මාර්ගය වැඩි දියුණු කිරීමට ඉඩ දුන්නේ නැහැ. ඊට අවහිර කළ බව මා මේ ගරු සභාවේදී නොයෙක් වර මතක් කර ඇති. අඩු වශයෙන් අවිස්සාවේල්ල දක්වාත් මේ දුම්රිය මාර්ගය වැඩි දියුණු කළහොත් දුම්රිය දෙපාර්තමේන්තුවට විශාල ආදායමක් ලබා ගන්නටත් පුළුවන් වේවි. මුල් කාලයේදී නම් මේ දුම්රිය සේවයෙන් ලාභ ලැබුණා. නමුත් වෙනත් ගමනාගමන පහසුකම් ඇති වූවාට පසුව බොහොම ප්‍රමාද, පිරිහුණු, සේවයක් තිබෙන මේ දුම්රියෙන් බඩු මුට්ටු එහා මෙහා යැවීමට හෝ ගමන් බිමන් කිරීමට හෝ මහජනයා වැඩි කැමැත්තක් දැක්වූයේ නැති බව ඇත්තයි. විශේෂයෙන් තව අවුරුදු දෙකක් යන විට ඔරුවල යකඩ කම්හලෙන් යකඩ නිෂ්පාදනය වන විටවත් මේ දුම්රිය සේවය ක්‍රමානුකූලව දියුණු කළ යුතුව තිබෙනවා. ඔරුවල යකඩ කම්හල පිහිටුවන අතර ගම්පහ ප්‍රදේශයේ ඊට අදාළ ගබඩා පිහිටුවන බවකුත් දැන ගන්නට තිබෙනවා. එසේ කිරීම නම් තේරුමක් නැති වැඩක්. කෙසේ හෝ වේවා, මේ දුම්රිය සේවය දියුණු කිරීමට ක්‍රියා කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

**හමීඩ් මයා.**
*(ஜனாப் ஹமீத்)*
(Mr. Hameed)

I want to know from the Hon. Minister why vacancies in the Railway Department are not filled. You will find that millions of rupees are being paid as overtime. This has two defects. One defect, as you will agree with me, is that overtime is not productive. The volume of work done is not very productive. The second is the question of employment. After all, there are thousands of youths who are seeking employment. Why do you not fill those vacancies? Millions of rupees are being paid as overtime. I know that there are various rackets that centre around this question of overtime. I do not want to go into details. The allocation of overtime itself is honeycombed with favouritism. Therefore, I would like to appeal to the Hon. Minister to see that these vacancies are filled without further delay.

Railway losses, especially on account of thefts, continue to increase. We have the railway security officers. I would like to ask the Hon. Minister why up to date these security men are not allowed to appear in civilian clothes at the railway yard. As soon as they go to the railway yard in uniform the talk goes round and everybody knows that the security men are about the place. Security men must be allowed to appear in civilian clothes in the railway yard.

We have the Colombo-Kandy train every day leaving Colombo at 4 p.m. I would like the Hon. Minister to consider this suggestion. On Saturdays there are a large number of Government officers and officers working in the commercial sector who leave their offices by 1 p.m., but they have to hang around until 4 p.m. for the train. I would request the Hon. Minister to see whether it is not possible to start this train from Colombo on Saturdays only at 2 p.m. so that these officers can get home in time.

When they reach Kandy they have to proceed from there to Matale and various other places, and if my suggestion is accepted they will be able to get their buses in time.

There is one more matter I want to mention. Udathalawinna is a point on the Kandy-Matale line. On that line, Udathalawinna, is the most paying point. Udatalawinna is a point on the line between Kandy and Matale. Trains stop at Udatalawinna but I do not want to call it a station because there is no building there. Correspondence on this subject has been going up and down for the last 5 or 6 years. I should like to appeal to the Hon. Minister to take up that matter because this is a centre that has been neglected. An old abandoned railway waggon is used as a railway station.

The next thing is we have a train leaving Colombo called the Nanu Oya Express at 6.05 a.m. It reaches Kandy

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[හමීඩ් මයා.]

by 9 o'clock . I want the Hon. Minister to consider the possibility of running a connecting train up to Matale. You will find that people who wish to proceed beyond Matale have no connecting train. I hope the Hon. Minister will look into it.

Finally, it is understood that there is to be classless travel from the 1st of next month on short distance trains. Now I am not arguing on the pros and cons of classless travel, but I should like to point out that there will be a problem with regard to Government servants because their class of travel is determined by the salary they draw, and they are entitled to season tickets. As I said I am not debating the pros and cons of this matter, but I would like if this question could be gone into.

ඩබ්ලිව්. දහනායක මයා.
(திரு. டபிளியு. தகனாயக்க)
(Mr. W. Dahanayake)

I want to make a few observations. The first point I wish to mention is the new colour light signalling scheme. That has been put into operation from the first of this month. Today, in spite of the signals being given from the cabins of various stations, there is what is called the master keyboard at the Maradana railway station which is expected to given signals to all the stations within a certain distance from Colombo. This colour light signal scheme has been in operation from the first of this month. I myself have experienced certain delays as a result of the introduction of this scheme. The trains that come into Colombo halt between the Slave Island and Fort stations, and sometimes the delay is over half an hour. The same is true of the trains on other lines. Not only is there an inordinate delay between the Fort Railway Station and the other stations, but I also learn that the new signal system does not operate properly.

A few days ago a collision was barely averted. I do not know whether this new colour light scheme had been fully tested before it had been put into operation. I also do not know whether those who are supervising this work have a full and detailed knowledge of the scheme. I learn that in the recently averted collision the fault was with those who operated the master keyboard at Maradana. I hope that there will be no major disaster as a result of ignorance on the part of those who operate the scheme. The Minister should look into this carefully so that possible collisions and inordinate delays are averted.

There is one other point on which I wish to make a few comments. The overtime bill of the Railway in the year 1960-61 was Rs. 6.6 million and the overtime bill in the year 1961-62 was Rs. 7.2 million. The Minister has said that the overtime bill is due to vacancies not being filled. He also admits that the increase in the overtime bill is due to the fact that the vacancies in 1961-62 were more than the vacancies in 1960-61. This is a deplorable state of affairs. I do not know what the overtime bill is going to be in 1962-63. Assuming that the overtime bill in 1962-63 will also be Rs. 7.2 million, in a space of three years you would have spent Rs. 23 million on overtime, a colossal sum of money to spend on overtime which you could well have spent on new employees. There are a large number of youths who are anxious to join the Railway. The Hon. Minister is aware, and he has been very sympathetic on this point, that there is a very large waiting list of the children of railway employees who are very anxious to come into the service. I do hope that he will look into this question carefully and see that a large number of the children of railway men are employed and that this excessive overtime bill is reduced.

පූ. භා. 9.49

සුමනපාල දහනායක මයා.
(திரு. ஸுமனபால தகனாயக்க)
(Mr. Sumanapala Dahanayake)

කොළඹ-මාතර දුම්රිය ගමන පිළිබඳව වචන කීපයක් මතක් කරන්න කැමතියි. "රුහුණු කුමාරි" දුම්රිය අද දවසේ බොහොම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ජනප්‍රිය වී තිබෙන බව කියන්න ඕනෑ. "රුහුණු කුමාරි" උදේ 6 ට මාතරින් පිටත් වෙලා කොළඹ බලා එනවා. නැවත හැන්දෑවට මාතර බලා යනවා.

මාතර සිට කොළඹ බලා එන අයගේත් කොළඹ සිට මාතර බලා යන අයගේත් ගමන් පහසුව සඳහා පැය තුනකින් මේ ගමන කෙළවර කරන්න පුළුවන් රුහුණු කුමාරි හා සමාන තවත් දුම්රියක් වුවමනා බව අප කියා සිටිනවා. මීට ඉහතිනුත් මේ පිළිබඳව මෙම සභාවේදී ප්‍රකාශ කර ඇති. උදේ හතකුත් ගණනකට කොළඹ සිට මාතර බලා දුම්රියක් පිටත් වෙනව. ඒක මාතරට යන්ට පැය 5 ක් විතර ගත වෙනව. වෙළඳ ව්‍යාපාරිකයන්ට, නීතිඥයන්ට, කෙටියෙන් කියනවා නම් ඉක්මනින් ගමන්බිමන් කරන්න වුවමනා කරන උදවියට නියම වේලාවට එම දුම්රියෙන් තම ගමන් බිමන් කරන්න අමාරුයි. මාතර සිට උදේට රුහුණු කුමාරි දුම්රියෙන් පැමිණෙන අයට උදේ 9 ට කන්තෝරුවල පෙනී සිටින්නත් පුළුවනි. ගරු ඇමතිතුමාගෙන් විශෙෂයෙන් ඉල්ලා සිටිනවා, රුහුණු කුමාරි දුම්රිය හා සමාන තවත් දුම්රියක් මෙම මාර්ගයට යොදන්නය කියා. එම දුම්රිය කොළඹින් උදේ 6 ට පිටත් වීමට යෙදුවොත් සවසට කොළඹ බලා ආපසු පැමිණෙන්ටත් පුළුවනි. ගරු ඇමතිතුමා හුඟක් උනන්දුවෙන් වැඩ කරන බව අපි දන්නවා. මෙම කාර්යය ඉටු කර දෙන ලෙස මා එතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු කලුගල්ල**

*(கௌரவ கலுகல்ல)*

(The Hon. Kalugalla)

Mr. Deputy-Speaker, I must thank the Members of the Opposition for allowing these five Supplementary Estimates to be passed within a short time. The very valuable suggestions made by the hon. Members will receive my earnest consideration.

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

## පරිපූරක මුදල් : දුම්රිය දෙපාර්තමේන්තුව

### குறைநிரப்புத் தொகை : புகையிரதச் சேவை

### SUPPLEMENTARY SUPPLY : RAILWAY

මතු පළවන යෝජනාව සභාසම්මත විය.

That a supplementary sum not exceeding Rupees Four million one hundred and seventy-three thousand three hundred and twenty-five (Rs. 4,173,325) be payable out of the Consolidated Fund of Ceylon, or any other fund or moneys of, or at the disposal of the Government of Ceylon or from the proceeds of any loans obtained by the Government of Ceylon, for the service of the Financial Year beginning on 1st October, 1961, and ending on 30th September, 1962, and that the said sum may be expended as specified in the Schedule hereto :—

| *Schedule* | *Rs.* |
|---|---|
| Head 164—Railway. | |
| Vote No. 2 — Administration Charges—Recurrent Expenditure .. .. | 3,503,500 |
| Vote No. 6—Economic Development—Recurrent Expenditure .. .. | 669,825 |
| | 4,173,325 |

මතු පළවන යෝජනාව සභාසම්මත විය.

That a supplementary sum not exceeding Rupees Six million four hundred and ninety-nine thousand (Rs. 6,499,000) be payable out of the Consolidated Fund of Ceylon, or any other fund or moneys of, or at the disposal of, the Government of Ceylon or from the proceeds of any loans obtained by the Government of Ceylon, for the service of the Financial Year beginning on 1st October, 1961, and ending on 30th September, 1962, and that the said sum may be expended as specified in the Schedule hereto :—

| *Schedule* | *Rs.* |
|---|---|
| Head 164—Railway. | |
| Vote No. 7—Economic Development—Capital Expenditure .. .. | 6,499,000 |

—[ගරු කලුගල්ල]

## පරිපූරක මුදල : දුම්රිය දෙපාර්තමේන්තුවට ඩීසල් ජලවේගබල කෝච්චි

### குறைநிரப்புத் தொகை : டீசல் நீர்ச்சக்திப் பெட்டிகள்

### SUPPLEMENTARY SUPPLY : DIESEL HYDRAULIC POWER COACHES FOR RAILWAY

මතු පළවන යෝජනාව සභාසම්මත විය :

That a supplementary sum not exceeding Rupees Three million one hundred and twenty-two thousand (Rs. 3,122,000) be payable out of the Consolidated Fund of Ceylon, or any other fund or moneys of, or at the disposal of the Government of Ceylon or from the proceeds of any loans obtained by the Government of Ceylon, for the service of the Financial Year



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු කලුගල්ල]

beginning on 1st October, 1961, and ending on 30th September, 1962, and that the said sum may be expended as specified in the Schedule hereto —

| Schedule | Rs. |
|---|---|
| Head 164—Railway. | |
| Vote No. 7—Economic Development—Capital Expenditure .. .. | 3,122,000 |

—[ගරු කලුගල්ල]

## පරිපූරක මුදල : කටුනායක අහස් නැව් තොටුපලට දුම්රිය මාර්ගයක්

குறைநிரப்புத் தொகை : கட்டுநாயக்கா வரை புகையிரத வீதி

## SUPPLEMENTARY SUPPLY : RAILWAY LINE TO KATUNAYAKE AIR PORT

මතු පළවන යෝජනාව සභාසම්මත විය.

That a supplementary sum not exceeding Rupees Ten (Rs. 10), (Token Vote), be payable out of the Consolidated Fund of Ceylon, or any other Fund or moneys of, or at the disposal of the Government of Ceylon or from the proceeds of any loans obtained by the Government of Ceylon, for the service of the Financial Year beginning on 1st October, 1961, and ending on 30th September, 1962, and that the said sum may be expended as specified in the Schedule hereto :—

| Schedule | Rs. |
|---|---|
| Head 164—Railway. | |
| Vote No. 7—Economic Development—Capital Expenditure .. .. | 10 (Token Vote) |

—[ගරු කලුගල්ල]

## පරිපූරක මුදල : සිවිල් ගුවන් සේවය : සීමාසහිත ලංකා ගුවන් සමාගමට ආපසු ගෙවීම

குறைநிரப்புத் தொகை : சிவில் விமானப் போக்குவரத்து—இலங்கை விமானச் சேவை லிமிடட்டுக்குக் கொடுமதி

## SUPPLEMENTARY SUPPLY : CIVIL AVIATION REFUND TO AIR CEYLON LTD.

ගරු කලුගල්ල

(கௌரவ கலுகல்ல)

(The Hon. Kalugalla)

I move,

That a supplementary sum not exceeding Rupees Thirty-two thousand four hundred and one (Rs. 32,401) be payable out of the Consolidated Fund of Ceylon, or any other fund or moneys of, or at the disposal of, the Government of Ceylon or from the proceeds of any loans obtained by the Government of Ceylon, for the service of the Financial Year beginning on 1st October, 1961, and ending on 30th September, 1962, and that the said sum may be expended as specified in the Schedule hereto :—

| Schedule | Rs. |
|---|---|
| Head 165—Civil Aviation. | |
| Vote No. 2—Administration Charges—Recurrent Expenditure .. .. | 32,401 |

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

පූ. භා. 9.53

හමීඩ් මයා.

(ஜனாப் ஹமீத்)

(Mr. Hameed)

Does the Hon. Minister have any scheme for providing an aerodrome at Kandy ? It will be admitted that Kandy is the Hill Capital and is the Royal Seat of Kings. Kandy needs an aerodrome. In fact, politically, it is an area from where your Government draws a large number of Members. It will even be a political victory for you. If an aerodrome is not possible I would ask the Hon. Minister to explore the possibility of constructing a sea base there, but at no cost should the identity of the Kandy lake be destroyed.

ලෙස්ලි ගුණවර්ධන මයා. (පානදුර)

(திரு. லெஸ்லி குணவர்தன—பாணந்துறை)

(Mr. Leslie Goonewardene—Panadura)

I think the idea is to have a railway from Katunayake to Colombo which is cheaper than having a road. Are you going to have a separate air terminal in Colombo ? If so where are you going to build it ?

ගරු කලුගල්ල

(கௌரவ கலுகல்ல)

(The Hon. Kalugalla)

In the Fort.

ජයසිංහ මයා.

(திரு. ஜயசிங்ஹ)

(Mr. Jayasinghe)

Firstly I want to know from the Minister whether the aerodrome comes within his Ministry ?

ගරු කලුගල්ල

(கௌரவ கலுகல்ல)

(The Hon. Kalugalla)

No.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ජයසිංහ මයා.
(திரு. ஜயசிங்ஹ)
(Mr. Jayasinghe)

The airport was taken over from the R. A. F. with about 600 acres of land. As you know, this comprises very good coconut property. A few months ago the land was given out on tender on terms which are surprising. According to the figures available to the department only 15.79 coconuts per tree per year was the yield of the property, which worked out at three nuts per tree per pick. Without obtaining accurate figures and without making a correct estimate, purely on the basis of figures supplied by the previous tenants of the R. A. F., you have leased out this valuable coconut property for a period of ten years for a sum of Rs. 73,000.

ගරු කළුගල්ල
(கௌரவ கலுகல்ல)
(The Hon. Kalugalla)

The land has been leased by the Land Department.

ජයසිංහ මයා.
(திரு. ஜயசிங்ஹ)
(Mr. Jayasinghe)

If you want to acquire a lease of land owned by the Ministry of Transport you will have to apply to the Land Commissioner. The terms of the contract are terrible. The Katunayaka Airport authorities have to maintain the boundary fences and the roads.. Surely, the Hon. Minister must acquaint himself with these matters. The calculated loss is about Rs. 3 million to the Government over a period of 10 years.

You had a proposal to have a hundred foot road to the Katunayake Airport. In some instances notices of possession have already been given to some landowners. I now hear that you want to have a railway link.

ගරු කළුගල්ල
(கௌரவ கலுகல்ல)
(The Hon. Kalugalla)

The railway link is costing very much less.

ජයසිංහ මයා.
(திரு. ஜயசிங்ஹ)
(Mr. Jayasinghe)

Supposing your plane gets delayed you will have to hold up the train that will transport the passengers. You have this railway link for the quick transport of passengers from the airport to Colombo. If you take it over a period of years you will find that the laying of the new railway line will cost much more than the widening of the road. The widening of the road will solve two problems. It will solve your motor transport problem as well as the problem of transporting passengers from the airport. This line will actually be a mono-rail . I do not see that it is a practical solution to the problem.

The Hon. Minister has not told us one word about his air contracts. We find that we had recently to pay for a difference that was not estimated when he made the proposal for an amalgamated air service. It was stated that Air Ceylon had more freight but according to their returns we find that Air Ceylon is not very prosperous. You are hoping to have more freight and passengers but your charges are a recurring expenditure. I hope the Hon. Minister will kindly take this matter also into consideration.

I must say that he is one of the very few Ministers who co-operate with the Opposition and we are only too ready to co-operate with him.

ගරු කළුගල්ල
(கௌரவ கலுகல்ல)
(The Hon. Kalugalla)

The suggestions made by hon. Members will receive my consideration.

As regards the point mentioned by the hon. Member for Galle (Mr. W. Dahanayake) already a site has been selected and soil tests are being taken for the construction of an airport at Kataragama.

With regard to the question of the road, it is an expensive undertaking and is estimated to cost about Rs. 40

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු කලුගල්ල]

million. The financial situation does not permit us to undertake this work. So we are going to run a special diesel which will cost only about Rs. 6 lakhs.

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

## පරිපූරක මුදල : සිවිල් ගුවන් සේවය

## குறைநிரப்புந் தொகை: சிவில் விமானப் போக்குவரத்து

## SUPPLEMENTARY SUPPLY: CIVIL AVIATION

මතු පළවන යෝජනාව සභා සම්මත විය.

That a supplementary sum not exceeding Rupees Twenty thousand (Rs. 20,000) be payable out of the Consolidated Fund of Ceylon, or any other fund or moneys of, or at the disposal of, the Government of Ceylon or from the proceeds of any loans obtained by the Government of Ceylon, for the service of the financial year beginning on 1st October, 1961, and ending on 30th September, 1962, and that the said sum may be expended as specified in the Schedule hereto:

*Schedule*

Head 165—Civil Aviation.

| | Rs. |
|---|---|
| Vote No. 2—Administration Charges—Recurrent Expenditure .. .. | 20,000 |

[ගරු කලුගල්ල]

## පරිපූරක මුදල : ආහාර කොමසාරිස්

## குறைநிரப்புந் தொகை: உணவு ஆணையாளர்

## SUPPLEMENTARY SUPPLY: FOOD COMMISSIONER

**ගරු ඩී. එස්. ගුණසේකර**
*(கௌரவ டீ. எஸ். குணசேக்கர)*
(The Hon. D. S. Goonasekera)

I move,

That a supplementary sum not exceeding Rupees Sixty-four million (Rs. 64,000,000) be payable out of the Consolidated Fund of Ceylon, or any other fund or moneys of, or at the disposal of, the Government of Ceylon or from the proceeds of any loans obtained by the Government of Ceylon, for the service of the financial year beginning on 1st October, 1961, and ending on 30th September, 1962, and that the said sum may be expended as specified in the Schedule hereto:

*Schedule*

Head 149—Food Commissioner.

| | Rs. |
|---|---|
| Vote No. 4—Services provided by the Department —Recurrent Expenditure | 64,000,000 |

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

පූ. භා. 10.3

**ඩබ්ලිව්. දහනායක මයා.**
*(திரு. டப்ளியு. தகனாயக்க)*
(Mr. W. Dahanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වැය ශීර්ෂය සම්බන්ධව දීර්ඝ සාකච්ඡාවක් කිරීම අවශ්‍ය නිසා තමුන්නාන්සේ මේ ගරු සභාවට ඒ සඳහා අවස්ථාව දෙන්නට ඕනෑ. කෝටි හයාමාරක වැය ශීර්ෂයක් මේ ඉදිරිපත් කර තිබෙන්නෙ. මේක එසේ මෙසේ වැය ශීර්ෂයක් නොවෙයි. මේක හිමාලය පර්වතය වගේ විශාල වැය ශීර්ෂයක්. මේක භූමිකම්පාවක් ඇති කරන වැය ශීර්ෂයක්.

**ගරු ඩී. එස්. ගුණසේකර**
*(கௌரவ டீ. எஸ். குணசேக்கர)*
(The Hon. D. S. Goonasekera)

මේකෙ කාරණා වෙන් වෙන් වශයෙන් විස්තර කර දුන්නොත් මන්ත්‍රීතුමාට ලේසි වෙයි.

**ඩබ්ලිව් දහනායක මයා.**
*(திரு. டப்ளியு. தகனாயக்க)*
(Mr. W. Dahanayake)

ඒකත් මම එක කාරණයක් හැටියට ලකුණු කර ගත්තා. මේක භූමිකම්පාවක් ඇති කරන වැය ශීර්ෂයක්. මෙවැනි විශාල, හිමාල පර්වතය වගේ, වැය ශීර්ෂ ඉදිරිපත් කිරීම ගැන අපේ විරුද්ධත්වය ප්‍රකාශ කරන බව මම මුලින්ම කියන්නට කැමතියි. අයවැය ලේඛනයක් ඉදිරිපත් කරන විට ගණන් හිලව් පිළිබඳ ප්‍රමාණවත් නිවැරදි තත්ත්වයක් තියෙන්නට ඕනෑ. එසේ නැත්නම් අයවැය ලේඛනය විහිළුවක් වෙනවා. අයවැය ලේඛනයේ තේරුමක් නැති වෙනවා. මේ පාර්ලිමේන්තු සම්ප්‍රදාය සම්පූර්ණයෙන් නිශ්ප්‍රභ වී යනවා. එම නිසා රුපියල් කෝටි හයාමාරක වැය ශීර්ෂයක් ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආහාර දෙපාර්තමේන්තුවට තදින් දොස් පවරන්නට ඕනෑ. පාර්ලිමේන්තු සම්ප්‍රදාය ගැන කිසි තැකීමක් නැතිව, මහජනතාවට තිබෙන වගකීම ගැන කිසි සැලකිල්ලක් නොදක්වා, විශාල මුදලක් වියදම් වන වැය ශීර්ෂයක් විස්තර කිසිවක් නැතිව ඉදිරිපත් කිරීම පාර්ලිමේන්තුවට කළ අගෞරවයක් ය කියා මා කල්පනා කරනවා. මෙහි සඳහන් කර තිබෙන කරුණු 5 පිළිබඳව විස්තර සපයා නැත්තේ මන්ද කියා මා අහනවා. වැඩ බලන ඇමතිතුමාට පුළුවන්ද කරුණා කර එම විස්තර අපට සපයන්න?

**ගරු ඩී. එස්. ගුණසේකර**
*(கௌரவ டீ. எஸ். குணசேகர)*
(The Hon. D. S. Goonasekera)

ඔව්.

| | Rs. |
|---|---|
| (*a*) Increase in the quantity of local rice purchased under the Guaranteed Price Scheme .. | 19 million |
| (*b*) Decrease in revenue consequent to the reduction in the selling price of white sugar .. | 17 „ |
| (*c*) Payment of demurrage .. | 4 „ |
| (*d*) Increased cost of American flour purchased under P. L. 480 and Canadian Gift flour .. | 2 „ |
| (*e*) Under provision in original estimates in anticipation of price fluctuations .. | 21 „ |

**ඩබ්ලිව්. දහනායක මයා.**
*(திரு. டப்ளியு. தகனாயக்க)*
(Mr. W. Dahanayake)

මෙම විස්තරය දීම ගැන වැඩ බලන ගරු ඇමතිතුමාට ස්තුති කරන අතර මෙම කරුණු මුලින්ම මෙහි සඳහන් නොකිරීම ගැන දෙපාර්තමේන්තුවට දොස් පවරන්න ඕනෑ. කෙසේ හෝ වේවා, දැන් මෙම විස්තර තිබෙන නිසා දීර්ඝ වශයෙන් මෙම වැය ශීර්ෂය යටතේ සාකච්ඡාවක් පවත්වන්න පුළුවන්. මෙම කාර්යය පිළිබඳව අවුරුදු 15 කට වැඩි කාලයක පළපුරුද්දක් ආහාර දෙපාර්තමේන්තුවට තිබෙනවා. ඒ හෙයින් මෙම ඇස්තමේන්තුව පිළිබඳ විස්තර සැපයීම දෙපාර්තමේන්තුවේ යුතුකමක්ව තිබුණා. එය නොකිරීම ආණ්ඩුව කළ බලවත් වරදක්.

ආණ්ඩුව විසින් මහජනයාට කරන සේවාවන්ගෙන් පළමුවන සේවය වශයෙන් හැඳින්විය හැක්කේ ආහාර සැපයීමයි. ආහාර සැපයීමේ ඇස්තමේන්තු වැරදි විධියට තිබෙනවා නම් ආණ්ඩුවේ නොයෙකුත් වැඩ කටයුතු අවුල් වෙන්න ඉඩ තිබෙනවා. ඊට නිදර්ශනයක් වශයෙන් මෑතදී හාල් හුණ්ඩු දෙකක් කැපීමේ යෝජනාව සඳහන් කරන්න පුළුවනි. හිටපු මුදල් ඇමතිතුමාට අස්වන්න සිද්ධ වූයේ හාල් හුණ්ඩු දෙකක් කැපීමට ගිහිනුයි. ජූලි මාසේ 26 වන දා හිටපු මුදල් ඇමතිතුමා හාල් හුණ්ඩු දෙකක් කැපිය යුතුයයි යෝජනා කරමින් කළ අයවැය කථාවට පසුව ලොකු අර්බුදයක් ඇති වුණා. ඒ අර්බුදය නිසයි, මුදල් ඇමතිතුමාට අස්වන්න සිදු වූයේ. අගෝස්තු 31 වන දා සූර්යග්‍රහණයක් තිබුණා. ඒ සූර්යග්‍රහණය ආහාර දෙපාර්තමේන්තුවේ නොසැලකිල්ල නිසා ඇති වූවක්. වැරදි ඇස්තමේන්තු කිරීම නිසා ඇති වූවක්. ඒ සූර්යග්‍රහණයේ අපලය නිසයි, මුදල් ඇමතිතුමාට අස් වන්න සිදු වූයේ. ආහාර දෙපාර්තමේන්තුව ඉදිරිය බලන්නේ නැතිව වැරදි ඇස්තමේන්තු කිරීමෙන් මුළු කැබිනට් මණ්ඩලයම නොමග හැර තිබෙනවා. මේ වැය ශීර්ෂයෙන් පැහැදිලිවම ඔප්පු වන කාරණයක් තමයි. ආහාර දෙපාර්තමේන්තුව කැබිනට් මණ්ඩලයේ ඇස්වලට වැලි ගසා ඇති බව. එපමණක් නොවෙයි. පාර්ලිමේන්තුවේ ඇස්වලටත් වැලි ගසා තිබෙනවා. මුළු ලංකාවේම මහජනයා රවටා තිබෙනවා. ඒ නිසා මේ වැය ශීර්ෂය පිළිබඳව සම්පූර්ණ කරුණු නිරාකරණය කර ගැනීම පිණිස දීර්ඝ වශයෙන් සාකච්ඡා කළ යුතුයි.

ජූලි 26 වන දා හිටපු මුදල් ඇමතිතුමා හාල් හුණ්ඩු දෙකක් කැපීමට යෝජනා කොට කීව්වා, මට වෙන කරන්න දෙයක් නැත කියා. නමුත් ඊට මාසෙකට පස්සෙ තවත් කව්පියක් කියනවා, කරන්ට දෙයක් තිබෙනවාය කියා. මේ අදහස් දෙක එකට එක සන්සන්දනය කරන්නෙ කොහොමද කියා මම අහන්ට කැමතියි. හාල් හුණ්ඩු දෙක කැපීම අවශ්‍යයි, ඒක නොකර බැහැ කියා හිටපු මුදල් ඇමතිතුමා කිව්වා නම්, ඊළඟ මුදල් ඇමතිතුමා කියතොත් හාල් හුණ්ඩු දෙක කැපීම අවශ්‍ය නැත කියා, මොකක්ද මේකෙ තේරුම? මේ අදහස් දෙක සන්සන්දනය කරන්ට පුළුවන්ද? කවුද මෙතන වැරදිකාරයා?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩබ්ලිව්. දහනායක මයා.]

නිදහස්ව කල්පනා කරන මට කියන්ට පුළුවනි, ඒ ගරු මුදල් ඇමතිවරයා නො මග යැව්වෙ ආහාර දෙපාර්තමේන්තුවෙන් දිය යුතු ගණන් හිලව් ආදිය වැරදි ලෙස දීම නිසාය කියා. වැඩ බලන මුදල් ඇමති තුමාට මම අවවාදයක්, උපදේශයක්, දෙන්ට කැමතියි. කවුරු කුමක් කිව්වත්, ආහාර දෙපාර්තමේන්තුවෙන් කුමක් කිව් වත්, තමුන්නාන්සේ සිහි බුද්ධියෙන් කල්පනා කර බලන්න සියලු දේම.

අද "දවස" පත්‍රයේ මුල් පිටුවේ එක්තරා ප්‍රවෘත්තියක් තිබෙනවා. මොකක්ද ඒ ප්‍රවෘත්තිය? දැනට සිටින මුදල් ඇමති තුමා අයවැය හිඟය පියවන්ට පුළුවනි කිය නවා හාල් හුණ්ඩු දෙක කපන්නෙ නැතුව. නමුත් අභියෝගයක් කර තිබෙනවා ඒ ගණන් හිලව් කොහෙන්ද ආවෙ කියල. මේවා ඔක්කොම අපි කියවා බලනවා. මේ හැම පත්තරයක්ම කියවන්ට තරම් වේලා වක් තමුන්නාන්සෙලාට තියෙනවද කියන්ට මම දන්නෙ නැහැ, නමුත් මම පත්තරවල තියෙන ඔය ආරංචි කියවනවා. ඒ ආරංචි තමුන්නාන්සෙලාටත් මම දෙන් නම්.

"දවස" පත්‍රය දොම්පේ ගරු මන්ත්‍රීතු මාගෙ අදහස් ප්‍රකාශ කරන පත්තරයක්ය කියා අපට ආරංචියි. දොම්පේ මන්ත්‍රීතුමා ගේ කටහඬයි "දවස" පත්‍රයෙන් පිට වෙන්නෙ. සමහර අය කියනවා, දොම්පේ මන්ත්‍රීතුමා මේ පත්‍රය පිටුපසින් ඉන්නවා ය කියා. ඒ පත්තරේ අද බලන්න, අභි යෝගයක් කර තිබෙනවා. සී. පී. ද සිල්වා අලුත් මුදල් ඇමතිතුමාගෙ ගණන් හිලව් සම්බන්ධයෙනුයි ඒ අභියෝගය කර තිබෙන්නෙ.

හාල් ප්‍රශ්නය සම්බන්ධයෙන් බුරුමයට ගිය දූත පිරිස ආපසු විත් තමුන්නාන් සෙට දුන්නෙ මොන ආරංචියක්ද කියා මම තමුන්නාන්සෙගෙන් අහන්ට කැමතියි. ඒ අය තමුන්නාන්සෙට යම් ආරංචියක් අරන් එන්ට ඇති. රටට අවශ්‍ය හාල් ප්‍රමා ණය ලබා ගන්න ඉඩ තිබෙනවද, මුදල කොතෙක්ද, යනාදි කරුණු ගැන එතුමාට දන්වන්ට ඇති. මම නිලධාරීන්ට චෝදනා කරන්ට කැමති නැහැ. ඔය හාල් ජාවාර මත් සීනි ජාවාරමත් අවුරුදු 15ක් හෝ ඊට වැඩි කාලයක් තිස්සේ කර සිටින ඔය නිල ධාරීන්ගේ වැඩ ගැන ටිකක් පරීක්ෂාවෙන් කටයුතු කරන ලෙස මම ගරු ඇමතිතුමාට



අවවාද කරනවා. ඒ අයට දැන් මේ ජාවා රම් හොඳට පුරුදු වෙලයි තියෙන්න. ඇමති තුමාගේ ඇස් දෙකට වැලි ගහන්ට තරම් පුරුද්දක් දැන් ඒ අයට තිබෙනවා වෙන්ට පුළුවනි. ඉංග්‍රීසි කියමනක් මට මතක් මුණා: "The old order changeth, yielding place to new" පරණ සිරිත අත්හැර දමන්නට ඕනෑ අලුත් එකක් ගන්ට ඕනෑ. ආහාර දෙපාර් මේන්තුවේ දැන් ඉන්න නිලධාරීන් වෙනු වට අලුත් නිලධාරීන් පත් කරනවා නම් මම බොහොම කැමතියි. ආහාර වෙළෙන් දන්ගෙ ප්‍රශ්නයට ටිකක්වත් අත නොග හපු, සම්පූර්ණයෙන්ම අලුත්, ඒ ප්‍රශ්න ගැන කිසිම දෙයක් නොදන්න, මෙපමන කාලයක් ඒ ප්‍රශ්නය සම්බන්ධයෙන් සහ භාගි නුවූ, මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් කිසිම හැඟීමක් නැති, පුරුද්දකුත් නැති, අලුත් කණ්ඩායමක් දමා වැඩ කරවනවා නම් මම මගේ කැමැත්ත ප්‍රකාශ කරනවා. මන්ද, ඒ අලුත් අයට පෙනේවි නොයෙක් දේවල්. බුරුමයේ සිට එංගලන්තෙට එන්ට පුළුවනි. බුරුමෙ ඉඳල ලංකාවට එන්ට පුළුවනි. ලංකාවෙ සිට ඇමෙරිකාවට යන්ටත් පුළුවනි. පී. එල්. 480 නීතිය අනුව තවත් රටකින් සීනි ගෙන්වන හුව මාරු ඇති කරන්ටත් පුළුවනි. එකම පරණ කෙනෙක්වත් ඒ නිලධාරි මණ්ඩලයට නොයොදා අලුත් අය මේ කාරණයට යො දනවා නම් ඒ පරණ පුරුදුවල ඇති වැරදි තමුන්නාන්සේලාට ඔප්පු වේවිය කියා මා විශ්වාස කරනවා. තමුන්නාන්සේලාට බුරුමයෙන් හාල් ලැබෙන්නේත්, කියුබා වෙන් හෝ වෙන රටකින් සීනි ලැබෙන් නේත්, එහෙම නැත්නම් ඇමෙරිකාවෙන් හෝ ඔස්ට්‍රේලියාවෙන් පිටි ලැබෙන් නේත්, ඉතාම පහසු, ලාභ මුදලටය කියා තමුන්නාන්සේලා හිතනවද? මා නම් හිතන්නේ නැහැ. මේ ආහාර ද්‍රව්‍ය ඔයිට වඩා ලාභයට ලබා ගන්න පුළුවනි. එම නිසා මම කිසිම පුද්ගලයෙකුට චෝදනා වක් නොකොට ඉතාමත් ඕනෑකමින් තමුන්නාන්සේගෙන් ඉල්ලනවා, ඒ ආහාර දෙපාර්තමේන්තුවේ නිලධාරි කණ්ඩායම සම්පූර්ණයෙන් වෙනස් කර අලුත් කණ්ඩායමක් දමා වැඩ කරන්න කියා.

මේ අපේ වැඩ බලන ගරු ඇමතිතුමාට මම එක්තරා මල්මාලාවක් දමන්න කැමතියි. එනම්, මේ හාල් පොත් ජාවාරම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පිළිබඳ කාරක සභාව නිර්භයව කිසි නිල ධාරියෙකු බේරන්න තැත් කරන්නේ නැතිව අවංකව වැඩ කිරීම ගැනයි. ඒ කාරක සභාවේ සභාපතිවී සිටි නිසා නො යෙකුත් කරුණු ගැන තමුන්නාන්සේ දැන් අපට වඩා දන්නවා. ඒ හාල් පොත් දීම සම්බන්ධයෙන් තිබුණු විශාල හොරකම ගැන තමුන්නාන්සේ පුදුමයෙන් පුදුමයට පත් වුණා. එතන නේද අලි බබා සහ හොරු හතලිස් දෙනා ඉන්නෙ? වර්තමාන ලෝකයේ අලිබබා සහ හොරු හතලිස් දෙනා පිළිබඳ නව කථාව ලියන්න තමුන් නාන්සේ කරුණු සොයා ගත්තා. ඒ ගැන අපි තමුන්නාන්සේට ප්‍රශංසා කරනවා. ඒ සොයා ගත් කරුණු මොනවාද? වැරදි විධි යට, නොනිසි විධියට, හොර විධියට හාල් පොත් පාවිච්චි කිරීමෙන් මහජනයාට වර දක් කළා පමණක් නොවෙයි, ආණ්ඩුවට අවුරුදු ගණනාවක් තිස්සේ විශාල අලාභ හානි කර තිබෙනවා. ඒ හොරකම් අනුව තමුන්නාන්සේලා මොන විධියටද ක්‍රියා කර තිබෙන්නේ කියා අපි දැනගන්න සතුටුයි. මේවා ප්‍රසිද්ධ නොකරන්නේ ඇයි? බලන්න ගරු නියෝජ්‍ය කථානායක තුමනි, හාල් පොත් බෙදා දීමේ සුළු ක්‍රම යේ මෙපමණ වැරදි සහ හොරකම් තිබුණා. බුරුමයෙන් සහ ඇමෙරිකාවෙන් ආහාර ද්‍රව්‍ය ගෙන්වීම සමග සමාන කර බලන විට ලංකාවේ හාල් පොත් බෙදීම හරියට පුහුල ඇතුළේ තොවිලය වගෙයි. හාල් පොත් බෙදීම සුළු කාරණයක්, ලොකු දෙයක් නොවෙයි. එය හරියට කරන්න පුළුවන් වන්නට ඕනෑ. ලංකාව පළාත් නවයකට බෙදා තිබෙනවා. ඊළඟට දිස්ත්‍රික්කවලට බෙදා තිබෙනවා. ඒවායේ වෙනම මුලාදෑනි වසම් තිබෙනවා. හැම මුලාදෑනි වසමකටම එක මුලාදෑනියකු බැගින් සිටිනවා. එතකොට රට හැම තැනම එක ආණ්ඩුවේ නිලධාරියෙක් යට තේ තිබෙන විට, හාල් පොත් බෙදීමේ කාර්යය සුළු වැඩක්; අභ්‍යන්තර වැඩක්. එය පුහුල් ගෙඩිය ඇතුළේ තොවිලය වගෙ යි.

ඒක ලේසි වැඩක්. ඒ ලෙහෙසි වැඩය වත් හොඳට කරන්ට බැරි වුණා නම් ඒකෙ සිටින්නේ අලිබබා සහ හොරු හතලිස් දෙනා බව මම කියනවා. බුරුමය, ඇමරි කාව, ඕස්ට්‍රේලියාව, කියුබාව, ආදී රටවල් සමග කරන ආහාර හුවමාරුවේ කොපමණ ලොකු හොරකම් තිබෙනවාද කියා තමුන් නාන්සෙලා දන්නවාද? මේ අභ්‍යන්තර හාල් පොත් බෙදා දීමට තමුන්නාන්සේ කොමිටියක් පත් කර හොඳට වැඩ කරන්ට කල්පනා කිරීම ගැන අපි තමුන් නාන්සේට ප්‍රශංසා කරනවා. ඒ අතරම පිටරටවලින් හාල්, පිටි, සීනි සහ තවත් නොයෙකුත් බඩු ගෙන්වීමේ හුවමාරු ක්‍රම යේ විශාල හොරකම් තිබෙනවා. ඒ නිසා පළපුරුදු, ඒ සම්බන්ධ කරුණු දන්න, අය ගෙන් යුත් කොමිටියක් පත් කරන මෙන් අපි තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටින වා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පිට රටවලින් බඩු ගෙන්වන හුවමාරු කිරීමේ ජාවාරමක් සම්බන්ධ කාරණයක් ගැන මම මතක් කරන්ට කැමතියි. මිට්සුබිෂි කියා විශාල ධනපති වෙළඳ සමාගමක් ජපානයේ තිබෙනවා. අපේ තොග වෙළඳ ආයතනය, සී. ඩබ්ලිව්. ඊ. එක, අවුරුදු පතා ටින් කෑම විශාල තොගයක් මේ සමා ගමින් ගෙන්වනවා. ජපන් රටින් ගෙන් වන ටින් කෑම වර්ග ලාබ නිසා ඒවා මිළ දී ගන්න කියන දැන්වීම් චිත්‍රපටි බලන්න ගියාම අපට දකින්ට ලැබෙනවා. එහෙත් මේ ජපන් රටින් ගෙන්වන ටින් කෑම වර්ග ලාභ නැහැ. මම කලින් සඳ හන් කළ සමාගමින් ගෙන්වන ටින් කෑම් වගේම ඉස්තරම් ටින් කෑම හුඟක් ලාභ යට විකුණන තවත් සමාගමක් ජපානයේ තිබෙනවා. එම සමාගම් දෙකේම ටින් කෑම පිළිබඳව ඒ කාරණය මම මේ ගරු සභාවේ ඔප්පු කළා. ඒ ටින් කෑම වර්ග දෙක මම ගරු සභාවට ගෙනැවිත් තමුන් නාන්සේලාට පෙන්නුවා. මේ එක වර්ග යක් ලංකාවට ගෙන්වන්නේ සමුපකාර තොග වෙළඳ ආයතනයයි; අනෙක් වර්ගය ගෙන්වන්නේ පුද්ගලික සමාගමක්. ඒ ටින් කෑම වර්ග දෙකම එක සමානයි. නමුත් සමුපකාර තොග වෙළඳ ආයතනය ඒ ටින් කෑම ගෙන්වන විට මිළ වැඩියි. පුද්ගලික සමාගම ගෙන්වන විට මිළ අඩු යි. ඒ කාරණය මම ඔප්පු කළා. මේකෙ හොරයක් තිබෙනවා. මේ කාරණය ගැන මීට අවුරුද්දකට පෙරත් මම තමුන්නාන් සේලාට කරුණු කීවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩබ්ලිව්. දහනායක මයා.]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ගරු සභාවේ අප ඕනෑවාට වඩා කථා කරන වාය කියා ඇතැම් අය අපට දොස් කියන වා. එහෙත් තමුන්නාන්සේලා අපට කොපමණ දොස් කීවත්, අපට කොපමණ අවහිර පැමිණෙව්වත්, මහජනයා වෙනු වෙන් අප මේ කාරණා ඉදිරිපත් කරනවා. මේ ටින් කෑම පිළිබඳව මා කරුණු විස්තර කළාට පසු අලුත් ධනපති කණ්ඩායමක් ගැසූ ගුණ්ඩුවක් තමුන්නාන්සේ දන්න වාද? ඒ කණ්ඩායම එකතු වී මිට්සුබිෂි සමාගමේ ශාඛාවක් ලංකාවේ ඇති කළා. ඔවුන් එම ශාඛාව ඇති කළේ තවත් විශාල පිළිවෙළට මේ රට සූරා කෑමටයි. මේ සම්බන්ධව වැඩි විස්තරයක් කරන්න මම අදහස් කරන්නේ නැහැ. ගරු කථා නායකතුමනි, මිට්සුබිෂි සමාගම ලංකාවේ ඇති කළ ශාඛාව සම්බන්ධව විස්තරයක් "ට්‍රිබියුන්" පත්‍රයේ තිබුණා. සතිපතා පළ වන පත්‍රයක් වූ "ට්‍රිබියුන්" පත්‍රයේ මෙවැනි පුවත් පළ වීම ගැන මම සන්තෝෂ වෙනවා. "ට්‍රිබියුන්" පත්‍රයේ අදහස්වලට අප විරුද්ධ වුණත්, සමහර අවස්ථාවලදී පළ වන මෙවැනි වැදගත් කරුණු ගැන අප සැලකිලිමත් වෙන්න ඕනෑ. අපි නොදන්න හැංගි තිබෙන නොයෙකුත් විධියේ ජාවාරම් එළි කරන නිසා මා විශෙෂයෙන්ම ඒ පත්‍රයේ "ෂර්ලොක් හෝම්ස්" කියන නමින් ලියන කතෘවර යාට ස්තුති කරන්ට කැමතියි. මිට්සුබිෂි ජාවාරම්කාරයන් මේ රටේ ගෙන ගිය අළුත් හොරකමක් ඒ "ට්‍රිබියුන්" පත්‍රයෙන් හෙළිදරව් කළා. නමුත් ඒව එළි කිරීමෙන් ඇති වූ ඵලය කුමක් ද? මා ඊට පෙර මෙතැනට ටින් දෙකක් ගෙනැත් පෙන්නු විට ඒක ගණන් ගත්තෙ නැහැ. "ට්‍රිබියුන්" පත්‍රයේ වාක්‍ය හුහක් ලිවීමෙන් පසුත් එය අහන්නෙ නැත්නම් ඒ කරුණු පෙන්වා දීමෙන් අපි කරන්නෙ පාළු ගෙයක වළං බිඳීම වගේ වැඩක්. අපි නොයෙක් කරුණු ඉදිරිපත් කරනව, නමුත් ඒව ගැන තමුන්නාන්සෙලාට කිසිම අවබෝධයක් ඇත්තෙ නැහැ. ඒ වගේම ඒව ගැන ක්‍රියා කරන්නෙත් නැහැ. ඒ වෙනුවට මුදල් යවනව, යවනව, කෝටි ගණන් යවනව. ඒවා පරීක්ෂා නොකිරීමෙන් තමුන්නාන්සෙල අමාරුවෙ වැටෙනව. මේ ඊයෙ පෙරේද අරගලයක් ඇති වුණේ රුපියල් කෝටි කීයක් සම්බන්ධයෙන්ද? කෝටි 1.1 ක් සම්බන්ධව. ඒ අරගලය ඇති වෙන්නෙ නැහැ, තමුන්නාන්සෙලා සෝදිසි කළා නම් කොහෙ කොහෙද මුදල් අපතෙ යන්නේ, කියා. තමුන්නාන්සෙලා ශක්තිවන්තව ඉදිරියට ගමන් කළා නම්, කවුරු හෝ වේවා හොරකම් කරන අය නැති කර දමන වාය, අපේ රටට ආහාර ගෙන්වීමේ කාර්යයත් අපේ රටේ ආහාර බෙදා හැරීමේ කාර්යයත් ඉතාම හොඳින් අපි කරනවාය කියා, ඒ රුපියල් කෝටිය ලබාගන්න බැරිද?

වැඩ බලන ගරු ඇමතිතුමා පමණක් නොව, ස්ථිර ඇමතිතුමාත් සොයා බැලුවේ නැද්ද, කරවල වෙළඳාම සම්බන්ධයෙන් තොග වෙළඳායතනය මොන අන්දමට ක්‍රියා කළාද කියා? කරවල වෙළඳාම ආණ්ඩුව අතට ගැනීම ගැන අපි විරුද්ධ වුණේ නැහැ. ඒ ප්‍රතිපත්තියට අපි ප්‍රශංසා කළා. කරවල ජාවාරම ආණ්ඩුව අතට පත් කර ගැනීමේ ප්‍රතිපත්තිය හරි. තමුන්නාන්සේලා ඉදිරිපත් කළ තර්කය සම්පූර්ණයෙන්ම හරි. කරවල මෙරටට ගෙන්වීමේදී තොග වෙළෙන්දන් නොයෙක් විධියේ අයුතුකම් සහ හොර වැඩ කළා. තමුන්නාන්සෙලාගෙන් අපි බලාපොරොත්තු වුණේ කුමක්ද? ඒ ව්‍යාපාරය ආණ්ඩුවට පවරා ගැනීමෙන් පසු හරියාකාර එය කරාවිය කියායි. නමුත් ඒක හොඳට කළාද? මහජනයා කබලේ සිට ලිපට වැටීමයි එයින් සිදු වුණේ. පිටි සර බඳ දුප්පත් මහජනයාගෙ විශෙෂ ආහාරයක් වන කරවල ටික නැති කර දැම්ම. පුදුම විධියට කරවල මිළ හුහක් නැග්ග. සත 90 ට ගත් බොම්බිලි කරවල රාත්තල රුපියල් දෙකක් වුණා නම්, රුපියලට ගත් හාල් මැස්සන් රාත්තල සිළිං පහක් වුණා නම්, තමුන්නාන්සෙලාගෙ ක්‍රමය අනුව සිදු වුණේ කරවල මිළ ඉතා ඉහළ යාමයි.

පූ. භා. 10.34

**නියෝජ්‍ය කථානායකතුමා**

*(பிரதிச் சபாநாயகர்)*

(Mr. Deputy-Speaker)

කරුණා කර නිශ්ශබ්ද වෙන්න. දැන් කාරක සභා නියෝජ්‍ය සභාපතිතුමා මූලාසනය ගන්නවා ඇති.

**අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමා මූලාසනාරූඪ විය.**

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ඩබ්ලිව්. දහනායක මයා.**
*(திரு. டப்ளியு. தகனாயக்க)*
(Mr. W. Dahanayake)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ කරවල ජාවාරම ගැන අපට සන්තෝෂ වෙන්ට මොකක්ද සිද්ධ වුණේ ? එක පැත්තකින් කරවල හිඟ වුණා; අනික් පැත්තෙන් කරවල මිළ නැග්ගා. කොහොමද මේ කරුණු දෙක එක වර සිද්ධ වුණේ ? එය ජනසතු කිරීමේ වරදක්ද ? ඔව්, සමහර ප්‍රතිගාමීන් නම් කියනව ඇති, ජනසතු කිරීමේ වරද නිසා එය සිදු වෙනවාය කියා. නැහැ. කරවල වෙළඳාම ජනසතු කිරීම හරියටම හරි. කරවල ජාවාරම ජනසතු කරන්නට තුබුණේ බොහොම ඉස්සරයි. කෙසේ හෝ වේවා, මේ ආණ්ඩුව කරවල ජාවාරම ජනසතු කිරීම ගැන මා මේ ආණ්ඩුවට ප්‍රශංසා කරනවා. නමුත් ඒ සමගම දොස් පැවරිය යුතුව තිබෙන්නේ ජනසතු කරන ලද ඒ ව්‍යාපාරය ඉතාමත් වැරදි විධියට පාලනය කිරීම ගැනයි; දූෂණ සහිතව පවත්වාගෙන යෑම ගැනයි. ඒ විධියට කටයුතු කර ජනසතු කිරීමේ ප්‍රතිපත්තියට අවනම්බු කිරීම ගැනයි, මා මේ ආණ්ඩුවට දොස් පවරන්නේ. දැන් සිදු වී තිබෙන්නේ මොකක්ද ? ගම්බද ජනතාවට දැන් කරවල නැහැ. මෙම ව්‍යාපාරය ජනසතු කළාට පසු කාටත් ලාබෙට කරවල ලැබෙනැයි අප සිතුවා. නමුත් දැන් කල්පනා කර බලන විට ඒ සිතුවිල්ල නිෂ්ඵල එකක් බව පේනවා. එක්තරා වෙද මහතකුගෙන් බෙහෙතක් ගෙන, තුබුණු මොකක්දෝ එකකුත් වැසී ගිය බවට ගම කතාවක් තිබෙනවා. කරවලවලට සිදු වූ හරිය ගැන කල්පනා කර බලන විට එය ඊට හොඳ උපමාවක්. තුබුණු ලෙඩේ සුව කර ගැනීම සඳහා බෙහෙත් ගත් විට මොකද වුණේ ? තමුන්නාන්සෙලා ඒ ගැන අසා ඇති නොවැ. අන්න ඒ සිදු වුණු දේ තමයි කරවල ජාවාරමටත් වුණේ. හාල්, පිටි, සීනි, වගේම කරවලත් මේ රටේ මිනිසුන්ට අත්‍යවශ්‍යයි.

**ඒ. ශිවසුන්දරම් මයා.** (කිලිනොච්චි)
*(திரு. ஏ. சிவசுந்தரம்—கிளிநொச்சி)*
(Mr. A. Shivasunderam—Kilinochchi)

There is no Quorum, Sir.

මන්ත්‍රී මණ්ඩලය ගණන් කොට ගණපූරණයක් නොමැති වූයෙන්, බෙදුම් සීනු ශබ්ද කිරීමට නියෝග කරන ලදී.

පසුව ගණපූරණයක් තුබුයෙන්—

**ඩබ්ලිව්. දහනායක මයා.**
*(திரு. டப்ளியு. தகனாயக்க)*
(Mr. W. Dahanayake)

ජනසතු කිරීමේ හොඳ ප්‍රතිපත්තිය අනුව කරවල ජාවාරම ජනසතු කළ ආණ්ඩුවට මුහුණ පාන්නට සිදු වුණු අකරතැබ්බය ගැනයි මා විස්තර කරමින් සිටියේ. ආණ්ඩුව හොඳ වැඩක් කළ බව ඇත්තයි. ආණ්ඩුවේ චේතනාව හොඳයි. නමුත් සිදු වුණු ප්‍රතිඵලය කුමක්ද ? ප්‍රතිඵලය නරක් වුණා. හාල්, පිටි, සීනි, වගේම ගම්බද ජනතාවට කරවල අවශ්‍ය ආහාරයක්. ඒ නිසා කරවල නැති කළොත් ගම්බද ජනතාවගේ ආහාරයේ වැදගත් කොටසක් නැති කළා සේ සලකන්ට පුළුවනි. දුප්පත් ජනතාවට අවශ්‍ය ආහාරයක් වූ කරවල නැති කිරීම ලොකු වරදක්. කරවල ප්‍රශ්නය උඩ තමුන්නාන්සේලාට හුඟක්ම ඡන්ද නැති වුණු බව සමහරුන් කියනවා. විරුද්ධ පාර්ශ්වයේ සිටියත් මගේ සිතේ නම් එවැනි අදහසක් නැති බව කියන්ට කැමතියි. මේ පිළිබඳව තමුන්නාන්සේලාගේ චේතනාව හොඳ බව මා නිතරම කල්පනා කරනවා. තමුන්නාන්සේලා කරවල වෙළඳාම ජනසතු කෙළේ හොඳ චේතනාවකින්. නමුත් වරද තිබෙන්නේ ඒක නිසි පිළිවෙළට නොකිරීමෙහියි. ගම්බද ජනතාවගේ මගුලක් තුලාවක්, මරණයක්, නම් දීමක්, යාළු මිත්‍රයන් එකතු වීමක්, ආදී මේ හැම කරුණකදීම ඒ අයට කරවල වුවමනා කරනවා. නමුත් දැන් නම් වුවමනාවල් සඳහා කරවල ගැනීමට ගම්බද ජනතාවට පුළුවන්කමක් නැහැ. සිංහල අවුරුද්දට කරවල කුරියෙක් නැති සිංහල ගෙදරක් හොයා ගන්න බැහැ. කොළඹ කුරුඳුවත්තේ සිංහල ගෙවල් හැරෙන්න අනිකුත් සියලුම සිංහල ගෙවලට සිංහල අවුරුද්දට කරවල කුරියෙක් ගෙනියන්න අමතක කරන්නෙ නැහැ. ගම්බද ජනයාට කොස් ටික තම්බාගෙන කන්න විදියක් නැහැ, කරවල නැතුව.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)

ඇයි, කිරි හොදි ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ඩබ්ලිව්. දහනායක මයා.**
*(திரு. டப்ளியு. தகனாயக்க)*
(Mr. W. Dahanayake)
අයියෝ, ගරු සභාපතිතුමනි, ඒ මන්ත්‍රීතුමාට වඩා තමුන්නාන්සේ දන්නවා ඇති කරවල නැතුව කොස් කෑම හරියට මොකක් වාගෙද කියන එක.

**හමීඩ් මයා.**
*(ஜனாப் ஹமீத்)*
(Mr. Hameed)
මනමාලි නැති මඟුල් ගේ වාගෙ.

**ඩබ්ලිව්. දහනායක මයා.**
*(திரு. டப்ளியு. தகனாயக்க)*
(Mr. W. Dahanayake)
මනමාලි නැති මඟුල් ගේ වාගෙයි කියා අකුරණ දෙවන ගරු මන්ත්‍රීතුමා කියනවා. කරවල සෑහෙන මිලකට ගෙනැවිත් මහ ජනයාට බෙදා දුන්නෙ නැති නම් තමුන්නාන්සේලාගේ ආණ්ඩුවට ලොකු පාඩුවක් සිදු වන බව මා මෙම අවස්ථාවේදී මතක් කරන්න කැමතියි. තමුන්නාන්සේලා නිවැරදි කරුවන් වුණත් මෙම ප්‍රශ්නයේ දී මහජනයා තමුන්නාන්සේලාට දොස් පවරනවා. මේ කරවල ජාවාරමෙහි දූෂණ ඇති කළේ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසිනුයි. නරක නිලධාරීන් නිසා ආණ්ඩුවේ හොඳ චේතනාවට සිදු වුණු දේ බලන්න. මෙම කරවල ජාවාරමෙන් තමුන්නාන්සේලාට පුළුවනි, පාඩමක් ඉගෙන ගන්න. හාල්, පිටි සහ සීනි පිළිබඳ ජාවාරම් මීට වඩා හොඳට කරන්න වග බලා ගන්න.

දැන් මෙම වැය ශීර්ෂය දෙස විස්තර වශයෙන් බලමු. අභ්‍යන්තර වී ගැනීමේ ක්‍රම සම්බන්ධව කරුණු දෙක තුනක් කියන්න තියෙනව. අද දවසේ ගොවියාට වී බුසලකට රුපියල් 12 ක් නියම විධියට ලැබෙන්නෙ නැහැ. මේ කරුණ හරි ගස්සා ගන්න තමුන්නාන්සේලා නියම විධියට ඉදිරිපත් වෙලා ක්‍රියා කර තිබෙනවාය කියා මා සිතන්නෙ නැහැ. අයුක්ති සහගත රෙගුලාසි දෙකක් තිබෙනවා. කරුණා කර මා කියන කරුණුවලට ඇහුම්කන් දෙන්න. තමුන්නාන්සේලා නොදන්න දේවල් තමයි මම කියන්නෙ. මා දැන් කියන්න යන්නෙ අලුත් දෙයක්. [බාධා කිරීම්] ඉස්ටෝරු භාර අය වී ගන්නා විට ගොවියාට කියනව, "ගොවිරාළ, උඹ අපට වී බුසල් 20 කට වැඩිය දෙනව නම් අපි වී බුසල් 10 ක් ගන්නෙ නැහැ" කියල. තමුන්නාන්සේලා ඒක දැනගෙන හිටියද? ගොවිරාල වී බුසල් 30 ක් ආණ්ඩුවට විකුණන්න ගෙනාවම 20 යි විකුණන්න පුළුවන් වෙන්නෙ. 10 ක් ගෙනියන්න වෙනව, ගෙදර. එසේම වී බුසල් 40 ක් ගෙනාවොත් ඒකෙනුත් 10 ක් ආපසු ගෙනියන්න වෙනව.

**සිරිසේන මයා.**
*(திரு. சிரிசேன)*
(Mr. Sirisena)
ඇයි ගොවිරාළ කන්නෙ නැද්ද?

**ඩබ්ලිව්. දහනායක මයා.**
*(திரு. டப்ளியு. தகனாயக்க)*
(Mr. W. Dahanayake)
ඒක පුද්ගලික කාරණයක්. ඒක ගොවියාට අයිති කාරණයක්. තමන්ට කොච්චර කන්න වුවමනා වෙනවද කියන එක ගොවිරාල දැනගනීවි. ඒක දන්නෙ ආණ්ඩුව නොවෙයි. ඒ ගොවි රාළ කඩෙන් ගන්න හාල් කනවද, වී හාල් කරගෙන කනවද, කියන එක තීරණය කරන්න ඒ ගොවිරාළට නිදහස තියෙන්න ඕනෑ. ඇයි තමුන්නාන්සෙල වී බුසල් 10 ක් ගන්න බැරිය කියා නියෝගයක් කරල තියෙන්නෙ? එයින් වන විපාකය ගැන කල්පනා කර බලමු. මෙන්න මේකයි, එයින් සිදුවන විපාකය. ඒ ගොවි රාළ වී බුසල් 10 ගෙදර ගෙන යනවා. ඔහු ළඟ කුපනුත් තියෙනවා. එක්කෝ ඔහු ඒ කුපන් ටික කළු කඩේට යවනවා; එසේ නැත්නම් වී බුසල් 10 කළු කඩේට යවනවා. ඒ දෙකෙන් එකක් ඔහු කළු කඩේට යවන්න ඕනෑ. තමුන්නාන්සෙල වී බුසල් 10 ක් නොගැනීමෙන් කළු කඩ ක්‍රමයක් ඇති කළා. එම නිසා මේ වී බුසල් 10 නොගැනීමේ රෙගුලාසිය සංශෝධනය කරන ලෙස මම වැඩ බලන ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. තමන්ගෙ සතුටේ හැටියට ඒ වී බුසල් 10 දෙන්න හෝ නොදෙන්න ගොවියාට නිදහස දෙන්න ඕනෑ. ඒ වී බුසල් 10 විකුණන්න ඕනෑ නම් විකුණන්නත්. තමන්ට තබා ගන්න ඕනෑ නම් තබා ගන්නත්, නිදහස දෙන්න ඕනෑ. එසේ නැත්නම් තමුන්නාන්සෙල ඒ ගොවි ජනයාට බරපතළ අයුක්තියක් කරනවා. එපමණක් නොවෙයි,

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

තමුන්නාන්සෙලාගෙ මුදල් තත්ත්වය පහළ බැහැල තියෙන නිසා, ආණ්ඩුවට පුළුවනි, ඕනෑවට වඩා වී එනවා, මොකක් හරි ක්‍රමයකින් කොටස කොටස කපලා සල්ලි නොදී ඉන්න ඕනෑය කියා වී බුසල් 20 ට වඩා දෙන ගොවියාගෙන් වී බුසල් 10 බැගින් කපන්න. එතකොට තමුන්නාන්සෙලා අභ්‍යන්තර වී ගැනීමේ ක්‍රමයේ වාසිය සම්පූර්ණයෙන්ම ගොවියට දුන්නද? නැහැ. ඒ වාසියේ කොටසක් තමුන්නාන්සෙලා නැති කළා නේද ? ඔව්. ඇයි ඒ නැති කළේ ? තමුන්නාන්සෙලාගෙ කැටේ සල්ලි නැති නිසා වන්න පුළුවනි. තමුන්නාන්සෙලාගෙ කැටේ සල්ලි නැති වුණාට අපි වග කියන්නෙ නැහැ. ඒ කැටේ තිබෙන සල්ලි තමයි, අපේ වී. අපට තිබෙන ධනය තමයි අපේ වී. ඇයි, ඒක ගන්නෙ නැත කියා මේ ආණ්ඩුව කියන්නෙ ? ඒ නිසා මේ රෙගුලාසිය වහම ඉවත් කරන ලෙස මම ඉතාමත් කරුණාවෙන් ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කාගෙන් අහලද මේ රෙගුලාසිය දැම්මෙ ? වැඩ බලන ගරු ඇමතිතුමනි, ආහාර සම්බන්ධව උපදෙස් දෙන්නට තමුන්නාන්සෙලාගෙ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙ කොමිටියක් තිබෙනවා නේද ?

**සිරිසේන මයා.**
*(திரு. சிறிசேன)*
(Mr. Sirisena)

ඒකට අපි දැන් යන්නෙත් නැහැ. එක අපි ප්‍රතික්ෂේප කරල දාල තියෙනවා. අපි කියන දෙයක් අහන්නෙ නැහැ.

**ඩබ්ලිව්. දහනායක මයා.**
*(திரு. டப்ளியு. தகநாயக்க)*
(Mr. W. Dahanayake)

අන්න අකුරණ පළමුවන ගරු මන්ත්‍රීතුමා ඇත්ත කියනවා. තමුන්නාන්සෙලාගෙ මූණ ඉස්සරහපිට ඉන්න අපෙන් පමණක් නොවෙයි, තමුන්නාන්සෙලාගෙ පිටිපස්සෙන් ඉන්න මන්ත්‍රීවරුන්ගෙනුත් තමුන්නාන්සෙලාට චෝදනා එනවා. වැඩ බලන ගරු ඇමතිතුමා ඉතාමත් කරුණාවන්ත හිතක් ඇති, ඉතාමත් ශාන්ත දාන්ත ලීලාවෙන් ක්‍රියා කරන කෙනකු බව අපි දන්නවා. මම මේ තමුන්නාන්සෙට දොස් පවරනවාය කියා හිතන්න එපා. මම අහන ප්‍රශ්නයට පිළිතුරු දෙන්න. තමුන්නාන්සෙලාගෙ පාර්ලිමේන්තු කණ්ඩායමේ මන්ත්‍රීවරුන්ව එකතු කරලා ඇහුවද, අභ්‍යන්තර වී ගැනීමේ ක්‍රමයේ තිබෙන වැරදි මොනවද, ඒවා හරිගැස්සීමට තමුන්නාන්සෙලා දෙන උපදෙස් මොනවාද, කියා ? තමුන්නාන්සෙලා පිටිපස්සෙ ඉන්න ගරු මන්ත්‍රීවරුන්ගෙන් එහෙම උපදෙස් ගන්නවා නම් මෙහෙම පටලැවිලි ඇති වන්නෙත් නැහැ. "වන් ස්ටෙප් බැක්වර්ඩ්ස්, ටූ ස්ටෙප්ස් ෆෝර්වර්ඩ්" කියනවා වගේ විගඩම් ඇති වන්නෙත් නැහැ. පිටිපස්සෙ ඉන්න මන්ත්‍රීවරු හොඳ මොලයක් ඇතිව මෙහාට ඇවිත් ඉන්න අය. ඉංග්‍රීසි භාෂාවෙන් කථා කරන්න බැරි වුණාට——

**සිරිසේන මයා.**
*(திரு. சிறிசேன)*
(Mr. Sirisena)

උපදෙස් දෙනවා පිළිගන්නෙ නැහැ. ඒකට අප මොකද කරන්නෙ ? මෙම චෝදනාව එල්ල කරන්නෙ වැඩ බලන ඇමතිතුමාට නොවෙයි. ස්ථිර ඇමතිතුමාගෙ හොස්ස ළඟින් මැස්ස යන්න බැහැ. නිකම් එයා දෙස බැලුවත් කේන්ති යනවා. එයාව අපි ප්‍රතික්ෂේප කරලයි තියෙන්නෙ.

**ඩබ්ලිව්. දහනායක මයා.**
*(திரு. டப்ளியு. தகநாயக்க)*
(Mr. W. Dahanayake)

නියෝජ්‍ය සභාපතිතුමනි, මා ටිකක් නිශ්ශබ්දව සිටියේ මගේ කථාවට වඩා වටිනා වචන එම මන්ත්‍රීවරයාගේ කථාවේ තිබුණ නිසයි. මම ඒ මන්ත්‍රීතුමාට කියනවා, පාර්ලිමේන්තු කණ්ඩායමේදී එම ඇමතිතුමාට උපදෙස් දෙන්නය කියා. සෑම දෙයක් පිළිබඳවම දැනුමක් ඇමතිවරයෙකුට හෝ වෙන අන් කවර කෙනෙකුට හෝ නැහැ. සෑම දෙනාම දෙන උපදෙස්වලට ඉතා හොඳින් ඇහුම්කන් දෙන්න ඕනෑ. අවුරුදු 4 ක් ඇමතිවරයෙකු වශයෙන් මා වැඩ කළ කාලයේදී මා කටයුතු කළේ ඒ අන්දමටයි. මා සහ අවිස්සාවේල්ලෙ මන්ත්‍රීවරයාත් (ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.)

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பீ. ஆர். குணவர்தன)*
(Mr. D. P. R. Gunawardena)
තමුසෙයි මාව එළවා ගත්තෙ.

**ඩබ්ලිව්. දහනායක මයා.**
*(திரு. டப்ளியு. தகனாயக்க)*
(Mr. W. Dahanayake)

ඒක වෙනම කාරණයක්. මම කියන්නෙ මෙයයි. ඇමතිවරුන් අවවාද ලබා ගන්න ඕනෑ. අවවාදවලට ඇහුම්කන් දෙන්න ඕනෑ. පිටුපස අසුන්වල සිටින මන්ත්‍රීවරුන් කියන දේටද අප නිතරම ඇහුම්කන් දෙන්න ඕනෑ. ඒ පිළිවෙළට මේ ආණ්ඩුවේ ඇමතිවරුන් ක්‍රියා කළා නම් අද ආණ්ඩුව වැටී තිබෙන ආන්ත්‍රාය දායක තත්තවයෙන් මිදීමට පිටුපස සිටින මන්ත්‍රීවරුන්ගෙන් උපදෙස් ලබා ගන්න පුළුවන්කම තිබුණා.

නියෝජ්‍ය සභාපතිතුමනි, දැන් වී ගොවිතැන සම්බන්ධයෙන් වචන කීපයක් සඳහන් කරන්න ඕනෑ. මෙම අවුරුද්දේ පටන් අපේ ගොවි ජනතාව නිපදවන සම්පූර්ණ වී ප්‍රමාණය රජය මිළ දී ගන්නෙ නැහැ. එක්තරා ප්‍රමාණයක් ඇස්තමේන්තු කර තිබෙනවා. ඊට වැඩියෙන් නිපදවන වී ගන්නෙ නැහැ. අපි මේවා, මේ ආරංචි, සොයා ගන්නෙ කෙසේද කියා ගරු වැඩ බලන ඇමතිතුමා දැන් කල්පනා කරනවා ඇති. මෙම ඇස්තමේන්තුව ගොවීන්ගෙ අයිතිවාසිකම් නැති කර දැමීමට ඇති කර තිබෙන එකක්. මේ රටේ ආණ්ඩුව ගොවියාට දී තිබෙන විශාලම දායාදය තමයි ඔහු නිපදවන වී රජය මිළ දී ගැනීම. මෙම ක්‍රමය මුලින්ම පටන්ගත්තෙ එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුවෙන් තමයි. අප ඇත්ත කියන්න ඕනෑ. වී බුසලට රුපියල් 12 ක් දීමෙන් ආණ්ඩුව කර තිබෙන්නෙ ගොවියාට විශාල ජාතික ත්‍යාගයක් දීමයි. ගොවියා තමයි අප ජාතියේ කොඳු ඇටය. සමාජයේ සිටින ඉතා වැදගත් කොටසක් තමයි වී නිපදවන ගොවිරාළල. මෙම ගොවිරාළලට දී තිබෙන දායාදය හොරෙන් ගන්න එපා. ඔහුගේ එම අයිතිවාසිකම නැති කරන්න එපා. එමෙන්ම ගොවි ජනතාවගේ බලාපොරොත්තුද නැති කර දමන්න එපාය කියාත් මා ඉල්ලා සිටිනවා.

යල මෝසමට මහ මෝසමට වඩා අස්වැන්න තිබෙනවා, අපේ පළාත්වල. ගොවිජන සේවා දෙපාර්තමේන්තුව ගිය මෝසමේදී සකස් කළ ඇස්තමේන්තු අනුව මේ මෝසමේදී වී ගන්නවා නම් ඒක හරිද? වැරදියි. මෙසේ වැරදි පිළිවෙලට වැඩ කිරීමෙන් තමුන්නාන්සෙලා අද ගොවි ජනයාගේ අයිතිවාසිකම් නැති කරනවා. මේ වැය ශීර්ෂය යටතේ මුලින්ම කියා තිබෙන්නෙ අභ්‍යන්තර වී ගැනීම ගැනයි. ඒ නිසා මේ වැරදි කාරණා ඉදිරිපත් කිරීම ගැන තමුන්නාන්සෙ පිළිතුරක් දෙන්න ඕන. වහාම මේ වැරදි හරිගස්සන්න ඕන. සල්ලි නැතැයි කියන්න එපා. වී ගැනීමට සල්ලි දීම විදේශ හුවමාරු මුදල් නැති වීමක් නොවෙයි. එක අතකට සල්ලි කඩදාසි. වී වටිනා ධාන්‍යයක්. වී ගෙන සල්ලි දුන්නාට, ඒ නිසා හුවමාරුවෙන් පාඩුවක් වන්නෙ නැහැ. ඒ නිසා සල්ලි දී වී ගැනීම මොන විධියකින්වත් අඩු කරන්න එපා. ඒ කටයුත්ත සීමා කිරීමට මොන නීතියක් වත් දමන්න එපා. තමුන්නාන්සෙලා නොයෙකුත් පළාත්වලට අවශ්‍ය මුදල් යවා නැහැ. ඇයි, මුදල් නොයවන්නෙ? තමුන්නාන්සෙලාට තිබෙන අමාරුව මොකක්ද? මුදල් යැවීමට සෑම පහසුකමක්ම තිබෙනවා. එසේ නම්, ඇයි මුදල් නොයවන්නෙ? අභ්‍යන්තර වී ගැනීමේ ක්‍රමය යටතේ වී ගැනීමට මුදල් නැතැයි කීමට තමුන්නාන්සෙලාට ලජ්ජා නැද්ද?

මුදල් යැවීම ප්‍රමාද කිරීමෙන් වන්නෙ, ගොවියා තම වී ටික ආණ්ඩුවේ ගබඩාවට නොදී පිට ජාවාරම්කාරයින්ට දීමයි. ඒ නිසා මුදල් ප්‍රමාද කිරීමෙන් සල්ලි යන්නෙ ජාවාරම්කාරයාටයි. ඒ නිසා දවසක්වත් මේ මුදල් ප්‍රමාද කරනවා නම් ඒ වරද කරන නිලධාරියාගේ හිස ගසා දැමිය යුතුයයි මම කල්පනා කරනවා. පිටින් ඉන්න ජාවාරම්කාරයින් සමග නිලධාරීන් එකතු වී මුදල් පමා කිරීම පොම්මෙ ගැහීමක්. අපේ පිටිසරබද ගොවියා ආණ්ඩුවට සල්ලි නැතැයි විශ්වාස කරන්නෙ නැහැ. ගොවියා සිතන්නේ ඒ නිලධාරීන් කරන වැරදිය කියායි. නිලධාරීන් කලට වේලාවට මුදල් ගෙවන්නේ නැහැ. වීවලට සහතික මිල ගෙවීමේ ක්‍රමය අලුත්වැඩියා කරන්න. කොහොමද අලුත්වැඩියා කරන්නෙ? ළඟදී මහජන බැංකුව පටන් ගත්තා. ඒ බැංකුවේ ශාඛාවල් විස්සක් තිහක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පරිපූරක මුදල්

උතුරු මැද පළාතේ විවෘත කරන්න. හම්බන්තොට දිස්ත්‍රික්කය තුළත් මහජන බැංකුවේ ශාඛා විවෘත කරන්න. අභ්‍යන්තර වී මිළයට ගැනීම කළ හැකි කොයි ප්‍රදේශවලද, ඒ ප්‍රදේශවල මහජන බැංකුවේ ශාඛා විවෘත කරන්න. මිලයට වී ගත හැකි හැම ප්‍රදේශයකම මහජන බැංකුවේ ශාඛා විවෘත කරන්න. වී උපදවන්නෙ කොහෙද, එතන මහජන බැංකුවේ ශාඛා විවෘත කරන්න. ප්‍රසිද්ධ නගරවලට පමණක් ශාඛා බැංකු සීමා කිරීමට හේතුවක් නැහැ. නගරවලත් ප්‍රසිද්ධ ස්ථානවලත් පමණක් මහජන බැංකුවේ ශාඛා තිබිය යුතුය කියා හිතන්ට වුවමනාවක් නැහැ. මහජනයා ගැවසෙන තැන්වල, බෙහෙවින් ගනුදෙනු කෙරෙන තැන්වල තමයි බැංකු පිහිටුවිය යුත්තේ. ඒ බැංකුවලට කියන්න කිසිම බියක් නැතිව ගොවියන්ට වුවමනා මුදලුත් ණයට දෙන්න කියා. ණය මුදල් වෙනුවෙන් පොලියක් ගන්නත් එපා. වී ගොවිතැන් කරන ජනයාට විශ්වාසය උඩ ණය දෙන ලෙස බැංකුවට කියන්න.

**සිරිසේන මයා.**
*(திரு. சிறிசேன)*
(Mr. Sirisena)

හොරට වී මනින, හොරට වී ගන්න මුදලාලිලාටයි බැංකුවත් සල්ලි ණයට දෙන්නෙ.

**ඩබ්ලිව්. දහනායක මයා.**
*(திரு. டப்ளியு. தகனாயக்க)*
(Mr. W. Dahanayake)

අකුරණ පළමුවන ගරු මන්ත්‍රීතුමා වටිනා අදහස් ප්‍රකාශ කරනවා.

**සිරිසේන මයා.**
*(திரு. சிறிசேன)*
(Mr. Sirisena)

ඕවා ඔක්කොම කුමන්ත්‍රණ අනුව කරන බව අපි දන්නවා.

**ඩබ්ලිව්. දහනායක මයා.**
*(திரு. டப்ளியு. தகனாயக்க)*
(Mr. W. Dahanayake)

මහජන බැංකු සේවය දනට වඩා පුළුල් කරන්න. මහජන බැංකුව දන් සේවය කරන්නෙ වචනයෙන් පමණයි. ඒක ක්‍රියාවෙන් නම් මහජන බැංකුවක් නොවෙයි. නම කපුරුහාමි; නමුත් කට ගඳ ගහනවා. අන්න මහජන බැංකුවෙ හැටිත් එහෙමයි. මහජන බැංකුව එක ගොවිරාළ කෙනෙකුට ණයක් දීල තියෙනවද? කුඹුරු යායවල් තිබෙන එක ගමකට ගිහිල්ල ශාඛාවක් පිහිටෙව්වද? ආණ්ඩුවට වී ගන්න සියලුම ස්ථානවල මහජන බැංකුවේ ශාඛා පිහිටුවා මුදල් හදල් හුවමාරුව පටන් ගන්න. ඒ වගේම ණයත් දෙන්න. අද මහජන බැංකුවේ ණය ක්‍රමය ඉතාමත් දුර්වලයි.

**සිරිසේන මයා.**
*(திரு. சிறிசேன)*
(Mr. Sirisena)

කරවලවලට වැඩිය ගඳක් වහනය වෙනවා අනාගතයේදී ඔය බැංකුවල. දුප්පතාට නොවෙයි මුදල් දෙන්නෙ, හොර ගණන්කාරයින්ටයි, හොර බුකිකාරයින්ටයි.

**ඩබ්ලිව්. දහනායක මයා.**
*(திரு. டப்ளியு. தகனாயக்க)*
(Mr. W. Dahanayake)

බලන්න තමුන්නාන්සෙලා පැත්තෙන්ම තමුන්නාන්සෙලාට එන ගල් මුල්, පොලු පහරවල හැටි. ඒ නිසා දීර්ඝ වශයෙන් කථා කරන්ට වුවමනාවක් ඇත කියා මා කල්පනා කරන්නෙ නැහැ. මේ විධියට සාකච්ඡා කිරීම ගැන තමුන්නාන්සේ මා සමග තරහ නොවනු මැනවි. මහජන බැංකුව මුදල් ණයට දෙන්නෙ හොර බුකිකාරයින්ටය කියා අකුරණ පළමුවන ගරු මන්ත්‍රීතුමා කියනවා.

**සිරිසේන මයා.**
*(திரு. சிறிசேன)*
(Mr. Sirisena)

ගොවියටවත් කම්කරුවටවත් නොවෙයි බැංකුව ණය දෙන්නෙ. හොර බුකිකාරයටත් කසිප්පුකාරයාටත් හොර ගණන්කාරයාටත් තමයි දෙන්නෙ.

**ඩබ්ලිව්. දහනායක මයා.**
*(திரு. டப்ளியு. தகனாயக்க)*
(Mr. W. Dahanayake)

තමුන්නාන්සෙට මම රහසක් කියන්නම් කරුණා කර ඒ අහගන්න. ඊයේ පෙරේදා සිදු වූ දෙයක් ගැනයි මම මේ කියන්නෙ. කොප්පරා, පොල් තෙල් ආදිය පිටරට පටවන මුබාරක් තහා මහත්මයා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පරිපූරක මුදල්

[ඩබ්ලිව්. දහනායක මයා.]

කොහෙ ගියාද දන්නෙ නැහැ. දෙවන රොයිස් ද මෙල් කෙනෙක්වෙලයි ඉන්නෙ. මේ රහස මම කියන්නෙ තමුන්නාන්සෙ දන්නෙ නැතුව ඉන්නව නම් මතක් කර දෙන්ටයි. මම තවම කොටින් කිව්වේ. ඒ මුබරක් තහා මහත්මයා හොඳ කල්පනාවක් ඇති, මොලේ ඇති මිනිහෙක්. පොලිසියට අහුවෙන්නට ගෙයි ටේප් රෙකෝඩ් එකක් තිව්වා. පොලිසිය ගිහින් හොහෝ මෙන්න, මෙන්න කියලා එක පාරටම ඒක උස්සා ගත්තා. මුබරක් තහා මහතාට ඕනෑ කළේත්, ඒක තැබුවේත්, පොලිසියට සොයා ගන්නමයි. පත්තරකාරයිනුත් හිතුවා, පොලීසිය ලොකු වැඩක් කළා කියා. නමුත් මේක බිල්ලට දෙන්න එතන තැබූ එකක්. මේක පොලීසියට අරගෙන ගොස් ඇහුම්කන් දෙන විට ඔන්න හොර ඔට්ටන් ගැන ලොකු ලොකු අයගෙ නම් කියවෙනවා. ඒ හොර ඔට්ටන් තැබූ අයගෙන් අඩු ගණනේ එක නමක් ආහාර දෙපාර්තමේන්තුවේ ලොකු නිලධාරියෙකුගේ නමක්. මෙය හැමෝම දන්නෙ නැහැ. මම දන්නවා. මා හිතන්නෙ කොට්ටාවේ ගරු මන්ත්‍රීතුමාත් (ඩී. බී. ආර්. ගුණවර්ධන මහතා) දන්නවා ඇති. මොකද? අපි නොයෙකුත් තැන්වල ගිහින් නොයෙකුත් දේවල් අහුල ගන්නවා. ආහාර දෙපාර්තමේන්තුවේ ලොකු නිලධාරියෙක් ලොකු ඔට්ටු අල්ලන හැටි මේ මුබරක් තහා මහතාගේ ටේප් රෙකෝඩ් එකේ තිබුණා. තවත් පොලිසියේ ඉහළම ඩී.අයි.ජී. " ඩිග් " කියන කෙනෙකුගේ නමකුත් තිබුණලු. ඔහු හැම තිස්සේම හැම විටම විශාල මුදල් ඔට්ටු දමන කෙනෙක්. කොහොමද ඔට්ටු දමන්නෙ, සල්ලි ගස් තිබෙනවාද? අර ආහාර දෙපාර්තමේන්තුවේ නිලධාරියට සල්ලි ලැබුණේ කොහොමද? පොලිස් නිලධාරියාට සල්ලි ලැබුණේ කොහොමද? පගා කාරයින්ගෙන්, කසිප්පු කාරයින්ගෙන්, හොර ඔට්ටුකාරයින්ගෙන්, නොවේද? ආහාර දෙපාර්තමේන්තුවේ නිලධාරියාට සල්ලි ලැබුණේ කොහොමද? ඒවා ලැබුණෙත් අර අලිබබාගෙ වැනි හුවමාරුවලින් නේද, කියා කල්පනා කර බලන්න.

තමුන්නාන්සේට තව එකක් කියන්නම්. මුබරක් තහා මහත්මයා මේ ටේප් රෙකෝඩ් එක එතන තැබුවේ නඩුවෙන් තමන් බේරෙන්න. ඇයි උඹලා මටනෙ ගහන්න එන්නෙ. ගිහිල්ල අහගනිල්ලා කවුද කියලා. මුබරක් තහා උන්නැහේගේ නුවණට ගණදෙවියොත් පරදිනවා. ටේප් රෙකෝඩ් එක තබා පොලීසියට දුන්නෙ නඩුවෙන් බේරෙන්න. ඔන්න අනික් රහස, සභාපතිතුමනි, මුබරක් තහා මහතා නඩුවෙන් බේරන්න අනික් උසස් නිලධාරීන් උත්සාහ කරනවා. ඇයි නඩුවට මුබරක් තහා ඇදල ගත්තොත් ගමරාළගෙ වලිගය වගේ තවත් ලොකු ලොට් එකක් ඇදිල එනවා. උසස් නිලධාරීන් ලොට් එකක්ම ඇදිල එනවා. දැන් මුබරක් තහා තමුන්නාන්සෙලාට සොයා ගන්න බැහැ. ඔහුගෙ ටේප් රෙකෝඩර් එක ලැබුණා. ඒක මැජික් ටේප් රෙකෝඩර් එකක්. එයින් මුබරක් තහා මහත්මයත් බේරුණා; ජාවාරම් කාරයෝත් බේරුණා. එතනින් ඒ කතාව නිම වෙනවා. ගරු සභාපතිතුමනි, මෙන්න හොරකම්වල මහත. මෙන්න අපේ රට විනාශ කරන හොරු. මෙන්න රටේ තිබෙන මුදල් හිඟයට මුල. මේ කරුණු හරි ගැස්සුවොත් තමයි හොඳ මිනිසුන් හැටියට අපට මේ රටේ ජීවත් වෙන්ට පුළුවන් වන්නෙ. අපි කුළල් කා ගැනීමෙන් වැඩක් නැහැ. මේවා ගැන අපි සියලු දෙනාම එක් වී ක්‍රියා කරන්න ඕනෑ.

ගාල්ල ප්‍රදේශයේ වී ගොවිතැන තිබෙන්නේ ඉතා සුළු වශයෙන් වුවත් මම ඒ ගැනත් වචන ස්වල්පයක් කථා කරන්න බලාපොරොත්තු වෙනවා. දැන් මහජන බැංකුව ක්‍රියා කරන ආකාරය සම්බන්ධව මම තමුන්නාන්සෙලාට කීවා. ඊළඟට, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වැරදි ආකාරයට ගොවීන්ට පෝර බෙදා දෙන්නෙ මක්නිසාද කියා මම ප්‍රශ්න කරනවා. පෝර බෙදා දෙන ක්‍රම තුනක් අද තිබෙනවා. වුවමනා පෝර ප්‍රමාණයෙන් භාගයකට මුදල් අය නොකිරීම, තුනෙන් කොටසකට මුදල් අය නොකිරීම හා සම්පූර්ණ පෝර ප්‍රමාණයටම මුදල් අය කර ගැනීම, ආදී වශයෙන් අද පෝර බෙදා දෙනවා. ඇයි මේ එක එක් කෙනාට එක එක විධියට පෝර බෙදා දෙන්නෙ? මේවා සාධාරණ ක්‍රම නොවෙයි. ඒ වාගේම වීවලට වියදම් කරන මුදලින් භාගයක් කා අතටද යන්නෙ? ගොවි මණ්ඩලයකට හෝ සමුපකාර සමිතියකට බැඳී ඒ මාර්ගයෙන් පෝර ඉල්ලන ගොවීන්ට වුවමනා පෝර ප්‍රමාණයෙන් භාගයකට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මුදල් අය කරන්නේ නැහැ. කිසිම සමිතිය කට බැඳී නොසිටින ගොවීන්ට අවශ්‍ය පෝර ප්‍රමාණයෙන් තුනෙන් කොටසක් අඩු කර නවා. මේ ක්‍රම සියල්ලක්ම වැරදියි. සියලුම ගොවි ජනයාට භාගයක් අඩු කර පෝර දෙන්න. ගොවීන් කෙරෙහි කිසිම අවිශ්වාස යක් තබාගන්න එපා. අපේ ගොවි ජනතාව ඉතාම ශිෂ්ටසම්පන්නයි. එම නිසා තමයි, මඩ සෝදා ගත් ගොවියා රජකමට වුවත් සුදුසුය කියා රොබට් නොක්ස් වැනි විජාතික යෙක් කීවේ. කිසිම ඔප්පුවක් හෝ ශිවි සුමක් නැතිව ගොවීන්ට මුදල් දෙන්න. ඒ ගොවීන්ට දෙන මුදල් නියමිත කාල වේලා වට ප්‍රථමයෙන් ඔවුන් ආපසු ගෙවාවි. ඒ නිසා මුදල් ගෙවීමේදී ගොවීන් කෙරෙහි කිසිම අවිශ්වාසයක් ඇති කර ගන්න එපා. හුදෙක් විශ්වාසය උඩ පමණක් ඒ ගොවීන්ට මුදල් දෙන්න. මේ අන්දමට තමුන්නාන්සෙ ගොවි ජනතාවට සල කන්නෙ නැත්තේ මන්ද කියා මම අහ නවා. එම නිසා, ගරු නියෝජ්‍ය සභාපති තුමනි, ගොවි ජනතාවට විශේෂ ලාභ ප්‍රයෝ ජන සහ උපකාර ලැබෙන ක්‍රමයක් ඇති කරන මෙන් මම ඉල්ලා සිටිනවා. මේ සම් බන්ධව නීතිරීති කීපයක් තිබෙන නමුත් ආණ්ඩුව නියම විධියට ක්‍රියා කරන්නේ නැහැ.

ඊළඟට අපේ වැඩ බලන ඇමතිතුමාට එක් වැදගත් කාරණයක් මම මතක් කරන්ට කැමතියි. මෙන්න අපේ විවිධ සේවා සමිති නොකරන සේවයක්. ව්‍යවස්ථා අනුව ගොවියකු මුලින්ම කුඹුර හාන අවස්ථා වේදී විවිධ සේවා සමිතිය විසින් අක්කරය යට රුපියල් 40 ක් ගෙවන්ට ඕනෑ. ඊළඟට කුඹුරේ පැළ හිටවන අවස්ථාවේදී නැත හොත් ඇට පේළියට හිටවන අවස්ථාවේදී අක්කරයකට රුපියල් 25 ක් ගෙවන්න ඕනෑ. ඊළඟට නෙළීමේ අවස්ථාවේදී අක් කරයකට රුපියල් 30 ක් දෙන්ට ඕනෑ. අන් තිමේ අස්වැන්න ලබා ගන්න අවස්ථාවේදී අක්කරයකට රුපියල් 25 ක් ගෙවන්ට ඕනෑ. විවිධ සේවා සමුපකාර සමිති ව්‍යවස්ථා වල මේ නීති තිබෙනව. ඒ නීති ක්‍රියාවේ යෙදෙන්නෙ නැහැ. නීති නම් බොහොම ලක්ෂණයි. ඒ නීතිවල හැටියට අක්කරයක වැඩ කරන ගොවිරාළ කෙනෙකුට අස් වැන්න ලබා ගන්න විට ණයක් වශයෙන් රුපියල් 120 ක් ලැබෙන්න ඕනෑ, විවිධ

පරිපූරක මුදල්

සේවා සමුපකාර සමිතියෙන්. මේ මුදල් ගාලු දිස්ත්‍රික්කයේ කාටවත් ලැබෙනවාද කියා මා සොයා බැලුවා. නමුත් කාටවත් ලැබෙන් නෙ නැහැ. ඉතින් මේ නීති මොකටද ? මහ ජනයාට සේවය කිරීමට නීති තිබෙන නමුත්, ඒවා පොතට පමණක් සීමා වී තිබෙ නව. ඒ නීති හරියාකාර ක්‍රියාවෙ යෙදෙව් වොත් සියලුම ගොවීන්ට ඉතාමත් හොඳින් නියම විධියේ උපදෙස් ලබාගෙන, නියම පෝර ප්‍රමාණය තම කුඹුරුවලට දමා, අස් වැන්න වැඩි කරගෙන ණය නැතිව ඔළුව කෙලින් කරගෙන සිටින්ට පුළුවන් වෙනව. විවිධ සේවා සමුපකාර සමිතිවලින් කී දෙන කුට මේ රුපියල් 120 මුදල ලැබී තිබෙනවාද කියා තමුන්නාන්සේ මට කියනවද ? ඒ ගැන සොයා බලන්න. මම හිතන්නෙ මේ නීති හැදුවේ අපේ අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීතුමාය කියායි. ඒ මන්ත්‍රීතුමා හැදු නීති තමුන්නාන්සෙලා පොත්වලට පම ණක් සීමා කර තැබීමේ තේරුම මොකක්ද? මමත් මේ කාරණය කලින් දැනගෙන හිටියෙ නැහැ. මේ කාරණය මට දැනගන්ට ලැබුණේ ඊයෙ පෙරේද එක එක්කෙනා සමග මේ කාරණය ගැන සාකච්ඡා කිරීමේ දියි.

**ටී. බී. තෙන්නකෝන් මයා. (ප්‍රවාහණ හා රජයේ වැඩ පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්)**

*(திரு. ரி. பி. தென்னகூன்—போக்குவரத்து, கட்டடவேலை அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*

(Mr. T. B. Tennekoon—Parliamentary Secretary to the Minister of Transport and Works)

ඇයි ඒ කාලෙ ඔබතුමා කැබිනට් මණ්ඩලයෙ හිටිය නේද ?

**ඩබ්ලිව්. දහනායක මයා.**

*(திரு. டப்ளியு. தகநாயக்க)*

(Mr. W. Dahanayake)

ඔව්. ඒ වුණත් මේ ව්‍යවස්ථා තමුන්නාන් සෙල දන්නවයැ. අපි මේව කියන්නෙ ඒකයි. මේ වාසිය කාටවත් ලැබෙන්නෙ නැහැ. ගොවි ජනයාට විවිධ සේවා සමුපකාර සමිති මගින් මේ මුදල් නොගෙවන්නෙ ඇයි ? ගොවීන්ට මේ මුදල් ගෙවනවා නම් හුඟක් දුරට පටලැවිලි බේරිලා නේද ? ගොවි ජනයාගෙන් කොපමණ සංඛ්‍යාවකට මේ මුදල ලැබුණාද කියා කරුණාකර කියන්න.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩබ්ලිව්. දහනායක මයා.]

අක්කරයට රුපියල් 120 ගණනේ කී දෙනකුට ලැබුණාද ? සමහර ප්‍රදේශවලට නම් මේ මුදල් ගෙවනවා. පොළොන්නරුව, හිඟුරක්ගොඩ, ප්‍රදේශවලට නම් මේ මුදල මුළුමනින්ම ගෙවනවා ; නමුත් ගාලු දිස්ත්‍රික්කයේ නම් කාටවත් ගෙවන්නෙ නැහැ. මේවා පුදුම දේවල්. මුබරක් තහා පිළිබඳ කථාව මා මුලින් කිවා. ඒක හරියට නව කථාවක් වගෙයි. එහි ඔක්කොම වැඩ පුදුම දේවල්. මේ මන්ත්‍රී මණ්ඩලය ඒ විධියෙ පුදුම දේවල් කියන ස්ථානයක්.

කුඹුරු හාන විට, පැළ හිටවන විට නැත්නම් ඇට හිටවන විට, නෙළන විට, අස්වැන්න කපා පාගා ගන්න විට, යන ආකාරයට කොටස් හතරකට බෙදා මේ රුපියල් 120 මුදල බෙදා දීමේ ක්‍රමය අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීතුමා කෘෂිකර්ම ඇමතිවරයා වශයෙන් සිටියදී ඇති කෙළේ ඇයි ? ඒ ගැන තමුන්නාන්සේලා කල්පනා කර බලන්න. කුඹුරු පණත පනවන්ට පෙර අද ගොවීන්ට කුඹුරු හිමියාගෙන් විටින් විට මුදල් ලැබුණා. නමුත් කුඹුරු පණත එන විට ඒ ආධාර නැති වන බව අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීතුමාට පෙනී ගිය නිසා, ගොවි ජනයා අනාථ වන බව පෙනී ගිය නිසා, ඔවුන්ට සහනයක් සැලසීම සඳහා අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීතුමා මේ පිළිබඳ ඇමතිවරයාව සිටියදී මේ ක්‍රමය සකස් කළා. අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීතුමා මේ ක්‍රමය සකස් කළත්, අද මෙය නිසි පරිදි ක්‍රියාත්මක වෙනවාද ? නැහැ. ඒ නිසා සිදු වී තිබෙන ප්‍රතිඵලය මොකක්ද ? මුළු රටේ සාමාන්‍ය වී අස්වැන්න අක්කරයකට බුසල් 39 යි. නමුත් ගාලු දිස්ත්‍රික්කයේ අක්කරයට අස්වැන්න බුසල් 27 යි. ගාලු දිස්ත්‍රික්කයේ වී අස්වැන්න ඉතාම අඩුයි. අර කී ආධාර මුදල ගාලු දිස්ත්‍රික්කයේ ගොවීන්ට නොලැබෙන නිසා ඒ විධියට අස්වැන්න අඩු වී තිබෙනවා. ඇයි මේ ගොවීන්ට මුදල් නොදෙන්නේ ?

තවත් කිව යුතු කාරණයක් තිබෙනවා. නියම විධියේ පෝර පාවිච්චි කිරීමට ගොවි ජනයාට ඉඩ දෙන්නෙ නැහැ. දැන් පෝර වර්ග කීපයක් තිබෙනවා. රට පෝර දැමුවොත් අස්වැන්න අඩු වෙනවාය කියා දැන් සමහර ගොවීන් අතර මතයක් තිබෙනවා. වැරදි පෝර වර්ග පාවිච්චි කළොත් කුඹුර නරක් වන බව ගොවීන්ගේ හැඟීමයි. ඇමෝනියා යූරියා කියන ලුණු සහිත පෝර පාවිච්චි කළොත් සමහර කුඹුරුවල මතුපිට යකඩ පාටින් තට්ටුවක් සෑදීම හේතුකොටගෙන අස්වැන්න අඩු වෙනවා.

**කාරකසභා නියෝජ්‍ය සභාපති**
*(குழுக்களின் பிரதி அக்கிராசனர்)*
(The Deputy-Chairman of Committees)

ආහාර වගා කිරීමේ කාරණයට ඔය කරුණු අදාළ නැහැ.

**ඩබ්ලිව්. දහනායක මයා.**
*(திரு. டப்ளியு. தகநாயக்க)*
(Mr. W. Dahanayake)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙහි තිබෙන්නේ, “Increase in the quantity of local rice purchased under the G. P. S.” කියලයි. [බාධා කිරීම්.] ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේකෙ එහෙමයි තියෙන්නෙ. මාතෘකාවට ආපසු එන්න මා බොහොම සන්තෝෂයි. මෙහෙම කතා කර ගෙන යන එක මටත් සන්තෝෂයට කාරණයක් නොවෙයි. ඊයෙ රාත්‍රියෙ සිට නිදි මරාගෙන හිරිය කඩාගෙන කතා කරන එක මට සන්තෝෂයට කාරණයක් නොවෙයි කියන එක තමුන්නාන්සෙත් පිළිගන්නවා ඇති. නමුත් මහජනයා වෙනුවෙන් අප සතු යුතුකම් අප ඉටු කරන්න ඕනෑ. මැරිල වැටුණත් අපේ යුතුකම අපි ඉටු කරන්න ලෑස්තියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පෝර වර්ග කීපයක් තියෙනවා. “ඇමෝනියා” කියන පෝර වර්ගය එහෙම නොදැන පාවිච්චි කළොත් අස්වැන්න අඩු වෙනවා. එම නිසා අපේ ගොවි ජන සේවා දෙපාර්තමේන්තුව මගින් හැම කුඹුරු ගොවියකුටම වාගෙ කියා දෙන්න ඕනෑ, පෝර පාවිච්චි කරන පිළිවෙළ ගැන. ගොවි ජන සේවා දෙපාර්තමේන්තුවේ හැම ගොවියකු වෙනුවෙන්ම පිළියෙළ වුණු fපයිල් එකක් තියෙනවද කියල මා අහනවා. ඔය දෙපාර්තමේන්තුව අළුතින් ආරම්භ කළේ අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීතුමා ඇමතිකම් කරන කාලයේදීයි. ඉස්සෙල්ල තිබුණේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙ ආහාර වගා කිරීමේ වැඩ පිළිවෙළ පමණයි. ගොවි ජන සේවා දෙපාර්තමේන්තුව හැදුවෙ ඔන්න

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඔය විධියෙ වැඩ පිළිවෙළක් යෙදීමටයි. බමුණු කුලයේ නිලධාරීන් බිහි කරන්න නොවෙයි, ගොවි ජන සේවා දෙපාර්තමේන්තුව හැදුවේ. එහෙම නම් ගොවි ජන සේවා දෙපාර්තමේන්තුවෙ හැම ගොවියාටම, හැම කුඹුරටම, වෙන් වුණු fපයිල් එකක් තියෙන්න ඕනැ. කුඹුර පිළිබඳ "ග්‍රාෆ්ප්" එකක් ඒ fපයිල් එකට ඇතුළත් වෙන්න ඕනැ. ඒ කුඹුරෙන් ලැබෙන අස්වැන්න ගැනත් ඊට අවශ්‍ය කරන පෝර ගැනත් ඒ fපයිල් එකෙන් බලා ගන්න පුළුවන් වෙන්න ඕනැ. එසේම——

**ගරු ඩී. එස්. ගුණසේකර**
*(கௌரவ டீ. எஸ். குணசேக்கர)*
(The Hon. D. S. Goonasekera)

ඒක එම දෙපාර්තමේන්තුවට අයිති වැඩක් නොවෙයි.

**ඩබ්ලිව්. දහනායක මයා.**
*(திரு. டப்ளியு. தகனாயக்க)*
(Mr. W. Dahanayake)

හොඳයි, කොහේ හරි තියෙනවාද ? පෝර වර්ග නිසි ලෙස පාවිච්චි කරන්න අද දවසේ ගොවි ජනයා දන්නවද ? ඒ අයට පෝර පාවිච්චි කරන අන්දම ගැන කියා දීල තියෙනවද ? නැහැ. පෝර, පෝර කියමින් වැරදි පෝර ගන්න අය ඉන්නව. [බාධා කිරීමක්.] නියම විධියට පස් වර්ග පරීක්ෂා කර, එම පසට අවශ්‍ය පෝර මොනවද කියන එක සොයා බලන්න යෙදුණු කෝරළ දෙකලු මුළු ලංකාවෙම තියෙන්නෙ. එම කෝරළ දෙකේ පසට අවශ්‍ය කරන්නෙ මොන විධියෙ පෝරද, ඒ පෝර අවශ්‍ය කරන්නෙ මොන කාල සීමාවලටද, කියන එක සොයා බලා තිබෙනවලු. අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීතුමා ඒ බව කියනවා. එතකොට අනික් තැන්වල අස්වැන්න වැඩි කරන්න පුළුවන්ද, හරියාකාර නොදැන පෝර යෙදීමෙන් ? පෝර දැම්මත් අස්වැන්න අඩු වන බව කියන්නෙ මේ නිසයි. පෝරවල වරදද ඒක ? ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගොවි ජන සේවා දෙපාර්තමේන්තුව හරියට වැඩ කරන්න ඕනැ. හැම ගොවියාටම හැම කුඹුරටම නියම විධියට පෝර දෙනවා නම් ගොවිතැන් සශ්‍රීක වෙනවා ඇති. මේ පෝර ගැනීමේ දී ඔප්පුවලට අත්සන් කරන එක ගොවියාට ඔබින්නෙ නැති වැඩක්. ඔප්පුවලට අත්සන් කරන්නය කිව්වාම ගොවියා අහනව, "මොකටද මහත්තය මුද්දරයක් උඩ අත්සන් කරන්න කියන්නෙ ? මොකද මගේ වචනය විශ්වාස කරන්න බැරිද ?" කියල. මේ මුද්දර උඩයි, ඔප්පුවලටයි අත්සන් කරන්න වුවමනා නැහැ, "විශ්වාසයට දෙන්න. මම තමුන්නාන්සෙලාට කිව්වා, ගොවියා රජය, මඩ සෝදා ගත්තම ඔටුණු පැළඳවීමට සුදුසුය කියා. අවුරුදු තුන්හාර සියයකට ප්‍රථම රොබට් නොක්ස් ඔය විධියට කියල තියෙන්නෙ. ඒ ගොවියට කියා දෙන්න නියම විධියේ පෝර මොනවද කියා. පෝර පාවිච්චි කරන ප්‍රමාණය කියා දෙන්න.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ඇමතිතුමාගෙන් එක කාරණයක් දැන ගන්න කැමතියි. ඇමෝනියා කියන පෝර ගන්න අවසර පත්‍රයක් වුවමනා නැහැ. නමුත් යුරියා කියන පෝර වර්ගය තමයි, ගාලු දිස්ත්‍රික්කය වගේ ප්‍රදේශවල පහත් මට්ටමේ තිබෙන කුඹුරුවලට යෝග්‍ය පෝර. ඇමෝනියා නොවෙයි, ගාල්ල, මාතර කළුතර, වැනි දිස්ත්‍රික්කවලට ඔබින්නේ. ඇමෝනියා කියන පෝර ගැනීමට කිසිම බලපත්‍රයක් වුවමනා නැහැ. නමුත් යුරියා කියන පෝර ගැනීමට බලපත්‍රයක් ඕනැ. ඔන්න මම රහසක් එළිදරව් කළා. ගිය සතියේ මම විදුලි පුවතක් යැව්වා, පේරාදෙණියේ කෘෂිකර්ම අධ්‍යක්ෂවරයාට, යුරියා කියන පෝර ගැනීමට බලපත්‍ර දීමේ ක්‍රමය වහම නැති කරන්නය කියා. ඇයි යුරියා කියන පෝර ගැනීමට බලපත්‍රයක් ඉල්ලන්නෙ ? ගාලු දිස්ත්‍රික්කයේ ගොවියා බලපත්‍ර ගන්නෙ කොහොමද ? බලපත්‍ර ගන්න ගිහින් නිලධාරි මහත්මයාගේ කන්තෝරුවෙ දොරෙකොඩට වෙලා පැය ගණනක් ඉන්න ඕනැ. පැය ගණනක් හිටියට පස්සෙ හෙට වරෙන් කියනවා. ඉතින් බලපත්‍ර නැතිව යුරියා ගන්න බැරි නිසා ඇමෝනියා ගන්නවා, ඔන්න මම ලේසියට දෙන පෝර ගත්තාය කියා. නමුත් ඒ ප්‍රදේශවල කුඹුරට ඔබින්නේ යුරියා පෝරයි. මේක වැරදි නීතියක්. ඇයි අනික් පෝරවලට නැති නීතියක් යුරියාවලට තියෙන්නෙ ? මේක තමුන්නාන්සෙ නොදන්න කාරණාවක්. මේක හරි ගස්සන්න ඕනැ.

මම දැන් අභ්‍යන්තර වී ගැනීමේ ක්‍රමය ගැන වුවමනාවට වඩා කථා කළාය කියා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩබ්ලිව්. දහනායක මයා.]

හිතනවා. තව හුඟක් කියන්න තියෙනවා, ඒවා මතු සම්බන්ධය කියා අතික් කාරණා ගැන මම ටිකක් විස්තර ඉදිරිපත් කරන් නම්.

Decrease in revenue consequent to the reduction in the selling price of white sugar.

මම ඒ ගැන දොස් පවරනවා හිටපු මුදල් ඇමතිතුමාට. දුඹුරු සීනි සම්බන්ධව එතුමාට දොස් පැවරීම ගැන කව්රුවත් මා සමග කරහ වෙන්න එපා. දුඹුරු පාට සීනි නැවැත්වීමෙන් හිටපු මුදල් ඇමති තුමා මේ ලංකාවෙ දුප්පත් මහජනයාට ලොකු පහරක් ගැහුවා. තමුන්නාන්සෙට මතක ඇති රත්නපුරේ සම්මේලනයේදී, අපි සීනිවල මිළේ කිසිම වෙනසක් කරන්නෙ නැත කියා ප්‍රකාශයක් කරල, කිසිම හැල හොල්මනක් නැතිව පූසා වගේ භාණ්ඩාගාරයට ඇවිත්, දුඹුරු පාට සීනි ගෙන්වීම නවත්වන්නය කියා හොර රහසේම ඔඩරයක් ගැහුව හැටි. කව්ද එහෙම කළේ ? හිටපු මුදල් ඇමතිවරයා.

**ගරු ඩී. එස්. ගුණසේකර**
*(கௌரவ டீ. எஸ். குணசேக்கர)*
(The Hon. D. S. Goonasekera)

දැන් ලංකාවේ කර්මාන්තශාලාවල සීනිත් ගන්න නිසා මේක අඩු වෙනවා.

**ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பீ. ஆர். குணவர்தன)*
(Mr. D. P. R. Gunawardena)

කොච්චර සීනි නිපදවල තියෙනවද ලංකාවෙ ? සීනි නොවෙයි, වැඩිපුර උපද වන්නෙ රම්.

**ජයසිංහ මයා.**
*(திரு. ஜயசிங்ஹ)*
(Mr. Jayasinghe)

ඔය නිලධාරි දෙන බොරු උපදෙස් පිළිගෙන තමුන්නාන්සෙ කථා කරන්න එපා.

**ඩබ්ලිව්. දහනායක මයා.**
*(திரு. டப்ளியு. தகனாயக்க)*
(Mr. W. Dahanayake)

වැඩ බලන ඇමතිතුමාට මම අවවාදයක් දෙනවා. ඒ ගැන තරහ වෙන්න එපා. [බාධා කිරීම්]

**ගරු ඩී. එස්. ගුණසේකර**
*(கௌரவ டீ. எஸ். குணசேக்கர)*
(The Hon. D. S. Goonasekera)

ගරු මන්ත්‍රීවරු සීලාචාර අන්දමට මේ ස්ථානයේ හැසිරෙන්න ඕනෑ. නිකම් බිල්ලන් වගේ [බාධා කිරීමක්] මන්ත්‍රී වරු කීප දෙනෙක් නැගිටලා එක විට කථා කළාම බොහොම අවලක්ෂණයි.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

දෙබරෙට ගල් ගහන්න එපා.

**ගරු ඩී. එස්. ගුණසේකර**
*(கௌரவ டீ. எஸ். குணசேக்கர)*
(The Hon. D. S. Goonasekera)

එක මන්ත්‍රීවරයෙක් කථා කර ඉවර වුණාම කථා කරනවා නම් [බාධා කිරීම්].

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

සීලාචාරකම් තමුන්නාන්සෙගෙ පැත්තෙ ඉන්න අයට කියා දෙන්න.

**කාරකසභා නියොජ්‍ය සභාපති**
*(குழுக்களின் பிரதி அக்கிராசனர்)*
(The Deputy-Chairman of Committees)

කරුණා කර නිශ්ශබ්ද වන්න.

**ගරු ඩී. එස්. ගුණසේකර**
*(கௌரவ டீ. எஸ். குணசேக்கர)*
(The Hon. D. S. Goonasekera)

අර බලන්න යමක් කමක් තේරෙන අයියණ්ඩි, ඇමතිකමක් කර පුරුද්දක් තිබෙන තැනැත්තා, මහත්මයෙක් වාගේ නිසොල්මන්ව සිටිනවා.

**ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பீ. ஆர். குணவர்தன)*
(Mr. D. P. R. Gunawardena)

ගරු මන්ත්‍රීවරුන් මේ සභාවෙ විවේචයනයන් ඉදිරිපත් කරන විට ඇමතිවරු සභාවෙන් පැන යන්නෙ නැතිව මෙහි ඉන්න ඕනෑ ඒවාට පිළිතුරු සපයන්න. ඇයි මේ විවේචනයන්ට මුදල් ඇමතිතුමා කන් නොදෙන්නේ ? අපි තමුසෙට දොස් කියන්නෙ නැහැ. තමුසෙට මේ ලෝකෙ දෙයක් තේරෙන්නෙ නැහැ. මේක තමුසෙට කරන්න පුළුවන් දෙයක් නොවෙයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු ඩී. එස්. ගුණසේකර**
*(கௌரவ டீ. எஸ். குணசேக்கர)*
(The Hon. D. S. Goonasekera)

අවිස්සාවේල්ලෙ ගරු මන්ත්‍රීවරයාටත් තමන්ගෙ අවස්ථාව ආවාම කථා කරන්න පුළුවන්.

**ඩබ්ලිව්. දහනායක මයා.**
*(திரு. டப்ளியு. தகனாயக்க)*
(Mr. W. Dahanayake)

ගරු සභාපතිතුමනි, විවාදවලදී මෙවැනි උණුසුම් වාද භේද ඇති වුණාම ඒවා වහාම අමතක කර දමන්න ඕනෑ. අප සියලු දෙනාම මෙහි පැමිණ සිටින්නෙ මහජන ප්‍රශ්න නිරාකරණය කොට ඔවුන්ට සුභ සිද්ධියක් සලසා දීමටයි. ඒ නිසා මෙවැනි සිද්ධීන් අමතක කර දමන්න ඕනෑ.

මා කලින් හිතාගෙන හිටියේ හිටපු මුදල් ඇමතිතුමා සත්පුරුෂ කෙනෙක්ය කියායි. [බාධා කිරීමක්]

**සිරිසේන මයා.**
*(திரு. சிறிசேன)*
(Mr. Sirisena)

ඒක සම්පූර්ණ අසත්‍යයක්.

**ඩබ්ලිව්. දහනායක මයා.**
*(திரு. டப்ளியு. தகனாயக்க)*
(Mr. W. Dahanayake)

හිටපු ඇමතිතුමා ගැනයි එම ප්‍රකාශය කළේ. වැඩ බලන ඇමති ගැන නොවෙයි.

දුඹුරු පාට සීනි ගෙන්වීම නැවැත්වීම කොපමණ ලොකු අපරාධයක් ද? එය දුප්පත් ජනතාවට ගැසූ මරු පහරක්. මට මතකයි, කොට්ටාවේ ගරු මන්ත්‍රීතුමා දුඹුරු සීනි ගෙන්වීම තහනම් කිරීම ගැන කළ කථාව. ඒ පිළිබඳව මම විස්තර වශයෙන් කථා කිරීමට අදහස් කරන්නේ නැහැ.

**ගරු ඩී. එස්. ගුණසේකර**
*(கௌரவ டீ. எஸ். குணசேக்கர)*
(The Hon. D. S. Goonasekera)

මෙහි තිබෙන්නේ, "Decreasing revenue consequent to the reduction in selling price of white sugar" කියායි. වැඩි මුදලකට ඇස්තමේන්තු හදා තිබෙතත් විකුණන්න සිදු වූයේ අඩු මුදලකට නිසා මේ මුදල වුවමනා බවයි, මෙහි කියා තිබෙන්නේ. ඇස්තමේන්තු සාදද්දී බලාපොරොත්තු වූ තරමට විකුණන්න බැරි වී තිබෙනවා. ඒ නිසයි, මේ මුදල වුවමනා කරන්නේ.

**ඩබ්ලිව්. දහනායක මයා.**
*(திரு. டப்ளியு. தகனாயக்க)*
(Mr. W. Dahanayake)

වැඩ බලන ඇමතිතුමා කියන දේ මම පිළිගන්නවා. දුඹුරු පාට සීනි ගෙන්වීම නැවැත්වූයේ ඇයි? එයින් මහජනයාට මරු පහරක් වැදුනු බවයි, මම කියා සිටියේ. එයින් මහජනයාට ජීවන වියදම වැඩි කළා. සුදු සීනි ධනපතියන් පාවිච්චි කළාට දුඹුරු පාට සීනි තරම් හොඳ නැහැ. අගුණයි. පොඩි ළමයින්ට දෙන්න කියන්නේත් දුඹුරු සීනි. ඇයි ඒ සීනි ගෙන්වීම තහනම් කළේ? මහජනයාට වුවමනා දුඹුරු සීනි ගෙන්වීම නැවැත්වීමෙන් එදා කළ අපරාධයට ජුලි අගෝස්තු මාසය වන විට මහජනයාගේ බඩට ගැසූ ඒ ඇමතිතුමාට පඩිසන් දුන්නා. ඒ ඇමතිතුමාට පදවියෙන් අස්වෙන්න සිද්ධ වුණා. එක අඩියක් පස්සට ගත්තාට අඩි දෙකක් ඉස්සරහට තියනවාය කී නමුත් පළමු අඩිය පස්සට ගත් ඔහුට දෙවන අඩියත් පස්සටමයි ගන්න සිදු වුනේ. දැන් අඩි දෙකක් පස්සට ගෙන තිබෙනවා. පාර්ලිමේන්තු ලේකම් ධුරයෙනුත් අස් වී තිබෙනවා. එපමණක් නොවෙයි, අඩි දෙක අඩි තුනක් වෙයි. තවත් අඩියක් පස්සට ගන්න සිදු වෙයි. මන්ත්‍රීකමත් නැති වෙයි. අන්තිමට එතැනින් තමයි, පිටවෙන්නේ.

**සිරිසේන මයා.**
*(திரு. சிறிசேன)*
(Mr. Sirisena)

අපි නැවතත් දුඹුරු සීනි ගෙන්වනවා.

**ඩබ්ලිව්. දහනායක මයා.**
*(திரு. டப்ளியு. தகனாயக்க)*
(Mr. W. Dahanayake)

තමුන්නාන්සේ කී ඔය වචන හැන්සාඩ් වාර්තාවේ පළවෙනවා ඇති. නැවතත් දුඹුරු සීනි ගෙනාවොත් මම තමුන්නාන්සේට විශෙෂ මල් මාලයක් පැළඳවීම සඳහා කථානායකතුමාගෙන් අවසර ඉල්ලනවා. නමුත් මම දන්නව ගොයියො, මොන අයද කියා. තඹ පාට සීනි නැවත ගෙන්වන්නෙ නැහැ. තමුන්නාන්සෙ කිව් වචන හැන්සාඩ් වාර්තාවෙ තිබුණාවෙ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩබ්ලිව්. දහනායක මයා.]

තුන්වන කාරණය මෙන්න: පේමන්ට් ඔෆ් ඩිමරිජ්—නැව් දඩ මුදල් ගෙවීම—යටතේ රුපියල් ලක්ෂ 40 යි. [බාධා කිරීමක්] දැන් සිනි කතාව ඉවරයි. නැව් දඩය ගැන වචන සවල්පයක් කථා කිරීමට විශේෂ අයිතිකමක් මට තිබෙනවා. මන්ද, ගාලු වරාය සම්බන්ධ කරුණු බොහොම හොඳට මම දන්න නිසයි. ගාලු වරායට නියම විධියට නැව් යැව්වොත් රුපියල් ලක්ෂ 40 ක් බේරා ගන්න පුළුවන්කම තිබෙනවා. ඇයි නියම විධියට නැව් යවන්නෙ නැත්තෙ? ගාලු වරායෙ තිබෙන නැව් නවත්වන සථානයේ බර්ත් නමැති විශේෂ ඇඳ පැත්තකට කර තිබෙනවා. ඕනෑම වෙලාවක ආහාර නැවකට යන්ට පුළුවනි. වෙනත් නැව් එතනට බාර ගන්නෙ නැහැ. කජ්රා බර්ත් එක වෙන් කර තිබෙනවා. තමුන්නාන්සෙලා ඒක පාවිච්චි කරනවද? සැප්තැම්බර් 2 වන දා ආහාර නැවක් ගාලු වරායට ආව. 3 වනදා සිට අද වන තුරු දවස් 26 ක් ආහාර නැවක් ගාල්ලට නැහැ. නැව්වල බඩු බාන අයට එතන රක්ෂාවල් නැහැ. ආහාර ඇමති තුමා සමුපකාර සමිතියක්ය කියා 270ක් කම්කරුවන් එකතු කර සමිතියක් ඇති කළා. ඒ 270 දෙනාට පසුගිය 26 දවස තුළ වැඩ නැහැ. ආහාර නැවක් එහාට යැව්වෙ නැති නිසයි වැඩ නැත්තෙ. හාල් නැව් පමණයි ගාල්ලට යවන්නෙ. පිටි, අර්තාපල්, ඇනු, ආදිය රැගත් නැව් ගාලු වරායට යවන්ට පුළුවන් බව කම්කරුවෝ පෙන්වා දුන්නා. ආහාර ඇමතිතුමා ඒවා යවන්නෙ නැහැ ගාලු වරායට. එතුමා එසේ කරන්නෙ මන්දැයි අභියෝග කර මම ප්‍රශ්න කර නවා. මේ පිළිබඳව හොඳට කරුණු දන්න කෙනෙක් මම. ගාලු වරාය ගැන මා විතර කරුණු දන්න මන්ත්‍රීවරයෙක් මෙතන නැතුව ඇති. සමහර විට කොට්ටාවෙ ගරු මන්ත්‍රීතුමා දන්නවා ඇත කියා මා කල්පනා කරනවා. අපි දන්නවා තමුන්නාන්සෙලා නොදන්න දේවල්. වැඩ කරන කම්කරු වන්ගෙන්ම අහල, සොයා බලා දැන ගන්න දේවල් තමයි අපි කියන්නෙ.

අර්තාපල්, ඇනු, ආදිය ඇතුළත් ආහාර නැව් ගාලු වරායට යවන්නෙ නැත්තෙ ඇයි කියන එක මම කියන්නම්. නැව් දඩය වශයෙන් රුපියල් ලක්ෂ 40 ක් ගෙවන්නෙ ඇයි? මම රහස එළිදරවු කරන්නම්. නියෝජ්‍ය සභාපතිතුමනි, නොදන්නා දේවල් මගෙන් අහගන්න. පිටකොටුවේ ජාවාරම්කාරයෝ, පිටකොටුවේ බඩු ගෙන් වන තොග වෙළෙන්දෝ, ඉම්පෝටර්ස්ලා, මේ රටට එන ද්‍රව්‍යවලට මිල වැඩි කරන පිටකොටුවේ දුෂ්ට වෙළෙන්දෝ, ළඟ අර්තාපල්, රටඇනු සහ අනික් ඇනු වර්ග තිබෙනවා. එසේ තිබෙන විට අර්තාපල් නැවක් කොළඹ වරායට ආවොත් ඒ වෙළෙන්දෝ පගාව දෙනවා බඩු බෑම ප්‍රමාද කරන්න.

**වෛද්‍යාචාර්ය නාගනාදන්**
*(டொக்டர் நாகநாதன்)*
(Dr. Naganathan)

I rise to a point of Order. There is no Quorum.

මන්ත්‍රී මණ්ඩලය ගණින් කොට ගණපූරණයක් නොමැති වූයෙන්, බෙදුම් සීනු ශබ්ද කිරීමට නියෝග කරන ලදී.

පසුව ගණපූරණයක් තුබුයෙන්—

**ඩබ්ලිව්. දහනායක මයා.**
*(திரு. டப்ளியு. தகநாயக்க)*
(Mr. W. Dahanayake)

නියෝජ්‍ය සභාපතිතුමනි, පිටකොටුවේ තොග වෙළෙන්දන් සහ පිටරටින් බඩු ගෙන්වන වෙළෙන්දන් ළඟ ඇනු සහ අර්තාපල් තොග තිබෙනවා. ඒ ඇනු සහ අර්තාපල් තිබෙන විට කොළඹ වරායට නැවක් එනවා, තවත් ඇනු සහ අර්තාපල් අරගෙන. එක පාරටම මේ පිටරටින් බඩු ගෙන්වන තොග වෙළෙන්දෝ ගිහින් ලොකු පගාවක් දීල කියනවා, ඔය නැවේ බඩු බාන්න එපාය කියා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)

කවුද කියන්නේ? නම කියන්න.

**ඩබ්ලිව්. දහනායක මයා.**
*(திரு. டப்ளியு. தகநாயக்க)*
(Mr. W. Dahanayake)

මම ඒ නිලධාරීන්ගේ නම් කියන්න සතුටු නැහැ. මගෙන් එහෙම අහන එක වැරදියි. නම "අයන්න" වන්නත් පුළු වනි; "ආයතන" වන්නත් පුළුවනි; ජකෝරිස් වන්නත් පුළුවනි; ජෙරමියස්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එන්නත් පුළුවන්. මම කියන්නේ වන සිද්ධියයි. මෙතනයි පගාව ගහන තැන. "මහත්මයා මේ බඩු බාන්න එපා; එසේ කළොත් අප ළඟ තිබෙන තොගයෙන් මෙපමණ පාඩු විඳින්න වෙනවා. ඒ නිසා බඩු බාන්න එපා" කියා පගාව දෙනවා. [බාධා කිරීමක්] "අපට ඕනෑ මෙය ප්‍රමාද කරන්න. මන්ද? මේ බඩු බැවොත් අපේ ළඟ තිබෙන බඩුවල මිල අඩු වෙනවා" කියා කියනවා. ඒ විධියට මේ වෙළෙන්දන් අර බඩු බෑම ප්‍රමාද කරනවා තමන් ළඟ තිබෙන බඩු ටික විකිණෙන තුරු. බඩු ඉවර වේගෙන යන විට මිල නංගනවා. නාවලපිටියෙන් හරි කොහෙන්හරි පිට පළාතකින් කෙනෙක් ආවාම කියනවා දන් මේ බඩුවල මිල නැගලා; ඔය නැවේ බඩු ළඟදී බාන්නේ නැත කියා. ඔය විධියට පළමුවෙන්ම ටොන් එකකට රුපියලක් නංගනවා. ඊට පසු දෙකක් නංගනවා තව ටික දවසක් යනවිට තුනක් නංගනවා. ඔය විධියට බඩුවල මිල නඟිනවා; අර නැවේ තිබෙන ඒවා කුණුවෙනවා. එයින් වන්නෙ කුමක්ද? තිබෙන බඩු තොගයෙන් මුදල් හම්බ කරනවා. ඒ තොගය ඉවර වුණාම ඊළඟ බඩු ටික බානවා. එත කොට කල් පසුවීම නිසා මේ අර්තාපල්, ළූනු ආදිය කුණු වෙලා. එපමණක්ද? නැව ප්‍රමාදවීම නිසා ඒ නැවට ඩෙමරේජ් ගෙව නවා. මේ ආකාරයට විශාල මුදලක් වැය කර ගෙන්වන අර්තාපල්, ළූනු ආදිය කුණු වී අන්තිමට ඒවා පෝරවලට දමනවා. එහෙම නැත්නම් මුහුදට දමනවා. මෙයින් විශාල හානියක් සිද්ධ වෙනවා. අවස්ථා වෙන් ප්‍රයෝජනය ගන්න පිටකොටුවේ වෙළෙන්දන් මේ නිසා බඩු මිළ නංවනවා. බඩු පිටරට යැවීම හා බඩු මෙරටට ගෙන්වීම සම්පූර්ණයෙන් රජයට ගෙන ඒ කට යුතු පිරිසිදුව කරන්ට කියා කරුණු සහිතව අප කියන්නේ ඒ නිසයි. බඩු පිටරට යැවීම හා ගෙන්වීම සම්බන්ධයෙන් විශාල ජාවාරමක් ගෙන යනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ළූනු හා අර්තාපල් නැව් ගාල්ලට පිටත් කළොත් නියම කාලයට වඩා ඉතා සුළු කාලයකින් ඒ නැව්වල බඩු බානවා. එහෙත් එම බඩු නැව් ගාල්ලට එවන්නේ නැහැ. එම නැව්වල බඩු කොළඹ බාන්නෙත් නැහැ. පගාවට යට වී බඩු කුණු කරනවා. මේ ශ්‍රී ලංකාද්වීපය නොයෙකුත් දේවලට ප්‍රසිද්ධියක් දරනවා. ඒවාගේම "ආහාර කුණු වෙන ද්වීපය" හැටියටත් ලෝක වෙළඳ පොලේ කීර්තියක් දරනවා. අර්තාපල්, ළූනු කරවල ටොන් ගණන් කුණුවීමට ඉඩ හරිනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බඩු කුණු කිරීමේ ජාවාරම ගැන තවත් කාරණයක් කියන්ට තිබෙනවා. සමහර අවස්ථාවලදී සමුපකාර තොග වෙළඳ ආයතනයේ ඇතැම් නිලධාරීන් වහලේ උළු කැටයක් අස් කරනවා. මේ නිසා සිදු වන්නේ කුමක්ද කියා තමුන්නාන්සේලාට සිතා ගන්න පුළුවන්. වැස්සක් ආවොත් අර උළු කැටය ඉවත් කළ තැනින් වතුර ගලා ගොස් ගබඩා කර තිබෙන බඩු කුණු වෙන්ට පටන් ගන්නවා. ඉන්පසු ඒ ද්‍රව්‍ය "කන්ඩෙම්" කරවා ගන්නවා. මෙසේ "කන්ඩෙම්" කරන බඩු ඉවත් කිරීමේදී හොඳ බඩුත් ඒ සමගම පිට කර නවා. අද මෙය විශාල ජාවාරමක් බවට පත්වී තිබෙනවා. මේ විධියට බඩු කුණු කිරීමේ ජාවාරම වහාම නැති කරන්ට විධි විධාන යොදන්න ඕනෑ බව මම ඇමතිතුමාට මතක් කරනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ ආකාරයට ක්‍රියා කළොත් ඔය නැතිවූ රුපියල් කෝටිය වගේ තුන් ගුණයක් බේරා ගන්ට පුළුවනි.

**කාරකසභා නියෝජ්‍ය සභාපති**
*(குழுக்களின் பிரதி அக்கிராசனர்)*
(The Deputy-Chairman of Committees)

රැස්වීම අ. භා. 2 වන තුරු තාවකාලිකව අත්හිටවනවා.

**රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්සිටුවන ලදින්, අ. භා. 2 ට කථානායකතුමාගේ සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.**

**ඩබ්ලිව්. දහනායක මයා.**
*(திரு. டப்ளியு. தகநாயக்க)*
(Mr. W. Dahanayake)

ගරු කථානායකතුමනි, දාවල් 12 ට සභාව විසිර යන අවස්ථාවේදී මා කථා කර මින් සිටියේ නැව් ප්‍රමාද වීම නිසා ඇති වන දඩ ගැනයි, ඩෙමරේජ් ගැනයි. පසුගිය වර්ෂයේ ප්‍රමාද වූ නැව්වලට දඩ වශයෙන් රුපියල් ලක්ෂ 40ක් ආණ්ඩුවට නැති වී තිබෙනව. ඒ දඩ ඇති වෙන්නෙ මොන කරුණක් නිසාද කියා මා මගේ කථාවේදී පෙන්වා දුන්නා. මේ සම්බන්ධව සාමාන්‍ය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩබ්ලිව්. දහනායක මයා.]
මහජනයා අතරේ වැරදි මතයක් ඇති වී තිබෙනව. ප්‍රවෘත්ති පත්‍රවලත් මේ නැව් දඩ ගැන වැරදි අදහස් පළ වෙනව. අපේ රටේ බොරුවක් පතුරුවා හැර තිබෙනව, මේ නැව් දඩ ගෙවන්ට සිද්ධ වෙන්නෙ කොළඹ වරායෙ කම්කරුවන්ගේ වරද නිසාය කියා. කොළඹ වරායෙ කම්කරුවන් ඊට වරදකරුවන් නොවෙයි. මා පෙන්වා දී තිබෙනව, කොළඹ වරායෙ කම්කරුවන් ඉක්මනින් නැව්වල බඩු ගොඩ බාන්ට ඉතාමත් ආසා වෙන් ඉන්න බව. එය කම්කරුවන්ගෙ වරදක් නොවෙයි. කොළඹ වරායෙ නිලධාරීන් ඕනෑකමින්ම ඔවුන්ගේ කූට උපක්‍රම අනුව වාසි ලබාගැනීමේ බලාපොරොත්තුවෙන් නැව්වල බඩු බෑම ප්‍රමාද කරනව. මන්ද? පිටකොටුවේ වෙළෙන්දන්ගෙන් පගාව ලබාගන්න කොළඹ වරායෙ නිලධාරීන් ඇනු අර්තාපල් වැනි ඉක්මනින් නරක් වන බඩු බෑම ප්‍රමාද කරවනව. එවිට පිට කොටුවේ වෙළෙන්දන්ට පුළුවන් වෙනවා තමන් ළඟ තිබෙන අර්තාපල් සහ ඇනු තොගය වැඩි ගණනකට විකුණන්න. ඒ පමණක් නොව පගාව වශයෙන් දුන් මුදලට පොළියකුත් සමග ඒ තිබෙන බඩු තොගය විකුණා ගන්න ඔවුන්ට අවස්ථාව ලැබෙනව.

ඒ වගේම අර්තාපල් ඇනු වැනි ඉක්මනින් නරක් වන ද්‍රව්‍ය ගාලු වරායට එවන්නය කියා ගාලු වරායෙ කම්කරුවන් ඉල්ලා තිබෙනව. ගාල්ලෙ සමිති සමාගම් කීපයකුත් ඒ ඉල්ලීම කර තිබෙනව. ගාල්ලෙ මන්ත්‍රීවරයා වශයෙන් මමත් මෙය විටින් විට කියා තිබෙනව. නමුත් කොළඹ වරායෙ කූට නිලධාරීන්, හොර කමෙහි යෙදෙන නිලධාරීන්, ඒ බඩු නැව් ගාලු වරායට යවන්නෙ නැහැ. මට මතකයි, 1958 එක්තරා අවස්ථාවකදී ඇනු අර්තාපල් වැනි ඉක්මනින් නරක් වන ද්‍රව්‍ය ගොඩ බාන්න නැව් වගයක් ගාලු වරායට යැව්වා. මොකක්ද සිද්ධ වුණේ? කොළඹ වරායෙදී "demurrage" හෙවත් නැව් ප්‍රමාද වීමේ ගාස්තු ගෙවන්නට සිදු වුණා. නමුත් ගාලු වරායෙදී "despatch money" හෙවත් නියම කාලයට කලින් බඩු බා ගැනීම වෙනුවෙන් මුදලක් අපට ලැබුණා. ඒ කියන්නේ, ගාලු වරායට නැව් පිටත් කර යැවීම නිසා අපට ලාභයක් ලැබුණා. කොළඹ වරායෙදි නම් මේ අපට ලැබෙන "despatch money" වෙනුවට "demurrage" යනුවෙන් අපෙන් මුදලක් ගෙවන්නට සිදු වුණා. "demurrage" මුදල අපතේ යන මුදලක් නිසා අපට ඒ ගැන කිසි සේත්ම සතුටු වන්නට බැහැ. එසේ "demurrage" ගෙවන්නට සිදු වුණේ නිලධාරීන්ගේ වරද නිසයි. "demurrage" ගාස්තු නිසා කොළඹ වරාය මුළු ලෝකයේම අපකීර්තියට පත් වුණා. කොළඹ වරායේ නැව් ප්‍රමාද වීම නිසා លොකු අපකීර්තියක් ලැබුණා. ඒ අපකීර්තිමත් නාමය දැන් ලෝකය පුරා පැතිරී තිබෙනවා. මේ නිසා සමහර නැව් කොළඹ වරායට නොපැමිණ සිංගප්පූරුවට යනවා. සමහර නැව් කොළඹ වරායට නොපැමිණ කොචින් වරායට යනවා. ඒ වගේම ඕස්ට්‍රේලියාවේ වරායවලට යනවා. කොළඹ වරායට ලැබී තිබෙන නරක නාමය නිසා මේ රටට සිදු වී තිබෙන්නේ ලොකු පාඩුවක්. ඒ බව නමුන්නාන්සේලා දැන ගත යුතුයි. මේ පාඩුවට හේතු වී තිබෙන්නේ කොළඹ වරායේ සේවය කරන කම්කරුවන්ගේ වරද නොවෙයි. නිලධාරීන් ලොකු වෙළඳුනුත් සමග එකතු වී කරන ජාවාරම් නිසා මේ විධියේ තත්ත්වයක් ඇති වී තිබෙන බවයි, මා කියන්නේ.

ඒ නිසා නමුන්නාන්සේලා මේ කාරණය ගැන සොයා බලන්ට ඕනෑ. මේ කාරණය ගැන සොයා බැලීම සඳහා කාරක සභාවක් පත් කරන්න. එසේ වුවහොත් නම් නියම තත්ත්වය දැන ගැනීමට නමුන්නාන්සේට පුළුවන් වේවි. දඩ මුදල් හෙවත් "demurrage" ගෙවන්න වන්නේ මොන හේතුවක් නිසාද කියා එතකොට නමුන්නාන්සේලාට පැහැදිලි කර ගන්නට පුළුවන් වේවි. කොළඹ වරායේ කම්කරුවන්ට නරක නාමයක් ලැබී තිබීම ගැන මා කනගාටු වෙනවා. කොළඹ වරායේ කම්කරුවන්ගේ නම නරක් කිරීම සඳහා පුවත්පත්වල පළ කරන වාර්තා ගැන මා කනගාටු වෙනවා. මේ කම්කරුවන් පිට අය නොවෙයි; අපේම අයයි. සමහර විට ඔවුන් අපේ නෑදෑයන් වන්ට පුළුවනි. කොළඹ වරායේ සිටින රටට දැයට හිතැති කම්කරුවන්ට මේ විධියේ නරක නාමයක් දෙන එක ගැන කනගාටු නොවී බැහැ. මගේ අත්හදා බැලීම අනුව, මගේ දැනීම අනුව, මම ඇත්ත ප්‍රකාශ කරන්නම්. මම කොළඹ වරායේ කම්කරුවන්ගේ වෘත්තීය සමිති

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පරිපූරක මුදල්

වලට සම්බන්ධ කෙනෙක් නොවෙයි. ඒ වගේම කොළඹ වරායේ කම්කරුවන්ගේ පක්ෂපාතකමක් මට නැහැ. මා කොළඹ වරාය කම්කරුවන්ගෙ සභා රැස්වීම්වලට ගිහින් අරගල ඇති කරන්න සම්බන්ධ වෙලා නැහැ. නමුත් මා ඇත්ත ඇත්තක් හැටියට ප්‍රකාශ කරන්න ඕන. තමුන්නාන් සෙල හොඳ කල්පනාවෙන් මේ කාරණය ගැන සිතා බැලුවොත් පෙනේවි, මේ සිය ලුම වැරදි කරන්නෙ දුප්පත් කම්කරුවන් නොවන බව. මේ වැරදි කරන්නෙ කූට නිලධාරිනුයි. එදා ඉංග්‍රීසිකාරයාගෙ කාලයේ දීත් හිටිය, කූට නිලධාරීන්. නැසීගිය බණ්ඩාරනායක අගමැතිතුමාගෙ කාලෙත් හිටියා. මාත් තවත් ඇමතිවරුත් බොහොම උත්සාහ ගත්ත මේ කූට නිලධාරීන් එළවා දමන්න. ඇතැම් අවස්ථාවලදී මේ කූට නිල ධාරීන් මා සමග ඇවිලිලත් තියෙනවා. ඇතැම් අවස්ථාවලදී ඇමතිවරුන් වුණත් කූට නිලධාරීන්ට පරාද වුණා. මොවුන් මුල් අල්ලපු නුග ගස් වගේ දැඩියි. මේ නුග ගස් උගුල්ලන්න අමාරුයි. අද දවසේ තමුන්නාන්සෙලාගෙ ඇතැම් පිරිසිදු අද හස් ඔවුන් විසින් අපිරිසිදු අදහස් ආකාර යට රටට පෙන්වනු ලබන බව පේනවා. තමුන්නාන්සෙල පාදා ගන්න වැදගත් පාර නැති කරන්න හදනවා. තමුන්නාන් සෙල හොඳ වැඩක් කරන්නය කිව්වහම ඒක නරක අතට හරවල රටට ජාතියට ඒ මගින් අලාබයක් ඇති කරන්න හදනව. මම තමුන්නාන්සෙලාට සත්තක වශ යෙන්ම කියනවා, මේ අලාබ විඳින්න සිදු වන්නෙ කොළඹ වරායෙ සහ ආහාර දෙපාර්තමේන්තුවෙ උසස් නිලධාරීන් නිසාය, කියල. ඔය උසස් නිධධාරීන්ට තියෙන "බෑංක් එකවුන්ට්ස්" දිහා බලන්න. ඒ අයට කොච්චර මුදල් තියෙන වද කියල බලන්න. එතකොට පෙනෙයි, තත්ත්වය.

මා ගත වුණු පාන්දර යාමයේදී තමුන් නාන්සෙලාට මතක් කළා මුබරක් තහා පිළිබඳ සිද්ධියක් ගැන. එයාගෙ බූකියක් නැතිනම් හොරකමක් අල්ලන්න ගිහින් හම්බ වෙච්ච ටේප් එක කැරකෙව්වහම මොකක්ද ලැබුණු ආරංචිය. ? ආහාර දෙපාර්තමේන්තුවෙ උසස් නිලධාරියෙක් විශාල ඔට්ටු දමන අන්දම අහු වුණා. මේ තරම් ටැක්ස් ගෙවන්න තියෙන කාලයේ දී කොහොමද ආහාර දෙපාර්තමේන්තුවෙ උසස් නිලධාරියෙක් දිනපතාම හොර ඔට්ටු දමන්නෙ? ඉස්සර නම් සතිපතායි, හොර ඔට්ටු දැම්මෙ. නමුත් දැන් දිනපතා හොර ඔට්ටු දමනවා. ඉන්දියානු රේස්වලට සතිපතා ඔට්ටු දමනවා. එංගලන්ත රේස් වලට දිනපතා ඔට්ටු දමනවා. බලූ රේස්, අශ්ව රේස්, යනාදියට දිනපතාම වාගෙ සල්ලි යනව, මේ විදියට. රුපියල් දහය පහ ළොව නොවෙයි යන්නෙ. සිය දහස් ගණන් යනවා. කොයින්ද මේ ආහාර දෙපාර්ත මේන්තුවෙ උසස් නිලධාරියාට මේ හැටි සල්ලි ?

ඩෙමරේජ් එකට සතයක්වත් ගෙවන්න වුවමනාවක් නැහැ. අවුරුද්දෙන් අවුරුද්ද ඩෙමරේජ් ගෙවීමෙන් තව ලොකු වරදක් සිදු වෙනවා. ඒ නිසා බඩු මිල නගිනවා. අපි තමුන්නාන්සේලාට තියෙන ඉතාම භයා නක ප්‍රශ්නයක් තමයි, ජීවන වියදම ඉහළ නැගීමේ ප්‍රශ්නය. මේ ඩෙමරේජ් ගෙවීමත් ජීවන වියදම ඉහල යාමට හේතුවක් වෙන වා. ඩෙමරේජ් ගෙවීම සම්පූර්ණයෙන් නැති කර දමන ලෙස මා ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා. තමුන්නාන්සෙලා මා කියන දෙය විශ්වාස කරනවා නම්, හොඳ කාරක සභා වක් පත් කරලා මෙම කාරණය ගැන පරීක්ෂණයක් පවත්වා බලන්න. හැබැයි, හොරු අල්ලන්න තවත් හොරු කට්ටියක් දමන්න එපා. විරුද්ධ පක්ෂයෙන් වුවමනා නැහැ, ආණ්ඩු පක්ෂයෙන්ම, තමුන්නාන් සෙලාට විශ්වාසවන්ත මන්ත්‍රීවරුන් කීප දෙනකුව යොදවා ඩෙමරේජ් ගෙවන්න සිදු වන්නේ මොන කාරණයක් නිසාද කියා සෝදිසි කළොත් බඩුත් එක්ක හොරු අහු වේවි. හොර හාල් පොත් ජාවාරම ගැන වගේම, බඩු බෑම ප්‍රමාද වන්නේ, බඩු කුණු වන්නේ මොන කරුණු නිසාද කියා දැන ගන්න පුළුවන්වෙයි. එම නිසා රුපියල් 40,00,000ක් ඩෙමරේජ්වලට වියදම් වෙන වාය කීවම අපට ඒකට එකඟ වෙන්න බැහැ. 4 වැනි කාරණය හැටියට මේ වැය ශීර්ෂයේ පෙන්වා දී තිබෙනවා, "Increased cost of American flour purchased under P. L. 480 and Canadian Gift flour" කියා.

ඇමෙරිකාවේ තිබෙන නීතියක් අනුව අපි ඇමෙරිකාවෙන් පිටි ගෙන්වනවා. ගරු කථානායකතුමනි, අපේ රට කුඩා රටක්. අපි සෑම ලොකු රටවල් සමගම මිත්‍රකමින්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩබ්ලිව්. දහනායක මයා.]

සිටින්ට ඕනෑ. නමුත් අපි කිසිම ලොකු රට කට වහල් වන්නට වුවමනා නැහැ. එම නිසා අපි අපේ බඩු ඉතාමත්ම ලාභ වෙළඳ පොළකින් ගන්න ඕනෑ. එම නිසා ඇමෙරිකාවෙන් හෝ වේවා, වෙන රටකින් හෝ වේවා අපට ලාබෙට ලැබෙන රටකින්, පිටි හෝ වේවා, වෙන ද්‍රව්‍යයක් හෝ වේවා ගන්නය කියා මම ඉල්ලා සිටිනවා. ඇමෙරිකාවෙන්ම අපේ බඩු ගන්න වුවමනා නැහැ. ඒ වගේම ඇමෙරිකාවට විරුද්ධව අපේ හිත හදා ගන්න වුවමනාවක් නැහැ. කොහෙන්ද ලාබෙට බඩු ලැබෙන්නෙ, අන්න ඒ වෙළඳ පොළෙන් බඩු ගත යුතුය කියන ප්‍රතිපත්තිය අනුගමනය කරන ලෙස මම ඉතාමත් ඕනෑකමින් ඉල්ලා සිටිනවා. ඒ වගේම අළුත් මුදල් ඇමතිතුමාගේ ක්‍රියා මාර්ගය මම බොහොම සන්තෝෂයෙන් පිළිගන්නවා. මොකක්ද ඒ? බඩු හුවමාරු කිරීමේ ක්‍රියා මාර්ගය. මා හිතන පිළිවෙළට ඒ මුදල් ඇමතිතුමා පාර්ලිමේන්තුවේදී ප්‍රකාශයක් කළේ නැහැ, බඩු හුවමාරු කිරීමේ ප්‍රතිපත්තිය කුමක්ද, අපට රත් පවුම් ලබාගැනීමේ ක්‍රම මොනවාද කියා. නමුත් පරණ මුදල් ඇමතිතුමා නම් වුවමනාවට වඩා විස්තර කළා. මම නිදහස් මනුෂ්‍යයෙක්. මට අළුත් මුදල් ඇමතිතුමාට හෝ පරණ මුදල් ඇමතිතුමාට හෝ පක්ෂව හෝ විරුද්ධව හෝ කථා කරන්ට කිසිම පෞද්ගලික හේතුවක් නැහැ. ඇත්ත ඇත්ත හැටියට පෙන්වා මට කථා කරන්ට පුළුවන්. මට පෙනෙන හැටියට අළුත් මුදල් ඇමතිතුමාගේ විදේශික වෙළඳාම පිළිබඳ ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් මම කියන්ට කැමතියි. එතුමා ඒ ප්‍රතිපත්තිය කියා දුන්නෙ නැහැ. නමුත් ප්‍රවෘත්ති පත්‍ර මාර්ගයෙන් විස්තර අහුලා ගත් තරමට මම කෙටියෙන් විස්තර කරන්නම්. අපි වෙන රටවල් සමඟ වෙළඳාම් කරනවා. අපි බුරුමය ගැන කල්පනා කර බලමු. බුරුමයෙන් තමයි, අපි හුඟක් හාල් ගෙන්වන්නෙ. බුරුමයෙන් අපි හුඟක් හාල් ගෙන්වන විට බුරුමයට හුඟක් සල්ලි යවනවා. අපි ඔහ දිය මහන්සියෙන් හම්බ කරන සල්ලි කොපමණ ප්‍රමාණයක් අවුරුද්දකට බුරුමයට යවනවාද කියා සොයා බලමු. 1961 තීරු බදු සම්බන්ධව විස්තර දෙන පොතේ මුල් පිටුවල තිබෙනවා, ඒ ඒ රටවලින් අපි



කොයි තරම් ප්‍රමාණයක් වටිනා බඩු ගෙන්වනවද කියා. ඒ රටවලට අපේ බඩු කොපමණ යනවද කියා කල්පනා කර බලන්න ඕනෑ.

පළමුවෙන් අප බුරුමය ගැන කල්පනා කර බලමු. අපේ රටට බුරුමයෙන් ගෙන්වනු ලබන බඩු සඳහා අවුරුද්දකට රුපියල් කෝටි 19ක් ඒ රටට අප ගෙවනවා. 1961 ජනවාරි-දෙසැම්බර් කාලය තුළදී අපේ රට බුරුමයෙන් ගත් බඩුවලට ගෙවූ මුදලයි මේ ප්‍රමාණය. මෙම කාල සීමාව තුළදී බුරුමය අපේ රටෙන් මිළ දී රැගෙන තිබෙන බඩුවල මිළ ප්‍රමාණය කොපමණද? පොල්, කොප්පරා, පොල්තෙල්, කොහුලනු, කර්ද මුංගු, අඳී ද්‍රව්‍ය සම්බන්ධයෙන්—බුරුම රට අපෙන් ගත් ද්‍රව්‍ය සම්බන්ධයෙන්—බුරුමය අපට රුපියල් එක් කෝටියක් ගෙවා තිබෙනවා. මේ නිසා බුරුමයත් ලංකාවත් අතර වන වෙළඳ ගනුදෙනුවෙන් රුපියල් කෝටි 19ක් බුරුමයට යන විට මේ රටට රුපියල් එක් කෝටියක් පමණ ලැබෙන තත්ත්වයෙන් අපට සිදු වන්නේ පාඩුවක්. මේ බුරුම-ලංකා වෙළඳ හුවමාරුවෙන් අපට වන්නෙ අවාසියක්. මේ තත්ත්වය තමයි “ඇඩ්වර්ස් බැලන්ස් ඔෆ් ට්‍රේඩ්” යනුවෙන් විස්තර කරන්නෙ.

අළුත් මුදල් ඇමතිතුමාගෙ එක් ප්‍රතිපත්තියක් තමයි, මෙවැනි අවස්ථාවකදී තව තවත් අපේ රටේ බඩු කෙතරම් ඒ රටට යැවිය හැකිද කියා සෝදිසි කර බැලීම. අසුවල් ද්‍රව්‍ය සම්බන්ධයෙන් මීට වඩා වැඩි මුදලක් ඇයි බුරුමය නොදෙන්නෙ කියා සොයා බලා, ඒවාට දැනට වඩා වැඩි මිළක් ලබාගන්න බැරි නම් ලෝකයේ අනික් වෙළඳ පොළවලින් මීට වඩා සතුටුදායක මිළක් ලබා ගන්න පුළුවන්ද කියා පරීක්ෂා කර බැලිය යුතුයි. ඒ අන්දමට ලෝක වෙළඳපොළට ගොසින් අපේ බඩු ඒ තැන්වලට විකුණා එම වෙළඳපොළවල තිබෙන බඩු බුරුමයෙන් ගෙන්වා තිබෙනවාද කියා බැලිය යුතුයි. මෙන්න මේකයි අළුත් මුදල් ඇමතිතුමාගෙ වෙළඳ ප්‍රතිපත්තිය. අළුත් මුදල් ඇමතිතුමාගෙ මෙම ප්‍රතිපත්තිය ඉතාමත් වැදගත් ප්‍රතිපත්තියක් බව මා කියන්න කැමතියි. මේ ප්‍රතිපත්තිය අනුගමනය කළා නම් කවරදුවත් මේ ආණ්ඩුව වැටෙන්නෙ නැහැ, කවරදුවත් හානියක් වෙන්නෙ නැහැ. හැබැයි, මේ අදහස පුවත්පත් මගින් පළ කළායින්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පමණක්, ඇලඩින්ගෙ පුදුම පහණ වාගේ සියල්ලම හරි යන්නෙ නැහැ. ඒවා සාර්ථක කර ගන්න වැඩ කරන්න ඕනැ. මෙම පුවත මා "ඩේලි නිවුස්" පත්‍රයේ දැක සන්තෝෂ වුණා.

ගාම්භීර විධියට ලොකු වචන කථා කරන්නේ නැතිව, ලොකු කථා පවත්වන්නේ නැතිව, පපුව ඉස්සරහට දමා උඩ බල බලා උඩඟු විධියට ක්‍රියා නොකර, අපේ අළුත් මුදල් ඇමතිතුමා හීන් සැරේ—සියලුම සැරට වඩා හොඳ හීන් සැරේ—වැදගත් වෙළඳ ක්‍රියා මාර්ගයක් මේ රටට දුන්නා. මාත් සමඟ එකට වැඩ කළ ඇමතිවරයෙක් මෙවැනි වැදගත් වෙළඳ ක්‍රියා මාර්ගයක් ඉදිරිපත් කිරීම ගැන මම සන්තෝෂයි. මෙය ඉදිරිපත් කළාට පසු කවුරුත් එය හරිය කිව්වා. මෙය මුලින්ම ඉදිරිපත් කළේ සී. පී. ද සිල්වා ඇමතිතුමා නිසා මම මේ ක්‍රමයට කියනවා, සී. පී. ද සිල්වා ක්‍රමයය කියා. තවත් මොකක්දෝ කූපන් ක්‍රමයකට සී. පී. ද සිල්වා ක්‍රමයයි කියනවා. එය අභ්‍යන්තරව මිත්‍රයින් අතරේ සාකච්ඡා කළ එකක්. ඉතා සුළු දෙයක්. එය "හෝම්-ඇන්ඩ්-හෝම් මැච්" එකක්. නමුත් එය නොවෙයි, නියම සී. පී. ද සිල්වා ක්‍රමය. අපේ රටට අවාසි වෙළඳ හුවමාරුවක් තිබෙනවා නම් එය හරිගස් සාගැනීමයි, නියම ක්‍රමය.

ඉන්දියාව සමඟ අපේ වෙළඳාම ගැන බලන විට තමුන්නාන්සෙට පුදුම හිතේවි. ඉන්දියාවෙන් අපි කෝටි 21ක පමණ බඩු ගන්නවා. 1961 දී කෝටි 21ක බඩු ගෙන තිබෙනවා. නමුත් අපෙන් ඉන්දියාව ගෙන තිබෙන්නේ කෝටි 4ක බඩු පමණයි. මේ නිසා ඉන්දියාව සමඟ ඇති වෙළඳාමෙන් අපට රුපියල් කෝටි 17ක් අවාසියි. ඉන්දියාව සමඟ ඇති වෙළඳ අවාසිය කෝටි 17ක් වන අතර, බුරුමයත් සමඟ ඇති වෙළඳ අවාසිය කෝටි 18යි. ඉන්දියාව සමඟ කෙරෙන වෙළඳාමෙන් කෝටි 17ක් පාඩු වීම සඳහා අපි ඉන්දියාවෙන් මොනවද ගෙනෙන්නෙ? ඒ ගැන කල්පනා කරන විට කඳුළු එනවා. සාරිවලට රුපියල් ලක්ෂ 190ක් ගිහින් තිබෙනවා. සාරි කන්නද? ලස්සන කන්නද? කාන්තාවක් ලස්සන වෙන්නේ චාම් සාරියක් ඇන්දමයි.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
**(The Hon. C. P. de Silva)**

ගාල්ලෙ මන්ත්‍රීතුමා සාරි ගැන දන්නෙ නැහැ. මාත් දන්නෙ නැහැ.

**ඩබ්ලිව්. දහනායක මයා.**
*(திரு. டப்ளியு. தகநாயக்க)*
**(Mr. W. Dahanayake)**

මම දන්න තරමටයි, මම කියන්නෙ. ලස්සන කාන්තාවක් දීප්තිමත් වෙන්න නම් චාම් සාරියක් අඳින්න ඕන.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
**(The Hon. C. P. de Silva)**

හොඳ කථිකයෙක් දීප්තිමත් වෙන්න නම් කෙටියෙන් කථා කරන්න ඕන.

**ඩබ්ලිව්. දහනායක මයා.**
*(திரு. டப்ளியு. தகநாயக்க)*
**(Mr. W. Dahanayake)**

රුපියල් ලක්ෂ 190 ක් සාරි වෙනුවෙන් ඉන්දියාවට යවන්නෙ නැතිව ඉන් භාගයක් වියදම් කොට—අපටත් ඉල්ලුවොත් වැරදියට බාර ගනීවි—ආණ්ඩුවේ මන්ත්‍රීවරුන්ගෙ ආසනවලටවත් රෙදි වියන තැන් දෙක දෙක දෙන්න. තමුන්නාන්සෙගෙ අයවැය ලේඛනයේ එවැනි කිසිවක් ඇත්තේ නැහැ. අපට එපා. මම ඔය තරම් ඉල්ලන්නෙ නැහැ. දුන්නොත් අපි සන්තෝෂයෙන් ගන්නවා. අපි කල්පනා කරන්නෙ රට ගැනයි. අපට දුන්නත් එතනට දුන්නත් රටටයි දුන්නා වෙන්නෙ. ලක්ෂ 190 ක් සාරි වෙනුවෙන් ඉන්දියාවට යවන්නෙ නැතුව තහනම් නීතියක් පනවන්ට ඕනැ. සම්පූර්ණයෙන් තහනම් කරන්ට බැරි නම් භාගයක්වත් තහනම් කරන්න. ඒ මගින් රුපියල් ලක්ෂ 80 ක් නැත්නම් 90 ක් ඉතිරි කරගෙන එය බෙදා දෙන්න අලුත් රෙදි වියන ස්ථාන සඳහා. අපට දෙන්න බැරි නම් කරුණා කර ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් නියෝජනය කරන එක් කොට්ඨාශයට රෙදි වියන මධ්‍යස්ථාන දෙක බැගින්වත් හදා දෙන්න ඒ මුදලින්.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පරිපූරක මුදල්

[ඩබ්ලිව්. දහනායක මයා.]

අපේ ඇස්වලින් කඳුළුත් එනවා මේ ආණ්ඩුවට කියලම. වියලි මිරිස් වෙනුවෙන් රුපියල් ලක්ෂ 360 ක් ඉන්දියාවට යනවා. අහෝ, ලංකාවේ මිරිස් වැවෙන්නෙ නැද්ද? තනමල්විල ජනතාව අක්කර සිය ගණනක මිරිස් වවනවා. ඒ අය වීරයෝ. ඉතින් මේ වීරයන්ට මොකද කරන්නෙ? හේන් කොටනවය කියල මේ ආණ්ඩුව ඒ වීර ගොවියන්ට දඩ ගහනවා. මගේ ඇස් දෙකෙන් දැකලත්, කන් දෙකෙන් අහලත් තිබෙනවා මේ දුක්මුසු පුවත. ඒ වීරයෝ අපට කියනවා, මෙන්න සර් මිරිස් වැව්වයි කියල මට දඩ ගැහුව කියල. ගරු ඇමතිවරුන් නොවෙයි මේ වරද කරන්නෙ. යමක් තේරෙන්නෙ නැති නිලධාරීන් තමයි ඔය වැරද්ද කරන්නෙ. මේ ගොවියන්ට වෙන කිසිම උදව්වක් නුදුන්නත් ඒ අය අමනාප නැහැ. ඒ අය " සබ්සිඩි " එකක් වැනි ආධාරයක් ඉල්ලන්නෙත් නැහැ. එහෙම නම් මොනවද වුවමනා කරන්නෙ? මෙන්න ජෝන් අයියා, මේ ඉඩම් කැබැල්ලෙ වවන්න මිරිස්, කියල දෙන එකයි තියෙන්නෙ. තමුන්නාන්සෙට වුවමනා කරන මිරිස් ටික ඒ අය වගා කර දේවි. ඒක කෙරෙන තුරු තහනම් කරන්ට එපා. මහජනයාට පාඩුවක් නොවන විධියටයි කරන්න ඕනෑ. මහජනයට බරක් නොදී මේ වැඩේ කරන්න ඕනෑ.

මා මෙවැනි කතාවක් කළාම සමහර විට ඒක පත්‍රයේ වැටෙනවා. පත්‍රකාරයෝ මගෙ කතාවෙ වටිනා කොටස සමහර විට පළ කරන්නෙ නැහැ. නොවටිනා කොටසයි පළ කරන්නෙ. ගාල්ලෙ මන්ත්‍රීවරයා මිරිස් ගෙන්වීම තහනම් කරන්න කිව්වය කියා පත්‍රයේ පළ කරාවි. මිරිස් ගෙන්වන්න එපාය කියන්නෙ නැහැ මම. මේ රටට වුවමනා මිරිස් මේ රටේම නිපදවන්න ඕනෑ, කියන එකයි මම කියන්නෙ. ඊට පස්සෙ පිටරටින් ගෙන්වීම නතර කරන්න. එතකොට රුපියල් ලක්ෂ සිය ගණනක් නතර කර ගන්ට පුළුවන් වේවි. තනමල්විල ගොවියන් උසාවියට ඇදගෙන යන්නෙ නැතුව ඒ අයට අක්කරය, දෙක, තුන, හතර, ආදි වශයෙන් මිරිස් වැවීම සඳහා දෙන්න. ගොවියන්ගෙ උත්සාහයෙන් රටට ප්‍රයෝජනයක් ලබා දෙන ලෙස මා ඉතා කරුණාවෙන් ඉල්ලා සිටිනවා.

මා දැන් විස්තර කළේ සී. පී. ද සිල්වා වෙළඳ ක්‍රියා මාර්ගයයි. ඊට මම සම්පූර්ණයෙන් එකඟ වෙනවා. ඒ වෙළඳ ක්‍රියා මාර්ගය හරි හැටි ගෙන ගියොත් ඉදිරියට කවදාවත් දැන් තිබෙන ඔය අමාරුකම් තමුන්නාන්සෙලාට ඇති වෙන්නෙ නැහැ. දැන් තිබෙන ආර්ථික තත්ත්වය අනුව සියලුම දේවල් එක පාරටම හරි යාය කියන්නෙ නැහැ මම; නමුත් දැන් ඔය තමුන්නාන්සෙ ගමන් කරන්නෙ හරි ක්‍රියා මාර්ගය දිගේ තමයි. කලක් යන තුරු අමාරු වුණත් කවදා නමුත් ඒ මගින් හොඳ ප්‍රතිඵල ලැබෙනවා ඇති.

**ස්ටැන්ලි මොල්ලිගොඩ මයා.**
*(திரு. ஸ்டான்லி மொல்லிகொட)*
(Mr. Stanley Molligoda)

On a point of Order, the hon. Second Member for Akurana (Mr. Hameed) is obstructing hon. Members from coming into the House.

**ඒ. එච්. මාකන්-මාකර් මයා.** (මඩකලපුව දෙවන මන්ත්‍රී)
*(ஜனாப் ஏ. எச். மாக்கன் மாக்கர்—மட்டக் களப்பு இரண்டாம் அங்கத்தவர்)*
(Mr. A. H. Macan Markar—Second Batticaloa)

He was not obstructing.

**හමීඩ් මයා.**
*(ஜனாப் ஹமீத்)*
(Mr. Hameed)

That is a serious allegation. In fairness to me, I will want that withdrawn.

**ස්ටැන්ලි මොල්ලිගොඩ මයා.**
*(திரு. ஸ்டான்லி மொல்லிகொட)*
(Mr. Stanley Molligoda)

I will not withdraw it. I saw you asking the hon. Second Member for Batticaloa——

**හමීඩ් මයා.**
*(ஜனாப் ஹமீத்)*
(Mr. Hameed)

I was not obstructing. The hon. Member must withdraw it.

**ස්ටැන්ලි මොල්ලිගොඩ මයා.**
*(திரு. ஸ்டான்லி மொல்லிகொட)*
(Mr. Stanley Molligoda)

We cannot go by your statement. I am not going to withdraw it. You were guarding the door.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**හමීඩ් මයා.**
*(ஜனாப் ஹமீத்)*
(Mr. Hameed)

I was not guarding the door. The hon. Member should withdraw it.

**කථානායක තුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)

Order, please ! The hon. Member for Niwitigala should withdraw it. The hon. Second Member for Akurana has not obstructed any hon. Member from coming into the House.

**ස්ටැන්ලි මොල්ලිගොඩ මයා.**
*(திரு. ஸ்டான்லி மொல்லிகொட)*
(Mr. Stanley Molligoda)

In deference to your Ruling, I withdraw it.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

මේ වැඩවලින් රටට විශාල විපතක් සිදු වෙනවා. මේ වැඩ අනුව මුද්ල් හදල් නැති කරනවා පමණක් නොව බාල පරම්පරාවට විශාල පහරක් ගසා තිබෙනවා. සීනි කුඩා දරුවන්ගේත්, පොදුවේ කාගේත්, මූලික ආහාරයක්. ඒ ආහාරය නියමාකාරයට නොලැබෙන විට, ඒ ආහාරය ලබා ගැනීමට අවහිරකම් ඇති වන විට, හැදෙන පරපුරට වුවමනා තරම් සීනි ලබා ගන්නට පුළුවන් වන්නේ නැහැ. එම නිසා ඒ බාල පරපුරේ ශක්තිය පිරිහෙනවා. මේ අනුව කල්පනා කර බ්ලන විට මෙය බාල පරපුරට ගසන ලද මරු පහරක් බව කියන්ට පුළුවනි. නමුත් නාන්සෙල නාහෙට එහා කල්පනා නො කරන නිසා, නමුත්නාන්සෙලාට නාහෙට එහා කල්පනා කිරීමට ශක්තියක් නැති නිසා, රටවැසියාට වුවමනා කරන ආහාර ප්‍රමාණය ලබා ගන්ට බැරි වෙනවා. එයින් වන්නේ ඒ රටවැසියන්ගේ ශක්තිය පිරිහීමයි ; ශ්‍රමය අඩු වීමයි. ශ්‍රමය අඩු වන විට මේ රටේ භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ප්‍රමාණයත් අඩු වෙනවා.

පාඨශාලා ශිෂ්‍යයකුට අවුන්ස දෙකක ප්‍රමාණයක් ඇති බනිස් ගෙඩියක් දැන් දෙනවා. මේ අනුව ලක්ෂ ගණනක් පාඨශාලා ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට මේ බනිස් ලැබෙනවා. නමුත් සීනි මිළ වැඩි වුණු නිසා මේ බනිස් රසවත් කිරීම සඳහා දවටන සීනි ප්‍රමාණය අඩු වී තිබෙනවා. ඒ අනුනුත් බලන විට දරුවන්ට ලැබෙන ආහාර කොටසක් අඩුවුණා. මේ ඊයෙ පෙරේදා පාඨශාලාවලට බනිස් සපයන අයට අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් නිවේදනයක් ලැබී තිබෙනවා. මොකක්ද ඒ නිවේදනය ? මීට පසු "කෙයාර්" පිටි ලබා ගැනීමට අමාරු විය හැකි නිසා බනිස් ගෙඩියකට සත පහ බැගින් දෙනවා කියලයි, ඒ නිවේදනය යවා තිබෙන්නේ. දැනට ගෙවන්නේ සත දෙකහමාරයි. පිටි සපයමින් සත දෙකහමාරක් දෙන නමුත් මින් මත්තට පිටි නොසපයා සත පහක් දෙන බව බනිස් සපයන සමිති සමාගම් ආදියට දන්වා තිබෙනවා. සමුපකාරවලට කියා තිබෙනව පිටි හොයා ගන්න අමාරුයි කියල. සත 5 ගණනෙ බනිස් ගන්න බලාපොරොත්තු වුණහම මොකද වෙන්නෙ ? මේ පිටි ඉදිරි කාලයේදී ලබා ගන්න බැරි නම් හොර කඩෙන්වත් ගන්න ලෑස්ති වෙන්න කියන එකයි ප්‍රකාශ කරන්නෙ.

මා අදත් ගියා මගේ ප්‍රදේශයේ කොට්ටාවෙ පාසැල්වලට. පාසැල්වලට දවසකට බනිස් දහ දාහක් විතර සපයන විවිධ සේවා සමුපකාරයක් එහි තිබෙනවා. අද සවස 2.45 ට විතර එම සමුපකාරයේ මූලික පිරිස මා සමග කිව්ව "කෙයාර්" පිටි ලබා ගන්න අමාරුයි කියල. දැන් මේ අයගෙ කල්පනාව මෙතෙක් දුන්නු සත දෙකහමාරට තවත් සත දෙකහමාරක් වැඩි කර දීල සත පහ ගණනෙ බනිස් සපයන්න නියම කරන්නයි. අර කව්විය කිව්ව සත පහට බනිස් සපයන්න අමාරුයි කියල. වැඩ බලන ගරු ඇමතිතුමාගෙන් මා අහනවා එවැනි නියෝගයක් යවල තියෙනවද කියල.

පාසැල්වලට බනිස් සපයන විවිධ සේවා සමුපකාර වැනි ආයතනවලට මින් මත්තට "කෙයාර්" පිටි ලබා ගන්න බැහැ. මේ කාරණය කෙළින්ම ප්‍රකාශ කරනවා නම් කියන්න තියෙන්නෙ "මින් මතුවට පාසැල්වලට බනිස් දෙන්නෙ නැහැ, පිටි සොයා ගන්න බැරි නිසා" කියලයි. ඒකයි පෙනෙන්නෙ. අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙ පාසැල්වලට විවිධ සේවා සමුපකාර සමිති මගින් දෙන බනිස් ගෙඩියට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.]

පිටි ටික ලබා ගන්න අමාරුයි. බනිස් හදන්න පිටි හොයා ගන්න කියනව, තව සත දෙකහමාරක් වැඩිය දෙන්නම් කියල. කොහෙන්ද හොයාගන්නෙ? මා අද ගියා බනිස් දහ දාහක් විතර දවසකට සපයන විවිධ සේවා සමුපකාර සමිතියකට. ඒ අය කියන අදහස මම දැන් ප්‍රකාශ කළා.

අද දවසේ විවිධ සේවා සමුපකාර සමිති මගින් බනිස් සපයනත් ඒවාට තව මාසයකින් මුදල් ගෙවල නැහැ. රුපියල් දාහතර දහසක් දෙන්න තියෙනව, එක විවිධ සේවා සමුපකාරයකට. මෙහෙම කරන කොට කොහොමද විවිධ සේවා සමුපකාර සමිති දියුණු වෙන්නෙ? කොච්චාවෙ විවිධ සේවා සමුපකාර සමිතියටයි .රුපියල් දාහතර දහක් ගෙවන්න තියෙන්නෙ. පිටි හොයා ගෙන සත පහ ගණනෙ බනිස් සපයන්න ගියොත් ඒ මුද්ල් ලැබෙයිද? විවිධ සේවා සමුපකාර සමිති මගින් ගෙනියන ව්‍යාපාර යත් නැති කරන්නටයි, මෙම අඩිය අර ගෙන තියෙන්නෙ. ජනතාවට වැඩදායක ආයතන වශයෙන් විවිධ සේවා සමුපකාර සමිති ලබා තිඹෙන දියුණුව නැති කිරීමේ වැඩ පිළිවෙළක් මේක. දෙන්න තියෙන මුදල් වහාම දෙන්න කියල මම කියනවා. ඒවා පවුත්වාගෙන යන්න පුළුවන් වන්නෙ එසේ කළ විටයි.

කිරි සැපයීමත් එහෙමමයි. අද දවසේ කිරි මධ්‍යස්ථානවලට සපයන කිරි මිත් මත්තට නැති වෙයි. මිත් මත්තට අළුත් කිරි මධ්‍යසථාන රටේ විවෘත කරන්නෙ නැහැ කියල සෞඛ්‍ය අංශයෙන් පැහැදිලි කොට ප්‍රකාශ කලා, ඊයේ පෙරේදා.

කථානායකතුමනි, පෙනෙනවා නේද තමුන්නාන්සෙට, පාඨශාලාවලට යන ශිෂ්‍යයන්ට බනිස් ගෙඩියක් දෙන්නටත්, ගම්බදව කිරි මධ්‍යසථාන ඇරල කුඩා ළමයින්ට කිරි ටික දීමටත් වැඩ පිළිවෙළ සකස් කරගෙන ආවා. ඒකත් ඉවර කරන්න පහර ගහගෙන යනවා. අනාගතයේදී මේ රට ගෙන යන්නට හැදෙන පරම්පරාවට පාර ගැහීමෙන්, මුළු රටේම අනාගතය අඳුරු කිරීමේ වැඩ පිළිවෙළකුයි, ඇමතිවරු ගෙන යන්නෙ. කොහොමද මේවා සිද්ධ වන්නෙ? ඇමතිවරු රටින් රටට සංචාරය කරනවා. පිටි ටික ගෙනෙන්න ඇමති, හාල් ටික ගෙනෙන්න ඇමති, සීනි ටික ගෙනෙන්න ඇමති, කරවල ටික ගෙනෙන්න ඇමති රටින් රටට සංචාරය කරනවා, වැඩ බලන ගරු ඇමතිතුමා නම් එසේ පිට රට ගමන් නොකරන නිසයි, මම මේ කියන්නෙ. ඒ රටවල් එක්ක ඇති කර ගන්න කොන්ත්‍රාත් එකෙන් කොච්චර "කට්" එක තුබුනද කියලයි, මම කෙළින්ම අහන්නෙ. වැඩ බලන ඇමතිතුමා ගැන මම හොඳට දන්නවා. එතුමා ශතයක් වංචා කරන්නෙ නැති, අවංක කෙනෙක් බව මම දන්නවා. කාරණා, නොතේරුනත් එතුමා අවංක කෙනකු බව මම දන්නවා. අවුරුදු ගණනක් තිස්සෙ මේක සිද්ධ වෙනවා. තමුන්නාන්සෙලාගේ මැති ඇමතිවරු අද රටට මහා විපතක් වෙලා තියෙනවා. කොහොමද මේ විපතෙන් බේරෙන්නෙ? දැන් අමාරුයි බේරෙන්න.

ගරු කථානායකතුමනි, මම දැන් කිව්වා කුඩා දරුවන් ගැන, පාඨශාලාවලට යන ශිෂ්‍යයන් ගැන. ඔවුන්ට ශක්තියක් ලබා ගන්න තිබුණු ආහාරය නැති කිරීම ගැනයි කිව්වේ. පිටි මිළ නැගලලු. පසුගිය කාලයේ ගිවිසුම් ඇති කර ගන්නට පස්සෙ පිටි ටොන් එක පවුම් කීයක් නැගලද?

**ගරු ඩී. එස්. ගුණසේකර**
*(கௌரவ டீ. எஸ். குணசேக்கர)*
(The Hon. D. S. Goonasekera)
පවුම් දෙකයි.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)
මීට පෙර තිබුණු ගිවිසුම් අනුව දුන්න මිළට වඩා දැන් පිටි ටොන් එක පවුම් දෙකකින් නැගලා තියෙනවා. ඒකෙන් මොකද සිද්ධ වෙන්නෙ? ඒ වැඩි වන මිළ තමුන්නාන්සෙලා සොයන්න ඕනැ. ප්‍රයිස් fප්ලක්ෂුයේෂන්වලට රුපියල් 2,10,00,000 ක්. ඔව්, මේ භාණ්ඩ රටට ගෙන්වීමේදී මිළ ඉහළ පහළ යාම නිසා ඇති වන අවාසිය පිරවීමට රුපියල් 2,10,00,000 ක්.

**ගරු ඩී. එස්. ගුණසේකර**
*(கௌரவ டீ. எஸ். குணசேக்கர)*
(The Hon. D. S. Goonasekera)
1,08,00,000 යි.

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

වෙන්න බෑ. තමුන්නාන්සෙ මුලින් කිව්වේ දෙකෝටි දහ ලක්ෂයය කියායි, මට මතක. කොහොමද ඒ අවාසිය වෙන්නෙ? මේ රට බංකොලොත්ය කියා ලෝකයට ප්‍රසිඩ වේගන යනවා. ඒකෙන් අපට වැදුනේ මරු පහරක්. එවැනි තත්ත්වයේ සිටින අයට වෙළඳපොළේ බඩු දෙන්නෙ මිළ වැඩි කරලයි. "අපේ රට බංකොලොත් වෙලාය" කියා ප්‍රසිද්ධ කිරීමෙන් පසුවයි බඩු ගන්න වෙළඳ පොළට ගියේ; ගිවිසුම් ඇති කරගන්න ගියේ. මුදල් අතින් අමාරු තත්ත්වයක සිටින තැනැත්තෙක් හෙට්ටියෙක් ළඟට ගියාම, මුදල් හදිසියෙන්ම වුවමනා බව හෙට්ටිය දැනගත්තාම, සියයට විස්සෙ පොළිය තිස්පහ දක්වා ඉහළ නංවනවා. කල් වේලා ඇතිව රටට අවශ්‍ය බඩුබාහිරා දිය ලබාගන්න කටයුතු නොයෙදුව නිසා නේද, මේ තත්ත්වයට මුහුණ පාන්න සිද්ධ වුණේ? නහයෙන් එහාට කල්පනා කරන්න ශක්තියක් නැති උදවිය රටේ පාලනය ගෙන යන විට සිදු වන්නෙ මෙවැනි දේ තමයි. මේවා නිසා සිදු වන්නෙ මහජනයා මත වැඩි වැඩියෙන් බදු බර පැටවීමයි. පිටි ගිවිසුම කල් වේලා ඇතිව සකස් කර නොගත්තෙ ඇයි? මේ රටට පිටි වුවමනා බව ඇමතිවරු දැනගෙන සිටියෙ නැද්ද? වර්ෂයකට මෙපමණ ප්‍රමාණයක් වුවමනා කරනවාය කියා වාර්තා වලින් සොයා ගන්න බැරිද? නැහැ, අපේ ඇමතිවරු එහෙම කටයුතු කරන්නෙ නැහැ. ඒ අයට කෙලින්ම ඒ රටවලට යන්න ඕනෑ. බ්‍රෝකර්ගේ "කට්" එක කීයද, ඊට පසුව යන තැනැත්තාගෙ "කට්" එක කීයද, යනාදි විස්තර සොයා බැලීමෙන් පසුවයි මේ ගිවිසුම් අත්සන් කරන්න යන්නෙ. ඇයි මහජන චීනයට ඇමතිතුමාට යන්න තිබෙන හේතුව?

**ජයසිංහ මයා.**
*(திரு. ஜயசிங்ஹ)*
(Mr. Jayasinghe)

පදම අනු වෙන කල් බලාගෙන ඉන්නවා.

පරිපූරක මුදල්

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

ළඟදී මහජන චීනයෙන් නියෝජිත පිරිසක් ආවා නොවේද මේ කාරණා පිළිබඳව සාකච්ඡා කොට ගිවිසුමක් පිළියෙළ කර ගන්න?

**ගරු ඩී. එස්. ගුණසේකර**
*(கௌரவ டீ. எஸ். குணசேக்கர)*
(The Hon. D. S. Goonasekera)

උත්සවයකටත් සහභාගි වෙන්න තිබෙන නිසයි ගියේ.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

අපිත් බොහොම සතුටුයි මහජන චීනයත් සමඟ තිබෙන මිත්‍රත්වය තව තවත් දියුණු කර ගන්නවාට. ඔක්තෝබර් 1 වන දින ඔක්තෝබර් විප්ලවය සිහිපත් කිරීමේ උත්සවයට සාභාගි වෙන්නටද ගියේ? [බාධා කිරීමක්] ඇයි මෙහිදිත් එම උත්සවයට සහභාගි වන්න පුළුවන්කම තිබුණානෙ? ඇයි ගරු කථානායකතුමනි, තමුන්නාන්සේට මෙන්ම අප සියලු දෙනාටමත් මෙහි පවත්වන උත්සවයට සහභාගිවෙන්න කියා ආරාධනා පත් ලැබී තිබෙනවා නේද? හොඳයි, හාල් පිළිබඳ ගිවිසුමක් ඇති කර ගන්නනෙ චීනයට ගියෙ. බුරුමයෙන් අපට හාල් කොපමණ ලැබෙනවාද කියා තමුන්නාන්සෙට කියන්න පුළුවන්ද? තමුන්නාන්සේලා 50,000ක් බලාපොරොත්තු වුනාලු. නමුත් ලැබෙන්නේ කොපමණද?

**හමීඩ් මයා.**
*(ஜனாப் ஹமீத்)*
(Mr. Hameed)

There is no quorum, Sir.

මන්ත්‍රී මණ්ඩලය ගණන් කොට, ගණපූරණයක් නොමැති වූයෙන් බෙදුම් සීනු ශබ්ද කිරීමට නියෝග කරන ලදී.

පසුව ගණපූරණයක් තුබූයෙන්—

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

මීට පෙර බුරුමයෙන් හාල් ටොන් කොපමණ ගෙනාවාද? ඒ ගණන දැන් ලැබෙන්නේ නැහැ. ටොන් 50,000 ක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.]
ගන්න නේද, ගියේ ? නමුත් ලැබුනේ නැහැ නේද ? මාස හත අටක් අවුරුද්දක් එහාට කල්පනා කර නොවෙයි, ඇමතිවරු වැඩ කරන්නේ. මතු කාලයට මෙපමණ හාල් වුවමනායයි ඇමතිතුමා දැනගත යුතුයි. පස්වන ප්‍රමාණයට ඉගෙන ගත් සුළු කඩකාරයෙක් වුවත් දන්නවා තමන්ගේ වෙළඳාමේ හැටියට ඉදිරි කාලයට කොපමණ බඩු වුවමනාද කියා ; තමන්ගේ කඩේට කොපමණ කරවල වුවමනාද, කොපමණ සීනි වුවමනාද, කොපමණ තේකොළ වුවමනාද කියා. තමන්ගේ බඩු ප්‍රමාණය අවසන් වෙන්නත් පෙර ඔහු තව ගෙන වුත් තබා ගන්නවා. නමුත් රටේ වගකිය යුතු ඇමතිවරු රටට වුවමනා ආහාර ප්‍රමාණය මෙපමණයයි ගණන් බලා, තිබෙන ප්‍රමාණය අවසන් වෙන්න කලින් තවත් ගෙනවුත් තැබීමට කල්පනා කරන්නෙ නැහැ. රට මේ ප්‍රපාතයට දැමීම ගැන මුළු කැබිනට් මණ්ඩලයම වගකිය යුතුයි. ලබන අවුරුද්දේ මොකක්ද වෙන්න යන්නෙ ? තමුන්නාන්සේලා ඔය පුටුවල ඉන්නද යන්නේ ? මට පේන හැටියට නම් මහජනයා තමුන්නාන්සේලාගේ කන් කෙටියෙන් අල්ලා දොට්ට දමාවි, ඔවුන්ට බඩගිනි වෙන විට ; ඔවුන්ට වුවමනා හාල්, සීනි, පිටි ආදී ආහාර ද්‍රව්‍ය නොසපයන විට. කිසිම දෙයක් බලන්නෙ නැතුව සැලැස්මක් පිළියෙල කරන්නේ නැතුව මේ රට භයානක තත්ත්වයකට පත් කළා.

**ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பீ. ஆர். குணவர்தன)*
(Mr. D. P. R. Gunawardena)
බතල හිටවනවා.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)
ඔහොම කරගෙන ගියොත් ඉදිරියට ජනතාව කන් කෙටියෙන් අල්ලල දොට්ට දමාවි.

**ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பீ. ஆர். குணவர்தன)*
(Mr. D. P. R. Gunawardena)
රත්මලානෙ බතල හිටවන්න ඕනැ.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)
බතල හිටවලා හරියන්නෙ නැහැ.

**ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பீ. ஆர். குணவர்தன)*
(Mr. D. P. R. Gunawardena)
කටින් බතල කොළ හිටවන එකයි කරන්නෙ.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)
රටට වුවමනා කරන දේවල් ගැන සැලකිල්ලක් දක්වන්නෙ නැහැ. ඒවා ඔක්කොම පැත්තකට දමනවා. මේ රටේ ඉදිරියට කලකෝලහල ඇති වෙන්ට ඉඩ තියෙනවා. ආහාර ප්‍රශ්නය නිසා ඉදිරි කාලෙ මේ රටේ කලකෝලාහල ඇති වුණොත් තමුන්නාන්සෙලා වගකියන්ට ඕනැ. එවැනි තත්ත්වයක් ඇති වේය කියන බලාපොරොත්තුවක් තිබෙන නිසා තමයි සමහර උදවිය විදේශීය බැංකුවල කොමිස් මුදල් තැන්පත් කරන්නෙ.

**ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பீ. ஆர். குணவர்தன)*
(Mr. D. P. R. Gunawardena)
ජර්මනියට යනවද දන්නෙත් නැහැ.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)
අද රට ගෙන යන හැටියෙන් අපට පෙනෙනවා අභ්‍යන්තර පාලනය කොහොමද කියන එක. ගරු ඇමතිතුමා පිට වී යනවා. ඇයි දුවන්නෙ ? බතල හිටවන්ටද යන්නෙ ? කරුණාකර ටිකක් ඉන්න.

**ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பீ. ஆர். குணவர்தன)*
(Mr. D. P. R. Gunawardena)
කටින් බතල කොළ හිටවනවා.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)
අද "දවස" පත්තරේ බලන්න. මොකක්ද තියෙන්නෙ ? ලංකාවට හාමතේ ඒවි වෙයි කියල තියෙනවා ඒ පත්තරේ.

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

**එල්. ද එස්. ඒ. ගුණසේකර මයා.** (කලවාන)
*(திரு. எல். டி எஸ். ஏ. குணசேக்கர—களவான)*
(Mr. L. de S. A. Gunasekera—Kalawana)

පච පත්‍රයක් ඒක.

**වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. ඩී. ද සිල්වා**
*(டொக்டர் டப்ளியு. டீ. டி சில்வா)*
(Dr. W. D. de Silva)

පච නොවෙයි. ඒක ආණ්ඩුවෙ පත්තරේ. උඹ හරි මිනිහෙක්නෙ බන්.

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)

Order, please ! කරුණා කර පිළිගරුක වන්න.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

අපට දන් හොඳට මේවා පෙනෙනවා. පත්තරේ වාර්තාවක් දන්ට වුවමනා නැහැ. තමුන්නාන්සෙලාගේ අදූරදර්ශි වැඩ පිළිවෙළ, ක්‍රියා පටිපාටිය නිසා මොකක්ද වෙන්ට යන්නෙ ? නාහෙන් එහාට පෙනෙන්නෙ නැතුව, බලන්නෙත් නැතුව වැඩ කරන පිළිවෙළේ වැරද්ද නිසා ලංකාවේ ජනතාවට හාමතේ ඉන්ට වේදෝ කියන එක ගැන හිතන්ට ඕනෑ. මේ විධියට ගියොත් ඒක වෙනවා. බතල කොළ හිට වලාවත් මයියොක්කා කොළ හිටවලාවත් හරියන්නෙ නැහැ. ඉස්සරවෙලා ඒ ටික වත් කළා නම් එයින්වත් යම් ප්‍රයෝජන යක් ලැබෙන්ට තිබුණා. දන් අමාරුව මුළු ලංකාවටම නේද ?

වී මිළයට ගැනීම සම්බන්ධයෙන් ගෙන යන වැඩ පිළිවෙළ මොකක්ද ? වී වෙනු වෙන් මෙපමණ මුදලක් ඕනෑය කියා දන ගන්ට ඕනෑ. කොහොමද වී නිෂ්පාදනය කළේ කියා දන ගන්ට ඕනෑ. වී නිෂ්පාද නය කිරීමට ලෑස්ති කරගත් කුඹුරු ටිකෙනුත් හුඟක් හරිය අද රදල බලය නිසා පුරන් වෙලයි තියෙන්නෙ. ගොවි ජනතාව ලවා කුඹුරු පනත මගින් රටේ කුඹුරු ටික නියම විධියට අස්වද්දන්ට සැලැස්මක් ඇති කළා. ඒකට මොකද වුණේ ? ඒකෙ මූලික හතුරෝ අර ඉස්සරහ පෙළේ ඉඳගෙන ඉන්නවා. ඉතින් කොහොමද ඒක ගෙන යන්නෙ ? ඒකෙ මාරයෝ නේද අර ඉන්නෙ ?

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)

ඔය කරුණු මීට අදාළ නැහැ. කරුණාකර මාතෘකාවට අදාළව කථා කරන්න.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

කුඹුරු නැතුව රට ඇතුළේ වී ගන්ට පුළුවන්ද ? පොල් ගහෙන්ද වී ගන්නෙ ? අර පරණ මිනිහෙක් තණ කොළ කපන්ට කොහෙද ගියා වගේ පොල් ගහෙන්ද වී ටික ගන්නෙ ? කුඹුරෙන් නොවෙයිද ?

**ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பீ. ஆர். குணவர்தன)*
(Mr. D. P. R. Gunawardena)

කටින් බතල කොළ හිටවනව විතරයි.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

ඒ මූලික කුඹුරු පනත ක්‍රියාවේ යොද වන්නට නොදී මේ මාරයෝ ඉඳගෙන ඒක නැවා.

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)

ඒක එන්නෙ කෘෂිකර්ම අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

මේකටත් අදාළයි. එකින් එකට කියන්න ඕනෑ. අපි රටට යන්න ඕනෑ නේද ? මේවා නොකියා ඉන්නද තමුන්නාන්සෙ කියන්නෙ ? මේවා අවශ්‍යයි. මම ටිකක් හයියෙන් කථා කළාට අමුත්තක් වන්නේ නෑ. අද තිබෙන තත්ත්වය කියා දෙන්නට ඕනෑ. මේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.]

ඉස්සරහ පෙළේ සිටින ඇමතිවරු තමයි කුඹුරු පනතේ මාරයෝ. විදේශීය ආහාර ද්‍රව්‍ය ගෙන්වීමට මාර්ගය පාදා ගැනීමටයි එසේ කළේ. මේ රටේ නිෂ්පාදනය අඩු කර විදේශීය සංචාර මඟින් ජාවාරම් ගහගෙන, විදේශීය බැංකුවල මුදල් තැන්පත් කර ගැනීමට වැඩ පිළිවෙලක් සකස් කර ගැනීමටයි එසේ කළේ. එය හොඳටම පැහැදිලියි. මේ රටේ තිබෙන කුඹුරු අක්කර දොළොස් ලක්ෂය යල මහ දෙක වැඩ කරන්නට වී ඒවායින් උපදින වී අස්වැන්න ප්‍රමාණය දෙගුණ කළොත් අපි කොහොටවත් යන්න ඕනෑ නෑ. ඒ බව අපි පැහැදිලි වශයෙන් රටට පෙන්වා දුන්නා. නමුත් මේ ඉස්සරහ පෙළේ ඉන්න මාරයෝ ටික ඒක අහෝසි කළා. මූලිකයා සභානායක. ඊළඟට කිව යුතු නම කියන්නෙ නැහැ ; කුඹුරට බහින විට නම් කියන්නෙ "අම්බරුවා'' කියල.

**ගරු මෛත්‍රීපාල සේනානායක**
*(கௌரவ மைத்திரிபால சேனநாயக்க)*
(The Hon. Maithripala Senanayeke)
කට විතරයි.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)
ඒ කටයුත්ත සඳහාවත් තමුන්නාන්සෙ අඩියක් ගත්තා නම් වී බුසලක් දෙකක් වැඩි කර ගන්න තිබුණා. නමුත් මේ කුඹුරු පනතේ මාරයෝ වශයෙන් ඉඳගෙන රට ඇතුළේ වී ටික සපයන්නේ කොහොමද ? අපි මේක කිව්වා. මේ තත්ත්වය එනවා කියා මම කිව්වා. කථානායකතුමනි, ගණපූරණයක් නැහැ කියනවා.

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)
කවුද කියන්නෙ ?

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)
මට කථා කරන්න නම් පුළුවනි. නමුත් මේකෙ යම්කිසි වැඩ පිළිවෙලක් තිබෙනවා. ස්ථාවර නියෝග අනුව යම් යම් වරප්‍රසාද තිබෙනවා.

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)
මට ඇහුනෙ නැහැ.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)
බොහොම හොඳයි ; තමුන්නාන්සෙ නියම කථානායකවරයෙකු හැටියට කටයුතු කරනවා. ඇසුණු දේ නෑසුණු විධියටත්, දකපු දේ නොදකපු විධියටත්, මෙතන ඉන්න කියනවානෙ. තමුන්නාන්සෙ එය හරියටම පිළිපදිනවා.

ගරු කථානායකතුමනි, මේ රට දියුණු කරන මාර්ග අපි පෙන්වා දුන්නා. පිටිපස්සෙ ඉන්න මන්ත්‍රීවරු බොහෝ දෙනෙක් කෑ ගැහැව්වා.

**හමීඩ් මයා.**
*(ஜனாப் ஹமீத்)*
(Mr. Hameed)
Sir ; there is no Quorum.

මන්ත්‍රී මණ්ඩලය ගණන්කොට, ගණපූරණයක් නොමැති වූයෙන්, බෙදුම් සීනු ශබ්ද කිරීමට නියෝග කරන ලදී.

පසුව ගණපූරණයක් තුබූයෙන්—

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)
මා විස්තර කර ගෙන ගියේ අපේ කුඹුරුවල අස්වැන්න අඩු කිරීමට කටයුතු කරන මාරයන් වගේ සිටින මේ කැබිනට් එක——

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)
ඒ කාරණය සම්බන්ධව කී කරුණු ඇති. දැන් අලුත් කාරණයක් ගැන කියන්න. [බාධා කිරීමක්]——

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)
මගේ ගරුත්වයත් මේ රටේ ජනතාවගේ ගරුත්වයත් රැක ගත යුතු නිසා මේ කරුණු පහදා දීමට මට අයිතියක් තිබෙනවා. මා මේ ගරු සභාවට එවූ ඡන්දදායකයන්ගේත් මේ රටේ ජනතාවගේත් ගරුත්වය රැකගැනීම මගේ යුතුකමක්——

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**වෛද්‍යාචාර්ය නාගනාදන්**
*(டொக்டர் நாகநாதன்)*
(Dr. Naganathan)
Excuse me, Sir. There is no Quorum. You cannot proceed without a Quorum.

මන්ත්‍රී මණ්ඩලය ගණන්කොට, ගණපූරණයක් නොමැති වූයෙන්, බෙදුම් සීනු ශබ්ද කිරීමට නියෝග කරන ලදී.

පසුව ගණපූරණයක් තුබූයෙන්—

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)
ගරු කථානායකතුමනි, ඩෙමරේජ් හෙවත් ප්‍රමාද වන නැව්වලට ගෙවන මුදල් සම්බන්ධවත් කරුණු දක්වීමට මම අදහස් කරනවා.

**වෛද්‍යාචාර්ය නාගනාදන්**
*(டொக்டர் நாகநாதன்)*
(Dr. Naganathan)
There is still no Quorum.

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)
Why do you say so? There is definitely a Quorum.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)
ගරු කථානායකතුමනි, ලංකාවට බඩු ගෙන්වීමේදී, විශෙෂයෙන්ම හාල්, සීනි, පිටි, ආදිය ගෙන්වීමේදී, ඒ ද්‍රව්‍ය නරක් වීම උඩ හෝ ඒ ද්‍රව්‍ය රැගෙන එන නැව් වරායේ ප්‍රමාද කිරීම උඩ විශාල මහජන මුදලක් අපතේ යනවා. ඒ මුදලේ ප්‍රමාණය රුපියල් ලක්ෂ 70ක් යයි මෙහි සඳහන් වී තිබෙනවා. ගරු කථානායකතුමනි, බඩු නරක් වීම නිසා අපතේ යන හා බඩු නොබා වරායේ ප්‍රමාද කරන නැව් වලට ගෙවන මේ රුපියල් ලක්ෂ 70 ක මුදල රජය වියදම් කරන්නේ, මහජනතාව අඳින අර හැට්ට රෙද්දෙන් අය කරගත් ශත පණහ, පොඩි දරුවා අඳින ගවුම් රෙද්දෙන් අය කරන බද්ද, ආදි වශයෙන් එකතු කරන මුදලිනුයි. ගමේ ගොවි පවුලේ ගොවියාටත් ගොවි හාමිනේටත් අඳින්ට සිදු වී තිබෙන්නෙ එක රෙද්දයි. ගොවි මහත්මයා අමුඩය ගහගෙන ඉන්න අවසථා වට ගොවි හාමිනේ කම්බාය ඇඳගෙන යනවා. ගොවි හාමිනේ ගෙදර ආවට පසු දිය රෙද්ද යන්නම් පොරවාගෙනයි, ගොවි රාළට ඇඳගන්ට කම්බාය දී පොළට යවන්නෙ. ඒ දෙපොළගෙන් සරමට නැත්නම් කම්බායට ගන්න ශත 50 බදු වශයෙන් එකතු කරගෙන අද හැත්තෑ ලක්ෂ ගණන් "ඩෙමරේජ්" ගෙවනව. එසේ නැත්නම් ඒක ජාවාරම්කාරයන්ගෙ සාක්කුවලට යව නව. මෙවැනි වැඩ වරායෙ සිදු වන බව මම හොඳ හැටි දන්නව. වරායෙ වැඩ කරන කට්ටිය එක්ක අවුරුදු 25ක විතර කාලයක් කිට්ටු ආශ්‍රයක් ඇතුව සිටි නිසා මා හොඳ හැටි මේව දන්නව.

වරායට එන පිටි නැව එතැන තිබෙනව. අනික් ආහාර නැව එතැන තිබෙනව. නමුත් කොළඹ විශාල කොම්පැනියක ඒජන්ත කෙනෙකුගේ ඒජන්සිය උඩ යම් නැවක් එනව නම් ඒකට කලින් "බර්ත්" එක දෙනව. ඇට්කින් ස්පෙන්ස්ගෙ ඒජන් සිය උඩ නැවක් එනව නම් ඒ නැවට කලින් "බර්ත්" දී නතර කරනව. නිලධාරි යාට විස්කි පෙට්ටිය දෙක දෙන නැත්නම් කැප්ටන් මගින් ජාවාරම දෙන නැවටයි, "ගැං" එක අරින්නෙ බඩු බාන්න. එතැන වැඩ කරන හාබර් සහ ඩොක් කම්කරු සමිතියේ කම්කරුවන් ආහාර ටික බාන්ට ඕනෑය කිව්වට, සීනි ටික බාන්ට ඕනෑය කිව්වට, හාල් ටික බාන්ට ඕනෑය කිව්වට, පිටි ටික බාන්ට ඕනෑය කිව්වට, ඒකට නිලධාරීන්ගෙන් ඉඩ ලැබෙන්නෙ නැහැ. නමුත් ඇට්කින් ස්පෙන්ස්ගෙ විස්කි කේස් ටික බාගන්ට, එහෙම නැත්නම් මෝටර් කාර් ටික බාගන්ට, නැත්නම් මාලිගාවක් හදන්ට ගෙනෙන යකඩ ටික නැත්නම් මැෂින් ටික ඉක්මණින් බාගන්ට තමයි, "ක්‍රේන්" එක අල්ලන්ට කියා අද නිලධාරින්ගෙ ඕඩර් යන්නෙ. ඔය අන්දමට කටයුතු සිදු වන නිසයි, මේ "ඩෙමරේජ්" රුපියල් හැත්තෑ ලක්ෂය ගණන් නගින්නෙ.

අර ගමේ ගොවියාගෙයි, ගොවි හාමිනේගෙයි එක රෙද්දෙන් ගන්න සත 50 නාස්ති කරන්නෙ ඔය විධියටයි. අපි මේ මුදල් ගෙවන්නෙ රටට කන්ට ටික දෙන්ට කියායි කියන්නෙ. තමුන්නාන්සෙල කන්ට දෙන කොට ඒ කට්ටියට අඳින්ටත් නැහැ, ඇටකටු වෙලා මැරිල යයි. මේ ඇවුරුද්ද තුළ තමුන්නාන්සෙල ගෙන ගිය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.]

වැඩ පිළිවෙල ඔය විධියයි. මේක වෙනස් කරන්ට තමුන්නාන්සෙලාට බැහැ. මේ රටට වුවමනා ආහාර ටික සපයාගන්න මුදල් සොයාගන්න තමුන්නාන්සෙලාට බැහැ. තමුන්නාන්සෙලාගේ වැඩ පිළිවෙළ අනුව රටට වුවමනා කරන වී ටික නිෂ්පාදනය කර ගන්ට බැහැ. තමුන්නාන්සේලා නිතරම වැයම් කරන්නේ මේ රටේ සාරය උරා බීම සඳහා මාර්ග පාදා ගන්ට විතරයි. මේ කරුණු අප කලිනුත් කීවා. එදා තමුන්නාන්සේලා වරාය ජනසතු කිරීමට තීරණය කෙළේ කැමැත්තෙන් නොවෙයි. කම්කරුවන්ගේ බල කිරීම නිසා වරාය ජනසතු නොකර බැරි වුණා. කම්කරුවන් එකතු වී බලහත්කාරයෙන් කොළඹ වරාය ජනසතු කෙරෙව්වා. වරාය ජනසතු කළා වාගේම ලංකාවට පිටින් ආහාර ගෙන්වීමත් සම්පූර්ණයෙන්ම ජනසතු කරන ලෙසයි, අප කියන්නේ. එය පැය 24න් කළ හැකියි. ඒ විධියට කළොත් අතන බංගසාංල වීදියේ බඩු ගොඩ ගැහෙන්නේ නැහැ. ඒ විධියට කළොත් එම්. පී. ද සොයිසා උන්නැහේගේ බංගසාල වීදියේ තිබෙන ගබඩාවල කරවල ගොඩ ගැහෙන්නේ නැහැ. එහෙම කළොත් මීගමු පළාතේ තැබෑරුම් ගන්ට සී. ඩබ්ලිව්. ඊ. එකේ මැනේජර්ලාට සල්ලි ටික යන්නේ නැහැ. අද සී. ඩබ්ලිව්. ඊ. එකේ මැනේජර්ලා මීගමු පළාතේ තැබෑරුම් ගන්නවා. මේවා ගැන පරීක්ෂා කරන්ට තමුන්නාන්සේලා ලෑස්තිද? මේවාට යන්නේ මේ රටේ මහජන මුදල්. එක එක මිනිහාගේ නමින් ටෙන්ඩර් දමා ලක්ෂ ගණන් වියදම් කොට තැබෑරුම් ගන්නවා. ඇමතිතුමා මේවා ගැන ටිකක් සොයා බලන්න ඕනෑ. වැඩ බලන ඇමතිතුමා නම් මත්පැන් පානයට විරුද්ධයි. ඒ වගේම එතුමා පෝය දිනවලදී අටසිල් සමාදන් වෙනවා. සමහර විට දසසිලුත් සමාදන් වෙනවා. ඒ ගැන මා බොහොම සතුටුයි. නමුත් එතුමත් කැබිනට් මණ්ඩලයේ අනික් අය මැදට වැටී සිටීමෙන් මොන මොන දේ එතුමාගේ කරේ වැටේද කියා කියන්ට මා නම් දන්නේ නැහැ. නාස්ති කිරීම් ගැන මා කීවා. නාස්තිය දැන් හැත්තෑ ලක්ෂයකට නැඟලා. මේවා කාගේ සල්ලිද? තමුන්නාන්සේලාගේ ගෙවලින් ගෙනාපු සල්ලි නොවෙයි. මේවා මහජනයාගේ බදු මුදල්.

ගරු කථානායකතුමනි, මේ පාලන කාලයේදී බඩුමුට්ටුවල මිළ කොතරම් ඉහළ ගියාද කියන එක තමුන්නාන්සේ දන්නවා ඇති. පිටි ජාවාරම් පිළිබඳ ගිවිසුම් ගැන සාකච්ඡා කිරීමට කී දෙනකු හවුල් වුණාද? අපට ඒ අයගේ නම් ඕනෑ. පිටි ටොන් එකක මිළ පවුම් දෙකකින් නැඟලායයි කියන්ට යෙදුණා.

**ගරු ඩී. එස්. ගුණසේකර**
*(கௌரவ டீ. எஸ். குணசேக்கர)*
(The Hon. D. S. Goonasekera)
බලාපොරොත්තු වුණු ගණනට වඩා.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)
කවුද බලාපොරොත්තු වුණේ? ඒ පවුම් දෙක නැඟීම උඩ අද වුවමනා තරම් පිටි ගන්ට බැහැ. පිටි ගෙනෙන්නේ නැහැ. පාඨශාලා ශිෂ්‍යයන්ගේ බනිස්වලටත් පිටි නැති වන බව මා කලින් පහදා දුන්නා.

මා ඔය කරුණු තුන හතර පෙන්නුවේ තමුන්නාන්සෙට තත්ත්වය අවබෝධ කර දෙන්නටයි. මා වැඩ බලන ගරු ඇමතිතුමාගෙන් අහනවා, අද ලංකාවෙ ගබඩාවල හාල් ටොන් කොපමණ තිබෙනවාද කියා. වැඩ බලන ගරු ඇමතිතුමනි, ලංකාවෙ ගබඩාවල හාල් කොච්චර තියෙනවද? හාල් නැති නම් අපි රටට කියන්න ඕනෑ, බතල ටිකක් වත් හිටවා ගන්න කියල. ඇමතිවරු කිව්වට හිටවා ගන්නෙ නැහැ. මඤ්ඤොක්ක පඳුරු ටිකක්වත් හිටවා ගන්න අපි ජනතාවට කියන්න ඕනෑ. ගබඩාවල කොච්චර කලකට සෑහෙන්න හාල් තියෙනවද? මම අහන්නෙ "ස්ටොක්" එකේ හාල් කොච්චර තියෙනවද කියලයි. තමුන්නාන්සෙට උත්තරයක් දෙන්න පුළුවන්ද?

**ගරු ඩී. එස්. ගුණසේකර**
*(கௌரவ டீ. எஸ். குணசேக்கர)*
(The Hon. D. S. Goonasekera)
මාස ගණනකට සෑහෙන්න තියෙනවා.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)
කී මාසෙකටද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු ඩී. එස්. ගුණසේකර**
*(கௌரவ டீ. எஸ். குணசேக்கர)*
(The Hon. D. S. Goonasekera)
හරියටම කියන්න බැහැ.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)
ටිකක් පරීක්‍ෂා කරල බලන්න.

**ගරු ඩී. එස්. ගුණසේකර**
*(கௌரவ டீ. எஸ். குணசேக்கர)*
(The Hon. D. S. Goonasekera)
බලන්නම්.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)
පසුගිය දවස්වල ඇමතිතුමා එක තැනක් පරීක්‍ෂා කරන්න ගියා. එදා පිටි ගොඩක දණට එරුණ මතක නේද? එවැනි අවසථා වන්හිදී "ඩෙමරේජ්" වලට කොච්චර වැය වෙලා තියෙනවාද? ඒ විධියෙ දේවල් කන්න රට ලෑස්ති නැහැ. නාහෙට එහා කල්පනා නොකරන මැති ඇමතිවරුන්ගෙ වැඩ නිසා කොයි තරම් අවශ්‍ය කරන ආහාර ආදිය නාස්ති වෙලා ගිහින් තියෙනවද? [බාධා කිරීමක්] තමුන්නාන්සෙටත් ඊයෙ ඉඳල මෙතන ඉඳගෙන ඉන්න අමාරු ඇති. අපේ වැරදි නිසා නොවෙයි, තමුන්නාන්සෙලාගෙ වැරදි නිසයි, මේව වෙන්නෙ.

බලන්න, අපරාධ විධියට මේ අංශයේ මුදල් නාස්ති වෙන අන්දම. ඊයෙ පෙරේද වත්තල කිට්ටුව හතේ කණුව ළඟ හදල තියෙනව කරවල ගබඩා වගයක්. ජන ගහනය අධික ඒ ප්‍රදේශයේ ගබඩා හැදුවෙ කරවල තැන්පත් කරන්නයි. ඒ ප්‍රදේශයේ හැම තැනම ගෙවල් තිබෙනවා. දහස් ගණන් වාසය කරනවා. දැන් ඒ ප්‍රදේශයේ වාසය කරන්න බැහැ කුණු කරවලවලට එන නිල මැස්සන් නිසා. ගබඩාවලට කුණු කරවල ගිහින් දමල, පණුවොත් එක්ක. ඒ පලාතෙම නිල මැස්සො ඉන්නව කියල මිනිස්සු කෑ ගහනවා. කී ලක්‍ෂයක් ගියාද ඒ ගබඩා හදන්න? ඕවා අර කුරුඳුවත්තෙ ගිහිල්ල හදන්න තිබුණා නේද, ජනතාවට කරදර නොකර? සාමාන්‍ය ජනතාව ඉන්නෙ ඒ විධියටයි. ලක්‍ෂ ගණන් වැය කර කුණු කරවල ගබඩා ටිකක් ඒ ප්‍රදේශයේ හදලා දිනපතා කරවල කුණු කර කර ටොන් ගණනින් වළලනවා. එසේ කිරීමෙන් ඒ ප්‍රදේශයේ ජනතාවට වසංගත රෝග සෑදීමටත් මග සැලැස්සුවා. තමුන්නාන්සෙ මීගමු පාරෙ හතේ කනුව ළඟ හදල තියෙන කරවල ගබඩා ගිහින් බැලුවද?

මේ විදියට වැඩ කරන විට ඒ පැත්තෙ මිනිස්සු කිපෙන්න නැද්ද? කිපුනම ගබඩාවලට මොනව වෙයිද දන්නවද? ඒ ප්‍රදේශයේ පරම්පරාගතව එන මනුෂ්‍යයෝ සුළු සුළු ගෙවල් දහස් ගණනකුත්, ලොකු ගෙවල් කීපයකුත්, හදාගෙන පදිංචි වෙලා ඉන්න මැද්දේ මේ ගබඩා ඇරලා කුණු කරවල දමනවා. ඇමතිතුමා ගිහින් බලන්න ඕනෑ. දවසක් අර ගබඩාවකට ගිහින් නරක පිටි ගොඩේ එරුණා වගේ, මේ ගබඩාවට ගියොත් එළියට එන්න බැරි වෙනකන් ඇඟ පුරා නිල මැස්සො වහයි. තමුන්නාන්සෙ නම් යන්න එපා, අනික් අයව අරින්න. ඒ ගොල්ලන්ගෙ ඇගේ නිල මැස්සො වැහුවට කමක් නැහැ. තමුන්නාන්සෙ මේ දූර්වල කාලයේදී ගියොත් තමුන්නාන්සෙට අමාරු වෙයි. තමුන්නාන්සෙට අනුකම්පාව තියෙනවා.

මහජන බැංකුව හදපු හැටි තමුන්නාන්සෙ දන්නවනේ? ඒ බැංකුව ඇමීමට අපි බොහොම සතුටුයි.

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)
මේ වැය ශීර්ෂයට ඒක අදාළ නැහැ.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)
ඒ කරුණ මේකට ටිකක් අදාළ වෙනවා. මේ ගෙන්වන පිටි හාල් ආදිය නරක් වන විට ඒවා වෙන කෑමත් සමග මිශ්‍ර කරල කුකුල් කෑම වශයෙන් දෙනවා. ඒ නිසා සමහර විට මේකටත් සම්බන්ධයි. මේ පාඩු කරන්නෙ බැංකුව බේරා ගන්නද දන්නෙ නැහැ. කුකුළන් හදන්නට මහජන බැංකුවෙන් දහස් ගණන් අරගෙන තියෙනවා; තමුන් ඒ කුකුළන්ට මේ පිටි එහෙම මිශ්‍ර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.]

කරල දීලා ලෙඩක් හැදුනොත් ඒ වසංගතය නැති කරන්ට පුළුවන් කෙසේද කියා අද වන තෙක් පරීක්ෂණ පවත්වා නැහැ. ආහාර අංශයේ වැඩ බලන ඇමතිතුමා විතරයි මෙතන දැන් ඉන්නෙ. තමුන් නාන්සෙගෙන් අපි ඉඳල හිටලා අහන ප්‍රශ්නයකට උත්තරයක් ලබා ගන්නටවත් නිලධාරියෙක් පෙනෙන්න නැහැ. ගබඩාවල පිටරටින් ගෙන්වපු හාල් ටොන් කොච්චර තියෙනවද? ඉතාමත් අවශ්‍ය ප්‍රශ්නයක් මම මේ ඉදිරිපත් කරන්නෙ. තව මාස කීයකට හාල් තියෙනවද? සුමාන දෙකකට හාල් තියෙනවද දන්නෙ නැහැ. ගබඩා හිස් වෙලා බවයි, අපට ආරංචි. එසේ ගබඩාත් හිස් වෙලා නම්, මාසයකට හමාරට නම් හාල් තිබෙන්නෙ, පිටි ගිවිසුමත් හරි ගිහිල්ල නැත්නම්, ටොන් පනස් දාහක් ගන්න ගිය තැනින් ලැබුණේ ටොන් දහ දාහ නම්, ලබන මාස දෙකේ වැඩ කටයුතු කරගෙන යන්නෙ කොහොමද? තව මාස දෙකකටවත් හාල් තියෙනවද?

**ගරු ඩී. එස්. ගුණසේකර**
*(கௌரவ டி. எஸ். குணசேக்கர)*
(The Hon. D. S. Goonasekera)
මාස දෙකකට වඩා හාල් තියෙනවා.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டி. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)
ටොන් කොච්චර තියෙනවද? ඒකයි මම කිව්වේ, විශේෂ නිලධාරි දෙතුන් දෙනකු මෙතන ඉන්න ඕනෑය කියා. ඒ නිලධාරීන් හිටියා නම් උත්තර දෙන්න පුළුවන් වෙයි.

**ගරු ඩී. එස්. ගුණසේකර**
*(கௌரவ டி. எஸ். குணசேக்கர)*
(The Hon. D. S. Goonasekera)
ලබන මාසයේ මැද හරියෙදි නැව් ගණනාවක් එන්න තියෙනවා.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டி. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)
කොහෙන්ද? යූ. ඒ. ආර්. එකටත් ගියා නේද හාල් ගෙනෙන්න? කෝ, යූ. ඒ. ආර්. එකෙන් ටොන් එකක්වත් ලැබුණාද තමුන්නාන්සෙලාට? ඇයි මේ පසුගිය දිනවල ගලගෙදර මන්ත්‍රීතුමාත් (කේ. අබ්දුල් ජබාර් මයා.) ගියා නේද ඒ රටේ සවාරියක් ගහන්න? මෙම මන්ත්‍රීතුමාගේ සංචාරයෙන් ඇති වුණ ප්‍රයෝජනය කුමක්ද? යූ. ඒ. ආර්. එකෙන් හාල් ටොන් එකක්වත් ලබා ගන්න පුළුවන් වුණාද?

බොහෝ මැති ඇමතිවරු රටට නොයෙකුත් බොරු ප්‍රචාරයන් කර රට රටවල සවාරි ගහනවා. මේ යන හැම රට වලම සිටින බ්‍රෝකර්වරුන්ගෙන් තමන්ටත් "කට්" එකක් තබාගෙනයි ගිවිසුම් ඇති කර ගන්නෙ. අපි මේවාට සහමුලින්ම විරුද්ධයි. මේ අන්දමට දූතයින් සහ මැති ඇමතිවරුන් රට රටවල සංචාරය කරන්න යාමෙන් අපට කොපමණ මුදලක් වියදම් වෙනවාද? අප මේවාට පිළිතුරු බලාපොරොත්තු වෙනවා.

මේ සෑම රටකම මේ රටේ තානාපතිවරුන් සිටිනවා. ඇයි ඒ රටවලට යන්න කලින් මෙම තානාපතිවරුන් ගෙන් වෙළඳ වාර්තා සපයාගෙන මෙම ගරු සභාව ඉදිරිපිට නොතැබුවේ? එසේ නැත්නම් ඒ ඒ රටවල අපේ රට වෙනුවෙන් පෙනී සිටින අයගෙන් අපේ රටට අවශ්‍ය ද්‍රව්‍ය සම්බන්ධයෙන් මිළ ගණන් ආදී විස්තර ඇතුළත් වාර්තාවක් ලබාගෙන මෙම ගරු සභාවට ඉදිරිපත් නොකළේ ඇයි? ඒ ඒ රටවල සවාරි ගහන්න කලින් කළ යුතුව තිබුණේ එයයි. මේ සංචාර සම්බන්ධයෙන් කොපමණ මුදල් ප්‍රමාණයක් වියදම් වෙනවාද? ෆේපාරින් එක්ස්චේන්ජ් සම්බන්ධයෙන් නොයෙකුත් නීති රීති පනවා තිබෙන්නෙ අපේ විදේශ ධනය ආරක්ෂා කර ගන්න නොවේද? මේවා සම්බන්ධයෙන් මූලික වශයෙන් කළ යුතුව තිබෙන වැඩ තානාපති කාර්යාල මගින් කරන්නෙ නැතිව මැති ඇමතිවරු ඒ ඒ රටවලට යාමේ අභිරහස කුමක්ද? මෙම වැඩ පිළිවෙලේ විශාල අභිරහසක් තිබෙනවා. අපේ රටට රට ඉදි ගෙන්වා ගැනීමට පිටරටවල් සමග ගිවිසුම් ඇති කර ගත්තා නොවේද? මට මේ ප්‍රශ්නයට කෙළින් පිළිතුරක් ඕනෑ. දැන් මේ රටට ගෙන්වනු ලබන රට ඉදි ගෙන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වන්නෙ කෙළින්ම රජය මඟින්ද එසේ නැත්නම් ජාවාරම්කාරයින් මාර්ගයෙන්ද කියා මා දැනගන්න කැමතියි.

**ගරු ඩී. එස්. ගුණසේකර**
*(கௌரவ டீ. எஸ். குணசேகரா)*
(The Hon. D. S. Goonasekera)

සී. ඩබ්ලිව්. ඊ. එක මාර්ගයෙන්.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

හොඳයි. මේ ඊයේ පෙරේදා තමුන්නාන්සේලා ඕලන්දයෙන් කරවල තොගයක් ගෙනාවා නොවේද? මේ රටේ සාමාන්‍ය ජනතාව අනුභව කරන කරවල වර්ග නොවෙයි. ඒවා සී. ඩබ්ලිව්. ඊ. එකේ අලෙවි වෙනවාද? අලෙවි නොවන ඒවා ගබඩාවට ගෙනගිහින් වළ ලනවා නොවෙද? ටින් මාළු, ටුනා මාළු ආදියෙන් කොපමණ නැති වෙනවාද? කොම්පැනිකාරයින් නිසා කොපමණ වංචා ඇති වෙනවාද? ශත 35 ගණනේ කොන්ත්‍රාත් අරගෙන ශත 55 ට නැති නම් 70 ට මෙහි විකුණන්නේ. එක රාත්තලකින් ශත 20 ක් ජාවාරම්කාරයින්ට ගන්න ඉඩ දී තිබෙනවා. විදේශීය කොටස් සමඟ එකතු වී සිටින සවදේශීය කොටස් තමයි, මේවා කරන්නේ. ඇයි, මේවා ගැන පරීක්ෂා කර බලා ලක්ෂ ගණන් නැති වන විදේශීය හුවමාරු මුදල් නතර කරගැනීමට මාර්ග නොයොදන්නේ? සුළු දේ ගැන නම් තමුන්නාන්සේලා බලාවි. අතුගාල අහක දමන සීනි රාත්තලක් දෙකක් කම්කරුවෙක් ගෙන ගියොත් ඒ තැනැත්තා රක්ෂාවෙනුත් නෙරපන්න නම් කටයුතු යොදාවි. නමුත් මිටි ගණන් බොරු රිසිට් ලියා නිලධාරීන් විසින් යවන ඒවා ගැන සොයා බලා නියම දඬුවම් දීමට තමුන්නාන්සේලා ලැස්ති නැහැ. මන්ද? ඒ ස්ථාන වල යාළු මිත්‍රයින් තබාගෙන වැඩ කරන නිසයි. එතැන එක්කෙනා දෙන්නා ගැන ටිකක් එළිදරව් වෙන කොට ඈතට තල්ලු කරනවා. දන් ඒ තැනැත්තා ඒ ධුරයේ නැත, ඒ නිසා පස්සේ එළවන්නේ නැතැයි කියනවා. වංචාකාරයින් පගාකාරයින් අල්ලා ගැනීමට තමුන්නාන්සෙලා පණතක් ගෙනෙනවායයි කිව්වා. නමුත් අපි එය තවමත් දැක්කේ නැහැ. රජයේ භාණ්ඩ මේ විධියට තොග ගණනේ යන නමුත් ඒවා අල්ලාගැනීමට තමුන්නාන්සේලා ලැස්ති නැහැ. ගරු ඇමතිතුමා මේ සභා ගර්භයෙන් පිටදී මුණ ගැහුනම නම් කියන්නෙ මෙහෙම බැහැ, මීට වඩා බලවත් නීතියක් වුවමනා කරනවා යනාදි වශයෙනුයි. තවත් බොහොම තදින් කථා කරනවා. පැය 24 න් නීතියක් ගෙනෙන්න ඕනෑය කියලත් එතුමා කියනවා. හැබැයි, ඇතුළට ඇවිත් අර ඇමති පුටුවෙ ඉඳගෙනත් ඒකම කියනවාද? එහෙම කියන්නෙ නැහැ. ඈතින් ඉන්නකොට නම් කියනවා බොහොම ඉහළින්. මහජනයාගේ බඩු භාණ්ඩ—හාල්මිටි, සීනිමිටි, පිටිමිටි ආදිය තොග ගණන් ඔය ගබඩාවලින් ඇතැම් අවස්ථාවලදී පිට වූ බව ගරු ඇමතිතුමා හොඳට දන්නවා. ඒවට අනුබල දෙන උදවිය වැඩියි. ඔවුන් ඇල්ලීම පිණිස වහාම පනතක් ගෙනත් පැය 24 න් ක්‍රියා කරන්ට ලැස්තියි කියන්නෙ පිටදීයි. ඒක පාස් කරනවා නම් හරියාකාර ක්‍රියාත්මක කළ හැකි ආකාරයටයි පාස්කර ගන්ට ඕනෑ. "ඊට්‍රොස්පෙක්ටිව් ඉෆේපක්ට්" ඇතුවයි ඒ පනත ක්‍රියාත්මක වෙන්ට ඕනෑ. එහෙම නැතුව නිය ම විධියට හොරු අල්ලන්ට බැරි වෙනවා. හාල්, පිටි, සීනි, අල ලූනු, මිරිස් ආදි ආහාර ද්‍රව්‍ය ගෙන්වීමේදී කොයි තරම් නාස්තියක් වෙනවාද අල්ලස් ක්‍රමය, ජාවාරම් ක්‍රමය, හොරකම ආදිය නිසයි බොහෝ විට නාස්ති වෙන්නෙ. ඔවුන් අල්ලා ගැනීම පිණිස අතීතයටත් බල පාන ආකාරයට නීතියක් වහාම ගෙනත් ක්‍රියා කරන්ට ලැස්තිද? එහෙම කළොත් නම් මේවා ටිකක් දුරවත් නවත්වන්ට පුළුවන් වේය කියා මා හිතනවා. එහෙම නොකළොත් මේ රටේ කුඩා දරුවා පටන් මහල්ලා දක්වා සියලු දෙනාම භයානක තත්ත්වයකට වැටෙන්ට ඉඩ තියෙනවා. එතකොට ඉදිරි අනාගතයේදී මේ රටේ ජනතාවට බඩගින්නෙ ඉන්ට වෙයි. රට දියුණුව කරා ගෙන යාම අමාරු වැඩක් වෙනවා. මේකට නියම බෙහෙත දෙන්ට ඕනෑ. ඒ බෙහෙත දීමට තමුන්නාන්සෙලා පොහොසත් නැහැ. තමුන්නාන්සෙලා ඊට අපොහොසත්. කෝටි ගණන් මුදල් නාස්ති කිරීම අපේ රටට තිබෙන විශාල රෝගයක්, වසංගතයක්. ඒ වසංගතය තමුන්නාන්සේලා මේ



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.]
රටට බෝ කරගෙන ගොස් තිබෙනවා. මේ වසංගතය දුරු කිරීමට තමුන්නාන්සෙල කොයි තරම් වෙහෙසෙන්නට ලැහැස්තිද කියන එක අද ප්‍රශ්න කරන්න සතුටුයි.

**වෛද්‍යාචාර්ය නාගනාදන්**
*(டொக்டர் நாகநாதன்)*
(Dr. Naganathan)
There is no Quorum, Sir.

මන්ත්‍රී මණ්ඩලය ගණින් කොට ගණපූරණයක් නොතිබුයෙන්, බෙදුම් සීනු ශබ්ද කිරීමට නියෝග කරන ලදි.

පසුව ගණපූරණයක් තුබුයෙන්—

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)
ගරු කථානායකතුමනි, මේ ගැන තව දුරටත් කථා කරන්නට තිබෙනවා. මේක සුළු දෙයක් නොවෙයි. මේ ගරු සභාවේදී ඕනෑම ප්‍රශ්නයක් ගැන සාකච්ඡා කරන්නට හැමදාම අපි ලැහැස්ති වී සිටිනවා. නමුත් පාලනය ගෙන යන කැබිනට් මණ්ඩලයේ තමුන්නාන්සෙලා තමයි අවහිර කරන්නෙ. ඒවා දිනෙන් දින කල් දමනවා; මග හරිනවා. අපි මේ ප්‍රශ්නය රටට හොඳින් පහදල දෙන්න ඕනෑ. තමුන්නාන්සෙලාට අර පිටිය මතක් වන වේලාවට පමණක් වැඩ කර හරි යන්නෙ නැහැ. කිය යුතු දේ අපි මෙතන කියන්න ඕනෑ. මේවා රටේ ජනතාවට අයිති කරුණු. දුක් විඳින්නේ තමුන්නාන්සෙලා නොවෙයි; මේ රට මේ විධියේ මුදල් පරිහාණියකට පත් කළාම දුක් විඳින්නෙ මේ රටේ සිටින ජනතාවයි; දුප්පත් ඡන්දදායකයෝයි. මේ කාලසීමාවේදී ඒ උදවියට වග කියන්න යන්න තමුන්නාන්සෙල ලැහැස්ති නැහැ. අපි ඒ බව හොඳට දන්නවා. ඒ උදවියට වග කීමේ භාරය අපට නම් තිබෙනවා. ඒ අනුව තමයි අපි මෙතන විවේචන ඉදිරිපත් කර සාකච්ඡා කර දෙන්න හදන්නේ. එසේ නොකළොත් "තමුන්නාන්සෙ එතැනට ගියා; තමුන්නාන්සෙලා අන්ධයෝ වගේද වැඩ කළේ ?" කියා අපෙන් මහජනයා අහනවා. තමුන්නාන්සෙගෙන් නම් අහන එකක් නැහැ.

ගරු කථානායකතුමනි, මේක මේ රටේ ජනතාවට මූලිකව වුවමනා කරන කාරණයක්. මනුෂ්‍යයෙකුට මූලික වශයෙන් කෑම ටික ඕනෑ. කන්න බොන්න ඕනෑ; ඉන්න හිටින්න තැනක් ඕනෑ. මේ මා කීවේ මූලික වශයෙන්. කෑම් බීම්, ඉඳුම් හිටුම් ඕනෑමයි. සෞඛ්‍යය තබා ගන්ට ඕනෑ. ඒ වගේම මනුෂයෙක් වුණාම පරම්පරාව ඉදිරියට ගෙන යන පිළිවෙලට හැසිරෙන්නත් ඕනෑ. මේ ආණ්ඩුව ඒ සියල්ලම කඩ කර තිබෙනවා. මේවා අන්ධකාරයේ තබා තිබෙනවා. අපි මේ කරුණුවලදී ඒවා විවේචනය කර, ඒ සියලු දේම මේ ආණ්ඩුව කඩ කර තිබෙනවා කියා පෙන්වා දෙන්ට ඕනෑ. එහෙම රටට නොපෙන්වනවා නම් අපි වැරදිකාරයෝ. තමුන්නාන්සෙලා ඒව කැඩු ආකාරය යා යුතුව තිබෙන ගමන වළක්වා මහජනතාව අන්ධකාරයේ තබන ආකාරය, ප්‍රතිගාමී බල වේගයන්ට වහල් වී ප්‍රගතිශීලී කටයුතුවලට හරස් කපන ආකාරය, මේ රටේ මහජනතාවට අප පෙන්නුම් කර දෙන්න ඕනෑ. ඇත්ත වශයෙන්ම අද තමුන්නාන්සෙලා ප්‍රතිගාමී බල වේගවල වහලුන් වශයෙනුයි ක්‍රියා කරන්නෙ. අහිංසක වැඩ බලන ඇමති කෙනෙකු ඉදිරියේ මට මෙය කියන්ට සිදු වීම ගැන මම කනගාටු වෙනවා. කැබිනට් මණ්ඩලයේ සිටින ප්‍රතිගාමී කණ්ඩායම මෙතන නැහැ. මේ රටේ ගොවියාට විනා කරන, කම්කරුවාට ද්‍රෝහිකම් කර ඔවුන්ව තළන පෙළන, අධිරාජ්‍යවාදීන්ට ඇව්ටැඹිකම් කරන මේ ආණ්ඩුවට මින් ඉදිරියට මහජනතාව ගසා කෑමට ඉඩක් ලැබෙන්නේ නැති බව මම කියනව. ඒ අධිරාජ්‍යවාදී, ධනපති වාදය—

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)
මේ වැය ශීර්ෂයෙන් පිට යන්න එපා.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)
හොඳයි, කථානායකතුමනි, අවසාන වශයෙන් රටේ පවතින මේ භයානක තත්ත්වය ගැන මහජනයා කිපී තමුන්නාන්සෙලාගෙ කණින් ඇද දමන්ට පෙර අද පවතින තත්ත්වයෙන් රට මුදවා ගැනීමේ මාර්ගය අප පෙන්වා දෙන්ට ඕනෑ. [බාධා කිරීමක්] තව දුරටත් මහජනතාව පෙළීමට අප ඉඩ දෙන්නේ නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

හමීඩ් මයා.
(ஜனாப் ஹமீத்)
(Mr. Hameed)

There are five explanations that have been given in regard to the increase of Rs. 64 million. The first explanation given is the increase in the quantity of local rice purchased under the Guaranteed Price Scheme. This means that there has been an increase in the output of paddy.

කථානායකතුමා
(சபாநாயகர்)
(Mr. Speaker)

That has been fully discussed. Please come on to something else.

හමීඩ් මයා.
(ஜனாப் ஹமீத்)
(Mr. Hameed)

I have my own explanation for it. On each of these explanations each hon. Member will have his own views and we are entitled to place those views before the House.

I maintain that this means there has been an increase in the output of paddy. It is difficult for me to believe that because, according to the Food Commissioner's latest report, he maintains that the paddy yield figures are wrong. I have brought this matter to the notice of the Minister over and over again on the Floor of the House.

කථානායකතුමා
(சபாநாயகர்)
(Mr. Speaker)

Order, please! This is a Supplementary Estimates for money paid for certain paddy purchases. The hon. Member need not discuss paddy lands.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

This Supplementary Estimate does not deal with the question of purchase of paddy, and to talk about paddy under this Estimate is out of the point.

හමීඩ් මයා.
(ஜனாப் ஹமீத்)
(Mr. Hameed)

No, Sir. There has been an increase in the quantity of local rice purchases, which means that there has been an increase in the paddy yield.

කථානායකතුමා
(சபாநாயகர்)
(Mr. Speaker)

There is no reference to paddy in this Supplementary Estimate. Will the hon. Member please confine his remarks to the subject?

හමීඩ් මයා.
(ஜனாப் ஹமீத்)
(Mr. Hameed)

There is a second point. Another cause you have mentioned is demurrage. I have my own views on this subject. How does this situation come about? The cause of the demurrage is that the Food Department does not have sufficient alongside berths. That is the actual difficulty. I think the department has a reservation of four berths. Unless you increase your berthing facilities you will not be able to land the goods quickly. Until more berthing facilities are provided you should plan your unloading work in such a way as to avoid congestion.

The next reason you have mentioned is, the under-provision in the original Estimates in anticipation of price fluctuations. How are you going to tide over price fluctuations ? I have stated off and on on the Floor of this House that, as long as you do not have a market research centre you can never solve the problem of price fluctuations. You must study the markets and the seasons abroad, and it is in this way that you can solve the problem. I wish to ask the Hon. Minister whether he agrees with me.

කථානායකතුමා
(சபாநாயகர்)
(Mr. Speaker)

Order, please! That was very well explained by the hon. Member for Wattala (Mr. Jayasinghe).

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**හමීඩ් මයා.**

*(ஜனாப் ஹமீத்)*

(Mr. Hameed)

That is the second point. I now come on to the third point. I find that one of the reasons given is the increased cost of American flour purchased under P. L. 480, and Canadian gift flour. I should like to ask the Hon. Acting Minister whether he could explain how there could be an increase in the cost of Canadian gift flour. What is meant by gift flour? How do you get an increase on cost of gift flour? That sounds ridiculous.

I do not want to take the time of the House, but, in conclusion, as a Member of this House I have every right to place before you a new line of approach to a problem, and it is your duty to allow that opportunity.

අ. භා. 6.15

**ගරු ඩී. එස්. ගුණසේකර**

*(கௌரவ டீ. எஸ். குணசேக்கர)*

(The Hon. D. S. Goonasekera)

ගරු කථානායකතුමනි, මේ රුපියල් ලක්ෂ 640 ඇස්තමේන්තුව විස්තර කරන්ට කලින් මේ විවාදයට සහභාගි වූ මන්ත්‍රීවරුන්ට කරුණක් කියන්ට තිබෙනවා. අපේ ගරු මන්ත්‍රීවරුන් ඉදිරිපත් කළ ඉතා හොඳ අවවාද පිළිගෙන ඒ කියන ලද කරුණු ගැන ඉතා ඕනෑකමින් පරීක්ෂා කර බලා ඒ සම්බන්ධයෙන් කළ යුතු යම් දෙයක් තිබෙනව නම් ඒ සියලු දේම කරන බව ඉතා කරුණාවෙන් ගරු මන්ත්‍රීවරුන්ට මා දන්වා සිටිනව.

ගාල්ලේ ගරු මන්ත්‍රීතුමා (ඩබ්ලිව්. දහනායක මයා.) මේ සම්බන්ධයෙන් පැය ගණනක් කථා කරමින් ප්‍රශ්න රාශියක් ඇසුවා. ඇස්තමේන්තු පිළියෙළ කරන අවස්ථාවෙදි අනාගතයේදි සිදු වන වියදම හා ලැබෙන ආදායම හරියටම අසුවල් ගණනය කියා කොයිම කෙනෙකුටවත් නිග මනය කරන්ට පුළුවන්කමක් නැහැ. අපේ ගාල්ලෙ ගරු මන්ත්‍රීතුමා ඇමතිකමක සිටි නිසා මට වඩා හොඳින් දන්නවා ඇති, ඇස්තමේන්තුවල අයවැය නිතරම වගේ වෙනස් වන බව. එවැනි අවස්ථාවලදීයි ඒ අඩුපාඩු පිරිමසා ගැනීමට අපි මෙවැනි ඇස්තමේන්තු ගෙනෙන්නෙ. මෙවැනි කටයුත්ත කදී රුපියල් ලක්ෂ 640ක් විශාල ගණනක් හැටියට කල්පනා කිරීම වැරදිය කියා ඒ මන්ත්‍රීවරුන්ට මම කරුණාවෙන් කියනව.

ආහාර ඉතාම අවශ්‍ය දෙයක්ය කියා එය පළමුවෙනි අංකයේ තබා ගරු මන්ත්‍රීවරු කථා කළා. මා එය පිළිගන්නව. අද අපට ඊට වඩා ලොකු වෙනත් දෙයක් නැහැ. ආහාර සඳහා අපි වියදම් කරන්ට බලා පොරොත්තු වුණු ප්‍රමාණයට වඩා වියදම් වී තිබෙන මේ මුදල, සුළු මුදලක් වශයෙන් සලකන්ට මන්ත්‍රීවරුන් එකඟ වේවිය කියා මා බලාපොරොත්තු වෙනව. මේ රටේ නිපද වන හාල්වලට ගෙවන මුදල බලා පොරොත්තු වුණු ප්‍රමාණයට වඩා වැඩි වුණා. ගරු කථානායකතුමනි, නමුත් නාන් සෙත් මේ ගරු මන්ත්‍රීවරුන් දන්නවා, අපි වී බුසලකට රුපියල් 12ක් ගෙවන බව. එවිට හාල් සේරුවක් සත 85 කට වැඩි ගණනක් වෙනව. මේ වතාවෙදී අපට මේ රටේ නිපදවන හාල් ටොන් 40,000ක් වැඩිපුර ගන්ට සිදු වුණා. මෙයින් රුපියල් 230 ලක්ෂයක් වුවමනා කරන්නේ ඒ සඳහායි. ඒ නිසා මා හිතනව, අපේ මන්ත්‍රීවරුන් මේ සම්බන්ධව ආරාවුල් කරන එකක් නැත කියා.

ඒ වගේම අපි බලාපොරොත්තු වුණා, සීනිවලින් මීට වඩා විශාල ලාභයක් ලැබේය කියා. නමුත් කාරණා කීපයක් නිසා ඒ ලාභය නොලැබී ගියා. අපි සුදු සීනි රාත්තල සත 67ට දෙන්ට කලින් නියම කර ගත්ත. පසුව ඒ සීනි සත 62 බැගින් මිළ අඩු කර වික්ක. එම නිසා අපි සීනිවලින් ලැබේයයි බලාපොරොත්තු වුණු මුදල අඩු වුණා. සීනි මිල සත 5 කින් වැඩි කළාය කියා අපට ඒ කාලයේ විශාල චෝදනාවකුත් මේ ගරු මන්ත්‍රීවරු එල්ල කළා. ඒ නිසා අප එය අඩු කළා.

වැඩිපුර නැව් ගාස්තු ගෙවීම සඳහාත් රුපියල් 40,00,000 ක් වියදම් වීම ගැන සලකා බලන විට මෙය ඉතාම අඩු ගණනක් බව කිව හැකියි. මා එහෙම කියන්නේ ඇයි? දෙසැම්බර්, ජනවාරි යන මාසවල වරායේ කම්කරුවන්ගේ වැඩ වර්ජනයක් තුබුණා. එම නිසා කලට වේලාවට නැව් වලින් ආහාර ගොඩ බා ගන්න බැරි වුණා. ඒ වගේම ඒ මාසවල වාර්ෂාවත් පැවතුණා. වර්ෂාව පැවතීම හේතුකොටගෙනත් බඩු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පරිපූරක මුදල්

බැමේ වැඩ පමා වුණා. වර්ෂාව ඇති වේය කියා අප බලාපොරොත්තු වුණේ නැහැ. ආණ්ඩුව බලාපොරොත්තු නොවූ දෙයක් සිදු වුණා. වර්ෂාව ගැන වග කිව යුත්තේ කවුද කියා තෝරා බේරා ගැනීම තමුන්නාන්සේලාට භාරයි. මගේ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් වරායේ වැඩ වර්ජනයක් ඇති වීම සම්බන්ධයෙන් වැරදිකාරයන්ය කියා මට නම් කියන්න පුළුවන්කමක් නැහැ. ආහාර නැව් ගාලු වරායට යැව්වා නම් කිසිම අලාභයක් නොසිදුවන්න ඉඩ තුබුණු බව ගාල්ලේ ගරු මන්ත්‍රීතුමා (ඩබ්ලිව්. දහනායක මයා.) කිවා. අප කලින් ගාලු වරායට නැව් කීපයක් යැව්වා. නමුත් කොළඹ වරායේ වැඩ වර්ජන පවතිද්දී ආහාර නැව් ගාලු වරායට පිටත් කර යවන්නත් බැරිව ගියා. කොළඹ වරායේ වැඩ වර්ජනයේ යෙදී සිටිනවුන්ට සහයෝගය දෙන ලෙස ගාලු වරායේ කම්කරුවන් ගෙනුත් ඒ වැඩ වර්ජනය කළ කොළඹ වරායේ කම්කරුවන් ඉල්ලා තුබුණා. මේ නිසා ගාලු වරායේ පැවති තත්ත්වය ගැන ගරු කථානායකතුමා දන්නවා ඇති. ආහාර නැවක් නියමිත දිනයට පසුව වරායේ රැඳෙන සෑම දිනයකටම පවුම් 250 ගණනේ ගෙවන්න සිදු වෙනවා. මෙය අපේ රටේ මුදලින් නම් රුපියල් 3333 ක් විතර වෙනවා. නියමිත දිනට වඩා දවසකට කලින් බඩු බා ගන්න පුළුවන් වුණොත් අපට පවුම් 125 ක ලාභයක් ලැබෙනවා. එය මේ රටේ මුදලින් නම් රුපියල් 1666 ක්. මේ ආකාරයෙන් කල්පනා කර බලන විට නියමිත දිනට වඩා එක දවසක් පමා වුණොත් අපට අලාභ දෙකක් විඳින්න සිදු වෙනවා. ගෙවීමට වන රුපියල් 3333 හා නැති වී යන ලාභය වන රුපියල් 1666 යන අලාභ දෙකක් විඳින්න අපට සිදු වෙනවා. ඒ අතර බඩු බෑම පමා වීම හේතුකොටගෙන ඒවා නරක් වන්නටත් පුළුවනි. අපට සිදු වන අලාභය ගෙවන්ට සිදු වන්නේ ලංකාවේ තිබෙන මුදලින් නොව අපේ විදේශික ධනයෙනුයි. මේ විධියට අලාභ විඳින විට අපේ විදේශ ධනය අඩු වෙනවා. අප අතින් වරදක් වන විට එයින් ඇති වන විපාක අප තේරුම් ගන්ට ඕනෑ. ඒ වගේම වැරද්ද සිදු වී තිබෙන්නේ අසවලාගෙන්ය කියාත් තේරුම් ගන්ට අපට පුළුවන් විය යුතුයි. 1958-59 වර්ෂයේදී "ඩෙමරේජ්" වශයෙන් රුපියල් 1,30,00,000 ක් ගෙවන්න සිදු වුණා. 1959-60 වර්ෂයේදී රුපියල් 1,00,00,000 ක් ගෙවන්න සිදු වුණා. ඒ අනුව බලන විට අද තිබෙන තත්ත්වය ගැන ගරු මන්ත්‍රීවරුන්ට සතුටු වන්න පුළුවන්කමක් ඇතැයි මා කල්පනා කරනවා. දැන් "ඩෙමරේජ්" වශයෙන් ගෙවන මුදල රුපියල් 40,00,000 කට බැහැලා. දැන් අපේ වැඩ කටයුතු කරන නිලධාරි මහත්වරුන් ඇතුළු සැමගේම සහයෝගය තිබෙන නිසා වැඩි දියුණුවක් ලැබෙන්න පුළුවනි. 1958 වර්ෂයට වඩා අද තිබෙන තත්ත්වය හොඳයි.

පිටි සම්බන්ධව බොහෝ දෙනා ප්‍රශ්න කළා. අපට තෑගි වශයෙන් ලැබුණා වුණත්, ලෝකයේ සෑම තැනම පිටි ගණන් වැඩි වුණහම එය අපටද බල පානවා. පිටි වර්ග තෑගි වශයෙන් ලැබුණත් වෙනත් අංශවල කටයුතු කරන්න මුදල් තැන්පත් කරන්න ඕනෑ. මේ මන්ත්‍රීවරුන්ට එය හොඳාකාර තේරෙනවා ඇත කියා මා කල්පනා කරනවා.

අපේ ගාල්ලේ ගරු මන්ත්‍රීතුමාත් වත්තේගම ගරු මන්ත්‍රීතුමාත් (ඒ. රත්නායක මයා.) කථා කළා. එසේම නල්ලූර්හි ගරු මන්ත්‍රීතුමාත් (වෛද්‍යාචාර්ය ඊ. එම්. වී. නාගනාදන්) කථා කළා. නල්ලූර්හි ගරු මන්ත්‍රීතුමා දොස්තර මහත්මයකු වෙලත් ගණපූරණයක් නැති බව කියල පැනල ගිය එක ගැන මා කනගාටු වෙනව. මට බොහොම කනගාටුයි, අපේ මන්ත්‍රීතුමන්ලා මෙපමණ පහත් තත්ත්වයකට බැහැල තිබීම ගැන. යම් මන්ත්‍රීවරයෙක් කියනවා නම්, එසේ කිරීම තමන්ගේ අයිතියක්ය කියල, මා එතුමාට කියනවා, එසේ කිරීම මන්ත්‍රීකමට ඔබිනවාදැයි කල්පනා කර බලන ලෙස. "ගණපූරණයක් නැහැ" කියල පැනල ගිහිල්ල සභාවෙ වැඩ කටයුතුවලට හරස් වන එක කථා කරන මහත්මයාට කරන අවනම්බුවක් නේද? තමන්ගෙ පක්ෂයට අයිති මහත්මයකුට වුණත් අනික් පක්ෂයකට අයිති මහත්මයකුට වුණත් කරන අපහාසයක් ඒක. එතරම් කල්පනාවක් නැත්තෙ මොකද කියල මා අහනවා. ඒ ගැන තව දුරටත් කල්පනා කිරීම මා ගරු මන්ත්‍රීතුමන්ලාටම භාර කරනවා.

කෙට්ටාවේ ගරු මන්ත්‍රීතුමාත් (ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.) අඩුපාඩුකම් රාශියක් ගැන ප්‍රකාශ කළා. එම කරුණු පිළිබඳව මා ඉතා ඕනෑකමින් සොයා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ඩී. එස්. ගුණසේකර]

බලනවා. එතුමන්ලා එම කරුණු ඉදිරිපත් කළේ ආණ්ඩුවේ තියෙන වැරදි හරිගස්සා අපට ලාභයක් අරගෙන දීමටයි. අපි ඒ අදහස්වලට ගරු කරනවා. ඒවා ස්තුතියෙන් භාර ගන්නවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

## පරිපූරක මුදල : අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුව

குறைநிரப்புத் தொகை : சந்தைப் படுத்தற் பகுதி

## SUPPLEMENTARY SUPPLY : MARKETING DEPARTMENT

**ගරු ඩී. එස්. ගුණසේකර**

*(கௌரவ டீ. எஸ். குணசேக்கர)*

(The Hon. D. S. Goonasekera)

I move,

That a supplementary sum not exceeding Rupees Ten (Rs. 10) (Token Vote) be payable out of the Consolidated Fund of Ceylon, or any other fund or moneys of, or at the disposal of, the Government of Ceylon or from the proceeds of any loans obtained by the Government of Ceylon, for the service of the Financial Year beginning on 1st October, 1961, and ending on 30th September, 1962, and that the said sum may be expended as specified in the Schedule hereto :—

*Schedule*

Head 151—Marketing Department

| | *Rs.* |
|---|---|
| Vote No. 2—Administration Charges —Recurrent Expenditure .. | 10 (Token Vote) |

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

**මාකන්-මාකර් මයා.**

*(ஜனாப் மாக்கன் மாக்கர்)*

(Mr. Macan-Markar)

I believe the Agricultural Products (Regulation) Ordinance has been in existence for donkey's years, but it is sad to note that very little has been done to make the country self-sfficient in at least a few of the products that have been brought under this law. Some of the items mentioned in the explanation had been given a certain amount of protection in order to encourage production. No substantial increase in production has resulted from the guaranteed price enjoyed by these products. I believe one reason is that the guaranteed price itself has not been sufficiently attractive from the point of view of the producer. Why was that not realized all these years ? The result is that today with the importation of commodities like tamarind entirely prohibited, there is an acute scarcity which has caused prices to shoot up. There has been an inexcusable laxity on the part of the department in not advising the Ministry in time to increase the prices of local produce.

Furthermore, there is no proper organization to ensure that the actual producer of these commodities gets a fair price. Generally, the producer is exploited by middlemen who buy the produce at rock-bottom prices and sell it to the Marketing Department at the guaranteed price. Too much reliance has been placed on co-operative agricultural production and sales societies. It is well known that these societies are dominated by persons who exploit the co-operative structure for their personal benefit and devote most of their time to racketeering. The result is that the production of all subsidiary foodstuffs has suffered. I would ask the Hon. Acting Minister to take steps to set up a more suitable organization to ensure that the producer is given a fair price for his produce.

**හමීඩ් මයා.**

*(ஜனாப் ஹமீத்)*

(Mr. Hameed)

